

# අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ස්වරූපං

# අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ස්වරූප

සම්පාදිකා

**ත්‍රිපිටකාචාර්ය සීලවතී පීරිස් මහත්මිය**

ප්‍රකාශනය

**බෞද්ධ කල්‍යාණ මිත්‍ර සංගමය**

නුගේගොඩ

බු. ව. 2540

ක්‍රි. ව. 1996

# පෙරවදන

වත වළා (විනය පිටකය), සූතන්වළා (සුත්තන්ත පිටක) විජම් වළා (අභිධම්ම පිටක) යි සම්පූර්ණ සම්මුඛ දේසනා ධර්මය තෙවැදෑරුම් වෙයි. විශෙෂයෙන් මහණ මෙහෙණ දෙපිරිස විසින් නිර්වාණාධිගමය පිණිස දිවිහිමියෙන් රැක්ක මනා පර්යාය මුඛයෙන් ගැන බලත්ම සිකපද නවකෙළ දහස් එකසිය අසූකෝටි පණස් ලක්ෂ සතිසෙයකින් පරිමිත වූ උපසම්පදධි ශීලය විනය පිටකයෙහි සවිස්තරව වර්ණිත වෙයි.

විනය පිටකාගත චතුපාරිශුද්ධි ශීලය පැවිදි පරපුරෙහි ප්‍රායොගිකව පවත්නාතෙක් බුද්ධ ශාසනය ලොකයෙහි චිරස්ථායී වන්නේය. ''විනයො නාම සාසනස්සායු'',

විනය නම් සම්බුදුසසුනෝ ආයුසයි, පැවැසුනෝ එහෙයිනි'', ආණාදෙසනා නමිනුදු පැවැසෙන විනය පිටකය පරියත්ති සාසනයේ මූලභාගය වෙයි. එය සදෙව් ලෝවැසියනට සීල සම්පදව මොනොවට විදහා පාන්නේය. සම්බුදු පිරිනිවණින් පසු පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවෙහි දී විනය ධර ගණයේ ප්‍රමුඛස්ථානය දැරුවාහු ශාක්‍යවංශික මහරහත් උපාලි මහ තෙරපානෝය.

පරියත්ති සාසනයේ දෙවන භාග වන සූත්ත න්ත පිටකය සූතන්වළා නමින් පිරිසිදු හෙළ බසින් හැඳිනේ. සෞත්‍රාන්තික ධර්මධර මහතෙර ගණයේ නායකත්වය දැරුවෝ ධර්ම භාණ්ඩාගාරික ශාක්‍යවංශික මහරහත් ආනන්ද මහ තෙරපානෝය. ප්‍රථම ධර්ම සංගීතියෙහි දී සූත්‍රපිටකයට අයත් ධර්ම කථා සියල්ල මහා සංඝ සම්මේලනයට ඉදිරිපත්කළෝ ආනන්ද මාහිමිපානෝය. උන් වහන්සේගේ ප්‍රමුඛත්වයෙන් සංගායනාවට ඉදිරි

පත් කරන ලද සූත්‍ර දෙසනා සියල්ල සූත්තන්ත පිටකයෙහිලා සම්මත විය. විනය පිටකය සීල විසුද්ධියට උපදෙශ දෙන අතර සූත්‍ර පිටකය චිත්ත විසුද්ධියට මං පාදයි.

සම්බුද්ධ ධරමාන කාලයෙහි සිට ධම්ම සෙනාධිපති සාරිපුත්ත අගසවු මහරහතන් වහන්සේ ආභිධම්මික මහාථෙර ගණයේ නායකත්වය ඉසුලූහ. මහා මොග්ගල්ලාන, මහා කොඨිත, මහා කච්චාන, අනුරුද්ධ, ආදී මහරහතන් වහන්සේ ආභිධම්මික භික්ෂූන්ගේ ගණ නායක වූහ. උන් වහන්සේලාගෙන් ප්‍රථම ධම්ම සංගායනා සම්මේලනයට කායසාක්ෂි වූ ආභිධම්මික මහ තෙරුන් අතර ප්‍රධාන වූවාහු ශාක්‍ය වංශික අනුරුද්ධ මහරහත් හිමිපාණෝ ය. උන්වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍යයෝ අභිධර්ම පිටකය පවත්වාගෙන ආහ. විජමවළා නම් වූ ආභිධම්ම පිටකය දිට්ඨි විසුද්ධි කංඛා විතරණ විසුද්ධි, මග්ගාමග්ග ඥාණ දස්සන විසුද්ධි, පටිපද ඥාණ දස්සන විසුද්ධි, ඥාණ දස්සන විසුද්ධි, යන පඤ්ච මහා විසුද්ධිය උපද. වන්නේ පඤ්ඤා භාවනාවයි. පඤ්ඤා භාවනාවට මංපාදන්නේ අභිධම්ම පිටකයයි. මෙසේ අභිධම්ම පිටකයෙන් බැහැරි ප්‍රඥා භාවනායෙක් නොමැත. මෙසේ ත්‍රිපිටක ධර්මය අනුපිළිවෙලින් සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිශික්ෂා දෙයි. එයින් අනුත්තර විමුක්ති ලාභය ලැබෙන්නේය. මෙසේ ත්‍රිවිධ වූ පරියත්ති සාසනය හෙවත් තෙවලා දහම සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ පටිපත්ති සාසනය විදහා පෙන්වයි. ත්‍රිශික්ෂා පූරණයෙන් 'සතර මග' සතර ඵල නිබ්බාණ යන නව ලොකොත්තර ධර්ම වන පටිවෙධ සාසනය සාක් ෂාත් කෘත වන්නේය. තිසරණ ගමන සහිත දන, සීල, භාවනා යනුවෙන් ත්‍රිවිධ වූ හෝ දශවිධ පුණ්‍යක්‍රියා ගිහි සාමීචි පටිපදව, වන අතර තිසරණ ගමන සහිත සිල සමාධි පඤ්ඤා යන ත්‍රිශික්ෂා සමණ සාමීචි පටිපද වන්නේය. මේ දෙපිළිවෙත පුරණ කවරෙකු විසිනුදු නිර්වාණාධිගම පිණිස අභිධර්ම නමින් එන පරමාර්ථ ධර්ම ඥාණය ලදමනාම වෙයි. දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග යන සිවුසස් දහම් විෂයයෙහි පිරිවැටුනු තුනෙකින් ද ද්වාදසාකාරයෙකින් ද සැදුම්ලත් යථාභූතඥානදස්සනය සුවිසුද්ධ වූ විටම 'අනුත්තර සම්මා සම්බොධි නම් සබ්බඤ්ඤාත

ඥානය පහළ වන්නේය. දම්සක් පැවැතුම් සූතුරෙහි එන චක්ඛුං උදපාදි, ඥාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදී යන තන්හි චක්ඛු වන්නේ ධම්ම චක්ඛු, නම් වූ ප්‍රථම ලොකෝත්තර මාර්ග ඵල යුගලය වන සොතාපත්ති ඥාණ දෙක ගැනේ. ඥාණං උදපාදී යන්නෙන් දෙවන ලොවුතුරු නැණ යුවල වූ සකෘදගාමී 'ඥාණ චක්ඛු පැවැසෙයි. පඤ්ඤා උදපාදි යන්නෙන් ඔරම්භාගිය සඤ්ඤොජන ධර්ම පස ප්‍රහීන වීමත් සමඟ පහළ වන තෙවන ලොවුතුරු මග ඵල නුවණ කිය වෙයි. එය 'පඤ්ඤා චක්ඛු ''නමිනුදු පහළ වේ. විජ්ජා උදපාදි විජ්ජා උදපාදි යන්නෙන් දෙසන ලදුයේ සතර වන ලොකෝත් තර මාර්ග ඵලඤාණ දෙක වූ අරහත්ත මග්ග–ඵල නැමති විද්‍යා චක්ඛුෂයි. එය ලැබෙනුයේ උද්ධම්භාගීය සංයෝජන ධර්ම පඤ්චකයේ අශේෂ විරාහ නිරොධයෙනි. පස්වන ආලොකො උදපාදී' පැණ වූ උපන' යනුවෙන් පැවැසුනේ අර්හත් ඵල විමොක්ෂයාගේ අන්තයෙහි උපදනා අනුත්තර සම්මා සම්බොධි ඤාණ නැමැති බුද්ධ ඤාණයයි. ඒ ඒ සවැදෑරුම් වෙයි. ඉන්ද්‍රිය පරොපරියත්ති ඤාණ, ආසයා නුසය ඤාණ, යමකපාටිහීර ඤාණ, මහා කරුණාසමාපත්ති ඤාණ, සබ්බඤ්ඤුත ඤාණ, අනාවරණ ඤාණ, යනුවෙනි. මේ සය සම්මා සම්බුද්ධ තථා ගතයන් වහන්සේටම ආවේණික අසාධාරණ බුද්ධ ඤාණයි. බුද්ධ චක්ඛු නම් ද වේ. ධම්ම චක්ක පවත්තන සූත්‍රයෙහි එන චක්ඛු, ඤාණ, පඤ්ඤා, විජ්ජා, ආලොක යන වචන පසින් ධම්ම චක්ඛුය, සොතාපත්ති මග්ග–ඵල, ඤාණ චක්ඛු–සකදගාමි මාර්ගඵල, පඤ්ඤාචක්ඛු–අනාගාමි මග්ග ඵල) විජ්ජා චක්ඛු –රහත් මග්ග ඵල) බුද්ධ චක්ඛු (–ෂඩ් අසාධාරණ ඥාණ) පසැස් නුවණ ගැනේ. ඒ පසැසින් යුක්ත වන හෙයින් සර්වඥ තථා ගතයන් වහන්සේ චක්ඛු මා වන සේක. නිද්දෙස පාලියෙහි එන පරිදි බුදුරජාණන් වහන්සේ මාංස චක්ඛු, දිබ්බ චක්ඛු, පඤ්ඤා චක්ඛු, බුද්ධ චක්ඛු, සමන්ත චක්ඛු, යන නැණ පසින් යුක්ත වන හෙයින් චක්ඛුමා වන සේක. සමන්ත චක්ඛු (සම නැස් නුවණ) යනුවෙන් සබ්බඤ්ඤුත ඥානය පැවැසේ. ''ආලොකො උදපාදී'' යන්නෙන් බුද්ධ චක්ඛු, සමන්ත චක්ඛු යන ෂඩ් අසාධාරණ ඤාණය තමන් වහන්සේ තුල උපනැයි

වදාළ සේක. සිද්ධාර්ථ ගෞතම මහා බෝධිසත්වයන් වහන්සේ විසින් සමතිස් පෙරුම් දම් බෙලෙන් පඤ්ච මාරබල බිඳලමින් බෝධිද්‍රැම මූලයෙහි දී අනුත්තර සම්‍යග් සම්බොධි නැමැති ප්‍රඥාලොකය ලද හෙයින් ම ලොවට තෙවලා දහම පහළ වීය.

විනය පිටකය විනය ධර මහ රහතන් අතර අග්‍ර ස්ථානය ගත් උපාලි මහරහතන් වහන්සේගේ මාර්ග දේශකත්වය යටතේ ප්‍රථම ධර්ම සංගීති මහා සම්මේලනය යුගයේ පටන් අද තෙක් මහා සංඝයා වහන්සේ අතර උද්ග්‍රහණ ධාරණා දී වශයෙන් පැවතෙයි. බහුශ්‍රැත සියලු මහා සංඝයා අතර අගතැන් පත් ආනන්ද මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව විසින් පඤ්චමහා නිකායාන්තර්ගත සූත්‍ර පිටකය උද්ග්‍රහණ ධාරණ වාචනා මාර්ගයෙන් පවත්වාගෙන එනු ලබයි. තථාගත සර්වඥ යන් වහන්සේ ගේ දකුණත් සවූ ධර්ම සේනාපති සාරිපුත්‍ර මහ රහතන් වහන්සේගේ ගණනායකත්වයෙන් ආභිධම්මික මහා ථෙර පරම්පරාව විසින් අභිධර්ම පිටකය අද තෙක් උද් ග්‍රහණ ධාරණ වාචනා මාර්ගයෙන් පවත්වාගණ එනු ලබයි.

ත්‍රිපිටකයෙහි එන ධර්ම සියල්ලම සංගායනාවට නිසි වන පරිද්දෙන් විනය, සුත්ත, අභිධම්ම නමින් තෙ කොටසකට බෙදුනෝ ප්‍රථම, ද්විතීය, තෘතීය ධර්මසංගායනා සම්මේලනයන්හි දීය. විනය පිටකයේ පාරාජිකා පාලි ආදී නමින් කාණ්ඩ පසකි. සූත්‍රාන්ත පිටකය, නිකාය හෝ ආගම නාමයෙන් දීඝනිකාය හෝ දීඝාගම යනුවෙන් පඤ්ච මහා නිකාය යෙක. අභිධම්ම පිටකයෙහි පකරණ නාමයෙන් කාණ්ඩ සතෙකි. මෙසේ සත ලොස් කාණ්ඩයෙකින් පිරිපුන් පිටකත්‍රය ධර්මය වාචනාමාර්ග යෙන් පවත්වාගන එන භාණකයෝ වූහ.

අභිධම්ම භාණක, සුත්තන්තික විනය ධර, දීඝ භාණක, මජ්ඣිම භාණක, අංගුත්තර භාණක, ජාතක භාණක, ධම්ම පද භාණක, පරිත්ත භාණක, ආදී නමින් ඔහු හැඳින් වූහ. භික්ඛු, භික්ඛුණී, උපාසක, උපාසිකා, යන සිව් වණක් පිරිස්හි ධර්ම විනය සංස්ථාපනය යුගයෙන් යුගයෙහි පහළ වූ ථෙරීය නිකායට අයත් ගණාචාර්යයෝ තුන් පිටකය අළලමින් පොත් ලියූහ.

සිරිලක් දිවිහි සම්බුදු සසුන පිහිටියේ ක්‍රිස්තු පූර්ව තෙවන සිය වසෙහි ය. එතැන් සිට සිංහළ බෞද්ධයෝ තෙවලා දහම ඉගෙනීමෙහි උත්සුක වූහ. හෙල බොදු මහරජ දරුවෝ විශෙෂයෙන් හෙල බොදු වැස්සන් අතර විජම්බණ ඉගෙනීමට අභිධර්ම ග්‍රන්ථ ලියවා මගුලැතුන් පිට තබා නගර ප්‍රදක්ෂිණ කර වූහ. විනය ධර, ධර්ම ධර, භික්ෂූන්ට සිවුපස වැටුප්දීම පවා කරවූහ. තෙවලා දහම අළලමින් පොත ලියූ වහන්දැට ගම්වර පිදූහ. මහා විහාර වංශික අනුරුද්ධ ස්වාමීහු අභිධර්ම පිටකයට අයිති සප්ත ප්‍රකරණය හකුළුවා ආධුනිකයන්ගේ දැනුම පිණිස අභිධම්මත්ථ සංගහ නැමැති අනගි විජම් බණ පොත මාගධී භාෂාවෙන් ලියූහ. අභිධම්ම ඥනය ගිහි පැවිදි, දෙපිරිස අතුරින් වීමෙහිලා මහොපකාරී වූය. අභිධම්මත්ථ සංග්‍රහය වටා පසු කාලයෙහි බොහෝ ටීකා, සන්න ආදී මෙර ටෙහි පමණක් නොව බුරුම, සියම්, කාම්බෝජය, ආදි ථෙරවාදී බෞද්ධ දෙශයන්හි ලියැවුනහ. මේ සිය වසෙහි සිංහල ද්විප යෙහි විශේෂයෙන් ඇරැඹුණු දහම් පාසල් අධ්‍යාපනය නිසා අභිධර්ම ඥනය ගිහි උවසු උවැසියන් අතර ජනප්‍රිය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ සැදැහැ-නැණ සපන් ගිහි බැති මත්හු ද අභිධර්මයෙහි විසාරද වූහ.

අනුරාධපුර මහාවිහාර වංසික භදන්ත අනුරුද්ධ ස්වාමීන් ද්‍රයන් විසින් ගැදි පැදි දෙබසින් මුසු වූ මාගධ භාෂාවෙන් ලියන ලද අභිධම්මත්ථ සංගහප්පකරණය චිත්ත සංගහ විභාග, චෙතසික සංගහ විභාග, පකිණ්ණක සංගහ විභාග, වීථි සංග්‍රහ, විභාග, වීථි මුක්ත සංගහ විභාග රූපසංගහ විභාග, සමුච්චය සංගහ විභාග, පච්චය සංගහ විභාග, කම්මට්ඨානාවසාන සංගහ විභාග, යන පරිච්ඡෙද නවයකින් යුක්ත වෙයි.

සප්ත ප්‍රකරණයෙහිත් අභිධර්මාත්ථ සංග්‍රහයෙහිත් පුළුල් දැනුමැති ගිහි පැවිදි වියතුන් ඇසුරු කරමින් හොඳින් විජම් බණ දහම් උගත් නුගේගොඩ අංක 16 දරණ දූම්රිය පොල පටුමගෙහි පිහිටි බෞද්ධ කල්‍යාණමිත්‍ර සංගමයේ සභාපතිනිය වන සීලවතී පිරිස් මහොපාසිකාව විසින් ලියා පළකරවන ලද අභිධර්මාර්ථ සංග්‍රහ ස්වරූප නැමැති ග්‍රන්ථයේ පරිච්ඡේද කීපයක කියවා

බැලීමට අවස්ථාව මට ද ලැබිනි. මේ පොතේ සම්පාදිකා සීලවතී පිරිස් උපාසිකා මාතාව චිත්ත, චෙතසික, රූප නිබ්බාණ, යන සිවු පරමරුත් විසාහි තබා තුලැ පිහිටි සුගැඹුරු පුළුල් දැනුම මොනොවට පිළිබිඹු කොට ඇති බව හැමට පළමු සුපහන් සිතින් පවසමි. විෂය මාතෘකාවත් ග්‍රන්ථ කරණ සැටියත් පිළිබඳ වියත් ගිහි පින්වතෙකු හෝ පැවිදි උතුමෙකු ලවා පොතේ අත්පිට පතක් මුද්‍රණයෙහි දී ශොධ්‍ය පත්‍ර බලා සකස් කරවා ගත්තා නම් මිනිය නොහැකි වටිනාකමකි. දෙවන මුද්‍රණයෙහි දී ඒ ඉටු වේවා. පර්යාප්ති ධර්මය ඉගෙනීමට දෙසීමට භාෂා ශෛලියත් මුද්‍රණ දෙෂත් නොතකා හුදෙක් අභිධර්ම පිළිබඳ දැනුම වඩවා ගැනුමට මේ පොත මහ පිටුවහළ කැයි ඉඳුරා පවසමි. සයන දසකයෙහි වෙසෙමින්දුත් අභිධර්මය බඳු සුගැඹුරු විෂය මාතෘකාවක් යටතේ අභිධර්ම මාතිකා අභිධර්මාර්ථ සංග්‍රහ පාලිය බඳු දහම් පොත් ලියා පළකර විමෙහි තත්පරව වෙසෙන සීලවතී පිරිස් උපාසිකා මාතාව දුර්ලභ ගණයෙහි ලා ගැණෙන සිංහල මහොපාසිකාවකැයි කීම දෙසක් නොවන්නේය.

තයේ දයං කතං මහාපුණ්ණං
හොතු නිබ්බාණස්ස පච්චතයා

**පරවාහැර පඤ්ඤානන්ද**
**නායක මහා ථෙර**

පධාන සර මහා විහාර
174 සිරිවජිරඤාන මාවත,
කොළඹ 9.

# පොත ගැන

අභිධර්මාර්ථ පිළිබඳ ස්වරූප ධර්ම ස්වල්පයක් පිළියෙළ කලේ පොතක් වශයෙන් පලකිරීමේ අදහසකින් නොවේ. අපේ පංති වල ඉගෙන ගන්නා පින්වතුන්ට එදිනෙද ඉගෙන ගන්නා පාඩම් ගැන නැවත බලා ගැනීමට උපකාරයක් වශයෙන් බලාගන්න දීම සඳහා ය. මා අසනීපව සිටිය දී අප සමිතියේ පින්වතුන් කීප දෙනෙක් විසින් එය අච්චුගැසීමට භාර දීමෙන් පොතක් වශයෙන් පළ විය. මෙහි අවසාන කොටස් තුන ද බෞද්ධ කල්‍යාණ මිත්‍ර සමිතියේ ගිහි අනුශාසක තුමාගේ ඕනෑකම නිසා යන්තමින් පිළියෙල විය. මෙහි අඩුපාඩු කොතෙකුත් ඇත. ඒ ගැන නොසිතා ධර්ම කාරණය තේරුම් කර ගන්නා ලෙස කරුනාවෙන් මතක් කරමි.

අභිධර්මාර්ථ සංග්‍රහයට අර්ථ ලියා සකස් කරන ලද වටිනා පොතක් අපගේ ද ආචාර්යයන් වහන්සේ වන දෙමටගොඩ මහවිසුද්ධාරාමාධිපති ත්‍රිපිටක විද්‍යාලයාධිපති වූද සෙව්ජින් නිකායේ මහානායක වූද අති පූජ්‍ය දෙවිනුවර ඥානාවාස මාහිමි පානෝ විසින් බොරැල්ලේ තරුණ බෞද්ධ සමිතියේ පින්වත් මහතුන්ගේ ආරාධනාව පිළිගෙන ''අභිධර්ම'' නමැති ඉතා වටිනා පොතක් පිළියෙල කර තිබුනි. ගිහි පැවිදි සියලු දෙනාම එය ඉතා ගෞරවයෙන් භාවිත කළෙමු. ඒ පොත දැන් සොයා ගත නොහැක. ඒ බලවත් පාඩුවකි. නැවත ඒ පොත පළකරන්නේ නම් අභිධර්මය ඉගෙන ගන්නා සියලු දෙනාටමත් අභිධර්මයටත් කරන විශාල උපකාරයක් විය යුතුය. විශාල සැලකීමකි. ඉතා උතුම් වටිනා පින්කමකි.

අභිධර්මයෙන් නාම රූප ධර්ම දෙක යයි සම්මත සත්ව ප්‍රඥප්තිය පිළිබඳ දැනුම ලබාගන විදර්ශනා භාවනා කර ප්‍රති වේධය ලබාගැනීමයි. මෙහි ස්කන්ධ ආයතන ධාතු වශයෙන්

බෙදා දක්වා ඇති ධර්ම පුඤ්ජය නම් වූ සත්ව ප්‍රඥප්තිය කෙරෙහි ඇති මුලාව දුරුකර ගැනීමට කොටස් පසක් සේ පෙන්වා වදාල රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන කොටස් පස අතුරෙන් රූප කොටස් එකක් ද නාම ධර්ම කොටස් සතරක් (4) ක් ද පෙන්වා තිබීමෙන් භාවනා කිරීමෙන් නාමය කෙරෙහි පවත්නා මුලාව දුරුවී යන්නේය. ආයතන දොළසක් දේසනා කිරීමේදී ආයතන දසය කුත් බාගයක් රූප ධර්ම පෙන්වා තිබීම විදර්ශනා භාවනා වශයෙන් බැලීමෙන් රූපය කෙරෙහි පවත්නා ආත්ම සංඥාව දුරුවී යන්නේ ය.

ධාතු කොටස් දහඅට (18) විදර්ශනා භාවනා වසයෙන් බැලීමෙන් නාම ධර්ම කොටස් හතකුත් භාගයක් ද, රූප ධර්ම කොටස් දහයකුත් කොටසක් ද වශයෙන් විදර්ශනා නුවනින් බැලීමෙන් නාම රූප දෙක කෙරෙහි ම පවත්නා ආත්ම සංඥාව දුරුවන්නේය. මුලාව දුරුවන්නේය. නාම රූප කෙරෙහි පවත්නා සත්ව සංඥාව, දුරුකරගැනීමට උපකාර වීම සඳහා ද මිථ්‍යාදිට්ඨිය දුරුවී යාම සඳහා ද ඉතා ගෞරවයෙන් ධර්මය ඉගෙන ගත යුතු වන්නේය. නිර්වාණාව බෝධය පිණිස උපකාර වන්නේය. ක්ලේශ ධර්ම තදංග සමුච්ඡේද ආදී වශයෙන් යටපත් කර විනාස කර නිර්වානාවබෝධය ලබන්ට උපකාර ලබා ගන්නේය.

ප්‍රධාන සර විහාරාධිපති වූද, රුහුණු සරසවියේ කුලපති ධුරය දරන්නා වූ ද අතිපූජ්‍ය පරවාහැර පඤ්ඤානන්දභිධාන මාහිමි පාණන් වහන්සේ වෙත මේ මාගේ සුලු ලිපි ගොනුව ගෞරවයෙන් පිළිගන්වා ඊට යමක් ලියා දෙන මෙන් කරන ලද ආරාධනාව සතුටින් පිළිගෙන ඉතා වටිනා දහම් කරුණු ඇතුලත් අවවාදාන්විත අගනා ලිපියක් සපයා දීමෙන් කරන ලද ධර්ම සංග්‍රහය ඉතා ගෞරවයෙන් මෙහි පලවේ.

අපට කවදත් පින්කම්වලදී බොහෝ උපකාර ලැබී ඇති මේ නායක හිමිපාණන් වහන්සේගෙන් බැව් ඉතා සතුටින් මතක් කරමි. මීට අවුරුදු තිහකට (30) පමණ පෙර සිදුවූවකි. අපේ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සභාව මගින් පවත්වන ත්‍රිපිටක ධර්ම පරීක්ෂණය සඳහා දුර බැහැරින් වඩිනා ස්වාමීන් වහන්සේලාට ආවාස පහසුකම් දීම අපේ පරමාර්ථ සභා ශාලාවේන් නොලැබී ගියාට පසු සිදුවූයේ

විශාල කරදරකාරි තත්ත්වයකි. ඒ අවස්ථාවේ මම බෝධි නාගොඩ මහත්මියත් සමග එහි ගොස් අපට සිදුවූ සියල්ල කියා සිටි කල්හි ඉතා කරුණාවෙන් අපට අවවාද කර අපට පැදුරු කොට්ට, පිහන් කෝප්ප ආදී බඩු බාහිරාදිය තබා ගැනිමට සුරක්ෂිත ලොකු කාමරයක් ලබා දී ස්වාමීන් වහන්සේලාට ආවාස පහසුකම් ද සඳහා ශාලාවක් ද දන් පිළියෙල කර දීමට ශාලාවක් ද මුලුතැන් ගෙය ආදී සියලු පහසුකම් අද දක්වා ලබාදීමෙන් ද ත්‍රිපිටක විභාග යේ වැඩ කර ගැනිමට අපට සැනසීම ලබාදීමෙන් ඉතා විශාල උපකාරයක් විය. එය ඉතා ගෞරවයෙන් නැවත සිහි පත් කරමි. කලගුණ සැලකීම් වශයෙන් ගෞරවයෙන් දෙපා වැඳ අපගේ ප්‍රමාද දෝෂයකින් වරදක් වී ඇත්නම් නමස්කාර පෙරදැරිව සමාව අයැදිමි. නාහිමිපාණන් වහන් සේට රත්නත්‍රයේ ආනුභාවයෙන් සහ සම්‍යක්දෘෂ්ටික සියලු දෙවියන්ගේ ආරක්ෂාව නිති සැලසේවා, දීර්ඝායු ශ්‍රී සම්පත් සහ නිරෝගි සැප ලැබේවා, අපගේ ගුරුවර, මව්පිය, ඥාති මිත්‍ර සියලු දෙනාටම නිවන්සුව පිනිස ද හේතුවේවා,

අප සංගමයේ සාමාජිකයින් ගෙන් ලිපි සකස් කිරීම් ආදිය සහ අවසානය දක්වා පෘෂ්ප බැලීම් ආදියෙන් උපකාර වූ අප සංගමයේ භාණ්ඩාගාරික ඇල්. ආර්. වීරසිංහ අපගේ ඥාතිවරියට ද පින් සිදුවේවා.

මේ පොත බොහෝ උත්සාහයෙන් කීප වතාවක් කරුණු එකතු කිරීම් ආදී කරදර රාශියක් මධ්‍යයේ කර දුන් ශ්‍රීදේවි මුද්‍රණාලයාධිපති පින්වත් මහේන්ද්‍ර සේනානායක මහතා ඇතුළු සියලු භවතුන්ට අනේක වාරයක් පින් අනුමෝදන් කරවිමෙන් අපගේ ස්තූතිය සහ පින් අනුමෝදනාව පිරිනැමේ. ධර්ම දානමය පුණ්‍යකර්මයේ පින නොඅඩුව ලැබේවා. නිර්වාණාවබෝධයට හේතුවේවා.

මෙයට,

බුදුසසුනේ දියුණුව පතන

**සීලවතී පීරිස් උපාසිකාව.**

# පටුන

පිටුව


| | | | |
|---|---|---|---|
| 1 | අභිධර්මාර්ථ සංග්‍රහ පාලිය | .. | 01 |
| 2 | පරමාර්ථ ධර්මයන්ගේ ස්වරූප | .. | 07 |
| 3 | රූප පරමාර්ථය | .. | 08 |
| 4 | නිර්වාණ පරමාර්ථය | .. | 09 |
| 5 | ප්‍රඥප්ති ධර්ම | .. | 10 |
| 6 | නාම රූප බෙද දැක්වීම | .. | 11 |
| 7 | කාමාවචර සිත් 54 ස්වරූප | .. | 12 |
| 8 | රූපාවචර සිත් | .. | 36 |
| 9 | අරූපාවචර සිත් | .. | 39 |
| 10 | ලෝකෝත්තර සිත් .. | .. | 42 |
| 11 | සිත් 89 භූමි ආදිය වශයෙන් බෙද දැක්වීම | .. | 51 |
| 12 | සිත් 121 ස්වරූප .. | .. | 53 |
| 13 | චෛතසික පරමාර්ථය | .. | 54 |
| 14 | චෛතසික පරමාර්ථ ස්වරූප | .. | 61 |
| 15 | සම්ප්‍රයෝග නය සහ සංග්‍රහ නය | .. | 83 |
| 16 | සිත් සියල්ලෙහි ස්වරූප | .. | 85 |
| 17 | ප්‍රකීර්ණක සංග්‍රහ පාලිය | .. | 88 |
| 18 | ප්‍රකීර්ණක සංග්‍රහයෙහි ස්වරූප | .. | 95 |
| 19 | හේතු සංග්‍රහය සහ කෘත්‍ය සංග්‍රහය | .. | 96 |
| 20 | කෘත්‍ය සංග්‍රහයෙහි ස්ථාන භේදය | .. | 103 |
| 21 | ද්වාර සංග්‍රහය .. | .. | 106 |
| 22 | ආරම්මණ සංග්‍රහය .. | .. | 108 |
| 23 | වස්තු සංග්‍රහය .. | .. | 111 |
| 24 | වීථි සංග්‍රහය .. | .. | 113 |

| | | පිටුව |
|---|---|---|
| 25 | වීථි සංග්‍රහය ස්වරූප .. | 120 |
| 26 | චිත්ත වීථි (පංචද්වාර) .. | 127 |
| 27 | මනෝ ද්වාරික වීථි .. | 135 |
| 28 | මරණාසන්න වීථි .. | 141 |
| 29 | අර්පණා ජවන වීථි .. | 143 |
| 30 | මාර්ග වීථි .. | 150 |
| 31 | නිරෝධ සමාපත්ති වීථිය .. | 156 |
| 32 | අර්පණා ජවන වාරය (ද්වත්තිංස ගාථාව) .. | 157 |
| 33 | තදාරම්මණ නියමය .. | 159 |
| 34 | ජවන නියමය .. | 161 |
| 35 | පුද්ගල භේදය .. | 163 |
| 36 | වීථි මුක්ත සංග්‍රහයෙහි ස්වරූප .. | 176 |
| 37 | කාමාවචර පටිසන්ධි 10 .. | 180 |
| 38 | රූපාවචර පටිසන්ධි 6 .. | 183 |
| 39 | අරූපා පටිසන්ධි 4 . | 184 |
| 40 | විපාකදෙන පිළිවෙලින් කර්ම චතුෂ්කය .. | 186 |
| 41 | විපාක දෙන කාල වශයෙන් කර්ම ,, .. | 187 |
| 42 | විපාකදෙන ස්ථාන වශයෙන් කර්ම .. .. | 188 |
| 43 | මරණොත්පත්ති චතුෂ්කය .. | 193 |
| 44 | රූප ධර්මයන්ගේ ස්වරූප .. | 204 |
| 45 | රූප සමුද්දේසය .. .. | 209 |
| 46 | රූප විභාගය .. .. | 210 |
| 47 | රූප සමුට්ඨානය .. .. | 211 |
| 48 | කර්මජ රූපා කලාප ආදිය .. | 213 |
| 49 | රූප පවත්නා ක්‍රමය .. .. | 215 |
| 50 | නිර්වාණ පරමාර්ථය .. .. | 217 |
| 51 | රූප වීථි 3 .. .. | 221 |
| 52 | සමුච්චය කාණ්ඩය ස්වරූප .. | 235 |
| 53 | අකුසල සංග්‍රහය ආසව ආදිය .. | 236 |
| 54 | ග්‍රන්ථ ධර්ම ආදිය .. | 238 |
| 55 | උපාදන .. .. | 239 |
| 56 | නීවරණ .. .. | 240 |

පිටුව


| | | |
|---|---|---|
| 57 | අනුසය .. .. | 241 |
| 58 | සංයෝජන .. .. | 243 |
| 59 | අභිධර්ම ක්‍රමයට සංයොජන .. | 244 |
| 60 | ක්ලේශ .. | 246 |
| 61 | මිශ්‍රක සංග්‍රහය .. | 247 |
| 62 | ඉන්ද්‍රිය ධර්ම, සහ බලධර්ම, අයපති ධර්ම, ආහාර | 248 |
| 63 | බෝධිපාක්ෂික සංග්‍රහය විස්තරය .. | 252 |
| 64 | සර්ව සංග්‍රහය විස්තරය .. | 245 |
| 65 | පටීච්ච සමුප්පාදනය .. | 276 |
| 66 | උදන ගාථාව .. | 277 |
| 67 | විස්තරය .. | 279 |
| 68 | විසති නය සන්ධි සංඛෙප ආදි .. | 282 |
| 69 | පටිච්ච සමුප්පාද නය සතර .. | 286 |
| 70 | පටිලොම පටිච්ච සමුප්පාදය .. | 287 |
| 71 | පට්ඨාන නය .. | 292 |
| 72 | නාමය නාමයට 6 ආකාරයකින් උපකාරවීම | 297 |
| 73 | නාමය නාම රූප 2 ට 5 .. .. | 297 |
| 74 | රූපය නාමයට 1 .. .. | 298 |
| 75 | ප්‍රඥප්තියද නාමයද රූපයද නාමයට 2 ආකාරයකින් උපකාරවේ | 298 |
| 76 | නාමරූපදෙක නාමරූපදෙකට 9 ආකාරයකින් උපකාරවේ | 299 |
| 77 | නාම රූප හා ප්‍රඥප්තීන් බෙද දක්වීම .. | 302 |
| 78 | කර්මස්ථාන කාණ්ඩය .. | 315 |
| 79 | විදර්ශනා භාවනාව .. | 316 |
| 80 | කර්මස්ථාන සියල්ල ප්‍රඥප්ති පරමාර්ථ වශයෙන් දක්වීම | 322 |
| 81 | විදර්ශනා භාවනා කර්මස්ථාන .. | 325 |
| 82 | මාර්ගාධි ගමයට අන්තරායික ධර්ම .. | 326 |
| 83 | විමොක්ඛ මුඛ .. | 329 |
| 84 | නව මහ විදර්ශනා ඥාන .. | 330 |
| | කර්මස්ථාන කාණ්ඩය අවසන් .. | 336 |

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# අභිධර්මාර්ත්ථ සංග්‍රහ පාලිය

## ප්‍රථම පරිච්ඡෙදය

1. සම්මා සම්බුද්ධ මතුලං සසද්ධම්මගණුත්තමං,
අභි වාදිය භාසිස්සං අභි ධම්මත්ථ සංගහං.

2. තත්ථ වුත්තාභි ධම්මත්ථා චතුධා පරමත්ථතො,
චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා.

3. තත්ථ චිත්තං තාව චතුබ්බිධං හොති.
කාමාවචරං, රූපාවචරං, අරූපාවචරං,
ලොකුත්තරං චෙති.

4. තත්ථ කතමං කාමාවචරං? සොමනස්ස සහගතං දිට්ඨි ගත සම්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨි ගත සම්පයුත්තං අසංඛාරික මෙකංසසංඛාරිත මෙතං උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරික මෙකන්ති ඉමානි අට්ඨපි ලොභ සහගත චිත්තානි නාම.

5. දොමනස්ස සහගතං පටිඝසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරික මෙකන්ති ඉමානි ද්වෙපි පටිඝසම්පයුත්ත චිත්තානි නාම.

6. උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්ත මෙකං, උපෙක්ඛා සහගතං උද්ධච්චසම්පයුත්තමෙකන්ති ඉමානි වෙපි මොමූහ චිත්තානි නාම.

7. ඉච්චෙවං සබ්බථාපි ද්වාදසා' අකුසලචිත්තානි සමත්තානි.

8. අට්ඨධා ලොභමූලානි දෙසමූලානි ච ද්විධා, මොහ මූලානි ච වෙති ද්වාදසා'කුසලා සියුං.

9. උපෙක්ඛා සහගතං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං ඝාණ විඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, දුක්ඛ සහගතං-කාය විඤ්ඤාණං උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං, තථා සන්තීරණඤ්වෙති ඉමානි සත්තපි අකුසල විපාක චිත්තානි නාම.

10. උපෙක්ඛාසහගතං චක්ඛුවිඤ්ඤාණං තථා සොතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, සුඛසහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං,

සොමනස්සසහගතං සන්තීරණං, උපෙක්ඛා සහගතං සන් තීරණං ඤ්වෙති ඉමානි අට්ඨපි කුසලවිපාකාහෙතුක චිත්තානි නාම.

11. උපෙක්ඛාසහගතං පඤ්චද්වාරාවජ්ජනං, තථා මනොද්වාරාවජ්ජනං. සොමනස්සසහගතං හසිතුප්පාදඤ්වෙති ඉමානි තීණිපි අහෙතුක ක්‍රියාචිත්තානි නාම.

12. ඉච්චෙවං සබ්බථාපි අට්ඨාරස අහෙතුක චිත්තානි සමත්තානි.

13. සත්තාකුසලපාකානි පුඤ්ඤපාකානි අට්ඨධා,
ක්‍රියාචිත්තානි තීණීති අට්ඨාරස අහෙතුකා.

14. පාපාහෙතුක මුත්තානි සොභනානීති වුච්චරෙ,
එකූනසට්ඨි චිත්තානි අථෙක නවුතීපි වා.

15. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමේකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරික මෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරික මෙකන්ති ඉමානි අට්ඨපි කාමාවචර කුසලචිත්තානි නාම.

16. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර විපාක චිත්තානි නාම.

17. සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං, ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකන්ති ඉමානි අට්ඨපි සහෙතුක කාමාවචර ක්‍රියාචිත්තානි නාම.

18. ඉච්චෙවං සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

19. වෙදනා ඤාණ සංඛාර භෙදෙන චතුවීසති.
සහෙතුකාමාවචර පුඤ්ඤ පාක ක්‍රියා මතා.

20. කාමෙ තෙවීස පාකානි පුඤ්ඤා පුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියා චෙති චතුපඤ්ඤාස සබ්බථා.

21. විතක්ක විචාර පීතිසුඛෙකග්ගතාසහිතං පඨමජ්ඣාන කුසල චිත්තං, විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන

කුසලචිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කුසල චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කුසලචිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසල චිත්තං චෙති ඉමානි පඤ්චපි රූපාවචර කුසල චිත්තානි නාම.

22. විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං, විචාර පීතිසුඛෙකග්ගතාසහිතං දුතියජ්ඣාන විපාක චිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන විපාකචිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තං චෙති ඉමානී පඤ්චපි රූපාවචර විපාක චිත්තානි නාම.

23. විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන ක්‍රියා චිත්තං. විචාර පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන ක්‍රියාචිත්තං, පීතිසුඛෙකග්ගතාසහිතං තතියජ්ඣාන ක්‍රියා චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජඣාන ක්‍රියා චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන ක්‍රියා චිත්තං චෙති ඉමානි පඤ්චපී රූපාවචර ක්‍රියා චිත්තානි නාම.

24. ඉච්චෙවං සබ්බථාපි පණ්ණරස රූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

25. පඤ්චධාඣාන භෙදෙන රූපාවචර මානසං,
පුඤ්ඤපාක ක්‍රියා භෙද තං පඤ්ච දසධා භවෙ.

26. ආකාසානඤ්චායතන කුසල චිත්තං, විඤ්ඤාණඤ්චා යතන කුසල චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල චිත්තං චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර කුසල චිත්තානි නාම.

27. ආකාසානඤ්චායතන විපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තං, ආකිඤ්චඤ්ඤායතන විපාකචිත්තං නෙව සඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තං චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර විපාක චිත්තානි නාම.

28. ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තං, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තං, ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තං චෙති ඉමානි චත්තාරිපි අරූපාවචර ක්‍රියා චිත්තානි නාම.

29. ඉච්චෙවංසබ්බථාපි ද්වාදස අරූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි සමත්තානි.

30. ආලම්බනප්පභෙදෙන චතුධා රූප්පමානසං,
පුඤ්ඤපාක ක්‍රියා භෙද පුන ද්වාදසධා ඨිතං.

31. සොතාපත්තිමග්ග චිත්තං, සකදගාමීමග්ග චිත්තං, අනාගාමිමග්ග චිත්තං, අරහත්ත මග්ග චිත්තං චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර කුසල චිත්තානි නාම.

32. සොතාපත්ති ඵල චිත්තං, සකදගාමි ඵල චිත්තං, අනාගාමි ඵල චිත්තං, අරහත්තඵල චිත්තං චෙති ඉමානි චත්තාරිපි ලොකුත්තර විපාක චිත්තානි නාම.

33. ඉච්චේවං සබ්බථාපි අට්ඨලොකුත්තර කුසල විපාක චිත්තානි සමත්තානි.

34. චතුමග්ගප්පභෙදෙන–චතුධා කුසලං තථා,
පාකංතස්සඵලත්තාති–අට්ඨධානුත්තරං මතං.

35. ද්වාදසා කුසලා නෙවං–කුසලානෙකවීසති,
ඡත්තිංසෙවවිපාකානි–ක්‍රියා චිත්තානි වීසති.

36. චතුපඤ්ඤාසධා කාමෙ–රූපෙ පණ්ණරසීරයෙ,
චිත්තානි ද්වාදසාරූප්පෙ–අට්ඨධානුත්තරෙ තථා,

37. ඉත්ථමෙකූනනවුතිප්පභෙදං පන මානසං,
එකවීසසතං වාථ විභජන්ති විචක්ඛණා.

38. කථමෙකූන නවුතිවිධං චිත්තං එකවීස සතං හොති?

විතක්කවිචාරපීතිසුඛෙකග්ගතාසහිතං පඨමජ්ඣාන සොතා පත්තිමග්ග චිත්තං, විචාර පීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ් ඣාන සොතාපත්තිමග්ග චිත්තං පීතිසුඛෙකග්ගතා, සහිතං තතියජ්ඣාන සොතාපත්ති මග්ග චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣානසොතාපත්තිමග්ග චිත්තං, උපෙ ක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන සොතාපත්තිමග්ග චිත්තං චෙති ඉමානි පඤ්චපි සොතාපත්තිමග්ගචිත්තානි නාම.

39. තථා සකදාගාමි මග්ග අනාගාමිමග්ග අරහත්තමග්ග චිත්තං චෙති සමවිසති මග්ග චිත්තානි,

40. තථා ඵල චිත්තානි චෙති සමචත්තාළිස ලොකුත්තර චිත්තානි භවන්තී ති.

41. ඣානංග යොග භෙදෙන කත්වෙකෙකන්තු පඤ්චධා,
වුච්චතානුත්තරං චිත්තං චත්තාළිස විධන්තිච

42. යථාච රූපාවචරං ගය්හතානුත්තරං තථා,
පඨමාදි ඣාන භෙදෙ ආරුප්පඤ්චාපි පඤ්චමෙ.

43. එකාදසවිධං තස්මා පඨමාදික මීරිතං,
ඣානමෙකෙක මන්තෙ තු තෙවීසතිවිධං භවෙ.

44. සත්තතිංස විධං පුඤ්ඤං ද්විපඤ්ඤාසවිධං තථා,
පාකමිච්චාහු චිත්තානී එකවීසසතං බුධා.

ඉති අභිධම්මත්ථ සංගහෙ චිත්තසංගහ විභාගො නාම පඨමො පරිච්ඡෙදෙ

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# පරමාර්ථ ධර්මයන්ගේ ස්වරූප

## ප්‍රථම පරිච්ඡේදය

පරමාර්ථ වශයෙන් අභිධර්මාර්ථයෝ සිව්වැදෑරුම් වෙති. චිත්තය, චෛතසිකය, රූපය නිබ්බාන යයි සතර වැදෑරුම් වේ. එයින් අන්‍ය වූ පැණවීම් සියල්ල ප්‍රඥප්ති නම් වෙති. එහි ස්වරූපාර්ථයෝ නම් සිත යනු අරමුණු ගන්නා ධර්මයයි. ''ආරම්මණ විජානන ලක්ඛණං චිත්තං'' යනුවෙන් සිත හඳුන්වනු ලැබේ. සිතේ ස්වභාව ලක්ෂණය අරමුණු දැනගැනීම යි. අරමුණ දැනගැනීම හැර එහි ඇලීම්, ගැටීම් ආදිය සිදුකිරීමට සිතට පමණක් කළ නොහැක. ඒවා සිදු කිරීමට සිත සමග උපදනා තවත් ධර්මරාශියක උපකාරය ලැබිය යුතු වේ.

### සිත සමග උපදනා අනික් ධර්ම

සිත සමඟ උපදනා අනික් ධර්ම චෛතසික නම් වේ. සිතට ද තනිව ඉපදීමේ ශක්තියක් නැත. චෛතසික ධර්මයන්ටද සිතින් තොරව තනිව ඉපදීමේ ශක්තියක් නැත. මේ ධර්ම දෙකොටසම සැමවිටම එකටම උපදනෝ ය. එය ක්‍රමානුකූලව තැනට කාරණයට සුදුසු පරිදි උපදියි. සිත් සියල්ල ගණන් වශයෙන් 89 ක් හෝ 121 ක් ද චෛතසික ධර්ම 52 ක් ද තිබේ. සිතක් උපදිනුයේ අරමුණක එල්බගෙන ය. අරමුණකින් තොරව සිතක් නූපදනේය. එම සිතට සුදුසු පරිදි චෛතසික ධර්ම ද සිත සමඟම එකවිටම උපදනේය. එකටම නිරුද්ධවන්නේය. සිතක් ඉපද පවත්නා කාලය ඉතා කෙටි කාලයකි. චෛතසික ධර්මයන්ද එසේ එකටම පැවත බිඳීයන්නේය. මේ නාම ධර්ම දෙකොටසටම ස්ව ශක්තියෙන් සිටීමේ හැකියාවක් නැත්තේය. ඔවුනොවුන්ගේ උපකාරයද ලැබිය යුතු වේ. අරමුණෙන් තොර වද නූපදනේය.

නාම රූප ධර්ම හඳුනාගැනීමට සෑම ධර්මයක්ම තම තමාට වෙන් වූ ස්වභාව ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. අරමුණු ගැනීම් ස්වභාවය සිතේ ලක්ෂණය යි. ලෝභාදී චෛතසික ධර්මයන්ගේද වෙන වෙනම ලක්ෂණ චෛතසික කාණ්ඩයෙහි පෙන්වන්නේය.

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි පළමුව පෙන්වන්නේ ලෝභ මූල සිත් වලින් ආරම්භකොට අකුසල් සිත් දොළසයි. ඊළඟට එහි විපාක සිත් ද ඉගෙනීමේ පහසුව තකා ඊළඟටම කුසල විපාක අහේතුක සිත් කොටසත් ක්‍රියා සිත් කොටසක් ද යන අහේතුක සිත් 18 ය. අශෝභන, නමින් අකුසල් සිත් සහ අහේතුක සිත් පෙන්වා ඊට අනතුරුව ශෝභන සිත් වශයෙන් ඉතිරි සිත් සියල්ල වදළසේක.

ශෝභන සිත් සියල්ල කාමාවචර කුසල විපාක ක්‍රියා වශයෙන් 24 ක් ද, රූපාවචර කුසල විපාක ක්‍රියා වශයෙන් සිත් 15 ක් ද, අරූපා වචර කුසල විපාක ක්‍රියා වශයෙන් සිත් 12 ක් ද, ලෝකෝත්තර කුසල විපාක වශයෙන් 8 ක් ද, වදළසේක. මෙසේ සිත් 89 පෙන්වා ඊට අනතුරුව චෛතසික පරමාර්ථය සබ්බ චිත්ත සාධාරණ 7 ද, ප්‍රකීර්ණක 6 ද, අකුසල චෛතසික 14 ද ශෝභන චෛතසික 25 දැයි චෛතසික පෙන්වා තිබේ.

## රූප පරමාර්ථය

රූප ධර්මයෝ ගණන් වශයෙන් 28 කි. චිත්ත චෛතසිකාදී නාම ධර්ම මෙන් ඇසට නොපෙනෙන කනට නොඇසෙන ස්වභාවයෙන් යුක්ත නොවේ. ඇසට පෙනෙන කනට ඇසෙන අතින් අල්ලා දැනගත හැකි ස්වභාව ධර්මයන්ය. ශීත උෂ්ණ ආදී තම තමාට විරුද්ධ ප්‍රත්‍ය ධර්මයන්ගේ පහර ලැබ විනාශ වේනුයි විකාරයට වෙනස් ස්වභාවයට පළමු පැවති ස්වභාවයෙන් පැවතීමට නොහැකිව වෙනස් ආකාරයට රූප උපදවානුයි රූප වේ.

රූප ධර්මයන් ද කොටස් වශයෙන් කීපයකි. මහා භූත රූප 4 කි. ඒ මහා භූත රූප පවත්නා කල්හි ඒ අනුව එහි උපකාරයෙන් තවත් රූප 24 ක් ඇති වේ. එය උපාදරූප නම් වේ. උපාදරූපයන් ගෙන් වර්ණ රූපයත්, ගන්ධ රූපයත්, රසරූපයත්, ඕජාරූපයත් යන රූප කැබලි සතර මහාභූතරූප සමගම ඇති වේ. මහාභූත රූපයෝ නම් පඨවි මහාභූතරූපය,

ආපෝ මහාභූත රූපය, තේජෝ මහාභූත රූපය, වායෝ මහාභූත රූපය යනුවෙන් සතරකි. මහාභූත රූප සතර නිසා ඒ සමගම වර්ණාදී උපාද රූප සතරත් එකටම ඇතිවන්නේය. එයට ශුද්ධාෂ්ටකයයි කියනු ලැබේ.

රූප ධර්මයෝ විරුද්ධ ප්‍රත්‍ය වන රූප ධර්මයන්ගේ ගැටීම පහර ලැබීමෙන් විනාශ වන්නාක් මෙන්, ශීත උෂ්ණ ආදී ප්‍රත්‍ය ධර්මයන්ගේ උපකාරය ලැබීමෙන් වැඩීම ද සිදුවන්නේ ය. නාම ධර්මයන්ට වඩා වැඩි ආයු කාලයක් රූප ධර්මයන්ට තිබේ. සිත් 17 කාලයක් සිත් 17 ක් ඉපිද බිඳීයන නිරුද්ධවී යන කාලයක් රූප ධර්මයක ආයු කාලයයි. ඊට පසු රූප ධර්ම ද බිඳී අවසන් වන්නේය. රූපය පවත්නා කාලයේ ඒ රූපයන්ගේ උපකාරයෙන් තවත් රූප උපදනේය. එබැවින් රූපයේ හානිය නොපෙනේ.

## නිර්වාණ පරමාර්ථය

නිර්වාණය ලෝකෝත්තර පරමාර්ථ ධර්මයයි. තෘෂ්ණා වෙන්ද සියළු ලෞකික ධර්මයන්ගෙන් ද නික්මී ලබන ශාන්ත ප්‍රණීත ධර්මය නිර්වාණය යි. කෙලෙස් ගිනි නිවීයාම නිර්වාණාවබෝධය ලැබීම නිසා සිදු වේ. ''සාන්ති ලක්ඛණං අච්චුති රසං''

යනුවෙන් නිර්වාණ ධර්මයෙහි ලක්ෂණාදිය පෙන්වා තිබේ. ධ්‍යාන ලබා රූප, අරූප ලෝකයන්ට පැමිණි අය පවා මාර්ග ඵලාදියක් නොලැබූ යේනම් නැවත කාම ලෝකයටද පසුව සතර අපායටද පමුණුවන ශක්තිය ඇති අයය. නිර්වාණාව– බෝධය ලත් ආර්‍ය්‍ය සෝවාන් උතුමන් නැවත එයින් පිරිහීමක් නොවන්නේ ය.

ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග නමැති ශ්‍රොතයට අසුවූවාට පසු අනුපාදිසෙස පරිනිර්වාණය කරාම යන්නේය. ආර්‍ය්‍යයන් අටදෙනා ගෙන් පළමුවැන්නා සෝවාන් මාර්ගය ලත් ආර්‍ය්‍යයන් වහන්සේය. මාර්ග සිතට අනතුරුවම ඵලසිත ලැබෙන බැවින් සෝවාන් ඵලස්ථයින් වහන්සේ ය. ''අකාලිකො'' යන නව ලොව්තුරු දහම් ගුණ පදයෙන් පෙන්වන්නේ මාර්ග සිතට අනතුරුවම ඵල සිත ලබන තැනැත්තා ගැනය. සෝවාන් ඵලය ලත් ආර්‍ය්‍යයන් කාම ලෝකයේ සත්වරකට වඩා නූපදනේ ය. සකෘදගාමීන් එක් වරක් කාම ලෝකයේ උපත ලබන්නේ ය.

අනාගාමීන් කාම ලෝකයේ උපත නොලබන්නේ ය. අර්හත් ඵලයට පැමිණි ආයර්‍යයන් වහන්සේ කොතනක හෝ නූපදනේය.

## ප්‍රඥප්ති ධර්ම

සතර පරමාර්ථ ධර්ම හැර ලෝක ව්‍යවහාරයේ පවත්නා සියල්ල පැණවීම් වශයෙන් කථා ව්‍යවහාරයට සුදුසු පරිදි සම්මත යෙන් පණවා ගත් වචන මාලාව ප්‍රඥප්තිය හෙවත් සම්මුති සත්‍යය යි. කථා ව්‍යවහාර වශයෙන් එක් එක් වස්තු පුද්ගලාදීන් හඳුනා ගැනීමට නිතර ලෝක සත්වයා ව්‍යවහාර කරන හෙයින් එයද ලෝක වාසීහු ඒකාන්ත සත්‍යයක් ලෙසම භාවිතා කරති. බුදුරජාණන් වහන්සේ ද එය සම්මුති සත්‍ය ලෙස වදළ සේක. සම්මුති සත්‍යයෙහි පිහිටා සුචරිත යෙහි යෙදෙන්නන් හට එයින් කුසල් සිදුවේ. මෙලොව පරලොව දෙකෙහිම සැප විපාක ලැබෙන්නේය. දුසිරිතෙහි යෙදෙන්නන් හට දුක් විපාක වශයෙන් සතර අපා දුක්ද ලැබෙන්නේ ය.

සත්ව පුද්ගල, දේව, බ්‍රහ්ම, මිනිස්, තිරිසන් ආදීන් ද, ගස්, ගල්, භූමි, පර්වත, ඇල, දොළ, ගංගා, සාගර ආදීවූ නාමයන්ද ඇඳ, පුටු, මේස ආදි භාණ්ඩ යන්ටද සම්මතයෙන් පණවාගෙන භාවිත වන වචන සත්‍යයක් සේම වැටහෙන්නේ ය. පරමාර්ථ සත්‍යයට ලා නොබලන්නේ නම් ඒ සියලු ව්‍යවහාර ඒකාන්ත සත්‍ය ලෙසම පිළිගැනීම වේ. ඒවා ධර්මයෙහි වාග් සත්‍ය යයි ද ව්‍යවහාර වන්නේ ය.

පරමාර්ථ සත්‍ය වශයෙන් ව්‍යවහාර කරන්නේ නම් නාම රූප සමූහයක් ස්කන්ධ පඤ්චකයත් ආදී වශයෙන් භාවිතා වූයේ නම් මහත් අවුලක් වන්නේ ය. මිනිසුන් පවා වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වන්නේ ය.

බුදුරජාණන් වහන්සේ ද සම්මුති සත්‍යයෙහි පිහිටා තමන් වහන්සේගේ අතීත ජාතීන් පිළිබඳ දේශනා කළ සේක. ජාතක දේශනාවන්හිදී තමන් වහන්සේ සේනක පණ්ඩිතව ඉපිද මේ ආකාර දේශනා කළේ යයි ද, නාගරාජව ඉපිද සිල් ආරක්ෂා කළ ආකාරය ද මේ ආදී බෝධි සම්භාරය පූරන කාලය ගැන දේසනා වන්හිදී සම්මුති සත්‍යයෙහි පිහිටා දේසනා කල සේක.

පරමාර්ථ සත්‍යය ද ආර්‍ය්‍ය සත්‍යය ස්වභාව සත්‍යයයි දෙපරිදි වේ. ආර්‍ය්‍ය සත්‍යය නම් දුක්ඛ ආර්ය සත්‍යයයි, සමුදය සත්‍යයයි, නිරෝධ සත්‍යයයි, මාර්ග සත්‍යය යි සතරාකාර වේ. සීල සමාධි ප්‍රඥාවන් සම්පූර්ණ කොට මාර්ගඵලාවබෝධයට උපකාර වන්නේ චතුරාර්‍ය්‍ය සත්‍යය යි. ආර්‍ය්‍ය සත්‍යාවබෝධය නිවනට පැමිණීමේ ඒකායන මාර්ගයයි. කොපමණ උසස් ලෙස සිල් සම්පූර්ණ කලත් සීලයෙන් වත් සමාධිය සම්පූර්ණ කොට එයින්වත් නිර්වාණාවබෝධය කළ නොහැක. විදර්ශනා භාවනා වැඩීම් වශයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සිත දියුණු කිරීමෙන් ලෝභ, දෝස, මෝහාදී නූපදනා තත්වයට සිත දියුණු කොට කෙලෙස් සහමුලින්ම නූපදනා තත්වයට පමුණුවා ලැබිය යුතු ධර්මයකි නිබ්බාන පරමාර්ථය.

පරමාර්ථ ධර්ම තේරුම් ගැනීමට සම්මුති සත්‍යය ද හරිහැටි තේරුම් ගත යුතු වේ.

## නාම රූප ධර්ම බෙද දැක්වීම

චිත්ත පරමාර්ථය සංක්ෂේපයෙන් සිත් 89 ද විස්තාර වශයෙන් සිත් 121 ද වේ. එය කාමාවචරය රූපාවචරය, අරූපාවචරය ලෝකෝත්තර යයි සතරා කාර වේ. කාම භූමීන්හි වැඩි වශයෙන් උපදනා සිත් කාමාවචර නම් වේ. රූපී බඹලොව වැඩි වශයෙන් උපදනා සිත් රූපාවචර නම් වේ. අරූප භවයන්හි වැඩි වශයෙන් උපදනා සිත් අරූපාවචර නම් වේ.

කාම භූමි 11 කි. එහි රූපාවචර අරූපාවචරාදී සිත් අතුරෙන් කුසල් සිත් සහ ක්‍රියා සිත් ඊට සුදුසු අවස්ථාවෙහි සුදුසු අයට ලැබෙන්නේය. එයද කාම සුගති භූමීන්හි පමණක් ලැබේ. රූපා රූප භූමීන්හිද කාමාවචර සිත් එසේම අවස්ථානු රූපව ලැබෙන්නේ ය.

කාම සුගති භූමීන්හි ලෝකෝත්තර සිත් සියල්ලම ලැබෙන්නේය. සුධාවාසයත් අසංඥතලයත් හැර ඉතිරි රූප භූමීන්හි ලෝකෝත්තර සිත් 8 ම ලැබෙති. අරූප භවයෙහි සෝවාන් මාර්ග සිත හැර ඉතිරි මාර්ගඵල සිත් ලැබෙන්නේ ය.

## කාමාවචර සිත් 54

කාමාවචර සිත් 54 හි අකුසල් සිත් 12 ක් ද අහේතුක සිත් 18 ක් ද කාම සෝභන නමින් කුසල් විපාක ක්‍රියා වශයෙන් 8 බැගින් ද ඇතිවන්නේ ය. කාම සෝභන සිත් සියල්ල 24 කි. අකුසල් සිත් 12 හි ලෝභමූල සිත් 8 කි. ද්වේස මූල සිත් 2 කි. මෝහ මූල සිත් 2 කි. සියල්ල 12 ක් වේ.

## අහේතුක සිත් 18 සහ කාම සෝභන සිත් 24.

අකුසල විපාක සිත් 7 ද, කුසල අහේතුක විපාක සිත් 8 ද, අහේතුක ක්‍රියා සිත් 3 ද 18 ය. කාමාවචර කුසල් සිත් 8 යි සහේතුක විපාක සිත් 8 යි, ක්‍රියා සිත් 8 යි සියල්ල 24 කි.

## රූපාවචර අරූපාවචර සිත් 27

රූපාවචර කුසල් සිත් 5 ද විපාක සිත් 5 ද, ක්‍රියා සිත් 5 ද ඇති වේ. අරූපාවචර කුසල් සිත් 4 ද, විපාක සිත් 4 ද, ක්‍රියා සිත් 4 ද යන දොළසක් ඇති වේ. මේ සිත් 27 මහද්ගත සිත් වශයෙන්ද හඳුන්වන්නේ ය. කාමාවචර සිත් වලට වඩා උතුම් වූ සමථ භාවනා බලයෙන් සමාධිය දියුණු කිරීමෙන් ලබන සිත් බැවින් මහද්ගත නම් වන්නේ ය. සමාධිය දියුණු කොට ධ්‍යාන ලැබීමෙන් බ්‍රහ්ම ලොකයෙහි උපදින්නේ ය. ධ්‍යානයන් ගේ වශයෙන් බ්‍රහ්ම ලෝකද වෙන් වන්නේ ය.

## ලෝකෝත්තර සිත් 8ය

සෝවාන් මාර්ග සිත හා එම ඵල සිත ද, සකෘදගාමි මාර්ග සිත හා එම ඵල සිත ද, අනාගාමී මාර්ග සිත හා එම ඵල සිත ද, අර්හත් මාර්ග සිත සහ එම ඵල සිතද යන සිත් 8 ලැබෙති.

## චෛතසික පරමාර්ථය

චෛතසික සියල්ල 52 කි. සබ්බ චිත්ත සාධාරණ නමින් සැම සිතකම නොඅඩුව ලැබෙන චෛතසික 7 කි. ප්‍රකීර්ණක චෛතසික 6 කි. එය සමහර සිත්වල එකක් වත් නූපදනේ ය. සමහර සිත්වල සියල්ල ද ඇතැම් සිත්වල කීපයක් ද උපදී. කුසලා කුසල විපාක ක්‍රියා සිත් සියල්ලෙහි විසිර පවත්නා බැවින් ප්‍රකීර්ණක නම් වේ.

අකුසල චෛතසික 14 කි. ඒවා අකුසල් සිත්වල පමණක් සුදුසු පරිදි උපදී.

සෝභන චෛතසික 25 කි. සෝභන සිත්වල පමණක් යෙදෙති. සෝභන සිත් වල ද එක් එක් කුසල් ආදීන්ට සුදුසු පරිදි යෙදෙති. සෝභන සාධාරණ නමින් 19 ද විරති චෛතසික තුනක් ද අප්පමඤ්ඤා දෙකක් ද ප්‍රාඥව ද යන 25 යි.

## රූප පරමාර්ථය

රූප ධර්ම සියල්ල 28 කි. මහාභූත රූප 4 ද ඒ මහා භූත රූප නිසා උපදිනා උපාද රූප 24 ද යන රූප 28 කි. රූප ධර්ම 28 එකොළොස් ආකාරයට ද බෙදෙන්නේ ය. මහා භූත රූප 4 ය ප්‍රසාද රූප 5 ය. විෂයරූප 7 ද (පොට්ටබ්බ රූපය සමග) භාව රූප 2 හදය රූපය ද, ජීවිත රූපය ද, ආහාර රූපය ද, පරිච්ඡෙද රූපය ද විඤ්ඤත්ති රූප 2 ද ලහුතාදී 3 ද, උපචය, සන්තති ජරතා අනිච්චතා රූප 4 ද යන රූප 28 යි. රූප පරමාර්ථය මෙසේ කොටස් වන්නේ ය.

## අකුසල් සිත් 12

### ලෝභ මූල සිත් 8

සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත
උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික සිත
උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික සිත
උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික සිත
උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික සිත

## ද්වේෂ මූල සිත් 2

දෙමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික සිත
දෙමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික සිත

## මෝහ මූල සිත් 2

උපේක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත
උපේක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත

## හීන උත්කෘෂ්ය වශයෙන් බෙද දැක්වීම

හීන උත්කෘෂ්ය වශයෙන් සිත් බෙද දැක්වීමෙදී අකුසල් සිත් හීන වූ පහත් සිත් වශයෙන් ද කාමාවචර කුසල් ආදිය උත්කෘෂ්ය සිත් වශයෙන් ද දක්වා තිබේ. උත්කෘෂ්ය තර වශයෙන් මහද්ගත සිත් පෙන්නුම් කරති. උත්කෘෂ්ය තම වශයෙන් ඉතාම උසස් ලෝකෝත්තර සිත් පෙන්වා තිබේ. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි හීනවූ අකුසල් සිත් පළමුව විස්තර කරති. අකුසල් සිත් අතුරෙන් ලෝභමූල සිත් 8 පළමුව විස්තර වේ.

## ලෝභමූල සිත්

අකුසල් සිත් අතුරෙන් ලෝභමූල සිත් 8 ක් ද, ද්වේෂමූල දෙකක් ද, මෝහ මූල සිත් දෙකක් ද යි අකුසල් සිත් 12 ක් වේ. අසෝභන සිත් වශයෙන් අහේතුක සිත් 18 සමග සිත් 30 කි. අසෝභන යනු සෝභන නාමයෙන් වදරන ලද සද්ධා, සති, කරුණා මුදිතා, ප්‍රඥා ආදි සෝභන ධර්ම හා නො යෙදෙන බැවිනි.

අසෝභන සිත් වලට ඇතුලත් අකුසල් සිත් සමග අසෝභන වූ ලෝභ ද්වේෂා දී අකුසල චෛතසික යෙදෙන බැවින් අසෝභන නම් වේ. අසෝභන ධර්ම හා යෙදෙන බැවින් හීන ධර්ම ද වේ. අකුසල් සිත් 12 අනිෂ්ට විපාක උපදවන බැවින් ද හීන වේ.

පළමුව වදරන ලද ලෝභමූල චිත්තයන්හි සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික කියා ද සංසංඛාරික කියා දෙවන සිත ද සංඛාර භෙදයෙන් දෙපරිදි වේ. සෝමනස්ස උපේක්ඛා වශයෙන් පළමුව කොටස් දෙකකට බෙදෙන්නේ ය. එය වේදනාවගේ වශයෙන් බෙදීමයි. සැප වේදනාව හා යුක්තව පළමු සිත් හතර සොමනස් වේදනාව සමග යෙදී අකුසල් කරන අවස්ථාවන්හි, සමහර අය බොහොම සතුටින් යුක්තව ඉතා උසස් හොඳ යහපත් ක්‍රියාවක් ලෙස සිතා සොමනස්ස සිතින්

යුක්තව බරපතල දුක්විපාක උපදවන අකුසල් කරන්නෝ ය. එය සැළියේ වතුර රත්වන තුරු කකුළුවා වතුර සැළිය තුල නටනටා සිටීම වැනි වේ. එසේ සොම්නස් සිත් සතරකි. උපේක්ඛා සිත් ද සතරකි.

මිත්ථ්‍යාදිට්ඨියෙන් යුක්තව සිත් සතරක් ඇතිවේ. මිථ්‍යා දිට්ඨිය නැතිව සතරක් ඇති වේ. තමාගේම තියුණු සිතින් පසුබැසීමක් නැතිව කරන අකුසලය අසංඛාරික ය. අනුන්ගේ අණ කිරීමක් මෙහෙයීමක් නිසා හෝ තමාගේම පසුබැසීමෙන් හෝ නැවත නැවත සිතීමෙන් යුතුව කළයුතු ද නොකළ යුතුද යන ස්වභාවයෙන් පසුබැසීමෙන් කරන කුසල් හෝ අකුසල් සසංඛාරික වේ. ප්‍රකෘතියෙන් නොඋපන් සිතක් ඉපදීමට පිළියෙල කෙරේ ද ඒ සංඛාර නම්. සිත පහළවීමට උපකාර වූ ප්‍රයෝගය හෝ උපායයි, ඒ.

මිථ්‍යාදිට්ඨිය ඇතිවීමට උපකාරක ධර්ම නම් මිථ්‍යාදිට්ඨි අදහස් ඇති බවය, මිථ්‍යාදිට්ඨි අදහස් ඇති අය ඇසුරුකිරීම, සද් ධර්මයට පිටුපෑමය. මිථ්‍යා විතර්ක ඇති බව, ඥානුවනින් මෙනෙහි කිරීම, යන මේ කරුණු ද මිථ්‍යා දිට්ඨිය ඇතිවීමට උපකාර වේ.

## ලෝභමූල සිත් ඇතිවන ආකාරය

ඉෂ්ට ප්‍රියමනාප අරමුණක් ලැබීමෙන් සිත සොම්නසින් යුක්ත වේ. අකුසලයෙහි නිවැරදි බව පිළිගෙන මිථ්‍යාදිට්ඨි යෙන් ද යුතු වේ. අසංඛාරිකව හෝ සසංඛාරිකව කාමමිථ්‍යා චාරය, බොරුකීම, කේලාම්කීම, හිස්බස් දෙඩීම, අන්සතුදේට ආසාකිරීම, මිථ්‍යාදිට්ඨිය ඇතිකරගැනීම, ආදී වශයෙන්, අකුසල් සතක් කරන්නෝ ය. මිථ්‍යාදිට්ඨි අදහස් නැතිවද මේ අකුසල් සයක් දිට්ඨි විප්ප යුක්ත සිතින් කරන්නෝ ය.

සොම්නසින් යුක්ත නොවී මධ්‍යස්ථව සිතා මැදහත් වේදනා වෙන් යුක්තව මේ අකුසල කර්ම පථ සත උපෙක්ඛා සහගත සිතින් ද කරන්නෝ ය. මිථ්‍යා දිට්ඨියෙන් තොරව වරද බව පිළිගෙන එහෙත් වරද කරන්නෝ ය. එහි මිථ්‍යා දිට්ඨියෙන් තොරව අකුසලය කරති. ඇතැම් විට මිථ්‍යා දිට්ඨිය නැතිව මානය ඇතිවීමෙන් තමන් දිට්ඨි විප්පයුක්ත සිතින් අකුසල් කරන්නෝ ය. මානය සැමවිටම නොයෙදෙනි.

මේ අකුසල් සතෙන් තුනක් ඒකාන්ත ලෝභමූල සිතින් කරන්නේ ය. කාමමිථ්‍යාචාරය, අභිධ්‍යාව, සහ මිත්‍ථ්‍යාදිට්ඨියයි. අනික් අකුසල් සතර සොරකම, මුසාවාදය, කේලාම්කීම, හිස් වචන කථා කිරීම, යන අකුසල් සතර ද්වේෂයෙන් ද කරති. මේ අකුසල් සිත් අට ලෝභය බලවත් හේතු ධර්මය වී උපදනේය. සියලුම අකුසල් සිත් සමග සාධාරණ මෝහයද යෙදෙන්නේ ය.

අකුසල් සිත් අට රූපාදී අරමුණු කෙරෙහි ද ඇති වේ. රූප තණ්හා, ශබ්ද තණ්හා ආදී වශයෙනි. කර්ම ද්වාර වශයෙන්ද කාය කර්ම ද්වාර, වාග් කර්ම ද්වාර, මනොකර්මද්වාර යන තුනෙහි ද උපදී. විමංසාධි පතිය හැර අධිපති ධර්ම තුනෙහි ද ඇති වේ. මෙසේ ක්‍රම රාශියකගේ වශයෙන් ඇති වේ. දස දහස් ආකාරයකට ඇතිවන්නේ ය.

## ද්වේෂමූල සිත් දෙක

ලෝභමූල සිත් අටට අනතුරුව ද්වේෂ මූල සිත් දෙක වදළ සේක. ද්වේෂයේ ස්වභාවය නම් අරමුණක් ගැනීමේදී අරමුණට අකමැති විරුද්ධ ස්වභාවයෙන් ගැනීමයි. තමාට වඩා බලවත් අරමුණක් වේ නම් භය ආකාරයෙන් ද, පිළිකුල් අරමුණක් වේ නම් අකමැති අප්‍රිය ස්වභාවයෙන් ද, අරමුණ ගනී. ද්වේෂය ස්වභාවයෙන්ම අරමුණට විරුද්ධව අරමුණු ගැනීම ය. ද්වේෂය ප්‍රධාන කාරණය වුවද අනික් ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච, ආදී චෛතසික ධර්ම රාශියක සහ මූල ධර්මයක් වන මෝහයේ ද බලවත් උපකාර ලැබ සිත උපදනේ ය.

මේ සිත් දෙක මානසික දෙම්නස් වේදනාවෙන් යුක්ත වේ. මානසික දුක දෙම්නස නිසාම ඇතිවන සිත් දෙකකි. සිතේ මැදහත් බවක් හෝ ඇති නොවේ. හැඬීම ඇති වන්නේ ද මේ සිත් දෙක උපන් කල්හි ය. ක්‍රොධය, වෛරය, තරහව, අමනාපය, නොසතුට ආදී වචන රාශියක් මේ ද්වේෂය, වෙනුවෙන් භාවිතා වේ. රූපාදී අරමුණු කෙරෙහි ද, කර්ම ද්වාර වශයෙන් ද, අකුසල් දසය අතුරෙන් සතක් මේ සිත් දෙකෙන් කරන්නේ ය. ඒකාන්තයෙන්ම කර්ම පථ තුනක් ද්වේෂමූල යෙහි උපදී. ප්‍රාණඝාත, පරුෂ වචන, ව්‍යාපාද යන කර්ම පථ තුන වේ. දස අකුසල කර්ම පථ අතුරෙන් සතක් කල

හැකි ශක්තිය තිබේ. ආනන්තරිය අකුසල් කිපයක් ද්වේෂය මුල් වී කෙරෙති. අනාගාමි මාර්ග ඵලයන් ලැබෙන තුරු මේ සිත් දෙක උපදී. බඹලොව, බ්‍රහ්මයින්ට එහි සිටින කාලයේ මේ සිත් දෙක නූපදනේ ය. ද්වේෂය ඇති වූ විට පළමුව තමාගේ චිත්තසන්තානය ද, ශරීරය ද දැවෙන තැවෙන ස්වභාවයෙන් යුක්ත වේ. මේ ද්වේෂ ගින්නෙන් තමා පළමුව හිංසාකාරී තත්ත්වයට පැමිණ පසුව අනුන්ට හිංසා කරයි. ඇතැම්විට ජීවිතය පවා විනාශකරයි. තමාගේ ජීවිතය හෝ නැතිකර ගනී. මේ ද්වේෂ ගින්නේ ස්වභාව යයි.

## මෝහ මූල සිත් දෙක

මේ අකුසල් සිත් දෙක මෝහ නමැති බලවත් ගන අඳුර නිසාම ඇතිවේ. එකම හේතු ධර්මයක් සමග ඇතිවන සිත් දෙකකි. අනික් අකුසල් සිත් උපදනේ මෝහය සමග අනික් හේතූන් ද සමග ය. මෝහය සියළුම අකුසල් කිරීමට නැතිවම බැරි අකුසල මූලයකි. මෝහයෙන් මූලාවන ස්වභාවයෙන් තොරව වරද වරද සේ පෙනෙන්නේ නම් වැරදි වූද, නොකටයුතු අකුසල් මව්පියන් මැරීම, වැනි මහත් අපරාධ ක්‍රියා නො කළ හැකි ය. එසේ හෙයින් මෝහය ඇතිවූ සිතට හොඳ නරක දැනගත නොහැකි වේ.

අකුසල් සිත් අතුරෙන් එකොළොස් වන සිතයි. ඒ සිත විචිකිච්ඡාවෙන් යුක්ත වේ. විචිකිච්ඡාව නම් සැකය යි. සාමාන්‍ය කරුණක් ගැන සිතීම නිශ්චය කර ගැනීම සිත් රාශියක් ඉපිද කල යුත්තකි. පාරක් තොටක් හරිහැටි විසඳා ගැනීම හෝ යම්කිසි වස්තුවක් හඳුනා ගැනීම වැනි අවස්ථාවන්හි ඇති වන්නේ පටිරූපක විචිකිච්ඡා නම් වූ නිශ්චය කරගත නොහැකි තත්ත්වයකි.

විචිකිච්ඡා චෛතසිකයේ ස්වභාවය බුද්ධ, ධම්ම, සංඝ, පූර්වාන්තය, අපරාන්තය, පූර්වාන්ත අපරාන්ත දෙකම ත්‍රිවිධ ශික්ෂා, පටිච්ච සමුප්පාද ධර්ම යන මේ කරුණු අට කෙරෙහි ඇතිවන සැකයයි. ඒ විචිකිච්ඡා චෛතසික යේ ස්වභාවය යි. බුද්ධ ඥාන පමණක් නොව බුද්ධ ශරීරය ගැන ද මහාපුරුෂ ලක්ෂණ ආදිය ගැන ද සැක කරති. මේ නීවරණ විචිකිච්ඡාවයි.

මෙසේ බලවත් මෝහාන්ධ කාරය ඇති සිතට බුදුකෙනෙකුගේ ගුණ ස්කන්ධය, පාරමී ධර්ම ගැන කෙසේවත් වැටහීමක් නොමැති බැවින් මෙසේ සැක ඇති වන්නේ ය.

දස අකුසල් කිරිමට මෝහය බලවත් උපකාරයකි. මෝහ යෙන් යුත් විචිකිච්ඡාව ඇතිවීමට මේ ආදී කරුණු ද උපකාර වේ. ධර්මය නූගත් බව, ශ්‍රද්ධාව නැති බව, බුද්ධාදී උතුමන් ගැන නොදැනීම, පාපමිත්‍ර ආශ්‍රය, නිතර රත්නත්‍රයට දෙස් නගා කථා කිරීම, ආදී කරුණු ද විචිකිච්ඡාව ඇති වීමට හේතුවේ.

උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත ද මෝහය නමැති එකම බලවත් හේතුව නිසාම ඇතිවේ. උද්ධච්ච සිත නොසන්සුන් ස්වභාව යෙන් යුක්ත වේ. උද්ධච්ච යනු නොසන්සුන් ස්වභාවය යි. උද්ධච්ච චෛතසිකය අකුසල් සියල්ලටම සාධාරණ ව ඇතිවේ. එහෙත් මේ සිත බලවත් උද්ධච්ච යෙන්ම යුක්ත වේ. ඇතැම් විට කුසල් කරන දනා දී පින්කම් කරන අවස්ථාවලදී ද උද්ධච්ච සිත ඇති වී නොසන්සුන් ස්වභාවයක් ඇතිකරයි. එය හේතු කොට කුසලය බාලවීමට ද ත්‍රිහේතුක ආදිය නොවීමට ද ඉඩ ලැබෙන්නේ ය. කුසල් කිරීමේදී ඒ අතරම මේ සිත ඇතිවීම බලවත් පාඩුවකි. මේ සිත චංචල ගතියෙන් යුක්ත වේ. ඒ උද්ධච්ච යේ ස්වභාවයයි. සිත් දෙකම එකම හේතුවකින් යුක්තවේ. සිත් දෙකම අසංඛාරික වේ. දස අකුසලයන් කරන අවස්ථාවන්හිදී මේ සිත් උපදී. උද්ධච්චය වේගයෙන් දුවන අසුපිට නොවැටී සිටීම මෙනි.

අකුසල් ඇතිවීමට මේ කරුණු ද උපකාර වේ. යහපත් පතිරූප දේශ වාසයක් නොලැබීම, අසත් පුරුෂ ආශ්‍රය, පෙර පින්කළ පුරුද්ද නැති බව, අයෝනිසෝ මනසිකාරය ද යනාදී කරුණු අකුසල් කිරීමට උපකාර වන්නේ ය.

| අකුසල් සිත් දෙළසෙහි ස්වරූප බෙද දක්වීම | | සෝමනස්ස සිත් | දෝමනස්ස ,, | උපේක්ඛා ,, | සම්පයුත්ත ,, | විප්පයුත්ත ,, | අසංඛාරික ,, | සසංඛාරික ,, |
|---|---|---|---|---|---|---|---|---|
| ලෝභ මූල සිත් | 8 | 4 | — | 4 | 4 | 4 | 4 | 4 |
| ද්වේෂ මූල සිත් | 2 | — | 2 | — | 2 | — | 1 | 1 |
| මෝහ මූල සිත් | 2 | — | — | 2 | 2 | — | 2 | — |
| අකුසල් සිත් | 12 | 4 | 2 | 6 | 8 | 4 | 7 | 5 |

ප්‍රාණඝාතාදී දස අකුසල් කිරීමේදී අකුසල චෛතසික යෙදුනා වූ අකුසල් සිත් උපදනා ආකාරය යි. අකුසල් සිත් දෙළසින් යම්කිසි සිතක් ඉපිද කායාද්වාර, වාග්ද්වාර, මනො ද්වාර, යන කර්මද්වාර තුනෙන් එක ද්වාරයක් මෙහෙයවා අකුසලය කරන්නේ ය. සමහර අකුසල් ද්වාර දෙකකින් ද කෙරෙයි. ප්‍රාණඝාත අකුසල වාග්ද්වාරයේද කායාද්වාරයේද යන ද්වාර දෙකෙහි ම උපදියි. සතෙක් මැරීමට යම් කෙනෙකුට අණ කිරීමේදී ප්‍රාණඝාත අකුසල් වාග්ද්වාරිකව උපදනා අකුසල යකි. එසේ අණ පරිදි සතා මරයිද එවිට කායද්වාරව අකුසලය සිදුවෙති. එක සතෙත් මැරීමේ කර්ම පථ භාවයට පැමිණීමේ අකුසලය දෙදෙනෙකුට සිදුවුණි. එය අණ කළ තැනැත්තාට ආණත්තික වශයෙන් අකුසලය සිදුවෙයි. සතාගේ ජීවිතය විනාශ කළ තැනැත්තාට සාහත්ථික වශයෙන් තමාගේ අත උපයෝගී කරගැනීම නිසා සාහත්ථික වශයෙන් කායද්වාරයෙහි අකුසලය සිදු වේ. මෙය ද්වේෂ මූල අකුසලයකි. අනික් අකුසල් සිදුවීම ද මෙසේ දැනගත හැකි වේ.

දස අකුසල් කිරිමට අවස්ථාව ලැබුනේ වී නමුත් වරද බව දැන ගෙන හෝ කර්මඵල ආදිය ගැන සිතා හෝ කෙසේ හෝ නොකර හැරීම සම්පත්ත විරති සීලය යි. ශික්ෂාපද සමාදන් වීම සමාදන සිලය යි. සහමූලින්ම අකුසල් නොකරහැරීම සමුච්ඡෙද විරතියයි.

## දස අකුසල්

| | | |
|---|---|---|
| ප්‍රාණඝාතය | — | ඒ කාන්ත ද්වේෂයෙන් |
| අදත්තාදානය | — | ලෝභයෙන් හා ද්වේෂයෙන් |
| කාම මිථ්‍යාචාරය | — | ඒකාන්ත ලෝභයෙන් |
| මුසාවාද | — | ලෝභයෙන් හා ද්වේෂයෙන් |
| පිසුනාවාචා | — | ලෝභයෙන් හා ද්වේෂයෙන් |
| ඵරුෂාවාචා | — | ඒකාන්ත ද්වේෂයෙන් |
| සම්ඵප්ප්‍රලාප | — | ලෝභයෙන් හා ද්වේෂයෙන් |
| අභිද්‍යා | — | ඒ කාන්ත ලෝභයෙන් |
| ව්‍යාපාද | — | ඒ කාන්ත ද්වේෂයෙන් |
| මිථ්‍යාදිට්ඨි | — | ඒ කාන්ත ලෝභයෙන් |

අකුසල් 12 අතුරෙන් පළමු අකුසල් 3 කායාද්වාරික වේ. ඊළඟ 4 වාග්ද්වාරික වේ. අවසාන 3 මනොද්වාරික වේ. මේ 10 කර්මපථ වූයේ නම් සතර අපායෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාක ලැබේ. කර්ම පථ නොවූයේ නම් ප්‍රවෘත්ති විපාක සුගතියෙහි ද ලැබෙයි. මෝහය සියල්ලටම සාධාරණව යෙදේ.

## අහේතුක සිත් 18

### අකුසල විපාක සිත් 7

1. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
2. උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණය
3. උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය
4. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය
5. දුක්ඛ සහගත කාය විඤ්ඤාණය
6. උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත
7. උපෙක්ඛා සහගත සන්තීරණ සිත

### අහේතුක කුසල විපාක සිත් 8

1. උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
2. උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණය
3. උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය

4. උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය
5. සුඛ සහගත කාය විඤ්ඤාණය
6. උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත
7. සෝමනස්ස සහගත සන්තීරණ සිත
8. උපෙක්ඛා සහගත සන්තීරණ සිත

## අහේතුක ක්‍රියා සිත් 3

උපෙක්ඛා සහගත පඤ්ච ද්වාරා වජ්ජන සිත
උපෙක්ඛා සහගත මනොද්වාරා වජ්ජන සිත
සෝමනස්ස සහගත හසිතුප්පාද සිත

## අහේතුක සිත් 18

මේ සිත් 18 සමග එකම හේතු ධර්මයක්වත් නොයෙදෙන බැවින් අහේතුක නම් වේ. කුසල අකුසල හේතු නොයෙදුනෝ වී නමුත් සිත් ඇති වීමේ ජනක හේතු නිසා මේ සිත් 18 උපදනෝ ය. එහි අකුසල් සියල්ලටම ලැබෙන විපාක සිත් 7 ද, කාමාවචර මහා කුසලයන්ට ලැබෙන අහේතුක විපාක සිත් 8 ද, අහේතුක ක්‍රියා සිත් 3 ද යන සිත් 18 ලැබේ. මේ සිත් 18 අහේතුක නමින්ද ඉතිරි සිත් 71 සහේතුක නමින් ද සිත් 89 එක් බෙදීමක් වේ.

## අකුසල විපාක සිත් 7

එහි චක්ඛු විඤ්ඤාණ සිත පළමුව දක්වේ. චක්ඛු නම් පෙර කරන ලද කුසලා කුසල යන්ගේ විපාක වශයෙන් ලැබුණ කර්මජ මහාභූත රූපයන්ගේ ඕපයකි. එය චක්ඛු ප්‍රසාද රූපය නම් වේ. චක්ඛු ප්‍රසාද රූපය ඉදිරියට හමු වූ බාහිර රූප සෙව නැලි වැදගැනීමේ ශක්තියක් මේ ප්‍රසාදරූපයට ඇත. කන්නාඩියක් ඉදිරියට ඇති රූප සෙවනැලි එහි පවත්නා ඕපයට වැදීම මෙන් මේ ප්‍රසාද රූපයෙහි රූප සෙවනැලි වැදගැනීම පමණක් සිදුවේ. දැකීමේ ශක්තියක් නැත. ආලෝකය මනසිකාරය ආදීන්ගේ ද උපකාරය ලැබ ආවජ්ජන සිතින් සිත් පරපුර හරවා දීමෙන් පසු ප්‍රසාද රූපය ඇසුරු කොට සිතක් උපදනෝ ය. එය චක්ඛු ප්‍රසාදය ඇසුරු කොට උපන් සිත යන තේරුමෙන් චක්ඛු විඤ්ඤාණ නම් වේ.

ප්‍රසාද රූපයට ඉදිරිපත් වූ රූපාරම්මණයට අනුව කුසල විපාක හෝ අකුසල විපාක වන්නේ ය. රූපාරම්මණය ඉෂ්ට ප්‍රිය මනාප අරමුණක් නම් කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත උපදී. අනිෂ්ට අප්‍රිය තමා අකමැති අරමුණක් හමුවූයේ නම් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත උපදී. චක්ඛු ප්‍රසාදය සමග ගැටීම වන්නේ වර්තමාන රූපාරම්මණය යි. අතීත වූ හෝ අනාගත වූ හෝ අරමුණු ගැනීමේ ශක්තියක් මේ සිත් 10 ට නැත. වර්තමාන ප්‍රසාද ආරම්මණයන්ගේ ගැටීමෙන්ම චක්ඛු විඤ්ඤාණාදී සිත් උපදනේ ය. නිරුපද්‍රැත චක්ඛු ප්‍රසාදය ඇති සෑම සත්වයෙකුටම එය ඇසුරු කොට සිත් උපදනේ ය. සුගති දුගති සියල්ලෙහිම ඇති වේ. සෑම කෙනෙකුටම එක හා සමාන ප්‍රසාද රූප නොලැබිය හැකි වේ. කුසලා, කුසල යන්ට අනුව ඒවා ලැබෙන්නේය. ප්‍රසාද රූප අඩු අය ද ප්‍රසාදරූප නැති උපතින්ම නො ලැබූ ජාති අන්ධයෝ ද සිටිති.

චක්ඛු ප්‍රසාදයට, චක්ඛු ද්වාර යයි ද, චක්ඛු වස්තු යයි ද, චක්ඛු ඉන්ද්‍රියයි ද, චක්ඛායතන යයි ද, චක්ඛු ධාතුයයි ද, කියති.

## ෝසත විඤ්ඤාණ සිත් දෙක

සොත විඤ්ඤාණ සිත් දෙකද පෙර කරන ලද කුසලා කුසල යන්ගේ විපාක වශයෙන් ලැබුණු සිත් දෙකකි. සොත ප්‍රසාදය පෙර කරන ලද කුසලා කුසලයන්ගේ විපාක ඵල වශයෙන්ද ලැබුණු කර්මජ මහා භූත රූපයන්ගේ ඔප ගතිය යි. එය කන් බිලය තුල පිහිටි රූපය නිසා සොත ප්‍රසාද නම්වේ. එහි ප්‍රසාද රූපය ඇසුරු කොට උපදනා සිත සොත විඤ්ඤාණය නම් වේ. කුසල විපාක හා අකුසල විපාක සිත් වශයෙන් දෙවැදෑරුම් වේ. නිරුපද්‍රැත සොත ප්‍රසාද යද ශබ්දරම්මණය ද ගැටීමෙන් සිත් උපදී. එයට ශ්‍රවණය කළ හැකි දුර ප්‍රමාණයේ ඇති වූ ශබ්ද ද අවකාශය ද, කන් සිදුර නොවැසී තිබීම ද, වායොධාතුව ද, මනසිකාරය ද යනාදි කරුණු ඇති කල්හි ඇසීම සිදුවේ. තමා කැමති ප්‍රිය මනාප ශබ්ද ඇසීමේදී කුසල විපාක සොත විඤ්ඤාණය ද, අකමැති අමිහිරි රෞද්‍ර ශබ්ද ඇසීමේ දී අකුසල විපාක සොත විඤ්ඤාණය ද ඇති වේ. මනසිකාරය සිත් ඉපදීමට බොහෝ උපකාරක ධර්මයකි. මනසිකාරයෙන් නොමෙනෙහි කරන ලද්දේ නම් ලඟ ඇති වූ ශබ්ද පවා නො ඇසී යයි. මේ සිත් 10 ට මනසිකාරය බොහෝ උපකාර වේ. නැතිවම බැරි ධර්මයකි.

සුගති, දුගති දෙක්හිම මේ සිත් සුදුසු පරිදි ඇතිවේ. කර්මජ ප්‍රසාද රූපය නොලබන ලද ජාති බධිරයාට උපතින්ම සිදුවූ නොඇසීමේ පාඩුවය.

චක්ඛු සොත කර්මජ රූපයන් බඹලොව බ්‍රහ්මයින්ට ද පිහිටති. බුද්ධ දර්ශනයට සහ ධර්ම ශ්‍රවණයට, දස්සන අනුත්තරිය සහ සවණ අනුත්තරිය ලැබීම සඳහා ඒ ප්‍රසාද රූප පිහිටා එහි සිත් උපදී. අනික් ඝාණ, ජිව්හා, කාය ප්‍රසාද රූපයන් බඹලොව නො ලැබේ.

## ඝාණ විඤ්ඤාණ සිත් දෙක

පෙර කරන ලද කුසලා කුසලයන්ගේ විපාක වශයෙන් ලැබුන සිත් දෙකකි. ගඳ හෝ සුවඳ වැදගැනීමට සුදුසු ප්‍රසාද රූපයයි. පෙර කරන ලද කුසලා කුසලයන්ගේ විපාක වශයෙන් ලැබුණු කර්මජ මහාභූත රූපයන්ගේ ඔප ගතියයි. එය නාස් බිලය තුල පිහිටි මහාභූත රූපයන්ගේ ඔප ගතිය බැවින් ඝාණ ප්‍රසාදය හා ගැටෙන ගඳ සුවඳ අරමුණු වැදගැනීමේ රූපයයි. ආඝ්‍රාණය කිරීම එහි උපදනා සිත් දෙකෙන් සිදු කෙරේ. තමා කැමති සුවඳ වර්ග වැදගැනීමෙන් කුසල විපාක ඝාණවිඤ්ඤාණය උපදී. දුගඳ අරමුණෙහි දී අකුසල විපාක ඝාණ විඤ්ඤාණය උපදී. සුගති දුගති දෙක්හිම ඇතිවේ. බඹලොව ඝාණ ප්‍රසාදය ජිව්හා ප්‍රසාදය, කාය ප්‍රසාදය, රූප නොලැබේ.

නිරුපද්‍රැත ඝාණ ප්‍රසාදය ද, වර්තමාන ගන්ධාරම්මණය ද, වායෝ ධාතුව ද, මනසිකාරය ද යන මේ කරුණු සම්පූර්ණ වීමෙන් ඝාණ විඤ්ඤාණ උපදී. ඝාණ ප්‍රසාදයෙහි ගන්ධාරම්-මණය ගැටීමෙන්ම ඝාණ විඤ්ඤාණය උපදී. චක්ඛු සෝත දෙක මෙන් ළඟට නොපැමිණ අරමුණ ගැනීම සිදු නොවේ. සම්පත්ත වශයෙන්ම අරමුණු ගැනීම වේ.

## ජිව්හා විඤ්ඤාණ සිත් දෙක

ජිව්හා නම් පෙර කරන ලද කර්මයන් නිසා ලැබෙන කර්මජ මහාභූත රූපයන්ගේ ඔපයයි. ප්‍රසාද රූපයයි. ජිව්හා ප්‍රසාදයත්

ආරම්මණයත් ගැටීම හේතුකොට ජිව්හා විඤ්ඤාණය උපදී. ජිව්හා ප්‍රසාදය, රසාරම්මණය ආපොධාතුව, මනසිකාරය, යන කරුණු ඇති වූ කල්හි ජිව්හා විඤ්ඤාණය උපදී. කුසල විපාක අකුසල විපාක වශයෙන් ජිව්හා විඤ්ඤාණය දෙපරිදි වේ. මිහිරි රසයක් තමා කැමති ප්‍රිය කරන ජිව්හා ප්‍රසාදයට කැමති රසයක් ගැටීමෙන් කුසල විපාක ජිව්හා විඤ්ඤාණය ද වැඩදයක වුවත් කටුක බෙහෙත් ආදිය සහ සැර බීම වර්ග කැමැත්තෙන් ගන්නේ වී නමුත් ජිව්හා විඤ්ඤාණය අකුසල විපාක විය හැකිය.

චක්ඛු විඤ්ඤාණ දෙකේ සිට ජිව්හා විඤ්ඤාණ දෙක අවසානයට ඇති සිත් 8 උපෙක්ඛා සහගත වේ. උපාද රූප උපාද රූපයන් හා ගැටීමෙන් ඇතිවන බැවින් උපෙක්ඛා සහගත වේ.

## කාය විඤ්ඤාණ සිත් දෙක

කාය ප්‍රසාද රූපය නම් පෙර කරන ලද කර්මයන්ට අනුව කයෙහි පැවති කර්මජ මහාභූත රූපයන්ගේ ඔපයයි. ඵොට්ඨබ්බ රූපය නම්, පඨවි, තේජෝ, වායෝ, යන මහා භූත රූප තුනයි. මහාභූත රූප වන ඵොට්ඨබ්බා රම්මණය ප්‍රසාදයයි කියන ලද උපාද රූපයෙහි ගැටීමෙන් නොනැවතී. එහිවූ මහාභූත රූපයන් හිම ගැටෙන්නේ ය. එය ගැටීම උපාද රූප දෙකොට සක ගැටීම මෙන් නොවන්නේ ය. උපෙක්ඛා වේදනාවෙන් නොව මහා භූත රූප දෙකොටසක ගැටීමේ දී සුඛ සහගත හෝ දුක්ඛ සහගත කාය විඤ්ඤාණ ඉපදීමට හේතු වේ. එසේ හෙයින් කාය විඤ්ඤාණ සිත් දෙක අකුසල විපාක කාය විඤ්ඤාණය දුක්ඛ සහගත වේ. කුසල විපාක කාය විඤ්ඤාණය සුඛ සහගත වේ. මේ සිත් 10 ට දෙපස් විඤ්ඤාණ යයි එක නමක් ද ව්‍යවහාර වේ. කුසල අහේතුක විපාක සහ අකුසල විපාක සිත් 10 යි. කෘත්‍ය වශයෙන් දස්සන, සවණ, සායන, සායන ඵුසන යන කෘත්‍ය 5 ක් මේ සිත් 10 න් සිදු කෙරේ.

## සම්පටිච්ඡන සිත් දෙක

චක්ඛු විඤ්ඤාණාදී සිත් වලින් ගන්නා ලද අරමුණු, රූපාදී අරමුණු 5 ම පිළිගන්නා ස්වභාවයෙන් චක්ඛු විඤ්ඤාණාදීන් ලඟටම උපදනා සිත සම්පටිච්ඡණ සිතයි. එය අකුසල විපාක

සිත සහ කුසල විපාක සිතද යනුවෙනි. සම්පටිච්ඡන දෙසිතද උපෙක්ෂා සහගත වේ. අනිෂ්ට අරමුණු පිළිගන්නා සිත අකුසල විපාක සම්පටිච්ඡනයයි. ඉෂ්ට අරමුණු පිළිගන්නා සිත කුසල විපාක අහේතුක සම්පටිච්ඡන සිතයි. සම්පටිච්ඡන කෘත්‍යය ද මේ සිත් දෙකෙන් කරනු ලබයි.

## සන්තීරණ සිත් තුන

උපේක්ඛා සහගත සම්පටිච්ඡන දෙසිතට අනතුරුව සන් තීරණ සිත් වදල සේක. සන්තීරණ සිත් තුනකි. අකුසල විපාක උපේක්ඛා සන්තීරණ සිත් එකක් ද කුසල අහේතුක විපාක සන්තීරණ සිත් දෙකක් ද වේ. ඉන් එකක් අති ඉෂ්ට අරමුණු ගැනීමේදී සොම්නස් වේදනා වෙන් සතුටින් යුක්ත වේ. අනික ඉෂ්ට මධ්‍යස්ථ අරමුණුහි දී උපෙක්ඛා වේදනාවෙන් යුක්තව උපදී. උපේක්ඛා සහගත සන්තීරණ සිත් දෙක අතුරින් අකුසල විපාක සිත සතර අපායෙහි පටිසන්ධිය ලබා දී අනතු රුව භවංග වශයෙන් සහ චුති වශයෙන් ද ඉපදී භවය අවසන් කරන්නේ ය.

උපෙක්ඛා සහගත කුසල විපාක සන්තීරණ සිත කාම සුගතියෙහි ජාති අන්ධ, ජාතිබධිර, ජාතිඑල, ජාතිඋම්මත්තක නපුංසක, උභතොබ්‍යඤ්ජනක ආදී උත්පත්ති ලබන්නේය. මේ පටිසන්ධි සිත් දෙක අහේතුක පටිසන්ධි යුගලය නමින් ද දක්වේ. හේතු ධර්ම එකක් වත් නොයෙදෙන බැවින් අහේතුක නම් වේ. කුසල අහේතුක විපාක සන්තීරණ සිත පටිසන්ධි භවංග චුති කෘත්‍ය තුන සහ තදරම්මණ කෘත්‍යයෙන් ද උපදනේ ය.

## අහේතුක ක්‍රියා සිත් තුන

උපේක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන සිතය උපේක්ඛා සහ ගත මනෝද්වාරා වජ්ජන සිතය, සොම්නස් සහගත හසිතුප්පාද සිත යයි තුන් වැදෑරුම් වේ. චක්ඛු සොතාදී ද්වාර පසෙන් අරමුණු ගැනීමේදී චක්ඛු ද්වාරයට අරමුණු ගැටීමත් සමගම මනෝද්වාර යෙහි ද ගැටෙති. මනෝද්වාරය වන්නේ භවංග සිතය. එසේ ගැටුනු අරමුණු ගැනීමක් භවංගයට කළ නොහැකි බැවින් ඒ භවංග සිත් ඉපදීම නතර වන්නේය. ඊට අනතුරුව වස්තු රූපය ඇසුරු කොට පඤ්චද්වාරාවජ්ජන සිත එම අරමුණ

ගනිමින් ඉපිද චක්ඛු ආදි ද්වාර පසටම අරමුණු ගැනීමට ඉඩ සලසා දෙන්නේය. එසේ පසටම ඉඩ සලසා දෙන බැවින් පඤ්චාද්වාරාවජ්ජන නම් වේ.

පළමුව ඉපද චක්ඛු ආදී ද්වාර පසට චිත්ත වීථිය ඉපදීමට ඉඩ සලසා දෙන සිත බැවින් වීථි පටිපාදක මනසිකාර යයි ද කියති. පඤ්චද්වාරවජ්ජන සිත හා සම්පටිච්ඡන සිත් දෙක මනොධාතු ත්‍රිකයයි. මනෝද්වාරාවජ්ජන සිත පඤ්චද්වාර යෙහි සිත් ඉපදීමේදී ජවන් සිත් වලට පළමුව ඉපිද ජවන් සිත් ඉපදීමට ඉඩ සලසා දෙයි. එහිදී මනෝද් වාරාවජ්ජන සිත වොත්ථපන නමින් දැක්වේ. මනෝද් වාරිකවම සිත් ඉපදීමේදී භවංගයට පසුව ඉපද මනෝද්වාරික චිත්ත වීථි පිළියෙල කරයි. ඊට පසු ජවන් සිත් උපදී. පඤ්ච ද්වාරයෙහි දී මනෝද්වාරික සිත ජවන පටිපාදක නමින් දැක්වේ.

සොම්නස් සහගත හසිතුප්පාද සිත. මේ සිත රහතුන් වහන්සේලාට සහ බුදු, පසේ බුදු රජාණන් වහන්සේලාට ද, සිනහ පහළ වීමේදී උපදිනා සිතකි. හසිත යනු සිනහවයි. සිනහව ආකාර සයකට ඇතිවේ. බුදුරජාණන් වහන්සේලාට ඇතිවන මද සිනහව පසුව වඩිනා ආනන්ද හාමුදුරුවන් දැනගන් නේ සුදු බුද්ධ රශ්මි මාලාව විහිදීමෙනි. සිනහව ඇතිවන සිත් සියල්ල 13 කි. එනම් ලෝභ මූල සොම්නස් සිත් 4 ද, කාමාවචර සොමනස්ස සහගත මහා කුසල් මහා ක්‍රියා 8 ද හසිතුප්පාදය 13 යි. අනික් අයට ලෝභ මූල 4 සහ මහා කුසල් 4 ද යන සිත් අටෙන් සිනහව ඇති වේ.

බුද්ධාදී උතුමන්ට සොමනස්ස හසිතුප්පාද සිත ද මහාක්‍රියා 4 ද ලැබේ.

| අසෝභන සිත් 30 හි ස්වරූප | සිත් | සුඛ සහගත සිත් | සොමනස්ස සහගත සිත් | දුක්ඛ සහගත සිත් | දොමනස්ස සහගත සිත් | උපේක්ඛා සහගත සිත් | සම්පයුත්ත සිත් | විප්පයුත්ත සිත් | අසංඛාරික සිත් | සසංඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් | 12 | — | 4 | — | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| අහේතුක අ. වි. | 7 | — | — | 1 | — | 6 | — | 7 | 7 | — |
| අහේතුක කුසල විපාක | 8 | 1 | 1 | — | — | 6 | — | 8 | 8 | — |
| අහේතුක කිරිය | 3 | — | 1 | — | — | 2 | — | 3 | 3 | — |
| අසෝභන | 30 | 1 | 6 | 1 | 2 | 20 | 8 | 22 | 25 | 5 |

## කාම සෝභන සිත් 24

### කාමාවචර කුසල් සිත් 8

සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත

### සහේතුක කාමාවචර විපාක සිත් 8

සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සංසංඛාරික සිත

සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සංසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සංසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත

**සහේතුක කාමාවචර ක්‍රියා සිත් 8**

සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාරික සිත
උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත

**කාමාවචර මහාකුසල් සිත් 8**

කාමාවචර සිත් 54 අතුරෙන් අසෝභන සිත් 30 ද කාම සෝභන සිත් 24 ද වේ. කාමසෝභන සිත් 24 තුන් ආකාරයකට විස්තර වේ. ඉන් මහා කුසල් සිත් මෙහි විස්තර වේ. කාමාවචර කුසල් මහා කුසල් නමින් ද විස්තර වේ. කිසිම සිතකට නොලැබෙන පරිදි විපාක සිත් 16 ක් ලැබෙයි. කුසල් සිත් වාගේ දෙගුණයක් විපාක සිත් ලැබේ. ධ්‍යාන මාර්ග ආදී කුසල් ලැබීමට පළමුව මහා කුසල් සිත් වලින් අකුසල් පහකොට චිත්ත සන්තානය පිරිසිදුකර දෙන්නේ ය. පටිසන්ධි 9 ක් ලැබෙන්නේ ය. කාම සුගති භූමි 7 හිම පටිසන්ධි ලබා දෙන්නේය. අර්හත් මාර්ග සිත දක්වාම මහා කුසල යෙහි උපකාර ලැබිය යුතු වේ.

බුදු පසේ බුදුරජාණන් වහන්සේලාට පාරමී ධර්ම සම්පූර්ණ කරගැනීමට ද බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණ කරගැනීමට ද මහා කුසල් උපකාර වන්නේ ය. අකුසල් තදංග වශයෙන් යටපත්කර කුසල් සිත ශක්තිමත් කරන්නේ ය. මේ ආදී කරුණු සලකා මහාකුසල් නම් වන්නේය.

පළමුව සොම්නස් උපෙක්ඛා වශයෙන්ද දෙවනුව ඤාණ සම්පයුත්ත විප්පයුත්ත වශයෙන්ද, අවසානයට අසංඛාරික සසංඛාරික වශයෙන්ද බෙදී පවත්නේය. සෝභන සිත් අතුරෙන් කාම සෝභන සිත්හි පමණක් නුවණ ඇති සිත් සහ නුවණ නැති සිත් තිබේ. ඊට ඉහළ රූප, අරූප ආදී ලෞකික සිත් ද නුවණ ඇති සිත් වේ. ලෝකෝත්තර සිත්හි වේදනා භෙදය පමණක් තිබේ. අසංඛාරික ආදී වෙන භෙදයක් නැත්තේය.

කාමාවචර කුසල් සිත් සොම්නස් ඤාණසම්පයුත්ත දෙකක් ද ඤාණ විප්පයුත්ත 2 ද වේ. උපේක්ඛා සිත් 4 ද එසේ ම ඤාණ සම්පයුත්ත දෙකක් ද ඤාණ විප්පයුත්ත දෙකක් ද වේ. සිත් 8 හිම අසංඛාරික සතරක් ද සසංඛාරික සතරක් ද වේ.

සෝවාන් ආදී මාර්ග ඵල ලාභී උතුමන්ට රහත් වනතුරුම කාමාවචර මහාකුසල් සිත් ලැබේ. රහත් වූවාට පසු අර්හත් ඵලයට පත් උතුමන්ට කාමාවචර ක්‍රියා සිත් ලැබේ. අකුසල් පහකිරීම කුදු නැති හෙයින් ද නැවත විපාක නූපදවන හෙයින් ද බුදුරජාණන් වහන්සේ ආදී රහත් උතුමන්ට ක්‍රියා සිත් ලැබේ.

කාමාවචර මහා කුසල් සිත් 8 අසංඛාර සසංඛාර භෙදයෙන්ද වෙන් වන්නේ ය. එහෙත් අකුසල් සිත්වල මෙන් චෛතසික යෙදීම් ආදි විශෙෂයක් නැත. කුසල් සිත් අසංඛාර සසංඛාර වීමෙන් විපාක සිත් ද අසංඛාර සසංඛාර වේ. අසංඛාරික විපාක සිතකින් පටිසන්ධිය ගත් තැනැත්තා ගේ භවංග සිත ද අසංඛාරික වේ. අසංඛාරික මනොද්වාරයක් ඇති හේතුවෙන් කුසල් කිරීමේදී සිත පසු බැසීමක් නැතිව උනන්දු වූ සිතෙන්ම වහාම ඉදිරිපත්වී කුසල් කරන්නේ ය. කුසල විපාක අසංඛාරික භවංගයක් ඇතිවීම කුසල් කිරීමට මහත් උපකාරයකි.

නින්දිත වූ පාප ධර්මයන් සොලවා කම්පාකර හරින හෙයින් ද කුසල් නම් වේ. කාමාවචර කුසලයෙන් අකුසල් ඇතිවීම තදංග වශයෙන් ඒ අවස්ථාවට යටපත් කරයි. කුසල සිතේ උපදනා ප්‍රඥා චෛතසිකය කඩුවකට උපමාකර තිබේ. කෙලෙස් නමැති ලෙඩ සුව කරන ඖෂධයකට ද, ප්‍රඥාව සමාන කරන්නේ

ය. වරද සහිත ලෝභ, ද්වේෂාදී අකුසල ධර්මයන්ගේ–කෙලෙස් නමැති ගින්න විනාශ කරන සිසිල් ජලධාරාවක් වැනියයි ද කුසලයට උපමා දක්වන්නේ ය.

යකඩයෙහි හටගන්නා යකඩ මලය යකඩය අවසාන වන තුරුම කාදමන්නාක් මෙන් චිත්ත සන්තානය අනුව උපදනා ගුණධර්ම කා දමන්නේ ය. යකඩ මල සුද්ධ කරන ඇඹුල් කාරමක් මෙන් කුසලයෙන් (මාර්ග කුසලයෙන්) අකුසලය සහමුලින්ම විනාශ කරන්නේ ය.

කුසලයන්ගේ තවත් ප්‍රභෙදයක් නම් ඥාණ සම්භාර කුසල්ය පුණ්‍ය සම්භාර කුසල්යයි ද දෙයාකාරයක් වේ. ඉන් ඥාණ සම්භාර කුසලය උතුම් වේ. පුණ්‍ය සම්භාර කුසලයෙන් භව භෝග වතුපිටි ආදී වස්තු සම්භාරයක් ලබා දෙන්නේ ය. උප තින් නුවණ නැති වේ. කුසල් කිරීමේදී තණ්හා දිට්ඨි, මාන ආදී අකුසල යන්ගෙන් අරමුණු කිරීම නිසා කුසලය හීන කුසලයක් වේ. නුවණ ඇතිකර ගැනීමට කුසල් කරන අවස්ථාවෙහි ඉතාමත් උත්සාහයෙන් යෝනිසෝමනසිකාරයෙන් යුතුව කළ යුතු වෙයි. නුවණ ඉතාමත් දුර්ලභ අගනා (වස්තුවකි) ධර්මයකි.

ධ්‍යාන මාර්ග ඵල ආදී උසස් කුසල් කරගැනීමට පළමුව කාමාවචර මහා කුසලයෙන් කෙලෙස් මල නූපදනා ලෙස සිත පවිත්‍රකර දිය යුතු ය. අර්හත් මාර්ග ඵල දක්වාම මහා කුසල යන්ගේ බලයෙන් සිත ආරක්ෂාකර ශක්තිමත් කර දෙන්නේ ය. එය පූර්ව භාග ප්‍රතිපදව වන්නේ ය. නිර්වාණාවබෝධය කළ හැකි වන්නේ ඊට පසුව උපදනා සිත්වලිනි. දස පාරමී ධර්ම සම්පූර්ණ කිරීම් ආදිය සිදුකරනුයේ කාමාවචර කුසලයේ බලයෙනි. සත් තිස් බෝධි පාක්ෂික ධර්ම සම්පූර්ණ වන්නේ ද මහා කුසල් දියුණු කිරීමෙනි. බුදුබව පසේ බුදුබව ලැබීමට ද මහා කුසල් බොහෝ උපකාර වේ. කාමාවචර මහාකුසලයෙහි බලය අසීමිත යයි කිය යුතු ය.

**සහේතුක කාමාවචර මහා විපාක සිත් 8**

කාමාවචර කුසලයන්ට විපාක සිත් 16 ක් ලැබෙයි. ඉන් 8 ක් කුසල අහේතුක විපාකයි. මේ සිත් 8 සහේතුක විපාක

සිත් 8 යි. කාමාවචර කුසලයන්ට වෙන කිසිම කුසලයකට නැති මහා බලයක් තිබේ. කුසල් සිත් 8 ට විපාක සිත් 16 ක් ලැබීමත් පටිසන්ධි 9 ක් ලැබීමත්, මිනිස් ලොව සහ දෙව්ලෝ 6 ම උත්පත්තිය ලැබීමත් ආදී ආනිශංස මහත් රාශියක් ලැබෙයි.

මහා විපාක සිත් 8 ද කුසල් සිත් 8 ට මෙන් සොම්නස් 4 ක්, උපෙක්ඛා 4 ක් ද, ඤාණ සම්පයුත්ත 4 ක් සහ විප්පයුත්ත 4 ද, අසංඛාරික 4 ද, සසංඛාරික 4 ක් ද, වෙති. ස්වශක්තියෙන් ඇතිවීමේ බලයක් විපාක සිත්වලට නැත, කුසල් සිත් ඇති වූ නිසා එහි විපාක වශයෙන් ලැබෙයි. ප්‍රවෘත්ති විපාක සිත් වශයෙන් 16 ම ලැබෙයි.

ප්‍රධාන විපාකය පටිසන්ධි විපාකයයි. මෙහි අවස්ථා කීපයක් වෙයි. එය සමංගිතා නමින් හඳුන්වනු ලැබේ. කුසල් කරන අවස්ථාව චේතනා සමංගිතාවය, කුසලය කර අවසන් වූවාට පසු එම කුසලයෙහි ප්‍රතිඵල ලබාදීම සඳහා යම්කිසි ශක්ති විශේෂයක් පවතී ද එය කර්ම සමංගිතා වයි. එය කල්ප ලක්ෂ ගණනක් වුවත් අවස්ථාව ලැබුනෝ නම් පටිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක ද ලබා දෙයි. යම්කිසි භවයක මරණාසන්න අවස්ථාවෙහි මරණාසන්න ජවනයන්ට කර්මය හෝ කර්ම නිමිත්ත වශයෙන් එළඹ සිටීම උපට්ඨාන සමංගිතා නම් වෙති. උපට්ඨාන සමංගිතා බව අනුව පටිසන්ධි ගැනීම, විපාක සිත ලැබීම විපාක සමංගිතා නම් වේ.

මෙසේ කාමාවචර මහාකුසලයට සමංගිතා වශයෙන් අවස්ථා 4 ක් ලැබෙති. කුසලය කරන අවස්ථාව චේතනා සමංගිතාවය. විපාක උපදවන තුරු චේතනා සමංගිතාවට පසු කම්ම සමංගිතාවයි විපාක දීමට අවස්ථාව ලැබී මරණාසන්න ජවනයට අරමුණුවීම උපට්ඨාන සමංගිතාවයි. ඊට පසු භවයේ පටිසන්ධියක් ලබාදීම විපාක සමංගිතාවයි. මෙසේ අවස්ථා 4 ක් ලැබෙති.

කාමාවචර කුසලයට දිට්ඨධම්ම වේදනීය වශයෙන් ද විපාක ලැබෙයි. එය කර්මය කරන ලද භවයේම ලැබෙන විපාක යයි. පුණ්ණ දුගියාට සිටු තනතුරු ලැබීම කුසලය කර අවසන් වීම සමගම සිදු විය. ඒක සාටක බ්‍රාහ්මණයාට මහත් වස්තු රාශියක් ලැබීම විය.

මෙසේ ආයසීයන් වහන්සේලා උදෙසා පිරිනමන ලද දනාදීන් නිසා සිව්පස දනයක් පිරිනැමීමෙන් ලබන දිට්ඨධම්ම වේදනීය විපාකයි. වර්තමානයේ ද දිට්ඨධම්ම වේදනීය විපාක ලැබිය හැකි ය. කාමාවචර කුසලයට පටිසන්ධි විපාක 9 ක් ලැබෙයි. ත්‍රිහේතුක පටිසන්ධි 4 ක් ද, ද්විහේතුක පටිසන්ධි 4 ක් ද, සුගති අහේතුක පටිසන්ධියක් ද යන පටිසන්ධි 9 ලැබෙයි. ඉන් ත්‍රිහේතුක හා ද්විහේතුක පටිසන්ධි දෙව්ලෝ 6 හි සහ මිනිස් ලොව ද ලැබෙයි. කුසලයෙහි බලාබල කම් අනුව එය සිදුවන්නේ ය.

කාමාවචර කුසල් සිත් 8 ආකාර කීපයකින් විස්තර කල යුතු වෙයි. නුවණ ඇති කුසල් අතුරෙන් ත්‍රිහේතුක උත්කෘෂ්ඨය, ඕමකය (ලාමකය) කියා දෙපරිදි වෙයි. ද්වි හේතුක කුසලය ද උත්කෘෂ්ඨ ඕමක යයි දෙපරිදි වේ. ත්‍රිහේතුක කුසලයෙහි අලෝභ, අදෝස, අමෝහ යන හේතු තුන යෙදෙයි. කුසලය කරන අවස්ථාවෙහි භික්ෂූන් වහන්සේලාට දනාදී සිව්පස පූජාවක් කරන අවස්ථාව කර්ම කර්මඵල විශ්වාසය ඇතිව ගෞරවයෙන් පූජා කිරීමෙන් හේතු තුනම යෙදුණු ත්‍රිහේතුක කුසලයක් විය හැකිය. ත්‍රිහේතුක වීම පමණකින්ම කුසලය බලවත්වී නුවණ ඇති උපතක් ලැබීමට ප්‍රමාණවත් නොවේ. එම පූජාවන් පිළියෙල කරන අවස්ථාවෙහි ද කර්මය කර්මඵල විශ්වාසය ආදියෙන් සිත පහද ගෙන නුවණ පෙරදැරි කරගෙන ආනිශංස ආදිය ගැන සලකා නිවන් ලැබීමේ අදහස ඇතිව ගෞරවයෙන් කළ යුතු වේ. තණ්හා වෙන් භවභෝග සම්පත් ප්‍රාර්ථනා වෙන් හෝ මමයි මෙ අන්දමේ උසස් ලෙස කුසල් කරන්නේ යයි මානයෙන් හෝ, කර්ම ඵල ආදිය ගැන විශ්වාස නොමැතිව හෝ දෙවියෙක් ආදි උසස් තත්ත්වයක් පටිසන්ධි ආදියක් බලා-පොරොත්තුව හෝ අන්‍යයන්ගේ පුණ්‍ය ක්‍රියාව හා ගටා නුවුවමනා අදහස් ඇති කර නොගෙන කළ යුතු වේ. පූර්ව චේතනාවන් නුවණින් යුක්ත වීමෙන් ද, දනාදී පූජාවන් පූජා කරන අවස්ථා වෙහි ද නුවණින් යුතුව කළ යුතු වේ. කුසලය කර අවසානයේ නුවුවමනා ගුණ දෙස් විවේචනාදියෙන් හෝ සිත් දූෂ්‍ය කර නොගන්නා කුසල් උත්කෘෂ්ඨ වේ. අපර චේතනාවන් ද තණ්හා දිට්ඨි මාන ආදියෙන් කිලිටිකර නොගෙන ආරක්ෂා කරගන්නා කුසලය ත්‍රිහේතුක වේ. ත්‍රිහේතුක වීම පමණක් ත්‍රිහේතුක උපතක් ලැබීමට ප්‍රමාණ වත් නොවන්නේ ය.

පූර්ව චේතනා, මුඤ්චන චේතනා, අපර චේතනා යන අවස්ථා තුනම කුසලය උත්කෘෂ්ඨ වීමට ප්‍රවේසම් විය යුතු ය. තමා කරන ලද කුසලය උසස් ලෙසටත්, අන්‍යයන්ගේ පින්කම් ආදිය පහත් ලෙසටත් සැසඳීම් ආදී වශයෙන් ''අත්තුක්ඛංසන පරවම්භන'' ආදී නොයෙක් ක්‍රමයන් ගෙන්, කරන ලද උතුම් කුසලය හෝ පසුව නුවූවමනා දේවල් නිසා කුසලයෙහි බලහීන කර නො ගන්නා ලද කුසලයන් ගෙන් ත්‍රිහේතුකව-නුවණ ඇතිව උපතක් ලැබිය හැකි වෙයි. උපතින් නුවණ නැති වීනම් බුදු සසුනක් ලැබී කොපමණ පින් කම් කලත් ධ්‍යානයක් හෝ මාර්ග ඵල යක් ලැබිය නොහැකි වේ. එයයි පාඩුව.

කුසල් කිරීමට නම් එය පාඩුවක් නොවිය හැකි ය. පටි සන්ධි ගත් සිතම ඒ භවයේ චුති අවස්ථාව (මරණය) දක්වා වීථි සිත් නූපදනා විට උපදනා භවංග සිත යි. වැඩි වශයෙන් නිතරම ඇතිවන්නේ භවංග සිත් යයි ද සිතිය හැකිය. උපතින් නුවණ නැති වී නම් භවංග සිත ද නුවණ නැති සිතකි. භවංග සිත නුවණ ඇති වුනි නම් ඒ තැනැත්තාට නිතර ඇතිවන්නේ ද වැඩි වශයෙන් ඇති වන්නේ ද නුවණින් යුත් සිතකි. එය බොහෝම ප්‍රයෝජන වත් වේ: මනෝද්වාරය වන්නේ ද භවංග සිතයි. එයින් ඔහු ඥාණවන්තයෙකි. නුවණ ඇති කෙනෙකි. පින් කිරීමට වඩා කරන ලද පින ප්‍රවේසම් කරගැනීම අසීරු යයි සිතිය හැකිය.

ත්‍රිහේතුක උත්කෘෂ්ඨ වූ උතුම් කුසලයකින් ත්‍රිහේතුක උපතක් ලැබේ. ත්‍රිහේතුක ඕමක කුසලයෙන් සහ ද්විහේතුක උත්කෘෂ්ඨ කුසලයෙන් ද්විහේතුක උපතක් පටිසන්ධියක් ලැබේ. ඒ පටිසන්ධි දෙක සමාන විය හැකි නො වේ. නුවණ නැති උත් පත්ති දෙකකි. එහෙත් ඒ දෙදෙනා සමාන නොවන්නේ ය.

### ද්විහේතුක කුසල විපාක සිත් 4

ද්විහේතුක යනු අලෝභ අදෝස, යන හේතු ධර්ම දෙක සමග යෙදී ඇතිවන විපාක යන්ය. මේ විපාක සිත් 4 හි නුවණ නැත. ඒවායේ ද විපාක සිත උත්කෘෂ්ඨ ඕමක වේ. ද්විහේතුක උත්කෘෂ්ඨ වන උසස් කුසල විපාකයෙන් ද්විහේතුක උපතක් ලබයි. ද්විහේතුක ඕමක වූ (බාල)

කුසල විපාක සිතින් අහේතුක වූ පටිසන්ධියක් ලබයි. එකම හේතු ධර්මයක් හෝ නූපදනා වූ අහේතුක කුසල විපාක උපෙක්ඛා සන්තීරණ සිතින් සුගතියෙහි මිනිස් ලොව මිනිසෙක්ව උපත ලැබුවත් මහා අවාසනා වන්තයෙක් වේ. උපතින්ම ගොළු, බිහිරි, අන්ධ ආදි උපත් සිදුවේ. ඒ උපන් සත්වයා ගැන ධර්මයෙහි පෙන්වා තිබෙන්නේ ජාති අන්ධ, ජාති බධිර, ජාතිඵල, ජාති උන්මත්තක, නපුංසක, පණ්ඩක, උභතොබ්‍යඤ්ජණක ආදි ඉතා දුර්වල තත්ත්වයකින් උපදනා මිනිසුන් හැටියට යි. කුසලය ඉතාම බාල වූ හේතුවෙන් සිදු වූ පාඩුවයි. කුසල් කිරීම ඉතාම හොඳ වුවත් ප්‍රවේසමෙන් කල යුතු වෙයි.

හොඳට ලබා ගත් කිරි කලයකට එම ගවයාගේම මල මූත්‍ර ආදියෙන් ඉතාම ස්වල්පයක් මිශ්‍රවීමෙන් කිරි කලයම නරක් වන්නාක් මෙනි. ඉතා සුළු දේකින් විශාල පාඩු සිදුවිය හැකිය. කුසලයද එසේ ලෝභ දිට්ඨි මාන ආදි අකුසලයකින් බාල විපාක ලබා දෙන තත්ත්වයට පත්විය හැකි බව සිතා ප්‍රවේශම් විය යුත්තේ වඩාත්ම අපර චේතනාව යයි කිය යුතු වේ. ලෝභාදීන් ගෙන් එකකින් ඒ පාඩුව සිදුවිය හැකි වේ.

### සහේතුක කාමාවචර ක්‍රියා සිත් 8

සහේතුක කාමාවචර ක්‍රියා චිත්තය 8 වැදෑරුම් වේ. අහේතුක කාමාවචර සිත් වලින් වෙන් කර දැක්වීමට සහේතුක යයි කියති. මේ සිත් 8 ද මහා කුසල් සිත් මෙන් සොමනස් උපේක්ඛා භෙදයන් ගෙන් සමාන වෙයි. වෙනස වන්නෙ මේ සිත් 8 අර්හත් ඵලය ලත් උතුමන්ට පමණක් ලැබීමයි. වෙන කිසිවෙකුට නොලැබේ. රහතුන් වහන්සේලාට පමණක් නොව බුදු රජාණන් වහන්සේ හා පසේ බුදු රජාණන් වහන්සේලාට ද ධර්ම දේශනා ආදිය කරන අවස්ථාවන්හි ලැබෙන්නේ කාමාවචර ක්‍රියා සිත් ය. කිරීම් මාත්‍රයෙන් අවසන් වේ. නැවත කුසලයකට මෙන් විපාක අවස්ථාවකට නොපැමිනේ. නැවත භවයක් නැති උතුමන් බැවිනි. මේ උතුමන්ගේ කාය කර්මාදී සියල්ල කර්ම නොවේ. ක්‍රියාවෙන් අවසන් වෙයි. මුල කපන ලද ගසෙහි ගෙඩි හට නොගැනීම මෙනි. සියලු භවගාමි අකුසලයන් මුල් සමගම මුලින්ම උදුරා විනාශ කල බැවිනි.

ක්‍රියා චිත්තයෙහි ස්වභාවය පැලවෙන ශක්තිය ඇති ඇට වර්ග තම්බා ගත් පසු පැලවෙන ශක්තිය විනාශ වූවාසේ නැවත

විපාක උපදවන ක්ලේශයන්ගේ අනුසය ශක්තිය විනාශ කල බැවිනි. කාමාවචර සිත් වල ක්‍රියා සිත් මහා ක්‍රියා සිත් එවැනි උතුමන්ට හටගන්නාක් මෙන් රූපාවචර අරූපාවචර කුසල් සිත් වෙනුවට ඒ ධ්‍යාන සිත් වෙනුවට හටගන්නේ රූපාවචර අරූපාවචර ක්‍රියා සිත් 9 යි. කාමාවචර ක්‍රියා සිත් 8 ත් හසිතුප්පාදයත් මහද්ගත ක්‍රියා සිත් 9 යත් යන ක්‍රියා සිත් 18 රහත් උතුමන් තුලම පමණක් ඇති වේ. වෙන කිසිවෙකුට මේ සිත් 18 ඇති නොවේ. අනිත් ඉතුරු ආවජ්ජන ක්‍රියා සිත් අනික් සැම දෙනාටම සුදුසු පරිදි ඇති වේ. පඤ්චද්වාරාවජ්ජන සිත අරූප ලෝකයෙහි ඇති නොවේ. පඤ්ච ප්‍රසාදය නැති බැවින් එසේ වන්නේ ය.

කාමාවචර සිත් 54 අවසන්.

කාමාවචර සිත් 54

අකුසල සිත් 12 සහ අහේතුක සිත් 18 ද, කාම සෝභන සිත් කුසල, විපාක, ක්‍රියා, වශයෙන් 24 හි ද ස්වරූපය දැක්වීම.

| කාමාවචර සිත් 54 හි ස්වරූප දැක්වීම | සිත් | සුඛ සහගත සිත් | සෝමනස්ස සහගත සිත් | දුක්ඛ සහගත සිත් | දෝමනස්ස සහගත සිත් | උපෙක්ඛා සහගත සිත් | සම්පයුත්ත සිත් | විප්පයුත්ත සිත් | අසංඛාරික සිත් | සසංඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් | 12 | — | 4 | — | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| මහා කුසල් සිත් | 8 | — | 4 | — | — | 4 | 4 | 4 | 4 | 4 |
| විපාක සිත් | 23 | 1 | 5 | 1 | — | 16 | 4 | 19 | 19 | 4 |
| ක්‍රියා සිත් | 11 | — | 5 | — | — | 6 | 4 | 7 | 7 | 4 |
| කාමාවචර සිත් | 54 | 1 | 18 | 1 | 2 | 32 | 20 | 34 | 37 | 17 |

## රූපාවචර කුසල් සිත් 5

විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල් සිත.

විචාර පීති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල් සිත

පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන කුසල් සිත

සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන කුසල් සිත

උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල් සිත.

## රූපාවචර විපාක සිත් 5

විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක සිත

විචාර පීති සුඛ ඒකග්ගතා සහිත දුතියජ්ඣාන විපාක සිත

පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන විපාක සිත

සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාක සිත

උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන විපාක සිත.

## රූපාවචර ක්‍රියා සිත් 5

විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන ක්‍රියා සිත
විචාර පීති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන ක්‍රියා සිත
පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන ක්‍රියා සිත
සුඛ එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන ක්‍රියා සිත
උපෙක්ඛා එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන ක්‍රියා සිත.

## රූපාවචර සිත් විස්තරය

මේ සිත් පසළොස රූපාවචර ධ්‍යාන සිත් නම් වේ. එහි කාම සෝභන චිත්ත යන් ගේ මෙන් කුසල් සිත්, විපාක සිත්, ක්‍රියා සිත් යනුවෙන් තුන් වැදෑරුම් වේ. පළමුව උපදනා ධ්‍යාන

සිත ප්‍රථමධ්‍යාන කුසල් සිතයි. එහි එක් එක් ධ්‍යානාඞ්ගයක් භාවනාවෙන් නැති කරමින් සිත දියුණු කිරීමෙන් ධ්‍යාන සිත් පසක් ලැබේ. ඒ අභිධර්ම න්‍යායයි, සූත්‍ර ක්‍රමයට ධ්‍යාන සිත් සතරකි. මන්දපඤ්ඤ, තික්ඛපඤ්ඤ. . . . . .

යන පුද්ගල භෙදයෙන් ද එසේ වන්නේ ය.

ධ්‍යානය යනු ලක්ඛණ උපනිජ්ක්ධානය ආරම්මණ උපනිජ්ක්ධානය යයි දෙපරිදි වේ. මෙහි ලැබෙන්නේ ආරම්මණ උපනිජ්ක්ධානයයි. අරමුණ වෙත එලඹ බලා භාවනාවෙන් සිතේ සමාධිය බලවත් බවට පැමිණවීම. චිත්ත සමාධියට විරුද්ධ ධර්ම වන කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා කියන නිවරණ ධර්මයන් මතුවීමට ඉඩ නොතබා යටකර තබා, විතක්ක, විචාරාදී ධ්‍යාන අංග පස දියුණු කොට එහි පවත්නා එකග්ගතා සංඛ්‍යාත සමාධියේ බලයෙන් කාමච්ඡන්දදීන් මැඩ පවත්වා කලකට හෝ ඒ අකුසල ධර්ම යන් ගෙන් ඈත් වී සිටීම ය.

ධ්‍යාන ලැබිය හැකි අරමුණු සතලිහක් ඇත්තේ ය. දස කසිණ, දස අසුභ, කායගතාසති, ආනාපානසති, මෙත්තා, කරුණා මුදිතා යන මේ භාවනාවන් ගෙන් ප්‍රථම ධ්‍යානය ලැබිය හැකිය. පිරිසිදු සීලයෙහි පිහිටා ආචාර්යයන් වහන්සේ වෙතින් කමටහන් ලබා විවේකීව සිත තැන්පත් කිරීමෙන් චිත්ත සමාධිය සඳහා සිත එක අරමුණක තබා භාවනා කළ යුත්තේ ය. එසේ බොහෝ කලක් පුරුදු කරන ලද තැන්පත් වූ සිතින් නීවරණ ධර්මයන් යටපත් වී මෙන් ධ්‍යාන සිත උපදී. ධ්‍යානය වන්නේ විතක්කාදී අංග පසයි. ඒ අංග පස බලවත්වී උපදින සිත ධ්‍යාන සිතයි.

විතක්කය ධ්‍යාන අංගයන්ගේ පළමුවැන්නයි. ඒ චෛත සිකයකි. එහි බලයෙන් නැවත නැවතත් කසිණාදී අරමුණු කෙරෙහි සිත නැංවීම කරන අතර විචාරයේ බලයෙන් අරමුණෙහි ම සිත හසුරුවයි. සිතට පසු බැසීමට ඉඩ නොතබා නැවත නැවතත් අරමුණෙහි ම තබයි. එසේ අරමුණෙහි ම තබන ලද සිත ප්‍රීතිමත් කිරීම ප්‍රීති චෛතසිකයෙන් සිදු කරයි. කැමති අරමුණ කෙරෙහි ඇති වූ සතුට ප්‍රීතිය නිසා සැප ස්වභාවයක් සුඛ වේදනාවක් ඇතිවේ. මෙසියල්ල අරමුණෙහිම සිත රඳවා

ගැනීම නිසා ඇතිවන එකග්ගතාවට උපකාර වේ. ප්‍රධාන ධර්මය එකග්ගතා නම් වූ චිත්ත සමාධිය යි. නොයෙක් අරමුණු කරා විසිර පවත්නා සිතෙහි තැන්පත් සන්සුන් බවයි.

ධ්‍යාන අංග පසෙන් නීවරණ ධර්ම යටපත් කරන්නේ ය. විතක්කයෙන් ථීනමිද්ධ නීවරණය යටපත් කරයි. සිත සහ චෛතසික ධර්ම අලස බවට පමුණුවන නිදිමත වැනි ස්වභාවය ථීන මිද්ධයේ ස්වභාවය යි. එය දුරු කොට නැවත නැවත සිත අරමුණෙහි නංවයි. විචාරයෙන් අරමුණෙහිම හැසිර වීමෙන් විචිකිච්ඡා ඇති වීමට ඉඩ නොතබයි. සැක ඇති වීමට ඉඩ නොදෙයි. ප්‍රීතිය හෙවත් සතුට ඇති වීමෙන්, ව්‍යාපාදය නැති කරයි. සුඛය හේතුකොට සිතේ ඇතිවන නොසන්සුන් ස්වභාවයට ඉඩ නොතබා යටකර තබයි. එකග්ගතාව විසින් සිත්හි ඇතිවන කාම තෘෂ්ණාව දුරු කරයි, සිත තැන්පත් බවට එක අරමුණෙක්හි තබා බොහෝ වේලා නවත්වා තබාගත හැකි සේ හීලෑ කරයි.

පළමු ධ්‍යාන සිත මේ අංග පසෙන්ම යුක්ත වේ. තික්ඛ පඤ්ඤ පුද්ගලයා දෙවෙනි ධ්‍යානය ලැබීම සඳහා කාම ධර්මයන් කෙරෙහි කලකිරීම හේතුකොට කාම ධර්මයන් ගෙන් නැගී සිටි තැනම පවත්නා විතක්ක, විචාර යන අංග දෙකම එකවිට පහකොට ඒ අංග දෙකම නැති දෙවෙනි ධ්‍යානය ලබයි. මන්ද පඤ්ඤ පුද්ගලයා එක අංගයක් නැති කොට දෙවෙනි ධ්‍යානය ලබයි. මෙසේ එක් එක් අංගයක් කෙරෙහි කලකිරීමෙන් සතුරු ධර්ම සේ සලකා අවසානයට පස්වෙනි ධ්‍යානයෙහි දී උපෙක්ඛා එකග්ගතා යන අංග දෙකින් යුත් ධ්‍යානය ලබයි. ධ්‍යාන ලාභී පුද්ගලයා ඊට පසු ධ්‍යානය තහවුරු කර ගැනීම සඳහා ධ්‍යානයට නිතර සමවැදීමද කරන්නේ ය. එය හුරුපුරුදු කරගැනීමට බොහෝ ක්‍රම යොදා ගන්නේ ය. පංචවිධ වසිප්‍රාප්ත යන්ගෙන් ධ්‍යානය වසඟකර ගන්නේ ය. එසේ ප්‍රවේසම් කරගත් ධ්‍යානය පවා ස්ථිර බවක් නැත්තේ ය. යටකරන ලද සතුරු ධර්ම පෘථග්ජන සන්තානයෙහි සැනෙකින් මතුවී ධ්‍යානය නැතිවී යාමට ද ඉඩ තිබේ. මරණය දක්වා ප්‍රවේසම් කර නොගත්තේ නම් ධ්‍යානය පිරිහී ගියේ නම් එහි විපාකයන් ද නොලැබෙන්නේ ය. ප්‍රවේසම් වූ ධ්‍යානයෙන් මරණින් පසු ඊට සුදුසු බඹ ලොවක උපත ලබන්නේ ය.

රූපාවචර කුසල් සිත් පහට අනතුරුව විපාක සිත් පහද, ක්‍රියා සිත් පහද, වදාළ සේක. කුසල් සිත් පස ලබා එය නො පිරිහී තිබුනේ නම් එක් එක් ධ්‍යානයකට සුදුසු බඹතලයන්හි උපදනේ ය. ඉන් ස්ථාන දහයක් සාමාන්‍ය බ්‍රහ්ම ලෝකයන් වේ. එහි ධ්‍යාන ලාභී පෘථග්ජනයන් සහ සියළු ආර්‍යයන් ද ඇත්තේ ය. මෙහි දී ආර්‍ය භාවයට පැමිණ ධ්‍යානයන් ද ලබා ඇති උතුමන් එක් එක් ධ්‍යාන විපාක සිතකට ලැබිය හැකි බඹතලයක උපදනේ ය. කිසිම ආර්‍යයන් වහන්සේ නමක් අසංඥ තලයෙහි නූපදනේ ය. පඤ්චම ධ්‍යාන ලාභී පෘථග්ජනයෝ සංඥා විරාග භාවනාව වඩා එහි උපදිති. පඤ්චම ධ්‍යාන ලාභී අනාගමීන් වහන්සේලා ශුද්ධාවාස බඹ ලොව උපත ලබා දීම නියමයක් නැති හෙයින් ඇතැම් විට වේහප්පල බඹ ලොවෙහි ද ඉපදිය හැක. පඤ්චමධ්‍යාන ලාභී අනාගාමි වහන්සේලා හැර වෙන කිසිවෙක් ශුද්ධාවාසයන්හි නූපදින්නෝ ය. රහතුන් වහන් සේලාට ලැබෙන ධ්‍යාන සිත් ක්‍රියා සිත් වෙති.

### අරූපාවචර කුසල්, විපාක ක්‍රියා සිත් දොළොස

ආකාසානඤ්චායතන කුසල් සිත
විඤ්ඤාණඤ්චායතන කුසල් සිත
ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත
නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල් සිත

ආකාසානඤ්චායතන විපාක සිත
විඤ්ඤාණඤ්චායතන විපාක සිත
ආකිඤ්චඤ්ඤායතන විපාක සිත
නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත.

ආකාසානඤ්චායතන ක්‍රියා සිත
විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත
ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත
නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ක්‍රියා සිත.

# අරූපාවචර සිත් විස්තරය

අරූප ධ්‍යාන ලබා ගැනීමට පළමුව රූපාවචර ධ්‍යාන ලබා සිටිය යුතුය. රූපාවචර පඤ්චම ධ්‍යාන ලාභී තැනැත්තා රූපය කෙරෙහි කලකිරී රූපය නැති භවයක ඉපදීමේ බලාපොරොත්තු වෙන් රූප විරාග වශයෙන් භාවනා කරයි. ආකාශය නම් හිස් බවයි. එය සතර වැදෑරුම් වේ. අජටාකාශය, පරිච්ඡින්නා කාශය කසිණුග්ඝාටිමාකාශය, රූපපරිච්ඡෙදකාශය යනුයි. මෙහි කසිණුග්ඝාටිමාකාශය ගනු ලැබේ. දස කසිණයන් අතුරෙන් ආකාශ කසිණය හැර ඉතිරි කසිණ නවය අතුරෙන් යම්කිසි කසිණයකින් ලත් කසිණ ලොකය යි. එය සිතින් අත්හැර අහසෙහි පතුරුවා ලත් අහස අරමුණු කොට ''අනන්තො ආකාසො'' ,''අනන්තො ආකාසෝ'' යයි මෙනෙහි කරමින් භාවනා කිරීමෙන් ආකාසානඤ්චායතන ධ්‍යාන සිත ලබන්නේ ය.

එම ධ්‍යානය ලත් තැනැත්තා තමා ලත් ධ්‍යාන සිත අරමුණු කොට විඤ්ඤාණං අනන්තං යයි භාවනා කොට විඤ්ඤානඤ්චා යතන ධ්‍යාන සිත ලබයි. එම ධ්‍යානය ලැබූ පුද්ගලයා ආකාසානඤ්චායතන සිත්තේ නැති බව අරමුණු කොට භාවනා කර ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත ලබයි. ඊට පසු ආකිඤ්චඤ්චායතන සිත අරමුණු කොට '' සාන්ත මෙනං පණීතං මෙනං '' යනුවෙන් භාවනා කර නෙවසඤ්ඤානා සඤ්ඤායතනධ්‍යානය උපදවා ගනී. එම සිතෙහි ඇති ශාන්ත බවම සියුම් බවම හේතු කොට සිත ඇත්තේ ද නැත්තේ ද යන ස්වභාව යෙන් සංඥා, වේදනා ආදී ධර්ම ඇති බවක් නොවැටහෙන තරම් සියුම් සිතක් වන්නේ ය. ලෞකික සිත් අතුරෙන් බොහෝ දුරට කෙලෙස් සංසිඳුනා වූ ද සිත ඇති බව පවා නොවැටහෙන තරම් සියුම් වූ සිතකි.

මේ ධ්‍යාන වැඩූ පුද්ගලයින් රූපයේ දෙස් දක රූප විරාග භාවනාව වැඩූ බැවින් රූපය නැති ඒ ඒ ධ්‍යානයට සුදුසු ස්ථානයන්හි නාමස්කන්ධ යන්ගෙන් යුත් පටිසන්ධි සිත උපදනේ ය. උපදනේ ද, පවත් නේ ද, චුතවන්නේ ද, නාම ධර්මයෝ ය. මෙයට අරූප ධ්‍යාන යයි ද, අරූප ලෝකය යයි ද

ව්‍යවහාර වේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූපී භවයට භවාග්‍රයයි ද ව්‍යවහාර කරන්නේ ය. ලෝක වශයෙන් සත්වාවාස වශයෙන් ප්‍රථග්ජන සත්වයන් උපදනා අන්තිම ස්ථානයයි. මෙහි උපන් සත්වයෝ ද එහි ආයු කාලය වන මහා කල්ප අසූසාරදහස අවසානයේ චුතියෙන් පසු නැවත මිනිස් ලොව ආදී සුගති ස්ථානයන්හි උපදනෝ ය. පසුව මාර්ගඵලාධිගමයක් නොකලේ නම් අපායෙහි ද ඉපදිය හැකිය. සෑම බඹලොවකින්ම චුත වීම සමඟ භවය අපායෙහිම පටිසන්ධි නොවන්නේ ය. පසුව ගති නියමයක් නැත්තේ ය.

සෝවාන් මාර්ගයට පැමිණි ආර්‍යයන් එහි උපත ලැබුවේ නම් එහි දීම ඉතිරි මාර්ග ඵල සම්පූර්ණ කොට පිරිනිවන් පාන්නේය. සෝවාන් මාර්ගය එහි නොලැබේ. ධර්ම ශ්‍රවණය නොකල හැකි බැවින් සෝවාන් මාර්ගය නොලැබේ. රහතන් වහන්සේ අරූපධ්‍යාන ලැබුයේ නම් අරූපාවචර ක්‍රියා සිත් සතර අතුරෙන් යම්කිසි සිතක් සුදුසු පරිදි ලැබෙන්නේ ය. ප්‍රථග්ජනයා සහ ආර්‍යයන් වහන්සේලා සත් දෙනෙක් අරූපී ලෝකයෙහි සිටිති. (සිටිය හැකි වේ).

අරූපාවචර චිත්තය ඉක්මවන අරමුණු දෙකක් සහ අරමුණු ගන්නා ක්‍රම ද දෙකකි. ආකාසානඤ්චායතන සිතින් පඤ්චම ධ්‍යාන සිතට අරමුණු වූ කසිණ නිමිත්ත අත්හැර එයින් උගුළුවා ගත් අහස අරමුණු කරයි. විඤ්ඤානඤ්චායතන සිතින් ආකාසානඤ්චායතන සිත අරමුණු කරයි. ආකිඤ්චඤ්ඤායතන සිතින් ආකාසානඤ්චායතන සිතෙහි නැති බව—නාස්ති භාව ප්‍රඥප්තිය මෙනෙහි කරයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිතෙ ආකිඤ්චඤ්ඤායතන සිත අරමුණු කරයි.

අරූපාවචර සිත් සියල්ලම උපෙක්ඛා ඒකග්ගතා යන ධ්‍යාන අංග දෙකින් යුක්ත වේ, රූපාවචර අරූපාවචර සිත් සියල්ල එක්කොට මහග්ගත සිත් විසිහතක් යයි කියති. කාමාවචර චිත්ත යන්ට වඩා උතුම් සිත් යන අර්ථයෙන් එසේ ව්‍යවහාර වේ. (බඹලොව දී) 'යට කරන ලද කෙලෙස් නූපදනා බැවින් ද මහත් බවට පැමිණියා වන්නේ ය.

ලෞකික සිත් මෙතෙකින් අවසන් වූයේ වී නමුත් තවත් බඹලෝ පහක් ඇත්තේය. එය සුද්ධාවාස භූමි පහයි. අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සීය අකනිට්ඨය කියා ඒ පහ නම්කර

තිබේ. එහි උපදිනු යේ කාමරාග, ව්‍යාපාදයත් සහමුලින්ම පහ කරන ලද. ඉතා පිරිසිදු චිත්ත සන්තාන ඇති කෙලෙස් කිළිටු බොහෝ දුරට ඉවත් කළ උතුමන් පමණකි. එහි සමථ විදර්ශනා දෙකින් ම බොහෝ ඉහල තත්ත්වයට පත් වූ ධ්‍යාන වශයෙන් පඤ්චමධ්‍යාන සමාධිය ලත් මාර්ග ඵල වශයෙන් අනාගාමී ඵලය ලත් උතුමෙකි.

## ලෝකෝත්තර සිත් 8

සොතා පත්ති මග්ග චිත්තය
සකදගාමී මග්ග චිත්තය
අනාගාමී මග්ග චිත්තය
අරහත්ත මග්ග චිත්තය

සොතා පත්ති ඵල චිත්තය
සකදගාමී ඵල චිත්තය
අනාගාමී ඵල චිත්තය
අරහත්ත ඵල චිත්තය.

ලෝකෝත්තර මාර්ග සිත් සතර හා ඵල සිත් සතර යන මේ සිත් පළමු සඳහන් වූ සිත් වලට වඩා බොහෝ වෙනස් වූ සිත් 8 කි. පළමුවකී සිත් ලෞකික සිත් නම් වේ. ඒ සිත්වල අරමුණු වූයේ රූප ශබ්ද ආදියත් නාම ධර්ම වන සිත් සහ චෛත සික ධර්මයනුත් සහ නාම රූප ධර්ම සහ ප්‍රඥප්ති ධර්ම යන්ය. ලෝකෝත්තර සිත්වල අරමුණ වූයේ ඒකාන්ත, ශාන්ත ස්වභාව යෙන් යුත් පඤ්චස්කන්ධ ලෝකයට අයත් නොවන්නාවූ ද සංඛත ධර්මයන්ට අයත් නොවූ අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණ ධාතුවයි.

ඉහත පෙන් වූ සිත් මෙන් මේ සිත් සෑම කල්හිම සෑම විටම සෑම කෙනෙකුටම ලෙහෙසියෙන් ඇති නොවන්නේ ය. පළමුව බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කොට පසුව ලෝකයාට පෙන්වා දේශනා කොට වදරන සේක. ත්‍රිහේතුක පටිසන්ධි යක් ලත් කෙනෙකු විසින් ආර්‍ය්‍යයන් වහන්සේලා ගෙන් අසා දැනගෙන ඊට සුදුසු ප්‍රතිපත්ති සම්පූර්ණ කිරීමෙන් මේ ලෝකෝත් තර ධර්ම ලබා ගත යුතු වන්නේ ය.

එසේ පළමුව ලබන සිත සෝවාන් මාර්ග සිතයි. සොත යනු සැඩ දිය පහරට නමෙකි. එම සැඩ දිය පහර ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයට උපමාකර ආර්‍ය අෂ්ඨාංගික මාර්ග නමැති සැඩ දිය පහරින් ගසාගෙන නිර්වාණ නැමැති සාගරය කරාම ගෙන යන්නේ ය. පාරමී ධර්ම එක්තරා ප්‍රමාණයකින් සම්පූර්ණ වීමෙන් සෝතාපත්ති මාර්ගයට පැමිණ නිවන් අවබෝධ කරන්නේය. දරුචීරිය රහතන් වහන්සේ මෙන් වහා නිවන් ලබන පින් සම්පූර්ණ වූ අයද සිටියහ. ඇතැම් අය සෝවාන් ආදී පළමු මාර්ගඵල යන්ට පැමිණ දෙවනුව දෙව්ලෝ බඹලෝ ආදී දක්වාම අකනිට්ඨා බඹලොව දක්වා ගොස් රහත් වී පිරිනිවන් පාන්නේ ය. (තමා කැමති ආකාරයෙන්) චූල රථකාර මහා-රථකාර යන දෙවියන් සහ අනාථපින්ඩික, විසාකා මහා උපාසිකාව නිදසුන් වශයෙන් පෙන්විය හැක. සොත යනු මාර්ගාංග අට සම්පූර්ණව එකවරටම ලැබෙන අවස්ථාවයි. මේ අටෙන් කීපයක් කාමාවචර කුසල් සිත් වලද ඇති වේ. එකවර අටම ඇතිවන්නේ මාර්ග කුසල් සිත් වලයි. ඵල සිතේද ඇති වේ. සමථ භාවනා වෙන් මාර්ගාංග දියුණුවක් නොවූවත් සමථ භාවනාවෙන් ලබන චිත්ත සමාධිය විදර්ශනා භාවනාවට බොහෝ උපකාර වේ. එසේ සමාධිය ලබාගැනීම ද ඉතා අසීරු කාරණයකි. සමාධියෙන් කෙලෙස් මල පිරිසිදු කොට ශාන්ත බවට පමුණුවා දුන් කල්හි ත්‍රිලක්ෂණ වශයෙන් භාවනා කිරීම ඉතා පහසු වන්නේ ය. මාර්ග සිත ලැබුණු වහාම ඊළඟට අතරක් නොතබා ඵල සිත් 2 ක් හෝ 3 ක් ලැබේ. නුවණ අඩු වැඩි තරමින් එසේ ඵල සිත් ලබන්නේ ය. මන්ද පඤ්ඤ තික්ඛ පඤ්ඤයන පුද්ගල භේදය අනුව එසේ වන්නේ ය.

සෝවාන් පුද්ගලයින් තුන් දෙනෙකි. එනම් එක බීජ, කොලංකොල, සත්තක්ඛත්තු පරම යනු වෙති. එක බීජ පුද්ගලයා එක් වරක් නැවත ඉපද සියල්ල සම්පූර්ණ කර රහත්වී පිරිනිවන් පාන්නේ ය. කොලංකොල යනු දෙවන ආත්මයත් සයවන ආත්මයත් අතරතුර ඉපද පිරිනිවන් පාන්නාය.

සත්තක්ඛත්තු පරම පුද්ගලයා හත්වෙනි වාරය දක්වා සසර සැරි සරා රහත් වී පිරිනිවන් පාන්නේ ය. සෝවාන් මාර්ගය දහසක් ක්‍රම තිබෙන බව ''දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් ඵලය'' කියා තිබීමෙන් පැහැදිලි වෙයි. ඒ ධ්‍යාන ක්‍රමයට ලැබිය හැකි වේ.

සෝවාන් මාර්ගයෙන් සක්කාය දිට්ඨි විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුන නැති කරන්නේ ය. ක්ලේශ වශයෙන් දිට්ඨි, විචිකිච්ඡා දෙකයි, ලෝභ මූල දිට්ඨි සම්පයුත්ත සිත් 4 හා විචිකිච්ඡා සිතද පහ කරන්නේ ය. සත් වාරයකට කාම භවයේ පටිසන්ධිය සීමා වන්නේ ය. අටවන වාරයේ කාම භවයේ නූපදිති. අපායෙන් මිදුනු උතුමෙකි. ක්ලේශ සියල්ලෙහිම අපායගාමී ශක්තිය නැති කෙනෙකි. වෙන ශාස්තෘ වරයෙකු නොඅදහයි.

**සෝවාන් මාර්ගය ලැබීමට උපකාරක ධර්ම සතරකි.** සද්ධර්ම ශ්‍රවණය, සත් පුරුෂ ආශ්‍රය, ත්‍රිහේතුක පටිසන්ධිය, යෝනිසෝ මනසිකාරය. මේ කරුණු 4 සම්පූර්ණ විය යුතු ය. අරූප භවයෙහි සද්ධර්ම ශ්‍රවණය නැති නිසා සෝවාන් විය නොහැකි ය. සෝවාන් ඵලස්ථයා එහි ඉපද ඉතිරි මාර්ග ඵල ලබයි. සෝවාන් වීමේදී විපල්ලාස ධර්ම 8 ක් නැති කරයි.

අනිත්‍ය නිත්‍ය වශයෙන් ගන්නා–සංඥ විපල්ලාසය, දිට්ඨි විපල්ලාසය, චිත්ත විපල්ලාසය ද,

දුක්ඛය සුඛ වශයෙන් ගන්නා–දිට්ඨි විපල්ලාසය
අසුභ සුභ වශයෙන් ගන්නා–දිට්ඨි විපල්ලාසය

අනාත්මය ආත්මය වශයෙන් ගන්නා–සංඥ විපල්ලාසය, චිත්ත විපල්ලාසය දිට්ඨි විපල්ලාසයද, යන මේ විපල්ලාස ධර්ම 8 සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරන්නේ ය. රූප භවයෙහි සෝවාන් වන ආයුෂ්මතුන් නැවත කාම භවයේ පටිසන්ධි නොගනී. සෝවාන් වූ වාට පසු නැවත නිවන් සුව විඳින කැමැත්ත ඇතිවුනි නම් ඵල සිතින් යුතුව ඵල සමාපත්ති සුවයෙන් සිටිති. මාර්ග සිත් ලැබෙන්නේ එක වරක් පමණයි. නැවත මාර්ග සිතට කළයුතු වැඩක් නැති බැවින් නැවත නැවත ලබන්නේ ඵල සිතයි.

## සකෘදගාමී මාර්ග සිත

සෝවාන් මාර්ගඵල ලබන ලද ආයුෂ්මතුන් වහන්සේලා දෙවනුව ලබන මාර්ගතත්ත්වය සකදගාමී මාර්ගය යි. සකදගාමී මාර්ගය ලබාගැනීමට නැවත විදර්ශනා භාවනාව කර

කෙලෙස් වශයෙන් කාමරාග පටිඝ යන දෙකෙහි ගොරෝසු ගතිය තුනී කරයි. නැවත මිනිස් ලොව එක් වරක් පටිසන්ධි ගැනීමේ ශක්තිය ඇති පුද්ගලයා ය.

සකෘදගාමීන් පස් දෙනෙක් ගැන කියති.

1. ඉධපත්වා ඉධපරිනිබ්බායි
2. ඉධපත්වාතත්ථ පරිනිබ්බායි
3. තත්ථපත්වා තත්ථපරිනිබ්බායි
4. තත්ථා පත්වා ඉධ පරිනිබ්බායි
5. ඉධ පත්වා තත්ථ නිබ්බත්තිත්වා වා ඉධ පරිනිබ්බායි.

යන ආයඞ වහන්සේලා 5 දෙනෙක් පෙන්නුම් කරයි.
පළමුවැන්නා මෙහිදී සකෘදගාමීව මෙහිම පිරිනිවන් පාති.
දෙවැන්නා මෙහි සකෘදගාමීව දෙව්ලොව පිරිනිවන් පාති.
තෙවැන්නා එහි සකෘදගාමී වී එහි පිරිනිවන් පාති.
සිව් වැන්නා එහි සකෘදගාමීව මෙහි පිරිනිවන් පාති.
පස්වැන්නා මෙහි සකෘදගාමීව එහි ඉපද චුතවී නැවත මෙහි ඉපද පිරිනිවන් පාන්නාය.

## අනාගාමී මාර්ග ඵල

තුන් වෙනුව මාර්ග ඵල ලැබීම අනාගාමී නම් වේ. සකෘද ගාමී මාර්ග ඵල ලාභීන් නැවතත් විදර්ශනාව දියුණුකොට භාව නාව දියුණු කොට අනාගාමී මාර්ග ඵල ලබයි. කාම සම්පත් කාමාසාවන් සහ පටිඝයද සහමුලින්ම නැති කරති. කාමරාග පටිඝ යන සංයෝජන දෙකත් දෝස මූල සිත් දෙකත් කාම ලෝකයෙහි උත්පත්තියත් නැතිකර ලබන තත්ත්වයයි. අනා ගාමීත්වය. ධ්‍යාන නොලැබූ අනාගාමීන් වහන්සේමරණා-සන්නයේ හෝ ධර්ම තාවක් ලෙස ධ්‍යානයක් ලැබී බ්‍රහ්ම ලෝකයෙහි උපදනේ ය. අනාගාමී වූවාට පසු කාම ලෝකයේ උපදනා කෙලෙස් ශක්තිය නැති බැවින් උපදින්ට ඉඩ ඇති තැන බ්‍රහ්ම ලෝකය පමණයි. රහත් නොවූ බැවින් කොතනක හෝ ඉපදීමේ ශක්තිය ඉතිරිවී තිබෙන බැවින් උත්පත්තියක් ලැබිය යුතු වේ. පඤ්චම ධ්‍යාන ලාභී අනාගාමීන් සුද්ධාවාස යෙහි උපදී. කැමති පරිදි වෙන නැනක වෙහප්ඵලය ආදීන්හි ද ඉපදිය හැකි වන්නේ ය.

## අනාගාමීන් වහන්සේලා පස් දෙනෙකි

1. අන්තරා පරිනිබ්බායීය
2. උපහච්ච පරිනිබ්බායීය
3. අසංඛාර පරිනිබ්බායීය
4. සසංඛාර පරිනිබ්බායීය
5. උද්ධං සොත අකනිට්ඨ ගාමීය යන පස්දෙනාය. ඒ ආයඪී යන් පස්දෙනා අවිහයෙහි ඉපිද එහිම පිරිනිවන් පාන්නේ ය. තවත් කෙනෙක් උසස් බඹතල යන්හිදී කැමති පරිදි අකනිටා බඹලොව දක්වා යන්නේ ය. අනාගාමීන් උපදින ස්ථාන සුද්ධාවාස බඹතල පසකි. අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අක නිට්ඨය යන පසයි. ඉන්ද්‍රිය ධර්මයන්ගේ දියුණු තත්ත්වයට අනුව එසේ උත්පත්ති ගන්නේය. සද්ධින්ද්‍රිය, සතින්ද්‍රිය, විරියිඉන්ද්‍රිය සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන ඉන්ද්‍රිය ධර්මයන්ගේ දියුණු ආකාරයට ද උත්පත්ති ලබන්නේ ය.

සෝවාන් මාර්ග ඵල ලත් සමහර අය පිළිවෙලින් දෙව්ලෝ සහ සුද්ධාවාස යන්හි ද අකනිට්ඨා බඹලොව දක්වා චුති පටිසන්ධි වශයෙන් ගොස් අකනිට්ඨා වෙහි දී රහත් වී පිරිනිවන් පාන්නේ යයි කියති. සුද්ධාවාසයන්හි අනාගාමී ඵලස්ථයින් සහ අර්හත් මාර්ගස්ථයින් සහ ඵලස්ථයින් යන ආයඪීයන් තුන්දෙනා පමණක් සිටින්නේ ය.

## අර්හත් මාර්ගඵල

අනාගාමී උතුමෝ නැවත විදර්ශනා වශයෙන් භාවනා කොට අර්හත් මාර්ගඵලයන්ට පැමිණෙති. අර්හත් මාර්ගයේදී ඉතිරිව තිබූ සියලුම ක්ලේශ ශක්තීන් මූලින් උපුටා දමා සකල ක්ලේශ යන් ප්‍රහීණ වීමෙන් ලබන අග්‍ර දක්ඛිණෙය්‍ය නම් වූ සියළු පූජාවන් ලැබීමට සුදුසු උත්තමයෙක් වන්නේ ය. ඉතිරිව තිබූ සංයෝජන ධර්ම පහ 5 වන රූප රාග, අරූපරාග. මාන උද්ධච්ච අවිජ්ජා යන සංයෝජන පහත් ලෝභ මූල සිත් 4 ත් උද්ධච්ච සිතත් සියළු ක්ලේශ ධර්මයනුත් පහකර නැවත උත්පත්තියක් නොලබන අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණ ධාතුව අවසාන වශයෙන් අවබෝධ කල උතුමෙක් වන්නේ ය.

අග්‍ර දක්ඛිණෙයයා තත්ත්වයට පැමිණීමට කර්මාවරණ, ක්ලේශාවරණ, විපාකාවරණ, නැති ත්‍රිහේතුක පටිසන්ධියක් ද ඇත්තා වූ සද්ධම්ම සවණ, පතිරූපදෙස වාස, යෝනිසෝ මනසිකාරාදීයෙන්ද යුක්තව බුද්ධශාසනයක් පවත්නා කාලයක ඉපිද සිටිය යුතුය.

නිර්වාණ ධාතුව විද්‍යමාන සදකාලික ධර්මයක් වුවත් මෙකී සුදුසු තත්ත්වය නැතිව ලැබිය නොහැකි ය. සොත නැමති සැඩ දිය පහරට අසුව ගලා ගෙන ගොස් පැමිණීමේ අවසාන යයි.

අවසානයට ලෝකෝත්තර සිත් 8 වදල සේක. ලෝකෝත්තර සිත් 8 ක් ලැබීම සුද්ධ විපස්සනා භාවනා ක්‍රමයට ලෝකෝත්තර සිත් ලැබීමයි. සමථ යානිකයාගේ වශයෙන් ධ්‍යාන ලබා ධ්‍යාන අංග (හෝ) පාදක කර විදර්ශනා භාවනා කොට මාර්ග ඵල ලැබීම තවත් ක්‍රමයකි. දෙකෙහිම නිවන් අවබෝධ වීමේ අඩුපාඩුවක් නැත. එහෙත් ප්‍රාතිහාර්‍ය ආදී කිසිත් නැති සාමාන්‍ය ක්‍රමයයි. සුද්ධ විපස්සනා යානය වන්නේ. ඉද්ධිවිධ දිබ්බසොතාදී ඥානයන් ඒ ආර්‍යයන්ට නැත්තේ ය. නිරොධ සමාපත්තියට ද පැමිණිය නොහැක.

බුදුරජාණන් වහන්සේ අදම්‍ය පුරුෂයන් දමනය කිරීම් ආදියට ද අනුන්ගේ සිත් බලා කමටහන් දීම ආදිය සඳහා ද ධ්‍යාන බලය යොදා ගත්තේ ය. ධ්‍යාන අභිඥා ආදියෙන් ඉර්ද්ධියෙන් අග්‍රස්ථානය ලත් මුගලන් මහ රහතන් වහන්සේට නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීමට අවසර දුන් සේක. බුදුරජාණන් වහන්සේ බක බ්‍රහ්ම ආදීන් ද ආලවකාදී යක්ෂයන් ද එසේ දමනය කල සේක. යමකප්‍රාතිහාර්‍යයද පෑ සේක.

විපස්සනා භාවනා වැඩීමට හා ධ්‍යාන භාවනා වැඩීමට කරන භාවනා ක්‍රම දෙකකි. ආරම්මණ උපනිජ්ඣායනය හා ලක්ඛණ උපනිජ්ඣායනය යන භාවනා ක්‍රම දෙක. ධ්‍යාන ලැබීම සඳහා අරමුණු වෙතම සිත පවත්වාගන එහිම සිත රඳවා භාවනා කිරීමයි. ලක්ඛණ උපනිජ්ඣායනය වැඩීමෙන් සෝවාන්

ආදී මාර්ග ඵල ධර්මයන් ලැබෙන්නේ ය. තම පඤ්චස්කන්ධය කෙරෙහි සිත පිහිටුවා නාම රූප ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් ත්‍රි ලක්ෂණයට නගා භාවනා වැඩීමයි. එය නිර්වාණාවබෝධය පිණිස පවත්නේය. ධ්‍යාන ලාභියා ධ්‍යානය පාදක කොටද විදර්ශනා භාවනා කර නිර්වාණාවබෝධය ලබයි. එසේ නොවූ යේ නම් ධ්‍යානය නොපිරිහී තිබුනේ නම් මරණින් පසු ඊට සුදුසු බ්‍රහ්මලයක උපදින්නේ ය.

සංක්ෂේප ක්‍රමයට මාර්ගඵල ලැබීමේදී විදර්ශනා භාවනාවෙන් විදර්ශනා නුවණ ලබා අනතුරුව මාර්ග සිත උපදවා චිත්ත විථියෙහි පරිකර්මාදීන්ට අනතුරුව මාර්ග සිත් සතරින් පළමු වන සෝවාන් මාර්ග සිත ඉපදී ඊට අනතුරුව අතරක් නොතබා එම චිත්ත විථියේදීම ඵලසිත් 2 ක් හෝ 3 ක් ලබයි. ඊට පසු නැවතත් භාවනා දියුණුකොට ඉතිරි මාර්ග ඵලයන් ද ලබයි.

ධ්‍යාන ක්‍රමයට එක එක ධ්‍යාන ලාභියෙක් තමා කැමති පරිදි මාර්ග ඵලයන්ට පැමිණේ. එසේ එක ධ්‍යාන ලාභියෙකුටම මාර්ග ඵල සිත් 8 ම ලබා පරිනිර්වාණය කල හැක. ඒ පිළිවෙලට එක ධ්‍යානයක් ලබා මාර්ග ඵල අටම ලබන ක්‍රමයට මාර්ග ඵල සිත් 40 ක් ලැබෙති. ඒ විස්තාර ක්‍රමය යි. මාර්ග ඵල සිත් 2 ම එකම චිත්ත විථියෙහිදී ලබන්නේ ය, යන කාරණය එසේ එකම විථියක දී ලැබීම සිද්ධාන්තයකි. මාර්ග සිතට අනතුරුවම ඵලය ලැබීම ධර්මයේ පෙන්වා තිබෙන ඒකාන්ත සිද්ධියකි. මාර්ග සිතින් කෙලෙස් නැවීම සිදුවූවාට පසු එහි විපාකය වශයෙන් ඵල සිත ලැබෙන්නේ ය. ඵල සිත ලබාගැනීමට වෙනම නැවත භාවනාවක් වදරා නැත්තේ ය. එය නව ලොව්තුරු ධර්මයෙහි අකාලිකො යනුවෙන් වදළ සේක. ඊට පසු නැවත නිවන් සුවය ලැබීම සඳහා තමා කැමති කාලයක් පුරුදු තාවයට අනුව ඵලසිතින් යුක්තව සිටියි.

ධ්‍යාන ලාභීන්ද ධ්‍යාන සමාපත්තියට සමවැද ධ්‍යාන සුව යෙන් කැමති පරිදි සිටිති. ධ්‍යාන නොලත් මාර්ගඵල ලාභි ආයර්‍යයන්ගේ මාර්ග සිත ප්‍රථම ධ්‍යානයට සුදුසු සමාධි යෙන් යුක්ත වෙයි. ධ්‍යාන සහිත මාර්ග ඵල ලාභීන්ට ධ්‍යානයට අයත් සිත් සහ මාර්ග ඵල සිත් ද ඇතුලත් සිත් 11 ක් එක ධ්‍යාන ලාභී පුද්ගලයෙකුගේ වශයෙන් ගැනීමේ දී ප්‍රථමධ්‍යානික ලෝකෝත්තර සිත් 11 ද ද්විතියධ්‍යාන 11 ද තතියධ්‍යාන 11 ද

චතුත්ථධ්‍යාන 11 ද පඤ්චමධ්‍යාන 11 ද යන පිළිවෙලට මෙහි මාර්ග ඵල සිත් 40 ක් ද ධ්‍යාන සිත් 15 ක් ද යන ක්‍රමයට සිත් සියල්ල විස්තර ක්‍රමයට 55 ක් වේ. මෙසේ ගණන් ගැනීමේදී සිත් 89 ක්‍රමයෙන් ලැබුණු ලෝකෝත්තර සිත් 8 අත් හැර ඒ වෙනුවට මෙහි ලැබෙන ලෝකෝත්තර සිත් 40 හ එකතු කොට ගත් කල්හි විස්තාර ක්‍රමයට සිත් 121 ක් වෙති.

## ලෝකෝත්තර සිත් 8 ධ්‍යාන ක්‍රමයට 40 ක් වේ.

එහි ස්වරූපය

| ලෝකෝත්තර සිත් සතලිසෙහි ස්වරූප | සෝවාන් මාර්ග සිත් | සෝවාන් ඵල සිත් | සකෘදාගාමි මාර්ග සිත් | සකෘදාගාමි ඵල සිත් | අනාගාමි මාර්ග සිත් | අනාගාමි ඵල සිත් | අර්හත් මාර්ග සිත් | අර්හත් ඵල සිත් | ධ්‍යාන ක්‍රමයට ලෝකෝත්තර සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථම ධ්‍යාන | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| ද්‍විතිය ධ්‍යාන | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| තතිය ධ්‍යාන | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| චතුත්ථ ධ්‍යාන | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| පඤ්චම ධ්‍යාන | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 8 |
| | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 40 |

මාර්ග ඵල සිත් 40

මේ සමාපත්ති දෙකෙහි දී මාර්ග ඵල ලාභියා ධ්‍යාන කුසල් සිත සමාපත්ති වශයෙන් බොහෝ වේලාවක් කාලයක් හෝ ලබයි. මාර්ග ඵල ලාභීන් සමාපත්ති වීථියෙහි ඵල සිතින් යුක්තව සිටිති. ධ්‍යාන සම්පත්ති ලාභියා විපාක සිතින්බඹලොව උපත ලබයි. මාර්ගඵල ලාභියා ඵල සිතින් නිවන අරමුණු කරගන නිවන් සුවයෙන් සිටිති. මේ විපාකයන් එකක් ගැනවත් අමුතුවෙන් භාවනා කිරීමක් පෙන්වා නැත. කිසිම විපාකයක් ලැබීමට අමුතු උත්සාහයක් ගන්නා තැනක් දැකිය නොහැක. මාර්ග ඵලලාභීන් ඊට පසු වෙන භවයක උපත ලැබුවත් තමා ලත් ඵල සිතින් ඵල සමාපත්ති යෙන් යුතුව සිටිය හැකි වේ. මාර්ගසිත් නැවත ලැබීමක් හෝ පිරිහීමක් නොවේ. කළ යුත්ත කර අවසන් වූ බැවිනි. මාර්ග කුසලයේ බලයෙන් පහ කරන ලද කෙලෙස් නැවත නූපදනා බැවින් මාර්ග කුසලයට නැවත කරන්නට වැඩක් නැත්තේ ය. මාර්ග කුසලය එක් වරක් පමණක් ලැබේ. මාර්ග කුසලයෙන් කළ යුතු ක්‍රියාව එකවරටම කර අවසන් කරති. නැවත මාර්ග සිත ලැබීමක් හෝ ඵලයට පැමිණීමට නැවත ප්‍රතිපත්ති ක්‍රමයක් හෝ පෙන්වා නැත. එබැවින් මාර්ගයට අනතුරුව එම වීථියේ මාර්ග සිතට අනතුරුවම ඵලසිත් 2 ක් හෝ 3 ක් පෙන්වා තිබෙන ආකාරය පිළිගැනීමට සිදු වෙයි. වෙන ක්‍රමයක් පෙන්වා නැති හෙයින් පිළිගැනීමට සිදු වෙයි. චිත්ත වීථි කිසිවක මාර්ග සිතට අනතුරුව භවාංග සිතක් හෝ වෙන යම්කිසි සිතක් පෙන්වානැත. මාර්ග චිත්ත වීථියේ සෑමමාර්ග වීථි යකම වීථි 4හිම මාර්ගයට අනතුරුව තිබෙන්නේ ඒ මාර්ග සිතට අයිති ඵලසිත් බැවින් ඒ ක්‍රමය පුරාණ විසුඬී මාර්ගයෙනි සෝවාන්මාර්ග විථිය හා අර්හත් මාර්ග විථියද ප්‍රස්තාර කොට අකාලික ගුණය දේශනා කරන තැන පෙන්වා තිබේ. අකාලික පදය ඒ සඳහා වදාළ බව පෙන්වා තිබේ.

## සිත් 89 බෙද දැක්වීම

(1)

| | | |
|---|---|---|
| කාමාවචර සිත් | 54 | භූමි භෙදයෙන් සිත් 89 |
| රූපාවචර සිත් | 15 | |
| අරූපාවචර සිත් | 12 | |
| ලෝකෝත්තර සිත් | 8 | |

(2)

| | | |
|---|---|---|
| අකුසල් සිත් | 12 | ජාති භෙදයෙන් සිත් 89 |
| කුසල් සිත් | 21 | |
| විපාක සිත් | 36 | |
| කිරිය සිත් | 20 | |

(3)

| | | |
|---|---|---|
| අහේතුක සිත් | 18 | අහේතුක සහේතුක වශයෙන් සිත් 89 |
| සහේතුක සිත් | 71 | |

(4)

| | | |
|---|---|---|
| අසෝභන සිත් | 30 | අසෝභන සෝභන භෙදයෙන් 89 |
| සෝභන සිත් | 59 | |

(5)

| | | |
|---|---|---|
| කාමාවචර සිත් | 54 | කාම මහග්ගත ලෝකෝත්තර සිත් 89 |
| මහග්ගත සිත් | 27 | |
| ලෝකෝත්තර සිත් | 8 | |

(6)

| | | |
|---|---|---|
| ලෞකික සිත් | 81 | ලෞකික ලෝකෝත්තර වශයෙන් 89 |
| ලෝකෝත්තර සිත් | 8 | |

(7)

| | | |
|---|---|---|
| සුඛ සහගත සිත්* | 39 | අනුභවන භෙදයෙන් වේදනා වශ වශයෙන් සිත් 89 ය 97* වේ ලෝකෝත්තර සිත් දෙවරක් හෙයින් |
| දුක්ඛ සහගත සිත් | 3 | |
| උපේක්ඛා සහගත සිත්* | 55 | |

(8)

| | |
|---|---|
| සුඛ සහගත සිත් | 1 |
| සොම්නස් සහගත සිත්* | 38 |
| දුක්ඛ සහගත සිත් | 1 |
| දොම්නස් සහගත සිත් | 2 |
| උපෙක්ඛා සහගත සිත්* | 55 |

ඉන්ද්‍රිය භෙදයෙන් වේදනා වශයෙන් සිත් 89 ය 97* වේ ලෝකෝත්තර සිත් සොම්නස් උපේක්ඛා යන දෙයාකාරයටම ඇතිවීම දක්වීම සඳහා එසේ පෙන්වා තිබේ. පුද්ගල භෙද යෙන් එසේ සිදුවේ. ඇතැම් කෙනෙකුගේ උපේක්ඛා වේදනා වෙන් යුක්ත වේ. ඤාණ සම්පයුත්ත කාමාවචර සිත් උපෙක්ඛා සෝමනස්ස යන දෙයාකාරයකි භාවනාවේදී එක් ආකාරයක් ගැනීමෙන් මාර්ග ඵල සිත් ද එසේ වන්නේ ය.

| සිත් 89 හි හෝ සිත් 121 හි ස්වරූප | සිත් | සුඛ සහගත සිත් | සොමනස්ස සහගත සිත් | දුක්ඛ සහගත සිත් | දොමනස්ස සහගත සිත් | උපෙක්ඛා සහගත සිත් | සම්පයුත්ත සිත් | විප්පයුත්ත සිත් | අසංඛාරික සිත් | සසංඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් | 12 | — | 4 | — | 2 | 6 | 8 | 4 | 7 | 5 |
| අකුසල විපාක | 7 | — | — | 1 | — | 6 | — | 7 | 7 | — |
| අහේතුක කුසල විපාක | 8 | 1 | 1 | — | — | 6 | — | 8 | 8 | — |
| ,, කිරිය | 3 | — | 1 | — | — | 2 | — | 3 | 3 | — |
| අහේතුක | 18 | 1 | 2 | 1 | — | 14 | — | 18 | 18 | — |
| සහේතුක | 71 | — | 28 | — | 2 | 41 | 55 | 16 | 19 | 52 |
| මහා කුසල් | 8 | — | 4 | — | — | 4 | 4 | 4 | 4 | 4 |
| මහා විපාක | 8 | — | 4 | — | — | 4 | 4 | 4 | 4 | 4 |
| මහා කිරිය | 8 | — | 4 | — | — | 4 | 4 | 4 | 4 | 4 |
| කාම විපාක | 23 | 1 | 5 | 1 | — | 16 | 4 | 19 | 19 | 4 |
| කාම කිරිය | 11 | — | 5 | — | — | 6 | 4 | 7 | 7 | 4 |
| කාමාවචර | 54 | 1 | 18 | 1 | 2 | 32 | 20 | 34 | 37 | 17 |
| රූපාවචර | 15 | — | 12 | — | — | 3 | 15 | — | — | 15 |
| අරූපාවචර | 12 | — | — | — | — | 12 | 12 | — | — | 12 |
| *ලෝකෝත්තර | 8 | — | 8 | — | — | 8 | 8 | — | — | 08 |
| සංක්ෂේප ක්‍රමයට | 89 | 1 | 38 | 1 | 2 | 47 | 55 | 34 | 37 | 52 |
| විස්තාර ක්‍රමයට | 121 | 1 | 62 | 1 | 2 | 55 | 87 | 34 | 37 | 84 |
| විස්තාර ලෝකෝත්තර | 40 | — | 32 | — | — | 8 | 40 | — | — | 40 |

* ලෝකෝත්තර සිත් 8 සොම්නස් සහගතව සහ උපෙක්ඛා සහගතව පෙන්වා ඇත. පුද්ගලයින් ගේ ස්වභාවය අනුව ඒ දෙයාකාරයෙන්ම එම (ලෝකෝත්තර) සිත් ඇතිවන බව සැලකිය යුතුයි.

චිත්ත කාණ්ඩයෙහි ස්වරූප අවසන්

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# චෛතසික පරමාර්ථය

## දෙවන පරිච්ඡෙදය

43 එකුප්පාද නිරොධාච-එකාලම්බන වත්ථුකා,
චෙතො යුත්තා විපඤ්ඤාස-ධම්මා චෙතසිකා මතා.

44 කථං ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරො චෙති සත්තිමෙ චෙතසිකා සබ්බ චිත්ත සාධාරණා නාම.

45 විතක්කො, විචාරො, අධිමොක්ඛො, විරියං, පීති ඡන්දෙ චාති ඡ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම.
එවමෙතෙ තෙරස චෙතසිකා අඤ්ඤ සමානාති වෙදිතබ්බා.

46 මොහො, අහිරිකං, අනොත්තප්පං, උද්ධච්චං, ලොභො, දිට්ඨි මානො, දොසො, ඉස්සා, මච්ඡරියං, කුක්කුච්චං, ථීනං මිද්ධං, විචිකිච්ඡා චෙති චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම.

47 සද්ධා, සති, හිරි, ඔත්තප්පං, අලොභො, අදොසො, තත්‍රමජ්ඣත්තතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්ත ලහුතා, කායමුදුතා, චිත්තමුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්, මඤ්ඤතා, කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා කායුජ්ජු කතා, චිත්තුජ්ජුකතා චෙති එකූනවීසතිමෙ චෙතසිකා සොභණ සාධාරණා නාම.

48 සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො චෙති තිස්සො විරතියො නාම.

49 කරුණා, මුදිතා අප්පමඤ්ඤායො නාමාති සබ්බථාපි පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං පඤ්චවීසති මෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා.

එත්තාවතාව :

50 තෙරසඤ්ඤසමානා ච චුද්දසා කුසලා තථා,,
සොභනා පඤ්චවීසාති-ද්විපඤ්ඤාස පවුච්චරෙ.

51 තෙසං චිත්තා වියුත්තානං — යථා යොග මිතො පරං,
චිත්තුප්පාදෙසු පච්චෙකං — සම්පයොගො පවුච්චති.

52 සත්ත සබ්බත්ථ යුජ්ජන්ති — යථායොගං පකිණ්ණකා,
චුද්දසා කුසලෙස්වෙච සොභනෙස්වෙච සොභනා.

53 කථං ? සබ්බචිත්ත සාධාරණා තාව සත්ත චෙතසිකා සබ්බෙසු එකූනනවුති චිත්තුප්පා දෙසු ලබ්භන්ති.

54 පකිණ්ණකෙසු පන විතක්කො තාව ද්විපඤ්ච විඤ්ඤාණ වජ්ජිත කාමාවචර චිත්තෙසු චෙව එකාදසසු පඨමජ්ඣාන චිත්තෙසු චාති පඤ්චපඤ්ඤාස චිත්තෙසු උප්පජ්ජති.

55 විචාරො පන තෙසු චෙව එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසු චාති ඡසට්ඨී චිත්තෙසු.

56 අධිමොක්ඛො ද්විපඤ්ච විඤ්ඤාණ විචිකිච්ඡා සහගත වජ්ජිත චිත්තෙසු.

57 විරියං පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිත චිත්තෙසු.

58 පීති දෙමනස්සු පෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣානවජ්ජිත චිත්තෙසු.

59 ඡන්දෙ අහේතුක මොමූහ වජ්ජිත චිත්තෙසු ති.

60 තෙ පන චිත්තුප්පාද යථාක්කමං :

ඡ සට්ඨී පඤ්ච පඤ්ඤාස–එකාදස ච සොළස,
සත්තති වීසති චෙව–පකිණ්ණක විවජ්ජිතා.

61 පඤ්චපඤ්ඤාස ඡසට්ඨී-අට්ඨ සත්තති තිසත්තති,
එකපඤ්ඤාස චෙකූන-සත්තති සපකිණ්ණකා.

62 අකුසලෙසු පන මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං චාති චත්තාරො මෙ චෙතසිකා සබ්බා කුසල සාධාරණා නාම සබ්බෙසුපි ද්වාදසාකුසලෙසු ලබ්භන්ති.

63 ලොභො අට්ඨසු ලොභසහගත චිත්තේස්වෙව ලබ්භති

64 දිට්ඨි චතුසු දිට්ඨිගත සම්පයුත්තේසු.

65 මානො චතුසු දිට්ඨිගත විප්පයුත්තේසු.

66 දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං චෙති ද්වීසු පටිඝ සම්පයුත්ත චිත්තෙසු.

67 ථිනං මිද්ධං පඤ්චසු සසංඛාරික චිත්තේසු.

68 විචිකිච්ඡා විචිකිච්ඡා සහගත චිත්තේ යෙවාති.

69 සබ්බා පුඤ්ඤෙසු චත්තාරො-ලොභමූලෙ තයොකතා,
දොසමූලෙසු චත්තාරො-සසංඛාරෙ ද්වයං තථා.

විචිකිච්ඡා විචිකිච්ඡා චිත්තෙ චාති චතුද්දස,
ද්වාදසා කුසලෙස්වෙව සම්පයුජ්ජන්ති පඤ්චධා.

70 සොභනෙසු පන සොභනසාධාරණා තාව එකූනවීසති චෙතසිකා සබ්බෙසුපි එකූනසට්ඨි සොභන චිත්තෙසු සංවිජ් ජන්ති.

71 විරතියො පන තිස්සො පි ලොකුත්තර චිත්තෙසු සබ්බථා පි නියතා එකතොව ලබ්භන්ති ලොකියෙසු පන කාමාවචර කුසලෙස්වෙ කදාචි සන්දිස්සන්ති විසුං විසුං.

72 අප්පමඤ්ඤායො පන ද්වාදසසු පඤ්චමජ්ඣාන වජ්ජිත මහග්ගත චිත්තෙසු චෙව කාමාවචර කුසලෙසු ච සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තෙසු චාති අට්ඨවීසති චිත්තෙස්වෙව කදාචි නානා හුත්වා ජායන්ති. උපෙක්ඛා සහගතෙසු පනෙත්ථ කරුණා මුදිතා න සන්තීති කෙචි වදන්ති.

73 පඤ්ඤාපණ ද්වාදසසු ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසු චෙව සබ්බෙසුපි පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙසු චෙති සත්ත චත්තාළිස චිත්තෙසු සම්පයොගං ගච්ඡන්ති.

74 එකූනවීසති ධම්මා—ජායන්තෙ කූන සට්ඨීසු,,
තයොසොළස චිත්තෙසු—අට්ඨ වීසතියං ද්වයං.

පඤ්ඤා පකාසිතා සත්ත—චත්තාළිස විධෙසුපි
සම්පයුත්තා චතුද්ධෙවං—සොභනෙස්වෙව සොභනා.

75 ඉස්සා මච්ඡෙර කුක්කුච්ච—විරතී කරුණාදයො.
නා නා කදචි මානො ච—ථීන මිද්ධං තථා සහ.

76 යථා වුත්තානු සාරෙන සෙසා—නියත යොගිනො,
සඞ්ගහං ච පවක්ඛාමි—තෙසං දනි යථාරහං.

77 ඡත්තිංසානුත්තරෙ ධම්මා—පඤ්චතිංස මහග්ගතෙ.
අට්ඨතිංසාපි ලබ්භන්ති—කාමාවචර සොභනෙ.
සත්තවීසත්‍ය පුඤ්ඤම්හි—ද්වාදසා හෙතු කෙතිච,
යථා සම්භව යොගෙන—පඤ්චධා තත්ථ සංසහො.

78 කථං? ලොකුත්තරෙසු තාව අට්ඨසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරස චෙතසිකා අප්පමඤ්ඤා වජ්ජිතා තෙවීසති සොභන චෙතසිකා චෙති ඡත්තිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති.

79 තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්කවජ්ජා.

80 තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා,

81 චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා.

82 පඤ්චමජ්ඣානික චිත්තෙසුපි උපෙක්ඛා සහගතා තෙ යෙව සඞ්ගය්හන්තීති සබ්බථා පි අට්ඨසු ලොකුත්තර චිත්තේසු පඤ්චකජ්ඣාන වසෙන පඤ්චධාව සඞ්ගහො හොතී ති.

83 ඡත්තිංස පඤ්චතිංසාථ චතුත්තිංස යථාක්කමං,
තෙත්තිංස ද්වය මිච්චෙවං පඤ්චධානුත්තරෙ ඨිතා.

84 මහග්ගතෙසු පන තීසු පඨමජ්ඣානික චිත්තෙසු අඤ්ඤසමානා තෙරස චෙතසිකා විරතිත්තයවජ්ජිතා ද්වාවීසති සොභන චෙතසිකා චෙති පඤ්චතිංස ධම්මා සඞ්ගහං ගච්ඡන්ති. කරුණා මුදිතා පනෙත්ථ පච්චෙක මෙව යොජෙ තබ්බා.

85 තථා දුතියජ්ඣානික චිත්තෙසු විතක්ක වජ්ජා,

86 තතියජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර වජ්ජා,

87 චතුත්ථජ්ඣානික චිත්තෙසු විතක්ක විචාර පීති වජ්ජා.

88 පඤ්චමජ්ක්ධානික චිත්තෙසු පන පන්නරසසු අප්පමඤ්ඤා ච න ලබ්භන්තී ති සබ්බථා පි සත්තවීසති මහග්ගත චිත්තෙසු පඤ්චකජ්ඣාන වසෙන පඤ්චධාව සඞ්ගහො හොතී ති.

89 පඤ්චතිංස චතුත්තිංස-තෙත්තිංස ච යථාක්කමං,
ද්වත්තිංස චෙව තිංසෙති-පඤ්චධාව මහග්ගතෙ.

90 කාමාවචර සොභනෙසු තාව කුසලෙසු පඨමද්වයෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා පඤ්චවීසති සොභන චෙතසිකා චෙති අට්ඨතිංස ධම්මා සංගහං ගච්ඡන්ති. අප්පමඤ්ඤා විරතියො පනෙත්ථ පඤ්ච පි පච්චෙක මෙව යොජෙ තබ්බා.

91 තථා දුතියද්වයෙ ඤාණවජ්ජිතා.

92 තතියද්වයෙ ඤාණසම්පයුත්තා පීති වජ්ජිතා.

93 චතුත්ථද්වයෙ ඤාණ පීති වජ්ජිතා තෙ යෙව සඞ්ගය්හන්ති.

94 ක්‍රියාචිත්තෙසු පි විරති වජ්ජිතා තථෙව චතුසු පි දුකෙසු චතුධා සඞ්ගහං ගච්ඡන්ති.

95 තථා විපාකෙසුච අප්පමඤ්ඤා විරති වජ්ජිතා තෙ එව සඞ්ගය්හන්තී සබ්බථා පි චතුවීසති කාමාවචර සොභන චිත්තෙසු දුක වසෙන ද්වාදසධාව සංගහො හොතී ති.

96 අට්ඨතිංස සත්තතිංස ද්වයං ඡත්තිංසකං සුභෙ,
පඤ්චතිංස චතුත්තිංස-ද්වයං තෙත්තිංසකං ක්‍රියෙ.

තෙත්තිංස පාකෙ ද්වත්තිංස ද්වයෙ කත්තිංසකං භවෙ,
සහෙතු කාමාවචර-පුඤ්ඤපාක ක්‍රියා මනෙ.

97 න විජ්ජන්තෙත්ථ විරති-ක්‍රියෙ සුච මහග්ගතෙ,
අනුත්තරෙ අප්පමඤ්ඤා-කාමපාකෙ ද්වයං තථා.

98 අනුත්තරෙ ඣානධම්මා-අප්පමඤ්ඤාච මජ්ඣිමෙ,
විරති ඤාණ පීතීච-පරිත්තේසු විසෙසකා.

99 අකුසලෙසු පන ලොභමූලෙසු තාව පඨමෙ අසංඛාරිකෙ අඤ්ඤසමානා තෙරස චෙතසිකා අකුසල සාධාරණා චත්තාරො චාති සත්තරස ලොභදිට්ඨීහි සද්ධිං එකූනවීසති ධම්මා සංගහං ගච්ඡන්ති.

100 තථෙව දුතියෙ අසංඛාරිකෙ ලොභ මානෙන.

101 තතියෙ තථෙව පීති වජ්ජිතා ලොභ දිට්ඨීහි සහ අට්ඨාරස

102 චතුත්ථෙ තථෙව ලොභමානෙන.

103 පඤ්චමෙ පන පටිඝසම්පයුත්තෙ අසංඛාරිකෙ දොසො ඉස්සා, මච්ඡරියං කුක්කුච්චං චාති චතුහි සද්ධිං පීති වජ්ජිතා තෙ එව වීසති ධම්මා සංගය්හන්ති. ඉස්සා මච්ඡෙර කක්කුච්චානී පනෙත්ථ පච්චෙක මෙව යොජෙතබ්බානි.

104 සසංඛාරික, පඤ්චකෙපි තථෙව ථීන මිද්ධෙන විසෙසෙත්වා යොජෙතබ්බා.

105 ඡන්ද පීති වජ්ජිතා පන අඤ්ඤසමානා එකාදස අකුසල සාධාරණා චත්තාරො චාති පන්නරස ධම්මා උද්ධච්ච සහගතෙ සම්පයුජ්ජන්ති.

106 විචිකිච්ඡා සහගත චිත්තෙ ච අධිමොක්ඛ විරහිතා විචිකිච්ඡා සහගතා තථෙව පන්නරස ධම්මා සමුපලබ්භන්ති ති සබ්බ ථාපි ද්වාදසාකුසල චිත්තුප්පාදෙසු පච්චෙකං යොජිය මානාච් ගණනවසෙන සත්තධාව සංගහිතා භවන්ති ති.

107 එකූනවීසට්ඨා රස වීසෙක වීස වීසති,
ද්වෙවීස පණ්ණරසෙති සත්තධා කුසලෙ ඨිතා.

108 සාධාරණාච චත්තාරො සමානා ච දසාපරෙ,
චුද්දසෙතෙ පවුච්චන්ති සබ්බා කුසල යොගිනො.

109 අහෙතුකෙසු පන හසනචිත්තෙ තාව ඡන්ද වජ්ජිතා අඤ්ඤසමානා ද්වාදස ධම්මා සං ගහං ගච්චන්ති.

110 තථා වොත්ථපනෙ ඡන්ද පීති වජ්ජිතා.

111 සුඛසන්තීරණෙ ඡන්ද විරිය වජ්ජිතා.

112 මනොධාතුත්තිකාහෙතුක පටිසන්ධි යුගලෙ ඡන්ද පීති විරියවජ්ජිතා.

113 ද්විපඤ්ච විඤ්ඤාණෙ පකිණ්ණක වජ්ජිතා තෙ යෙව සංගය් හන්තී ති සබ්බාථපි අට්ඨාරස්සු අහෙතුකෙසු ගණනවසෙන චතුධාව සඞ්ගහො හොතී ති.

114 ද්වාදසෙකාදස දස — සත්තවාති චතුබ්බිධො,
අට්ඨාරසා හෙතුකෙසු — චිත්තුප්පාදෙසු සංගහො.

115 අහෙතු කෙසු සබ්බත්ථ — සත්තසෙසා යථාරහං,
ඉති විත්ථාරතො වුත්තො — තෙත්තිංසවිධ සංගහො,

116 ඉත්ථං චිත්තා වියුත්තානං — සම්පයොගඤ්ච සංගහං,
ඤත්වා භෙදං යථා යොගං — චිත්තෙන සම්මුද්දිසෙ.

අභිධම්මත්ථ සංගහෙ මෙතං සිත සංගහ විභාගො නාම
දුතියෙං පරිච්ඡෙදෙ

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# චෛතසික පරමාර්ථය ස්වරූප

චිත්ත පරමාර්ථයට අනතුරුව චෛතසික පරමාර්ථය දේශනා කළ සේක. එය චෛතසික ධර්ම සියල්ලම පද දෙපනසකි. එය කොටස් කිපයකි. සිත සමඟ එකටම උපදනා චෛතසික 7 කි. සැම සිතක් සමගම උපදනා බැවින් සබ්බ චිත්ත සාධාරණ නම වේ. චිත්ත චෛතසික ධර්මයෝ සතර ආකාරයකින් එකට බැඳී පවත්නාහුය එකට ඉපදීමය, එකවරම නිරුද්ධ වීමය, එකම අරමුණක් ගැනීමය, එකම වස්තු ධර්මයක ඉපදීමය. යන ආකාර සතරකින් එකටම යෙදී බැඳී පවත්නේය. එය සතර සම්ප්‍රයෝග ලක්ෂණ නම් වේ. චිත්ත, චෛතසික සියල්ලෙහිම මේ ලක්ෂණ සතර පවත්නේ ය.

නාම ධර්ම සියල්ල සිත් 89 ද විස්තර වශයෙන් 121 ක් ද, වේ. චෛතසික ධර්ම සියල්ල 52 ක් වේ. ඒ නාම ධර්ම රාශිය අතුරෙන් සිත අරමුණක් ගත්තේ නම් චෛතසික ධර්මද කොටස් වශයෙන් තැනට සුදුසු පරිදි එම අරමුණ ගෙන උපදී. සිත අරමුණක් ගෙන උපදින විට නැතිවම බැරි චෛතසික ඵස්ස ආදි සතයි. මේ චෛතසික සත සිත සමග සැමවිටම පවත්නේය. සිතින් තොර නොවේ. මේ හත සමග පමණක් උපදනා සිත් 10 ක් තිබේ. දෙපස් විඥාණ සිත් 10 යි. ඒ හැර, අනෙක් සිත් වලට තවත් චෛතසිකයන්ගේ උපකාරය නැතිව ඉපදිය නො හැකි ය.

ප්‍රකිණීක නාමයෙන් විසිර පවත්නා චෛතසික හයක් තිබේ. ඒ සය එකටම උපදනා ස්වභාවයක් නැත්තේ ය. ඉන් හතරක් පහක් ආදී වශයෙන් තැනට සුදුසු පරිදි උපදනා ස්වභාවයෙන් ද යුක්ත වේ. සබ්බ චිත්ත සාධාරණ හත සහ ප්‍රකීර්ණක සයම එකට ගෙන අඤ්ඤ සමාන යයි කියති. අඤ්ඤසමාන 13 කි. මේ දහතුන කුසලයෙන් අන්‍ය වූ අකුසල් සමඟ ද අකුසලයෙන් අන්‍ය වූ කුසල් සිත් සමග ද ඉපදී. තමාගෙන් ඉටුවිය යුතු වැඩ කොටස නොඅඩුව ඉටු කරයි. එබැවින් අන්‍ය සමාන නම් වේ.

ඊ ළඟට අභිධර්මාර්ථයෙහි පළමුව පෙන්වා තිබෙන අකුසල් සිත් සමග පමණක් උපදනා අකුසල චෛතසික 14 ක් තිබේ. ඒ චෛතසික අකුසල් සිත් 12 හි සුදුසු පරිදි යෙදෙයි. ලෝභ මූල සිත්හි පමණක් උපදනා ලෝභ ත්‍රිකය ද දෝෂ මූල සිත් දෙකෙහි පමණක් උපදනා දෝෂ චතුෂ්කය ද අකුසල් සිත් 12 ට සාධාරණව උපදනා මෝහ චතුෂ්කය ද, විචිකිච්ඡා සිතෙහි පමණක් උපදනා විචිකිච්ඡා චෛතසිකය ද යන කොටස් කීපය කින් යුක්ත වේ. අඤ්ඤ සමාන 13 ත් අකුසල චෛතසික 14 ත් යන චෛතසික 27 ම අකුසල් සිත් 12 හි සුදුසු පරිදි යෙදෙති.

සෝභන සිත් වල යෙදෙන සෝභන චෛතසික 25 කි. සෝභන සිත් වල පමණක් යෙදෙන චෛතසික 25 හද, කාම සෝභන සිත් 24 ද, රූපාවචර සිත් 15 ද, අරූපාවචර සිත් 12 ද, ලෝකෝත්තර සිත් 8 හිද යෙදෙති විස්තර වශයෙන් ලෝකෝත් තර සිත් 40 ද යෙදෙති. එයද කොටස් 4 න් යුක්ත වේ. සියලුම සෝභන සිත් සමග යෙදෙන සෝභන සාධාරණ 19 ද **විරති** චෛතසික 3 ද, සත්ව ප්‍රඥප්තිය, අරමුණු කරන අප්පමඤ්ඤා චෛතසික 2 ද, ප්‍රඥ චෛතසිකයද යන කොටස් සතරකි. අඤ්ඤ සමාන 13 ත් සෝභන චෛතසික 25 ත්, සෝභන සිත් සියල්ලෙහිම සුදුසු පරිදි යෙදෙති. චෛතසික 52 නම් වශයෙන් මෙසේය :

### සබ්බ චිත්ත සාධාරණ 7

ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යනුයි.

### ප්‍රකීර්ණක චෛතසික 6

විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද යනුයි.

### අකුසල චෛතසික 14

මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, ලෝභ, දිට්ඨි, මාන දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, ථීන, මිද්ධ, විචිකිච්ඡා, යනුයි.

### සෝභන චෛතසික 25

සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ, අදෝස, තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්තලහුතා, කාය මුදුතා, චිත්ත මුදුතා, කායකම්මඤ්ඤතා, චිත්තකම්මඤ්ඤතා

කායපාගුඤ්ඤතා, චිත්තපාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජු කතා, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, කරුණා, මුදිතා, ප්‍රඥා යනුයි.

## සබ්බචිත්ත සාධාරණ චෛතසික 7

**ඵස්සය** : අරමුණ ස්පර්ශ කිරීම වැනි සිත අරමුණෙහි ගැටීම වැනි සම්භාවය යි. වස්තුරූප ඇසුරුකොට හෝ නොකොට උපදනා අරමුණ වෙතට සිත පැමිණවීම සේ කරන ධර්මය ඵස්සය යි. සිතටද අරමුණ වෙතට යාමේ බලයක් නැත. වස්තුරූප ඇසුරු කොට එහි සිත් උපදී. දුර තිබියදී අරමුණ ගැනීමට ද උපකාර වන්නේ ඵස්සයයි. යම්කෙනෙක් ඇඹුල් කනවා දුටු විට තමාට ඇතිවන ස්වභාවය මෙන්ද, අනතුරු සහිත භයානක තැනක සිටින කෙනෙක් දුටුවිට තමාට ඇතිවන කම්පනය වැනි යයිද උපමා පෙන්වා තිබේ. ඵස්සයෙන් අරමුණ සිතට ලංකර ලබාදෙන්නේය. අරමුණු ස්පර්ෂ කරන ස්වභාවයයි. ඵස්සයේ ලක්ෂණය වූසන ලක්ෂණයයි.

**වේදනාව** : අරමුණු රස විඳින ස්වභාව ධර්මයයි. අරමුණු කෙරෙහි ඇති සිතට මතුකර ගන්නා ස්වභාවය ත්‍රිවිධාකාර වේ. සිත කැමති අරමුණෙහි සැප වේදනාවද, අකමැති කැත අප්‍රිය හෝ භය උපදවන අරමුණෙහි දුක් වේදනාවද, ඒ දෙකම නො මැති මැදහත් වශයෙන් අරමුණු ගැනීමෙන් උපේක්ඛා වේදනාවද ඇති වේ. සැම අරමුණකම මේ තුන් ආකාරයෙන් එක් ආකාර යක් ඇත. තවත් ආකාරයකට ද අරමුණ රස විඳීම නම් ඊට ඉන්ද්‍රිය භෙදය යයි කියති. කය පිළිබඳ යම් විඳීමක් වී නම් සුඛ වේදනාවද, සිතටම යම් විඳීමක් සැප ස්වභාව සුඛයක් වී නම් සොම්නස් වේදනාව ද එසේම කය පිළිබඳ අම්හිරි වේදනාවක් වී නම් දුක් වේදනාවද සිතටම යම් අකමැති අමනාප දෙයක් ඇති වූ විට දෙම්නස් වේදනාවද, ඒ දෙකම මැද ඇතිවන කැමති ස්වභාවයද නැති අකමැති වීමක්ද නැති වේදනාවක් වී නම් එවැනි අරමුණු ගැනීමේදී මැදහත් ස්වභාවයෙන් උපේක්ෂා වේදනාව වේ. වේදනාව ඵස්සය මෙන් අප්‍රකට ධර්මයක් නොවේ. වේදනාව විඳීම් ලක්ෂණයෙන් යුක්ත වේ. ප්‍රකටව පවත්නා ධර්මයකි. ස්කන්ධ පහ අතුරෙන් වේදනාව වේදනා ස්කන්ධ යයි.

**සංඥාව** : හැඳිනීම් ස්වභාවයෙන් යුක්ත ධර්මය සංඥාවයි. දැකීම් ඇසීම් ආදී වශයෙන් සියලුම අරමුණු කෙරෙහි නැවත හඳුනා ගැනීමට ලකුණු ගන්නා ස්වභාව ධර්මය සංඥාවයි. වරක් ඇසූ දුටු දෙයක් හෝ යම්කිසි ශාස්ත්‍ර හදරන අය කලින් ඇසූ දුටු දෙයෙහි අනුසාරයෙන් පසු දේවල් කිරීමට ගන්නා උපකාරය මෙන් සංඥාවද විඤ්ඤානය සේම බොහෝ දෙයක් සිදු කෙරෙන ධර්මයකි. බුදුරජාණන් වහන්සේ ස්කන්ධ දේශනා මෙහිදී සංඥාවද ස්කන්ධයක් වශයෙන් වදාළ සේක. මේ ධර්මදෙකද විශාල වැඩ කොටසක් කරති. වේදනාව අරමුණු රසවිඳීමේදී මුල් තැන ගන්නේය. සංඥාවද සිත මෙන් අරමුණු හැඳින ගැනීමෙන් විශාල වැඩ කොටසක් සිත සමඟ ඉපිද ඉටුකර දෙන්නේය. එබැවින් මේ ධර්ම දෙක ස්කන්ධ දෙකක් සේ දේශනා කළ සේක.

**චේතනාව** : කුසල් අකුසල් කිරීමේදී කර්මය වශයෙන් පෙන්වා තිබෙන්නේ චේතනාවයි. කුසලා කුසල ක්‍රියාවන් තමාකරමින් අන්‍ය චෛතසිකයන්ද එහි යොදවන ස්වභාව ධර්මයයි. ඔවු-නොවුන්ට සම්පූර්ණයෙන්ම විරුද්ධ කුසලා කුසල දෙකෙහිම තමාට අයත් කොටස අඩු නැතිව සම්පූර්ණයෙන්ම ඉටු කරයි. චේතනා නානාත්වය නිසා කර්ම නානාත්වයද වේ. සෙන්පති යකු තමාගේ වැඩ කොටස ඉටුකරමින් අන්‍ය සෙබළුන් ද කට යුත්තෙහි යොදවන්නාක් මෙන් මේ උපමාවන්ගෙන් චේතනා වේ ප්‍රධානත්වය පෙන්වයි. තමා කරන ක්‍රියාව අඩුපාඩු නොකර හරියට සිදුකිරීම සහ අන්‍ය චෛතසිකයන්ද කටයුත්තෙහි යොදවන ප්‍රධානත්වය උසුලන ධර්මය චේතනාවයි. ආයුහනය හෙවත් කර්ම රැස්කිරීම් ස්වභාව ධර්මය චේතනාවයි.

**ඒකග්ගතාව** : නොයෙක් අරමුණු කරා විසිර යාමට ඉඩ නොදී එකම අරමුණක සිත පවත්වන ධර්මය ඒකග්ගතාවය එකට උපදනා චිත්ත චෛතසික ධර්මයන් විසින් එකම අරමුණෙක්හි සිත රඳවා තබා ගැනීමට උපකාරය ලබා දෙන ධර්මය ඒකග්ග-තාවයි. වැඩි වෙලාවක්හි එකම අරමුණෙක්හි සිත තබා ගැනීම සමාධි භාවනාවද වන්නේය. අරමුණ කෙරෙන් පැන යන්ට නොදී එහි නැවත නැවතත් දවසක් හෝ චිත්ත චෛතසිකයන් තබා ගැනීම ඒකග්ගතා චෛතසිකයේ බලයෙන් සිදු වේ. නො

යෙක් ආකාර ඇති අරමුණුවල එක් ආකාරයක් ගෙන ඒ ආකාර යෙහි සිතත් අනිත් චෛතසික ධර්මත් පිහිටුවමින් උපදනා ස්ව භාවය ඒකග්ගතාවයි. අවික්ෂේප ලක්ෂණයෙන් යුත් ධර්මය ඒකග්ගතාවයි.

**ජීවිතින්ද්‍රිය** : චිත්ත පරම්පරාව නොසිඳ පවත්වා ගෙන යන ධර්මය ජීවිතින්ද්‍රියයි. ජීවිතින්ද්‍රිය ධර්ම දෙකක් තිබේ. අනික් ජීවිතින්ද්‍රිය කර්මජ රූප සමඟ ඉපිද කර්මජ රූප පාලනය කරන ජීවිතින්ද්‍රියයි. පටිසන්ධියේ සිට චුතිය දක්වා කර්මජ රූප පරම් පරාව පවත්වන ධර්මය රූප ජීවිතින්ද්‍රියයි. නාම ජීවිතින්ද්‍රියද චිත්ත පරම්පරාව නොසිඳ අනාදිමත් සංසාරයෙහි චිත්ත පරම් පරාව පවත්වාගෙන එන නාම ධර්මයකි. රහතන් වහන්සේගේ චුති සිත ඇතිවීම දක්වා නොනැසී චිත්ත පරම්පරාව පවත්වන ධර්මයකි. එය සෑම සිතක් පාසාම උපදී. සිත උපදින විට ඒ සමඟ ඉපිද සිත නිරුද්ධ වන විට ඒ සමඟ නිරුද්ධ වේ. නෙළුම් මහනෙල් ආදියට ජලයෙන් ලැබෙන උපකාරය වැනියයි උපමා වශයෙන් දක්වේ. සහජාත නාම ධර්ම පාලනය කිරීම් ලක්ෂණ යෙන් යුක්ත ධර්මය ජීවිතින්ද්‍රියයි.

**මනසිකාරය** : සිත හා අරමුණු එකට ගලපන ධර්මය මනසිකාර චෛතසික ධර්මයයි. වඩා ප්‍රකට නැති යෙවාපනක වශයෙන් පෙන්වන ධර්මයකි. නිරුද්ධ වන සිතට පසුව නැවත සිත් ඉපදීමට සලස්වන ආකාරයෙන් නාම ධර්මයන්ගේ හටගැනීමට උපකාර වන ධර්මයයි. මනසිකාර ධර්ම තුනක් ඇත්තේ ය. ආවර්ජන සිත් දෙකටද මනසිකාර යයි ව්‍යවහාර වේ. යෝනි සො මනසිකාර අයෝනිසො මනසිකාර වශයෙන් ද ඒ සිත් දෙක භාවිතා වේ. අරමුණෙහි සිත යොදවන ස්වභාවයෙන් යුත් ධර්ම යයි. රථයෙහි යොදන ලද ගොනුන් සමව හරියාකාර රථය ගෙනයන කල්හි නිශ්චලව බලා සිටින රථාචාර්යයා මෙනි. මෙය ආරම්මණය පිළියෙල කරන මනසිකාරයයි. ආවජ්ජන සිත් දෙක චිත්ත වීථිය පිළියෙල කරන විථි පටිපාදක මනසි කාරය සහ ජවන පටිපාදක මනසිකාර යයි. මනෝද්වාර වජ් ජන සිත ජවනය පිළියෙල කරයි. මේ සබ්බ චිත්ත සාධාරණ චෛතසික සතයි.

සබ්බචිත්ත සාධාරණ චෛතසික සත නිමි.

## ප්‍රකීර්ණක චෛතසික සය

**විතක්කය :** නම් කල්පනා කිරීමයි. අරමුණට සිත නංවන ස්වභාව ධර්මය විතක්ක නම් වේ. සිත හා චෛතසික ධර්ම අරමුණ වෙත ගෙනයාම මෙන් අරමුණට නංගවමින් පවත්නා සිත සමඟ උපදනා ධර්මය විතක්කයයි. අරමුණ කරා පැමිණ වීමත් උවමනා නැති ප්‍රසාද ආරම්මන ගැටීමෙන්ම උපදනා සිත් 10 ක් ඇත. චක්ඛුවිඤ්ඤාණාදි සිත් 10 යි. විතක්කයේ බලයෙන් ප්‍රථම ධ්‍යානය ලබාගත් පසු ඒ හුරුපුරුදුතාවයට අනුව නැවත නැවත අරමුණට සිත නංවමින්ම ද්විතීය ධ්‍යානාදීන් උපදවා ගනී. විතක්කය නැතිව උපදනා සිත් 66 කි. සිත අරමුණට නංවන ලක්ෂණයෙන් යුක්ත ධර්මය විතක්ක යයි ප්‍රථම ධ්‍යානය ලැබීමට නැතිවම බැරි ධර්මය විතක්ක යයි.

**විචාරය :** විතක්කයෙන් අරමුණට නංවන ලද සිත අරමුණෙහි හැසිරවීම විචාරයයි. සමහර සිත් විතක්ක විචාර දෙකෙන්ම යුක්ත වේ. විතක්කයෙන් අරමුණට නැංවීමත් විචාරයෙන් අරමුණෙහි හැසිරීමත් දෙපස් විඤ්ඤාණ සිත් 10 ට විතක්ක විචාර දෙකම උවමනා නැත. ප්‍රථම ධ්‍යාන සිතට විතක්ක විචාර දෙකේම උපකාර ලැබිය යුතු වේ. දුතියධ්‍යාන සිතට විතක්කය නැතිව විචාරය පමණක් ලැබෙති. ඉන් ඉහළ ධ්‍යාන සිත්වලදී විතක්ක විචාර දෙකේම බලය නැතිව සිත් උපදී. උපමා කීපයකින් මේ ධර්ම හඳුන්වා තිබේ. විතක්කය ලෝහ තලිය පළමු පිරිමැදීම මෙන් ද, එය නැවත නැවත පිරිමැදීම විචාරය මෙන්ද, පක්ෂියෙක් අහසට නැගීම හා එහි නිශ්චලව සිටීම විචාරය මෙන්ද හඳුන්වා තිබේ. සිත අරමුණෙහි හැසිරවීම විචාරයේ ලක්ෂණය වේ.

**අධිමොක්ඛය :** සිතින් අරමුණ ගැනීමේදී අරමුණ වෙන්කර නිශ්චය කර ගැනීම අධිමොක්ඛයේ ස්වභාවයයි. අධිමොක්ඛයද අප්‍රකට වූ යෙවාපනක නාමයෙන් වදරන ලද ස්වභාව ධර්මයකි. දනාදී කුසල් කිරීමේදී හෝ අකුසල් කිරීමේදී කරමද නොකරම් ද යන පසු බසින ස්වභාවයට විරුද්ධව එය කළ යුතු යැයි නිශ්චය කිරීම වැනි ස්වභාව ධර්මයයි. අකුසලයෙහිදී සඩාවේ මුහුණුවරින් අධිමොක්ඛය උපදී. වැරදි දේ හෝ නිවැරදි යැයි ගන්නා ස්වභාව ධර්මයයි.

**විරිය** : යම්කිසි ක්‍රියාවක් හෝ වැඩක් හෝ ආරම්භ කොට නොනවත්වා ඉදිරියට ගෙනයාමට චිත්ත ශක්තියක් තිබිය යුතුය. ඒ සිතෙහි ඇතිවන පසු නොබැස ක්‍රියාව හෝ වැඩය අවසන් වනතුරු ගෙන යාමට සිතෙහි ඇතිවන ශක්තිය විරියයි. සිතත්, ඒ සමඟ උපදනා චෛතසික ධර්මත් පසුබැසීමට පත්වෙන්ට නොදී සිතෙහිම උපදනා ස්වභාව ධර්මයක් වන විරිය චෛතසිකයෙන් අනුබල දී ඔසවා තබන්නාක් මෙන් කරන ධර්මයයි. ඇද වැටෙන්ට යන ගසකට රුකුල් දී ඔසවා තබන්නාක් මෙනි. මේ ධර්ම කුසලා කුසල දෙකෙහිදීම ඒ ඒ ක්‍රියාවන් බොහෝ උත්සාහයෙන් කරති, අනුබල දෙන්නේ ය. අකුසලයෙහිදී බලවත් වියර්‍යයක් උවමනා නැතිව හෝ සසර පුරුද්ද අනුව අකුසලය කරන්නේ ය. කුසල් කිරීමට බලවත් වීර්යයක් උවමනා වේ. සමහර බෝධිසත්වයන්ට වීර්යාධික බෝසත්වරු යයි කියති. දසපාරමී ධර්මයන්ගෙන් එකකි. බෝධි පාක්ෂික ධර්මයන්හි ස්ථාන නවයක වීර්යය පෙන්නුම් කර තිබේ. වීර්යය අඩු කුසීත පුද්ගලයින්ට කුසල් කිරීම මහ බරකි.

ශාරීරික වීර්යය කයේ ඇතිවන ශරීර ශක්තියයි. ඒ අනෙකකි. මේ වීරිය සිතේ උපදනා චෛතසිකයයි. සිත සමග උපදනා ධර්මයයි. කායික බලය නොවේ. කය ක්‍රියා කරවීමට ද විරිය උපකාරී වේ.

**ප්‍රීතිය** : අරමුණෙහි සිත ප්‍රබෝධමත් කරන පිනවන ස්වභාව ධර්මය ප්‍රීතියයි. අසරණ දුගී මනුෂ්‍යයෙකුට ආහාර පාන වස්ත්‍ර, ආදී යමක් ලැබුනේ නම් එවිට ඇතිවන්නේ ප්‍රීතියයි. පූර්ණ දුගියාට සිටු තනතුරු ලැබීම මෙනි. ප්‍රීතිය ඇසට පෙනෙන ධර්ම ස්වභාවයක් නොවූවත් ප්‍රීතිමත් සිත් ඇති තැනැත්තාගේ මුහුණෙහි ද එම ප්‍රීතිමත් ගතිය ප්‍රකට වේ. ප්‍රීතිය ඇතිවන්නේ සොම්නසත් සමගය. සොම්නස වේදනාවට අයත් සොම්නස් වේදනාවයි. මේ ධර්ම හේතුකොට ගෙන සිනාව, නැටීම් ආදිය ඇතිවේ. බලවත් ප්‍රීතිය ඇති වූ විට ධ්‍යාන බලයක් නැති අය පවා අහසට ඔසවා ලන්නේය.

බලවත් ප්‍රීතිය පස් ආකාරයකින් දක්වා තිබේ. ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, ඕක්කන්තික ප්‍රීතිය, උබ්බේග ප්‍රීතිය. ඵරණ ප්‍රීතිය යන පස් ආකාරයයි. ප්‍රීතිය ඇති වූ විට ශරීරය ද

පිම්බීම් ස්වභාවයෙන් යුක්ත වේ. ප්‍රීතිය ඇතිවූ සිත් හේතුකොට ශරීරයෙහි උපදනා චිත්තජ රූපයන් ගෙන්ද ඒ පිම්බීම් ස්වභාවය මතුවී එන්නේය. අරමුණෙහි සිත පිනවීම ප්‍රීතියේ ලක්ෂණයයි. සිනාහව, නැටීම ආදිය සිදුකිරීමට ප්‍රීතිය බොහෝ උපකාරී වේ. කුසලයට ද උපකාරී වේ.

**ඡන්දය** : ඡන්දය නම් කැමැත්තයි. කුසලාකුසල දෙකෙහිම ඡන්දය ඇතිවේ. ලෝභ මූල අකුසල් සිත්හි ඇතිවන්නේ කාමච්ඡන්දයයි. කුසල් සිත්හි ඇතිවන්නේ කුසලච්ඡන්දයයි. ඉන් පිටස්තර දේවල් කිරීමෙහිදී ඇතිවන්නේ කත්තු කම්‍යතා ඡන්ද යයි. කාමච්ඡන්දය ලෝභ මූල සිත්වල පමණක් ඇති වේ. ලෝභ යෙන් සිදු කෙරෙන අකුසල් කිරීමේ කැමැත්තයි. කුසල් සිත් වල උපදනා ඡන්දය ඉධිපාද භාවයටද අධිපති භාවයටද පැමිණේ. ධ්‍යාන මාර්ගඵල ආදිය කුසලච්ඡන්දයෙන් සිදුවේ. එදිනෙද කළයුතු කටයුතු ආදිය කිරීම කත්තුකම්‍යතා ඡන්දයයි. අගති ධර්ම සතරෙන් එකකදී ඡන්දයද උපකාරී වේ. ඒ ඡන්දගතියයි. අනික් අගති ධර්ම තුන ද්වේෂය, මෝහය, භය යන තුනයි. අගතියට යෑමඅකුසලයකි.

## අකුසල චෛතසික 14

අකුසල චෛතසික 14 අකුසල් සිත් 12 හි සුදුසු පරිදි යෙදෙති. සියල්ල යෙදෙන සිත් නැත. මෝහාදී 4 සබ්බ අකුසල සාධාරණ නම් වේ. ඒ සතර සෑම අකුසල් සිතකම සාධාරණව යෙදේ. මෝහාදී චෛතසික හතර බලවත් චෛතසික හතරකි. මෝහය ඇති සිත අඳුරුය. හොඳ නරක, කළයුතු නොකළ යුතු දේ තෝරා බේරා ගැනීමට නොහැකි වන සේ සිත අඳුරු තත්ත්වයට පමුණුවන්නේය. එබැවින් මෝහයේ බලා බල තත්වයට අනුව බලවත් අකුසල් හොඳ දේ හැටියට සිතා කරන්නේය.

**මෝහය** : සමගම අහිරික, අනොත්තප්ප, උද්ධච්ච තුනද එකටම ඇතිවී එකටම ඉපදී ලජ්ජා භය දෙකද නැති කරන්නේය. පංචස්කන්ධ දුක සහ සංසාර දුකද දුකක් හැටියට නොව සැපක් හැටියට පෙන්වයි. අකුසල් කිරීමට උපාය සොයන විට විතක්කයේද ආධාරය ඇතිව නැවත නැවත එහිම සිත යොදවමින් අකුසල් කරන්නේය. මෝහය, ලෝභය, විතක්කය, විචාරය,

මිථ්‍යා දෘෂ්ටිය, සිත යන මේ ධර්ම අකුසල් කිරීමේදී ඥනය මෙන් ඉපිද අකුසලය උසස් දෙයක් සේ සිතා කරන්නේය. මෝහය චතුරංග සමන්වාගත අඳුරට සමාන යයි උපමා පෙන්වා දී තිබේ. ඒ සතරාකාර අන්ධකාරය පෙන්වා තිබෙන්නේ මෙසේය. මාසෙ පෝය දිනය, මධ්‍යම රාත්‍රිය, ඝන අඳුරු වනාන්තරය, තද වර්ෂා දිනය යන කරුණු හතරෙන් යුත් වනාන් තරය මධ්‍යයේ මොනම දෙයක් වත් නොපෙනෙන්නා සේ මෝහයෙන් මුලා වූ විට හොඳ නරක තේරුම් කරගත නොහැකි බව පෙන්වා තිබේ.

**අහිරිකය** : පිළිකුල් කළයුතු පාපය පිළිකුල් නොකළ යුතු දෙයක් සේ පෙන්වන ස්වභාවයෙන් යුක්ත ධර්මයයි. ඇතැම් අය ආර්යයන් වැනි අය පිළිකුල් කරන පාපය ඇතැම් අය කළ යුතුම හොඳ යහපත් දෙයක් සේ සිතා කරති. එසේ කිරීමට මෙබඳු බලයක් සිතට ලබාදෙන ධර්මයයි. සුනඛ, සූකර, ආදී සතුන්ට අසූචියෙහි ඇති පිළිකුල දුර්ගන්ධය නොදැනේ. ඒ සතුන් අසූචි සොයා යති. ආහාර වශයෙන්ද ගන්නේය. පව් කම් කරන අවස්ථාවටද එවැනි පිළිකුල් නැති පවිත්‍ර වූ හොඳ යහපත් කළ යුතු දෙයක් සේ පෙන්වා පාපයේ ආදිනව වසන ස්වභාවයක් මේ ධර්මයන්හි තිබේ. අහිරිකය බල ධර්මයකි. අකුසල පක්ෂයේ බල ධර්මයකි.

**අනොත්තප්පය** : කාය දුශ්චරිතාදි අකුසලයන්ට භය නැති ස්වභාවයෙන් යුක්ත ධර්මයයි. අකුසලයෙහි ආදීනව දුක් විපාක ආදියට භය නොවී අකුසල් කළහැකි තත්ත්වයක් සිතට ලබා දෙන ස්වභාව ධර්මය අනොත්තප්පයයි. අහිරික අනොත්තප්ප දෙක අකුසල පක්ෂයෙහි මහා බල ධර්ම දෙකය.

**උඬච්චය** : සිත නොසන්සුන් ස්වභාවයට පමුණුවන ධර්ම යයි. ඇතැම් සිත් අරමුණෙහි නොසැලී පවතී. උද්ධච්චයෙන් යුත් අකුසල් සිත් සැලෙන නොසන්සුන් ස්වභාවයෙන් යුක්ත වේ. අවසාන උද්ධච්ච සිතෙහි බලවත්වම සැලෙයි. නිශ්චලව නො පිහිටයි. සිත සැලෙන ස්වභාවයට පත්වන්නේ උද්ධච්චය සමඟ යෙදීමෙනි. කෙලෙසුන්ගෙන් යුක්ත සිත් දවන තවන පෙලන ස්වභාවයෙන් යුක්ත වේ. ඒ සිත් වල උද්ධච්චය යෙදෙන බැවින් නොසන්සුන් ගතියෙන් යුක්ත වේ. උද්ධච්ච සිතෙහි

ස්වරූප වශයෙන් වදරා සෙසු අකුසල් සිත්වල සේවාපනත වශයෙන් වදාළ සේක. උද්ධච්චය යෙදෙන සිතෙහි ඒකග්ග තාව ද යෙදෙති. එය ගැස්සෙන කරත්තයෙහි යන කෙනෙක් කරත්තයේ ගැස්සෙන බව තිබියදීම එහි වාඩිවී සිටී. ගැස්සෙන බව උද්ධච්චය මෙන්ද, වාඩිවී විසි නොවී සිටීම ඒකග්ගතාව මෙන්ද පෙන්වා තිබේ. අකුසල සාධාරණ චෛතසික සතරයි මේ දැක්වූයේ.

**ලෝභය** : අරමුණෙහි ඇලෙන ස්වභාවය ලෝභයයි. ලෝභය නම් රාශියකින් සියයකින් පමණ ධම්ම සංගනියෙහි පෙන්වා තිබේ. ආදරය ප්‍රේමය යනාදි වශයෙන් ගන්නේද ලෝභයම ය. ලෝභය අකුසල මූලයකි. සංසාරයෙහි පැවැත්මට බලවත් උපකාර ධර්මයකි. රූප තණ්හා, ශබ්ද තණ්හා, ආදි වශයෙන් ෂඩාරම්මණයන්හිම ඇතිවේ. ලෝභය වඳුරන් ඇල්ලීමට පාවිච්චි කරන ලාටුවකට උපමා කර තිබේ. වඳුරා, දෙ අත්, දෙපය සහ මුඛයෙන්ද අල්ලා ඒ ලාටුවෙහි ඇලී ගිය පසු ලෙහෙසි යෙන්ම වඳුරු වැද්ද වඳුරන් අල්ලා ගන්නේය. එබැවින් ලාටුවකට උපමා කර තිබේ. අවිජ්ජා, තණ්හා, දෙක භව චක්‍රයේ පැවැත්මටද මුල් වන්නේය. ආර්යසත්‍ය දේශනාවෙහි සමුදය සත්‍ය වශයෙන් ලෝභය පෙන්වා වදාළ සේක. දස අකුසල යන්ගෙන් තුනක් ඒකාන්ත වශයෙන්ම ලෝභය හේතුකොට කරන අතර තවත් අකුසල කර්ම හතරක් අනේකාන්ත වශයෙන් ද ලෝභයෙන් කරන්නේය.

ලෝභය 108 ක් ප්‍රභෙද වශයෙන්ද ඕඝ, යෝග, ගන්ථ, නීවරණ, උපාදනාදී වශයෙන්ද, අකුසල් රාශියක් ලෝභය මුල්වී කරන්නේය. ලෝභයේ ඇති අනුසය ශක්තිය ඝන බහල බව අපායේ හෙලන ශක්තිය සෝවාන් මාර්ග කුසල යෙන් නැති කළ හැකි වුවත්, සියුම් වශයෙන් රූප රාග, අරූප රාග, ආදී වශයෙන් පවත්නා ශක්තිය රහත්වනතුරු පවතී. අර්හත් මාර්ගයෙන් ඉතිරි නැතිව නැතිකරන්නේය.

ලෝභය අරමුණෙහි ඇලෙන ස්වභාවයෙන් ලාටුවක් බඳුය. ලෙහෙසියෙන් පහකළ නොහැකි බැවින් තෙල් සායමක් බඳුය. කොතැනක හෝ උපන් සත්වයාට පටිසන්ධියෙන් පසු පළමුව ලෝභ ජමන් ඇතිවන්නේ යැයි මරණාසන්න චිත්ත වීථියෙහි

පෙන්වයි. රහත් චුතියට පසු පටිසන්ධි නොලැබේ. අර්හත් මාර්ග සිතින් ලෝභය සම්පූර්ණයෙන්ම පහකළ බැවිනි.

**දිට්ඨිය** : දිට්ඨිය යනු දැකීමයි. අකුසල් සිත් සමග ඇතිවන්නේ වැරදි දැකීමයි. එය මිථ්‍යා දිට්ඨි නාමයෙන් හඳුන්වයි. දස අකුසලයන්ගේ බරපතලම අකුසලයයි. මිථ්‍යා දිට්ඨිය බොහෝ ප්‍රභෙද ඇත්තේය. සදකාලික ආත්මයක් ඇතැයි ගන්නා ශාස්වත දිට්ඨියක් ද එක් භවයකින් පසු භවය ඉවර වේයයි ද ගන්නා උච්ඡෙද දිට්ඨියද වේ. මේ දෙක ප්‍රධාන මිථ්‍යා විශ්වාස ඇති දිට්ඨි දෙකය.

නාස්තික, අකිරිය, අහේතුක යන කර්මපථ භාවයට පැමිණෙන තවත් දිට්ඨි තුනකි. තමාගේ පඤ්චස්කන්ධය කෙරෙහි පවත්නා විසි වැදැරුම් සක්කායදිට්ඨියද, කර්මය හෝ කර්ම ඵලය ගැන විශ්වාස නොකරන දිට්ඨියද වේ. මිථ්‍යා දිට්ඨි බොහෝ ඇත්තේය. සෝවාන් මාර්ගයෙන් මිථ්‍යා දිට්ඨි සියල්ලම පහ කරන්නේය. දිට්ඨිය උපදනා සිත් සතර සමගම පහ කරන්නේය. දන්දීම් ආදියෙන් පින්සිදු නොවේ යයි කියා ගන්නා දස වස්තුක මිථ්‍යා දිට්ඨියද බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි දෘෂ්ටි ජාලයන් 62 ක් වදළසේක. මිථ්‍යා භිනිවේස ලක්ෂණයෙන් යුක්ත වූ ස්වභාව ධර්මය මිථ්‍යා දිට්ඨි යයි. මිථ්‍යාදිට්ඨිය ආනන්තරිය අකුසලයන්ටත් වඩා බරපතල අකුසලයක් යයි පෙන්වා තිබේ. චුතියට අනතුරුව අවීචි මහා නිරයෙහි පටිසන්ධි ගන්නේ යයි වදලාය. බුද්ධ ශාසනය නැති කාලයන්හි පවත්නේ වැඩි වශයෙන්ම මේ අකුසල ධර්මයෝ යයි ද පෙන්වා දී තිබේ.

**මානය** : මානය නම් තමන් අනුන් හා මැනීමයි. එය සමානත්ව යෙන්ද වැඩි උසස් තත්වයෙන්ද, අන්‍යයන්ට වඩා පහත් අඩු තත්වයෙන් ද මැනීමයි. ගුණ නුවණින්, ධනයෙන්, බලයෙන්, යසසින්, උගත්කමින් ආදී නොයෙක් දේ හා ගැටීමෙන් මැන බැලීමෙන් මානය ඇතිවේ. එය සිතා මතා ඇතිකරගන්නා අකුසලයකි. සෙය්‍ය මාන, සදිස මාන, හීනමානය යි. ත්‍රිවිධා කාර වේ. එය නව ආකාරයකට නව ආඝාත වස්තු වශයෙන් ඇතිකර ගනී. අතිමානය, අධිමානය, කියාද ඇතිවේ. හීන මානය නිසා තමාට කළහැකි පුණ්‍යක්‍රියාවන්ගෙන් ද පිරිහෙන් නේ ය. මෙය ලෝභමූල දිට්ඨි විප්පයුත්ත හිත්වල ඇතැම්විට

ඇතිවේ. අරහත් මාර්ගයෙන් පහකළ යුතු ධර්මය ඉතා සියුම් අකුසලයකි. වස්සකාර ඇමති දූන දූනම වඳුරෙක් විය. මානය අත්නොහැර දූන දූනම සතර අපායෙන් එකක් වන තිරිසන් අපා යේ වඳුරෙක්ව ඉපදුනි. බුදුරජාණන් වහන්සේගේ වචනය පිළිගත් නිසා පලතුරු උයනක් වැව්වේ තමා උදෙසාය. මානයෙන් තමා ගරුකොට උසස් කොට ගැනීම නිසා මහ ඇමති වඳුරෙක් විය. මේ චෛතසික ධර්ම තුන ලෝභ ත්‍රිකය නමින් හඳුන්වයි. කැස් බෑවාගේ උපමාව සූත්‍රයෙහි දක්වා වදලේ එක්වරක් අපායට ගිය සත්වයාට නැවත සුගතියක උපත ලැබීමේ අපහසු බව පෙන්වීමටය.

**දෝසය** : සිතින් ගනු ලබන රූපාදී අරමුණු කෙරෙහි නොසතුටු වන ස්වභාවය ද්වේෂයයි. ගනු ලබන අරමුණ කෙරෙහිම ඇතිවන, සිතින් ගන්නා ආකාර කීපයක් තිබේ. භය ආකාරයෙන් ද, පිළිකුල් ආකාරයෙන්ද, තමාට අනර්ථ පමුණුවන්නේ යැයි කියාද, නොයෙක් ප්‍රභෙද තිබේ. මෙය ඉතාම ප්‍රකට ස්වභාව ධර්මයකි. ද්වේෂය ඇතිවූ කල්හි පළමුව තමා දූවෙන තැවෙන ස්වභාවයෙන් යුක්ත වේ. අන්‍යයන්ට අනර්ථ පමුණුවන්නේ දෙවනුවය. දරුණු සර්පයෙකුට ගැසූ කලක මෙන් වහා නැග එන්නේය. ද්වේෂය බෝවන රෝගයක් මෙනි. දෙව්දත් බෝධි සත්වයින් කෙරෙහි ඇතිකරගත් ද්වේෂය අතුපතර ද වැඩුන ගසක් මෙන් වැඩී කීපවාරයක් ඔහු අපාගත විය. අන්තිම වරට තවත් කීප දෙනෙක්ද දෙව්දත් නිසා අපාගත විය. ද්වේෂය අනාගාමී මාර්ගය තෙක් පවත්නේය. ධ්‍යාන කුසලයෙන් තාව කාලික වශයෙන් යටපත් කරයි. ද්වේෂය චණ්ඩික්ත ලක්ෂණ යෙන් යුත් ස්වභාව ධර්මයකි. ආනන්තරිය අකුසල් කීපයක් ද්වේෂය නිසා සිදුවේ. ඉතා ආදරයෙන් හදපු දරුවන් විසින් දෙමව්පියන් මරන්නේද ද්වේෂයෙනි. දස අකුසල් වලින් කීපයක් හතක් පමණ ද්වේෂයෙන් කරන්නේය. මේ දෝෂ චතුෂකයේ පළමුවැන්නය. ද්වේෂය බලවත් අකුසලයකි. අකු සල මූලයකි. ඇතැම්විට තමන්ගේ ජීවිත හානියද කර ගනී. එහි විපාක දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් ද බොහෝ විට ලැබෙන්නේය. සිතා බැලිය යුතුවේ.

**ඉස්සාව** : අනුන්ගේ සැප සම්පත් දූක තමා නිකරුනේ ඇතිකර ගන්නා අකුසලයකි. මෙය ද්වේෂය සමග ඇතිවේ. අන්‍යයන්ගේ ධනය, බලය, කීර්ති, ප්‍රශංසා, ගුණානුවන ආදිය හේතුකොට

ඒවා දකින අසන අසත්පුරුෂයන්ගේ සිතේ ඇතිකරගන්නා ස්වභාව ධර්මයයි. මෙය ද්වේෂ ගින්න සමග ඇතිවී තමා දවෙන්නේය. ඒ තමන්ට එවෙලේම ලැබෙන විපාක කොටසයි. පර ලොව විපාක පසුවයි. අන්‍යයන්ගේ සම්පත් නොඉවසන ස්වභාව ධර්මය ඉස්සා නම් වේ.

**මච්ඡරිය** : මසුරු කමද ද්වේෂය සමග ඇතිවන අකුසල ධර්ම යකි. තමා සතු ධන ධාන්‍යය ආදී දේ අන්‍යයන් දකිනවාට ද අක මැති ස්වභාවයයි. තමාගේ සම්පත් හා සමානව අන්‍යයන්ටද සැප සම්පත් ලැබීම නොඉවසන ගතියයි. මෙයට මසුරුකම යයිද කියති. මසුරුකම ඇතිවන කරුණු 5 ක් ධර්මයෙහි දක්වා තිබේ. එය අවාස මච්ඡරිය, කුලමච්ඡරිය, ලාභමච්ඡරිය වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය යන 5 යි. මේවා භික්ෂුන් වහන්සේලා පිළිබඳවද ඇතිවන බව බණපොතේ පෙන්වා තිබේ.

ලෝසක හාමුදුරුවන්ගේ චරිත කථාවෙන් එහි ඇති භයානක තත්ත්වය පැහැදිලි වේ. රහත් වූවාට පසුත් හරිහැටි දන වේලක් නොලැබීම මොනතරම් අවාසනාවක් ද, දුකක් ද, සසර කොයි තරම් දුක් ලැබෙන්න ඇත්ද, එසේම අවාස මච්ඡරිය නිසා ආවාස අසලම ඉපිද කැලි කසල ආදිය පරිහරණය කල පුවත් ධර්මයෙහි දක්වේ. ගිහියන් ගැන කොතෙකුත් මෙවැනි දේ සිදුවේ.

**කුක්කුච්චය** : පසු තැවෙන ස්වභාව ධර්මයයි. පින් කල හැකි කාලයේ පින් නොකිරීමද, පව් කිරීමද නිසා මොකුත් කල නො හැකි දුබල අවස්ථාවන්හිදී සිතේ ඇතිවන පසුතැවෙන ස්වභාව යයි. යෞවන මද, ආරෝග්‍ය මද සිප්ප මද, ආරෝහ පරිනාහ මද ආදි නොයෙක් ආකාරයෙන් උඩගුබවක් ඇතිවීම නිසාද, තමාගේ ඒ ආරෝග්‍යාදීන් සැම කල්හිම නොනැසී පවත්නා ධර්ම සේ ගෙන ඇතැම් අය පින් කිරීම පසුවට තබති. පව් කල අයට ඒවා සිහිවීමෙන් මහත් දහයක් දවෙන තැවෙන ස්වභාවයක් ද්වේෂය සමග ඇතිවේ. කුක්කුච්චය ඇතිවන්නේ ද්වේෂ මෝහ ආදියත් සමගය., කුසල් නොකිරීමත්, අකුසල් කිරීමත් යන දෙක ගැනම තැවෙන ස්වභාවයත් අකුසලයකි. එය ද්වේෂ මූල සිත් ඇතිවී සිදුවේ. පසුතැවීමම කුක්කුච්චයේ ලක්ෂණයයි. ද්වේෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන 4 දෝස චතුෂකය නම් වේ. ද්වේෂය සමගම ඇතිවේ. ඉතිරි චෛතසික තුන එකට ඇතිනොවේ. වෙන වෙනම ද්වේෂය සමග උපදී.

**ථීන මිද්ධ දෙක** : මේ ධර්ම දෙක එකටම උපදනා ස්වභාව ධර්ම දෙකය. ථීනය සිත දුබලකරන කුසල් කිරීමේදී සිත පසුබස්වන ස්වභාවයෙන්ද, එම සිතෙහිම උපදනා මිද්ධයෙන් චෛතසික ධර්මයන් පසුබස්වන ස්වභාවයෙන් ද උපදී. මේ ධර්මයන් ගෙන් කුසල් කිරීමට ඉඩ නොතබා පසු බස්වන ස්වභාවයෙන් යුත් අකුසල් ඉපිද නොයෙක් අපහසු කම් සිතා කුසලයට ඉඩ නො දෙති. සමහර විට බණ ඇසීම් අදියෙහි දී නිදිමත ඇති වේ. සිතත් චෛතසික ධර්මත් අකර්මණ්‍ය කරවති. කුසල් පැත්තට බරවීමට නැමීමට ඉඩ නොතබා සිත වසා තබන්නාක් මෙන් වේ. සිත ඉදිරියට නොයයි. ථීන මිද්ධ දෙක නිවන් මග හා සුගති මගද අසුරන්නේ ය. ආවරණය කරන්නේය. මේ ධර්ම දෙක එකම නීවරණයකි. අකුසල සසංඛාරික සිත් පහේ ඇතිවේ. යෙදෙතත් යෙදෙන්නේ ඇතැම් විටකය. ඒ සිත් පහේ වුවද සෑමවිටම නොයෙදෙති.

**විචිකිච්ඡාව** : මෙයට සැකයයි කියති. සාමාන්‍ය කාරණයක් පාරක් තොටක් ආදිය නොදැනීම නිසා විචිකිච්ඡාව ඇති නොවේ. එය සිත් රාශියකින් සිදුවන ක්‍රියාවකි. එවැනි දේ කුසල් සිතින්ද ඇතිවිය හැකිය. විචිකිච්ඡාව අකුසලයකි. ඒ නමින්ම සිතක් තිබේ. බුද්ධ, ධම්ම, සංඝ, ත්‍රිශික්ෂාව, පුබ්බන්තය, අපරන්තය, පුබ්බාපරන්ත දෙකම සහ පටිච්ච සමුප්පාද නම් වූ හේතුඵල ධර්මය යන මේ කරුණු කෙරෙහි ඇතිවන සැකය, අවිනිශ්චිත බව විචිකිච්ඡාවයි. බුද්ධ ශරීර ලක්ෂණ ගැන හා බුද්ධඥණ ගැන ද සැකයයි. සොළොස් ආකාර විචිකිච්ඡාවක්ද තිබේ. ධර්මය නම් නව ලෝකෝත්තර ධර්මයෝය. සංඝයා නම් ආර්‍ය මහා සංඝරත්නයයි. ත්‍රිශික්ෂාව නම් ශීල, සමාධි, ප්‍රඥවයි, පූර්වාන්තය නම් අතීතය ගැන සැකයයි. අපරාන්තය නම් අනාගතය ගැන සැකයයි. අතීත අනාගත දෙකම ගැනද සැකයයි. පටිච්ච සමුප්පාදය නම් හේතුඵල ධර්මයයි. අවිජ්ජාව නිසා සංඛාර ඇතිවේද යනාදි වශයෙන් ඇතිවන සැකයයි. සෝවාන් මගින් මේ සැක සියල්ල පහ කරනු ලැබේ. ඒ අවස්ථාව දක්වා විචිකිච්ඡාව පවත්නේය. අකුසල චෛතසික දහතර ඉතාම සංක්ෂේපයෙන් දැක්වීමකි. නාම මාත්‍රයකි.

අකුසල චෛතසික 14 නිමි.

# සෝභන චෛතසික 25

**සඬාව** : සෝභන චෛතසික 25 අතුරෙන් පළමුවැන්නයි. සෝභන ධර්මයන්හි ප්‍රධාන තැනක් ගන්නා ප්‍රකටව පවත්නා කුසල් කිරීමේදී නැතිවම බැරි ධර්මයයි. සඬාව අකුසලයෙන් වැලකී කුසල් කිරීමට නිර්භීත ස්වභාවයෙන් යුත් යෝධ වීර පුරුෂයෙක්මෙනි. යමක් ලබාගැනීමටත් උවමනා කටයුතු කර ගැනීමටත් අත උපකාර වන්නාක් මෙන් කුසල් ලබාගැනීමට ලංකර ගැනීමට ද සඬාව අතක් මෙන් ක්‍රියා කරයි.

බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි පැහැදීම සද්ධාවයි. සද්ධාවේ අඩු වැඩි බවක් ද තිබේ. කෙලෙස් දූවිලි සංසිඳ වන සිහිල් ජලයක් බඳුය. සඬාව බල ධර්මයකි. අධිපති ධර්මයකි. ඉන්ද්‍රිය ධර්මයකි. කුසල් සිතෙහි ඉදිරියෙන් යන ධර්මයෙකි. ධනයකි. ආගම සද්ධා, අධිගම සද්ධා ආදී වශයෙන්ද ඒ එක් එක් අවස්ථාවට කරන ක්‍රියාවට අනුව ඇතිවේ. බොරදිය පැහැ ද වීමට කිලුටු මඩ ආදිය යටපත් කිරීමට යොදන ඖෂධයක් වැනිය. කෙලෙස් කිලුටු යටකර කුසල් සිත පහදවන දීප්තිමත් කරන බැබලීම ඇතිකරන ධර්මය සද්ධාවය. සමහර බෝධි සත්වයින් සද්ධාධික නමින්ම ප්‍රකට වේ. සද්ධාව නැතිවීම මහත් පාඩුවකි. නුවන සමග යෙදෙන සද්ධාව උතුම් වේ.

නුවන නැතිවිට කුසල් යයි සිතා නොකටයුතු ක්‍රියාද සිදුවේ. නුවන නැතිවද සද්ධාවට ඉපදිය හැකිය. නුවන නැති කුසල් කළහැකි වුවත් ඒ කුසල් උතුම් කුසල් නොවේ. බාල කුසල් වන්නේය. ඒ බලවත් පාඩුවකි. විපාකය දුර්වල වන්නේ ය. මිත්‍යාඅධිමොක්ඛය සද්ධාවේ ස්වරූපය ගන්නේය. සද්ධාව සිත පහදවන ස්වභාවයෙන් සම්පසාදන ලක්ෂණයෙන් යුක්ත වේ. සම්පක්ඛන්ධන ලක්ෂණයෙන් ද යුක්ත වේ.

**සතිය** : රූපාදී ආරම්මණයන් මතත්කර දෙන ස්වභාවය සතියයි. අකුසල් නොකලයුතු බවත් කුසල් කලයුතු බවත් සිතට මතුකර දෙන හිත මිතුරකු මෙනි. ස්වභාවයෙන් ලෝකයා සිහියයි භාවිතා කරන ධර්මය සති චෛතසිකය නොවේ. මෙය සෝභන සිත් සියල්ලෙහිම උපදනා කුසල් කිරීමට නැතුවම බැරි ධර්මයකි.

සිතෙහි බැබලීම සිදුවන්නේ සම්පජඤ්ඤයෙන් යුක්තවූ ඒ සමග යෙදුන සතියයි. සම්පජඤ්ඤ යනු ප්‍රඥවයි. භාවනා කිරීමට නැතුවම බැරි ධර්මයකි. සතිපට්ඨාන භාවනා නමින්ම විදර්ශනා භාවනාව නිවන් දැකීමේ මාර්ගය යි වදලසේක. සතිය පිහිටුවා භාවනා කිරීම නිවන් දැකීමේ ඒකායන මාර්ගය වශයෙන්ද පෙන්වන්නේය. සතියට ප්‍රධාන තැනක් දුන්නේ වී නමුත් අනික් ධර්මත් නොඅඩුව තමාගේ වැඩ කොටස ඉටුකරති.

සුළඟට අසුවූ බැලුම් බෝලයක් සේ සිතට නොමනා අරමුණු කෙරෙහි පාවී ඇදී යන්නට ඉඩ නොදී නිසි පරිදි යහප තෙහි පිහිටුවන්නේය. තම දරුවන් නොමනා දේවල යෙදී නොමග යනවිට එයින් වලක්වා යහමඟෙහි යොදවන මව්පියන් ගුරුවරුන් වැනි ධර්මයකි. අරමුණෙහි මූලා නොවී ස්ථිරව නො සැලී පිහිටා සිටීම සති චෛතසිකයේ ලක්ෂණයයි. සති සම්ප ජඤ්ඤ දෙකෙන් යුක්ත වූ සිත නිවන ලබා දෙන්නේය.

**හිරිය** : අකුසල් කිරීමට ඇති පිළිකුල් ස්වභාවය හිරියයි. අකු සල් කිරීමට අවස්ථාව ලැබුනත් මහත් වස්තු සම්භාරයක් වැනි දෙයක් අයුතු ලෙස තමාට අයිති කරගැනීමට අවස්ථාව ලැබුන විට හෙතෙම අකුසලයෙහි අදීනව සලකා මෙලොව වශයෙන් ලැබෙන නින්ද අපහාසයන්ද පරලොව අපාය භයද සලකා ආදීනව සහිත වූ පාපයෙන් වලකින්නේය. එසේ වැලකීමට උපකාර වන ධර්මය හිරියයි. මේ ධර්ම ලෝක පාලක ධර්ම වශයෙන්ද මෙලොව යහපත් ජීවිතයක් ගතකිරීමට බොහෝ උපකාර වේ. මේ ධර්ම ගැන නොසැලකීම හේතුකොට දෙලොවින්ම පිරිහෙන් නේය.

**ඔත්තප්පය** : ඇතැම් අය පව්කිරිමට බිය වේ. පින් කිරීමටද ඇතැම් අය බියවේ. ඇතැම් අය කිසිම බියක් නැතිව විපාකය දැන ගනත් අකුසල් කරති. රහතන් වහන්සේ නමක් වඳුරෙක් වගේ පැන පැන එන්නේය යි කී ආයුෂ්‍යන්ට ගර්හා කිරීමේ වචනය අස්කර නොගෙන අපාගතවීම මෙහි අකුසලයට බිය නැති බවයි එයින් පෙනෙන්නේ. මේ ධර්ම දෙක හිරි ඔත් තප්ප යන ධර්මයන් කුසල පක්ෂයෙහි බල ධර්ම දෙකකි. හිරි බල ඔත්තප්ප බල වශයෙන් බල ධර්ම 9 ට ඇතුලත් කර

වදරාතිබේ. දේවධර්ම නාමයෙන්ද ව්‍යවහාර වේ. පාපයට බියවීම ඔත්තප්පයේ ලක්ෂණයයි. යහපත් හොඳ ජීවිතයක් ගතකිරීමට ද, කුසල් කිරීමටත් මේ ධර්ම දෙක බොහෝ උපකාර වන්නේය. හිරි ඔත්තප්ප දෙක ශරීරය අලංකාර කරන ආභරණාදියක් මෙනි. සිතටආභරණයක් මෙනි.

**අලෝභය** : කුසල් කිරීමට නැතිවම බැරි ධර්මයකි. සෝභන සිත් සියල්ලෙහිම යෙදෙති. අරමුණු කෙරෙහි නොඇලී අරමුණු ගන්නේය. නෙලුම් පතෙහි ඇති වතුර මෙනි. වතුර ඇතත් එය නො ඇලී වැගිරෙන්නේය. අලෝභය අරමුණු ගැනීමේදී අරමුණෙහි යථා තත්ත්වයට අනුකූලවම නො ඇලී අරමුණු ගන්නේය. අලෝභය හේතුකොට දනාදී පින්කම් කල හැකිවේ. පසේ බුදුරජාණන් වහන්සේට දුන් ආහාර ටික පසුව ඇතිකරගත් නරක චේතනාව හේතුකොට පසු ජාතියක ධනය ලැබීමත් තමාට ප්‍රයෝජනයක් ගන්ට නොහැකි වීමත් ගැන සිතන විට පින්කම් කිරීමේදී දනාදිය දිය යුතු හැටි ද පෙනෙන්නේය. ලෝභය නැති බව අලෝභය නොවේ. අලෝභය වෙනම කුසල මූලයකි. අරමුණෙහි නොඇලීමේ ස්වභාව ධර්මය අලෝභය වේ. අලෝභය දීමේ චේතනාව ය අලෝභය සෑම දනාදී කුසල් සිදු කෙරෙන්නේ ය.

**අදෝසය** : අරමුණෙහි සිත දූෂ්‍ය නොකර විරුද්ධාකාරයෙන් නොගැටී අරමුණ ගන්නා ස්වභාව ධර්මයයි. අදෝසය කුසල මූලයකි. කෙලෙස් ගිනිවලින් තැවීම නවත්වන නිවාලන ධර්මයකි. ද්වේශ ගින්න නිවාලන ජල ධාරාවක් මෙනි. අන්‍යයන්ට අනර්ථ කිරීමෙන් වෛර කිරීමෙන් වලකින්නේය. අදෝසය හේතුකොට ප්‍රාණඝාතාදි දරුණු අකුසලයන් කිරීමෙන් වලකින්නේය. මෛත්‍රී භාවනාවට බොහෝ උපකාර වේ. තමාට හිතවැඩ සලසන කල්‍යාන මිත්‍රයෙක් මෙනි. සිත මෘදු මොලොක් ස්වභාවයට පැමිණවීම අදෝසයේ ලක්ෂණයයි.

**තත්‍රමජ්ඣත්තාතව** : මෙය තමා හා එකට උපදනා සහජාත ධර්මයන් සමව පවත්වන සවභාවයෙන් යුක්ත වේ. අසුන් ආදී සතුන් යෙදූ රථයක් සම වේගයෙන් යන කල්හි නොසන්සුන්ව සමව බලාසිටින රථාචාර්‍යයෙකුට සමාන කරයි. එකට උපදනා

චිත්ත චෛතසික ධර්මයන්ගේ වේග සමත්වය සිදු කරණ ධර්ම යයි. මේ චෛතසිකය ද යෙවාපනක ධර්මයක් වශයෙන් පෙන්වා තිබේ.

**කාය පස්සද්ධිය හා චිත්ත පස්සද්ධිය** :

කාය පස්සද්ධියෙන් තමා හා සමග උපන් සිත්හි උපදනා චෛතසික ධර්මයන් සංසිඳවන ස්වාභාවයයි. වේදනා, සඤ්ඤා සංඛාර යන ස්කන්ධ තුනෙහි සංසිඳීම ඇති කරයි. චිත්ත පස්සද්ධියෙන් විඤ්ඤාන ස්කන්ධයෙහි සංසිඳීම ඇතිකරයි. මේ ධර්ම දුබල වූයේ නම් කුසල් කිරීමෙහි දී නාම ධර්ම දුබල වේ. රත්වූ ගල්තලාවෙහි දමන ලද මසුන් මෙන් තැවෙන ගතියෙන් යුක්ත වේ. කුසල් කිරීමේදී සිත පසුබසී. කුසලයෙන් සතුටක් නොලබයි.

**කාය ලහුතා චිත්ත ලහුතා** :

වේදනාදී ස්කන්ධයන්හි කෙලෙස් බර ඇතිවීම වලක්වා සෝභන සිත සමග උපදනා චෛතසික ධර්මයන් බලවත් කරවයි. චිත්ත ලහුතාව විඤ්ඤාන ස්කන්ධයෙහි සංසිඳවීම කරවයි. මේ චෛතසිකයන්ගෙන් සෝභන ධර්මයන් ආරක්ෂා කරයි. නාම ස්කන්ධය සැහැල්ලු ස්වභාවයට පමුණුවයි. කුසල් කිරීමට පහසු බවක් ඇතිකරයි. කාය චිත්ත දෙකේ (නාමස්කන්ධ සතරෙහි) කුසල් කිරීමෙහිදී ඉදිරියට යන ස්වභාවයෙන් යුක්ත වෙයි. මෙහි කාය වශයෙන් ගන්නේ සෝභන සිත්වල උපදනා වේදනාදී ස්කන්ධ තුනයි. නාම ධර්මයන් සැහැල්ලු කරවන ලක්ෂණයෙන් යුත් ස්වභාව ධර්මයයි.

**කාය මුදුතා චිත්ත මුදුතා**

මේ චෛතසික ධර්ම හේතුකොට නාම ධර්මයන් ආරක්ෂා කරයි. දිට්ඨි මාන ආදී අකුසල ධර්මයන්ගෙන් පීඩා නොවන සේ සිතෙහි තද ගතිය ඇතිවීමට ඉඩ නොතබා නාම ස්කන්ධයන් මෘදු මොලොක් බවට පමුණුවයි. නාම ධර්මයන් දරදඬු ස්වභාවට පත්වීමට ඉඩ නොදෙයි. කුසල් කිරීමට චිත්ත චෛතසික ධර්ම නැමී පවත්නා ස්වභාවයෙන් යුක්ත වේ.

**කාය කම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා** :

සියලුම කුසල ධර්මයන් කිරීමට යෝග්‍යාකාරයෙන් නාම ස්කන්ධයන් නැමී පවත්නා ආකාරයෙන් යුක්තවන්නේ මේ ධර්මයන්ගේ උපකාරයෙනි. පිරිසිදු රත්රන් සියුම් කර්මාන්ත යන්ට යොදවන්නාක් මෙනි. කාමච්ඡන්දදි අකුසල ධර්මයන් ගෙන් පීඩා නොවනසේ කුසල් සිත ආරක්ෂා කරයි. මේ ධර්ම දුබලවුවහුගේ කුසලය දුබලය. උඩු සුලඟට දැමූ බොල් වී මිටක් සේ ඉදිරියට නොයයි. කුසල් කිරීමට පසු බසින ස්වභාව යෙන් යුක්ත සිත් මේ ධර්ම බලවත් වීමෙන් කුසල් කිරීමට යොග්‍ය ආකාරයෙන් නාම ස්කන්ධයන් ආරක්ෂාවන්නේය. කුසල් කිරීමට ඉදිරිපත් වන්නේ ය.

**කායපාගුඤ්ඤතා චිත්ත පාගුඤ්ඤතා** :

සෝභන නාමස්කන්ධයන්ගේ නොගිලන් බව ඇති කරයි අකුසල ධර්ම ඇති සිත ගිලන් බවක් මෙන් රෝගියෙක් සේය. කුසල් කිරීමට ඉඩ නොතබා ලෙඩක් මෙන් වේ. එසේ චිත්ත චෛතසික ධර්මයන් අලස කරවන ලෙඩ වූ කලක මෙන් දුබල කරවන ගතියට ප්‍රතිපක්ෂ ස්වභාවයෙන් ඉපද චිත්ත චෛතසික යන් ශක්තිමත් කරවන ස්වභාවයට පමුණුවන්නේය. මේ ධර්ම බලවත් වූ කල්හි සිත කුසල් කිරීමෙහි යෙදෙන්නේය. මේ ධර්ම දුබල වූ විට කුසල කිරීම පසුවට කල් දමයි හෙටට කල්තබයි. එවැනි ස්වභාවය ඇති වන්නේ දුබල වූ සිතයි.

**කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා** : මේ ධර්ම දෙක චිත්තය හා චෛත සික ධර්මයන් ඍජු බවට පමුණුවන්නේය. කුසල් සිත බලවත් කරන්නේය. මායා සාඨෙය්‍ය ආදි අකුසල ධර්මයන්ගෙන් කිලිටි වීම රවටනා ස්වභාව ඇතිවීමට ඉඩ නොතබන සිත සහ චෛතසික ඇදනැති ස්වභාවයට පමුණුවන ධර්ම දෙකකි. චිත්ත චෛතසිකයන්ගේ තුන් ආකාරයක වංකයක් බණ පොතේ පෙන්වා තිබේ. ගෝමුත්‍ර වංකය, චන්ද්‍රලේඛා වංකය, නංගල කෝටිවංකය යනුවෙනි. ගමන් කරමින් මුත්‍ර පහකරන ගවයාගේ මුත්‍ර වංකයද මාසෙ පෝය පසු වූ දවසෙන් දෙකෙන් පායන සඳෙහි ඇති වංකය චන්ද්‍රලේඛා වංකයයි ද නගුල් කෙළවර පිහිටි

ඇදය නංගලකෝටි වංකය නමින් ද ව්‍යවහාර වේ. ඇතැම් කෙනෙක් පව් කරමින් පවට භය ආකාරයෙන් පව් නොකරන බව පෙන්වයි. එහෙත් තුන් දෙරින්ම පව් කරති. එය ගෝමුත්‍ර වංකයට සමාන කර පෙන්වයි. තවත් කෙනෙක් දෙදෙරකින් ද, තවත් කෙනෙක් එක ද්වාරයකින් ද පව් කරති. මේ කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා යන චෛතසිකයන් ඒ ඇදයට විරුද්ධව ඒ තත්වයෙන් මුදවා කුසල් සිත ආරක්ෂා කරන්නේය. මේ සෝභණ සාධාරණ චෛතසික 19 යි.

**විරති චෛතසික තුන** : සම්මා වාචා චෛතසිකය සම්මා කම්මන්ත චෛතසිකය, සම්මා ආජීව චෛතසිකය යන තුනයි. ප්‍රාණඝාතාදී අකුසලයන්ගෙන් වැළකීම විරතියයි. එය සම්පත්ත විරතිය, සමාදන විරතිය, සමුච්ඡෙද විරතිය යන ආකාර තුනකි.

සම්පත්ත විරතිය නම් අකුසලයක් කරන්ට අවස්ථාව පැමිණි විට එය නොකර හැරීම සම්පත්ත විරතියයි. පෙර ලක්දිව විසූ චක්කණ නැමැත්තෙක් මව සුවපත් කරගැනීම සඳහා වත් ප්‍රාණඝාතය නොකර සත්‍ය ක්‍රියා බලයෙන් මව සුවපත් කළ පුවතක් තිබේ. සමාදන විරතිය උදෙසා ශික්ෂාපද සමාදන් වී සිටි පුරුෂයෙකු පිඹුරෙක් වෙලාගත් විට අතේ තිබුන කැත්තෙන් ගසා පිඹුරා නොමරා සමාදන් වූ සීලයට තම ජීවිත දනය දී කැත්ත වීසිකළ පුවතක් ද සමාදන සීලය ආරක්ෂා කළ ආකාරය පෙන්වයි. පිඹුරා ඔහු නොමරා හැරිය බවයි පෙන්වන්නේ.

සම්මා වාචා විරතියද තුන් ආකාර වේ. යහපත් කථාව කථා සම්මා වාචා නම් වේ. එය ඇතිකරන චේතනාව චේතනා සම්මා වාචා නම් වේ. දුෂ්චරිතයෙන් වැලකීම විරති සම්මා වාචාය. සම්මා කම්මන්තයද ක්‍රියා සම්මා කම්මන්තය චේතනා සම්මා කම්මන්තය විරති සම්මා කම්මන්තය යන තුන් ආකාර වේ.

**සම්මා ආජීවය** : ජීවිකාව පිණිස හෝ කායාදී දුශ්චරිතයන් නොකර හැරීම සම්මා ආජීවයයි. සම්මා ආජීවය වශයෙන් ගනු ලබන්නේ ජීවිතය රැක ගැනීම පිණිසවත් ප්‍රාණඝාතාදී පව් නොකිරීමය. මේ චෛතසික තුන කාමාවචර කුසල් සිත්වල වෙන් වශයෙන් අවස්ථාවට අනුකූලව උපදී. මාර්ගඵල සිත්වල

තුනම එකටම යෙදෙන්නේය. කාමාවචර කුසල් සිත්වල යෙදී බලවත් වී මාර්ග සිතෙහි එකවර යෙදීමට ශක්තිමත් වන්නේය. එය භාවනාවෙන් සිදු වන්නකි.

**අප්ප මඤ්ඤා චෛතසික දෙක.**

කරුණාව හා මුදිතාව සත්ව ප්‍රඥප්තිය අරමුණු කොට උපදනා චෛතසික දෙකය. දුක්විඳින සත්වයන් දුටු විට සත්පුරුෂයන්ගේ සිත්තුළ ඒ දුකින් මුදවන සැපවත් කරවන ආකාරයෙන් සිතේ ඇතිවන හොඳ යහපත් ස්වභාවය කරුණාවය. ඇතැම් කෙනෙක් දුකට පත් කෙනෙක් දුකින් නිදහස් කිරීමට ජීවිත හානියද කරති. එය කරුණාව නොව ද්වේශයය. කරුණාවේ මුහුණුවරින් ශෝකයද ඇතිවේ. හැඬීම ඇතිවන්නේ කරුණාව නිසා නොව ශෝකයෙනි. කරුණාව බ්‍රහ්ම විහරණ සතරින් එකකි. භාවනාවකි ධ්‍යාන භාවනාවකි. මහාබෝධි සත්වයින් වහන්සේලාට දුකට පත් සංසාර දුකට පත් සත්ව ප්‍රජාව කෙරෙහි ඇතිවන මහා කරුණාව නිසා අතට පත් නිවන් සැප අත්හැර සසර දුක්විඳ පාරමී ධර්ම සම්පූර්ණ කර බුදුවී සත්වයන්ට පිහිට වෙති.

**මුදිතාව** : සැපවිඳින සත්වයින් දුටුවිට සිතේ ඇතිවන ඊට කැමති වන ස්වභාවය අනුන්ගේ සම්පත් කෙරෙහි ඊර්ෂ්‍යා නොකරන ස්වභාවය මුදිතාවය. සත්ව ප්‍රඥප්තිය අරමුණු කොට සිත්තුල ඇතිවන හොඳ ගතියකි. බ්‍රහ්ම විහරණ සතරට අයත් ධර්මයකි. භාවනාවක් වශයෙන් දියුණුකොට ධ්‍යාන ඉපදවිය හැකිය. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන බ්‍රහ්ම විහරණ සතරින් දෙකකි. මේ චෛතසික දෙකෙහි අරමුණු දුක්විඳින සත්ව ප්‍රඥප්තිය හා සැප විඳින සත්ව ප්‍රඥප්තියයි. සැප විඳින සත්වයින් කෙරෙහි ඊර්ෂ්‍යා නොකරන හොඳ ගතිය මුදිතාවය මේ ද්වේෂයට විරුද්ධ ද්වේෂය පහකරන ධර්ම මෙනි.

**ප්‍රඥව** : නිවැරදි ලෙස අරමුණු ගන්නාවූ ස්වභාව ධර්මයයි අමෝහ යයි ප්‍රඥවට නම් රාශියක් තිබේ. අරමුණ ගන්නා ආකාරයන්ගේ වශයෙන් එසේ නම් රාශියක් වේ. මෝහයට ප්‍රතිවිරුද්ධ මෝහ නමැති සිතේ ඇතිවන ඝන අඳුර දුරුකරන ධර්මයයි. ප්‍රඥ ආලෝකයක් වශයෙන් වදළ සේක.

කුසල් කිරීමෙහි ප්‍රධාන ධර්මයයි. කිව යුතුය. ප්‍රඥාව ඇති කුසල් මහා බලයකින් යුක්ත වේ. නුවණ නැති නුවණ නොයෙදෙන කුසලය බාල කුසලයක් වේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ආදී වශයෙන් ඇත්ත වැටහෙන්නේ නුවන ඇති විදර්ශනා සිතටය. ප්‍රඥාව ධනයකි. සියලු සැප සම්පත් ලබා ගැනීමටත් සංසාර දුකින් නිදහස් වීමටත් ප්‍රඥා ආලෝකයම තිබිය යුතුය.

ප්‍රඥා නමැති ආයුධය සමාධි නැමති කරගලෙහි මුවහත් තබා ශක්තිමත් කරගත් කල්හි කෙලෙස් නාමැති ඝන වනාන්තරය කපා දැමිය හැකිවේ. එහෙයින් ප්‍රඥාව ආයුධයකට සමාන කරයි. ප්‍රඥාව මෝහ නමැති ඝන අඳුර නසාලන ආලෝකයකි. ප්‍රදීපයකි. සියලුම ධර්මයන්ගේ මුදුන්මල් කඩක් මෙන් වන්නේ ප්‍රඥාවය. නුවන නැති සිත අඳුරු වේ. නුවණ ඇතිකර ගැනීමට ධර්මය ඉගනීමෙන් අන්‍යයන්ට කියාදීමෙන් ද නුවණ වැඩෙති. බුද්ධ ධර්මය හරිහැටි ඉගෙනීමෙන් නුවණ දියුණු වන්නේය. ප්‍රඥා ආලෝකය සැමටම ලැබේවා.

සෝභන චෛතසික නිමි.

# සම්ප්‍රයෝගනය සහ සංග්‍රහනය පිළිබඳ ස්වරූප ධර්ම

චෛතසික සිත් සමග යෙදෙන ආකාරය දැක්වීම සම්ප්‍රයෝග නයයි. එක් එක් සිතෙක්හි මෙතෙක් චෛතසික යෙදෙන්නේ යැයි චෛතසික ගණන දැක්වීම සංග්‍රහනය ක්‍රමයයි. චෛතසික ධර්ම කොටස් තුනකින් යුක්ත වේ. අඤ්ඤසමාන රාශිය, අකුසල රාශිය, සෝභන රාශිය යි තුනකි.

සම්ප්‍රයෝග නය 16 සහ සංග්‍රහනය 33 ක් වේ.
සම්ප්‍රයෝගනය 16 නම්,

| | | |
|---|---|---|
| අන්‍ය සමාන රාශියෙහි නය | 7 | 16 සම්ප්‍රයෝගනය |
| අකුසල රාශියෙහි නය | 5 | |
| සෝභන රාශියෙහි නය | 4 | |

සබ්බචිත්ත සාධාරණ චෛතසික 7 සෑම සිතකම යෙදෙති. 89 ක් වූ හෝ 121 ක් වූ සිත් සමග සියල්ලම එකටම එකවිටම යෙදෙති. ප්‍රකීර්ණක චෛතසික 6 වෙන වෙනම විසිර පවත්නේය. ඇතැම්විට එකටම ද යෙදෙති. එකක්වත් නොයෙදෙන සිත් 10 කි. දෙපස් විඥාන 10 යි. මේ චෛතසික 13 ට අන්‍ය සමාන යයි ද කියති.

අකුසල චෛතසික 14 කි. එය අකුසල් සිත් වල පමණක් යෙදෙති. වෙන වෙනම කොටස් වශයෙන් යෙදෙති. අන්‍ය සමාන 13 ද ඒ සමග යෙදෙති. සියල්ල 27 ක් වේ.

සෝභන චෛතසික 25 කි. එය සෝභන සිත් වලම යෙදෙති. චෛතසික 19 ක් සෝභන සිත් සියල්ලෙහිම සෝභන සාධාරණ නමින් යෙදෙති. ඉතිරි චෛතසික සය සුදුසු පරිදි වෙන වෙනම යෙදෙති. අන්‍ය සමාන 13 සමග මේ චෛතසික 25 හ සෝභන සිත් 59 හෝ 91 හි යෙදෙති. සම්ප්‍රයෝග 16 සුදුසු පරිදි යෙදෙති. අන්‍යසමාන 13 සම්ප්‍රයෝගනය 7 ද, අකුසල චෛතසික 14 පස් ආකාරයද, සෝභන චෛතසික 25 සතර ආකාරයකින්ද යන 16 ආකාරයකට යෙදෙති.

**සංග්‍රහනය** : සම්ප්‍රයෝගනයට අනතුරුව චෛතසික යන්ගේ සංග්‍රහනය 33 ක් දැක්වේ. ලෝකෝත්තර සිත්හි සංග්‍රහනය 5 ද, මහද්ගත සිත්හි සංග්‍රහනය 5 ද, කාම සෝභන සිත්හි සංග්‍රහනය 12 ද, අකුසල් සිත්හි සංග්‍රහනය 7 ද, අහේතුක සිත්හි සංග්‍රහනය 4 ද ලැබෙති. මෙසේ සංග්‍රහනය 33 ලැබෙති.

**නියත යොගී අනියත යෝගී චෛතසික.**

නියත යෝගි අනියත යෝගි වශයෙන්ද ආකාර භෙදයක් වේ. නියමයෙන්ම යෙදෙන චෛතසික නියත යෝගීය. එය 41 වේ. අනියත යෝගී චෛතසික 11 වේ. අනියත යෝගී නම් සෑම විටම නොයෙදෙන්නා වූද, වෙන වෙනම හෝ එකටම යෙදෙන්නා වූ ද වේ. අවස්ථානුරූපව එසේ වන්නේය. වෙනස් අරමුණු ගැනීමෙන් අරමුණු නානත්වය නිසාද, එසේ අනියත යෝගී වේ. නානා යෝගී ද, කදචි යෝගී ද වේ.

**අනියත යෝගී වන චෛතසික**

ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, තුනද විරති චෛතසික තුනද, අප්පමඤ්ඤා චෛතසික දෙකද, මානයද, ථීන මිද්ධ දෙකද, යන 11 අනියත යෝගී, කදචියෝගී, නානායෝගීද වේ.

දෝශ චතුෂකයට අයත් ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, තුන ද්වේශය සමග ඒ එකක් යෙදෙති. අරමුණු නානත්වය නිසා එකට එකවිට නො යෙදෙති. විරති තුන කාමාවචර කුසල් සිත් 8 හි එකවිට නොයෙදේ. අකුලසයෙන් වැලකීම් ආදි අවස්ථාවන්හි යෙදෙති. එකක්වත් නොයෙදෙන අවස්ථා වන් ද තිබේ. ලෝකෝත්තර සිත් අටෙහිම යෙදෙති. විස්තාර ලෝකෝත්තර සිත් වලද, විරති 3 ම යෙදෙති. මානය ලෝභ මූල, දිට්ඨි විප්පයුත්ත සිත්හි ඇතැම් විට යෙදෙති. ථීන මිද්ධ දෙක අකුසල සසංඛාරික සිත්වල ඇතැම් විටෙක එකටම යෙදෙති. අප්පමඤ්ඤා, දෙක කාමාවචර කුසල් සිත් වලද ක්‍රියා සිත්වලද ඇතැම් විටෙක යෙදෙති. මහද්ගත සිත් වල චතුත්ථ ධ්‍යානය දක්වා ඇතැම් විට වෙන වෙනම යෙදෙති. ලෝකෝත්තර සිත් වල නොයෙදෙති.

මහද්ගත ලෝකෝත්තර
67
සහ කාමසෝභන සිත්
24 හි සංග්‍රහනය
දැක්වීමයි
සිත් සියල්ල 91 යි)
1 කොටස

| | සිත් | සබ්බ චිත්ත සාධාරණ 7 | විතක්කය 1 | විචාරය 1 | අධිමොක්ඛය 1 | විරිය 1 | පීති 1 | ඡන්ද 1 | සෝභන සාධාරණ 19 | විරති 3 | අප්පමඤ්ඤා 2 | පඤ්ඤා 1 | යෙදෙන ගණන | නොයෙදෙන ගණන | චෛතසික සියල්ල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථම ධ්‍යාන ලෝකෝ. | 8 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | 3 | – | 1 | 36 | 16 | 52 |
| දුතිය ධ්‍යාන ලෝකෝ. | 8 | 7 | – | 1 | 1 | 1 | 1 | 1 | 19 | 3 | – | 1 | 35 | 17 | 52 |
| තතිය ධ්‍යානලෝකෝ. | 8 | 7 | – | – | 1 | 1 | 1 | 1 | 19 | 3 | – | 1 | 34 | 18 | 52 |
| චතුත්ථ ධ්‍යාන ලෝකෝ. | 8 | 7 | – | – | 1 | 1 | – | 1 | 19 | 3 | – | 1 | 33 | 19 | 52 |
| පඤ්චම ධ්‍යාන ලෝකෝ. | 8 | 7 | – | – | 1 | 1 | – | 1 | 19 | 3 | – | 1 | 33 | 19 | 52 |
| ප්‍රථම ධ්‍යාන | 3 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | — | 2 | 1 | 35 | 17 | 52 |
| දුතිය ධ්‍යාන | 3 | 7 | — | 1 | 1 | 1 | 1 | 1 | 19 | — | 2 | 1 | 34 | 18 | 52 |
| තතිය ධ්‍යාන | 3 | 7 | — | — | 1 | 1 | 1 | 1 | 19 | — | 2 | 1 | 33 | 19 | 52 |
| චතුත්ථ ධ්‍යාන | 3 | 7 | — | — | 1 | 1 | — | 1 | 19 | — | 2 | 1 | 32 | 20 | 52 |
| පඤ්චම ධ්‍යාන අරූපා. | 15 | 7 | — | — | 1 | 1 | — | 1 | 19 | — | — | 1 | 32 | 20 | 52 |
| කාම කුසල් පළමු යුගල | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | 3 | 2 | 1 | 38 | 14 | 52 |
| කාම කුසල් දෙවැනි ,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | 3 | 2 | – | 37 | 15 | 52 |
| කාම කුසල් තුන්වෙනි,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | — | 1 | 19 | 3 | 2 | 1 | 37 | 15 | 52 |
| කාමකුසල් සතරවෙනි,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | — | 1 | 19 | 3 | 2 | – | 36 | 16 | 52 |
| කාමා විපාක පළමු යුග. | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | | – | 1 | 33 | 19 | 52 |
| කාමා විපාක දෙවන ,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | — | — | — | 32 | 20 | 52 |
| කාමා. විපාක තුන්වන,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 19 | — | — | 1 | 32 | 20 | 52 |
| කාමා. විපාක සතරවන,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | – | 1 | 19 | — | — | — | 31 | 21 | 52 |
| කාමා. ක්‍රියා පළමු යුගලය | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | — | 2 | 1 | 35 | 17 | 52 |
| කාමා. ක්‍රියා දෙවන ,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 19 | — | 2 | — | 34 | 18 | 52 |
| කාමා.විපාක තුන්වන ,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | — | 1 | 19 | — | 2 | 1 | 34 | 18 | 52 |
| කාමා. ක්‍රියා සතරවන ,, | 2 | 7 | 1 | 1 | 1 | 1 | — | 1 | 19 | — | 2 | — | 33 | 19 | 52 |

| අසෝභන සිත් 30 හි සංග්‍රහනය 2 කොටස | සිත් | සබ්බ චිත්ත සාධාරණ | විතක්ක, විචාර, විරිය | අධිමොක්ඛ | පීති | ඡන්ද | අකුසල සාධාරණ | ලෝභ | දිට්ඨි | මාන | දෝස චතුක්කය | ථීනමිද්ධ | විචිකිච්ඡා | සංග්‍රහවන චෛතසික | සංග්‍රහ නොවන ,, | චෛතසික සියල්ල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලෝභ මූල සොම් දිස අසං | 1 | 7 | 3 | 1 | 1 | 1 | 4 | 1 | 1 | | | | | 19 | 33 | 52 |
| ලෝභ මූල සොම් දිස සසං | 1 | 7 | 3 | 1 | 1 | 1 | 4 | 1 | 1 | | | 2 | | 21 | 31 | 52 |
| ලෝභ මූල සොම් වි. අසං | 1 | 7 | 3 | 1 | 1 | 1 | 4 | 1 | — | 1 | | | | 19 | 33 | 52 |
| ලෝභ මූල සොම් වි. සසං | 1 | 7 | 3 | 1 | 1 | 1 | 4 | 1 | — | 1 | — | 2 | | 21 | 31 | 52 |
| ලෝභ මූල උපෙක්ඛා දිස | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | 1 | 1 | | | | | 18 | 34 | 52 |
| ලෝභ මූල ,, දිස සසං | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | 1 | 1 | | | 2 | | 20 | 32 | 52 |
| ලෝභ මූල ,, වි අ | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | 1 | — | 1 | | | | 20 | 32 | 52 |
| ලෝභ මූල ,. වි ය | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | 1 | — | 1 | — | 2 | | 18 | 34 | 52 |
| දෝසමූල පටිඝ අසං | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | | | | 4 | | | 20 | 32 | 52 |
| දෝසමූල පටිඝ සසං | 1 | 7 | 3 | 1 | — | 1 | 4 | | | | 4 | 2 | | 22 | 30 | 52 |
| මෝහමූල විචිකිච්ඡා | 1 | 7 | 3 | | — | — | 4 | | | | | | 1 | 15 | 37 | 52 |
| මෝහමූල උද්ධච්ච | 1 | 7 | 3 | 1 | — | — | 4 | | | | | | | 15 | 37 | 52 |
| දෙපස් විඥාන | 10 | 7 | | | | | | | | | | | | 07 | 45 | 52 |
| සම්පටිච්ඡන | 2 | 7 | 2 | 1 | | | | | | | | | | 10 | 42 | 52 |
| උ. සන්තීරණ | 2 | 7 | 2 | 1 | | | | | | | | | | 10 | 42 | 52 |
| සොම්නස් ,, | 1 | 7 | 2 | 1 | 1 | | | | | | | | | 11 | 41 | 52 |
| උ. පංචද්වාරාවජ්ජන | 1 | 7 | 2 | 1 | | | | | | | | | | 10 | 42 | 52 |
| උ.ම නොද්වාරාවජ්ජන | 1 | 7 | 3 | 1 | | | | | | | | | | 11 | 41 | 52 |
| සො. හසිතුප්පාද | 1 | 7 | 3 | 1 | 1 | 1 | | | | | | | | 12 | 46 | 52 |

දෙපස් විඥාන 10, සම්පටිච්ඡන 2, සන්තීරන 3, පංචද්වාරාවජ්ජන 1 යි. මේ සිත් 16 යේ විරිය නොයෙදෙති.

දිට්ඨි මාන දෙක ලෝභ මූල සිතෙහිම යෙදෙති. ස්කන්ධ පඤ්චකය කෙරෙහි පැවති ආස්වාදය නිසා ඇතිවේ. දිට්ඨිය ආත්මයක් ඇතැයි ගැනීමෙන් ඇති වේ. නොමනා සේ වැරදි විදියට ආත්මය ගැන විශ්වාසය නිසා ඇතිවේ. මානය යන හැඟීමෙන් මම උසස් කෙනෙක්මි. ගුණ නුවනින් යුතු උතුමෙ කැයි යන හැඟීමෙන් ද උසස් කොට ගන්නේය. ආත්ම දිට්ඨිය පෘථග්ජන සන්තානයෙහිම ඇතිවේ. ආර්යයන්ට ඇති නොවේ. මානය ආර්යයන් තුන්දෙනෙකුට ඇතිවේ. රහතන් වහන්සේට මානය ඇතිනොවේ. මානය සියුම් අකුසලයකි. ලෙහෙසි යෙන් නැතිකළ නොහැක්කේය. මච්ඡරිය ද තමාගේ සම්පත් කෙරෙහි පැවති ලෝභය හේතුකොට ඒවාගේ සම්පත් අන්‍ය යන්ට නොලැබේවා ආදි වැරදි කල්පනා නිසාම ගැටෙන ස්වභාවයෙන් ඇතිවේ.

අසෝභන සිත් 30 අතුරෙන් දිට්ඨි විප්පයුත්ත සිත්හි යෙදෙන මානය කදාචියෝගී චෛතසිකයකි. සෑමවිටම නොයෙදේ. මානය යෙදෙන ලෝභමූල දිට්ඨි විප්පයුත්ත සිත්වල සුදුසු අවස්ථාවට යෙදෙති. දෝස මූලයෙහි යෙදෙන දෝෂ චතුෂ්කය අතුරෙන් ද්වේෂය සෑමවිටම යෙදෙන අතර ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච තුනෙහි අරමුණු නානත්වය නිසා සුදුසු පරිදි ඉන් එකක් අරමුණට අනුව අවස්ථානනුකූලව යෙදෙති. මේ චෛත සික සමහරක් ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච තුනත් මාන, ථීන, මිද්ධ තුනත් අනියත යෝගීහුය. මේ චෛතසික සෑමවිටම නොයෙදේ.

චෛතසික කාණ්ඩය ස්වරූප අවසන්

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# ප්‍රකීර්ණක සංග්‍රහ පාලිය

## තුන්වන පරිච්ඡෙදය

117 සම්පයුත්තා යථායොගං තෙ පඤ්ඤාස සභාවතො,
චිත්ත චෙතසිකා ධම්මා තෙසං දනි යථාරහං.

118 වෙදනා හෙතුතො කිච්ච ද්වාරා ලම්බන වත්ථුතො,
චිත්තුප්පාද වසෙනෙව සංගහො නාම නීයතෙ.

119 තත්ථ වෙදනා සංගහෙ තාව තිවිධා වෙදනා සුඛං දුක්ඛං අදුක්ඛමසුඛං චෙති, සුඛං දුක්ඛං සොමනස්සං දෙමනස්සං උපෙක්ඛා තී ච භෙදෙන පන පඤ්චධා හොති.

120 තත්ථ සුඛ සහගතං කුසලවිපාකං කාය විඤ්ඤාණ මෙක මෙව.

121 තථා දුක්ඛ සහගතං අකුසලවිපාකං කාය විඤ්ඤාණං.

122 සොමනස්ස සහගත චිත්තානි පන ලොභ මූලානි චත්තාරි ද්වාදස කාමාවචර සොභනානි සුඛසන්තීරණ හසනානි ච ද්වෙති අට්ඨාරස කාමාවචර චිත්තානි චෙව පඨම දුතිය තතිය චතුත්ථජ්ඣාන සංඛාතානි චතු චත්තාළිස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති ද්වාසට්ඨී විධානි භවන්ති.

123 දෙමනස්ස සහගතචිත්තානි පන ද්වෙ පටිඝ සම්පයුත්ත චිත්තා නෙව.

124 සෙසානි සබ්බානිපි පඤ්චපඤ්ඤාස උපෙක්ඛා සහගත චිත්තා නෙවා.

125 සුඛං දුක්ඛ මුපෙක්ඛාති තිවිධා තත්ථ වෙදනා,
සොමනස්සං දෙමනස්ස මිති භෙදෙන පඤ්චධා,

126 සුඛමෙකත්ථ දුක්ඛං ච දෙමනස්සං ද්වයෙ ඨිතං,
ද්වාසට්ඨීසු සොමනස්සං පඤ්චපඤ්ඤාස කෙතරා.

127 හෙතුසංගහෙ හෙතුයො නාම ලොභො දෙසො මොහො
අලොභො අදෙසො අමොහො චාති ඡබ්බිධා
භවන්ති.

128 තත්ථ පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්ච විඤ්ඤාණ සම්
පටිච්ඡන සන්තිරණ වොත්ථපන හසන වසෙන අට්ඨා
රස අහෙතුක චිත්තානි නාම.

129 සෙසානි සබ්බානි පි එකසත්තති චිත්තානි සහෙතුකා නෙව.

130 තත්ථා පි ද්වෙ මොමූහ චිත්තානි එකහෙතුකානි.

131. සෙසානි දසඅකුසල චිත්තානි චෙව ඤාණ විප්පයුත්තානි
ද්වාදස කාමාවචර සොභනානී චෙති ද්වාවීසති ද්විහෙතුක
චිත්තානි.

132 ද්වාදස ඤාණසම්පයුත්ත කාමාවචර සොභනානි චෙව
පඤ්ච තිංස මහග්ගත ලොකුත්තර චිත්තානි චෙති
සත්ත චත්තාලීස තිහෙතුක චිත්තානී ති.

133 ලොභො දෙසො ච මොහො ච හෙතු අකුසලා තයො,
අලොභා දෙසා මොහො ච කුසලා ව්‍යාකතා තථා.

134 අහෙතුකට්ඨාරසෙක හෙතුකා ද්වෙ දුවීසති,
දුහෙතුකා මතා සත්ත චත්තාළිස තිහෙතුකා.

135 කිච්ච සංගහෙ කිච්චානි නාම පටිසන්ධි භවංගාවජ්ජන
දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ
වොත්ථපන ජවන තදලම්බන චුති වසෙන චුද්දස විධානි
භවන්ති.

136 පටිසන්ධි භවංගාවජ්ජන පඤ්චවිඤ්ඤාණට්ඨා නාදි වසෙන
පන තෙසං දසධා ඨානභෙදෙ වෙදිතබ්බො.

137 තත්ථ ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණානි චෙව අට්ඨ මහාවිපාකානි ච නව රූපාරූප විපාකානි චෙති එකූනවීසති චිත්තානි පටිසන්ධි භවංග චුති කිච්චානි නාම.

138 ආවජ්ජන කිච්චානි පන ද්වෙ.

139 තථා දස්සන සවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන කිච්චානි ච.

140 තීණි සන්තීරණ කිච්චානි.

141 මනොද්වාරාවජ්ජන මෙව පඤ්චද්වාරෙ වොඨ්ඨප්පන කිච්චං සාධෙති.

142 ආවජ්ජනද්වය වජ්ජිතානි කුසලාකුසල ඵල ක්‍රියා චිත්තානි පඤ්චපඤ්ඤාස ජවන කිච්චානි.

143 අට්ඨ මහාවිපාකානි චෙව සන්තීරණත්තයං චෙති එකාදස තද ලම්බන කිච්චානි.

144 තෙසු පන ද්වෙ උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තානි පටිසන්ධි භවංග චුති තදරම්මණ සන්තීරණ වසෙන පඤ්ච කිච්චානි නාම.

145 මහාවිපාකානි අට්ඨ පටිසන්ධි භවංග චුති තදරම්මණ වසෙන චතුකිච්චානි.

146 මහග්ගත විපාකානි නව පටිසන්ධි භවංග චුති වසෙන ති කිච්චානි.

147 සොමනස්ස සහගතං සන්තීරණං සන්තීරණ තදරම්මණ වසෙන ද්‍රකිච්චං.

148 තථා වොත්ථපනං ච වොත්තපනා වජ්ජන වසෙන.

149 සෙසානි පන සබ්බානි පි ජවන මනො ධාතුත්තික ද්වි පඤ්ච විඤ්ඤාණානි යථා සම්භව මෙක කිච්චානී ති.

150 පටිසන්ධාදයො නාම කිච්චභෙදෙන චුද්දස, දසධා ඨාන භෙදෙන චිත්තුප්පාද පකාසිතා.

151 අට්ඨසට්ඨී තථා ද්වෙ ච නවට්ඨ ද්වෙ යථාක්කමං,
එක ද්විති චතුපඤ්ච කිච්ච ඨානානි නිද්දිසෙ.

152 ද්වාරසංගහෙ ද්වාරානි නාම චක්ඛුද්වාරං සොතද්වාරං ඝාණ ද්වාරං ජිව්හාද්වාරං කාය ද්වාරං මනොද්වාරං චෙති ඡබ්බි ධානි භවන්ති.

153 තත්ථ චක්ඛුමෙව චක්ඛුද්වාරං.

154 තථා සොතාදයො සොතද්වාරාදීනි.

155 මනොද්වාරං පන භවංගන්ති පවුච්චති.

156 තත්ථ පඤ්චද්වාරාවජ්ජන චක්ඛුවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන කාමාවචර ජවන තදලම්බන වසෙන ඡත්තාළිස චිත්තානි චක්ඛුද්වාරෙ යථරහං උප්පජ්ජන්ති.

157 තථා පඤ්චද්වාරාවජ්ජන සොතවිඤ්ඤාණාදි වසෙන සොත ද්වාරාදිසු පි ඡ චත්තාලීසෙව භවන්තී ති සබ්බථා පි පඤ්ච ද්වාරෙ චතු පඤ්ඤාස චිත්තානි කාමාවචරානෙවා ති වෙදිතබ්බානි.

158 මනොද්වාරෙ පන මනොද්වාරාවජ්ජන පඤ්ච පඤ්ඤාස ජවන තදලම්බන වසෙන සත්ත සට්ඨී චිත්තානි භවන්ති.

159 එකූනවීසති පටිසන්ධිභවංග චුති වසෙන ද්වාර විමුත්තානි.

160 තෙසු පන ද්විපඤ්චවිඤ්ඤාණානි චෙව මහග්ගත ලොකුත්ත ර ජවනානි චෙති ඡත්තිංස යථාරහමෙක ද්වාරික චිත්තානි නාම.

161 මනොධාතුත්තිකං පන පඤ්චද්වාරිකං

162 සුඛසන්තීරණ වොත්ථපන කාමාවචර ජවනානි ඡද්වාරික චිත්තානි.

163 උපෙක්ඛාසහගත සන්තීරණ මහාවිපාකානි ඡද්වාරිකානි චෙව ද්වාරවිමුත්තානි ච.

164 මහග්ගත විපාකානි ද්වාරවිමුත්තා නෙවාති,

165 එකද්වාරික චිත්තානි පඤ්චඡද්වාරිකානිච, ඡද්වාරික විමුත්තානි විමුත්තානි ච සබ්බථා.

166 ඡත්තිංසති තථාතීණි එකතිංස යථාක්කමං,
දසධා නවධා චෙති පඤ්චධා පරිදිපයෙ.

167 ආරම්මන සංගහෙ ආරම්මනානි නාම රූපා රම්මණං සද්දරම්මණං ගන්ධාරම්මණං රසාරම්මණං ඵොට්ඨබ්බා රම්මණං ධම්මාරම්මණං චෙති ඡබ්බිධානි භවන්ති.

168 තත්ථ රූපමෙව රූපාරම්මණං.

169 තථා සද්දදයො සදරම්මණාදීනි.

170 ධම්මාරම්මණං පන පසාද සුඛුමරූප චිත්ත චෙතසික නිබ්බාන පඤ්ඤත්තිවසෙන ඡධා සංගයිහන්ති.

171 තත්ථ චක්ඛුද්වාරික චිත්තානං සබ්බෙසම්පි රූප මෙව ආරම්මණං තඤ්ච පච්චුප්පන්න මෙව.

172 තථා සොතද්වාරික චිත්තාදිනම්පි සද්දදයා දීනි තානිච පච්චුප්පන්නා යෙව.

173 මනොද්වාරික චිත්තානං පන ඡබ්බිධම්පි පච්චුප්පන්න මතීතං අනාගතං කාල විමුත්තං ච යථාරහ මාලම්බනං හොති.

174 ද්වාරවිමුත්තානඤ්ච පටිසන්ධි භවංග චුති සංඛාතානං ඡබ්බිධම්පි යථාසම්භවං යෙභුයොයන භවන්තරෙ ඡද්වාර ගහිතං පච්චුප්පන්න මතීතං පඤ්ඤත්තිභූතං වා කම්ම කම්ම නිමිත්ත ගතිනිමිත්ත සම්මතං ආරම්මනං හොති.

175 තෙසු චක්ඛුවිඤ්ඤාණාදීනි යථාක්කමං රූපාදී එකෙකාරම්මනා නෙව.

176 මනොධාතුත්තිකං පන රූපාදි පඤ්චා ලම්බනං.

177 සෙසානි කාමාවචර විපාකානි හසන චිත්තං චෙති සබ්බාථාපි කාමාවචරා රම්මනා නෙව.

178 අකුසලානි චෙව ඤාණවිප්පයුත්ත ජවනානි චෙති ලොකුත්තරවජ්ජිත සබ්බාලම්බනානි.

179 ඤාණසම්පයුත්ත කාමාවචර කුසලානි චෙව පඤ්චමජ්ඣාන සංඛාතං අභිඤ්ඤාකුසලං චෙති අරහත්ත මග්ග ඵල වජ්ජිත සබ්බා ලම්බනානි.

180 ඤාණසම්පයුත්ත කාමාවචරක්‍රියානි චෙව ක්‍රියා භිඤ්ඤා වොත්ථපනං චෙති සබ්බථාපි සබ්බා ලම්බනානි.

181 ආරුප්පෙසු දුතිය චතුත්ථානි මහග්ගතා ලම්බනානි.

182 සෙසානි මහග්ගත චිත්තානි පන සබ්බානිපි පඤ්ඤත්තා ලම්බනානි.

183 ලොකුත්තර චිත්තානි නිබ්බානාලම්බනා නීති.

184 පඤ්චවිසපරිත්තම්හි - ඡ චිත්තානි මහග්ගතෙ,
එකවීසති වොහාරෙ - අට්ඨනිබ්බාන ගොචරෙ.

185 වීසානුත්තර මුත්තම්හි අග්ගමග්ග ඵලුජ්ඣිතෙ,
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති සත්තධා තත්ථ සංගහො.

186 වත්ථු සංගහෙ වත්ථුනි නාම චක්ඛු සොත ඝාණ ජිව්හා කාය හදය වත්ථු චෙති ඡබ්බිධානි භවන්ති.

187 තානි කාමලොකෙ සබ්බානිපි ලබ්භන්ති.

188 රූපලොකෙ පන ඝාණාදිත්තයං නත්ථි.

189 අරූපලොකෙ පන සබ්බානිපි න සංවිජ්ජන්ති.

190 තත්ථ පඤ්චවිඤ්ඤාණධාතුයො යථාක්කමං එකන්තේන පඤ්චප්පසාද වත්ථූනි නිස්සා යෙව පවත්තන්ති.

191 පඤ්චද්වාරාවජ්ජන සම්පටිච්ඡන සංඛාතා පන මනොධාතුච හදයං නිස්සිතා යෙව පවත්තන්ති.

192 තථා අවසෙසා පන මනොවිඤ්ඤාණ ධාතු සංඛාතා ච සන්තීරණ මහාවිපාක පටිඝද්වය පඨමමග්ග හසන රූපාව චර වසෙන හදයං නිස්සායෙව පවත්තන්ති.

193 අවසෙසා කුසලාකුසල ක්‍රියානුත්තර වසෙන පුන නිස්සාය වා අනිස්සාය වා.

194 ආරුප්ප විපාකවසෙන හදයං අනිස්සායෙ වා ති.

195 ඡ වත්ථු නිස්සිතා කාමෙ සත්තරූපෙ චතුබ්බිධා,
තිවත්ථු නිස්සිතා රුප්පෙ ධාත්වේකා නිස්සිතා මතා.

196 තෙ චත්තාළිස නිස්සාය ද්වෙ චත්තාළිස ජායරෙ.
නිස්සාය ච අනිස්සා ය පාකාරුප්පා අනිස්සිතා.

තුන්වෙනි පරිච්ඡෙදය අවසන්

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# ප්‍රකීර්ණක සංග්‍රහයෙහි ස්වරූප

## තුන්වන පරිච්ඡෙදය

පරමාර්ථ දේශනා, සම්මුති දේශනා යන කොටස් දෙක අතුරෙන් පරමාර්ථ දේශනාවට ඇතුළත් නොවූ කථා ව්‍යවහාර යෙහි පවත්නා ප්‍රඥප්තීන් සියල්ල සම්මුති සත්‍යය යි. පර මාර්ථ සත්‍යයට අයත් චිත්ත චෛතසික ධර්මයන් ස්වභාව ලක්ෂණ වශයෙන් දක්වීමේදී සිත, අරමුණු ගැනීම් ස්වභාවයෙන් එකක් වශයෙන් ද චෛතසික දෙපනස ධර්ම ස්වභාව දෙපනස ද සමග සියල්ල 53 ක් වේ.

ඒ ධර්ම වේදනා, හේතු, කෘත්‍ය, ද්වාර, ආරම්මණ, වස්තු වශයෙන් සවැදෑරුම් කොට මෙහි විස්තර වන්නේය.

**වේදනා සංග්‍රහය**

පළමුකොට ත්‍රිවිධ වේදනා වශයෙන් ද, ඉන් අනතුරුව ඉන්ද්‍රිය භෙදයෙන් පස් ආකාරයකට ද පෙන්වන්නේය. ඒ වේදනාවන්ගේ භෙදයෙන් සුඛ සහගත කාය විඥානය සුඛ වේදනා වශයෙන් ද, දුක්ඛ සහගත කාය විඥානය දුක්ඛ වේදනා වශයෙන්ද, සෝමනස්ස සහගත ලෝභමූල සිත් හතර ද කාම සෝභන සිත් කුසල, විපාක ක්‍රියා වශයෙන් දෙළහ ද සෝමනස්ස සන්තීරණය ද, හසිතුප්පාද සිතද මහද්ගත ලෝකෝත්තර සිත් හතලිස් හතර ද යන සිත් හැට දෙක (62) සෝමනස්ස වේදනා වශයෙන් ද, පටිඝ සම්පයුත්ත සිත් දෙක දෝමනස්ස වේදනා වශයෙන් ද, ඉතිරි සිත් පනස් පහ උපෙක්ඛා වේදනා වශයෙන් ද දක්වේ.

| | | |
|---|---|---|
| සුඛ වේදනාවෙන් යුක්ත සිත් | 1 යි. | 121 ඉන්ද්‍රිය භෙදයෙන් |
| දුක්ඛ වේදනාවෙන් යුක්ත සිත් | 1 යි. | |
| සෝමනස්ස වේදනාවෙන් යුක්ත සිත් | 62 යි. | |
| දෝමනස්ස වේදනාවෙන් යුක්ත සිත් | 2 යි. | |
| උපෙක්ඛා වේදනාවෙන් යුක්ත සිත් | 55 යි. | |
| සුඛ සහගත සිත් | 63 යි. | 121 අනුභවන භෙදයෙන් |
| දුක්ඛ සහගත සිත් | 3 යි. | |
| උපෙක්ඛා සහගත සිත් | 55 යි. | |

**හේතු සංග්‍රහය**

වේදනා භෙදයට අනතුරුව හේතූන්ගේ වශයෙන් සිත් බෙදා දැක්වීමයි. හේතු ධර්ම 6 කි. ලෝභ, දෝස, මෝහ යන අකුසල හේතු 3 ද; අලෝභ, අදෝස, අමෝහ යන කුසල, අව්‍යාකත හේතු 3 ද වේ. හේතු ධර්මයෝ වනාහි සිත් ඉපදීමේ දී ගසකට මුදුන් මුල තදින් කා වැදී ගස පොළවෙහි ස්ථිරව පිහිටා සිටීමට උපකාර වන්නා සේ සිතට අරමුණෙහි කා වැදීමෙන් තදින් අරමුණ ගැනීමට උපකාර වේ.

එක ම හේතු ධර්මයක් වත් නො යෙදෙන සිත් 18 කි. ප්‍රසාද ආරම්මණ ගැටීමෙන් ඒ සිත් උපදී. ආලෝක, මනසිකාර ආදියෙහි ද උපකාර ලැබේ. සහේතුක සිත් 71 කි. ඒ සියල් ලෙහිම හේතු ධර්ම යෙදීම නොයෙක් ආකාර වේ. හේතු 1 ක් යෙදෙන සිත් ද, හේතු 2 ක් යෙදෙන සිත් ද, හේතු 3 ක් යෙදෙන සිත් ද තිබේ. හේතු ධර්ම දෙවර්ගයකි. අකුසල් සිත් සමග යෙදී අකුසල් කිරීමට උපකාර වන හේතු සහ කුසල් සිත්වල සහ විපාක ක්‍රියා ආදී සෝභන සිත්වල යෙදෙන කුසල, අව්‍යාකෘත හේතු ද වේ. හේතු ධර්ම යෙදෙන සිත් මෙසේ ය :

| | | |
|---|---|---|
| හේතු එකක්වත් නො යෙදෙන අහේතුක සිත් | 18 | 89 |
| හේතු ධර්ම යෙදෙන සිත් | 71 | |

| | | |
|---|---|---|
| අහේතුක සිත් | 18 | 89 |
| මෝහ මූල සිත් 2—ඒක හේතුක සිත් | 2 | |
| ලෝභ මූල සිත් 8, දෝස මූල සිත් 2 ඤාණවිපස්සනා ඤාණසම්පයුත්ත කාම සෝභන සිත් 12—ද්විහේතුක සිත් | 22 | |
| කාම සෝභන 12, මහද්ගත 27, ලෝකෝත්තර 8 —ත්‍රිහේතුක සිත් | 47 | |

**කෘත්‍ය සංග්‍රහය**

චිත්ත චෛතසිකයන්ගෙන් කෙරෙන වැඩ 14 පමණ තිබේ. දැකීම, ඇසීම, ආදී ඒ වැඩ රාශිය සිදු කිරීමේ දී ඊට සුදුසු සිත ඉපද ඒ එක් එක් වැඩක් කරන්නේ ය. කෘත්‍ය සංග්‍රහයේ දී ඒ වැඩ සහ වැඩ කරන සිත් ද වෙන් වශයෙන් පෙන්වන්නේ ය. ඒ කෘතය 14 මෙසේය :

පටිසන්ධි, භවාංග, ආවජ්ජන, දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන, සම්පටිච්ඡන. සන්තීරණ, වොත්ථපන, ජවන තදාලම්බන, චුති, වශයෙන් කෘත්‍ය 14 වේ.

පටිසන්ධි කෘත්‍යය — භව දෙකක් එකට ගලපන ආකාර යෙන් සිදු කරන කෘත්‍යය යි. ඉකුත් භවයේ මරණාසන්න ජවනයෙන් ගන්නා අරමුණ ම ගෙන අලුත් භවයේ පටිසන්ධි සිත හට ගනී. සිත් පරම්පරාවෙහි සිතක් නිරුද්ධ වීමත්, ඊළඟට අලුත් සිතක් ඇතිවීමත් දිගට ම වෙයි. චුතියෙන් පසු ස්ථාන මාරුවීමක් සිදු වේ. පටිසන්ධියෙන් පසු භවාංග, චුති වශ යෙන් ද එම පටිසන්ධි අරමුණ ම ගෙන භවාංග සිත් උපදී.

භවාංග කෘත්‍යය—වන්නේ ද පටිසන්ධි සිතම ය. භවය පැවැත්මට උපකාරවන සිතයි.

ආවජ්ජන කෘත්‍යය නම් චක්ඛුද්වාරාදි ද්වාරයන්හි ගැටෙන අරමුණු ගෙන පළමුව ඉපද චිත්ත වීථිය පිළියෙල කරන සිතය. එම සිත ද්වාර පහට ම ආවජ්ජන කෘත්‍යය කරයි.

දස්සන කෘත්‍යය නම් – චක්ඛුද්වාරයෙහි ගැටෙන රූපාරම්-මණය ගෙන දැකීම් කෘත්‍යය කරන සිතයි. සවණ කෘත්‍යය නම් සෝත ද්වාරයෙහි ගැටෙන ශබ්දරම්මණය ගෙන ඇසීම් කෘත්‍යය කරන සිතයි. ඝායන කෘත්‍යය නම් ඝාන ද්වාරයෙහි ගැටෙන ගන්ධාරම්මණය ගෙන ගඳ සුවඳ දැනගන්නා කෘත්‍යය කරන සිතයි. සායන කෘත්‍යය නම් ජිහ්වා ද්වාරයෙහි ගැටෙන රස ආරම්මණය ගෙන රස දැනගන්නා කෘත්‍යය කරන සිතයි. ඵුසන කෘත්‍යය නම් කාය ද්වාරයෙහි ගැටෙන ඵොට්ඨබ්බා රම්මණය ගෙන ස්පර්ශ කෘත්‍යය කරන සිතයි.

සම්පටිච්ඡන කෘත්‍යය නම් චක්ෂුරාදී ද්වාර පහට හමුවන රූපා දී අරමුණු ගෙන අරමුණු පිළිගැනීම් කෘත්‍යයෙන් උපදනා සිතයි.

සන්තීරණ කෘත්‍යය — සම්පටිච්ඡන සිතින් පිළිගත් රූපාදී අරමුණු පසම විමසන සිතයි. වොත්ථපන කෘත්‍යය නම් සන්තීරණ සිතින් විමසන ලද රූපාදී අරමුණු කෙරෙහි කෙසේ පිළිපැදිය යුතු දැයි නියම කරගන්නා සිතයි.

ජවන කෘත්‍යය නම් අරමුණෙහි ඇලීම්, ගැටීම්, ආදී වශයෙන් එකම සිතක් කීප වාරයක් උපදනා කුසලාකුසලාදී කර්මාදිය සිදු කරන සිත් පේළියයි. වැඩි වශයෙන් ජවන් සිත් 7 ක් උපදනේය.

එක් එක් කෘත්‍යය සිදු කරන සිත්

| | | | | |
|---|---|---|---|---|
| පටිසන්ධි | කෘත්‍යය | සිදුකරන | සිත් | 19 |
| භවාංග | ,, | ,, | ,, | 19 |
| ආවජ්ජන | ,, | ,, | ,, | 2 |
| දස්සන | ,, | ,, | ,, | 2 |
| සවණ | ,, | ,, | ,, | 2 |
| ඝායන | ,, | ,, | ,, | 2 |
| සායන | ,, | ,, | ,, | 2 |
| ඵුසන | ,, | ,, | ,, | 2 |
| සම්පටිච්ඡන | ,, | ,, | ,, | 2 |
| සන්තීරණ | ,, | ,, | ,, | 3 |
| වොත්ථපන | ,, | ,, | ,, | 1 |
| ජවන | ,, | ,, | ,, | 55 |
| තදලම්බන | ,, | ,, | ,, | 11 |
| චුති | ,, | ,, | ,, | 19 |

පටිසන්ධි කෘත්‍යය කරන සිත් 19 අතුරෙන් උපේක්ඛා සන්තීරණ සිත් දෙක අහේතුක පටිසන්ධි ලබා දෙන්නේ ය. අකුසල විපාක සිතින් සතර අපායෙහිම පටිසන්ධි ලබා දෙන්නේ ය. අනික් සිත කුසල විපාක අහේතුක උපෙක්ඛා සන්තීරණ සිතයි. එය කාම සුගතියෙහි ජාති අන්ධ, ජාති බධිර, ජාති ඒල, උම්මත්තක, නපුංසක, උභතොබ්‍යඤ්ජනක ආදි අවාසනාවන්ත පටිසන්ධි ලබා දෙන්නේ ය. මේ සිත් දෙක අහේතුක පටිසන්ධි යුගල නම් වේ. පටිසන්ධි ලබාදුන් සිත ඒ භවයේ සිටින තාක් කල් භවාංග කෘත්‍යය ද කරයි. චුති කෘත්‍යය ද කර ඉන් භවය අවසන් වෙයි.

කාමාවචර මහා විපාක සිත් 8 කාම සුගති භූමි 7 හි පටිසන්ධි භවාංග, චුති කෘත්‍යයන් ද, තදරම්මණ කෘත්‍යය ද කරයි. අනන්ත කාලයක් ප්‍රවෘත්ති විපාක ද උපදවන්නේ ය.

කාමාවචර කුසල් සිත් අටට විපාක සිත් දහසයක් (16) ලැබේ. පටිසන්ධි 9 ක් ලැබේ. උපේක්ඛා සහගත සන්තීරණ

සිත් දෙක පටිසන්ධි, භවාංග, චුති, තදරම්මණ, සන්තීරණ යන කෘත්‍යය පහක් (5) සිදු කරයි.

මහා විපාක සිත් අට පටිසන්ධි, භවාංග, චුති, තදරම්මණ යන කෘත්‍යය 4 ක් සිදුකරයි. එම සිත් අට ඥානසම්ප්‍රයුක්ත පටිසන්ධි 4 ක් සහ ඥාන විප්‍රයුක්ත පටිසන්ධි 4 ක් සිදු කරයි. භවාංග, චුති කෘත්‍යයන් ද තදරම්මණ කෘත්‍යය ද කරයි. චුති කෘත්‍යයෙන් ඒ භවයෙහි අවසන් සිත වශයෙන් උපදියි. නැවත ඒ සිතෙන් පටිසන්ධියක් නූපදවයි. චුති සිතට පළමුව ඇති වූ මරණාසන්න ජවනයට අනුව ඊළඟ පටිසන්ධිය ලැබෙන්නේය. ධ්‍යාන නොලබන ලද කෙනෙකු නම් කාම සුගතියක හෝ දුගතියක ජවනයෙන් ගත් අරමුණට අනුව ම පටිසන්ධිය ලැබේ. චුති සිතට අනුව පටිසන්ධි ලැබීමක් නො වන්නේ ය. චුති සිතෙන් ඒ භවයේ සිත් ඇතිවීම අවසන් කරයි. එයයි චුති කෘත්‍යය.

මරණාසන්න චිත්ත වීථි සතර ආකාරයකට ඇති වේ. වීථි කාණ්ඩය බලා දත යුතුය. ද්වාර සයෙහිම ඇති වන්නේ ය. වීථි කාණ්ඩයෙහි එය විස්තර වේ. මෙසේ මහා විපාක සිත් අටෙන් පටිසන්ධි අටක් කාම සුගති භූමි හතෙහි ලැබේ.

මහද්ගත විපාක සිත් 9 අතරෙන් රූපාවචර විපාක සිත් 5 න් රූපාවචර පටිසන්ධි 5 ක් ලැබේ. අසංඥතලය හැර සුද්ධාවාස 5 සමග රූපී බ්‍රහ්ම ලෝක පහළොවෙහි පටිසන්ධි භවාංග, චුති කෘත්‍යයන් කරයි. ධ්‍යාන කුසලය චුතිය දක්වා නො පිරිහී පැවතුනෝ නම් පටිසන්ධි ආදිය ලැබේ. පිරිහී ගියේ නම් අහෝසි කර්ම වේ. විපාක නොලැබේ. අරූපාවචර විපාක සිත් 4 අරූප ලෝක 4 හි පටිසන්ධි, භවාංග, චුති කෘත්‍ය සිදු කරයි. මෙසේ පටිසන්ධි සිත් 19, අසංඥතලය හැර ඉතිරි තල 30 ක පටිසන්ධි, භවාංග, චුති කෘත්‍ය කරයි.

ආවජ්ජන කෘත්‍යය — ආවජ්ජන සිත් 2 පංචද්වාරයෙහි හා මනෝද්වාරයෙහි ආවජ්ජන කෘත්‍යය කරයි. පංචද්වාරාවජ්ජන සිත චක්ඛුද්වාරාදී ද්වාර පහට ම ගැටෙන අරමුණ ගෙන භවාංග සිත් පරප්‍රර නැවතීමෙන් පසු චිත්ත වීථිය ඇතිවීමට සලස්වා දෙන

සිතයි. ද්වාර පහට ම ආවජ්ජන කෘත්‍යය කරන සිතයි. මේ සිතට වීථි පටි පාදක මනසිකාරය යයි ද ව්‍යවහාර වේ. අනික් සිත මනෝද්වාරාවජ්ජන සිතයි. මෙම සිත පංචද්වාරයෙහි දී වොත්ථපන නමින් ඇති වී ජවනය පිළියෙල කරයි. මනෝද්වාරික වීථීන්හි ආවජ්ජන් කෘත්‍යය කරයි. මනෝද්වාරාවජ්ජන සිතට අනතුරුව උපදනා සිත් ජවන් සිත් නමින් ම හැඳින් වේ. මෙම සිතට ජවන පටිපාදක මනසිකාරය යයි ද කියනු ලැබේ. නිරෝධ සමාපත්ති වීථියෙහි උපදනා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිතට පළමුව ආවජ්ජන සිත් නූපදී.

දස්සන කෘත්‍යය නම් දැකීම් කෘත්‍යය යි. එම කෘත්‍යය කෙරෙන සිත් දෙකකි. අහේතුක කුසල විපාක, අකුසල විපාක වශයෙනි. පෙර භවයන්හි දැකීම් වශයෙන් ද අන්‍යයන්ට දැකීමට සැලැස්වීම් ස්වභාවයෙන් ද කරන ලද කුසල අකුසල කර්මයන්ගේ විපාක වශයෙන් ලැබෙන සිත් දෙකයි. භය උපදවන හෝ අප්‍රිය අමනාප හෝ දැකීම් අකුසල විපාකයෙන් ද, බුද්ධාදී උතුමන් දැකීම, ප්‍රිය ඥාති මිත්‍රාදීන් දැකීම ආදිය කුසල විපාකයෙන් ද සිදු වේ. බුද්ධාදි උතුමන් දැකීම දස්සන අනුත්තරිය ද වේ. කුසල්, අකුසල් දෙකට ම ඇස බොහෝ උපකාර වේ. ආනන්තරිය ආදී අකුසල් කිරීමට ද ඇස උපකාරී වේ.

සවණ කෘත්‍යය කෙරෙන සිත් ද කුසල විපාක, අකුසල විපාක වශයෙන් දෙවැදෑරුම් වේ. පෙර කරන ලද යහපත් ඇසීම් හා අනුන්ට ඇසෙන්ට බණ දහම් ආදිය කීම හා යහපත් ශිල්ප ශාස්ත්‍ර කියාදීම් ආදිය නිසා වර්තමාන භවයේ දී හොඳ ප්‍රිය මනාප දේ ඇසීම ද බැණුම් ආදී අකුසල ශබ්ද නිසා නරක, අප්‍රිය, අමනාප දේ ඇසීම ද සිදුවේ. යහපත් ඇසීම් සවණ අනුත්තරියයි සොත ප්‍රසාදය නිරුපද්‍රතව තිබීම ද, ශබ්දරම්මණය ද, වායෝ ධාතුවද, මනසිකාරය ද ඇසෙන තෙක් මානයේ සිටීම ද යන කරුණු ඇසීම සඳහා තිබිය යුතුයි. මනසිකාරයෙන් මෙනෙහි නොකෙළේ නම් ඇතැම්විට ළඟ ඇති වූ ශබ්දය පවා නො ඇසී යයි. නිදා සිටින විට ද මෙසේ සිදුවේ. සියලු ඉන්ද්‍රියයන්ට ම මනසිකාරය ඉතාමත් උපකාරී වේ.

ඝායන කෘත්‍යය — ගඳ සුවඳ දැනීම ද කුසල, අකුසල විපාක සිත් දෙකින් සිදු වේ. පෙර භවයන්හි සුවඳ ද්‍රව්‍ය පූජාව ආදීන්ගෙන් ලැබෙන විපාක සිත කුසල විපාක ඝාන විඥාන සිතයි. පෙර කරන ලද නපුරු ගන්ධාරම්මණයන් අන්‍යයන්ට ලැබෙන්නට සැලැස්වීම් ආදී වැරදි ක්‍රියා විෂ බෙහෙත් වර්ග ආඝ්‍රාණය කරවීම් ආදියෙන් කෙරෙන සත්ව ඝාතන ආදිය අකුසල විපාක ඝාන විඥානය ලැබීමට හේතු වේ. මෙම සිත් කාම, දුගති, සුගතීන්හි ලැබේ. බ්‍රහ්ම ලෝකවල නැත. ඝාන විඥාන සිත ලැබීමට නිරුපද්‍රැත ඝාන ප්‍රසාදයද, ගන්ධාරම්මණය ද, වායෝ ධාතුව ද, මනසිකාරය ද තිබිය යුතුය. ගන්ධාරම්මණය ඝාන ප්‍රසාද රූප යෙහි ගැටීමෙන් ඝාන විඥාන සිත උපදී. එසේ නාස් කුහරය තුළ නො ගැටුණහොත් එය නූපදී. එම ගැටීම ප්‍රසාද ආරම්මණ යන්ගේ ගැටීමකි. එය සම්පත්ත ගාහී වශයෙන් වන්නේ යයි කියනු ලැබේ. චක්ඛු, සෝත දෙකෙහි සිත් ඉපදීම ප්‍රසාද, ආරම්මණ නො ගැටී සිදු වේ. එයට අසම්පත්තගාහී යයි කියනු ලැබේ.

සායන කෘත්‍යය — රස දැන ගැනීම ද දෙයාකාර වේ. කුසල විපාක වශයෙන් මිහිරි, ප්‍රණීත, ආහාර පාන ආදී රසයන් ලැබීමද, අකුසල විපාක වශයෙන් තිත්ත, කටුක ගොරෝසු, අම්හිරි, ආහාර පාන ලැබීම ද සිදු වේ. ජිව්හා විඥාන සිත ඉපදීමට නිරුපද්‍රැත ජිව්හා ප්‍රසාදයද, රසාරම්මණය ද, ආපෝ ධාතුව ද, මනසිකාරය ද, යන කරුණු තිබිය යුතුය. පෙර භවයන්හි ප්‍රණීත ආහාර පාන වර්ග මනා ලෙස සකස් කර සිල්වතුන් උදෙසා පූජා කිරීම ද, යාචකාදීන්ට තිරිසනුන්ට පවා හොඳ ආහාර පානාදියෙන් සංග්‍රහ කිරීම ද මෙම විපාක සිත ලැබීමට හේතු වේ. ඇතැම් අය අනුන් දෙන දෙය පවා වලක්වති. මේවායේ විපාක විඳින විට කර්මයන්ගේ ස්වභාව දැකගත හැකි වේ.

ඵුසන කෘත්‍යය — ස්පර්ශ කිරීම් කෘත්‍යයයි. එය ද දෙයාකාර වේ. කුසල විපාක අකුසල විපාක වශයෙනි. සුව පහස් දෙන අරමුණක් කයෙහි ගැටීමෙන් කුසල විපාක සුඛ සහගත කාය විඥානය ද, රළු පරුෂ යමක් හැපීමෙන් හෝ කයෙහි ම වේදනා ඇතිවීමෙන් හෝ අකුසල විපාක දුක්ඛ සහගත කාය විඥානය ඇතිවේ. මහාභූත රූප, මහාභූත රූප සමග ගැටීම හේතු කොට

ගෙන කාය විඥාන උපදී. ඵොට්ඨබ්බාරම්මණය වන්නේ ආපෝ ධාතුව හැර ඉතිරි මහා භූතරූප තුනයි. ආපෝ ස්වභාවය කයට හැපීමෙන් දැනගත නොහේ. එය මනෝද්වාරික සිත් වලින් දත යුතු වේ. උණු, සිසිල් දෙක තෙජෝ ධාතුව යි. පැතිරීම්, වැගිරීම්, එකට බැන්දවීම් ආදි ස්වභාවය ආපෝ ධාතුවයි.

දෙපස් විඥාන අතුරෙන් කාය විඥාන දෙක සුඛ, දුක්ඛ, වශයෙන් ද, චක්ඛු විඥානාදී අට උපෙක්ඛා වේදනා වශයෙන් ද ඇති වේ. දෙපස් විඥාන (10) චක්ඛු ද්වාරාදී පසෙහි ඇති වේ. ඉතිරි සිත් මනෝද්වාරයෙහි ඇති වේ. මනෝද්වාරය නම් භවාංග සිතයි. අරමුණු සියල්ලම පළමුව ගැටීම වන්නේ මනෝද්වාරය වන භවාංග සිත සමගය.

සම්පටිච්ඡන කෘත්‍යය — අකුසල විපාක සහ කුසල විපාක වශයෙන් සම්පටිච්ඡන දෙසිත පංචද්වාරයෙන් ගන්නා අරමුණු පහම පිළිගැනීම් කෘත්‍යයෙන් දෙපස් විඥානයන්ට අනතුරුව ඉපදේ.

සන්තීරණ කෘත්‍යය — අකුසල විපාක සන්තීරණ සිත සහ කුසල විපාක සන්තීරණ දෙසිත, සම්පටිච්ඡන සිතින් ගත් අරමුණ කුමක් ද කියා තීරණය කරයි. විමසා බලයි. මින් උපෙක්ඛා දෙසිත අහේතුක පටිසන්ධි යුගල නම් වේ. කුසල විපාක සොම්නස් සන්තීරණ සිත අති ඉෂ්ටාරම්මණයෙහි ඇති වේ. උපෙක්ඛා සන්තීරණ දෙසිත කෘත්‍ය 5 ක් සිදු කරයි. සොම්නස් සන්තීරණ සිත කෘත්‍ය දෙකක් සිදු කරයි.

වොත්ථපන කෘත්‍යය — වොත්ථපන නමින් පංචද්වාරයෙහි දී ඇතිවන්නේ මනෝද්වාරාවජ්ජන සිතයි. මනෝද්වාරාවජ්ජනය සෑම වීථියක ම ජවනය පිළියෙල කිරීම් වශයෙන් උපදී. අහේතුක ක්‍රියා සිත් තුනෙන් එකකි. මෙම මනෝද්වාරාවජ්ජන සිත පංචද්වාරයෙහි වොත්ථපන නමින් ද, සියලුම මනෝද්වාරික වීථීන්හි මනෝද්වාරාවජ්ජන නමින් ද උපදී.

තදරම්මණ කෘත්‍යය — කාම ජවන වීථීන්හි ජවනයට පසුව ජවනයෙන් ගත් අරමුණ ගනිමින් උපදනා සිත් 11 ක් තිබේ. මෙම තදරම්මණ කෘත්‍යය කරන්නේ කාමාවචර මහා විපාක සිත් 8 සහ සන්තීරණ සිත් 3 වේ.

චුති කෘත්‍යය — පටිසන්ධි කෘත්‍යය කරන සිත් 19 ම චුති කෘත්‍යය ද කරයි. අසංඥ තලයෙහි උපන් සත්වයින්ගේ චුතිය රූපයයි. එහි සිත් නූපදනා බැවින් චුති වශයෙන් ඇති වන්නේ ද රූපය නිරුද්ධ වීම පමණකි. චුති සිතින් නැවත පටිසන්ධියක් නොගනී. පටිසන්ධි ගත් භවය අවසන් කරයි. චුති සිත වන්නේ එම භවයේ ම පටිසන්ධි සිතයි. චුති සිත උපදනා මරණාසන්න චිත්ත වීථියේ හටගත් ජවනයන්ගෙන් ගන්නා අරමුණට සුදුසු වන සේ එම කුසලා කුසලයන්ට අනුව ඊළඟ පටිසන්ධිය වේ.

චුති සිත ඉපිද ඒ ලබා තිබූ භවයෙන් චුත වූ සත්වයා නැවතත් එම චුති සිතටම අනුව පටිසන්ධි ගන්නේ නම් සිදුවිය යුත්තේ ඒ භවයේ ම නැවතත් ඉපදීමය. ඒ භවයෙන් වෙන භවයකට කිසිලෙසකින් වත් මාරුවීමක් නොවේ. සදකාලිකවම එහි චුති පටිසන්ධි ගනිමින්—ඉපදෙමින් මැරෙමින් සිටියි. නිවන් දැකීමක් ද සිදු නොවේ. චුති සිතට අනුව පටිසන්ධි ගැනීම නො වන්නේම ය. එය ධර්ම නියාමයට පිටුපා කරන කථාවකි. අපායේ නම් නැවතත් අපායේ ම පටිසන්ධිය ගනී. නිදහසක් නොවේ. පිළිගත හැකිද? ධර්ම නියාමය නොවේ.

### කෘත්‍ය සංග්‍රහයෙහි ස්ථාන භේදය

ස්ථාන දහයක් (10) සහ ඒ ස්ථාන දහයෙහි කෙරෙන කෘත්‍ය (වැඩ) විසිපහක් මෙහි පෙන්වන්නේය. දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන, කෘත්‍ය එක් ස්ථානයක් වශයෙන් ගැනීමෙන් ස්ථාන දහය ලැබේ. පටිසන්ධි කෘත්‍යය කරන ස්ථාන එකක් වශයෙන් ගෙන චුති—භවාංග දෙක අතර පටිසන්ධි ස්ථාන 1 යි., පටිසන්ධි 3 ක් වේ. ඒ තුනම ඇතිවන්නේ චුති සිතටත් ඊළඟ භවයේ පටිසන්ධි සිතට පසුව ස්වභාවයෙන්ම චිත්ත නියාම වශයෙන්ම ඇතිවන භවාංග සිතටත් අතරය. ඒ නිසා පටිසන්ධි ස්ථාන එකක් ලෙස ගනී. භවාංග ස්ථාන 6 යි. ආවජ්ජන ස්ථාන 2 යි. දෙපස් විඥාන ස්ථාන 1 යි. සම්පටිච්ඡන ස්ථාන 1 යි. සන්තීරණ ස්ථාන 1 යි. වොත්ථපන ස්ථාන 2 යි. ජවන ස්ථාන 6 යි. තදාලම්බන ස්ථාන 2 යි. චුති ස්ථාන 3 යි. මෙසේ විශේෂ වශයෙන් ස්ථාන විසි පහකි.

පටිසන්ධි සිත් දහ නවයේ ම පටිසන්ධි ස්ථානය ලැබේ චුති සිතටත් ඊළඟ භවයේ භවාංග සිතටත් අතර ය. භවාංග ඒ ස්ථාන 10 මෙසේ පෙන්නුම් කරයි:

කෘත්‍ය සංග්‍රහයෙහි ඨාන භෙදය

පටිසන්ධි ස්ථාන 1 :

චුති භවාංග අතර

භවාංග ස්ථාන 6 :

පටිසන්ධි — ආවජ්ජන අතර
තදලම්බන — ආවජ්ජන අතර
ජවන — ආවජ්ජන අතර
වොත්ථපන — ආවජ්ජන අතර
තදලම්බන — චුති අතර
ජවන — චුති අතර

ආවජ්ජන ස්ථාන 2 :

භවාංග — පංච විඥාන අතර
භවාංග — ජවන අතර

දෙපස් විඥාන ස්ථාන 1 :

ආවජ්ජන — සම්පටිච්ඡන අතර

සම්පටිච්ඡන ස්ථාන 1 :

දෙපස් විඥාන — සන්තීරණ අතර

සන්තීරණ ස්ථාන 1 :

සම්පටිච්ඡන — වොත්ථපන අතර

වොත්ථපන ස්ථාන 2 :

සන්තීරණ — ජවන අතර
සන්තීරණ — භවාංග අතර

ජවන ස්ථාන 6 :

වොත්ථපන — තදලම්බන අතර
වොත්ථපන — භවාංග අතර
වොත්ථපන — චුති අතර
ආවජ්ජන — තදලම්බන අතර
ආවජ්ජන — භවාංග අතර
ආවජ්ජන — චුති අතර

තදාලම්බන ස්ථාන 2 :

ජවන — භවාංග අතර
ජවන — චුති අතර

චුති ස්ථාන 3 :

තදාලම්බන — පටිසන්ධි අතර
ජවන — පටිසන්ධි අතර
භවාංග — පටිසන්ධි අතර

මෙසේ සිත්වලින් කරන වැඩ හෙවත් කෘත්‍යයන් ද ඒ එක් එක් කෘත්‍යය කරන ස්ථාන — චිත්ත වීථිවල ඇතිවන ස්ථාන ද පෙන්වන්නේ ය.

| | | |
|---|---|---|
| පටිසන්ධි කෘත්‍යය කරන ස්ථාන | | 1 |
| භවාංග කෘත්‍යය කරන ස්ථාන | | 6 |
| ආවජ්ජන කෘත්‍යය කරන ස්ථාන | | 2 |
| දෙපස් විඥාන | ,, | 1 |
| සම්පටිච්ඡන | ,, | 1 |
| සන්තීරණ | ,, | 1 |
| වොත්ථපන | ,, | 2 |
| ජවන් (55) | ,, | 6 |
| තදාලම්බන | ,, | 2 |
| චුති කෘත්‍යය කරන | ,, | 3 |

කෘත්‍ය සංග්‍රහයෙහි ඨාන භෙදය මෙසේ පෙන්වන්නේ ය. මෙකී ස්ථාන හා උපදනා සිත් ද පැහැදිලි ලෙස දැන ගැනීම සඳහා චිත්ත වීථි පිළිබඳ පැහැදිලි දැනුමක් ලැබිය යුතුය. සිත් උපදනේ පේළි පේළි වශයෙනි. නොයෙක් ආකාර සිත් පේළි ඇත්තේය. ඒ සිත් පේළි වල මෙනම් සිත් දෙක අතර මේ සිත් ඇතිවී මෙවැනි වැඩක් කරන්නේ යයි මින් පෙන්වන්නේ ය. අභිධර්මයෙහි ඉතාමත් ගෞරවයෙන් මේ කරුණු ඉගෙන ගත යුතු වේ. එක් එක් පුද්ගලයින්ට සිත් ඇතිවන ආකාරය චිත්ත වීථීන්හි පෙන්වන්නේය. නියාම ධර්ම පහෙන් එකක් වන චිත්ත නියාමය සම්මා සම්බුදුරජාණන් වහන්සේලා තමන් වහන්සේලාගේ සුවිසද නුවණින් අවබෝධ කොට ලෝක සත්වයාගේ මුලාව දුරුකර ගැනීම පිණිස මහත් වූ කරුණාවෙන් සත්ව ප්‍රඥප්තිය පහද වදාළ සේක.

කෘත්‍ය සංග්‍රහයෙහි ඨාන භෙදය අවසන්

# ද්වාර සංග්‍රහය

චක්ඛුද්වාරාදී ද්වාර පසද මනෝද්වාරයද යන ද්වාර සියල්ල 6 ක් වේ. චක්ඛුද්වාරය නම් පංචවෝකාර භවයෙහි නිරුපද්‍රැත චක්ඛු ගෝලය ඇසුරු කොට පැවති පෙර භවයන්හි කරන ලද කුසලාකුසල කර්මයන්ට අනුව ලබන ලද කර්මජ මහාභූත රූපයන් නිසා පවත්නා මහාභූත රූපයන්ගේ ඔපගතිය වන චක්ඛු ප්‍රසාදයයි. එම ප්‍රසාද රූපය ඉදිරියට පැමිණි වර්තමාන රූපාරම්මණය—සෙවනැල්ල වැනිව—එම ප්‍රසාද රූපය තුළ වැද ගැනීමෙන් සුදුසු පරිදි චක්ඛු විඥානය උපදී.

ප්‍රසාද, ආරම්මණ දෙක ගැටීම සිදුවන්නේ සිත් පරම්පරාව භවාංග වී, භවාංග සිත උපදිමින් පවත්නා කල්හි ය. එම භවාංග නම්වූ මනෝද්වාරයෙහි ද රූපාරම්මණය ගැටීම වන්නේ ය. එසේ රූපාරම්මණය ගැටීම් හේතුවෙන් භවංග සිත නැවතීමට පළමුව, වස්තු රූපය ඇසුරු කොට පවත්නා භවංග සිත් එකක් දෙකක් ඉපද භවංග සිත නවතී. ඊට පසු වස්තු රූපය ඇසුරු කොට පංචද්වාරාවජ්ජන සිත ඉපද නිරුද්ධ වී චක්ඛු විඥානය උපදින්නේය. එය රූපාරම්මණය දකින සිතයි. මෙසේ චක්ඛු ද්වාරය ඇසුරු කොට සිත් පේලියක්—චිත්ත වීථියක් හටගනී. මම දුක්කා' යනුවෙන් භාවිත වන්නේ මේ ක්‍රියා රාශියයි.

චක්ඛු ප්‍රසාදය මෙන් ම සෝත ප්‍රසාදදිය ද පෙර කරන ලද කුසලා කුසල කර්මයන් නිසා හටගත් මහාභූත රූපයන්ගේ ඔප ගතියයි. ඒ ඒ සිත් ඉපදීමට සුදුසු පරිදි ඒ ඒ ප්‍රසාද පිහිටන් නේ ය. විස්තර රූප ඉගෙනීමෙහි දී පැහැදිලි වන්නේ ය.

සෝත ද්වාරය — සෝත නම් ශබ්ද ඇසීමට සුදුසු පරිදි පෙර භවයන්හි කරන ලද කුසලාකුසල කර්ම හේතුවෙන් කන් බිලය තුළ පවත්නා ප්‍රසාද සෝතය යි. එය ඇසීමේ හෝ අනුන්ට ඇසෙන්ට සැලැස්වීමේ මාර්ගයෙන් කරන ලද කුසලාකුසල කර්ම නිසා ලබන ලද කර්මජ මහාභූත රූපයන්ගේ ඔප ගතියයි.

එය උපාද රූපයකි. එයට ශබ්ද සෙවනැලි වැද ගැනීමෙන් හා ඒ වෙත සිත් යොමු කරන මනසිකාරාදීන්ගේ උපකාර ලැබ කුසලාකුසල විපාක සෝත විඥාන දෙකෙන් එකක් සුදුසු පරිදි උපදී. 'මම ඇසුවා' යන්නෙන් කියැවෙන්නේ මෙයයි. චක්ඛු ද්වාරික සිත් පේළිය මෙන් සෝත ද්වාරික සිත් පේළියද උපදී. නාස් කුහරය තුළ පිහිටි ගඳ සුවඳ අරමුණු වැද ගැනීමට සුදුසු පරිදි පෙර කරන ලද කුසලා කුසල කර්මයන් නිසා හටගත් කර්මජ මහාභූත රූපයන්ගේ ඔප ගතිය ඝාන ප්‍රසාද රූපයයි. එයට ගන්ධාරම්මණය ගැටීමෙන් මනසිකාරාදීන්ගේ උපකාරයෙන් ඝාන විඥානය අරමුණ ගන්නා ආකාරයට සුදුසු පරිදි උපදී. ඇතැම් අරමුණු ස්වභාවයෙන් අනිටු වූවත් සමහර සත්වයින්ට ඉෂ්ට අරමුණු වන්නේ ය. සුනඛ, සූකර, කපුටු, මැසි ආදී සතුන්ට මෙනි. මෙහි ද චක්ඛුද්වාරාදීන්ගේ මෙන් සිත් පේළිය උපදී.

ජිව්හා ප්‍රසාදයම් ජිව්හා ද්වාර නම්. ප්‍රසාද කයම් කායද්වාර නම්. භවංග සිත මනෝද්වාර නම්. ගෙවල්වලට ඇතුල් වන පිටවන දෙරටු වැනිව චිත්ත චෛතසිකයන්ට දෙරටු වැනි වූ හෙයින් මේවා ද්වාර නාමය ලබයි.

එක් එක් ද්වාරයේ උපදින සිත් 46 කි. එසේ ද්වාර පහේම සිත් 46 බැගින් ඇති වේ. මෙසේ ඇතිවන සිත් සියල්ල කාමාව චර සිත් 54 ම වේ. දෙපස් විඥාන දහය එක් ද්වාරයක දෙක බැගින් ද්වාර පහේම ඇති වේ. අනික් සිත් 44 ද්වාර පහට ම සාධාරණ වේ.

මනෝද්වාරයෙහි මනෝද්වාරාවජ්ජන සිත සහ ජවන් සිත් 55 ද තදලම්බන 11 ද ලැබේ.

පටිසන්ධි ආදී කෘත්‍ය සිදු කරන සිත් 19 කි. කාමාවචර විපාක සිත් 8 සහ සන්තීරණ සිත් 2 වරෙක ද්වාරයෙහි ද වරෙක ද්වාර විමුක්ත ද වේ. ද්වාරයේ උපදින්නේ තදාරම්මණ සන් තීරණ කෘත්‍ය වශයෙනි.

ද්වාර සයෙහි ම උපදනා සිත් 31 කි. එනම් සොම්නස් සන්තීරණ සිත, වොත්ථපන සිත සහ කාම ජවන් 29 ද වේ.

ඒකාන්ත ද්වාර විමුක්ත වන්නේ මහද්ගත විපාක 9 යි. වරෙක ද්වාරවද, වරෙක ද්වාර විමුක්තව ද උපදනා සිත් උපෙක්ඛා සන්තීරණ සිත් 2 සහ සහේතුක කාම විපාක 8 ද වේ.

ද්වාර සංග්‍රහය අවසන්

# ආරම්මණ සංග්‍රහය

රූප, ශබ්ද, ගන්ධ, රස ඵොට්ඨබ්බ, ධම්ම යනුවෙන් අරමුණු හයකි. ධම්මාරම්මණය නම්–ප්‍රසාද රූප 5, සුඛුම රූප 16 සිත් 89, චෛතසික 52, නිර්වාණය හා ප්‍රඥප්තිය වේ. සුඛුම රූප 16 නම් ආපෝ ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය, ජීවිත, ආහාර, පරිච්ඡේද රූපද කාය විඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා රූපද, උපචය, සන්තති, ජරතා, අනිච්චතා රූප වේ. චිත්ත චෛතසිකයන් එල්බීමට උපකාර වන්නේ ආලම්බන නම්. චක්ඛු, සෝත ආදි ද්වාරයන්හි සිත් ඉපදීමට උපකාර වනුයේ මේ ආලම්බන හෙවත් අරමුණු වේ.

චක්ඛු ද්වාරිකා දී ද්වාර පසෙහි සිත් ඉපදීමට උපකාර වනුයේ වර්තමාන වශයෙන් පවත්නා රූපා දී අරමුණු පහයි. මනෝද්වාරයට වර්තමාන, අතීත, අනාගත යන කාල තුනට අයත් රූපාදී අරමුණු සහ නිර්වාණ, ප්‍රඥප්ති දෙක ද අරමුණු වේ. නිර්වාණ, ප්‍රඥප්ති දෙක කාල විමුක්ත වේ. ඒ දෙක ඇතිවීම්, නැතිවීම් ස්වභාවයෙන් යුක්ත නො වේ.

ද්වාර විමුක්ත සිත් 19 ට වර්තමාන හෝ අතීත හෝ ප්‍රඥප්තිය අරමුණු වේ. ඒවාට කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත, යන තුනෙන් එකක් අරමුණු වේ. මරණාසන්නයේ දී ඊළඟ භවයෙහි පටිසන්ධි දීමට එළඹ සිටි කුසලා, කුසලාදී කර්ම නිමිති තුනෙන් එකක් අරමුණු වේ.

### ඒකංසික ආරම්මණ

කාම විපාක 23, පංචද්වාරාවජ්ජනය, හසිතුප්පාදය යන සිත් 25 කාම ධර්ම අරමුණු කරයි. කාම ධර්ම නම් කාමාවචර සිත් 54, චෛතසික 52, රූප 28 වේ.

විඤ්ඤාණඤ්චායතන සිත් 3, නේවසඤ්ඤා නාසඤ්ඤා යතන සිත් 3 ද යන සිත් 6, මහද්ගත ධර්ම අරමුණු කරයි.

විඤ්ඤාණඤ්චායතන කුසල් සිත වර්තමාන, අතීත භවයන්හි තම සන්තානයෙහි ඇති වූ අකාසානඤ්චායතන කුසලය අරමුණු කරයි.

විඤ්ඤාණඤ්චායතන විපාක සිත අතීත භවයෙහි තම සන්-තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසලය අරමුණු කරයි.

විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත වර්තමාන, අතීත භවයන්හි තම සන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසල් හෝ වර්තමාන භවයෙහි තම සන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චා යතන ක්‍රියා සිත අරමුණු කරයි.

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සිත් 3 ද, ආකිඤ්චඤ්ඤා යතන සිත් මෙසේම අරමුණු කරයි.

රූපාවචර සිත් 15, ආකාසානඤ්චායතන, අකිඤ්චඤ්ඤා යතන සිත් 6 යන සිත් 21 ප්‍රඥප්ති ධර්මයන්ම අරමුණු කරයි.

රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත් 3; කසිණ 10, අසුභ 10, කාය ගතාසතියට අරමුණු වන කේසාදී කාය කොට්ඨාස ප්‍රඥප්තිය, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා, කරුණා මුදිතාවන්ට අරමුණු වන අප්‍රමාණ සත්ව ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති ධර්ම විසිපහ (25) අරමුණු කරයි.

රූපාවචර ද්‍විතිය, තතිය, චතුත්ථ යන සිත් 9 දස කසිණය, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා කරුණා මුදිතාවන්ට අරමුණු වන සත්ව ප්‍රඥප්තිය ද යන ප්‍රඥප්ති දහ හතර (14) අරමුණු කරයි.

රූපාවචර පංචමධ්‍යාන සිත් 3, දස කසිණය, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, උපෙක්ඛා බ්‍රහ්ම විහරණයට අරමුණු වන සත්ව ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති දෙලහ (12) අරමුණු කරයි.

ආකාසානඤ්චායතන සිත් 3, ආකාස කසිණයෙන් අන්‍ය වූ කසිණ නවය අතුරෙන් යම්කිසි කසිණයකින් උගුළුවා හැර ගත් ආකාස ප්‍රඥප්තිය අරමුණු කරයි.

ආකිඤ්චඤ්ඤායතන සිත් 3 ආකාසානඤ්චායතන කුසලයේ සහ ක්‍රියා සිතේ අභාවය වූ නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණු කරයි. ලෝකෝත්තර සිත් 8 නිර්වාණය පමණක් අරමුණු කරයි.

## අනේකංසික ආරම්මණ

අකුසල් 12, ඥාන විප්‍රයුක්ත මහා කුසල් 4 සහ ක්‍රියා 4 යන සිත් 20 ලෞකික ධර්ම අරමුණු කරයි. ලෞකික ධර්ම නම් සිත් 81, චෛතසික 52 සහ රූප 28 වේ.

ඥාන සම්ප්‍රයුක්ත කුසල් 4, අභිඥා කුසල් සිත යන සිත් 5 අර්හත් මාර්ග ඵල සිත් 2 හැර ඉතිරි සිත් 87, චෛතසික 52, රූප 28, නිර්වාණය සහ ප්‍රඥප්තිය ද අරමුණු කරයි.

ඥාන සම්ප්‍රයුක්ත ක්‍රියා සිත් 4 සහ වොත්ථපන සිතද ක්‍රියා අභිඥා සිත ද යන සිත් 6 සියලු ධර්මයන් අරමුණු කරයි. සියලු ධර්ම නම් සිත් 89, චෛතසික 52, රූප 28, නිර්වාණය සහ ප්‍රඥප්තිය යි.

| | | |
|---|---|---|
| කාම ධර්ම අරමුණු කරන සිත් | 25 | ඒකංසික අරමුණු |
| මහද්ගත ධර්ම අරමුණු කරන සිත් | 6 | |
| ප්‍රඥප්ති ධර්ම අරමුණු කරන සිත් | 21 | |
| නිර්වාණය අරමුණු කරන සිත් | 8 | |

| | | |
|---|---|---|
| ලෞකික ධර්ම අරමුණු කරන සිත් | 20 | අනේකංසික අරමුණු |
| අර්හත් මාර්ග ඵල හැර සෙසු ධර්ම අරමුණු කරන සිත් | 5 | |
| සියල්ල අරමුණු කරන සිත් | 6 | |

ආරම්මණ සංග්‍රහය අවසන්

# වස්තු සංග්‍රහය

වස්තු ධර්ම සහ ඒ ඒ වස්තු ඇසුරු කොට උපදනා සිත් වෙන් වශයෙන් දැක්වීමයි මෙහි දී කෙරෙනුයේ. වස්තු 6 කි. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, හදය වශයෙනි. මේ වස්තු ද්වාර නාමයෙන් ද හැඳින් වේ. වස්තු ධර්ම සියල්ල කාම ලෝකයේ සුදුසු පරිදි ලැබේ. අඩු අයද සිටිති. සුගති අහේතුක යින්ට අඩු වේ.

රූප ලෝකයෙහි චක්ඛු, සෝත වස්තු දෙක සහ හදය වස්තුව ලැබේ. අරූප ලෝකයෙහි රූප ධර්ම නැති හේතුවෙන් එක වස්තු ධර්මයක් හෝ නැත්තේ ය. අසංඥ තලයෙහි ද නැත. රූපී බ්‍රහ්ම ලෝකයේ බ්‍රහ්මයින්ට බුදුරජාණන් වහන්සේ දැකීමට සහ බණ ඇසීමට චක්ඛු, සෝත වස්තු දෙක ඇත. කාම ආශාව පහ කළ බැවින් ඝාන, ජිව්හා, කාය වස්තු නොලැබේ.

### විඤ්ඤාණ ධාතු 7

සිත් සියල්ල 89 ක් වේ. එම සිත් විඤ්ඤාණ ධාතු වශයෙන් කොටස් හතකින් යුක්ත වේ. චක්ඛු වස්තුව ඇසුරු කොට උපදනා සිත් 2 චක්ඛු විඤ්ඤාණ ධාතු වේ. සෝත ද්වාරයෙහි සෝත වස්තුව ඇසුරු කොට උපදනා සිත් 2 සෝත විඤ්ඤාණ ධාතු වේ. ඝාන වස්තුව ඇසුරු කොට උපදනා සිත් 2 ඝාන විඤ්ඤාණ ධාතු වේ. ජිව්හා වස්තුව ඇසුරු කොට උපදනා සිත් 2 ජිව්හා විඤ්ඤාණ ධාතු වේ. කාය වස්තුව ඇසුරුකොට උපදනා සිත් 2 කාය විඤ්ඤාණ ධාතු වේ. මේ සිත් 10 ත් අරූප විපාක 4 ත් හැර ඉතිරි සිත් 75 හදය වස්තුව ඇසුරුකොට උපදනේය. (පංච වෝකර භවයන්හි) මේ සිත් 79 මනෝධාතු හා මනෝ විඤ්ඤාණ ධාතු වය. සම්පටිච්ඡන සිත් 2 සහ පංච ද්වාරා වජ්ජන සිත මනෝධාතු ත්‍රිකය යි. මේ අන්දමට විඤ් ඤාණ ධාතු හතකි.

මනෝ විඤ්ඤාණ ධාතුවට අයත් සන්තීරණ සිත් 3, මහා විපාක සිත් 8, පටිඝ සිත් 2, සෝවාන් මාර්ග සිත, හසිතුප්පාද සිත, රූපාවචර සිත් 15 යන මේ සිත් 30 හදය වස්තුව නිසාම පවත්නේ ය.

මනෝ විඤ්ඤාණ ධාතුවට අයත් කාමාවචර කුසල් 8 සහ අරූපාවචර කුසල් 4, පටිඝ සිත් හැර අකුසල් සිත් 10, ඉතිරි ක්‍රියා සිත් 13 (පංචද්වාරාවජ්ජනය, හසිතුප්පාදය සහ රූපාවචර සිත් 15 හැර සෝවාන් මාර්ග සිත ද හැර) ඉතිරි ලෝකෝත්තර සිත් 7 යන මේ සිත් 42 පංචවෝකාර භූමියේ දී වස්තු රූපය නිසාද චතුවෝකාර භූමිවලදී හදය වස්තුව ඇසුරු නො කොටද උපදී.

කාම භූමි 11 ත්, අසංඥ සත්තය හැර ඉතිරි රූපී බ්‍රහ්ම ලෝක 15 ත් පංචස්කන්ධයම පවත්නා භූමි බැවින් පංචවෝකාර භූමි නම් වේ. අරූප භූමි 4 චතුවෝකාර භූමි නම් වේ. අසංඥ සත්තය ඒකවෝකාර භූමි නම් වේ.

මනෝ විඤ්ඤාණ ධාතුවට අයත් අරූප විපාක සිත් 4 වස්තුවක් ඇසුරු නො කොට ම උපදනේය. කාම භූමි 11 හි මහද්ගත විපාක සිත් 9 හැර ඉතිරි සිත් 80 සුදුසු පරිදි ලැබෙන්නේය. රූප භූමි 15 හි චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ මනෝ ධතු, මනෝ විඤ්ඤාණ ධාතුවට අයිති සිත් 69 චක්ඛු සෝත, හදය යන වස්තු ධර්ම ඇසුරු කොට උපදනේ ය. අරූප ලෝකයෙහි මනෝ විඤ්ඤාණ ධාතුවට අයත් සිත් 46 වස්තු ධර්ම ඇසුරු නො කොටම උපදනේ ය.

ප්‍රකීර්ණක සංග්‍රහය ස්වරූප අවසන්.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

# චතුත්ථො පරිච්ඡෙදෙ.

## සතරවන පරිච්ඡෙදය

197 චිත්තුප්පාදන මිච්චෙවං කත්වා සංගහ මුත්තරං,
භූමි පුග්ගල භෙදෙන පුබ්බාපර නියාමිතං.

198 පවත්ති සංගහං නාම පටිසන්ධිප්පවත්තියං,
පවක්ඛාමි සමාසෙන යථාසම්භවතො කථං?.

199 ඡ වත්ථූනි ඡ ද්වාරානි ඡ ආලම්බනානි ඡ විඤ්ඤාණානි ඡ වීථියො ඡධා විසයප්පවත්ති චෙති වීථිසංගහෙ ඡ ඡක්කානි වෙදි තබ්බානි.

200 වීථිමුත්තානං පන කම්ම කම්මනිමිත්ත ගති නිමිත්ත වසෙන තිවිධා හොති විසයප්ප වත්ති.

201 තත්ථ වත්ථුවාරාලම්බනානි පුබ්බෙ වුත්තනයා නෙවාති.

202 චක්ඛුවිඤ්ඤාණං සොතවිඤ්ඤාණං ඝාණවිඤ්ඤාණං ජිව්හා විඤ්ඤාණං කායවිඤ්ඤාණං මනොවිඤ්ඤාණං චෙති ඡ විඤ්ඤාණානි.

203 වීථියො පන චක්ඛුද්වාරවීථි සොතද්වාරවීථි ඝාණද්වාරවීථි ජිව්හාද්වාරවීථි කායද්වාරවීථි මනොද්වාරවීථි චෙති ද්වාරවසෙන වා චක්ඛු විඤ්ඤාණ වීථි සොතවිඤ්ඤාණ වීථි ඝාණ විඤ්ඤාණවීථි ජිව්හාවිඤ්ඤාණවීථි කාය විඤ්ඤාණවීථි මනොවිඤ්ඤාණවීථි චෙති විඤ්ඤාණවසෙන ද්වාරප්ප වත්තා චිත්තප්ප වත්තියො යොජෙතබ්බා.

204 අතිමහන්තං මහන්තං පරිත්තං අතිපරිත්තං චෙති පඤ්චද්වාරෙ, මනොද්වාරෙ පන විභූතමවිභූතං චෙති ඡද්ධා විසයප්ප වත්ති වෙදි තබ්බා.

205 කථං? උප්පාදඨිති භංගවසෙන ඛණත්තයං එකචිත්තක්ඛණං නාම.

206 තානි පන සත්තරස චිත්තක්ඛණානි රූප ධම්මානමායු.

207 එකචිත්තක්ඛණාතිතානි වා බහුචිත්තක්ඛණාතීතානි වා ඨිතිප්පත්තානෙව පඤ්චා ලම්බනානි පඤ්චද්වාරෙ ආපාථමාගච්ඡන්ති.

208 තස්මා යදි එකචිත්තක්ඛණාතීතකං රූපාරම්මණං චක්ඛුස්ස ආපාථමාගච්ඡති. තතො ද්වික්ඛත්තුං භවංගෙ චලිතෙ භවංගසොතං වොච්ඡින්දිත්වා තමෙව රූපාරම්මණං ආ—වජ්ජෙතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති.

209 තතො තස්සානන්තරං මෙව තමෙව රූපං පස්සන්තං චක්ඛුවිඤ්ඤාණං සම්පටිච්ඡන්තං සම්පටිච්ඡනචිත්තං, සන්තීරයමානං සන්තිරණචිත්තං වවත්ථපෙන්තං වොත්ථපන චිත්තං චෙති යථාක්කමං උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති.

210 තතොපරං එකූනතිංස කාමාවචර ජවනෙසු යංකිඤ්චි ලද්ධප්ප ච්චයං යෙභුය්‍යෙන සත්තක්ඛත්තුං ජවනං ජවති.

211 ජවනානුබද්ධානි ච ද්වෙ තදලම්බනපාකානි යථාරහං, පවත්තන්ති.

212 තතොපරං භවංගපාතො.

213 එත්තාවතා චුද්දස වීථි චිත්තුප්පාද ද්වෙ භවංග චලනානි පුබ්බෙවාතීතකෙ මෙක චිත්තක්ඛණන්ති කත්වා සත්තරස චිත්තක්ඛණානි පරිපූරෙන්ති.

214 තතො පරං නිරුජ්ඣති.

215 ආලම්බන මෙතං අතිමහන්තං නාම ගොචරං.

216 යාව තදලම්බනුප්පාද පන අප්පහොන්තා තීතක මාපාථ මාගතං ආලම්බනං මහන්තං නාම.

217 තත්ථ ජවනාවසානෙ භවංග පාතොව හොති, නත්ථි තද ලම්බනුප්පාදෙ.

218 යාව ජවනුප්පාදපි අප්පහොන්තාතීතක මාපාථ මාගතං ආලම්බනං පරිත්තං නාම.

219 තත්ථ ජවනම්පි අනුප්පජ්ජිත්වා ද්වත්තික්ඛත්තුං වොත්ථපන මෙව පවත්තති.

220 තොතපරං භවංගපාතොව හොති.

221 යාව වොත්ථපනුප්පාද පන අප්පහොන්තා තීතක මාපාථ මාගතං නිරෝධාසන්නං තමා ලම්බනං අතිපරිත්තං නාම.

222 තත්ථ භවංගචලන මෙව හොති, නත්ථි වීථි චිත්තුප්පාදෙ.

223 ඉච්චෙවං චක්ඛුද්වාරෙ තථා සොතද්වාරාදීසු චෙති සබ්බථා පි පඤ්චද්වාරෙ තදලම්බන ජවන වොත්ථපන මොඝවාර සංඛාතානං චතුන් නං වාරානං යථාක්කමං ආලම්බන භූතා විසයප්පවත්ති චතුධා වෙදිතබ්බා.

224 වීථි චිත්තානි සත්තෙව චිත්තුප්පාද චතුද්දස, චතුපඤ්ඤාස විත්ථාරා පඤ්චද්වාරෙ යථාරහං.

අයමෙත්ථ පඤ්චද්වාරෙ වීථි චිත්තප්පවත්ති නයො.

225 මනොද්වාරෙ පන යදි විභූතමාලම්බනං ආපාථමාගච්ඡති.

226 තතො භවංගචලන මනොද්වාරාවජ්ජන ජවනාවසානෙ තද ලම්බන පාකානි පවත්තන්ති.

227 තතොපරං භවංගපාතො.

228 අවිභූතෙ පනාලම්බනෙ ජවනාවසානෙ භවංගපාතොව හොති නත්ථි තදලම්බනුප්පාදෙ

229 වීථිචිත්තානි තීණෙව චිත්තුප්පාද දසෙරිතා,
විත්ථාරෙන පනෙත්ථෙක චත්තාළීස විභාවයෙ.

අයමෙත්ථ පරිත්ත ජවන වාරො.

230 අප්පනා ජවන වාරෙ පන විභූතාවිභූත භෙදො නත්ථි, තථා තදාලම්බනුප්පාදො ච.

231 තත්ථ ඤාණසම්පයුත්ත කාමාවචර ජවනානමට්ඨන්නං අඤ්ඤතරස්මිං පරිකම්මො-පචාරානුලොම ගොත්‍රභූ නාමෙන චතුක්ඛත්තුං තික්ඛත්තුමෙව වා යථාක්කමං උප්පජ්ජිත්වා නිරුද්ධෙ තදනන්තරමෙව යථා රහං චතුත්ථං වා පඤ්චමං ඡබ්බීසති මහග්ගත ලොකුත්තර ජවනෙසු යථාභිනීහාරවසෙන යං කිඤ්චි ජවනං අප්පනා වීථි මොතරති.

232 තතොපරං, අප්පනාවසානෙ භවංගපාතොව හොති.

233 තත්ථ සොමනස්සසහගත ජවනානන්තරං අප්පනාපි සොමනස්ස සහගතාව පාටිකංඛි තබ්බා.

234 උපෙක්ඛා සහගත ජවනානන්තරං උපෙක්ඛා සහගතාව.

235 තත්ථාපි කුසලජවනානන්තරං කුසලජවනඤ්චෙව හෙට්ඨිමඤ්ච ඵලත්තයමප්පෙති.

236 ක්‍රියාජවනානන්තරං ක්‍රියා ජවනං අරහත්ත ඵලං චාති.

237 ද්වත්තිංස සුඛ පුඤ්ඤම්හා ද්වාදසො පෙක්ඛකා පරං,
සුඛිතක්‍රියතො අට්ඨ ඡ සම්භොන්ති උපෙක්ඛකා.

238 පුථුජ්ජනාන සෙක්ඛානං කාමපුඤ්ඤාතිහෙතුතො,
තිහෙතු කාමක්‍රියතො වීතරාගාන මප්පනා.

අයමෙත්ථ මනොද්වාරෙ වීථිචිත්තප්පවත්ති නයො.

239 සබ්බථාපි පනෙත්ථ අනිට්ඨෙ ආලම්බනෙ අකුසල විපාකානෙව පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බනානි.

240 ඉට්ඨෙ කුසල විපාකානි.

241 අති ඉට්ඨෙ පන සොමනස්ස සහගතානෙව සන්තිරණ තද ලම්බනානි.

242 තත්ථාපි සොමනස්ස සහගත ක්‍රියාජවනාව සානෙ සොම නස්ස සහගතානෙව තදලම්බනානී භවන්ති.

243 උපෙක්ඛා සහගත ක්‍රියා ජවනාවසානෙ උපෙක්ඛා සහගතානි

244 දොමනස්ස සහගත ජවනාවසානෙ ච තද ලම්බනානි චෙව භවංගානි ච උපෙක්ඛා සහගතා නෙව භවන්ති.

245 තස්මා යදි සොමනස්ස පටිසන්ධිකස්ස දොමනස්ස ජවනා වසානෙ තදලම්බන සම්භවො නත්ථි, තද යංකිඤ්චි පරිචිතපුබ්බං පරිත්තා රම්මණමාරබ්භ උපෙක්ඛා සහගත සන්තීරණං උප්පජ්ජති.

246 තමනන්තරිත්වා භවංගපාතො හොතී ති වදන්ති ආචරියා.

247 තථා කාමාවචර ජවනාවසානෙ කාමාවචර සත්තානං කාමා වචර ධම්මෙ ස්වෙව ආලම්බන භූතෙසු තදලම්බනං ඉච්ඡන්තී ති.

248 කාමෙ ජවනසත්තා ලම්බනානං නියමෙ සති,
විභූතෙති මහන්තෙ ච තදලම්බන මීරිතං.

අයමෙත්ථ තදලම්බන නියමො.

249 ජවනෙසුච පරිත්ත ජවන වීථියං කාමාවචර ජවනානි සත්තක්ඛත්තුං ඡක්ඛත්තු මෙවවා ජවන්ති.

250 මන්දප්පවත්තියං පන මරණකාලාදිසු පඤ්ච වාර මෙව.

251 භගවතො පන යමකපාටිහාරිය කාලාදිසු ලහුකප්පවත්තියං චත්තාරි පඤ්ච වා පච්ච වෙක්ඛණචිත්තානි භවන්තීති පි වදන්ති.

252 ආදිකම්මිකස්ස පන පඨමකප්පනායං මහග්ගත ජවනානි අභිඤ්ඤාජවනානි ච සබ්බදපි එකවාරමෙව ජවන්ති.

253 තතොපරං භවංගපාතො.

254 චත්තාරො පන මග්ගුප්පාද එකචිත්තක්ඛණිකා.

255 තතො පරං ද්වෙතීණි ඵලචිත්තානි යථාරාහං උප්පජ්ජන්ති.

256 තතො පරං භවංගපාතො.

257 නිරොධසමාපත්තිකාලෙ ද්වික්ඛත්තුං චතුත්ථා රූප්ප ජවනං ජවති.

258 තතොපරං නිරොධං ඵුසති.

259 වුට්ඨානකාලෙච අනාගාමිඵලංවා අරහත්ත ඵලංවා යථා රහමෙකවාරං උප්පජ්ජිත්වා නිරුද්ධෙ භවාංගපාතො හොති.

260 සබ්බත්ථාපි සමාපත්ති වීථියං පන භවංග සොතෙ විය වීථි නියමො නත්ථී ති කත්වා බහූනි පි ලබ්භන්තී ති.

261 සත්තක්ඛත්තුං පරිත්තානි මග්ගාභිඤ්ඤා සකිං මතා,
අවසෙසානි ලබ්භන්තී ජවනානි බහූනිපි.

අයමෙත්ථ ජවන නියමො.

262 දුහෙතුකාන මහෙතුකානංච පනෙත්ථ ක්‍රියා ජවනානි චෙච අප්පනා ජවනානි ච න ලබ්භන්ති.

263 තථාඤාණසම්පයුත්ත විපාකානි ච සුගතියං.

264 දුග්ගතියං පන ඤාණවිප්පයුත්තානිච මහා විපාකානි න ලබ්භන්ති.

265 තිහෙතුකෙසු ච ඛීණාසවානං කුසලාකුසල ජවනානි න ලබ්භන්ති.

266 තථා සෙක්ඛ පුථුජ්ජනානං ක්‍රියා ජවනානි.

267 දිට්ඨිගත සම්පයුත්ත විචිකිච්ඡා ජවනානි ච සෙක්ඛානං.

268 අනාගාමි පුග්ගලානං පන පටිඝ ජවනානි ච න ලබ්භන්ති.

269 ලොකුත්තර ජවනානි ච යථාරහඅරියා න මෙව සමුප්පජ්ජන්ති ති.

270 අසෙක්ඛානං චතු චත්තාළිස සෙක්ඛාන මුද්දිසෙ,
ඡප්පඤ්ඤා සාවසෙසානං චතු පඤ්ඤාස සම්භවා.

අයමෙත්ථ පුග්ගල භෙදෙ.

271 කාමාවචර භූමියං පනෙතානි සබ්බානි පි වීථි චිත්තානි යථාරහමුපලබ්භන්ති.

272 රූපාවචර භූමියං පටිඝජවන තදලම්බන වජ්ජිතානි.

273 අරූපාවචර භූමියං පඨමමග්ග රූපාවචර හසන හෙට්ඨිමාරුප්ප වජ්ජිතානි ච ලබ්භන්ති.

274 සබ්බත්ථාපි තං තං පසාද රහිතානං තං තං ද්වාරික වීථි චිත්තානි න ලබ්භන්තෙව.

275 අසඤ්ඤසත්තානං පන සබ්බථාප චිත්තප්ප වත්ති නත්ථෙවාති.

276 අසීති වීථි චිත්තානි කාමෙ රූපෙ යථාරහං,
චතුසට්ඨි තථාරුප්පෙ ද්වෙ චත්තාළිස ලබ්භරෙ.

අයමෙත්ථ භූමි විභාගො.

277 ඉච්චෙවං ඡද්වාරික චිත්තප්පවත්ති යථා සම්භවං භවංගන්තරිතා යාවතායුකමබ්බොච්ඡින්නා පවත්තති ති.

ඉති අභිධම්මත්ථ සංගහෙ වීථි සංගහ විභාගො නාම
චතුත්ථො පරිච්ඡෙදෙ.

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# වීථි සංග්‍රහය ස්වරූප

## සතරවන පරිච්ඡේදය

ප්‍රකීර්ණක කාණ්ඩයට අනතුරුව චිත්ත නියාමයාගේ වශයෙන් වීථි කාණ්ඩය වදාළ සේක. එහි භූමිභෙදය–පුද්ගල භෙදය ආදිය සංග්‍රහ කර තිබේ. චිත්තයාගේ පැවැත්ම ද පටිසන්ධි කාලයේ පැවැත්ම සහ ප්‍රවෘත්ති කාලයේ පැවැත්ම යයි දෙවැදෑරුම් වේ. එසේ සිත් උපදනා පිළිවෙල චිත්තවීථි වශයෙන් පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් සිත් උපදනා වීථි කොටස් දෙකක් වේ. පඤ්චද්වාර වීථි සහ මනොද්වාර වීථි යන කොටස් දෙකයි. පඤ්චද්වාර වීථි නම් චක්ඛු, සෝත ඝාන, ජිව්හා, කාය යන ද්වාර පසෙහි රූප, ශබ්ද, ගන්ධ, රස පොට්ඨබ්බයන් ගැටීමෙන් උපදනා චිත්ත වීථි පඤ්චද්වාර වීථි නම් වේ. පඤ්චද්වාර වීථි සියල්ල 75 ක් වේ. එක ද්වාරයක වීථි 15 බැගින් ද්වාර පසේ චිත්ත වීථි 75 ඇති වේ.

වීථි කාණ්ඩයෙහි ෂට්ක සයක් වේ. වස්තු සය, ද්වාර සය, ආරම්මණ සය, විඤ්ඤාණ සය, විථි සය සහ විෂය ප්‍රවෘර්ති සය යයි සය වැදෑරුම් වේ. ප්‍රකීර්ණක කාණ්ඩයෙහි දී වස්තු, ද්වාර, ආරම්මණ යන තුන පෙන්වා ඇත. විඤ්ඤාණ සය නම් චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන පස හා මනො විඤ්ඤාණය යි. මෙහි චක්ඛු විඤ්ඤාණාදි සිත් 10 දෙපස් විඤ්ඤාණ නමින් ද ඉතිරි සිත් 79 මනො විඤ්ඤාණ නමින් ද දැක්වේ.

චක්ඛුද්වාරාදීන් වීථි නාමයෙන් ද චක්ඛු ද්වාර වීථි, සෝත ද්වාර වීථි ඝාණ ද්වාර වීථි, ජිව්හා ද්වාර වීථි, කාය ද්වාර වීථියද, මනොවිඤ්ඤාණ වීථියද වීථි ෂට්කය වශයෙන් පෙන්වන්නේය. විෂය ප්‍රවෘත්ත්තිය නම් අරමුණු ය. අරමුණු ගන්නා ආකාරද 6ක් වේ. පඤ්ච ද්වාරයෙහි සතරාකාරයකට ද මනොද්වාරයෙහි

දෙයාකාරයකට ද පෙන්නුම් කර තිබේ. පඤ්ච ද්වාරයෙහි අති මහන්ත අරමුණුය, මහන්ත අරමුණුය, පරිත්ත අරමුණුය, අති පරිත්ත අරමුණු යයි 4 ආකාරයකට අරමුණු ගෙන සිත් උපදනා ක්‍රම චිත්ත වීථි 4 ආකාරයකින් පෙන්වා තිබේ. මනො ද්වාරයෙහි විභූත අවිභූත වශයෙන් ද කාම ජවන වීථි, අර්පණා ජවන වීථි වශයෙන් ද බොහෝ ප්‍රභෙද දක්වා තිබේ.

පඤ්චද්වාරයෙහි උපදනා අතිමහන්තාරම්මණ චිත්ත වීථිය උපදිනුයේ චිත්තක්ෂණ 17 කට ආයු ඇති අරමුණෙහි එක චිත්තක්ෂණයක් ඉක්ම ගිය චිත්තක්ෂණ 16 කාලය පවත්නා ඉතා වැඩි කාලයක් ප්‍රසාදයෙහි ගැටීමෙන් පසුව අරමුණ පවත්වනා කල්හිය. ඉතා දිග අරමුණ යන අර්ථයෙන් අතිමහන්තාරම්මණ යයි ඊට නම් දී තිබේ. මහන්තා රම්මණය නම් අරමුණෙහි චිත්තක්ෂණ දෙකක් තුනක් ගෙවී ගිය අරමුණ ප්‍රසාදයෙහි ගැටීමෙන් අරමුණු කරන චිත්ත වීථි දෙකය. මෙහි අරමුණ ගැටීම යයි කියනුයේ අරමුණ ප්‍රසාදය ළඟට පැමිණ ගැටීමක් නොවන්නේය. අරමුණක් ගැනීමේදී සිතක් ද උපදින්නේය. ඒ සිතෙහි උපදනා නාම ධර්මයන් වන ඵස්ස චෛතසික යෙන් කරන උපකාරයයි. සබ්බ චිත්ත සාධාරණ චෛතසික 7 න් එකක් වන පළමුව කියා තිබෙන ඵස්ස චෛතසිකයෙන් සිතත් අරමුණත් එකට ලංකර දීම වාගේ ස්වභාවයෙන් යුත් සෑම සිතකටම උපකාර කරන චෛතසිකය යි. අරමුණ ප්‍රසාද යෙහි ගැටීම යයි කීවේ, මේ ඵස්ස චෛතසිකයෙන් සිත අරමුණ කරා යොමු කිරීම වැනි ස්වභාව ධර්මයටය. ඝාණ, ජිව්හා. කාය වීථීන්හි අරමුණ සමග ප්‍රසාද රූපය ගැටීමෙන්ම සිත් උපදනෝ යයි ද චක්ඛු, සෝත දෙක අරමුණු ගැනීමේදී අරමුණ දුර තිබියදී ම අරමුණු කරන්නෝ යයි ද කියති. එය ''අසම්පත්ත ග්‍රාහී'' යයි කියති. ඝාණ, ජිව්හා, කාය තුන අරමුණු ගැනීම ''සම්පත්තග්‍රාහී'' යයි ද කියති.

මනොද්වාරිකව සිත් උපදනා විට ඉතා දුර ඈත පිහිටි දැක නැති දේවල් ගැන පවා සිතන විට සිතට ඒ අරමුණ ගැනීමට අරමුණ කරා සිතා යොමු කරන ක්‍රියාව වැනි ස්වභාවයක් ඵස්ස චෛතසිකයෙන් සිදුවේ.

පඤ්චද්වාරික චිත්ත වීථීන් පරිත්තාරම්මණ වීථි 6 ක් ද අති පරිත්තාරම්මණ වීථි 6 ක් ද ඇති වේ. එහි ගන්නා අරමුණෙහි

ආකාරයෙන් සිත් ඉපදවීම පෙන්වන්නේය. වර්තමාන රූපාදී පස එහි ද, අරමුණ වේ. චිත්තක්ෂණ 3 සිට 16 දක්වා ගෙවී ගිය අරමුණු පිළිවෙලින් පළමු පරිත්තාරම්මණ චිත්ත වීථියේ සිට අරමුණු කිරීමේදී අවසානයට චිත්තක්ෂණ 16 ක් ඉක්ම ගොස් තිබූ අරමුණද ගන්නේය. ඒ වීථි 12 හි ජවන් සිත් එකක්වත් නූපදී පළමු වීථි 6 දැකීම් මාත්‍රයක් පමණක් සිදු කරයි. අති පරිත්තා රම්මණ වීථි 6 හි වීථි සිත් එකක් වත් නූපදනේය. පඤ්චද්වාර චිත්ත වීථි එක් ද්වාරයක 15 බැගින් ද්වාර 5ට චිත්ත වීථි 75 ක් ඇති වේ.

පඤ්චද්වාරික චිත්ත වීථීන්හි අරමුණු වර්තමාන රූප ශබ්ද පසය. එය වර්තමාන රූපාරම්මණ ආදි වශයෙන් පෙන්වා තිබේ. වර්තමාන රූපාරම්මණය නම් ප්‍රසාද රූප සමග ඉදිරි පසු නොවී එකම චිත්තක්ෂණයේ උපන් අරමුණ සහ ප්‍රසාද රූප යන මේවාය. වර්තමාන රූපාරම්මණය වන්නේ ප්‍රසාද රූපය හා එකම ක්ෂණයේ උපන් අරමුණයි. රූප ධර්ම සියල්ල 28 කි. එය මහා භූත රූප 4 ද උපාදා රූප 24 ද වේ. ඒවා කලාප නමින් මිටි මිටි වශයෙන් උපදනේය. ඉන් පළමු ඇතිවන කුඩා කලාපය ශුද්ධාෂ්ටක කලාපයයි. එය පඨවි ආපෝ තේජෝ වායො යන මහාභූත රූප 4 සහ උපාදා රූප 4 න් යුත් කුඩාම කලාපය යි. එසේ ශුද්ධාෂ්ටකයේ සිට තවත් රූප එකතු වීමෙන් ප්‍රසාද රූප ජීවිත රූප විඤ්ඤප්ති රූප ආදි දශයේ, එකොළහේ මිටි සෑදෙයි. පළමු ශුද්ධාෂ්ටක කලාපයෙහි කී මහාභූත රූපයන්ගේ ඔප ගතිය වන රූපයන්ට අයත් වන වර්ණ රූපය වර්තමාන රූපා රම්මණය වන්නේය. චක්ඛු ද්වාරයට අරමුණු වන්නේ එම වර්ණ රූපයයි. එයට වර්ණායතනය යයි ද ව්‍යවහාර වේ. චක්ඛු විඤ්ඤාණ දෙසිතට අරමුණු වන්නේ එම වර්ණ රූපය පමණකි. ඉතිරි රූප 27 ම චක්ඛු විඤ්ඤාණ සිතට අරමුණු නොවේ. එයින් ගන්ධ රූපය සුගඳ දුගඳ දෙකම ගන්ධ රූපයයි. ඝාණ විඤ්ඤාණ දෙකින් ශුද්ධාෂ්ටක කලාපයෙහි පැවති වර්ණ, ගන්ධ, රස, ඕජා යන රූප 4 න් ගන්ධ රූපය අරමුණු කරයි. රූප 28 අයත් ශබ්ද රූපය සෝත විඤ්ඤාණ දෙසිතට ද, රස රූපය ජිව්හා විඤ්ඤාණ දෙසිතට ද, පොට්ඨබ්බ රූපය වන මහා භූත රූප තුන (පඨවි, තේජෝ, වායෝ) කාය විඤ්ඤාණ දෙසිතට ද,

අරමුණු වන්නේය. ඉතිරි අනෙක් රූප මනෝ විඤ්ඤාණ සිත් වලින් අරමුණු කරන්නේය.

සත්ව සන්තානයෙහි චිත්ත වීථි නූපදනා කල්හි භවාංග චිත්ත පරම්පරාව පවත්නේ ය. භවාංග සිත නම් ඒ භවයේ පටිසන්ධිය ලබාදුන් සිතයි. පෙර භවයේ මරණාසන්න ජවන යෙන් ගත් කර්මය හෝ' කර්ම නිමිත්ත හෝ, ගති නිමිත්ත අරමුණු කොට ගෙන මේ භවයේ පටිසන්ධිය ලබා දුන් සිත භවය නොසිඳ පැවැත්මට උපකාර වීම් වශයෙන් වීථි සිත් නූපදනා කල්හි චිත්ත පරම්පරාව පවත්වා ගෙන යාම සඳහා චිත්ත වීථියක් ඉපිද අවසානයෙහි වෙනයම් චිත්ත වීථියක් උපදනා තුරු සිත් පරපුර නැවතීමට ඉඩ නොතබා ඒ අතරට උපදින සිත භවාංග සිතයි. භවයට අංගයක් වශයෙන් භවය පවත්වන සිත යන තේරුමයි. සිත් පේලිය අතරක් නොතබා ඉපදීම නතර වී නම් සිත් ඉපදීම සිඳී ගියේ නම් එම සිරුර ඇසුරු කොට සිත් නූපදින්නේ නම් සත්වයා මළේ යයි කියති.

රූපයක් ඉපද පැවත බිඳී යන කාලය සම්පූර්ණයෙන් චිත්ත ක්ෂණ 17 ක් වේ. ඒ රූපයේ වැඩිම ආයු කාලයයි. ඊට වඩ අඩු කාලයක් පවත්නා රූප ධර්ම ද තිබේ. විඤ්ඤප්ති රූප සහ ලක්ඛණ රූප ආදියයි. විඤ්ඤප්ති රූපයක ආයු කාලය එක චිත්තක්ෂණ යයි ද ලක්ෂණ රූපයන් ගෙන් උපචය එක චිත්තක්ෂණ යයි ද සන්තති ජරතා යන රූප දෙක මැද අවස්ථාව යයි ද අනිච්චතා භංගක්ෂණය යයි ද පෙන්වා තිබේ.

ඉතිරි රූප ධර්මයන්ගේ පළමු කුඩා ක්ෂණය උත්පාද යයි ද, අවසාන කුඩා ක්ෂණය භංග යයි ද, මැද පිහිටි කුඩා ක්ෂණ 49 ඨිතිය හෙවත් පැවැත්ම යයි ද වේ. රූපයේ ආයු කාලය චිත්තක්ෂණ 17 කි. සිතක ආයු කාලය කුඩා ක්ෂණ තුනකි. රූපයක ආයු කාලය කුඩා ක්ෂණ 51 ක් වේ. සිතක ආයු කාලය වන කුඩා ක්ෂණ තුනක කාලයෙන් පළමු කුඩා ක්ෂණය රූපයේ උත්පාද ක්ෂණයයි. අග කුඩා ක්ෂණය රූපයේ භංග ක්ෂණයයි. මැද ක්ෂණ 49 පවත්නා කාලයයි.

චිත්ත වීථියක අතීත භවාංගයෙන් පෙන්වන්නේ රූපාරම්ම ණයක් උපදනා අවස්ථාවයි. එතැන් සිට පිළිවෙලින් සිත් ඉපද තදරම්මණයෙන් අවසන් වන විට රූපයේ ආයු කාලයද සම්පූර්ණව චිත්තක්ෂණ 17 ද සම්පූර්ණ වේ. එවිට එම චිත්ත වීථියෙහි අතීත භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේදය ද යන භවාංග සිත් තුනට පසුව පඤ්චද්වාරාවජ්ජන, චක්ඛු විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ වොත්ථපන, ජවන් සිත් 7 ක් සහ තදරම්මණ සිත් 2 ද ඉපද චිත්ත වීථිය අවසන් වෙයි. එවිට අතීත භවාංග සිතේ සිට තදරම්මණ අවසානයට සිත් 17 ක කාලය වන රූපයේ ආයු කාලයද අවසන් වන්නේය. චිත්තෝත්පාද වශයෙන් උපදනා පඤ්චද්වාරාවජ්ජන සිතේ සිට තදරම්මණ අවසානයට සිත් 14 ක් සම්පූර්ණ වේ. ඒ 14 වීථි චිත්තෝත්පාද නම් වේ. පඤ්චද්වා රාවජ්ජනාදී එක එක ජාතියක සිත් වෙන් වශයෙන් ද, ජවන් සිත් 7 ම එකක් වශයෙන් ද ගෙන වීථි සිත් 7 ක් වේ. මේ අති මහන්තාරම්මණ චිත්ත වීථියක සිත් උපදනා ආකාරයයි. මේ අනුසාරයෙන් අනිත් චිත්ත වීථිවලදී ද සිත් ඇතිවීම පහද ගත යුතුයි.

මහන්තාරම්මණ වීථි 2 හිදී අතීත භවාංග 2 ක් 3 ක් ඇති වීමත් තදරම්මණ ඉපදීමට අවස්ථාව නොලැබීයාමත් සිදු වේ. පරිත්තාරම්මණයෙහි දී ජවන් සිත් නොඉපදීමත් අතීත භවාංග වැඩිවීමත් වේ. අති පරිත්තාරම්මණ වීථීන්ද අතීත භවාංගව ඉපද වීථිය අවසන් වේ. අවසාන ක්ෂණයේදී භවාංග චලනයේදී ගෙවී ගිය අරමුණ ඇති වීථියයි.

රූපයක් උපදනා අවස්ථාවේ ම වාගේ ප්‍රසාදය සමග ගැටී සිත් ඉපදීමත් ක්ෂණ දෙක තුන හතර ආදී වශයෙන් ගෙවී ගෙවී ගිය අරමුණු ප්‍රසාදයෙහි ගැටීමත් සිදුවී සිත් ඉපද අරමුණ ගන්නා ආකාරයත් මෙසේ චිත්ත වීථීන්ගෙන් පැහැදිලි කර පෙන්වා තිබේ. දැකීම් ඇසීම් ආදි ඒ ඒ ක්‍රියාවන් සිදුවන ආකාරය පහද ගැනීමට ධර්මයට අනුව පහද ගැනීමට තිබෙන එකම උපකාරය චිත්ත වීථි ආදිය පහද පෙන්වා වදරන ලද පරමාර්ථ දේශනාවම වන්නේ ය.

මන්‍දයුක්ත, ආමන්‍දයුක්ත, මධ්‍යමායුක්ත යයි ත්‍රිවිධාකාරයකින් ප්‍රසාද රූප පෙන්නුම් කරති. එයින් මධ්‍යමායුක්ත ප්‍රසාද රූපය හා ඒක ක්ෂණිකව හටගත් රූපාරම්මණ ගැටීම් සිදුවී දර්ශන කෘත්‍යයයි කියා පෙන්නුම් කරන දැකීම සිදුවෙයි. එය අතීත භාවාංගයාගේ උත්පාද ක්ෂණයෙහි උපන් ප්‍රසාද ආරම්මණ දෙකෙහි ගැටීම නිසා දැකීම වේ.

අතීත භවාංගයාගේ උත්පාද ක්ෂණයෙහි උපන් ප්‍රසාද රූපය හා බාහිර රූපය සමාන ආයු කාලයක් පැවති නිරුද්ධ වන රූපාරම්මණය හා ගැටෙන බැවින් එම රූපරම්මණයයි දැකීම වන්නේ. එබැවින් එම රූපාරම්මණයට මධ්‍යමායුක්ත යයි කියති.

අතීත භවාංගයෙන් පෙරටුව උපන් සත්තිස් (37) චක්ෂු ප්‍රසාදයෝ ගැටෙනු ලබන රූපාරම්මණයාගේ උත්පාදයට පෙරාතුව නිරුද්ධ වන හෙයින් මන්‍දයුක්ත නම් වේ. එම චිත්තයාගේ ඨිති ක්ෂණයෙහි පටන් උපදිනු ලබන එකොළොස් (ii) ප්‍රසාද රූපයෝ ගැටෙනු ලබන රූපාරම්මණයාගේ නිරෝධයෙන් පළමු නිරුද්ධ වන හෙයින් අමන්දයුක්ත නම් වෙත්. අනෙක් සොත ප්‍රසාද දී ආරම්මණයන්ද මේ ආකාරම වන්නේය.

මෙහි දක්වන ලද ත්‍රිවිධ ප්‍රසාදයන් අතුරෙන් ඉපිද විද්‍යමානව පවත්නා නිස්සය ප්‍රත්‍යය හා පූර්වජාත ප්‍රත්‍යය වන හෙයින් මධ්‍යමායුක්ත ප්‍රසාදයන්ම නිශ්‍රය කොට ඇසුරු කොට පංච විඤ්ඤාණයෝ හට ගනිත්. අනිත් ප්‍රසාද ඇසුරු කොට හට නොගනිත් යයි ටීකාවන්හි කියන්නේය. පංචවෝකාර පටිසන්ධි සිත් තමා හා එක්ව එකවිට හටගන්නා හෘදයවස්තු රූපය නිශ්‍රය කොට හටගන්නේය. භවාංග චිත්තයෝ තමන්ට එක චිත්තක්ෂණයකට පෙර හටගත් හෘදය වස්තු රූපය ඇසුරු කරන්නේය.

නිරෝධ සමාපත්තියෙන් නැගිටිනා අවස්ථාවෙහි අනාගාමි ඵල සිත හා අර්හත් ඵල සිතද තමාට එක චිත්තක්ෂණයකට පෙර උපන් හදය වස්තු රූපය නිශ්‍රය කොට ගෙන හටගන්නේය.

මරණාසන්න කාලයෙහි උපන් භවාංග ආරම්මණාදී මනෝ විඥ්ඥාණයෝ චුති සිතට පෙර සතළොස්වන (17) චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි උපන් හෘදය වස්තු රූපය නිශ්‍රය කොට හටගන්නෝය විසුද්ධි මාර්ගයේ මග්ගා මග්ග නිර්දෙශයන්හි එන්නෝ යයිද මිටිමධුවෙහි හා පොතේ නමක් හෝ කරන ලද කෙනෙක් හෝ දනගන්නට නැති ඉතාපැරණි පොතකද මෙසේ බොහෝ විස්තර තිබේ. ඉන් ගත් සටහන් කීපයකි මේ. එය විශාල පොතක් විය යුතුයි. පිටු තුන්සිය ගණනකින් පටන්ගෙන ඉතිරිවද තුන්සිය ගණනක් තිබේ.

## 1 අති මහන්තා රම්මණ චක්ඛු ද්වාරික චිත්ත වීථිය

වර්තමාන රූපාරම්මණය අරමුණු කරයි.

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | | | |
| භ | අ | න | ද | ප | ච | ස | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | |
| | | | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | | | චිත්කොත් |

පාදයෝ 14කි

කාම ජවන් 29 න් එකක් ලැබේ දෙලම්බණ 11 න් එකක් ලැබේ

1 2 3 4 5 6 7 වීථි සිත් 7 කි

පෙර පසු භවාංග පංචවෝකාර භවාංග පසළොසෙන් (15) න් එකකි. රූපි බ්‍රහ්මයින්ට තදලම්බන සහ ද්වේෂ මූල දෙසිතද නොලැබෙයි.

වර්තමාන රූපා රම්මණ අංක (17) න් පෙන්වති අතීත භවාංග යාගේ උත්පාදක්ෂණයෙහි උපන් චක්ඛු ප්‍රසාද රූපය හා රූපා- රම්මණය ගැටීමෙන් චිත්ත වීථිය හටගනී තදලම්බමණයාගේ අව- සානයෙහි රූපයේ ආයු කාලය සම්පූර්ණ වී රූපය නිරුඬ වන්නේය.

පෙරපසු භවාංග කර්ම කර්මනිමිති ගතිනිමිති යන තුනෙන් එකක් අරමුණු කරති.

## 2 ප්‍රථම මහන්තා රම්මණ චක්ඛු වාරික චිත්ත විථිය (ජවන වාරය)

වර්තමාන රූපාරම්මණය අරමුණු කරයි.

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

ග භ අ අ න ද ප ච ස ණ වො ජ ජ ජ ජ ජ ජ ජ භ ග ග

○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○

1 2 3 4 5 6 7 8 9 10 11 12 චිත්තෝත්පාද දෙළස(12)ක් වේ.

කාම ජවන් 29 න් එකක් ලැබේ.

1 2 3 4 5 6 විථි සිත් සය (6) කි.

පෙර පසු භවාංගයෝ කර්මාදී නිමිති තුනෙන් එකක් අරමුණු කරයි.

මේ මහන්තා ලම්බන වීථීන් කාම රූප පුද්ගලයන් කෙරෙහි උපදී. පළමුවන අතීත භවාංගයාගේ උත්පාදක්ෂණ යෙහි උපන් රූපාරම්මණය හා ප්‍රසාද රූපය ජවනයට අනතුරුව උපන් භවංගයාගේ අවසාන යෙහි නිරුද්ධ වේ.

## 3 ද්‍විතිය මහන්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (ජවන වාරය)

වර්තමාන රූපාරම්මණය අරමුණු කරයි.

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ අ න ද ප ච ස ණ වො ජ ජ ජ ජ ජ ජ ජ භ භ

○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○ ○○○

1 2 3 4 5 6 7 8 9 10 11 12

කාම ජවන් 29 න් එකක් ලැබේ.

1 2 3 4 5 6 වීථි සිත් 6 කි (1 සිට 6 දක්වා)

පෙර පසු භවාංගයෝ කර්මාදී නිමිති තුනෙන් එකක් අරමුණු කරයි.

මේ වීථිය ද කාම රූප පුද්ගලයන් කෙරෙහි උපදී, රූපාරම්මණය හා ප්‍රසාද රූපය ජවනයට අනතුරුව නිරුද්ධ වේ.

## 4 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපන වාරය)

වර්තමාන රූපය අරමුණු කරයි.

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17
ග හ භ අ අ අ අ න ද ප ච ස ණ වො වො හ ග හ භ හ
1 2 3 4

පෙර පසු භවාංගයන් පඤ්ච වෝකාර භවාංග 15 න් එකකි. කර්මාදී නිමිති තුනෙන් එකක් අරමුණු කරයි.

මෙහි කුසලා කුසලාදී ජවන් නූපදී. පළමු අතීත භවාංගයාගේ උත්පාදක්ෂණයේදී උපන් ප්‍රසාද ආරම්මණ දෙදෙන සතරවන භවාංගයාගේ භංගක්ෂණයෙහිදී නිරුඬ වේ.

## 5 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපන වාරය)

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17
ග හ ග අ අ අ අ අ න ද ප ච ස ණ වො වො වො හ හ හ හ

භවාංග ආරම්මණ ආදිය පළමු වීථියෙහි මෙනි.

මෙහි ජවන් නූපදී. ප්‍රථම අතීත භවාංගයාගේ උත්පාදක්ෂණයෙහි උපන් ප්‍රසාද ආරම්මණයන් ගැටීමෙන් චිත්ත වීථිය උපදී.

## 6 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපන වාරය)

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17
හ හ හ අ අ අ අ අ න ද ප ච ස ණ වො වො වො හ හ හ

භවාංග ආරම්මණ ආදිය පළමු වීථින්හි මෙනි.

මෙහි ජවන් නූපදී. ප්‍රථම අතීත භවාංගයාගේ උතපාදක්ෂණයේ උපන් ප්‍රසාද ආරම්මණයන් ගැටීමෙන් චිත්ත වීදිය උපදී.

### 7 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපන වාරය)

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ භ අ අ අ අ අ අ අ න ද ප ච ස ණ වො වො වො භ භ භ

භවාංග ආරම්මණ ආදිය පෙර වීථීන්හි මෙනි.

මෙහි ජවන් නූපදී. අතීත භවාංග යගේ උත්පාදක්ෂණයෙහි උපන් ප්‍රසාද ආරම්මණයන් ගැටීමෙන් චිත්ත වීථිය උපදී.

### 8 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපනා වාරය)

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ භ අ අ අ අ අ අ අ අ න ද ප ච ස ණ වො වො වො භ භ භ

භවාංග ආරම්මණ ආදිය පළමු වීථීන්හි මෙනි.

මෙහි ජවන් නූපදී. අතීත භවංග යාගේ උත්පාදක්ෂයෙගි උපන් ප්‍රසාද ආරම්මණයෙන් ගැටීමෙන් චිත්ත වීථිය උපදී.

### 9 පරිත්තා රම්මණ චක්ඛු වාරික චිත්ත වීථිය (වොත්ථපන වාරව)

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ භ අ අ අ අ අ අ අ අ අ න ද ප ච ස ණ වො වො භ භ භ

භවාංග ආරම්මණ ආදිය පෙර වීථීන්හි මෙනි.

ජවන් නූපදී. අතීත භවාංගයෙහිදී උත්පාදක්ෂණයෙහි උපන් ප්‍රසාද ආරම්මණයන් ගැටීමෙන් චිත්ත වීථිය උපදී.

රූපයේ ආයු කාලය 1 සිට 17 ඉලක්කමෙන් පෙන්වා ඇත.

## 10 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝ වාරය)

හ හ අ අ අ අ අ අ අ අ අ අ න න හ හ හ හ හ හ හ

පංචවෝකාර භවාංග 15 න් එකකින් කර්මාදි නිමිති තුනෙන් එකක් අරමුණු කරයි.

ප්‍රථම අතීත භවාංගයාගේ උත්-පාදක්ෂණයෙහි උපන් ප්‍රසාද ආරම්මණ භවාංග චලනයට පසු පස්වෙනි භවාංගයාගේ භංගක්ෂණයෙහිදී නිරුඩ වේ.

## 11 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝවාරය)

හ හ අ අ අ අ අ අ අ අ අ අ අ න න හ හ හ හ හ හ

අරමුණු ආදිය පළමු වීථියෙහි මෙනි.

ප්‍රසාද ආරම්මණයන්ගේ ගැටීමද පළමු වීථියෙහි මෙනි.

## 12 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝවාරය)

හ හ අ අ අ අ අ අ අ අ අ අ අ අ න න හ හ හ හ හ හ

අරමුණු ආදිය පළමු වීථියෙහි මෙනි.

ප්‍රසාද ආරම්මණ යන්ගේ ගැටීමද පළමු වීථීන්හි මෙනි.

## 13 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝවාරය)

හ හ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ න න හ හ හ හ

අරමුණු ආදිය පළමු වීථීන්හි මෙනි

ප්‍රසාද ආරම්මණයන්ගේ ගැටීමද පළමු වීථීන්හි මෙනි

## 14 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝවාරය)

භ භ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ න න අ අ

අරමුණු ආදිය පළමු වීථීන්හි මෙනි.

ප්‍රසාද ආරම්මණයන්ගේ ගැටීමද පළමු වීථියන්හි මෙනි.

## 15 අති පරිත්තා රම්මණ චිත්ත වීථිය (මෝඝවාරය)

භ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ අ න න භ භ

අරමුණු ආදිය පළමු වීථීන්හි මෙනි.

ප්‍රසාද ආරම්මණයන්ගේ ගැටීමද පළමු වීථීන්හි මෙනි.

වර්තමාන රූපාරම්මණය අරමුණු කොට උපදනා චිත්ත වීථී පසළොසකි. ආරම්මණයෙන් සහ ප්‍රසාදයෙන් එක් චිත්තක්ෂණයක් ඉක්මගිය අරමුණු ගන්නා වීථිය අති මහන්තා රම්මණ නමින් ඇති වේ. ඊට පසු ක්‍රමානුකූලව එක් එක් චිත්තක්ෂණය බැගින් ගෙවී ගිය අරමුණු ගන්නා වීථීන් මහන්තා රම්මණ නමින් වීථී දෙකක්ද, පරිත්තා රම්මණ වීථී සයක් සහ අති පරිත්තා රම්මණ වීථී 6 ක් වසයෙන් (වීථී සිත් එකකුදු නොඋපදනා වීථී සයක් දැයි,) චක්ඛු වාරයට අරමුණු ගැටීමෙන් උපදනා චිත්ත වීථී පසළොසකි. එසේම සෝත, ඝාණ, ජිව්හා, කාය යන වාරයන්හිද වර්තමාන අරමුණු ගැටී උපදනා චිත්ත වීථී සැත්තෑපහක් (75) ලැබේ. ඊට පසු එම අරමුණු අතීත වශයෙන් ගෙන මනො වාරයෙහිද තදනුවත්තක වීථී එක (1) ක් සහ සුබ මනෝවාර වීථී තුන (3) ක්ද ඇතිවීමෙන් අරමුණෙහි ඇලීම් කිපීම් ආදී ජවන් උපදනේය. (කර්ම රැස් කරන්නේය).

පඤ්ච ද්වාර වීථී අවසන්.

## අතිමහන්තා රම්මණ චිත්ත වීථිය හැඳින්වීම

ඉතා දිග චිත්ත වීථිය අතිමහන්තාරම්මණ චිත්ත වීථියයි. එහි චක්ඛු ප්‍රසාද රූපාරම්මණයන් ගැනද, විස්තර වන හෙයින් වඩාත් දික් වේ. මෙය චක්ෂුප්‍රසාද චිත්ත වීථියක් බැවින් ප්‍රසාද ආරම්මණයන් ගැනද විස්තර වෙයි.

## මනෝද්වාරික කාම ජවන වීථී

විඤ්ඤත්ති වශයෙන් අදහස් හැඟවීමේදී චිත්ත වීථි උපදින ක්‍රමය ටීකානුසාරයෙන් පෙන්වා ඇති ආකාරයයි. අත් පා හිස ආදිය සොළවා අදහස් හැඟවීමේදී ඒ චලනයන් දැකීමෙන් ප්‍රත්‍යුත්පන්න රූපාරම්මණය අරමුණු කොට චක්ඛුද්වාර වීථියක් උපදී. ඊට පසු අතීත වූ එම රූපාරම්මණය අරමුණු කොට එයට අනුව තදනුවත්තක නමින් මනෝද්වාර වීථියක්ද ඒ ශුද්ධ මනෝද්වාර වීථියට පසු විඥප්තිය දැනගන්නා වූ ශුද්ධ මනෝද්වාර වීථියක්ද නැවත මේ පුද්ගලයා මෙනම් දෙයක් කරවනු කැමැත්තේ යයි ඔහුගේ අදහස දැනගන්නා පස්වැනි මනෝද්වාරික වීථියක්දැයි චිත්ත වීථි 5ක් උපදී.

ඇමතුම් කරන ශබ්දය අරමුණු කොට ද මෙසේ වීථි 5 ක් උපදී. අර්ථය දැනගන්නා චිත්තවීථි සන්තතියක් ඇති වේ. ද්වාර පසටම මෙසේ චිත්ත වීථි ඇති වේ. සිත් ඉපදීම ඉතා සීඝ්‍රයෙන් වේගයෙන් මෙන් සිදු වේ. සිත් ඉපදීමේ වේගය පෙන්නුම් කිරීමට දක්වා තිබෙන උපමාව මෙසේය. අත්ලෙහි තල හා අබ ටිකක් තබා බලන කල්හි එහි තිබෙන තල ද අබද අත්ල ද එකවිට දකින්නාක් මෙන් පෙනුනේ වී නමුත් අත්ල දකින චිත්ත වීථි චක්ඛුද්වාර වීථියක් ද, මනොද්වාරික වීථි සන්තතියක් ද ඇති වී අත්ල දකින්නේ ය. ඒ සෑම වීථියක් අතරටම භවාංග ද ඇති වේ.

අබ දක්නා විටද චක්ඛුද්වාරික වීථියකින් දැකීම කරන්නේ ය. ඊට පසු තදනුවත්තක මනොද්වාරික වීථි කීපයක් ඉපද අබ යයි ද නිශ්චය කරයි. තල දක්නා විට ද එසේම චිත්ත වීථි

කීපයක් ඉපද තල දක්නා ලද්දේ යයි නිශ්චය කරයි. නමුත් දකින තැනැත්තාට වැටහෙනුයේ තලද අබද අත්ලද යන සියල් ලම එක වරටම දැකීම සිදු වූවක් ලෙසිනි. ඒ සෑම වීථියක් අතරට භවාංග ඇති වේ. සිතක ආයු කාලයද ඉතා කුඩා ක්ෂණයකි. එක චිත්තක්ෂණයක් තුල තවත් කුඩා ක්ෂණ තුනක් තිබේ. එය සිතේ උත්පාද ක්ෂණය, ඨිති ක්ෂණය හා භංග ක්ෂණයයි. මෙසේ කුඩා ක්ෂණ තුනක් සම්පූර්ණ වීමෙන් චිත්තක්ෂණයක් වෙයි. එසේ චිත්තක්ෂණ 17 ක් රූපයේ ආයු කාලයයි. නාම රූප දෙකෙහි ආයු කාලය මෙසේය.

මනොද්වාරික චිත්ත වීථි වලින් ද රූපයේ ආයු කාලය සම්පූර්ණව තිබියදීම චිත්තක්ෂණ 17 පවත්නා කල්හිම අරමුණු කරති. විභූතා රම්මණ චිත්ත වීථිවල එය පෙන්වා ඇත.

## 1 මනෝ ද්වාරික කාම ජවන විථි

### ප්‍රථම විභූතා රම්මණ වීථිය

වර්තමාන දෙවිසි රූපයන් ගෙන් එකක් අරමුණු කරති

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ භ භ භ

### 2 දුතිය විභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ භ භ භ

### 3 තතිය විභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ භ භ

### 4 චතුත්ථ විභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ

### 5 පංචම විභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ අ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ

මේ වීථි පසෙහි අරමුණ වර්තමාන දෙවිසි රූපයන් ගෙන් එකක් ම වේ විඥප්ති රූප 2ත් ලක්ෂණ රූප 4 ත් හැර රූප 22 යි. වර්තමාන වශයෙන් මනෝද්වාරයෙන් අරමුණු කරණ අවස්ථාව මේ වීථි 5 න් පෙන්වන්නේය.

අවිභූතා රම්මණ වීථිය උපදින ආකාරය නම් වර්තමාන දෙවිසි රූපය අරමුණු කොට අතීත භවාංග 6 ක් ඇතිව චිත්තවීථිය ඇතිවී තදරම්මණ නොමැතිව අවසන් වන වීථි 2 ක් ඇත්තේය. ඒ වීථි දෙක මෙසේ පෙන්නුම් කර තිබේ.

### 1 අවිභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

භ භ අ අ අ අ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ භ භ

### 2 අවිභූතා රම්මණ වීථිය

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

අ අ අ අ අ අ අ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ භ භ

සිතක කුඩාක්ෂණ තුන අතිමහන්තා රම්මණ වීථියේ පෙන්වා ඇත. එය බල දතයුතු මෙසේ මනෝද්වාරයෙහි වර්තමාන දෙවිසි රූපය අරමුණු කරණ විභූතා රම්මණ වීථි පස හා අවිභූතා රම්මණ වීථි 2 ද යන කාමජවන මනෝද්වාර වීථි 7යි.

එයින් අන්‍යවූ වීථි 2 ද වේ. වර්තමාන දෙවිසි රූපය හැර ඉතිරි චිත්තක්ෂණ 17 ආයුෂ නැති ධර්මයන් අරමුණු කරන විභූතා රම්මණ වීථි 1 ය. අවිභූතා රම්මණ වීථි 1 ය යන මේ වීථි 2 ය.

එහි විභූතා රම්මණ වීථියේ අරමුණ චිත්තක්ෂණ 17 ආයුෂ නැති අතීත, අනාගත, වර්තමාන කාලිකවූ කාම චිත්ත චෛතසික විඥප්ති රූප 2 ද, ලක්ෂණ රූප 4 ද, අතීත අනාගත කාලිකවූ ඉතිරි රූප 22 ද, යන මේ ධර්මයන් අරමුණු කොට අතීත භවාංග නැතිව වීථි සිත් ඉපද තදලම්බන යට අනතුරුව භවාංග ඇතිවන විභූතා රම්මණ වීථියයි.

### 2 විභූතා රම්මණ වීථිය

භ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ ත ත භ භ

අවිභූතා රම්මණ වීථිය උපදින ආකාරය නම් කාලත්‍රයට අයත් සිත් 89 ද, චෛතසික 52 ද, විඥප්ති රූප 2 ද, ලක්ෂණ රූප 4 ද, ඉතිරි අතීත අනාගත රූප 22 ද, නිර්වාණය හා ප්‍රඥප්තියද යන මේ ධර්මයන් අරමුණු කොට තදලම්බන නො මැතිව ඉහත කී පරිදි වීථි සිත් ඉපද ජවනයට අනතුරුව භවාංග වන වීථියයි.

### 3 අවිභූතා රම්මණ වීථිය

භ භ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ භ භ භ

මේ වීථි දෙකෙහි ආයු කාලය අරමුණු වල චිත්තක්ෂණ 17 ක් නො ලැබේ. මෙසේ මනෝද්වාරයේ කාම ජවන වීථි 9 ලැබේ. විභූතා රම්මණ වීථි 6 ක් සහ අවිභූතා රම්මණ වීථි 3 ක් ද ලැබේ.

### කාම ජවන වීථි අවසන්

# මරණා සන්න චිත්ත වීථි

මරණාසන්න චිත්ත වීථි කාමජවන වීථීන්හිම ඇතුළත් වේ. චක්ඛු ද්වාරාදී ද්වාර පසේම සහ මනෝද්වාරයෙහි ද සතර ආකාරයක විථි ඇති වේ. වර්තමාන වසයෙන් දකින, අසන, ආඝ්‍රාණය කරන, රස විඳින, කයට සැප දුක් වශයෙන් දැනෙන දෙයක් අරමුණු වීමේදීම මරණය සිදු වෙති. බණ කියන ශබ්ද හෝ හැඬීමක් හෝ බුදු පිළිමයක්, සිවුරක් හෝ ඤාති මිත්‍රාදීන් හෝ එවැනි දෙයක් අරමුණ වී මරණය සිදු විය හැකිය. මෙසේ අරමුණ යහපත් එකක් හෝ අයහපත් එකක් කිරීම මරණාසන්න සත්වයා ළඟ සිටින අයට කළ හැකි උපකාරයයි.

එසේ මරණාසන්න චිත්ත වීථියට ලැබෙන අරමුණට අනුව ඊළඟ භවය සුගතිය හෝ දුගතිය වේ. මරණාසන්න ජවනය ගැන දැන ගැනීමේ ප්‍රයෝජනය එයයි. කළහැකි කළ යුතු උපකාරය එයයි. ඉතාමත් ප්‍රවේසම් වියයුතු තැනකි. පංචද්වාරයෙහි එක ද්වාරයක විථි 4 බැගින් 20 ක් වේ. මනෝද්වාරයෙහිද 4 ක් ලැබෙති. මරණාසන්න වීථි සටහන බලා දැනගත යුතු වේ.

මරණාසන්න වීථිය භව දෙකකට සම්බන්ධ වේ. එයයි භව දෙකක් එකට ගැලපීම වී භව දෙකක සම්බන්ධය වන්නේ එලෙසයි. සිත් පරපුර වැල නොකැඩී එකකට පසුව එකක් වශයෙන් සිත් ඉපදීමේ අතරක් නැවතීමක් සිදු නොවේ. එයයි සම්බන්ධය. ඈත අතීතයේ සිට සිත් පේලිය පැවත ගෙන ආවේ එලෙස යි. දම්වැලක එක පුරුකක් ළඟට තවත් පුරුකක් එකට ගැලපීමෙන් දිග දම්වැලක් සෑදීම මෙන්, සංසාරයේ චිත්ත පරම්පරාව අතර නොසිඳ පැවැතගන ඒම නිසා එක සත්වයෙක් එක අයෙක් සේ ගනී.

රූප පරම්පරාව සෑම ක්ෂණයකම නිරුද්ධ වෙමින් සැදෙමින් ඇති වෙමින් පවත්නේය. රූප ධර්මයන්ගේ ඇතිවීම, නැති වීම, බිඳීයාම නිසා භවයෙන් භවයට මාරුවීමක් පෙනෙන්නේය. මාරු වන්නේ රූප ධර්මයයි. නාම පරම්පරාව දිගටම නතර වීමක් නොවී අර්හත් චුතිය වන තුරුම පවතී. කුසලා

කුසල කර්මයන්ට අනුවම මාරුවීම වෙති. වස්තුව වැඩිපුර ඇති අය හොඳ සැප ඇති තැන්වල ස්ථානවල සිටිනවාය කීමෙන් තේරුම් ගත යුත්තේ පෙර භවයන්හි පින් කළ නිසා පින් නමැති වස්තුව රැස්කළ හේතුවෙන් එසේ සැප ලැබෙන බවයි. කුසල් කළ යුතු බව එයින්ද පෙන්නුම් කරයි. පින් නිසා සැප ලැබෙයි.

මරණාසන්න වීථි සියල්ලම කාම ලෝකයෙහි ලැබෙති. රූප ලෝකයන්හි ඝාණ, ජිව්හා, කාය වීථි නොලැබේ. තද ලම්බණ චුතියද නොලැබේ. අරූප ලෝකයෙහි මනෝද්වාරික වීථි ලැබෙති. තද ලම්බණ වීථීන් නොලැබේ. තමා පටිසන්ධි ගත් සිත සැම කෙනෙකුගේම භවාංග කෘත්‍ය සහ චුති කෘත්‍යයද කරති. සදකාලිකව සැම භවයකම එකම විපාක සිතකින් පටිසන්ධිය නොලැබෙති. එලෙස භවයේ පැවැත්ම සිදුවන්නේ නම් පින් පව් වලින් ප්‍රයෝජනයක් නොවිය හැකිය.

චුතිය සහ පටිසන්ධිය ගැන ධර්මයෙහි පෙන්වා තිබෙන ආකාරය නම් චුති සිත එම භවයේ අවසාන සිතයි. ඒ සිතට නැවත තවත් භවයක උත්පත්තියක් ලබාදීමට ශක්තියක් නැත. එක භවයක පටිසන්ධි ලබා දුන් සිතම නැවත නැවත භවාංග නමින් ඉපද ඒ භවය පවත්වාගන යාමට සිත් පරම්-පරාව නැවතී අවසන් වී මරණය සිදුවීමට ඉඩ සලසා නොදෙමින් භවාංග නමින් උපදී. උත්පත්ති ලබාදුන් සිතම භවය පවත්වා ගන යමින් නැවත නැවත උපදනා සිත බැවින් ඒ අර්ථයෙන් භවාංග යන නම ව්‍යාවහාර කරති. කෘත්‍ය වශයෙන් එක් එක් සිතකට අයත් කෘත්‍යයන් ද වෙන් වශයෙන් කෘත්‍ය සංග්‍රහයෙහි පෙන්වා ඇත. එබැවින් පටිසන්ධි ලබා දෙන විපාක සිත් සියල්ලටම ඒ සිතට අයිති වැඩ තුනක් තිබේ. එනම් පටිසන්ධි, භවාංග, චුති යන කෘත්‍ය තුන සැම පටිසන්ධි සිතකින්ම සිදු විය යුතුමය. ඒ චිත්ත නියාමයයි.

එලෙස පටිසන්ධි දුන් සිතින් භවාංග චුති දෙකක් සිදු විය යුතු සිඬාන්තයකි. ඊට පසු නැවත ඒ චුති සිත පටිසන්ධි දෙනවා යයි කීම ධර්ම විරෝධී විය හැකිය. එසේ ධර්මයෙහි පෙන්වා නැත. එක කර්මයකින් පටිසන්ධි කීපයක් ලැබෙන ආකාරය පෙන්වා නැත. එක කර්මයකින් එක පටිසන්ධියක්

දී පසුව ප්‍රවෘත්ති විපාක කීපයක් ලැබිය හැකි බවයි ධර්මයෙහි පෙන්වන්නේ. ඒ න්‍යාය ධර්මයට අනුව වුවත් චුති සිතින් නැවත පටිසන්ධියක් දීමේ හැකියාවක් තිබිය නොහැක. එසේ චුති සිතට අනුව නැවත පටිසන්ධි ලබනවා නම් එම භවයේම සතර අපායේ නම් එහිම උපත ලැබීමත් සුගති භවයක නම් එහිම ඉපදීමත් වේ. පින් වලින් ප්‍රයෝජනයක් නැති විය හැකිය. කුසල් අකුසල් ගැන සැලකීමක් නැති වීමටද ඉඩ ඇත. මොනවා කළත් කමක් නෑ කියා සිතිය හැකිය. බුදු දහමෙහි වදරන ලද මිථ්‍යා දිට්ඨියකට අයත් වෙයිද?

මලගිය අයට පින් දීමෙන් වැඩක් නැති වී යයිද ? මුගලන් මහ රහතන් වහන්සේට අතීත සංසාරයේදීම මව් මැරූ අකුසලයට එක පටිසන්ධියක් අපායෙහි ලබා දී ඊට පසු ප්‍රවෘත්ති විපාක රහත් වූවාට පසුවත් ලැබුවාය යන සිද්ධිය බණ පොතේ තිබේ. චුති සිතට අනුවම පටිසන්ධි විය යුතු නම් එලෙස අපායෙන් මාරු වන්නේ කෙසේද? සුගතියක ඉපදීම කෙසේ සිදුවීද? බෝසත් තේමිය කුමරු මහත් දුකක් වින්දේ පෙර භවයේ අපායේ දුක් ගැන දැනීම ඇති වූ නිසා යයි තේමිය ජාතකයෙහි කියා තිබේ. මෙලෙස චුති සිතට අනුව පටිසන්ධි නොගන්නා බව බුදු දහමට අනුව පෙන්වා තිබේ.

එලෙස පටිසන්ධි දුන් සිතින් භවාංග චුති දෙකක් සිදු විය යුතු සිද්ධාන්තයකි. (ඊට පසු නැවත ඒ චුති සිත පටිසන්ධි දෙනවායයි කීම ධර්ම විරෝධී විය හැකිය. එසේ ධර්මයෙහි පෙන්වා නැත. එක කර්මයකින් පටිසන්ධි කීපයක් ලැබෙන ආකාරය පෙන්වා නැත. එක කර්මයකින් එක පටිසන්ධියක් දී පසුව ප්‍රවෘත්ති විපාක කීපයක් ලැබිය හැකි බවයි ධර්මයෙහි පෙන්වන්නේ. ඒ න්‍යාය ධර්මයට අනුව වුවත් චුති සිතින් නැවත පටිසන්ධියක් දීමේ හැකියාවක් තිබිය නොහැක. එසේ චුති සිතට අනුව නැවත පටිසන්ධි ලබනවා නම් එම භවයේ ම සතර අපායේ නම් එහිම උපත ලැබීමත් සුගති භවයක නම් එහිම ඉපදීමත් වේ. පින් වලින් ප්‍රයෝජනයක් නැති විය හැකිය.

කුසල් අකුසල් ගැන සැලකීමක් නැති වීමට ද ඉඩ ඇත. මොනවා කළත් කමක් නෑ කියා සිතිය හැකිය. බුදු දහමෙහි වදරන ලද මිථ්‍යාදිට්ඨියකට අයත් වෙයිද?

මලගිය අයට පින් දීමෙන් වැඩක් නැතිවී යයිද? මුගලන් මහරහතන් වහන්සේට අතීත සංසාරයේදී මව් මැරූ අකුසලයට එක පටිසන්ධියක් අපායෙහි ලබා දී ඊට පසු ප්‍රවෘත්ති විපාක රහත් වූවාට පසුවත් ලැබුවාය යන සිද්ධිය බණපොතේ තිබේ. චුති සිතට අනුවම පටිසන්ධි විය යුතු නම් එලෙස අපායෙන් මාරුවන්නේ කෙසේද? සුගතියක ඉපදීම කෙසේ සිදුවී ද? බෝසත් තේමිය කුමරු මහත් දුකක් වින්දේ පෙර භවයේ අපායේ දුක් ගැන දැනීම ඇති වූ නිසායයි තේමිය ජාතකයෙහි කියා තිබේ. මේ මෙලෙස චුති සිතට අනුව පටිසන්ධි නොගන්නා බව බුදු දහමට අනුව පෙන්වා තිබේ.

(මෙම ඡේද දෙක කර්තෘගේ අදහස් අනුව ලියා ඇත.)

මරණාසන්න වීථි ප්‍රස්තාර කර පෙන්වා ඇත. එහි ජවනයට පසු චුතිය ද, ජවන භවාංගයට පසුව චුතියද, ජවන තද ලම්බනයට පසුව චුතියද, ජවන තදලම්බන භවාංගයට පසුව චුතියද, යන චිත්ත වීථි 4 ක් පඤ්චද්වාර මනොද්වාර දෙයාකාරයටම පෙන්වා ඇත. එයින් චුති පටිසන්ධි ආදිය ගැන සුළු වශයෙන් හෝ මේ කාරණය තේරුම් කර ගැනීමට හැකි වෙනවා ඇත. (චුති සිත හොඳ නම් පටිසන්ධියත් හොඳ යයි ගත හැකිද?) දෙව්දත් තෙරුන්ගේ චුති සිත වූයේ ඥාන සම්පයුත්ත මහා විපාක සිත් 4 න් එකකි. ධ්‍යාන ලාභී වූයේ එසේ ඥාන සම්පයුක්ත සිතකින් උපන් බැවිනි. ඔහුගේ ඊට පසු පටිසන්ධිය නිරයේ යි.

එය කෙසේ සිදුවී ද? චුති සිතට අනුව පටිසන්ධි නොලැබෙන බව මෙයින් පෙන්නුම් කරන්නේය. මරණාසන්න ජවනයට අනුව පටිසන්ධිය ඇතිවීම පිළිගැනීමට සිදු වෙති.)

(වර්තමානයේ ධර්ම දේශනාවන්හි චුති සිතට අනුව චුති සිත හොඳ නම් පටිසන්ධිය හොඳයයි ඇසෙන බැවින් මේ ටික ලියන්න සිදු විය.)

# මරණාසන්න චිත්ත වීථි සටහන්

## 1 වැනි චක්ඛු ද්වාරික මරණාසන්න චිත්ත වීථිය. (ජවන චුතිය)

භ අ න ද ප ච ස ණ වො ජ ජ ජ ජ ජ චු | ප භ භ 15 හෝ 16 ම ජ ජ ජ ජ ජ ජ ජ භ

මේ චුතියෙන් පසු අලුත් භවය

## 1 මනො ද්වාරික මරණාසන්න වීථිය (ජවන චුතිය)

භ භ භ | න ද ම ජ ජ ජ ජ ජ චු | ප භ 15 හෝ 16 ම ජ ජ ජ ජ ජ ජ ජ | භ

## 2 මනෝද්වාරික මරණාසන්න වීථිය (ජවන භවාංග චුතිය)

භ න ද ම ජ ජ ජ ජ ජ භ චු | ප භ 15 හෝ 16 ම ජ ජ ජ ජ ජ ජ ජ භ

## 3 මනෝද්වාරික මරණාසන්න වීථිය (ජවන තදරම්මණ චුතිය)

භ න ද ම ජ ජ ජ ජ ජ ත ත චු | ප භ 15 හෝ 16 ම ජ ජ ජ ජ ජ ජ ජ භ

## 4 මනෝද්වාරික මරණාසන්න වීථිය. (ජවන තදරම්මණ භවාංග චුතිය)

භ න ද ම ජ ජ ජ ජ ජ ත ත භ චු | ප භ 15 හෝ 16 ම ජ ජ ජ ජ ජ ජ ජ භ

මෙහි පංච ද්වාර වීථි වෙනුවට චක්ඛු ද්වාර වීථිය පෙන්වා ඇත. චක්ඛු ද්වාර වීථිය මෙන් සොතාදී ද්වාරයන් ගේ ද චිත්ත වීථි ඇති වී චුතිය වන්නේය. මනො ද්වාරයෙහි මෙන් පංචද්වාර වීථි වලදී ද එක ද්වාරයක වීථි සතර බැගින් ඇතිවේ. සියලුම සත්වයින්ගේ මරණාසන්න වීථි කාම ජවන වීථින්ය. රහතන් වහන්සේලාට මරණාසන්නයේ කාමාවචර ක්‍රියා ජවන් ඇතිවේ. සුගති දුගති දෙකෙහිම අසංඥතලය හැර සැම දෙනාටම කාම ජවන වීථියක් මරණාසන්න චිත්ත වීතිය වෙති. සුදුසු පරිදි පංචද්වාර හෝ මනොද්වාර වේ. කාමා වචර කුසල් හෝ ක්‍රියා ද, ලැබෙති අකුසල ජවන්ද ඇතිවේ. මේ ජවන් සුදුසු පරිදි ලැබේ.

## අර්පණා ජවන වීථි

අර්පනා ජවනයෝනම් මහද්ගත ජවන් සහ ලෝකෝත්තර ජවනයන්ය. මහද්ගත ජවන්—රූපාවචර කුසල් 5 ක් සහ ක්‍රියා 5 ක් වශයෙන් 10 ක් වේ. අරූපාවචර ජවන් කුසල් 4 ක් සහ ක්‍රියා 4 ක් වේ. මෙසේ මහද්ගත ජවන් සියල්ල 18 ක් වේ. ලෝකෝත්තර ජවන් සංක්ෂේප ක්‍රමයට 8 ක් ද විස්තර ක්‍රමයට (ධ්‍යාන ක්‍රමයට) එක එක ධ්‍යානයට ලැබෙන මාර්ගඵල සිත් 8 කි. සියල්ල කුසල් සිත් 20 ක් සහ ඵල සිත් 20 ක් ද වේ. මහද්ගත ජවන් 18 කි. මෙසේ සංක්ෂේප ක්‍රමයට සියල්ල 26 ක් වේ. විස්තර ක්‍රමයට සියල්ල 58 ක් වේ.

අර්පණා යන නාමය සියල්ලටම ව්‍යවහාර කළේ වී නමුත් චිත්ත වීථිවලදී බොහෝ ප්‍රභෙද ඇත්තේය. නුවණ අඩු වැඩි පුද්ගලයන්ගේ වශයෙන්ද, සමාපත්ති ආදී වශයෙන්ද, පළමුව ලැබීමේ ආකාරයෙන්ද, අභිඥා ආදීන්ගේ වශයෙන්ද, මාර්ග ඵල වශයෙන්ද, වෙන වෙනම වීථි ප්‍රස්තාර කර තිබේ. ඒ වීථීන්හි තදලම්බන නැත්තේය. අරමුණු ද විභූත අරමුණුම වේ. සියල්ල මනෝද්වාරික වීථීන්ම වේ.

අර්පණා ජවන් කොටස් දෙකක් වශයෙන් පෙන්වා තිබේ. සමථ භාවනාව, දියුණු කිරීමෙන් ලබන රූපාවචර අරූපාවචර අභිඥා වීථි ආදියද, විදර්ශනා භාවනාව දියුණු කොට ලබන මාර්ග ඵල වීථීන් ද, සමථ විදර්ශනා දෙකම දියුණු කොට ලබන නිරෝධ සමාපත්ති වීථියද වේ.

පළමුකොට ආදි කම්මික ධ්‍යාන වීථිය උපදින ආකාරය පෙන්වනු ලැබේ. සම සතළිස් කර්මස්ථාන අතුරෙන් දස කසිණාදී ධ්‍යාන ලබන කමටහනක් තෝරා ගෙන පූර්වකෘත්‍යාදිය සම්පූර්ණ කොට අරමුණ කෙරෙහි සිත පිහිටුවා භාවනා කිරීමේදී භාවනා අරමුණ සිතට මනාව පුරුදු වී චිත්ත සමාධිය දියුණු වීමෙන් කාමච්ඡන්දදී නීවරණ ධර්මයන් යටපත් කොට ධ්‍යාන අංග වන විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා යන

ධ්‍යාන අංග පහෙන් යුත් ප්‍රථම ධ්‍යානය ලබයි. ප්‍රථම ධ්‍යානය ලබන තැනැත්තා විසින් කළ යුත්තේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ ධර්ම යට කිරීමය. එය විෂ්කම්භන ප්‍රහාන වශයෙන් කලකට ඔබා තැබීමයි. නීවරණ ධර්මයක් මතු වූ වහාම ධ්‍යානය නැතිවෙයි.

එසේ ලබන ලද ධ්‍යානය තවත් හොඳට හුරු පුරුදු වීම සඳහා පංචවිධ වශීතාවන්ගෙන් වශී ප්‍රාප්ත කරන්නේ ය. ආවජ්ජන සමාපජ්ජන අධිෂ්ඨාන උට්ඨාන පච්චවෙක්ඛණ යන පස් ආකාරයෙන් ධ්‍යාන සිත හීලෑ කරන්නේය. ඊට පසු නැවත දෙවෙනි ධ්‍යානය සඳහා භාවනාව පෙරසේම කරන්නේය. ඊට පසු පිළිවෙලින් භාවනා කොට පංචම ධ්‍යානය දක්වා ධ්‍යාන උපදවයි. කැමති පරිදි අරූපධ්‍යාන ද ලැබිය හැකි වේ. ඊට සුදුසු භාවනාවන් දියුණු කිරීමෙන් අරූප ධ්‍යාන ද ලබන්නේ ය. මහද්ගත ධ්‍යාන සිත් කුසල් වශයෙන් පහක් තිබුනේ වී නමුත් චිත්ත වීථි සෑම ධ්‍යානයකටම වෙන වෙනම පෙන්වා නැත. මන්දපඤ්ඤ, තික්ඛ පඤ්ඤ, වශයෙන් ආදි කම්මික ධ්‍යාන වීථි දෙකක් සහ ධ්‍යාන සමාපත්ති වීථිය ද ප්‍රස්තාර කර පෙන්වීමෙන් ධ්‍යාන පහම පෙන්වයි. අරූපාවචර ධ්‍යානයන් ද, ඒ වීථින්ගෙන් තේරුම් කරගතහැකි වේ. ධ්‍යාන වීථි පෙන්වීමේ ක්‍රමයයි ඒ.

**තික්ඛපඤ්ඤ ආදිකම්මික ධ්‍යාන වීථි සටහන**

භ න ද ම උ අ ගො ධ්‍යා භ භ භ

**මන්දපඤ්ඤ ආදිකම්මික ධ්‍යාන වීථි සටහන**

භ න ද ම ප උ අ ගො ධ්‍යා භ භ භ

**ආදි කම්මික චිත්ත වීථිය ලැබෙන ආකාරය :**

ප්‍රථම ධ්‍යානය ලැබිය හැකි ප්‍රඥප්ති අරමුණු 25 කි. කසිණ 10, අශුභ 10, කේශාදි දෙතිස් කාය කොට්ඨාශ, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා, කරුණා, මුදිතාවන්ට අරමුණු වන සත්ව ප්‍රඥප්තියද යන 25 යි. එයින් තමා කැමති තමාට වැටහෙන

එකකින් සිත එකම අරමුණක පිහිටුවා සිත එහිම රඳවා නැවත නැවතත් එයම අරමුණු කරමින් සිටීමෙන් සිතට එය හොඳාකාර හුරු පුරුදු වී එහිම රඳවා සිටිය හැකි වේ. එය එසේ පුරුදු කොට චිත්ත සමාධිය ලබයි. නීවරණ ධර්ම සිතට නැග නොඑන තත්ත්වයේ චිත්ත සමාධිය ලැබීම ප්‍රථම ධ්‍යානය වන්නේය. ධ්‍යාන අංග පසෙන් යුත් සමාධිය ප්‍රථම ධ්‍යානයයි.

ඒ ප්‍රථම ධ්‍යාන සිත උපදිනුයේ භවාංග සිත නැවතීමෙන් පසු මනොද්වාරාවජ්ජන සිත ඉපද එය නිරුද්ධ වූවාට පසු කාමාවචර සොම්නස් ඥාන සම්පයුත්ත කුසල ජවනයක් පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ යන නම් වලින් ඉපද ඊට පසු ධ්‍යාන සිත උපදී. එසේ උපදනා කාම ජවනයන් වැඩ 3 ක් කරයි. පරිකර්මයෙන් ධ්‍යාන වීථිය පිළියෙල කරයි. උපචාර නම් සිත ධ්‍යාන ලැබීමට ලංවී සමීපචාරීව ඇති තත්ත්වයයි. අනුලෝම නම් ධ්‍යානය පැත්තට අනුලෝමව සිටී. ගෝත්‍රභූ නම් කාමාවචර ගෝත්‍රය මඩිමින් මහද්ගත ගෝත්‍රයට පැමිණීම සිදු කරයි.

රහතන් වහන්සේට කාමාවචර ක්‍රියා සිත් උපචාර ජවන් වශයෙන් උපදී. මේ මන්දපඤ්ඤ වීථිය උපදින ආකාර යයි. තික්ඛපඤ්ඤ වීථියෙහි පරිකර්ම කිරීමක් නොකොට නුවණ දියුණු පුද්ගලයෙක් බැවින් උපචාර අවස්ථාවෙන්ම ධ්‍යාන වීථිය පිළියෙල කරයි. එයයි වෙනස. ධ්‍යාන සමාපත්ති වීථියෙහි ධ්‍යාන සිත් තමා කැමති කාලයක් උපදවා ගන ධ්‍යාන සිතින් යුක්තව සිටීමයි. ධ්‍යාන සියල්ලම උපදනා චිත්ත වීථි මෙසේම වේ. ධ්‍යාන සිතේම පමණක් වෙනස ඇතිවන්නේ ය.

ඉහළ ධ්‍යාන ලැබීමේදී විතක්කයේ දෙස් දැක එය කාම ධර්මයන්ට ආසන්න යයි සලකා විතක්කය නැති කිරීමට විතක්කය නැති දෙවෙනි ධ්‍යානය ලැබීමට නැවතත් පෙර සේම භාවනා කොට සුදුසු අවස්ථාවෙහි දෙවෙනි ධ්‍යාන සිත විතක්කය නැතිව උපදී. උපචාර සමාධිජවන් සිත් 4 ලැබෙන තික්ඛපඤ්ඤයාට ධ්‍යාන ක්‍රමයට භාවනා කරන විට දෙවෙනි ධ්‍යාන සිත ලැබීමේදී විතක්ක නැතිව දෙවෙනි ධ්‍යාන සිත ලබයි. තතිය ධ්‍යානය ලැබීමට විචාරය පහකර තතිය ධ්‍යාන සිත ලබයි.

චතුත්ථ ධ්‍යානය රූපාවචර 4 වන ධ්‍යානයයි. එය ලබන විට ප්‍රීතිය නැති සුඛ ඒකග්ගතා යන ධ්‍යාන අංග දෙකෙන් යුත් ධ්‍යාන සිත ලබයි. පංචම ධ්‍යාන සිත උපෙක්ඛා ඒකග්ගතා යන ධ්‍යාන අංග දෙකින් යුක්ත වේ. අරූපාවචර ධ්‍යාන අංග වන්නේද උපෙක්ඛා ඒකග්ගතාවන්ය. උපචාර ජවන් පස්වෙනි ධ්‍යාන චිත්ත වීථියේ සහ අරූපාවචර ධ්‍යාන ලැබීමේදී ද උපචාර ජවන් උපෙක්ඛා සහගත ඥාන සම්ප යුත්ත කුසල ජවන් 2 න් 1 ක් වේ. රහතන් වහන්සේට උපෙක්ඛා සහගත ක්‍රියා ජවන් 2 න් 1 ක් වේ.

## ධ්‍යාන සමාපත්ති වීථිය

භ භ න ද ම අ අ අ ගො ඣා ඣා ඣා ඣා භ භ භ

ධ්‍යාන ලබා ගැනීම සඳහා අරමුණෙහි පිහිටා භාවනා කිරීම ය. එය සමථ භාවනායි. එය ආරම්මණ උපනිජ්ඣානයයි. අරමුණ වෙත එළඹ බැලීමයි. අරමුණෙහිම පිහිටා ධ්‍යාන සිත ලබයි.

ධ්‍යාන සිත් ශක්තිමත් කර ගැනීම සඳහා ද උවමනා වූ වහාම ඇතිකර ගැනීම සඳහා ද ''ඛිප්පනිසන්ති' යයි කියන වහා කැමති දේ මවා පෑමට ධ්‍යානය වසඟ කර ගන්නේය. එය තුදුස් ආකාරයකින් පෙන්වා තිබේ.

එසේ තුදුස් ආකාරයෙන් හුරු පුරුදු කර තමාට වසඟ කර ගත් ධ්‍යාන සිත වහාම තමා කැමති සේ ක්ෂණයකින් ඉපද විය හැකි බලය ''ඛිප්පනිසන්ති' බලයයි. එයින් රහතන් වහන් සේලා පවා බොහෝ ප්‍රයෝජන ගෙන තිබේ. ඉද්ධිමතුන් කෙරෙහි අග තනතුරු ලත් මුගලන් මහ රහතන්වහන්සේට නන්දෝපනන්ද නාගරාජයා පවා දමනය කළහැකි වූයේ මේ ධ්‍යාන බලයෙනි.

මිහින්තලාවේ භාවනායෝගීව සිටි ස්වාමීන් වහන්සේලාට උපස්ථාන කිරීමට නා ලොවින් පැමිණි මහණ වෙස් ගෙන සිටි නාග රාජයාව ඩැහැගෙන යාමට රාජාලියෙක් පැමිණියා. එවිට එහි සිටි කුඩා (රහත්) ස්වාමීන් වහන්සේ නමක් ගල් පර්වත-යක් මවා මහණ වෙස් ගෙන සිටි ස්වාමීන් වහන්සේව බේරා ගත්තා. මේ ගැන පැහැදුන අනෙක් වැඩිහිටි ස්වාමීන් වහන්-සේලා කුඩා (රහත්) ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කළා.

## මාර්ග වීථි

මාර්ග වීථි සංක්ෂේපයෙන් සතර වැදැරුම් වේ. සෝතාපත්ති මාර්ග වීථිය, සකදාගාමි මාර්ග වීථිය, අනාගාමි මාර්ග වීථිය අර්හත් මාර්ග වීථිය යන 4 යි. මන්දපඤ්ඤ පුද්ගල වීථිය, තික්ඛ පඤ්ඤ පුද්ගල වීථිය යන ක්‍රමයට පුද්ගල භෙදයෙන් එක මාර්ගයක් ලබන පුද්ගලයින් වශයෙන් මාර්ග වීථි දෙයාකාර වේ. නුවණ අඩු පුද්ගලයා සහ නුවණ වැඩි පුද්ගලයා යන දෙදෙනාම මාර්ග ඵල ලැබීම සිදු කෙරෙති. ඒ පුද්ගලයින්ගේ වශයෙන් සෝවාන් මාර්ග වීථි දෙකකි. එසේ මාර්ග සතරෙහිම එම ආකාරයට මාර්ග චිත්ත විථි 8 ක් ලැබෙති.

ධ්‍යාන ලාභි පුද්ගලයින්ගේ වශයෙන් ප්‍රථම ධ්‍යාන ලාභී මාර්ග වීථි 4 කි. මන්දපඤ්ඤ තික්ඛපඤ්ඤ භෙදය එහිදී ද ලැබෙති. ඒ අනුව ප්‍රථම ධ්‍යාන ලාභී සෝවාන් මාර්ග වීථි 8 ක් ලැබෙති. ධ්‍යාන සියල්ලටම එසේ ගත යුතු වේ. ධ්‍යාන භෙදය, පුද්ගල භෙදය ආදීන් ගෙන් එලෙස බෙදී වැඩි වන්නේය. මාර්ග 4 රේ වශයෙන් මාර්ග වීථි 4 වෙනස් නොවෙති. ලබන ක්‍රම වශයෙන් එසේ වැඩි වේ. මාර්ග සිත් ගණන එසේමය. අඩු වැඩි නොවේ. වරදවා නොගත යුතුය.

මාර්ග වීථිය යයි කීවත් ඵල සිතත් එහි ලැබෙති. මාර්ග සිතට අනතුරුවම අතරක් නොතබා ඵල සිත ලැබෙති. මන්ද පඤ්ඤ පුද්ගලයාට මාර්ග වීථියෙහි උපචාර සමාධි ජවන් වශයෙන් කාමාවචර ඤාන සම්පයුත්ත කුසල් සිත් 4 න් එකක් මාර්ග වීථියෙහිදී පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ වශයෙන් ඉපද ඊට පසු මාර්ග සිත ඇති වී ඒ ලහට ඵල සිත් 2 ක් ඇති වේ. නුවණ අඩුකම හේතු කොට උපචාර සමාධි ජවන් 4 ක් ලැබෙති.

තික්ඛපඤ්ඤ පුද්ගලයා උපචාර සමාධි ජවන් සිත් 3 ක් ඇතිවීමෙන් පසු මාර්ග සිත ලබා ඵල සිත් 3 ක් ලබයි. පරිකර්ම අවස්ථාවක් ඔහුට නොලැබේ. පරිකර්ම, නම් මාර්ග වීථිය පිළියෙල කිරීමය. උපචාරය, මාර්ගයට සමීප අවස්ථාවය. අනුලෝමය, මාර්ග සිතට ද අනුලොම්ව සිත පැවතීමය. සෝවාන් මාර්ග වීථියෙහි උපචාර සමාධි ජවන් සිත අනුලෝම නමින් ඉපද නිරුද්ධ වූවාට පසු ගෝත්‍රභූ සිත නිවන් අරමුණු කරමින් උපදී.

ඊට පසු මාර්ග සිත නිවන අරමුණු කරමින් ඉපදී නිරුද්ධ වූවාට පසු ඵල සිත් 3 ක් උපදී. මන්දපඤ්ඤ පුද්ගලයාට උපචාර සමාධි ජවන් 4 ට පසු මාර්ග ඵල ලබයි. ඵල සිත් 2 ක් ලැබෙති. ගොත්‍රභූ සිතින් නිවන අරමුණු කරති. එහෙත් කෙලෙස් කැපීමේ ශක්තියක් නැත. කාමාවචර සිතක් බැවිනි. ගොත්‍රභූ සිතින් පෘථග්ජන ගොත්‍රය මැඩලමින් ආර්‍ය්‍ය ගොත්‍රයට පමුණුවයි. මාර්ග සිතින් අනාදිමත් සංසාරයෙහි පැවත ආ චිත්ත සන්තානය අනුව පැවති සියලුම ක්ලේශයන්ගේ අපාය පටිසන්ධි ලබන තත්ත්වය විනාශ කරති. ඵල සිත් වැඩිය ලැබීම තික්ඛපඤ්ඤයාගේ නුවණ වැඩි නිසා සිදු වන්නකි. සෝවාන් මාර්ග සිතේ විපාක සිත වන සෝවාන් ඵල සිත් මන්ද පඤ්ඤයාට 2ක් ද තික්ඛපඤ්ඤයාට 3 ක් ද ඇති වේ. සෝවාන් මාර්ග සිතින් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන තුනද දිට්ඨි, විචිකිච්ඡා යන ක්ලේශ ධර්ම දෙකද දිට්ඨි සම්පයුත්ත ලෝභ මූල සිත් 4 ත් විචිකිච්ඡා සහගත සිතත් යන සිත් 5 ද, නැවත නූපදී. කාම භවයේ පටිසන්ධි ගැනීම 7 වාරයකට ද, සීමා කරයි. කාම භවයේ රැඳී සිටින්නේ 7 වාරයක් පමණි. රූප භවයෙහි අකනිට්ඨා බඹ ලොව දක්වා යත හැකිවේ. එවැනි අය ගැන ධර්මයෙහි සඳහන් වේ. අරූපලෝකයෙහි උපන්, සෝවාන් වූ ආර්‍ය්‍යයන් නැවත ආපසු වෙනත් ලෝකයකට නො පැමිණෙති. එහිම රහත් වී පිරිනිවන් පාන්නේ ය.

රූපී බඹලොව සෝවාන් වී සිටින අය හෝ, මෙහිදී සෝවාන් මාර්ග ඵලයන්ට පැමිණ එහි පටිසන්ධි ලබන ආර්‍ය්‍යයන්ද නැවත කාම ලෝකයේ පටිසන්ධි නොගනිති. අරූප ලෝකයේ සෝවාන් මාර්ග සිත නොලැබේ. ධර්මශ්‍රවණයට කන් දෙක නැති හෙයින්, සෝවාන් මාර්ග ඵල මෙහිදී ලබා එහි උපන් පසු ඉතිරි මාර්ග ඵල සම්පූර්ණ කර එහිම පිරිනිවන් පාන්නේය. සෝවාන් ඵලස්ථයා සමග ආර්‍ය්‍යයන් 7 දෙනෙක් සහ ත්‍රිහේතුක පෘථග්ජනයා සමග පුද්ගලයෝ 8 දෙනෙක් අරූප ලෝකයෙහි සිටිති.

රූපී බඹ ලොව ආර්යයන් 8 දෙනාම සිටිති. සෝවාන් මාර්ග ඵල යන්ට පැමිණි ආර්යයන්ට ප්‍රත්‍යවේක්ෂා චිත්ත වීථි 5 ක් ලැබෙති. සෝවාන් මාර්ග ඵලයන්ට පැමිණි ආර්යයන් නැවත සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් භාවනා කොට සකදගාමි මාර්ග ඵලයන්ට පැමිණේ. නැවත

විදර්ශනා භාවනාව දියුණුකොට අනාගාමි මාර්ග ඵලයන් ද ලබා ප්‍රත්‍යවේක්ෂාවන්ද කර නැවත භාවනා කර අර්හත් මාර්ග ඵලයන්ට පැමිණේ.

සකදගාමි වීමේදී කාමරාග, පටිඝ යන සංයෝජන ධර්ම දෙකෙහි ඝන බහල ගොරෝසු ගතිය වැනි තත්වය නැති කරයි. සම්පූර්ණයෙන් නැති කිරීමේ ශක්තියක් නැත. ක්ලේශ ශක්තිය එතරම් දරුණු වේ. අනාගාමි මාර්ගයේදී ඝන බහල බව අඩු කර දුන් ක්ලේශ ධර්ම වන කාමරාග, පටිඝ දෙක සම්පූර්ණයෙන් විනාශ කරයි. ඉන්පසු අර්හත් මාර්ග ඵලයන්ට පැමිණීමය. මෙසේ මාර්ග ඵල අවස්ථා තුනකදී දුර්වල කරන ලද ඉතිරි කෙලෙස් සියල්ලම රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිද්‍යා යන සංයෝජන ධර්ම පහ නැතිකර අග්ගදක්ඛිණෙය්‍ය වූ රහත් භාවයට පැමිණෙති. ඊට පසු කිසි තැනෙක බැඳීමක් පටිසන්ධි ගැනීමක් නොවේ.

සකදගාමීන් එක් වරක් කාමලෝකයේ පටිසන්ධි ලබන්නෝ ය. අනාගාමි වූවාට පසු කාම ලෝකවල උපදින කෙලෙස් තත්වය නැති වේ. රූපී බඹලොව හෝ ශුද්ධාවාසයෙහි හෝ උපදිති. ශුද්ධාවාසයෙහි පටිසන්ධි ගැනීමට තවත් සුදුසු කමක් අවශ්‍ය වේ. ශුද්ධාවාස පටිසන්ධි සිත විය යුත්තේ පංචමධ්‍යාන විපාක සිතයි. ඒ සිත ලබා ඇති ධ්‍යානලාභී අනාගාමීන්ට තමාගේ කැමැත්තට අනුව ශුද්ධාවාසයෙහි හෝ වේහප්ඵලයෙහි හෝ පටිසන්ධි ලැබිය හැක.

රහතන් වහන්සේට ප්‍රත්‍යවෙක්ෂ වීථි 4 ක් ලැබෙති. ඉතිරි කෙලෙස් ගැන ප්‍රත්‍යවෙක්ෂා කිරීමක් නැති බැවින් ඒ වීථිය හැර ප්‍රත්‍යවෙක්ෂා වීථි 4 ක් ලැබෙති. ඒ අනුව ආර්යයන් 4 දෙනාට ප්‍රත්‍යවෙක්ෂා වීථි සියල්ල 19 ක් ඇති වේ. ප්‍රත්‍යවෙක්ෂා වීථීන්හි උපදනේ කාම ජවනයන්ය. ප්‍රත්‍යවෙක්ෂා කිරීම මාර්ග ඵලයන්ගෙන් සිදු නොවේ. මාර්ග ඵල සිත්වල අරමුණ ඒකාන්තයෙන්ම නිවනය. වෙන යමක් මාර්ග ඵල සිත්වලින් අරමුණු නොකරයි. ප්‍රත්‍යවෙක්ෂා වීථීන්හිදී ඥාන සම්පයුත්ත මහා කුසල් සිත් 4 න් එකක් සුදුසු පරිදි යට ඵලස්ථයින් තුන්දෙනාට ඇති වේ.

රහතන් වහන්සේ ඥාන සම්පයුත්ත මහා ක්‍රියා සිත් 4 න් කැමති එකකින් ප්‍රත්‍යවෙක්ෂා කරයි. ධ්‍යාන නොලැබුවේ නම් තමා මාර්ග ඵල ලබා ඇති ආකාරයට සොම්නස් සිතකින් හෝ උපෙක්ඛා සිතකින් සිදුවේ. ධ්‍යාන ලබා ඇත්නම් පංචමධ්‍යාන ලාභී වී නම් උපෙක්ඛා ජවන් සිත් වලින් ප්‍රත්‍යවෙක්ෂා කරති. එසේ නොවේ නම් ප්‍රත්‍යවෙක්ෂා ජවන් සොම්නස් වේ. මේ ගැන පැහැදිලි ලෙස දැනගැනීමට ද්වත්තිංස ගාථාවෙහි විස්තර කර ඇත. අර්හත් මාර්ගයෙන් ඉතිරි අකුසල් සිත් වන ලෝභ මූල දිට්ඨි විප්පයුත්ත සිත් 4 ත් උද්ධච්ච සහගත සිතත් සියලුම ඕඝ යෝග ආදි අකුසල ධර්මත් නැති කරන ලද ක්ෂීණාශ්‍රව තත්වයට පැමිණේ. සියළු පූජාවන් ලැබීමට සුදුසු තත්වයට පත් උතුමෙක් වේ.

මාර්ග සිතට අනතුරුවම ඵල සිත් ලැබේ. මාර්ග සිතින් එක වරක් දකින ලද නිර්වාණ ධාතුව ඒ සමගම උපදනා ඵල සිත් වලින් ද අරමුණු කරයි. නැවත මාර්ග සිත නූපදනේය. මාර්ග සිතින් කළ යුතු දේ කර අවසන් වූ බැවින් මාර්ග සිත නැවත නූපදී. නැවත නිවන අරමුණු කිරීමේ කැමැත්තට අනුව ඵල සමාපත්ති වීථි ඇති වේ. එහි උපචාර සමාධි ජවන් වශයෙන් අනුලෝම සිත තුන්වරක් හෝ සතර වරක් ඉපද නිරුද්ධ වූවාට පසු තමා ලබා ඇති ඵලයට අනුව ඵල සිත් කැමති වේලාවක් ඇති වේ. මුළු දවසම හෝ ඵල සමාපත්තියෙන් සිටිය හැකිය. ධ්‍යාන සියල්ලම ලත් අනාගාමි රහත් උතුමෝ නිරෝධ සමාපත්ති සුවයෙන් සිතත් චිත්තජ රූපයනුත් නිරුද්ධ කොට මිනිස් ලොව දින 7 ක් සිටිති. රූපී බඹ ලොව කැමති කාලයක් සිටිති.

ධ්‍යාන නොලත් සුද්ධ විපස්සනාවෙන් මාර්ග ඵල ලත් උතුමන්ට නිරෝධ සමාපත්තිය ලැබිය නොහැක. මාර්ග ඵල ලබන ක්‍රම දෙකකි. සුද්ධ විපස්සනාවෙන් ක්ෂණික සමාධියක් ලබා විදර්ශනා භාවනාවම දියුණු කොට මාර්ගඵල ලබන ක්‍රමය සහ සමථ භාවනාවෙන් ධ්‍යාන ලබා ධ්‍යාන අංග ආදිය පාදක කොට ත්‍රිලක්ෂණයට නගා විදර්ශනා භාවනා කර මාර්ග ඵල ලබන ක්‍රමයද යන සමථ යානය හා විපස්සනා යානය යන දෙයාකාර යයි. ධ්‍යාන ලබා ඇති ආර්යයන් වහන්සේලා ඉද්ධි ප්‍රාතිහාර්‍ය පාන්නේය. බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්‍ය පෙළහර පා බොහෝ දරුණු අය දමනය කළ සේක. අධමාය වූ යක්ෂාදීන් ද දමනය කළ සේක.

මාර්ග චිත්ත වීථිය ඇති වී සිත් ඇතිවීම එකම ක්‍රමයකි. මාර්ග සිතට අනතුරුවම ඵල සිත් ලැබීම මාර්ග වීථි සියල්ලටම සාධාරණ වේ. ඵල සිත් සඳහා පසුව භාවනාවක් පෙන්වා නැත. මාර්ග ඵල ලබන ආකාර සමථ විපස්සනා වශයෙන් දෙකක් ය. නිවන් ලැබීමට භාවනා ක්‍රම 2 ක් තිබේ. අනන්ත තොටුපල වල් ඇති ගංගාවක් මෙනි සම සතලිස් කර්මස්ථාන ආදියෙන් ද පෙන්නුම් කර වදාළ සේක. සතිපට්ඨාන සූත්‍රයෙහි 21 තැනක අර්හත්වය පෙන්වා තිබේ.

## මාර්ග වීථි සටහන්

### මන්දපඤ්ඤ පුග්ගල සෝතා පත්ති මග්ග වීථිය

භ භ න ද ම රි උ අ ගො ම ඵ ඵ භ භ භ

... ... ... ... ... ... ... ... ... ... ... ... ... ... ...

පංචවෝකාර ත්‍රිහේතුක භවාංග 9 න් එකකි — ත්‍රිභූමික සංස්කාරාරම්මණය — නිර්වාණ ආරම්මණය — එම භවාංග මැයි

### තික්ඛපඤ්ඤ පුද්ගල සෝතා පත්ති මග්ග වීථිය

භ භ න ද ම උ අ ගො ම ඵ ඵ ඵ භ භ භ

... ... ... ... ... ... ... ... ... ... ... ... ... ... ...

පංචවෝකාර ත්‍රිහේතුක භවාංග 9 න් එකකි — ත්‍රභූමක සංස්කාරාරම්මණය — නිර්වාණාරම්මණය — එම භවාංග මැයි

මාර්ග වීථියෙහි මනොද්වාරාවජ්ජනයට පසුව උපදනා කාම ත්‍රිහේතුක ජවන් සිත් 4 පරිකර්ම, උපචාර, අනුලොම ගොත්‍රභූ යන නම්වලින් හඳුන්වනු ලැබේ. පරිකර්ම ආදී සිත් තුන හෝ දෙක සංස්කාර ධර්මයන් අරමුණු කරති. කෙලෙස්කැපීමක් (ප්‍රහානයක්) නොකෙරේ. මාර්ග සිතින් කලෙශ ප්‍රහානය කරයි. ඵලසිත් දෙකක් මන්දපඤ්ඤයාට නිවන අරමුණු කොට උපදී. තික්ඛ පඤ්ඤයාට නිර්වාණය අරමුණු කොට ඵල සිත් තුනක් උපදී.

### සකදාගාමි මාර්ග වීථිය

භ භ න ද ම ප උ අ වො ම ඵ ඵ භ භ

... ... ... ... ... ... ... ... ... ... ... ... ... ...

පංචවෝකාර ත්‍රිහේතුක භවාංග 9න් එකක් — ත්‍රභූමක සංස්කාරාරම්මණය — නිර්වාණය අරමුණු කරයි — එම භවාංග

සෝවාන් මාර්ග වීථියෙහි උපචාර සමාධි ජවන් උපදනා වීථියහි ගොත්‍රභූ සිතින් පෘථග්ජන ගොත්‍රය මඩමින් ආර්ය-ගොත්‍රයට පැමිනිවීම කරන අර්ථයෙන් ගොත්‍රභූ යයි නම් කරන ලද උපචාර ජවන් සිත සකෘදගාමී මාර්ගය ලැබීමේදී වෝදන යයි නම් කරනු ලැබීය. වොදන යනු පිරිසිදු යන්නයි. ආර්ය වූ සෝවාන් ඵලස්ථයාටයි දූන් ඒ සිත ලැබුනේ ආර්ය කෙනෙක් ලබන සිත පිරිසිදු සිතකි. පෘථග්ජන ගොතය මැඩ ආර්ය ගොත්‍රයට පැමිණි කෙනෙකි. අනිත් ඉහළ මාර්ග වීථීන්ද සකෘදගාමී චිත්ත වීථිය මෙන් ප්‍රස්ථාර කළයුතු වේ.

## ප්‍රත්‍ය වෙක්ෂා වීථි සටහන්

### 1 සෝතා පත්ති මග්ග ප්‍රත්‍ය වෙක්ෂා වීථිය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | හ | හ | හ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| ත්‍රිහේතුක භවාංග 9 න් එකකි. | | | | | | මාර්ගය අරමුණු කරයි. | | | | | | | එම භවාංග මැයි |

### 2 සෝතා පත්ති ඵල ප්‍රත්‍ය වෙක්ෂා වීථිය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | හ | හ | හ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| ත්‍රිහේතුක භවාංගයකි | | | | | | ඵලය අරමුණු කරයි | | | | | | | එම භවාංග මැයි |

### 3 නිබ්බාණ පච්ච වෙක්ඛණ වීථිය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | හ | හ | හ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| ත්‍රිහේතුක භවාංගයන්ගෙන් එකකි | | | | | | නිර්වාණය අරමුණු කරයි | | | | | | | එම භවාංග මැයි |

### 4 ප්‍රහීණ කිලෙස පච්ච වෙක්ඛණ වීථිය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | හ | හ | හ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| ත්‍රිහේතුක භවාංගයන්ගෙන් එකකි | | | | | | ප්‍රහීණ කිලෙස ආරම්මණයයි | | | | | | | එම භවංග මැයි |

### 5 අවසෙස ඉතුරු කිලෙස පච්ච වෙක්ඛණ වීථිය

හ න ද ම ජ ජ ජ ජ ජ ජ ජ හ හ හ

... ... ... ... ... ... ... ... ... ... ... ... ... ...

ත්‍රිහේතුක භවාංගයන්ගෙන් එකකි — අවසෙස කිලෙස රම්මණය — එම භවංග මැයි — { මේ වීථිය රහතන් වහන්සේලාට නොලැබෙති

සෝවාන් ආදී මාර්ග ඵල ලාභීන්ට ප්‍රත්‍යවෙක්ෂා වීථි 5 බැගින් 15 ක් ද රහතන් වහන්සේට ඉතුරු කෙලෙස් නැති බැවින් ප්‍රත්‍ය වෙක්ෂා වීථි 4 ක්ද සියල්ල ප්‍රත්‍ය වෙක්ෂා වීථි 19 ක් ලැබෙති.

## අභිඤ්ඤා වීථිය

අභිඥ වීථි නම්. විශේෂ වසයෙන් දැනගන්නා අර්ථයෙන් අභිඥ නම් වේ. එය 7 ත් වැදෑරුම් වේ. දිබ්බ චක්ඛු අභිඥ වීථිය, දිබ්බ සෝත, ඉද්ධිවිධ, පරචිත්ත විජානන. පුබ්බේ නිවාසා නුස්සති, යථාකම්මූපග, අනාගතංස අභිඥ වීථිය යයි සත් වැදෑරුම් වේ. මේ සත් වැදෑරුම් අභිඥවන් මහද්ගත ලෝකෝත්තර වීථීන්හි ඇතුළත් වේ.

ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්තවිජානන, පුබ්බේ නිවාස, දිබ්බ චක්ඛු යන පස ලෞකික අභිඥ නම් වන්නේය. මේ ධ්‍යානයන් ලබනු සඳහා, අභිඥ පාදක පංචම ධ්‍යානයෙන් නැගී සිට කසිණානුලෝමාදී තුදුස් ආකර චිත්ත දමනය ඇතිව කුමාර රූපාදිය නිර්මිත කිරීම සඳහා කැමතිසේ රූපාවචර පංචම ධ්‍යානය පාදක කොට පඨවි ආදී කසිණාදියක් අරමුණු කොට ඇති පංචමධ්‍යානයෙන් නැගිට තුදුස් ආකාරයෙන් පඨවි කසිණ යෙහි පටන් කසිණයන්ට සමවැද චිත්ත දමනය කොට ඉද්ධිවිධ ඥනයාගේ පරිකර්ම ජවන් උපදින කල්හි නිර්මිත කිරීම ඉධිය යුතු. කුමාර රූපාදිය ආවර්ජනා කොට රූපය ද, වෙනයමක් ශබ්දදියක් හෝ අරමුණු කොට කැමති පරිදි කරන්නේය.

රූපය අරමුණු කොට දස දෙනෙක් සිය දෙනෙක් ආදිය අධිෂ්ඨාන කර මවා පෙන්විය හැකි වේ. මේ පංචවිධ අභිඥ වන්ගෙන් රූපාදී අරමුණු වූ ෂඩා ලම්බනයෙන්ම අරමුණු කල හැකි වේ.

දිබ්බ චක්ඛු අභිඥා වීථිය සඳහා අෂ්ඨ සමාපත්තිලාභී පුද්ගලයන් දුර වූ හෝ ලඟ වූ හෝ වැසුනාවූ හෝ යමක් දකිනු කැමැත්ත ඇතිවූ කල්හි තේජෝ කසිණය හෝ, ඕදාත කසිණය හෝ ආලෝක කසිණය හෝ අරමුණ කොට පංචම ධ්‍යානයට සමවැදීමෙන් එම පාදක ධ්‍යානයෙන් පසුව නො දක්නා රූපය අරමුණු කොට අසවල් රූපය දකින්නෙමියි ඉටීමෙන් කාමාවචර මනොද්වාර වීථි ඇතිවේ ඒ පරිකර්ම වීථි වශයෙනි. ඊට අනතුරුව ඕදාතාදී කසිණ තුනෙන් එකක් අරමුණු කොට පංචම ධ්‍යානයට සමවදිනු ලැබේ. එය අභිඥා පාදක ධ්‍යාන වීථියයි. ඊට අනතුරුව ඉටන ලද වර්තමාන රූපය අරමුණු කොට පිරිසිදු විශේෂ දැකීමෙන් යුත් පංචමධ්‍යාන අභිඥා වීථිය ධ්‍යාන ජවන යෙන් යුක්තව ඇතිවේ. මෙසේ වීථි සතරක් ඇති වන්නේය. ඉතිරි අභිඥා වීථි 6 ද එසේම ප්‍රස්ථාර කළ යුතු වේ.

## දිබ්බ චක්ඛු අභිඥා වීථි සටහන

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | න | ද | ම | ප | උ | අ | ගෝ | ඥා | භ | භ | භ |
| ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo |

අසුවලාගේ හෝ අසුවල් ශබ්දය හෝ අසන්නෙමි. දිබ්බ සෝත අභිඥාව ද, සියයක්. දහසක් ආදී වීම සඳහා ඉද්ධිවිධ අභිඥාවට ද, අසුවලාගේ සිත දැනගනිමි ය යි පරචිත්ත විජානන අභිඥාවට ද, පෙර විසූ ස්කන්ධ පරම්පරාව දැනගැනීම සඳහා පුබ්බේනිවාස නුස්සති අභිඥාවටද, අතීත කර්ම ආදිය දැනගැනීම සඳහා යථාකම්මූපග අභිඥාවටද, අනාගත ස්කන්ධ පරම්පරාව දැනගැනීම සඳහා අනාගතංස අභිඥාවටද පැමිණේ. එයට පිළිවෙලින් අධිෂ්ඨාන කළ යුතු වේ. පරිකර්මය සමාන වන හෙයින් අනාගතංස අභිඥාව සහ යථාකම්මූපග අභිඥාවද දිබ්බචක්ඛු අභිඥාවෙහිම ඇතුලත් වේ.

ධ්‍යාන පිළිවෙලින් ප්‍රථම ධ්‍යානයෙහි සිට අවසානයට සම වැදීම නම් වූ අනුලොම එකකි. අවසානයේ සිට ප්‍රථම ධ්‍යානය දක්වා සමවැදීම පටිලොම එකකි. මුල සිට අගටත් අග සිට මුලටත් අනුලෝම පටිලෝම එකකි. ප්‍රථම ධ්‍යානයට සමවැද දෙවැන්න අත්හැර තුන්වන ධ්‍යානයට සමවැදීම නම් වූ ධ්‍යානුක්කන්තක එකකි. කසිණ යන්ද එකක් හැර එකකට සමවැදීම නම් වූ කසිණුක්කන්තික එකකි. ධ්‍යානයද කසිණයද යන දෙකම එකක් හැර සමවැදීම ධ්‍යානුක්කන්ත, කසිණුක්කන්ත එකකි. ධ්‍යාන මාත්‍රයක් ඉක්මවා අරමුණ නො ඉක්මවා එකම කසිණයෙහි ධ්‍යාන අංග පසට සමවැදීම වූ අංගසංකන්තිකය එකකි. එක එක ධ්‍යානය හා කසිණ අරමුණ ඉක්මවා සමවැදීම වූ ආරම්මණ සං-කන්තිකය එකකි. ධ්‍යානයද ආරම්මණය ද ඉක්මවමින් සම වැදීම වූ ධ්‍යානාරම්මණ සමතික්කමනය එකකි. ධ්‍යාන අංගයන් නියම කොට සමවැදීම වූ අංගව්‍යවස්ථාපනය එකකි. මේ පඨවි කසිණ යයි ද නිශ්චය කොට ආපො කසිණ යයි ද නිශ්චය කොට එසේ ඕදාත කසිණය යි ද ආරම්මණ මාත්‍රයක්ම ව්‍යවස්ථා පනය එකකි. මේ තුදුස් ක්‍රමය චිත්ත පරිදමන ආකාර තුදුස යයි දත යුත්තේ ය.

ඉද්ධිවිධ ඥානය පරිකර්ම කිරීමෙහි දී පරිකර්මාදි ජවනයන් ගෙන් සිය ගණන් කුමාර රූපාදිය ආවර්ජනය කොට රූපය ද, දිබ්බ සෝත ඥානය පරිකර්ම කරන ජවනයන්ගෙන් ලොකු කුඩා ශබ්දයන්ද, චෙතොපරිය ඥානය සඳහා පරිකර්ම ජවනයෙන් අන්‍යයන්ගේ වස්තු රූපය ඇසුරු කොට පැවති ලේ වර්ණය දැකීමෙන් රාගාදී සිත් උපදනා බවද, පුබ්බෙනිවාස ඥානය සඳහා පරිකර්ම කරන කල්හි චුති සිත් ආදී පෙර භවයන් ද, දිබ්බචක්ඛු ඥානය සඳහා පරිකර්ම කාලයෙහි දී ආලෝකය පතුරුවන ලද ස්ථානයෙහි රූපය හා අන්‍යයන්ගේ සිත් ආදියද ගැනේ. ඉද්ධි විධ ඥානයට ෂඩාරම්මණයම අරමුණු වෙත්.

දිබ්බ සෝත ඥානයට ප්‍රත්‍යුත්පන්න ශබ්දය අරමුණුවෙත්. පරචිත්ත විජානන ඥානයට අතීත අනාගත යන්හි සත් දවසක් ඇතුළත වූ කාමාවචර සිතක් අරමුණු වේ. අෂ්ට සමාපත්ති නොලත් පුද්ගලයින්ට තුදුස් ආකාර චිත්ත දමනය ද නැති හෙයින් අභිඥා නොලැබෙන්නේය. පෘථග්ජන, සෝවාන්, සකෘදාගාමි, අනාගාමීන්ට කුසලාභිඥාව ද රහතුන්ට ක්‍රියා අභිඥාවද ලැබෙන් නේය. බුදුරජාණන් වහන්සේට යමක පාටිහාරිය ආදියෙහිදී ද ක්‍රියා අභිඥාවම ලැබෙන්නේ ය.

# නිරෝධ සමාපත්ති වීථිය

නිරෝධ සමාපත්තිය උපදින ආකාරය නම් :

අෂ්ට සමාපත්ති ලාභී අනාගාමී රහත් යන ආර්‍යයන් වහන්සේලා තමාගේ පංචස්කන්ධය කෙරෙහි කලකිරීමෙන් මෙලොවදීම නිවන් සුව විඳීම සඳහා ප්‍රථම ධ්‍යානයට සමවැදී, ඉන් නැගිට ඒ ධ්‍යානයට පසු සංස්කාර ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කොට විදර්ශනා වශයෙන් මෙනෙහි කොට මේ ක්‍රමයෙන් ද්‍විතිය, තතිය ආදී රූප ධ්‍යාන වශයෙන් ද අරූප ධ්‍යාන වශයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය දක්වා ඒ ඒ ධ්‍යානයට සමවදිමින් මෙනෙහි කරමින් ගොස් ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙන් පසුව පූර්ව කෘත්‍ය වශයෙන් සතරාකාර යකින් යුතු අධිෂ්ඨාන කරන්නේ ය.

අධිෂ්ඨාන සතර — නානාබද්ධ අවිකොපනය, සංඝපතිමානනය, සත්ථුපක්කොසනය, අද්ධාන පරිච්ඡේදය යන සතර පූර්ව කෘත්‍ය වශයෙන් අධිෂ්ඨාන කරනු ලැබේ. එය එම යෝගී පුද්ගලයා හට කාමාවචර ඥානසම්පයුත්ත චිත්ත වීථි ඇති වන්නේ ය. මනොද්වාර වීථිම ඇතිවන්නේය. රූප භූමියෙහි නම් මේ සිවුකිස ඉටීමක් නොකරන්නේය. ඊට පසු නෙවසඤ්ඤා නාස සඤ්ඤායතන ධ්‍යානයට සමවදිනු ලැබේ. එහි දී අනාගාමී ඵලස්ථයාහට එම කුසල ජවනය දෙවරක් ද,අර්හත් ඵලස්ථයාහට එම කිරිය ජවනය දෙවරක් ද ඉපද නිරුද්ධ වූ පසු කාම භූමියෙහි නම් සත් දවසක් කාලය මුළුල්ලෙහිද, රූපාවචර භූමියෙහි නම් කැමති කාලයක් ද චිත්ත චෛතසික චිත්තජ රූප නිරුද්ධකොට සිටිය හැකිය. කාම ලෝකයෙහි නම්: කර්මජ, ඍතුජ, ආහාර රූපයන්ගෙන් ද,රූප ලෝකයෙහි නම්: කර්මජ, ඍතුජ යන රූප දෙකොටසින් ද විසිය හැකි වේ. එයින් නැගී සිටි විට අනාගාමී ඵලස්ථයින් හට අනාගාමී ඵල ජවනයද, අර්හත් ඵලස්ථයින් හට අර්හත් ඵල ජවනය ද එක් වරක් බැගින් ආවර්ජනයෙන් තොරව ලැබෙන්නේය. ඊට පසු භවංග වන්නේ ය.

නානාබද්ධ අවිකොපනය නම් : තමාගේ ශරීරයට සම්බන්ධ නැති සියලු පිරිකර ආදිය වෙයන් ආදී සතුන් ගෙන් හෝ ජල, ගිනි ආදියෙන් හෝ විනාශ නොවේවා යයි අධිෂ්ඨාන කිරීමය. සත්දින ඇතුලත.

සංඝපති මාන්නය නම්—සංඝයා වහන්සේට යම්කිසි විනය කර්මාදියක් සඳහා තමා උවමනා උවහොත් කැඳවා යාමට පෙර යන්ට ලැබේවා යයි සිතීමය. සංඝ ආඥව සංඝ කර්ම ආදිය එතරම් ගරු වන්නේය.

සත්ථුපක්කොසනය නම් : ශාස්තෘන් වහන්සේට යම්කිසි අර්ථෝත්පත්ති දේශනාවක් කිරීම සඳහා හෝ විනය ප්‍රඥප්තියක් පැනවීම සඳහා හෝ සංඝයා කැඳවන්නේ නම් දූතයෙක් නො එවාම යන්ට ලැබීමය. දූතයෙක් එවන්ට ප්‍රථම යන්ට ලැබේවා යයි ඉටීමය.

අද්ධාන පරිච්ඡෙද නම් : නිරෝධ සමාපත්තියට සමවැද සිටින 7 දවස ඇතුලත ජීවිතය පවත්නේද යි බලා සමවැදීමය. ජීවිතය නො පවත්නේ නම් නිරෝධ සමාපත්තියට නුසුදුසු ය. එසේ සමවදින්නේ නැත.

නිරෝධ සමාපත්ති චිත්තවීථිය

නිරෝධ සමාපත්ති
දවස් 7 ක කාලය

චිත්ත චෛතසික චිත්-
තජ රූපයන් නැවැත්ම

භ භ භ න ද ම ප උ අ වො ඣා ඣා | | එ භ භ භ

අරමුණ } පංචවොකාර අකිඤ්චඤ්ඤායතන
කර්ම දියය } ත්‍රිහේතුක කුසල හෝ ක්‍රියා
භවංග 9න් 1කි අරමුණ

දවස් 7 ක කාලය මුලුල්ලෙහි චිත්ත චෛතසික හා චිත්තර රූපයන්ගේ නො පැවැත්ම වේ.

## ආර්පණා ජවන වාරය

ජවන් සිත් සියල්ල 55 ද වේ. ඉන් අකුසල ජවන් මේ ගාථාවෙහි අර්ථය ප්‍රකාශ කිරීමට නොගනී. අර්පණා ජවන් විස්තර කිරීමේදී වුවත් කාමාවචර මහා කුසල ඥාන සම්ප්‍රයුත්ත සිත් 2 ද සුඛ පුඤ්ඤම්හා යන්නට ඇතුලත් වේ. උපෙක්ඛා ඥාන සම්පයුක්ත සිත් ද ඇතුලත් වේ. මේ ගාථාවෙන් පෙන් වන්නේ අර්පණා ජවන් සිත් වලට ඇතුළත් වන ධ්‍යාන ජවන් සහ මාර්ග ඵල ජවන්ය. ඒවා පෙන්වීමට පළමුව ඒ ඒ සිත් ඇතිවන චිත්ත වීථි වල සහ සිත් ඇතිවන පුද්ගලයන්ගේ වශයෙන් ද, යන දෙයාකාරයකට පෙන්වයි. එසේ ආර්පණා ජවන් ඇතිවීමට එම චිත්ත වීථිවල පළමුව කාමාවචර ඥාන සම්පයුක්ත කුසල් සිත් 4 න් තැනට සුදුසු එක සිතක් මනොද්වාරා වජ්ජනයට පසුව පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ ආදී වශයෙන් ඇතිවේ. ඊළඟට ආර්පණා ජවන් සුදුසු පරිදි ඇතිවේ. තික්ඛපඤ්ඤ පුද්ගලයාට පරිකර්ම සිතක් නූපදනේය. ඒ විස්තර චිත්ත වීථි බලා දැනගත හැකි වේ. මේ ගාථාවයි විස්තර වන්නේ.

ගාථාව

''ද්වත්තිංස සුඛ පුඤ්ඤම්හා — ද්වාදසො පෙක්ඛ කාපරං
සුඛිතක්‍රියතො අට්ඨ — ඡ සම්භොන්ති උපෙක්ඛකා
පුථුජ්ජනා න සෙක්ඛානං — කාමපුඤ්ඤ තිහේතුකා
ති හේතු කාම ක්‍රියතො — වීතරාගා නමප්පණා.''

දැන් චිත්ත වීථියක සිත් ඇතිවන ආකාරයට මෙය විස්තර වේ. සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් දෙකෙන් එකක් උපාචාර ජවන් වශයෙන් ඉපද ඊටපසු ලැබෙන අර්පණා සියල්ල 32 කි. උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුත්ත කාමාවචර කුසල් සිත් දෙකට පසුව ලැබෙන අර්පණා සියල්ල 12 කි. මේ සිත් 32 න් සහ 12 න් එකක් එක අවස්ථාවක ලැබෙන්නේ ය. (සිත් 32 සහ 12 දැක්වීම) සුඛ සහගත අර්පණා ජවන් වලට පළමු සොම්නස් කාම ජවනයක් ද උපෙක්ඛා සහගත අර්පණා ජවනයට පළමු උපෙක්ඛා කාම ජවනයක් ද ඇති වේ. වේදනාව සමාන විය යුතු බැවින් එසේ වේ. පළමු දෙපදයයි. මේ.

සොම්නස් කාමජවනයට පසු සුඛ සහගත ධ්‍යාන ජවන් 4 න් එකක් හෝ ධ්‍යාන ක්‍රමයට මාර්ග ඵල ජවන් සුඛ සහගත (අර්හත් ඵලය හැර) සෝවාන් ආදී මාර්ග සිත් 16 හා ඵලයින් 12 ද යන සිත් 28 න් එකක් හෝ එක වීථියක උපදනේය. එසේ මෙ ආර්පණ ජවන් 16+12+4=32 සුදුසු පරිදි ලැබේ.

ඊළඟ පද දෙකෙහි අර්ථයෝ නම් :—ප්‍රථග්ජනයාට සහ සෙක්ෂයින් 7ත් දෙනාට ත්‍රිහේතුක කාම කුසලයක්ද අශෛක්ෂ වූ රහතන් වහන්සේට ත්‍රිහේතුක කාම ක්‍රියා සිත් 4 න් එකක් සුදුසු පරිදි වේදනාව සමාන වන පරිදි ලැබෙන්නේ ය. මුල දෙපදයෙහි ද ප්‍රථග්ජනයා සහ ආයර්‍යයන් ද ඇතුළත් වේ.

සුඛිත ක්‍රිය තො අට්ඨ — ජ සම්භොන්ති උපෙක්ඛකා
ත්‍රිහෙතු කාම ක්‍රිය තො — වීතරාගා න මප්පණා.

—සොම්නස් සහගත කාමාවචර ක්‍රියා ජවන් 2 ට පසුව ධ්‍යාන ජවන් 4 ද
—සොම්නස් සහගත අර්හත් ඵල ජවන් 4 ද යන ධ්‍යාන ක්‍රියා ජවන් 4 සහ 8 යි.
—උපෙක්ඛා සහගත කාමාවචර ක්‍රියා ජවන් 2 ට පසුව ධ්‍යාන ක්‍රියා 5 ද
—උපෙක්ඛා සහගත අර්හත් ඵල ජවන් 1 ද යන 6 යි.

මෙහි ධ්‍යාන ලාභී ප්‍රථග්ජනයා සහ ධ්‍යාන ක්‍රමයට මාර්ග ඵල ලාභී ආයර්‍යයන් වහන්සේලා 8 දෙනාටම — අර්පණ ජවන් ඇතිවන ආකාරය පෙන්වන්නේය. අර්පණ ජවනයන් ප්‍රකට අරමුණු ඇත්තේ වේ. තදලම්බන එම වීථිවල නූපදනේය. උපචාර ජවනයන් තික්ඛපඤ්ඤ පුද්ගලයාට 3 ක් ද මන්දපඤ්ඤ පුද්ගලයාට 4 ක් ද ඇති වේ. උපචාර ජවන් කාමාවචාර කුසල් ඥාන සම්ප්‍රයුක්ත 4 සහ, ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත 4 යන සිත් 8 ට ලැබෙති. ප්‍රථග්ජනයාට සහ ශෛක්ෂයින් 7 දෙනාට කුසල් සිත් ද, රහතන් වහන්සේට ක්‍රියා සිත් ද උපචාර ජවන් වශයෙන් උපදී.

අර්පණා ජවන් වශයෙන් රූපාවචර අරූපාවචර කුසල් 9 ත් ක්‍රියා සිත් 9 ත් යන 18 ද, ලෝකෝත්තර ජවන් 8 ද යන 26 සංක්ෂේප ක්‍රමයයි. විස්තාර ක්‍රමයට ලෝකෝත්තර ජවන් 40 කි. මහද්ගත ජවන් 18 සමග විස්තාර ක්‍රමයට 58 ක් වේ.

ද්වත්තිංස සුඛ පුඤ්ඤම්හා — ද්වාදසො පෙක්ඛකාපරං
ධ්‍යානලාභී පෘථග්ජනයාට සහ යට ආයඞ්යන් 7
දෙනාට ලැබෙන සිත්.

කාම: සො: කුසල් 2, පසුව රූපා: කු 4 ත් මා:කු 16 ත්
ඵල 12 යන 32 } 44
,, උ. ,, 2 ,, රූප, අරූප. කු 5 මා: කු
4 න් ඵල 3 ත් යන 12

රහතන් වහන්සේට ලැබෙන අර්පණ සිත්
සුඛිත ක්‍රියතො අට්ඨ — ඡ සම්භොන්ති උපෙක්ඛකා
සො.කා.ක්‍රි. 2 පසුව රූපා. 4 න් අර්හත් ඵල 4 = 8 } 14
උපෙ ,, ,, 2 ,, රූප. අරූප 5 න් අර්හත් ඵල 1 = 6

මේ දක්වූයේ පුද්ගල වශයෙනි.
ඉහතින් දක්වූයේ සිත් ඇතිවන වීථි ක්‍රමයටයි.

## තදරම්මණ නියමය

මෙ නම් ජවනයට අනතුරුව මෙනම් තදරම්මණය වන්නේ යයි පවත්නා නියමය තදරම්මණ නියමය යි. අරමුණ පිළිබඳ වද ක්‍රම තුනක් වේ. අනිෂ්ට අරමුණු ය. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණු ය අතිඉෂ්ට අරමුණු යයි තුන් වැදෑරුම් වේ. කැමති නොවන ලද මළ මූත්‍රා දියද, කුණු වූ මළ සිරුරු ආදිය ද තමා අකමැති අමනාප අරමුණු ය. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණු නම් සාමාන්‍යයෙන් මුණ ගැසෙන රූප ශබ්ද ආදියයි. අති ඉෂ්ට අරමුණු නම් බුද්ධ දර්ශන තමාගේ හිතවත් මව්පිය ඥාති මිත්‍රාදීන් ය.

ඉෂ්ටා රම්මණයක් මුණ ගැසෙන්නේ කුසල විපාකයක බලයෙනි. එසේ මුණ ගැසුන විට ලෝභ ජවන් ද ඉපදිය හැක. යෝනිසො මනසිකාරයෙන් යුක්ත වුනි නම් කුසල ජවන්ද ඉපදිය හැකි වේ. විපාක සිත් කුසල විපාක යෝමය. ඉෂ්ටාරම්මණ යෙහි තදරම්මණ යෝ සොම්නස් සහගත හෝ උපෙක්ඛා සහගත ද වේ. ඉෂ්ට මධ්‍ය ස්ථ අරමුණු ද සමහර අවස්ථාවන්හි අතිඉෂ්ටා රම්මණ වන්නෝය. අරමුණ මෙනෙහි කරන ආකාරයට ද එසේ වෙනස් වේ. සොම්නස් ජවනයට අනතුරුව .උපදින තදරම්මණ යෝ බොහෝ සෙයින් සොම්නස් වන්නේය. ඇතැම් විට උපෙක්ඛා තදරම්මණයන්ද උපදිති.

සොම්නස් සහගත කිරිය ජවන් අවසානයෙහි සොම්නස් තදලම්බන යෝ 5 න් 1 ක් ලැබෙති. ජවන යෙන් අරමුණ ගන්නා ලද ආකාරයට ඇතැම් විට උපෙක්ඛා තදලම්බන 6 න් 1 ක් හෝ කුසල විපාක තදලම්බන යක්ම වන්නේය.

උපෙක්ඛා සහගත ජවන් අවසානයෙහි උපෙක්ඛා තදලම්බන යෝ ම ලැබෙති. කිරිය ජවන් ලැබෙන්නේ රහතන් වහන්සේ ටය. ඉෂ්ට මධ්‍යස්ථ රම්මණ යෙහිත් අනිෂ්ටා රම්මණ යෙහිත් උපෙක්ඛා තදරම්මණ යෝ ලැබෙති.

සොම්නස් පටිසන්ධික යෙකුට දෙම්නස් ජවන් අවසාන යෙහි තදලම්බන උපෙක්ඛා සහගතම විය යුතුය, එහෙත් සොම් නස් පටිසන්ධිකයා ගේ දෙම්නස් ජවනයට පසු තදලම්බන නූපදනේ නම් සොම්නස් භවාංගය වේදනා භෙදය අනුව නූපද නේය. වේදනා දෙක ප්‍රතිවිරුද්ධ බැවින් සොම්නස් දෙම්නස් වේදනා දෙක එකතැන නූපදනේය. එසේ හෙයින් එම ස්ථාන යෙහි පෙර පුරුදු කරන ලද කාමාවචර අරමුණක් ගෙන උපෙක්ඛා සන්තිරණ සිත ආගන්තුක භවාංග කෘත්‍යයෙන් 1 වරක් ඉපද නිරුද්ධ වේ. ඊට පසු සුදුසු භවාංගය වන සොම්නස් භවාංගය ඉපදීමට අවස්ථාව ලැබෙන්නේය. මේ ආචාර්‍ය්‍ය මතයකි. කාම සත්වයන්ටම කාමාවචර ධර්මයක්ම අරමුණු කොට කාම ජවනයන් අවසානයෙහිම තදලම්බන උපදනේ ය. අති මහත්තා රම්මණ හා විභූතා ලම්බන වීථින්හිම තදලම්බන උපදී යයි කියන ලදී. ජවනයට අනුවද තදලම්බන නියමය වේ. අරමුණෙහි අනිෂ්ඨ, ඉෂ්ඨ මධ්‍යස්ථ අති ඉෂ්ඨ ආකාර භෙදය අනුව ද තදලම්බන උපදී.

මහා කිරිය උපෙක්ඛා ජවන් 4 ය, ද්වේශ ජවන් 2 ය යන ජවන් 6 ට අනතුරුව උපෙක්ඛා සහගත මහා විපාක 4 ය සන් තිරණ 2 ය යන උපෙක්ඛා තදලම්බන 6 ක් උපදී. මහා කිරිය සොම්නස් ජවන් 4 ට අනතුරුව සොම්නස් මහා විපාක 4 ය සොම්නස් සන්තිරණය යන තදලම්බන 5 න් 1 ක් උපදී.

ඉතිරි අකුසල ජවන් 10 ය මහා කුසල ජවන් 8 ය යන මොවුන්ට අනතුරුව තදලම්බන 11 සුදුසු පරිදි ලැබෙති.

තදරම්මණ නියමය යි.

## ජවන නියමය

ජවන් සිත් ඇතිවීම එක්තරා න්‍යාය ධර්මයක් අනුව සිදු වන්නකි. ජවන් සිත් සියල්ල සංක්ෂේප ක්‍රමයට සිත් 55 ක් ද විස්තාර ක්‍රමයට 87 ද වේ. එය කාම ජවන් මහද්ගත ජවන් ලෝකෝත්තර ජවන් යයි ද කොටස් වසයෙන් 3 ක් වේ. කාම ජවන් වලදී අකුසල ජවන් 12 ක් ද, කුසල ක්‍රියා ආදි 17 වේ. ලෝකෝත්තර ජවන් විස්තාර ක්‍රමයට 40 ක් වේ. සංක්ෂේප ක්‍රමයට 8 වේ. මහද්ගත නාමයෙන් දක්වෙන රූපාවචර ජවන් කුසල් ක්‍රියා වශයෙන් 10 ද, අරූපාවචර කුසල් ක්‍රියා 8 වේ. මෙසේ ජවන් සිත් සියල්ල ක්‍රම දෙකකින් පෙන්නුම් කරයි. එසේ ක්‍රම දෙකක් වීමට හේතුව වන්නේ ලෝකෝත්තර සිත් ලැබීමේ වෙනසයි. එය ක්‍රම දෙකකින් පෙන්නුම් කරයි. සමථ යානික යාට සිත් ලැබෙන විස්තාර ක්‍රමය හා සුඛ විපස්සනා යානික යාට සිත් ලැබෙන සංක්ෂේප ක්‍රමයයි. කෙසේ කොයි ක්‍රමයට සිත් ලැබුනේ වී නමුත් ලෝකෝත්තර සිත් සියල්ල 8 ක් ම වේ මාර්ග සිත් 4 හා ඵල සිත් 4 ද යන සිත් අටක්ම වේ. ඊට වඩා වැඩි ගණනක් ලෝකෝත්තර සිත් වශයෙන් නොලැබේ.

මෙහි වෙනස ඇතිවන්නේ පුද්ගල භේදයෙහි ධ්‍යාන මාර්ග ඵල ලබන පුද්ගල යින් කොටස් දෙකක් වේ. සුඛ විපස්සනා යානිකයා විපස්සනා භාවනාවම දියුණු කොට ධ්‍යාන ලැබීමක් නැති මාර්ග ඵලයන්ට පැමිණිමත් සමථ යානිකයා ධ්‍යාන පහම ලබා එක එක ධ්‍යානයක් ලබන ලද පුද්ගලයින් වෙන වෙනම එක ධ්‍යානිකයෙක්ම තමා ලත් ධ්‍යානයේ සිට විදර්ශනා භාවනාව ද දියුණු කොට මාර්ගඵල සිත් සියල්ලම ලබයි. එවිට එක එක ධ්‍යානයකට මාර්ග සිත් 4 හා ඵල සිත් 4 ලැබේ. ඒ මෙසේය. මෙසේ ධ්‍යාන 5 වශයෙන් මාර්ග සිත් මාර්ග ජවන් 20 ක් ද ඵල ජවන් 20 ද ලැබෙති.

කාම ජවන් ඇතිවීමේදී එකම සිත 7 වාරයක් හෝ 6 වාරයක් හෝ ලැබෙති. ධ්‍යාන ජවන් සහ මාර්ග ජවන් පළමුව එක වරක්ම ලැබෙති. මාර්ග ජවනය නැවත පසුව කිසිතැනක නො ලැබේ. ධ්‍යාන ජවනය හා ඵල ජවන් සමාපත්ති අවස්ථාවේ සමාපත්ති වීථි වශයෙන් ලැබෙති. බොහෝ වාර ගණනක්

දවසක් හෝ ලැබෙති. සිහි මූර්ඡා කාලයෙහි ද මරණාසන්න අවස්ථාවේ දී ද දියේ ගිලීම ආදි අවස්ථාවන්හි ජවන් 5 හෝ 6 ක් ලැබෙති. අභිඥ ජවනයද එක් වරක්ම ලැබේ.

බුදුරජාණන් වහන්සේ යමක පාටිහාරිය කාලයෙහි ජවන් සිත් 4 ක් හෝ 5 ක් ලැබෙන්නේ යයි ද ආචාර්‍ය්‍ය වරයෝ කියා තිබේ. යමක පාටිහාරිය පවත්නා කාලයෙහි ගිනිදලු නික්මීම තේජෝ කසිණ සමාපත්තියට ද, සමවැදී මෙන් ගිනිදලු පිටවීම පෙන්වයි. මේ පරිකර්ම වීථීන්හි කාම ජවන් ඇතිවෙන්නේ යයි ද අභිඥවීථිය පසුව ඇතිවී ධ්‍යානයට සම වදින සේක. අභිඥවගේ ආනුභාවයෙන් උඩ කයින් ගිනි දලුද නික්මෙයි. ඊටපසු යටකයින් දිය දලු නික්මෙයි. දිය දලු නික්මීම සඳහා ආපෝ කසිණය අරමුණු කොට අභිඥවීථිය උපදවා අභිඥ වීථිය ආනුභාවයෙන් දියදලු නික්මෙන්නේ ය. ප්‍රත්‍ය වෙක්ෂා ජවනය 4 වරක් හෝ 5 වරක් උපදනේය.

ජවන නියමයේදී කාම ජවන් සත්වරක් ම එකම සිත ලැබෙන්නේ යයි ද මේ වැඩි වාර ගණනක් ජවන් සිත් ඉපදීම කියන ලද්දේ ය. ජවන් සිත් හතකට වඩා වැඩි නොවන් නේය යි ද, එහෙත් යම් යම් අවස්ථා වන්හි හදය වස්තුව දුර්වල අවස්ථා වන්හි දී සයවර පස්වර, සතරවර දක්වා ද, ඇති විය හැකි යයි කියති. මාර්ග ජවනය එක වරක් ම ය. අභිඥ ජවනය එක වරක් උපදින්නේ යයි කියති. එහෙත් උවමනා අවස්ථා වන්හි දී නැවතත් ඉපදවිය හැකි වේ. උපදින අවස්ථාව එක් වරක් පමණක් ඉපදීම වන්නේය. මාර්ග ජවනය එක පුද්ගල යෙකුට එක් වරකට වඩා උපදවන්ට නුපුලුවන් වීම මෙහි එක වරක් යයි කීමෙන් තේරුම් ගත යුතුවේ. එයින් ඒ සිතෙන් කළ යුතු කෙලෙස් කැපීමේ කාරිය කර අවසන් කළ බැවින් එම කෙලෙස් නැවත ඇති නොවන බැවින්ද, එසේ වන්නේය. නිවන් සුවය මෙලොව ජීවත්ව සිටිය දී නැවත නැවත ලැබීම සඳහා ඵල ජවන් පසුව ලබන්නේ ය. නැවත නැවත ලබන්නේය. ධ්‍යාන ජවනය ආදි කම්මිකයාට එක වරක්ම ලැබෙන්නේය. ධ්‍යාන සමාපත්ති යට සම වැදීම සඳහා නැවත නැවතත් ධ්‍යාන කුසල ජවනයම ලැබෙන්නේය. ආදි කම්මිකයාට එක ධ්‍යාන සිතක් ඉපද සිත භවාංග වන්නේ ය. මාර්ග ජවනය ඉපද ඒ සමගම අතරක් නොතබා එහි විපාකය වන ඵල සිත ලැබෙන්නේ ය.

එය ඵල සිත යයි ව්‍යවහාර වේ. භවාංග සිත් උපදින්නේ ඵල සිත් ඇති වූවාට පසුවය. ප්‍රත්‍ය වෙක්ෂා විථි කාම ජවන් ඥාන සම්ප්‍රයුත්ත වේ.

නිරෝධ සමාපත්ති කාලයෙහි පූර්වභාග යෙහි චතුත්ථ ආරුප්ප ජවනය දෙවරක් ද, සමාපත්තියෙන් නැගිටින විට ඵල ජවනය එක් වරක් යයි ද කියති. මෙසේ ජවන් සිත් ඇතිවීම පෙන්වා තිබේ. චතුත්ත ආරුප්ප ජවන් අනාගාමීන් වහන්සේට කුසල ජවනය ද රහතන් වහන්සේට ක්‍රියා ජවනය ද ඇති වේ.

## පුද්ගල භේදය

පුදගලයෝ 12 දෙනෙකි. දූගති අහේතුකයාය, සුගති අහේතුකයාය, ද්විහේතුකයාය, ත්‍රිහේතුකයාය යන ප්‍රථග්ජනයන් 4 දෙනාය. මාර්ගස්ථ යින් 4 දෙනෙක්ද, ඵලස්ථයින් 4 දෙනෙක්දැයි පුද්ගලයින් සියල්ල 12 දෙනෙක් වේ.

පළමුව සඳහන් කළ දූගති අහේතුකයා නම් කුසල් හෝ අකුසල් හෝ හේතු ධර්ම කිසිවක් නැති අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් පටිසන්ධි ලබන ලද අපාය භූමි සියල් ලෙහිම වසන, සතර අපායෙහි පටිසන්ධි ගත් අවාසනාවන්ත සත්ව කොටසකි. සත්ව කොටස් වශයෙන් ප්‍රභෙද රාශියක් වේ. සුගති අහේතුකයා ද කුසල විපාක උපෙක්ඛා සහගත අහේතුක සන්තීරණ සිතින් පටිසන්ධි ලබන ලද කාම සුගතියට අයත් මනුෂ්‍යයින් සහ චාතුර්මහාරාජිකයට අයත් ඇතැම් සත්ව කොටස් ද වෙති· ජාති අන්ධ ආදීන් ඇතුළත් වේ.

ද්විහේතුක පුද්ගලයා නම් කුසල විපාක ද්විහේතුකයා සහ ත්‍රිහේතුක ඕමක බාල කුසලයෙන් පටිසන්ධි ලත් අයයි. ඔවුන් ගේ පටිසන්ධි අලෝභ, අදෝස යන කුසල හේතු දෙකින් යුත් අයයි. ත්‍රිහේතුක පුද්ගලයා නම් කාමාවචර ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල විපාකයෙන් පටිසන්ධි ලත් කාම සුගතියෙහි ද, මහද්ගත විපාකයන්ගෙන් පටිසන්ධි ලබන ලද රූප අරූප පටිසන්ධික යින්ද වේ. අසඤ්ඤ සත්තය හැර.

ඔවුන්ට ලැබෙන සිත් ද වෙන් වශයෙන් පෙන්වනු ලැබේ. අහේතුක පටිසන්ධි ලැබූ පුද්ගලයින් දෙදෙනාට ලැබෙන සිත් අකුසල් සිත් 12 ද, හසිතුප්පාදය හැර අහේතුක සිත් 17 ද, මහා

කුසල් සිත් 8 ද යන සිත් 37 ලැබේ. ද්විහේතුකයාට මේ සිත් 37 සහ මහාවිපාක සිත් ද්විහේතුක 4 යන 41 ලැබෙති. ත්‍රිහේතුක පුද්ගලයාට ලැබෙන සිත් අකුසල් 12 ද අහේතුක හසිතුප්පාදය හැර 17 ද, කාම කුසල් විපාක 16 ද සහ යන කාමාවචර සිත් 45 ද, මහග්ගත කුසල් 9 සමග 54 ක් ලැබෙති.

ආයඝීයන්ට ලැබෙන සිත් මාර්ගස්ථයින් 4 ට මාර්ග සිත පමණකි. ඵලස්ථයින් අර්හත් පලයට පැමිණි පුද්ගලයා හැර සෝවාන් සකදගාමි දෙදෙනාට අකුසල් සිත් 5 හැර ප්‍රථග්ජනයාට ලැබෙන සිත් 49 සමග තම තමා ගේ ඵල සිත සමග සිත් 50 වේ. අනාගාමි ඵලස්ථයාට දෝසමූල සිත් 2 හැර තමාගේ ඵලසිත සමග 48. අර්හත් ඵලස්ථයාට අහේතුක සිත් 18 ද, කාමසෝභන කුසල් සිත් 8 හැර 16 ද මහග්ගත ක්‍රියා සිත් 9 ද තමාගේ ඵල සිත ද, යන සිත් 44 ලැබෙති. ධ්‍යාන ලබා ඇත්තේ නම් විපාක සිත ද එකතු වේ. රහතන් වහන්සේට 44 ක් ද, සෙසු ශෛක්ෂයින් 4 දෙනාට සුදුසු පරිදි 56 ක් ලැබෙති. 7 දෙනාටම ලැබෙන සිත් සියල්ලම 56 ක් වේ. සිත් 56 ය බැගින් 7 දෙනාටම ලැබිය හැකි වේ.

භූමි භෙදය වශයෙන් සිත් බෙද දැක්වීමේදී වීථි සිත් සියල්ල 80 කි. ඒකාන්ත වීථිමුක්ත මහග්ගත සිත් 9 හැර 80 ලැබෙති. ඒ එක් එක් භූමියෙහි ලැබිය හැකි සිත් සියල්ල පෙන්වීමය. කාම භූමියෙහි වීථිමුක්ත මහග්ගත සිත් 9 හැර සියල්ල ලැබිය හැක. රූප භූමියෙහි ද්වේශ මූල සිත් 2 නො ලැබේ. තද ලම්බන වශයෙන් මහා විපාක සිත් 8 නොලැබේ. සන් තීරණ සිත් 3 ලැබෙති. හසිතුප්පාදයද නැත. අරූප භූමියෙහි ඝාණා දී සිත් 6 ද නැත. රූප භූමියෙහි ධ්‍යාන ලාභීන් පමණක් සිටිති. අරූප භූමියෙහිඅ කුසල් 10 ද කාමාවචර කුසල් ක්‍රියා 16 ද මනෝද්වාර වජ්ජන සිත 1 ද ලෝකෝත්තර සෝවාන් මාර්ග සිත හැර 7 ද ලැබෙති. අරූපා වචර කුසල් ක්‍රියා 8 ය. යන සිත් 44 සුදුසු පරිදි ලැබෙති.

සුද්ධාවාස භූමියෙහි අනාගාමී ඵලස්ථ අර්හත් මාර්ගස්ථ ඵලස්ථ යන තුන්දෙනාට ලැබෙන සිත් අකුසල් සිත් 5 ද අහේතුක සිත් 11 ද, කාම සෝභන 16 ද, පංචම ධ්‍යාන විපාක සිත් 1 ද ලෝකෝත්තර සිත් 3 ද යන මේ සිත් සුදුසු පරිදි ලැබෙති.

වීථි කාණ්ඩය ස්වරූප අවසන්

නමෝ තස්ස භගවතො අරහතෝ සම්මා සම්බුඩස්ස

# වීථිමුක්ත සංග්‍රහයෙහි පාලිය

## පස්වෙනි පරිච්ඡෙදය

278. වීථි චිත්තවසෙනෙවං පවත්තියමුදීරිතො,
පවත්ති සංගහො නාම සන්ධියං දනිවුච්චති.

279. චතස්සො භූමියො, චතුබ්බිධාපටිසන්ධි, චත්තාරි කම්මානි, චතුධා මරණුප්පත්ති චෙති වීථිමුත්ත සඞගහෙ චත්තාරි චතුක්කානි වෙදිතබ්බානි.

280. තත්ථ අපායභූමි, කාමසුගතිභූමි, රූපාවචර භූමි, අරූපාවචරභූමි චෙති චතස්සො භූමියො නාම.

281. තාසු නිරයො, තිරච්ඡානයොනි, පෙත්ති විසයො, අසුර කායො චෙති අපාය භූමි චතුබ්බිධා හොති.

282. මනුස්සා චාතුම්මහාරාජිකා තාවතිංසා යාමා තුසිතා නිම්මානරති පරනිම්මිත වසවත්ති චෙති කාම සුගතිභූමි සත්තවිධා හොති.

283. සා පනායමෙකාදසවිධාපි කාමාවචර භූමිච්චෙව සංඛං ගච්ඡති.

284. බ්‍රහ්මපාරිසජ්ජා, බ්‍රහ්මපුරෝහිතා, මහාබ්‍රහ්මා චෙති පඨමජ්ඣානභූමි.

285. පරිත්තාභා, අප්පමාණාභා, ආභස්සරා චෙති දුතියජ්ඣාන භූමි.

286. පරිත්තසුභා, අප්පමාණසුභා, සුභකිණ්හා චෙති තතියජ්ඣාන භූමි.

287. වෙහප්ඵලා, අසඤ්ඤසත්තා, සුද්ධාවාසා චෙති චතුත්ථජ්ඣානභූමිති රූපාවචරභූමි සොළසවිධා හොති.

288. අවිහා, අතප්පා, සුදස්සා, සුදස්සී, අකනිට්ඨා චෙති සුඬාවාසභූමි පඤ්චවිධා හොති.

289. ආකාසානඤ්චායතනභූමි, විඤ්ඤාණඤ්චායතනභූමි, ආකි ඤ්චඤ්ඤායතනභූමි, නෙවසඤ්ඤානාසඤ්ඤා යතනභූමි, චෙති ආරුප්ප භූමි චතුබ්බිධා හොති.

290. පුථුජ්ජනා නලබ්භන්ති සුද්ධාවාසෙසු සබ්බථා,
සොතාපන්නා ච සකදගාමිනො චාපි පුග්ගලා.

291. අරියා නො පලබ්භන්ති අසඤ්ඤාපාය භූමිසු,
සෙසට්ඨානෙසු ලබ්භන්ති අරියානරියාපිච.

ඉදමෙත්ථ භූමි චතුක්කං.

---

292. අපායපටිසන්ධි, කාමසුගතිපටිසන්ධි, රූපාවචර පටිසන්ධි අරූපාවචර පටිසන්ධි චෙති චතුබ්බිධා හොති පටිසන්ධි නාම.

293. තත්ථ අකුසල විපාකොපෙක්ඛා සහගත සන්තීරණං අපායභූමියං ඔක්කන්තික්ඛණෙ පටිසන්ධි හුත්වා තතො පරං භවංගං පරියො සානෙ චවනඤ්ච හුත්වා වොච්ඡිජ්ජති අය මෙකාවාපාය පටිසන්ධි නාම.

294. කුසලවිපාකො පෙක්ඛාසහගත සන්තීරණං පන කාම සුගතියං මනුස්සානං ජච්චන්ධා දීනං හීන සත්තානං චෙව භුම්මනිස්සිතානං විනිපාතිකා සුරානං පටිසන්ධි භවංග චුතිවසෙන පවත්ත ති.

295. මහා විපාකානි පනට්ඨ සබ්බත්ථාපි කාම සුගතියං පටිසන්ධි භවංග චුතිවසෙන පවත්තන්ති. ඉමා නව කාම සුගති පටිසන්ධියො නාම.

296. සාපනායං දසවිධාපි කාමාවචර පටිසන්ධිච්චෙව සංගහං ගච්ඡති.

297. තෙසු චතුන්නං අපායානං මනුස්සානං විනි පාතිකා සුරානංච ආයුප්පමාණ ගණනාය නියමො නත්ථි.

298. චාතුම්මහාරාජිකානං පන දෙවානං දිබ්බානි පඤ්චවස්ස සතානි ආයුප්පමාණං, මනුස්ස ගණනාය නවුති වස්ස සතසහස්සප්පමාණං හොති.

299. තතො චතුග්ගුණං තාවතිංසානං.

300. තතො චතුග්ගුණං යාමානං.

301. තතො චතුග්ගුණං තුසිතානං.

302. තතො චතුග්ගුණං නිම්මානරතීනං.

303. තතො චතුග්ගුණං පරනිම්මිත වසවත්තීනං.

304. නවසතඤ්චෙකවීස වස්සානං කොටියො තථා,
වස්ස සත සහස්සානි සට්ඨී ච වසවත්තිසු.

305. පඨමජ්ක්ධාන විපාකං පඨමජ්ක්ධාන භූමියං පටි සන්ධි භවාංග චුති වසෙන පවත්තති.

306. තථා දුතියජ්ක්ධාන විපාකං තතියජ්ක්ධාන විපාකං ච දුතියජ්ක්ධාන භූමියං.

307. චතුත්ථජ්ක්ධාන විපාකං තතියජ්ක්ධාන භූමියං.

308. පඤ්චමජ්ක්ධාන විපාකං චතුත්ථජ්ක්ධාන භූමියං.

309. අසඤ්ඤසත්තානං පන රූපමෙව පටිසන්ධි හොති, තථා තතොපරං පවත්තියං චවන කාලෙ ච රූපමෙව පවත්තිත්වා නිරුජ්ක්ධති, ඉමා ඡ රූපාවචර පටිසන්ධියො නාම.

310. තෙසු බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං කප්පස්ස තතියෙ භාගො ආයුප්පමාණං.

311. බ්‍රහ්ම පුරොහිතානං උපඩ්ඪකප්පො.

312. මහා බ්‍රහ්මානං එකො කප්පො.

313. පරිත්තාභානං ද්වෙ කප්පානි.

314. අප්පමාණාභානං චත්තාරි කප්පානි.

315. ආභස්සරානං අට්ඨ කප්පානි.

316. පරිත්තසුභානං සොළස කප්පානි.

317. අප්පමාණසුභානං ද්වත්තිංස කප්පානි.

318. සුභකිණ්හානං චතුසට්ඨි කප්පානි.

319. වෙහප්ඵලානං අසඤ්ඤසත්තානං ච පඤ්ච කප්පසතානි.

320. අවිහානං කප්ප සහස්සානි.

321. අතප්පානං ද්වෙ කප්ප සහස්සානි.

322. සුදස්සානං චත්තාරි කප්ප සහස්සානි.

323. සුදස්සීනං අට්ඨකප්ප සහස්සානි.

324. අකනිට්ඨානං සොළස කප්ප සහස්සානි.

325. පඨමාරුප්පාදි විපාකානි පඨමාරුප්පාදි භූමිසු යථාක්කමං පටිසන්ධි භවංග චුතිවසෙන පවත්තන්ති, ඉමා චතස්සො ආරුප්ප පටිසන්ධියො නාම.

326. තෙසු පන ආකාසානඤ්චායතනූපගානං දෙවානං වීසති කප්ප සහස්සානි ආයුප්පමාණං.

327. විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං චත්තාළීස කප්ප සහස්සානි.

328. ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං සට්ඨි කප්ප සහස්සානි.

329. නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං චතුරාසීති කප්ප සහස්සානි.

330. පටිසන්ධි භවංගඤ්ච තථා චවන මානසං,
එකමෙව තථෙවෙක විසයඤ්චෙක ජාතියං.

අයමෙත්ථ පටිසන්ධි චතුක්කං.

---

331. ජනක මුපත්ථම්භක මුපපීළක මුපඝාතකඤ්චෙ ති කිච්චවසෙන.

332. ගරුකමාසන්නමාචිණ්ණං කටත්තාකම්මඤ්චෙ ති පාකදාන පරියායෙන.

333. දිට්ඨධම්මවෙදනියං, උපපජ්ජවෙදනියං, අපරාපරියවෙද නියං අහොසිකම්මඤ්චෙ ති පාකකාලවසෙන චත්තාරි කම්මානි නාම.

334. තථා අකුසලං කාමාවචරකුසලං රූපාවචර කුසලං අරූපා වචර කුසලං චෙති පාකට්ඨාන වසෙන.

335. තත්ථ අකුසලං කායකම්මං වචීකම්මං මනො කම්ම ඤ්චෙති කම්මද්වාර වසෙන තිවිධං හොති.

336. කථං ? පාණාතිපාතො අදින්නාදනං කාමෙසු මිච්ඡාචාරො චෙති කායවිඤ්ඤත්ති සංඛාතෙ කායද්වාරෙ බාහුල්ල වුත්තිතො කායකම්මං නාම.

337. මුසාවාදෙ පිසුණාවාචා ඵරුසාවාචා සම්පප්ඵලාපො චෙති වචීවිඤ්ඤත්ති සංඛාතෙ වචී ද්වාරෙ බාහුල්ලවුත්ති තො වචීකම්මං නාම.

338. අභිජ්ඣා ව්‍යාපාදෙ මිච්ඡාදිට්ඨී චෙති අඤ්ඤත්‍රාපි විඤ්ඤ ත්තියා මනස්මිං යෙව බාහුල්ලවුත්තිතො මනොකම්මං නාම.

339. තෙසු පාණාතිපාතො ඵරුසාවාචා ව්‍යාපාදෙච දෙස මූලෙන ජායන්ති.

340. කාමෙසු මිච්ඡාචාරො අභිජ්ක්ධා මිච්ඡාදිට්ඨී ච ලොභ මූලෙන.

341. සෙසානි චත්තාරි තිහිමූලෙහි සම්භවන්ති.

342. චිත්තුප්පාද වසෙන පනෙතං අකුසලං සබ්බථාපි ද්වාදස විධං හොති.

343. කාමවචර කුසලංපි ච කායද්වාරෙ පවත්තං, කායකම්මං, වචීද්වාරෙ පවත්තං වචීකම්මං, මනොද්වාරෙ පවත්තං මනොකම්මං චෙති කම්මාද්වාර වසෙන තිවිධං හොති.

344. තථා දන සීල භාවනා වසෙන.

345. චිත්තුප්පාද වසෙන පනෙතං අට්ඨවිධම්පි දන සීල භාවනා පචායන වෙය්‍යාවච්ච පත්තිදන පත්තානුමෝදනා ධම්ම සවන ධම්මදෙසනා දිට්ඨිජ්ජු කම්ම වසෙන දසවිධං හොති.

346. තම්පනෙතං වීසතිවිධම්පි කාමාවචර කම්ම+මිච්චෙව සංගහං ගච්ඡතී ති.

347. රූපාවචර කුසලං පන මනොකම්මමෙව.

348. තඤ්ච භාවනා මයං අප්පනාප්පත්තං ඣානංග භෙදෙන පඤ්චවිධං හොති.

349. තථා අරූපාවචර කුසලං ච මනොකම්මං.

350. තම්පි භාවනා මයං අප්පනාප්පත්තං ආලම්බන භෙදෙන චතුබ්බිධං හොති.

351. එත්ථ කුසලකම්ම උද්ධච්චරහිතං අපාය භූමියං පටිසන්ධිං ජනෙති.

352. පවත්තියං පන සබ්බම්පි ද්වාදසවිධං

353. සත්තා කුසලපාකානි සබ්බත්ථාපි කාම ලොකෙ රූප ලොකෙච යථාරහං වි පච්චන්ති.

354. කාමාවචර කුසලම්පි කාමසුගතියමෙව පටිසන්ධිං ජනෙති.

355. තථා පවත්තියං ච මහාවිපාකානි.

356. අහෙතුක විපාකානි පන අට්ඨපි සබ්බථාපි කාමලොකෙව යථාරහං විපච්චන්ති.

357. තත්ථාපි තිහෙතුක මුක්කට්ඨං කුසලං තිහෙතුකං පටි සන්ධිං දත්වා පවත්තෙ සොළස විපාකානි විපච්චති.

358. තිහෙතුක මොමකං ද්විහෙතුක මුක්කට්ඨංච කුසලං ද්විහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තෙ තිහෙතුක රහිතානි ද්වාදස විපාකානි විපච්චති.

359. ද්විහෙතුකමොමකං පන කුසලං අහෙතුක මෙව පටිසන්ධිං දෙති, පවත්තෙ අහෙතුක විපාකා නෙව විපච්චති.

360. අසංඛාර සසංඛාර විපාකානි න පච්චති, සසංඛාර මසංඛාර විපාකානිති කෙචන.

361. තෙසං ද්වාදස පාකානි දසට්ඨච යථාක්කමං, යථා වුත්තානුසාරෙන යථා සම්භව මුද්දිසෙ.

362. රූපාවචර කුසලං පන පඨමජ්ක්ධානං පරිත්තං භාවෙත්වා බ්‍රහ්මපාරිසජ්ජෙසු උප්පජ්ජන්ති.

363. තමෙව මජ්ක්ධිමං භාවෙත්වා බ්‍රහ්මපුරොහිතෙසු.

364. පණීතං භාවෙත්වා මහාබ්‍රහ්මෙසු.

365. තථා දුතියජ්ක්ධානං තතියජ්ක්ධානංච පරිත්තං භාවෙත්වා පරිත්තාභෙසු.

366. මජ්ක්ධිමං භාවෙත්වා අප්පමාණාභෙසු.

367. පණීතං භාවෙත්වා ආභස්සරෙසු.

368. චතුත්ථජ්ක්ධානං පරිත්තං භාවෙත්වා පරිත්ත සුභෙසු.

369. මජ්ක්ධිමං භාවෙත්වා අප්පමාණසුභෙසු.

370. පණීතං භාවෙත්වා සුභකිණ්හෙසු.

371. පඤ්චමජ්ක්ධානං භාවෙත්වා වෙහප්ඵලෙසු.

372. තමෙව සඤ්ඤාවිරාගං භාවෙත්වා අසඤ්ඤ සත්තෙසු.

373. අනාගාමිනො පන සුද්ධාවාසෙසු උප්පජ්ජන්ති.

374. අරූපාවචර කුසලං ච යථාක්කමං භාවෙත්වා ආරුප්පෙසු උප්පජ්ජන්ති.

375. ඉත්ථං මහග්ගතං පුඤ්ඤං යථා භූමි වවත්ථිතං.
ජනෙති සදිසං පාකං පටිසන්ධිප්පවත්තියං,

ඉදමෙත්ථ කම්ම චතුක්කං.

---

376. ආයුක්ඛයෙන, කම්මක්ඛයෙන, උභයක්ඛයෙන, උපච්ඡේදක කම්මුනා චෙති චතුධා මරණුප්පත්ති නාම.

377. තථා මරන්තානං පන මරණකාලෙ යථා රහං අභිමුඛී භූතං භවන්තරෙ පටිසන්ධි ජනකං කම්මං වා තං කම්ම කරණකාලෙ රූපාදිකමුපලද්ධපුබ්බමුපකරණ භූතං ච කම්ම නිමිත්තං වා, අනන්තර මුප්පජ්ජමාන භවෙ උප ලභිතබ්බං උපභොගභූතං ගති නිමිත්තංවා කම්මබලෙන ඡන්නං ද්වාරානං අඤ්ඤතරස්මිං පච්චුපට්ඨාති.

378. තතොපරං තමෙවතථොපට්ඨිතං ආලම්බන මාරබ්භ විපච්චමානක කම්මානුරූපං පරිසුද්ධමුපක්කිලිට්ඨං වා උප්පජ්ජිතබ්බ භවානු රූපං තත්ථොනතංව චිත්තසන්තා නං අභිණ්හං පවත්තති බාහුල්ලෙන, තමෙව වා පන ජනකභූතං කම්මමභිනවකරණවසෙන ද්වාරප්පවත්තං හොති.

379. පච්චාසන්න මරණස්ස තස්ස වීථි චිත්තාව සානෙ භවංග ක්ඛයෙ වා චවන වසෙන පච්චුප්පන්නභව පරියොසොන භූතං චුති චිත්ත මුප්පජ්ජිත්වා නිරුජ්ක්ධති.

380. තස්මිං නිරුද්ධාවසානෙ තස්සානන්තරමෙව තථා ගහිතං ආලම්බනමාරබ්භ සවත්ථුකං අවත්ථුක මෙවවා යථාරහං අවිජ්ජානුසය පරික්ඛිත්තෙන තන්හානුසය මූලකෙන සංඛාරෙන ජනියමානං සම්පයුත්තෙහි පරිගය්හමානං සහ ජාතානමධිට්ඨාන භාවෙන පුබ්බංගම භූතං භවන්තරෙ පටිසන්ධානවසෙන පටිසන්ධි සංඛාතං මානසං උප්පජ්ජ මානමෙව පතිට්ඨාති භවන්තරෙ.

381. මරණාසන්න වීථියං පනෙත්ථ මන්දප්ප වත්තානි පඤ්චෙව ච ජවනානි පාටිකංඛී තබ්බානි.

382. තස්මා යදි පච්චුප්පන්නාලම්බනෙස්වාපාථ ගතෙසු ධරන් තෙස්වෙව මරණං හොති, තද පටිසන්ධි භවංගානම්පි පච්චුප්පන්නා ලම්බ නතාලබ්භති ති කත්වා කාමාවචර පටිසන්ධියා ඡද්වාර ගහිතං කම්මනිමිත්තං ගති නිමිත්තං ච පච්චුප්පන්නමතීතං වා ආලම්බනං උපලබ්භති.

383. කම්මං පන අතීතමෙව, තඤ්ච මනොද්වාර ගහිතං.

384. තානි පන සබ්බානිපි පරිත්තධම්මභූතානෙවා ලම්බනානීති වෙදිතබ්බානි.

385. රූපාවචර පටිසන්ධියා පන පඤ්ඤත්තිභූතං කම්මනිමිත්ත මෙවාලම්බනං හොති.

386. තථා ආරුප්ප පටිසන්ධියා ච මහග්ගත භූතං පඤ්ඤත්ති භූතං ච කම්මනිමිත්තමෙව යථා රහමාලම්බනං හොති.

387. අසඤ්ඤසත්තානං පන ජීවිත නවකමෙව පටිසන්ධි භාවෙන පතිට්ඨාති, තස්මා තෙ රූප පටිසන්ධිකා නාම.

388. ආරුප්පාඅ ාරුප්ප පටිසන්ධිකා නාම සෙසා රූපා රූප පටිසන්ධිකා.

389. ආරුප්ප චුතියා හොන්ති හෙට්ඨි මාරුප්ප වජ්ජිතා,
පරමාරුප්පසන්ධිච තථා කාමෙ තිහෙතුකා

390. රූපාවචර චුතියා අහෙතු රහිතා සියුං,
සබ්බකාම තිහෙතුම්හා කාමෙ ස්වෙව පනෙතරා.

අයමෙත්ථ චුති පටිසන්ධික්කමො.

---

391. ඉච්චෙවං ගහිත පටිසන්ධිකානං පන පටිසන්ධි නිරොධානන්තර තොප්පභූති තමෙවාලම්බනමාරබ්භ තදෙව චිත්තං යාව චුති චිත්තුප්පාද භවස්ස අංගභාවෙන භවාග සන්තති සංඛාතං මානසං අබ්බොච්ඡින්නං නදීසො තොවිය පවත්තති.

392. පරියොසානෙව චවන වසෙන චුති චිත්තං හුත්වා නිරුජ්ක්ධති.

393. තතොපරංච පටිසන්ධාදයො රථචක්කමිව යථාක්කමං
එවමෙව පරිවත්තන්තා පවත්තන්ති.

394. පටිසන්ධි භවංග වීථියො චුතිචෙහ තථා භවන්තරෙ,
පුනසන්ධි භවංග මිච්චයං පරිවත්තති චිත්තසන්තති.

395. පටිසංඛාය පනෙතමද්ධුවං අධිගන්ත්වා පදමච්චුතංබුධා,
සුසමුච්ඡින්න සිනෙහ බන්ධනා සමමෙස්සන්ති චිරාය
සුබ්බතා.

ඉති අභිධම්මත්ථ සංගහෙ වීථි මුත්ත සංගහ විභාගො නාම.

පඤ්චමො පරිච්ඡෙදො

නමෝ තස්ස භගවතො අරහතෝ සම්මා සම්බුඩස්ස

# වීථිමුක්ත සංග්‍රහයෙහි ස්වරූප

## 5 වෙනි පරිච්ඡේදය

ප්‍රවෘත්ති කාලයෙහි වීථි චිත්තයන් ගේ පැවැත්මට අන තුරුව පටිසන්ධි චුති කාලයන්හි චිත්තයාගේ පැවැත්ම වීථි මුක්ත වශයෙන් දක්වනු ලැබේ. එය චතුෂ්ක සතරකි. භූමි 4 ය, පටිසන්ධි 4 ය, කර්ම 4 ය, මරණෝත්පත්ති 4 ය යි මෙසේ චතුෂ්ක සතරක් දක් වේ. ඉන් පළමුව භූමි චතුෂ්කය (4) දක්වනු ලැබේ. අපාය භූමිය, කාම සුගති භූමිය, රූපා වචර භූමිය, අරූපාවචර භූමිය යි. භූමි වශයෙන් සතර වැදෑරුම් වේ.

**අපාය භූමි සතර නම් :** —නිරය, තිරිසන් යෝනිය, ප්‍රේත අපාය, අසුර කාය යයි මෙසේ අපාය භූමි සතරක් වේ.

**කාම සුගති භූමි 7 නම්** :—මිනිස් ලොව, චාතුර්මහා රාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිත වස වර්තතිය යන සතයි. මෙසේ කාම භූමි දුගති භූමි 4 ක් සහ සුගති භූමි 7 කැයි එකොලොස් වැදෑරුම් වේ.

**රූප භූමි 16 නම්** :—බ්‍රහ්මපාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මය යන භූමි තුන ප්‍රථම ධ්‍යාන භූමි වේ. දුතිය ධ්‍යාන භූමි තුන පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර යන තුනයි.

**තතිය ධ්‍යාන භූමි තුන** :—පරිත්ත සුභ, අප්පමාණ සුභ, සුගතිණභ යන තුනයි.

**චතුත්ථ ධ්‍යාන භූමි සත**: —වෙහප්ඵලය, අසඤ්ඤසත්තය යන රූප භූමි දෙක සහ සුඩාවාස රූප භූමි පහද වේ. අවිහය අතප්පය සුදස්සය, සුදස්සිය, අකනිට්ඨකය යන පහ සමග රූප චතුත්ථධ්‍යාන භූමි 7 ක් වේ.

**අරප භූමි 4 නම් :**— ආකාශානඤ්චා යතනය, විඤ්ඤාණඤ් චායතනය ආකිඤ්චඤ්ඤා යතනය, නෙවසඤ්ඤා නා සඤ්ඤායතනය යන 4 යි.

## පටිසන්ධි චතුෂ්කය

අපාය පටිසන්ධි, කාම සුගති පටිසන්ධි, රූපාවචර පටිසන්ධි, අරූපාවචර පටිසන්ධි යයි මෙසේ පටිසන්ධි 4 කි.

අපාය පටිසන්ධිය, පළමුව විස්තර වෙයි. එහි අපාය භූමි 4 අතුරෙන් නිරය, අපාය පළමුව විස්තර වන්නේ ය. නිරය අපායෙහි ද මහ නිරය 8 ද, එක් එක් මහ නිරයක් අවට සතර පැත්තේ ඔසු පත් නමින් 4 බැගින් කුඩා නිරය 16 ක් තිබෙන්නේය. මහා නිරය 8 ට නම් වශයෙන් — සංජීවය, කාල සූත්‍රය, සංඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය, යන අටයි. තවත්වේතරණී නරකය, අසිපත්‍ර නරකය, කුක්කුල නරකය, ගූථ නරකය, සිම්බලී මන නරකය, ලෝහ කුම්භී නරකය, මෙනම් ඇති නරක යන් ද වේ. නිරය අපාය පොළොව ඇතුලෙහි එකිනෙකට දුරින් පිහිටියේ ය. ඒවායේ සතර පැත්තම ලෝහ විය. ඇතුලත ගිනිදැල් වලින් පිරී ඇත්තේ ය. ගින්නෙන් කැකෑරෙන ලොහොදියෙන් ද යුක්ත වේ. දෙරටු සතරක් සතර පැත්තෙන් පිහිටියේ ය. යොදුන් සිය ගණන් විශාල වේ. අවීචි මහ නිරය දුකෙන් පිරී තිබෙන්නා සේම සත්වයින් ගෙන් ද පිරී පවත්නේ යයි ද, දෙව්දත් කීප වාරයක් බෝධිසත්වයින්ට ද්‍රෝහි කම් කොට පොළොව දෙබෑවී මැරී අවීචි නිරයෙහි උපන් බව බණ පොත්වල දක්නට ලැබේ. (වර්තමානයේ ද ගම් පිටින් සමහර පලාත් වල පොළොවෙ ගිලෙන බව කියති.) එක් වරක් අපාගත වූන කෙනෙකුට නැවත සුගති භවයක ඉපදීම ගැන කරන කණ කැස්බෑවා ගේ උපමාවක් දක්වා තිබේ. අපාය භූමි සියල්ලෙහිම පටිසන්ධි ගැනීම උපෙක්ඛා සහගත සංකීර්ණ සිතින් සිදුවේ. අකුසල විපාක උපෙක්ඛා සන්තීරණ සිතින් සිදුවේ. අකුසල් සියල්ලම අපාය භූමි සියල්ලෙහිම පටිසන්ධිය ලබා දෙන්නේය. එක සිත වුවත් විපාක ලැබීමේ දී කරන ලද අකුසල් වලට සරිලන ආකාරයට 3 ක් විපාක ලබන්නේ ය. අවීචියෙහි කල්පයක් පැසෙන්නේ යයි පෙන්වන්නේ ය. එක ආනන්තරිය කර්මය කට එසේ ඒ කාලය දක්වා තිබේ.

**තිරිසන් අපාය** පටිසන්ධිය ද අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් සිදු කෙරෙති. සියලුම ලොකු කුඩා අකුසල් සියල්ලෙහිම පටිසන්ධිය ලබා දෙන සිත වන්නේ නම් සන්තීරණ සිතයි. එසේ පටිසන්ධිය ඊට සුදුසු භවයන්හි ලැබුනාට පසු එම අකුසලයටම සුදුසු විපාක ලැබෙති. තිරිසන් අපාය විසිතුරු බව බුදුරජාණන් වහන්සේ නොයෙක් විට වදාළ සේක. ඉතා කුඩා කුහුඹුවාගේ පටන් ඉතා විශාල ඇතා ඔරන් ඔටා, තල්මසා ආදීන් ද ඉතා විශාල නාග රාජයින් ද පවා ඩැහැ ගෙන යන රාජාලින් වැනි විශාල පක්ෂි ජාතීන් ද තිරිසන් ගත සත්වයෝම ය.

තිරිසන් සත්ව ජාතීන් ද මෙපමණ යයි ගණනක් කිය නොහැක. පොළොව මතු පිට ද, පොළොව ඇතුලත ද, ඝන වනාන්තර වල ගස් වැල් ආදියෙහි ද ගංගා, සාගර, ආදී ජලයෙහි ද තිරිසන් සතුන්ගේ ශරීර වලද, මිනිස් සිරුරෙහි ද මලකුණු ආදියෙහි ද සිටිති. තිරිසන් සතුන්ට වෙන් වූ නියම භූමියක් නැත. ඔවුන් විඳින දුක් රාශිය කිය නොහැක. සමහර විට වෙඩි වැදීමකින් හෝ තුවාල වීමකින් සිටින සත්වයින් ගේ පණ පිටින් සිටිය දීම ඇස් තියුණු හොට වලින් ඇණ ගලවා ගනිති. මේ ආදී දරුණු දුක් ඇති ඇසට පෙනෙන්නට තිබෙන අපාය තිරිසන් අපායයි.

**ප්‍රෙත අපාය පටිසන්ධි ය** ද අකුසල විපාක, උපෙක්ඛා සහගතස න්තීරණ සිතින් සිදුවේ. සැපයෙන් පහවූ සත්ව කොටස යන තේරුම ඇති වචනයකි. ප්‍රෙත නම් වන්නේ ඒ සත්ව කොටස ද ඉතා දුකසේ ජීවත් වන නමුත් සාපිපාසා දුකින් පෙලෙමින් ම ජීවත් වෙති. කොපමණ සාපිපාසා යෙන් පෙළෙතත් නොමැරී ජීවත් වේ. ඒ කර්මයේ ස්වභාවය යි. ඇතැම් අවස්ථා වලදී මිනිසුන්ට ලඳරුවන්ට ආදීන්ට ආරූඪ වී තමාට උවමනා ආහාර පාන ලබා ගනිති. ඔවුන් ද පොළොව මතු පිට ජීවත් වෙති. අඳුරු ස්ථානයෙහි ද අපවිත්‍ර ස්ථානයන් හිද මිනිසුන් ගෙන් ඈත් වී ජීවත් වන්නෝ ය. අතිශයින් විරූපී වූ දුගඳ හමන්නා වූ ද පිළිකුල් කටයුතු ශරීර ඇති අයය. ගිනිගෙන දිලිසෙන ශරීර හා පිරිකර ඇති අයද වස්ත්‍රාභරණ නැති

අයද සිටිති. ගිනිගෙන දිලිසෙන පාත්‍රා සිවුරු දරන මහත් විශාල ශරීර ඇති ප්‍රෙතයින් ද සිටිති. ඇතැමුන්ගේ ශරීර අභ්‍යන්තරය ගිනිගෙන දැවෙන්නාක් මෙන් මහත් ගිනි ජාලාවක් මෙන් වූ ප්‍රෙතයන්ද සිටිති. එවැනි එක් ප්‍රෙතයෙක් ගඟක් අයිනේ වතුරේ යන ශබ්දයද කෑගසන ශබ්දයද ඇසී හාමුදුරුවරු 30 නමක් පමන ඒ සත්වයාට කථා කර ඇසූ විට දැනගන්නට ලැබුනේ පැන් සොයා ගඟ දියේ යන බවත්, යන යන තැන ගංහෙයි ගල මතුවී පෙනෙන බවත් ය. ඒ හාමුදුරුවරු ප්‍රෙතයාට දිගා වෙන්නට කියා පින්ඩපාත වේලාව නොපැමිණි බැවින් තම පාත්‍රාවලින් පැන් ගෙන විත් කටේ වත්කර සෑහීමකට පත්වී දැයි ඇසීය. පතක් පමණක්වත් උගුරෙන් ඇතුලට ගියා නම් ප්‍රෙත ආත්මයෙන් නොමිදේවා යයි ද ධර්මයෙහි කී බව සඳහන් වේ.

මහත් රාශියක් ප්‍රෙත කොටස් පෙන්වා තිබේ. ප්‍රෙත වත්ථුප්පකරණ නමින්ම පොතක් තිබේ. නානා ප්‍රකාර ප්‍රෙත සත්ව කොටස් සිටී. වන්තාස, කුණපාස, අග්ගිජාලමුඛ, ශුථ ඛාදක, සුචිමුඛ, පච්චතංග, අජගර, මහාසික යයි ද ප්‍රෙත කොටස් සිටිති.

පරදත්තුප ජීවි ඛුප්පිපාසික, නිජ්ඣාමතණ්හිකය, කාලකඤ්ජිකය කියා කොටස් සතරක් ද සිටිති. පරදත්තුප ජීවින්ට අයත් කොටසට ලැබෙන ආහාර පානාදිය සඳහා ඔවුන්ගේ ඥාතීන් දනාදී පින් කම් කොට ආහාර පාන වස්ත්‍රාදී පූජා කර පින් අනුමෝදන් කරවීමෙන් ඔවුනට ආහාර පානාදිය ලැබෙති. අවුරුද්දකට පමණ උඩදී එවැනි කාරනයක් ගුවන් විදුලි ධර්ම දේසනාවකදී ඇසුනි. (ඒ ප්‍රෙතයා තම නිවසේ ගොම වලේ ඉපද, සිට ගෙදරම සිටි ලමයෙකුගේ තුවාලය රැට ලෙවකන බැවින් එය සුව නොවන නිසා සොයන විට හීනෙන්දෝ තමාගේ තත්ත්වය දන්වා පින් ලබාගත් ආකාරය ඒ පින් අනුමෝදන් කල ස්වාමීන් වහන්සේම ප්‍රකාශ කළේය. තවත් එවැනිම ප්‍රවෘත්තියක් අති පූජනීය තුඩාවේ අරියවංස නායක ස්වාමීන් වහන්සේ ද දේසනාවක දී ප්‍රකාශ කලේය.) ඒ සත්ව යාට තමන්ගේ ස්වභාවයෙන් පෙනෙන්නට එන්ට කීවාම අඬා

වැටී එසේ ආවොත් අසලක වත් කිසිවෙක් සිටින්නේ නැත. දුර්ගන්ධය සහ විරූප ස්වභාවය නිසා. ඒ පින් අනුමෝදන් කළ ස්වාමීන් වහන්සේලා ගෙන්ම දැනගන්නට ලැබුන දේ ය.

සමහර ප්‍රේතයින්ගේ හිස මුදුනේ ඇස් දෙක සහ මුඛය කුඩා වට පිහිටි අය යයි ද කියා තිබේ.

අසුර යනුද සත්ව කොටස් කීපයකි. දේව කොටසට අයත් අසුරයින් ද සිටිති. දෙවියන්ට සතුරු අසුර කොටසක් ද වේ. අසුර භවනයෙහි වේපචිත්ති, පහාරද ආදී ආනුභා සම්පන්න අසුර කොටස් සිටී. රාහු නමින් අසුරේන්ද්‍රයෙක් ගැන ධර්මයෙහි සඳහන් වේ. විනිපාතික අසුර නමින් මාර්ග ඵලලත් අසුර මාතාවන් දෙදෙනෙක් ගැන ද සඳහන් වේ. පියංකර මාතා, උත්තර මාතා, නමින් දැක්වේ. වේමානික යනු ප්‍රේත අසුරයන්ය. ලෝකාන්තරික නරකයෙහි සිටින සත්ව කොටස ද අසුරයින් වශයෙන් ප්‍රකාශ වේ. මහ මෙර පත්ලෙහිද අසුර භවනයක් ඇතැයි සඳහන් වෙයි. කලක් දුක් විඳින කලක් සැප විඳින සත්ව කොටසක් ද මීටම අයත් වේ. මහ මෙර පත්ලෙහි අසුර භවනයෙහි සිටින්නන් අපායට අයත් නොවේ යයි ද යොදුන් ගණන් දිග ශරීර ඇති අසුරයින් ගැන ද සඳහන්ව තිබේ.

මෙසේ කාම භූමි 11 පෙන්නුම් කරති. මිනිස් ලොව, දෙව්ලෝ සය, සහ අපාය භූමි 4 ද යන ස්ථාන 11 ක් වේ.

## කාමාවචර පටිසන්ධි 10 කි.

අපාය පටිසන්ධි සිත් 1 කි. සියලුම පටිසන්ධි ගන්නා සත්වයින් ගේ උත්පත්තියේදී ලැබෙන මුල්ම සිත පටිසන්ධි සිත නම් වේ. මිනිස් ලොව හෝ දෙව්ලොව හෝ සිට චුත වී අපාය භූමියෙහි පටිසන්ධි ගන්නා සත්වයින්ට අලුත් භවය වන අපාය භූමියේදී පටිසන්ධි සිත අකුසල විපාක උපෙක්ඛා සන්තීරණ සිතයි. මහේසාක්‍ය ව සිටි දෙවියෙකුට වුවද පටිසන්ධිය මෙසේය. මේ දුගති අහේතුක පටිසන්ධි යයි.

සුගතියෙහි ද අහේතුක පටිසන්ධි එකක් ලැබෙති. ද්වි හේතුක ඕමක (ලාමක) කුසලයෙන් ලබන පටිසන්ධි යයි. කුසලය හරිහැටි නුවන ඇතිව කර නො ගැනීම හේතු කොට මෙසේ මහා අවාසනාවන්ත තත්ත්වයට පත් වන්නේ ය. ධර්මයෙහි වැඩි වශයෙන් විශේෂයෙන් අභිධර්මයෙහි කුසල් අකුසල් ආදිය ඉතා පැහැදිලිව විස්තර වශයෙන් තෝරා බේරා පැහැදිලි කරන්නේය. කරන ලද කුසල් බාල කර නොගෙන උතුම් ලෙස උතුම් සැප ලබා ගැනීම සඳහා ද, නිවන් ලබා ගැනීමට උපකාර වන ත්‍රිහේතුක උපතක් ලබා ගැනීම සඳහා ද, මහා කරුණාවෙන් දැන වදාල බුදුරජාණන් වහන්සේ අභිධර්ම දේශනාවේ දී ඉතිරි නැතිව මේ ධර්ම සියල්ල පහදා වදාල සේක.

සුගති අහේතුකයා උපතින්ම ඇස් නොපිහිටියා වූ අන්ධයෙකි. නැතහොත් ගොළුවෙකි. බිහිරෙකි. උපතින්ම උමතුවෙකි. නපුංසකයෙකි. උභතොබ්‍යඤ්ජනකයෙකි. නැතහොත් කිසිම දෙයක් තේරුම් නැති කෙල ටික පවා වැගිරී යන කෙනෙකි. මෙසේ උපදින්නේ අකුසලයෙන් නොවේ. කරන ලද කුසල් හරි හැටි නො කිරීමේ අනුවන කම නිසාය. හොඳට නුවන ඇතිව කරන කුසලය පවා ඇතැම් විට පසුව නොමනා ලෙස ඒ ගැන සිතා කතාබස් කර කුසල් බාල කර ගැනීමෙන් වූ විපාකයයි. දුර්වල වන්නේ විපාකයයි. හරි හැටි නොලැබී යයි. මොන තරම් පාඩුවක් ද එයින් පෙන් වන්නේ කුසල කිරීමත් කර අවසන් වූවාට පසුවත් කුසලය ප්‍රවේසම් කර ගැනීමයි. ඒ ටික හරි හැටි කර ගැනීමට බුදු බණ හරි හැටි දැන ගත යුතු වේ. හිත ගැන දැනගත හොත් කුසල් කිරීමට බොහෝ ප්‍රයෝජන වේ. සුගති අහේතුකය ධර්මයෙහි හඳුන්වන්නේ මෙසේය: ජාති අන්ධ, ජාති බධිර, ජාති මූග, ජාති එල, ජාති උම්මත්තක, පණ්ඩක, නපුංසක, උභතොබ්‍යඤ්ජනක, යනාදි නම් වලිනි. මව් කුස තුල දීම ඇස් ආදිය පිහිටන අවස්ථා වෙහි නොලැබී යාම ජාති අන්ධ ආදී සුගති අහේතුක නාමය ලබයි. ඇස් ආදිය ලැබී පසුව වෙනයම් කිසි ආකාරයකින් මේ ඉන්ද්‍රිය ධර්ම විනාශ වීම පාඩුවක් වුවත් සුගති අහේතුක නොවන්නේය. ත්‍රිහේතුක යෙකුට හෝ පසුව එසේ සිදුවිය හැකිය. යම් කිසි අකුසල කර්මයක් විපාක වශයෙන් මතු වුව හොත් එසේ භවයේ කරන ලද නොමනා ක්‍රියාවන් නිසා හෝ එසේ වේ.

## කාම සුගති පටිසන්ධි 8 නම්

කාමාවචර කුසලයන්ගේ ද්විහේතුක, ත්‍රිහේතුක පටි සන්ධි මීට අයත් වේ. අහේතුක පටිසන්ධිය හේතු නො යෙදුනු පටිසන්ධියයි. කාමාවචර මහා විපාක සිත් අටෙන් ලබන පටි පටි සන්ධි අට මනුෂ්‍ය ලෝකයෙහි සහ දේව්ලෝ සයෙහි ද ලැබෙති.

මේ පටිසන්ධි 8 හි. ද්විහේතුක 4 ද ත්‍රිහේතුක 4 ද වේ. ද්විහේතුක පටිසන්ධි ද්විහේතුක උත්කෘෂ්ඨ කුසලයෙන් හා ත්‍රිහේතුක ඕමක (ලාමක) කුසලයෙන් සිදු වේ. ඒ නුවන නැති පටිසන්ධි 4 ය. ත්‍රිහේතුක උත්කෘෂ්ඨ කුසලයෙන් ත්‍රිහේතුක පටිසන්ධි සතර සිදුවේ. ත්‍රිහේතුකව නුවන ඇතිව උපත ලැබුණු නම් නියම ප්‍රයෝජන ලබන්නේය. ධ්‍යාන මාර්ග ඵල ලැබීමට උපතින්ම නුවන තිබිය යුතුය.

දුගති අහේතුක, සුගති අහේතුක, ද්විහේතුක සහ ත්‍රිහේතුක යන පටිසන්ධි සිත් 10 න් නිරය, අපාය 4 සුගති භූමි 7 පටි සන්ධි ඇති කරයි. මේ සත්වයින්ගේ ආයු ප්‍රමාණය නියමයක් නැත්තේය. ඒ එක් එක් භවයක ආයු කාලය නියමව ඇතත් එහි උපන් අය ඒ ආයු කාලයම එහි සිටින වාය කියා නියමයක් නැත.

දෙව්ලෝ 6 හි දෙවියන්ගේ ආයු ප්‍රමාණය දක්වා තිබෙන්නේ මෙසේය. චාතුර්මහා රාජිකයට ආයු ප්‍රමානය දිව්‍ය ගණනින් 500 කි. මිනිස් ගණනින් අවුරුදු 50. එහි එක් දිනයකි. ඒ ගණනින් මාස අවුරුදු ගණන් ගනු ලැබේ.

තව්තිසා දෙව්ලොව දිව්‍ය ගණනින් 1000 කි. මිනිස් ගණ නින් අවුරුදු 100 ක් එහි එක් දිනයකි. එබැවින් 1000 වේ යයිද,

යාම දෙව් ලොව දිව්‍ය ගණනින් 2000 කි. මිනිස් ගණනින් අවුරුදු 200 ක් එක් දිනයකි. ඒ ගණනින් ගණන් ගනු ලැබේ.

තුසිත දෙවියන්ගේ ආයු කාලය අවුරුදු 4000 කි. මිනිස් ගණනින් අවුරුදු 400 ක් එක් දිනයකි. ඒ බැගින් ගණන් ගනු ලැබේ.

නිර්මාණරති දෙව්ලොව ආයු කාලය දිව්‍ය ගණනින් 8000කි. මිනිස් ගණනින් අවුරුදු 800 ක් එක් දිනයකි. ඒ බැගින් ගණන් ගනු ලැබේ. පරනිර්මිත වසවර්ති දෙව්ලොව ආයු කාලය දිව්‍ය ගණනින් 16000 කි. මිනිස් ගණනින් අවුරුදු 1600 ක් එක් දිනයකි. ඒ ගණනින් මාස අවුරුදු ආදිය ගණන් ගන්නේ යයිද, එහි දෙව්ලෝ වල ආයු කාලය මිනිස් ගණනින් වැඩි වීමත් දිව්‍ය ගණනින් වැඩි වීමත් වන්නේ යයි ද පෙන්වා තිබේ.

## රූපාවචර ප්‍රතිසන්ධි 6

ප්‍රථම ධ්‍යාන විපාක සිත ප්‍රථම ධ්‍යාන භූමි තුනෙහි ප්‍රතිසන්ධි ලබා දෙන්නේය. ධ්‍යාන කුසල් පරිත්ත, මධ්‍යම, ප්‍රනීත වශයෙන් ත්‍රිවිධාකාර වේ. එසේ හෙයින් උපදනා භූමි තුනක් වේ. බ්‍රහ්ම ලෝකවල ආයු කාලය පෙන්වා තිබෙන්නේ කල්ප වලිනි. ප්‍රථම ධ්‍යාන භූමි පළමු වැන්නට බ්‍රහ්ම පාරිසජ්ජයට අසංඛ්‍යය කල්පයෙන් තුනෙන් කොටසකි. බ්‍රහ්ම පුරෝහිතයට අසංඛ්‍ය කල්පයෙන් දෙකෙන් කොටසකි. මහා බ්‍රහ්මයට අසංඛ්‍ය කල්පයකි. පරිත්තාභයේ සිට ඉහළට මහා කල්පයන් ගෙන් ආයු කාලය පෙන්වන්නේය. පරිත්තාභයට මහා කල්ප දෙකක් වේ. අප්පමාණභයට 4 කි. ආභස්සරයට 8 කි. දුතිය ධ්‍යාන තල තුනයි.

තතිය ධ්‍යාන භූමි තුන, පරිත්ත සුභයට 16 කි. අප්පමාණ සුභයට 32 කි. සුභකිණ්හයකයට 64 කි.

චතුත්ථ ධ්‍යාන භූමි 7 කි. වෙහප්ඵලය 500 කි. අසඤ්ඤ සත්තය 500 කි. (මේ රූපය පමණක් ඇති බඹලොව) යි. සුද්ධාවාස භූමි 5 අවිහය මහා කල්ප 1000 කි. අතප්පය 2000 කි. සුදස්සය 4000 කි. සුදස්සී 8000 කි. අකනිට්ඨකය 16000 කි.

## අරූපා වචර ප්‍රතිසන්ධි 4

| | | | | |
|---|---|---|---|---|
| ආකාසානඤ්චායතන භූමියෙහි | ආයුෂ | මහාකල්ප | | 20000 |
| විඤ්ඤාණඤ්චායතන | ,, | ,, | ,, | 40000 |
| ආකිඤ්චඤ්ඤායතන | ,, | ,, | ,, | 6000 |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන | ,, | ,, | ,, | 84000 |

අන්තඃ කල්ප 20 ක් අසංඛ්‍ය කල්පයකි.

සෑම කල්ප විනාශයකදීම ප්‍රථම ධ්‍යාන තල තුන විනාශ වන්නේ යයි ද පෙන්වා දී තිබේ.

### 3 කර්ම චතුෂ්කය

කෘත්‍ය වශයෙන් කර්ම 4
ජනක උපස්ථම්භක උපපීඩක උපඝාතක යනුයි.

විපාක දෙන පිළිවෙලින් කර්ම 4 —
ගරුක, ආසන්න, ආචින්න, කටත්තා කර්ම

විපාක දෙන කාල වශයෙන් 4 —
දිට්ඨධම්ම වේදනීය උපපජ්ජ වේදනීය අපරාපරිය වේදනීය අහෝසි කම්ම

විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම 4 —
අකුසල, කාමාවචර කුසල, රූපාවචර කුසල අරූපාවචර කුසලයයි.

**ජනක කර්ම නම්** :—ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති විපාක උපදවන කුසල අකුසල කර්මයි. එහි විපාක නම් විපාක චෛතසික සහිත සිත් සහ කර්මය නිසා හටගන්නා රූපයෝ ය. කර්ම කර්ම පථ වශයෙන් කරන ලද කුසලාකුසල යන් දෙපරිදි වේ. කර්ම පථ වූවෝ ප්‍රතිසන්ධි ලබා දීම සහ ප්‍රවෘත්ති විපාක ද උපදවත්. කර්ම පථ නොවූ චේතනා සියල්ලම ප්‍රවෘත්ති විපාක

ඉපදවීමට අවස්ථාව ලද හොත් උපදවන්නේ ය. එසේ නො ලැබුනේ නම් අහෝසි කර්ම වේ. කර්ම පථ භාවයට පැමිණි කර්මයන් ගෙන් ද එක කර්මයකින් එකම පටි සන්ධියක් සහ අවස්ථාව ලැබුනේ නම් බොහෝ වාර ගණනක් ප්‍රවෘත්ති විපාක ලබා දෙන්නේය. එසේ නොලැබුනේ නම් අහෝසි කර්ම වේ. පඤ්චද්වාරයෙහි උපදනා කර්ම චේතනා පටි සන්ධි ලබා දීමට බලසම්පන්න නොවේ.

**උපස්ථම්භක කර්ම නම්** :—උපස්ථම්භනය යනු රැකුල් දීමයි. උපකාර වීමයි. කර්ම කථාවෙහි දී උපකාර වීම ජනක කර්මයටයි. ජනක කර්ම කුසල ජනක කර්ම සහ අකුසල ජනක කර්මය යි දෙපරිදි වේ. අකුසල ජනක කර්මයෙන් සතර අපායේ උත්පත්ති ලබා දී ප්‍රවෘත්ති විපාක වශයෙන් 3 ක් ලබා දීමයි. ජනක කර්මයටයි උපකාරය, අකුසල ජනක කර්මයට දුක් විපාක ලබා දීමත් කුසල ජනක කර්මයට සැප විපාක ලබා දීමත් උපස්ථම්භක කර්ම වන්නේ ය.

**උපපීඩක කර්ම නම්** :—ජනක කර්මයටය කීමෙන් අදහස් කරන්නේ ඒ කර්මයෙන් උපන් සත්වයාටයි. සැප දුක් දීම කරන්නේ. උප පීඩක යන්නෙහි අදහස පීඩා කිරීම කදරදර කිරීම. ජනක කර්මයට පීඩාව විය යුත්තේ අකුසල ජනක කර්ම වන සතර අපායේ උපදවන කර්මයි. ඒ කර්මයට කරන පීඩාව නම් ඒ කර්මයෙන් උපන් සත්වයාට කර්මානුකූල නොවන විපාක ලබා දීමයි. සැප දීමයි. සමහර බල්ලන් ආදි සතුන්ට සාමාන්‍ය මිනිසුන්ට වඩා සැප ලැබේ. ඒ ජනක කර්මයට පීඩාවකි. පෙර භවයක කරන ලද කුසල කර්මයක විපාකයි. මිනිසුන්ට දුක් විපාක ලැබීමත් ජනක කර්මයට කරන පීඩාවකි.

උපඝාතක කර්ම නම් ජනක කර්ම නසා දැමීමයි. විනාශ කිරීමයි. ඝාතනය කිරීම නම් විනාශ කිරීමයි. ජනක කර්ම යෙන් ප්‍රතිසන්ධිය ලබා දුන් පුද්ගලයා යි ජනක කර්මය වශයෙන් ගනු ලබන්නේ කුසල ජනක කර්මයෙන් උපන්නහුට බලවත් අකුසල කර්මයන් ඉදිරිපත්වී විනාශ කිරීමයි. අකුසලයෙන් උපන්නහුට කුසල කර්මය කින් විනාශ කිරීමයි. සැපයට පැමිණ වීමයි.

## විපාක දෙන පිළිවෙලින් කර්ම චතුෂ්කය

ගරු කර්ම, ආසන්න කර්ම, ආචින්න කර්ම සහ කටත්තා යන 4 යි.

**ගරු කර්ම නම්** :—අන්‍ය කර්මයකින් විපාක දීම වලක්වා ලන්ට නො හැකි බලවත් කර්මයි. එය අකුසල පක්ෂයෙහි ආනන්තරිය කර්ම වන, මව් මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදු සිරුරෙන් ලේ සෙලවීම සහ සංඝ භෙද කර්මය සහ නියත මිථ්‍යා දිට්ඨිය යි.

සංඝ භෙද කර්මය සංඝයා වහන්සේ කෙනෙක් විසින්ම කලයුතු කර්මයකි. ගිහියන්ට සංඝභෙද කියන මහා සාවද්‍ය අකුසල කර්මය කල නොහැක. හාමුදුරුවරු දෙදෙනෙක් තරහ කරවීම, බොරු කේලාම් කීම, සංඝ භෙද ආනන්තරිය අකුසලය නොවේ. දෙව් දත් අපාගත වූයේ සංඝ භෙද අකුසල කර්මයෙනි. බුදුරජාණන් වහන්සේට වත් එය වලක්වා ලන්නට ඉඩ නොලැබුනේ ය.

**කුසල ගරු කර්ම නම්** :—නො පිරිහුනු ධ්‍යාන කුසල් 9 යයි. ධ්‍යාන කුසල් මරණය දක්වා නොපිරිහී තිබුනේ නම් ඒ කුසල යෙහි විපාක වශයෙන් බඹලොව උත්පත්තිය ලැබීම. ඒ ධ්‍යානයේ විපාක ලැබීමයි. අකුසල ගරු කර්ම වලට දෙවැනි භවයේ ඒකාන්තයෙන්ම නිරය අපාය නියත වේ.

**ආසන්න කර්මය නම්** :—මරණයට ලංවී හෝ කරන ලද කර්මයි. එසේ නැතහොත් කලින් කරන ලදුව මරණයට ලංව සිහි කරන ලද හෝ කර්මයෝ ය. කුසල කර්ම හෝ අකුසල කර්මයයි.

**ආචින්න කර්ම නම්** :—දිනපතාම බහුල වශයෙන් පුරුදු කරන ලද හෝ කරන ලද කර්ම නැවත නැවත සිහි කොට ශක්තිමත් කරන ලද කර්මයෝ ය. කුසල අකුසල දෙපක්ෂයේම කර්ම මෙසේ ආචින්න කර්ම වේ. දුටුගැමුණු රජතුමාගේ

දන් දීමේ පුරුදු තාවය මෙනි. සැහවී පලායන රජතුමාට කැලේ මැදදී ආහාර වේලාව පැමුණුන කල්හි අශ්වා රෝහකයාගේ ආහාර වේල 4 ට බෙද අධිෂ්ඨාන කර සත්‍ය ක්‍රියා බලයෙන් රහතන් වහන්සේ නමක් ලබාගෙන එක් කොටසක් දන්දීමෙ කතාවක් ඇත්තේ ය. අනිත් කොටස් 3 රජතුමා ද, ඇමතියාද, අශ්වයාද ප්‍රයෝජනයට ගත් බව සඳහන් වෙයි. ආචින්න කර්මය යි.

**කටත්තා කර්ම නම්** :—ගුරු කර්මාදියත් නොතිබුනේ නම් ඊට අයත් කර්ම හැර මේ භවයේ කරන ලද කර්ම හෝ පූර්ව භවයක කරන ලද හෝ කුසල කර්ම හා අකුසල කර්මයෝ ය.

### විපාක දෙන කාල වශයෙන් කර්ම චතුෂ්කය

දිට්ඨධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය, අපරාපරිය වේදනීය අහෝසි කම්ම යන 4 ආකාර යයි.

**දිට්ඨධම්ම වේදනීය කර්ම නම්** :—කර්මය සිදු කල ආත්ම භාවයේම විපාක ලබා දෙන කුසල කර්ම හා අකුසල කර්ම යි. කුසල පක්ෂයෙහි ඒක සාටක බ්‍රාහ්මයාට ලැබුන සම්පත් ද පුණ්ණ දුගියාට ලැබුන සිටු තනතුර ද අකුසල පක්ෂයෙහි චිංච මානවිකාව සහ දෙව්දත් බුදුරජාණන් වහන්සේට දෝසා රෝපනය කිරීම නිසා අපාගත විය. මේ ආදිය දිට්ඨධම්ම වේදනීය විපාක වෙති. කෝකාලිත අගසව් දෙනමට දෙස් නගා ද, මහා කපි ජාතකයේ දුගියාට ලැබුන දරුණු විපාක ද වේ.

**උපපජ්ජ වේදනීය කම්ම නම්** කුසල කර්ම හෝ අකුසල කර්ම කරන ලද ආත්ම භාවය හැර ඊළඟම ඇති මරණය සිදු වූ අනතුරුවම විපාක උපදවන කුසල අකුසල කර්ම අජාසත් රජු අපාගත වීම මණ්ඩූකයා දෙව් පුත්ව ඉපදීම ආදිය මෙනි.

**අපරාපරිය වේදනීය කම්ම නම්** කර්මය සිදු කලාට පසු තුන්වන ආත්ම භාවයේ සිට රහත් වී පිරිනිවන් පානා තාක් කල් විපාක උපදවන කර්මයෝය. එක්තරා අවස්ථාවක කිරි

වවුල්ව සිට අභිධර්ම සජ්ඣායනය අසා සිටි කුසලය තුන්වන ආත්ම භාවයේ අභිධර්මය පළමුව ඉගෙනීමේ භාග්‍ය ලත් සැරියුත් මහරහතන් වහන්සේ ගේ ශිෂ්‍ය 500 ක් රහතන් වහන්සේලා කුසල පක්ෂයෙහි ද අකුසල පක්ෂයෙහි මුගලන් මහරහතන් වහන්සේට පල් හොරු බලවත් පීඩාවට පත් කිරීම ආදිය ද වෙති.

**අහෝසි කම්ම නම්** :—අහෝසි කම්ම නමින් කුසලා කුසල දෙපක්ෂයෙහිම කර්ම ජාතියක් නැත. නමුත් කරන ලද කුසල අකුසල දෙපක්ෂයෙහිම විපාක දීමට අවස්ථාව නොලබන ලද කර්ම අහෝසි වේ. විපාක නො ලැබෙන්නේ ය. රහත් වූවාට පසු ඉතිරි සියලුම කර්ම අහෝසි වන්නේ ය. අංගුලිමාල මහ රහතන් වහන්සේ රහත් වීමට පෙර කරන ලද අකුසල කර්ම විපාක දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් ලැබුන කර්ම විපාක හැර ඉතිරි අපරාපරිය වේදනීය වශයෙන් විපාක දිය හැකි සියලුම කර්ම අහෝසි කර්ම විය.

### විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම චතුෂ්කය

අකුසලය, කාමාවචර කුසලය, රූපාවචර කුසලය, අරූපා වචර කුසලය යන සතරයි.

අකුසල කර්මය කායකර්ම, වාග් කර්ම, මනෝ කර්ම යයි කර්මයන් සිදු වන ද්වාර තුනක් වේ. එහි සිදුවන කර්ම ද්වාර යන්ගේ වශයෙන් ප්‍රාණඝාත, අදත්තාදන, කාමයෙහි වරදවා හැසිරීම, යන තුන බොහෝ සෙයින් එය සිදු කිරීමට කයේ උපකාරයෙන්ම කලයුතු බැවින් කාය කර්ම නම් වේ. ආණත්තික වශයෙන් වුවත් කය උපයෝගී වීමෙන්ම සිදු වේ. මුසාවාද ආදී 4 බොහෝ සෙයින් වාග් විඤ්ඤත්තිය නිසා සිදු වේ. ලියා පලකිරීමට හැකි ද වේ. හස්ත විකාර ආදියෙන් ද සිදු කල හැකි වේ. අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යා දිට්ඨි යන තුන සිතෙහිම උපදනා අකුසල කර්මයෝ ය. කාය, වාග් ද්වාරයන් හිද ඇති විය හැකි වේ.

ප්‍රාණඝාත, පරුෂ වචන, ව්‍යාපාද යන අකුසල් තුන ද්වේෂය මුල් කොට සිදු වේ.

කාම මිච්ඡාචාරා, අභිධ්‍යා, මිථ්‍යා දිට්ඨි යන තුන ලෝභය නිසාම සිදු වේ.

අදත්තාදන, මුසාවාද, පිසුනාවාච, සම්පප්ප්‍රලාප යන සතර ලෝභය, ද්වේෂය යන දෙකම නිසා සිදුවේ. මේ සැමටම මෝහය යෙදෙති.

## කාමාවචර කුසල කර්මය

කාමාවචර කුසල කර්මයන් ද කර්ම ද්වාර තුනෙහි ම ඇති වේ. දන සීල, භාවනා වශයෙන් කුසල කර්ම තුන් වර්ගයකි දන, සීල, භාවනා, අපචායන, පත්තිදන, වෙයාාවච්ච පත්තානු මෝදනා ධම්ම සවන, ධම්ම දේසනා, දිට්ඨි උජු කම්ම යනාදී වශයෙන් දස ප්‍රභෙද වේ.

සිත් වශයෙන් කාමාවචර කුසල කර්ම සියල්ල සිදුවන කුසල් සිත් ද, සියලුම අකුසල කර්ම සිදුවන අකුසල් සිත් 12 ද තිබේ. ඒවායින් කාමාවචර කර්ම සියල්ල සිදු කරයි. කාම කුසලය, කාම සුගති භූමි 7 කි. පටි සන්ධි විපාක ද ප්‍රවෘත්ති විපාක ද උපදවත්, රූපාවචර භූමින් හිද ප්‍රවෘත්ති විපාක වශයෙන් චක්ඛු පසාද ආදී කුසල අකුසල විපාක කීපයක් ලැබෙති. අරූප ලෝකයෙහි නො ලැබෙති.

කාමාවචර කුසලය ද්විහේතුක, ත්‍රිහේතුක, වශයෙන් ද, උත්කෘෂ්ඨ ඕමක වශයෙන් ද ප්‍රභෙද තිබේ. විපාක දීමෙහි දී ඒ තත්ත්වයන්ට අනුව විපාකයෙහි බලා බල ඇතිවන්නේ ය. යම් කුසලයක් මුලින් හෝ යම්කිසි විධියකින් නීවරණ ආදියෙන් හෝ අත්තුක්කංසන පරවම්භනාදියෙන් හෝ කිලිටි නොවූයේ නම් උත්කෘෂ්ඨ ඉතා වටිනා කුසලයක් වේ. එයින් ත්‍රිහේතුක උපතක් ලැබිය හැකි වේ. ත්‍රිහේතුක ඕමක කුසලයෙන් ද්විහේ තුක පටි සන්ධියක් ලැබේ. ද්විහේතුක උත්කෘෂ්ඨ කුසලයෙන් ද ද්විහේතුක පටිසන්ධියක් ලැබේ. එහෙත් මේ දෙදෙනාගේ කුසල් කිරීම් ආදී වැඩ වල බොහෝ වෙනස් ස්වභාවයන් ඇත්තේ ය.

කුසල් කොට පසුව ඒ ගැන පසු තැවීම් ආදියෙන් එහි විපාකය දුර්වල වේ. කරන ලද කුසලය ගැන පසුව සිත සතුටු කර ගැනීමෙන් මහත් ලාභයක් වූයේ යයි සිතා කුසල් වශයෙන් සිතා සතුටු වීමෙන් විපාකය ශක්තිමත් වේ. ලෝභ වශයෙන් සතුට ඇති කර ගතහොත් විපාකය බාල වේ. යෝනිසෝ මනසි කාරය ඇති වුනි නම් කුසල විපාකය බාල කර නො ගන්නේ ය. එයයි ප්‍රතිකාරය හරි හැටි කුසල් කිරීමත් කරන ලද කුසලයෙහි විපාක බාලකර දුර්වල කර නො ගැනීමත් දෙකම නුවනින් යුතුව යෝනිසෝ මනසි කාරය ඇති කර ගෙන ම කළ යුතු වේ. ලෝභ දිට්ඨි, මාන, ආදියෙන් කුසලය දුබල වේ. විපාකය හීන වේ. එවිට ත්‍රිහේතුක කුසලයට ද්විහේතුක විපාක ලැබේ. ද්වි හේතුක කුසලයට අහේතුක විපාක ලැබේ. කුසල් කර පසුව නුවන මදකමින් එසේ කර ගනී.

## රූපාවචර කුසල කර්ම

රූපාවචර කුසල් මනෝ කර්ම වශයෙන් මනොද්වාර යෙහිම සිදු වන්නේ ය. සමථ භාවනා බලයෙන්ම ලැබිය යුතු වේ. එයටම අපර්ණා කුසල් යනු ද ව්‍යවහාර වේ. අපර්ණා කුසල් රූපාවචරය අරූපාවචරයයි දෙපරිදි වේ. රූපාවචර කුසලය ප්‍රථම ධ්‍යානාදී වශයෙන් එකකට වඩා ඊළඟ කුසලය උසස් වේ. එසේද ප්‍රභෙද වේ. ප්‍රථම ධ්‍යානාදී කුසලයෙහි ද පරිත්තය, මධ්‍යමය, ප්‍රණීතය යයි උසස් ලෙස ලබන ක්‍රම තිබේ. ඊට ප්‍රතිසන්ධි ලබන ස්ථාන ද වෙන් වශයෙන් තිබේ. භාවනා දියුණු කිරීමෙහි දී අධිපති ධර්ම ආදීන් ගේ යෙදීමේ ආකාරයට හීනාදීන් ඇති වේ. කුසල් කිරීමෙදී උසස් පහත් ලෙස කුසල් කිරීම හේතු කොට සත්වයින්ගේ මහේසාක්‍ය අල්පේසාක්‍යා දී උසස් බව හා හීන බව සිදු වේ. කුසල් කිරීමට ද ධර්මය ඉගනීම ඉතාම ප්‍රයෝජන වේ.

අධිපති ධර්ම හීන වූයේ නම් කුසලය ද හීන වේ. මධ්‍යම ප්‍රමාණයට යෙදුනේ නම් මධ්‍යම වේ. උසස් ආකාරයට අධිපති ධර්ම යෙදීමද පංච විධ වසිතාවන් ගෙන් වසීප්‍රාප්ත කර ගැනී

මෙන් ද වේ. අභිධර්ම ක්‍රමයට ධ්‍යාන කුසල් පහත් වේ. භූමි වශයෙන් තිබෙන්නේ ධ්‍යාන 4 රේ ක්‍රමයට බැවින් ප්‍රථම ධ්‍යාන භූමි තුනෙහි, ප්‍රථම ධ්‍යානිකයින් පටිසන්ධි ලබන්නෝ ය. දුතිය, තතිය යන ධ්‍යාන දෙකම ලබන ලද පුද්ගලයින් දුතියධ්‍යාන, භූමි තුනෙහි ද, චතුත්ථ ධ්‍යාන ලාභීන් තතිය ධ්‍යාන භූමීන් හි ද, පංචම ධ්‍යාන ලාභීන් චතුත්ථ ධ්‍යාන භූමීන්හි ද උපදිති. මේ අභිධර්ම න්‍යායට අනුව ධ්‍යාන පහක් ලබන අයගේ පටිසන්ධි ගන්නා ක්‍රමය යි. පංචම ධ්‍යාන ලාභී අනාගාමීහු වහන්සේලා කැමති පරිදි සුධාවාස යෙහි හෝ වේහප්ඵලයෙහි හෝ පටිසන්ධි ගනිති. අවිහයෙහි සද්ධා අධික අයද, අතප්පයෙහි වීර්‍යාධිකයා ද සුදස්ස යෙහි සතිය අධික අය ද, සුදස්සී යෙහි සමාධිය අධික අයද, අකනිට්ඨකයෙහි ප්‍රඥා අධිකයාද පටිසන්ධි ගනී. ශුද්ධාවාස භූමීන්හි මෙසේ අනාගාමී ඵලයට පැමිණි පුද්ගලයා ද අර්හත් මාර්ගස්ථ ඵලස්ථයින් දෙදෙනා වහන්සේ ද යන ආර්‍යයන් තුන් දෙනා සිටින්නෝ ය. ඊට පහළ ආර්‍යයන් හෝ කිසිවෙක් එහි නැත.

## අරූපාවචර කුසල කර්ම

අරූපාවචර කුසල් ලබන පුද්ගලයින් පළමුව රූපාවචර ධ්‍යාන සියල්ල කොයි ක්‍රමයකින් හෝ සූත්‍ර, අභිධර්ම යන ක්‍රමයන් ගෙන් එකකින් ලබා ඊට පසු ඒ ධ්‍යාන ලාභී තැනැත්තා රූප ධර්ම කෙරෙහි කලකිරී ජාති, ජරා, මරණාදියට පැමිණීමද දඬු මුගුරු ගෙන ඇණ කොටා කෝලාහල ආදිය කරන බැවින් ද රූප ධර්ම එපා වී රූප විරාග භාවනාව දියුණු කොට අරූප ලෝකයන්හි රූපය නැති සිත චෛතසික ධර්ම පමණක් පවත්නා තත්ත්වය ඇති කර ගනී. වස්තු ධර්ම ඇසුරු කොටම උපදනා සිත් කොටසක් ද වස්තු ධර්ම ඇසුරු නොකොට ඉපදිය හැකි සිත් කොටසක් ද තිබේ. වස්තු ධර්ම ඇති ලෝකයන්හි දී එම වස්තු ධර්ම (හදය වස්තුව) ඇසුරු කොට ඒ සිත් උපදන්නේ ය. වස්තු ධර්ම නැති ලෝක යන්හි වස්තු ධර්ම ඇසුරු නොකොට උපදී. වස්තු ධර්ම භාවනා බලයෙන් නැති කරගත් බැවින් ද, නූපදනා තත්ත්වයට පත්වූ බැවින් ද එසේ සිදුවන්නේ ය. ඒ සිතේ බලයයි.

පංචමධ්‍යානය වැනි උසස් තත්ත්වයට සිත් බලසම්පන්න වූ විට ඇතැම් අය සිත නිසා පව්කරන්නේ යයි ද, සිත නැති එක සැපයක් යයි ද සිතා සිත නැති නූපදනා තත්ත්වයට ද පත් වන්නාහ. මේ දෙපැත්තටම බෙදී යාමට පළමු කොට රූපා වචර පංචම ධ්‍යානය ලැබිය යුතු වේ. පිරිසිදු සිතක ඇති මහා බලයයි ඒ. මෙසේ අරූප ධ්‍යාන 4 කි. එහි ආයු කාලය මහා කල්ප 20000 කි. ඒ පළමුවන අරූප භූමියයි. එතැන් සිට හතලිස් දහස, හැට දහස, අසූහාර දහස දක්වා වැඩි වන්නේ ය. එසේ ආයු ඇතිව සිටින සත්ත්වයො ප්‍රථග්ජනයො නැවත මිනිස් ලොවට ද ඊට පසු සසර සුගති දුගති භවයන්හි ද සැරිසරන්නේය.

අරූප ලෝකයෙහි සෝවාන් වීමට භාග්‍යය නැත. ධර්ම ශ්‍රවනයට කන් දෙක නැති පාඩුව නිසාය. සෝවාන් මාර්ග ඵලයන් ලත් ආයර්‍යයන් එහි උපදින්නෙ නම් ඉතිරි මාර්ගඵල එහිම සම්පූර්ණ කර අනුපාද පරිනිර්වාණයට පත් වන්නේ ය. එහි කල්‍යාණ ප්‍රථග්ජනයා සහිත පුද්ගලයෝ 8 දෙනෙක් සිටිති.

**අරූපාවචර කුසල කර්මය මනො කර්මයකි.**

අර්පණා කුසලයකි. එහි අරමුණු ගැනීම, රූපාවචර කුසල යෙහි මෙන් ප්‍රඥප්ති අරමුණු ගන්නා සිත් දෙකක් ද, පරමාර්ථ ධර්ම අරමුණු කරන කුසල් සිත් දෙකක් ද වේ. කුසල් සිත් වලින් පමණක් නොව විපාක ක්‍රියා සිත් වලද අරමුණ එසේම ය. ආරම්මණ නානත්වයක් ඇත්තේ ය. අභිධර්ම නයින් පංචම ධ්‍යානලාභී පුද්ගලයා රූපය නිසා දඬු මුගුරු ගැනීම් ආදියෙන් කල කෝලාහල කිරීම ද, රූපය ජරා ව්‍යාධි ආදී තත්ත්වයට පත්වන්නේ යයි කලකිරීමෙන් රූපය පහ කිරීමේ අදහසින් භාවනා කොට රූපය නැති උපතක් ලබයි. එහි ඉහලම බඹ තලයට භවාග්‍රයයි ද කියති. එහි ආයු කාලය මහා කල්ප අසූ සාර දහසකි. එසේ වුවත් ප්‍රථග්ජන භවයේ සිට එහි උපන්නේ නම් බුදු කෙනෙක් ලොව පහල වී මග ඵල නිවන් සඳහා දහම් දෙසුවත් ඉන් පලක් නැත්තේ ය. බණ ඇසීමේ වාසනාව නැත. කන් දෙක නැති බැවින්. එවැනි අය එහි ආයු අවසානයේ

චුත වී නැවත කාම සුගතියක උපත ලැබුවත් මග ඵල නිවන් අවබෝධ නොකලේ නම් පසුව අපායට යන ශක්තිය ඇති නිසා අපායෙහි ද ඉපදිය හැකිය.

ධ්‍යාන කුසලයෙන් කුසලයට සමාන විපාක ලබති. කාමාවචර කුසලයෙන් තමාට සමාන විපාක සිත් හා අසමාන අහේතුක විපාක සිත් ද පටිසන්ධි ආදිය ද ලබන්නේ ය. ධ්‍යාන භාවනාවෙන් නොපිරිහී කාලක්‍රියා කල ස්ත්‍රිහු බ්‍රහ්ම පාරිසජ්ජ යෙහිම උපදිත්. මහේසාක්‍ය බවට පත් නොවේ. පංචම ධ්‍යාන ලාභී වූ ද අනාගාමී ස්ත්‍රිහු වෙහප්ඵල, සුධාවාස ආදියෙහි අල්පේසාක්‍යව උපදින්නේ ය. ධ්‍යාන කුසලය, පරිත්ත කුසලය, මධ්‍යම කුසලය ප්‍රණීත කුසල යයි තුන් වැදෑරුම් වේ. ඊට අනුව විපාක ලැබේ. කාමාවචර කුසලයෙහි ද්විහේතුක, ත්‍රිහේතුක, ඕමක, උත්කෘෂ්ඨ ආදී තත්ත්වයන් මෙනි. ඊට අනුව පටි සන්ධි සහ ප්‍රවෘත්ති විපාක ලබති. බඹ ලොවින් චුත වී ඊළඟම භවය අපායේ නූපදින්නේ ය. එය කාම සුගතියක උපදී. ඊට පසු අපායෙහි ද උපදින්නේ ය. කෙලෙස් වල අනුසය ශක්තිය පවත්නා බැවින් එසේ සිදුවේ.

### 4 මරණෝත්පත්ති චතුෂ්කයෙහි

මරණය සිදු වන ක්‍රම 4 ක් ඇත්තේ ය. ආයුක්ඛය, කම්මක්ඛය, උභය ක්ඛය, උපච්ඡේදක යන ක්‍රම 4 කි. ආයුෂ ගෙවීමෙන්, සිදුවන මරණය නම් පහනේ තෙල් තිබිය දී පහන් වැටිය ඉවර වීමෙන් සිදුවන පහන නිවී යාම මෙනි. එක් එක් සත්ව ජාතීන්ට අනුවද මරණය සිදු වේ. සතියක් දෙකක් ජීවත් වන සත්ව ජාතීන් ගේ මරණය එසේ ඊට අනුව සිදු වේ. නියමිත ආයු කාලය ගෙවී යාමෙන් සිදු වන මරණයයි. කර්මය ඉතුරුව තිබිය දී ද මරණය සිදු වේ. මරණාසන්න චිත්ත වීථි වීථි සංග්‍රහයෙහි පෙන්වා ඇත.

**කම්ම ක්ඛය මරණය නම්** :—සමහර දුර්වල කර්ම ප්‍රති සන්ධිය ලබා දෙති. එබඳු කර්මයන්ගෙන් ලබන පටිසන්ධි ඒ කාලයට නියම ආයු ගෙවීමට කලින් චුත වේ. ඒ කර්ම බලය හීන නිසා සිදුවන්නකි.

**උභයක්ඛය මරණය නම්** :— නියමිත ආයු ප්‍රමාණය සහ කර්ම ශක්තිය යන දෙකම ගෙවීයාමෙන් සිදුවිය හැකි මරණ යයි. පහනේ තෙල් සහ පහන් වැටිය ද යන දෙකම අවසන් වීමෙන් පහන නිවීයාම මෙනි.

**උපච්ඡේදක මරණය නම්** :— පටිසන්ධි ගත් භවය පිළිබඳ ආයු කාලය ද තමාගේ උපත ලබා දුන් කර්ම ශක්තිය ද යන දෙකම තිබිය දී අතීත අකුසල කර්මයක් හෝ රෝගාදී අන්තරා යක් හෝ සිදුවී මරණය සිදු වන්නේ ය. මෙය බොහෝ හේතූන් ගෙන් සිදු විය හැක. අකාල මරණය ද මෙසේ ම ය. ජීවිතයත් කර්මයත් දෙකම ඉතා දුර්වල ය. ආහාර පානාදිය හරි හැටි නොලැබීම ද, ආරක්ෂාව නැති බවද නිසා මරණය සිදුවිය හැකිය. කර්මයට පමණක් ජීවිතය පැවැත්විය නොහැක. ශරීරය ඇතු ලෙන් ද පිටත බාහිර උවදුරු නිසාද මරණය සිදු වේ. ඍතු විපර්‍යාසය නිසා ද නොමනා පැවැතුම් නිසා ද සිදු වේ. ඒ සැම එකකින් ම ශරීරය ආරක්ෂා කළ යුතු වේ. පෙර භවයන්හි කරන ලද බලවත් අකුසල කර්මයන් උපච්ඡේද කව උපඝාතකව ඉදිරිපත් වූයේ නම් එයින් ද මරණස සිදු වේ. කොයි ක්‍රමයකින් හෝ මරණය සිදුවීමේ දී අවසාන චිත්ත වීථිය ඇති විය යුතු ය. ඒ චිත්ත වීථියේ ජවන් සිත් 5 ක් ඇති වේ. ඒ ජවනයෙන් ගත් කර්මය හෝ කර්මය කිරීමට ගත් උපකරණ හෝ ගතිනිමිත්ත වශයෙන් මතු භවය ගැන යම් දෙයක් හෝ උපදනා ස්ථානය පිළිබඳව අකුසල කර්මයට නම් නිරයාදියෙහි ගිනිදැල් ආදී යමක් හෝ ප්‍රෙත ආත්මයෙහි නම් කැලෑ ආදීන්ගෙන් යමක් හෝ කුසල විපාකයක් වශයෙන් දෙව්ලෝ රථ විමාන දෙවඟනන් හෝ මිනිස් ලොව පිළිබඳ යම් දෙයක් මරණාසන්නයට ඉදිරි පත් වූ දෙයට අනුව ඊළඟ භවයේ උපත සිදු වේ. බණ කියන ශබ්දයක් හෝ අඬන ශබ්දයක් හෝ මල් වට්ටියක් සිවුරු පිරිකර ආදි යමක් හෝ ඉදිරිපත් කොට අකුසල කර්ම නිමිත්ත අමතක කිරීමට ද ඉඩ තිබේ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම දේශනාව අසා සිටි මැඬියා තමා කෙවිටට යට වී සිට මරණ වේදනාව අමතක කර ධර්මය ගැන පැහැදීම හේතු කොට දෙව්ලොව ඉපද උපන් ඇසිල්ලෙහිම වාගේ බුදුරජාණන් වහන්සේ වෙත

පැමිණ තමාගේ ආත්ම භාවයත් කර්මයත් ප්‍රකාශ කිරීමේ පුවත කොයි තරම් ආදර්ශයක් ද? මනුෂ්‍යයෙකුට වත් කල නොහැකි දෙයකි. ධර්මය ඇසීමෙන් ඇසෙන්ට කීමෙහිත් අගයයි.

කාම ලෝකයෙහි උපදින විට ලැබෙන පටිසන්ධියේ අරමුණ කාම ලෝකයේ මරණාසන්නයේ දී වර්තමාන අරමුණක් නම් සිත් 17 ක් පටන්නා අරමුණක් වේ. එය චුති සිත ඇති වී ඊළඟට පටිසන්ධි සිත ද ඇතිවී මෙන් පසු තවත් චිත්තක්ෂණ දෙකක් තුනක් පමණ පටිසන්ධි සිතේ අරමුණ පවත්නේ ය. මරණා සන්න චිත්ත වීථියෙහි ජවනයෙන් ගත් අරමුණම පටි සන්ධි ගැනීමට සමත් නොවේ. පෙර කරන ලද කුසලා කුසල චේතනාවක් මතු වී ජවනයට උපකාර වන්නේ ය. මේ ජවන යෙන් මතු කර දෙන්නේ ය. කාම ලෝකයේ උපදනා අයට මහද්ගත ප්‍රඥප්තීන් අරමුණු නොවෙති.

රූපාවචර පටිසන්ධියෙහි අරමුණ වන්නේ කර්ම නිමිත්ත වූ ප්‍රඥප්ති අරමුණයි. රූපාදී ධ්‍යානයන්ට ප්‍රඥප්තිය අරමුණ වන බැවින් මරණාසන්න යෙහි දී ධ්‍යානයට අරමුණ වූ කර්ම නිමිත්තම වන ප්‍රඥප්තිය අරමුණු වේ. ප්‍රතිසන්ධි සිත ද ඒ ප්‍රඥප්තීන් අරමුණු කරති.

අරූපාවචර පටිසන්ධි සිත ද ප්‍රඥප්ති ධර්ම හා මහද්ගත ධර්ම අරමුණු වශයෙන් ගන්නේ ය. පළමු වන අරූපාවචර පටිසන්ධි සිත ආකාශ ප්‍රඥප්තිය ද තුන් වැනි සිතට නාස්ති භාව ප්‍රඥප්තිය ද කර්ම නිමිත්ත වශයෙන් වැටහේ. දෙවැනි අරූපාවචර පටිසන්ධි සිතට පළමු වැනි අරූපාවචර සිත ද සතර වැනි අරූපාවචර සිතට තුන්වැනි අරූපාවචර සිත ද අරමුණු වේ. මේ සිත් දෙකේ අරමුණු මහද්ගත ධර්මයෝ වෙත්. මේය නාම පටිසන්ධියකි. මේ භූමි 4 චතුවෝකාර භූමි නම් වන්නේ ය. නාමස්කන්ධ සතර පවත්නා භූමි වන්නේ ය.

**ආසඤ්ඤ සත්ත පටිසන්ධිය** :—රූප පටිසන්ධියකි. පටිසන්ධිය ද ජීවිත නවක රූප කලාපයයි. පැවැත්ම ද එසේ ය. චුත වන්නේ ද ජීවිත නවක රූප කලාපයයි. ඊට පසු උත්පත්තිය කාම සුගති පටිසන්ධි පෙර භවයේහෝ කරන ලද කුසල කර්මයක් මෙහි විපාක වශයෙන් පටි සන්ධි සිත වශයෙන් ලැබෙන්නේ ය. පළමු භවයේ චුති සිත ඇති වූවාට පසු මේ මහාකල්ප 500 කට පසු පටිසන්ධි සිත ඇති වීමයි. භාවනාවෙන් චිත්ත බලයෙන් මහාකල්ප 500 ක් සිත නවත්වා තැබීමයි. සිදු වූයේ. මෙය ඒකවෝකාර භවයයි, නැවත පළමු පරිදිම සසර සැරිසරන සත්වයෙක් වන්නේ ය.

අරූපාවචර චුතියෙන් පසු අරූපවිපාක 4 න් කාම ත්‍රිහේතුක පටිසන්ධි 4 න් ලැබෙති. ඉහළ භූමිවල සිටි අය පහළ භූමිවල නූපදී.

රූපාවචර චුතියෙන් පසු පටිසන්ධි 17 ලැබෙති. ත්‍රිහේතුක 13 සහ ද්විහේතුක 4 ලැබෙති.

කාම ත්‍රිහේතුක චුති 4 පසු පටිසන්ධි 10 ලැබෙති. අසඤ්ඤසත්ත පටිසන්ධිය සමග 20 ලැබෙති.

ද්විහේතුක අහේතුක චුති 6 පසුව පටිසන්ධි 10 ලැබෙති. රූප අරූප පටිසන්ධි නොලැබේ.

රූප අරූප ධ්‍යාන ගැනීමට ත්‍රිහේතුක පටිසන්ධියක්ම විය යුතුය. එක් භවයක පටිසන්ධි භූමිජාති ආරම්මණාදීන්ගේ වසයෙන් සමාන විය යුතුය.

ඉතාම සංරක්ෂපයෙන් වීථි මුක්ත කාණ්ඩයෙහි ස්වරූප අවසන් වෙයි.

වීථි මුක්ත ස්වරූප අවසන්.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# රූප ධර්මයන්ගේ පාලිය

## සයවෙනි පරිච්ඡේදය

396. එත්තාවතා විභත්තා හි සප්පභෙදප්ප වත්තිකා,
චිත්ත චෙතසිකා ධම්මා රූපං දනි පවුච්චති.

397. සමුද්දෙසා විභාගා ච සමුට්ඨානා කලාපතො,
පවත්තික්කමතො චෙති පඤ්චධා තත්ථ සංගහො.

398. චත්තාරි මහාභූතානි චතුන්නංච මහාභූතානං උපාදය රූපං චෙති දුවිධම්පෙතං රූපං එකා දසවිධෙන සංගහං ගච්ඡති.

399. කථං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු භූතරූපං නාම.

400. චක්ඛු සොතං ඝාණං ජිව්හා කායො පසාද රූපං නාම.

401. රූපං සද්දෙ ගන්ධො රසො ආපොධාතු වජ්ජිතං භූතත්තය සංඛාතං ඵොට්ඨබ්බං ච ගොචරරූපං නාම.

402. ඉත්ථත්තං පුරිසත්තංච භාවරූපං නාම.

403. හදයවත්ථු හදය රූපං නාම.

404. ජීවිතින්ද්‍රියං ජීවිත රූපං නාම.

405. කබලිංකාරො ආහාරො අහාරරූපං නාමෙති ච.

406. අට්ඨා රසවිධම්පෙතංරූපං සභාවරූපං සලක්ඛණරූපං නිප්ඵන්නරූපං රූපරූපං සම්මසන රූපංති ච සංඛං ගච්ඡති.

407. ආකාසධාතු පරිච්ඡෙද රූපං නාම.

408. කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ච විඤ්ඤත්ති රූපං නාම.

409. රූපස්ස ලහුතා මුදුතා කම්මඤ්ඤතා විඤ්ඤත්ති ද්වයංච විකාරරූපං නාම.

410. රූපස්ස උපචයොසන්තති ජරතා අනිච්චතා ලක්ඛණරූපං නාම.

411. ජාති රූපමෙව පනෙත්ථ උපචය සන්තති නාමෙන පවුච්චති ති එකාදසවිධම්පෙතං රූපං අට්ඨවීසති විධං හොති සරූපවසෙන කථං?

412. භූතප්පසාද විසයා භාවො හදයමිච්චපි, ජීවිතාහාර රූපෙහි අට්ඨාරසවිධං තථා.

413. පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණන්ති ච, අනිප්ඵන්නා දසවෙති අට්ඨවීසවිධං භවෙ.

අයමෙත්ථ රූප සමුද්දෙසො.

---

414. සබ්බඤ්ච පනෙතං රූපං අහෙතුකං, සප්පච්චයං, සාසවං, සංඛතං, ලොකියං, කාමාවචරං, අනාරම්මණං, අප්පහා තබ්බ මෙවාති එකවිධම්පි අජ්ඣත්තික බාහිරාදි වසෙන බහුධා භෙදං ගච්ඡති.

415. කථං? පසාදසංඛාතං පඤ්චවිධම්පි අජ්ඣත්තික රූපං නාම, ඉතරං බාහිර රූපං.

416. පසාද හදය සංඛාතං ඡබ්බිධම්පි වත්ථුරූපං නාම, ඉතරං, අවත්ථු රූපං.

417. පසාද විඤ්ඤත්ති සංඛාතං සත්තවිධම්පි ද්වාරරූපං නාම, ඉතරං අද්වාර රූපං.

418. පසාදභාව ජීවිත සංඛාතං අට්ඨවිධම්පි ඉන්ද්‍රිය රූපං නාම, ඉතරං අනින්ද්‍රියරූපං.

419. පසාද විසය සංඛාතං ද්වාදසවිධම්පි ඔලාරික රූපං සන්තිකෙරූපං සප්පටිඝරූපං ච, ඉතරං සුඛුම රූපං දූරෙ රූපං අප්පටිඝරූපඤ්ච.

420. කම්මජං උපාදින්න රූපං, ඉතරං අනුපාදින්න රූපං.

421. රූපායතනං සනිදස්සන රූපං, ඉතරං අනි දස්සන රූපං.

422. චක්ඛාදිද්වයං අසම්පත්තවසෙන, ඝානාදිත්තයං සම්පත්ත වසෙනෙති පඤ්චවිධම්පි ගොචරග්ගාහික රූපං නාම, ඉතරං අගොචරග්ගා හිකරූපං.

423. වණ්ණො ගන්ධො රසො ඔජා භූත චතුක්කං චෙති අට්ඨවිධම්පි අවිනිබ්භොගරූපං, ඉතරං විනිබ්භොගරූපං.

424. ඉච්චෙවමට්ඨවීසති විධම්පිච විචක්ඛණා,
අජ්ඣත්තිකාදි භෙදෙන විභජන්ති යථාරහං.

අයමෙත්ථ රූප විභාගො.

---

425. කම්මං චිත්තං උතු ආහාරො චෙති චත්තාරි රූප සමුට්ඨානානි නාම.

426. තත්ථ කාමාවචරං රූපාවචරඤ්චෙ ති පඤ්ච වීසති විධම්පි කුසලා කුසල කම්ම මභිසංඛතං අජ්ඣත්තික සන්තානෙ කම්මසමුට්ඨාන රූපං පටිසන්ධිමුපාදාය ඛණෙ ඛණෙ සමුට්ඨාපෙති.

427. අරූපවිපාක ද්විපඤ්චවිඤ්ඤාණවජ්ජිතං පඤ්ච සත්තති විධම්පි චිත්තං චිත්ත සමුට්ඨාන රූපං පඨමභවංගමුපාදය ජායන්තමෙව සමුට්ඨාපෙති.

තත්ථ අප්පණා ජවනං ඉරියාපථම්පි සන්නා මෙති, වොත්ථපන කාමාවචරජවනා භිඤ්ඤාපන විඤ්ඤත්තිම්පි සමුට්ඨාපෙන්ති, සොමනස්ස ජවනානි පනෙත්ථ තෙරස හසනම්පි ජනෙන්ති.

428. සීතුණ්හොතු සමඤ්ඤාතා තෙජොධාතු ඨිතිප්පත්තාව උතුසමුට්ඨාන රූපං අජ්ඣත්තං ච බහිද්ධාච යථාරහං සමුට්ඨාපෙති.

429. ඔජාසංඛාතො ආහාරො ආහාරසමුට්ඨාන රූපං අජ්කෝධා හරණකාලෙ ඨානප්පත්තොව සමුට්ඨාපෙති.

430. තත්ථ හදය ඉන්ද්‍රියරූපානි කම්මජානෙ.ව

431. විඤ්ඤත්තිද්වයං චිත්තජමෙව.

432. සද්දෙ චිත්තොතුජො.

433. ලහුතාදිත්තයං උතුචිත්තාහාරෙහි සම්භොති.

434. අවිනිබ්භොග රූපානි චෙව ආකාසධාතු චතුහි සම්භූතානි.

435. ලක්ඛණරූපානි න කුතොචිපි ජායන්ති.

436. අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසාති ච, කම්ම
චිත්තොතුකාහාරජානි හොන්ති යථාක්කමං.

437. ජායමානාදි රූපානං සභාවත්තාහි කෙවලං,
ලක්ඛණානි න ජායන්ති කෙහිචීති පකාසිතං.

අයමෙත්ථරූප සමුට්ඨාන නයො.

---

438. එකුප්පාද එකනිරොධා එකනිස්සයා සහ වුත්තිනො එක වීසති රූපකලාපා නාම.

439. තත්ථ ජීවිතං අවිනිබ්භොග රූපංච චක්ඛුනා සහ චක්ඛු දසකන්ති පවුච්චති.

440. තථා සොතාදීහි සද්ධිං සොතදසකං, ඝාන දසකං, ජිව්හා දසකං, කායදසකං, ඉත්ථි භාව දසකං, පුම්භාව දසකං, වත්ථුදසකඤ්චෙති යථාක්කමං යොජෙතබ්බං, අවිනිබ්භො ගං රූපමෙව ජීවිතෙන සහ ජීවිතනවකන්ති පවුච්චති, ඉමෙනව කම්ම සමුට්ඨාන කලාපා.

441. අවිනිබ්භොග රූපං පන සුද්ධට්ඨකං, තදෙව කායවිඤ්ඤත්තියා සහ කායවිඤ්ඤත්ති නවකං, වචී විඤ්ඤත්ති සද්දෙහි ච සහ වචී විඤ්ඤත්තිදසකං, ලහුතාදීහි සද්ධිං ලහුතා දෙකාදසකං කායවිඤ්ඤත්ති ලහුතා දිද්වා දසකං, වචී විඤ්ඤත්ති සද්ද ලහුතාදි තෙරස කඤ්චෙති ඡචිත්ත සමුට්ඨාන කලාපා.

442. සුද්ධට්ඨකං සද්දනවකං ලහුතා දෙකාදසකං සද්ද ලහු තාදි ද්වාදසකඤ්චෙති චත්තරො උතුසමුට්ඨාන කලාපා.

443. සුධට්ඨකං ලහුතාදේකාදසකඤ්චෙති වෙ ආහාරසමුට්ඨාන කලාපා.

444. සුද්ධට්ඨකං ලහුතාදේකාදසකඤ්චෙති ද්වෙආහාරමුට්ඨා න කලාපා බහිද්ධාපි ලබ්භන්ති, අවසෙසා පන සබ්බෙපි අජ්ක්ධත්ත මෙව.

445. කම්ම චිත්තොතුකාහාර සමුට්ඨානා යථාක්කමං,
නව ඡ චතුරොද්වෙති කලාපා එකවීසති.

446. කලාපානං පරිච්ඡෙද ලක්ඛණත්තා විචක්ඛණා
න කලාපඟ්ගමිච්චාහු ආකාසං ලක්ඛණානි ච.

අයමෙත්ථ කලාප යෝජනා.

447. සබ්බානි පනෙතානි රූපානි කාමලොකෙ යථාරහං අනූනානි පවත්තියං උප ලබ්භන්ති.

448. පටිසන්ධියං පන සංසෙදජානඤ්චෙව ඔපපාතිකානඤ්ච චක්ඛුසොතඝාන ජිව්හාකාය භාවවත්ථුදසක සංඛාතානි සත්තදසකානි පාතුභවන්ති උක්කට්ඨවසෙන, ඔමකවසෙන පන චක්ඛු සොතඝානභාවදසකානි කදාචිපි න ලබ්භන්ති, තස්මා තෙසං වසෙන කලාප හානි වෙදිතබ්බා.

449. ගබ්භසෙය්‍යක සත්තානං පන කායභාව වත්ථුදසකසංඛාතානි තීණි දසකානි පාතු භවන්ති, තත්ථාපි භාව දසකං කදාචිනලබ්භති. ,තතොපරං පන පවත්තිකාලෙ කමෙන චක්ඛුදසකාදීනිච පාතු භවන්ති.

450. ඉච්චෙවං පටිසන්ධි මුපාදාය කම්ම සමුට්ඨානා දුතිය චිත්ත මුපාදාය චිත්තසමුට්ඨානා ඨිති කාලමුපාදාය උතුසමුට්ඨානා ඕජා ඵරණමුපාදාය ආහාර සමුට්ඨානා චෙති චතු සමුට්ඨාන රූප කලාපසන්තති කාම ලොකෙ දීපජාලාවිය නදීසොතො විය ච යාවතා යුකමබ්බොච්ඡින්නා පවත්තති.

451. මරණකාලෙ පන චුතිචිත්තොපරි සත්තර සමචිත්තස්ස ඨිතිකාලමුපාදාය කම්මජරූ පානි න උප්පජ්ජන්ති. පුරෙතර මුප්පන්නා නි ච කම්මජරූ පානි චුතිචිත්ත සම කාලමෙව පවත්තිත්වා නිරුජ්ක්ධන්ති, තතොපරං චිත්ත ජාහාරජර්ූපඤ්ච වොච්ඡිජ්ජති, තතොපරං උතුසමුට්ඨාන පරම්පරා ච මතකලෙබරං සන්ධාය පවත්තති.

452. ඉච්චෙ වං මත සත්තානං පුනදෙව භවන්තරෙ,
පටිසන්ධි මුපාදාය තථා රූපං පවත්තති.

453. රූපලොකෙ පන ඝානජිව්හා කායභාවදසකානි චෙව ආහාරජ කලාපානි ච ලබ්භන්ති, තස්මා තෙසං පටිසන්ධි කාලෙ චක්ඛුසොත වත්ථුවසෙන තීණි දසකානි ජීවිත නවකඤ්චෙති චත්තාරොකම්ම සමුට්ඨාන කලාපා පවත්තියං චිත්තො තුසමුට්ඨානා ච ලබ්භන්ති.

454. අසඤ්ඤදීනං පන චක්ශසොතවත්ථුසද්ද පි න ලබ්භන්ති තථා සබ්බානිපි චිත්තජ රූපානි. තස්මා තෙසං පටිසන්ධි කාලෙ ජීවිතනවක මෙව ලබ්භති. පවත්තියං ච සද්ද වජ්ජිතං උතු සමුට්ඨාන රූපං අතිරිච්චති.

455. ඉච්චෙවං කාමරූපාසඤ්ඤසංඛාතෙසු තීසු ඨානෙසු පටිසන්ධිප්පවත්ති වසෙනද්විධා රූපප්පවත්ති වෙදිතබ්බා.

456. අට්ඨවීසති කාමෙසු හොන්ති තෙවීස රූපිසු, සත්තර සෙවාසඤ්ඤදීනං ආරුප්පෙ නත්ථි කිඤ්චිපි.

457. සද්දෙ විකාරො ජරතා මරණඤ්චොප පත්තියං,
න ලබ්භන්ති පවත්තෙතු න කිඤ්චිපි න ලබ්භති.

අයමෙත්ථ රූපප්පවත්තික්ක මො.

458. නිබ්බානං පන ලොකුත්තරසංඛාත චතුමග්ග ඤාණෙන සච්ඡකාතබ්බං මග්ගඵලාන මාලම්බන භූතං වානසංඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති වුච්චති.

459. තදෙතං සභාවතො එකවිධම්පි සඋපාදි සෙස නිබ්බාන ධාතු අනුපාදිසෙස නිබ්බාන ධාතු චෙති දුවිධං හොති කාරණපරියා යෙන.

460. තථා සුඤ්ඤතං අනිමිත්තං අප්පණිහි තඤ්චෙති තිවිධං හොති ආකාර භෙදෙන.

461. පදමච්චුතමච්චන්ත මසංඛතමනුත්තරං,
නිබ්බානමිති භාසන්ති වානමුත්තා මහෙසයො.

462. ඉති චිත්තං චෙතසිකං රූපං නිබ්බාන මිච්චපි,
පරමත්ථං පකාසෙන්ති චතුද්ධාව තථාගතා.

නමෝ තස්ස භගවතො අරහතෝ සම්මා සම්බුඩස්ස

# රූප ධර්මයන්ගේ ස්වරූප

## හයවෙනි පරිච්ඡේදය

චිත්ත චෛතසික චිත්ත වීථීන්ගෙ ස්වරූප ධර්මයන් දැක්වීමට අනතුරුව රූප ධර්මයන්ගේ ස්වරූප දක්වනු ලැබේ. ''රූප්පතීති රූපං'' යන පදයට අනුව විකාර වේනුයි රූප නම්. ශීත උෂ්ණ ආදී විරුද්ධ ප්‍රත්‍යයන් හා ගැටීමෙන් වෙනස් වේනුයි පැවතගන ආ රූප පරම්පරාව වෙනස් ආකාරයකින් පැවතීම විකාර වීම නම් වේ. එසේ වෙනස් වන ස්වභාව ධර්මයෝ රූප නම් වේ. රූප ධර්මයෝ නාම ධර්මයන්ට වඩා දීර්ඝ කාලයක් නොනැසී පවත්නා බැවින් රූප ධර්මයන්ගේ ඨිති ක්ෂණයේ හෙවත් ඉපද පවත්නා කාලය නාම ධර්මයන්ට වඩා දික් කාලයක් පවත්නා බැවින් නාම ධර්ම 16 ක් පමණ කාලයක් පවත්නා බැවින් ඒ කාලයේ දී විරුද්ධ ප්‍රත්‍යයන් සමග ගැටීම සිදුවන්නේ ය. එවිට පෙර පැවති සන්තතිය වෙනස්ව අමුතු ආකාරයක් වන්නේ ය. මෙසේ මුලින් පැවති ආකාරය වෙනස්ව වෙනත් ආකාරයක් වීමට විකාර වීම යයි භාවිතා කෙරේ.

රූප ධර්මයෝ සමූහ වශයෙන් එක්ව නොයෙක් ආකාර යන් වන්නේය. වෙනත් ආකාර භූමි පර්වත ගෙවල් යාන වාහන ආදී වශයෙන් හා සත්ව පුද්ගලාදී කොටස් වශයෙන් ද පෙන්වන්නේ ය. යක්ෂ රාක්ෂාදීන් වශයෙන් ද පෙන්වා සත්වයන් මුලා කරන්නේ ය. රූපය පඨවි ධාතු, ආපෝ ධාතු, තේජොධාතු, වායෝ ධාතු යයි ප්‍රධාන කොටස් සතරක් වේ. ඒ ප්‍රධාන රූප සතර නිසා ඒ සතර ඇතිව පවත්නා තැන තවත් රූප 24 ක් ඇති වන්නේය. ඒ විසිහතර උපාද රූප නම් වේ. රූප සියල්ල විසි අටක් වේ. ඒ රූප 28 ලක්ෂණ හෙවත් ස්වභාව ධර්ම 28 කින් යුක්ත වේ. රූප 28 සැකෙවින් ඊළහට දක්වනු ලැබේ.

ඒ රූප 28 ආකාර පසක් වශයෙන් පෙන්වා තිබේ. ඒ මෙසේය : රූප සමුද්දේශය, රූප විභාගය, රූප සමුට්ඨානය, රූප කලාපය, රූප පවත්ති ක්‍රමය යන ආකාර පසක් වේ.

## රූපයන්ගේ ස්වරූප ලක්ෂණ

මහා භූත රූප 4 හි ලක්ෂණ පළමුව පෙන්වනු ලැබේ.

**පඨවි ධාතුවේ ලක්ෂණය** :—තද ගතිය සහ මොලොක් ගතියයි. පඨවි ධාතුව අධික ස්ථානයෙහි තද ස්වභාවය වැඩිය ඇති වේ. පඨවි ධාතු අධික නොවී වායෝ ධාතු ආදිය ඊට වඩා වැඩි නම් එහි තද ස්වභාවය අඩු වේ. මොලොක් ස්වභාවයක් ඇති වේ.

**ආපෝ ධාතුවේ ලක්ෂණය** :—වැගිරීම් ගතියයි. ධාතු කුඩු ඇති තැන දී අන්‍ය ධාතු කුඩු එකට බන්දවන ගතියෙන් යුක්ත වේ. බන්ද වීමට යම් ද්‍රව්‍යයක් නැති තැන පැතිර යයි. පැතිරීමේ ස්වභාවයෙන් යුක්ත වේ.

**තේජෝ ධාතුවේ ලක්ෂණය** :—උණුසුම් ගතිය සහ සිසිල් ගතියයි. තේජෝ ධාතුව ලක්ෂණය අධික නම් උණුසුම් ගති යෙන් යුක්ත වේ. තේජෝ ස්වභාවය අඩු තරමට සිසිල් ගතිය ඇතිවේ. තේජෝ ගතිය අඩු වැඩි තරමට එය සිදු වේ.

**වායෝ ධාතුවේ ලක්ෂණය** :—සැලීම් ගතිය සහ පුම්බවන ස්වභාවය යි. රුකුල් දෙන ඔසවා තබන ස්වභාව යයි. එහිදී අඩු වැඩි තරමින් එය පවතී. වායො ධතුව අඩු උනි නම් රුකුල් දීම කල යුතුය. ඔසවා තැබිය නොහැක. මේ මහා භූත රූප 4 සංක්ෂේපයෙන් හැඳින්වීමකි.

## ප්‍රසාද රූප සහ විෂය රූප

චක්ඛු ප්‍රසාදයේ ලක්ෂණය —:දකිනු කැමැත්ත නිසා වූ කර්මයෙන් හටගත් කර්මජ මහාභූත රූපයන්ගේ ඔප ගතියයි.

සෝත ප්‍රසාදයේ ලක්ෂණය :—ඇසීමේ කැමැත්ත නිසා වූ කර්මයෙන් හටගත් මහා භූත රූපයන් ගේ ඕප ගතිය යි.

ඝාණ ප්‍රසාදයේ ලක්ෂණය :—ගඳ සුවඳ ලබනු කැමැත්ත නිසා වූ කර්මයෙන් හටගත් මහාභූත රූපයන්ගේ ඕප ගතියයි.

ජිව්හා ප්‍රසාදයේ ලක්ෂණය :—රස විඳිමේ කැමැත්ත ඇති දේ පූජා කිරීම නිසා වූ කර්මයෙන් හටගත් මහා භූත රූපයන්ගේ ඕප ගතිය යි.

කාය ප්‍රසාදයේ ලක්ෂණය :—ස්පර්ශ කිරීමේ කැමැත්ත නිසා වූ සැප පහසු ආසන ආදිය පූජා කිරීමේ කර්මයෙන් හටගත් මහා භූත රූපයන්ගේ ඕප ගතිය යි.

රූපා රම්මණයේ ලක්ෂණය :—මහා භූත රූපයන්ගේ වර්ණ රූපය යි.

චක්ඛු ප්‍රසාදය හා ගැටීමෙන් චක්ඛු විඤාන සිත් දෙකට අරමුණු වන රූපාරම්මණ යයි දැකිය හැකි රූපය වර්ණ රූපය නම් වූ රූපාරම්මණ යයි ඉතිරි රූප 27 ම ඇසින් දැකිය නොහැකි රූපයෝ ය. අනි දස්සන රූප 27 යි. සනි දස්සන රූප 1 යි.

ශබ්දා රම්මණ යේ ලක්ෂණය :—සෝත ප්‍රසාදයෙහි ගැටීමෙන් අරමුණු කොට සෝත විඤාන සිත් දෙක ඉපදීමට ඉවහල් වන ශබ්ද රූපය යි. චිත්තජ, ඍතුජ ශබ්දයන් වශයෙන් ශබ්දය දෙපරිදි වේ.

ගන්ධා රම්මණය :—මහා භූත රූප නිසා හටගත් සුගඳ දුගඳ ආදි නානාප්‍රකාර ගන්ධයන් නිසා එය අරමුණු කොට ඝාණ විඤාන සිත් දෙක ඉපදීමට උපකාර වන ගන්ධාරම්මණ යෝ ය.

රසාරම්මණය :—මහා භූත රූපයන්හි පවත්නා තිත්ත, මිහිරි, කටුක, ආදී රස රූපයන් දැනීම නිසා ජිව්හා විඤාන සිත් දෙක ඉපදීමට උපකාර වන රූපයය.

ඵොට්ඨබ්බා රම්මණය :—කාය ප්‍රසාදයෙහි ගැටෙන ඵොට්ඨබ්බා රම්මණය නම් මහා භූත රූප තුනය. ආපෝ ධාතුව හැර මහා භූත රූප ප්‍රසාද රූපයෙහි පමණක් නොව මහා භූත රූපයන්හිම ගැටීමෙන් කාය විඥාන සිත් දෙක සුඛ දුක්ඛ වශයෙන් උපදනේ ය. ආපෝ ස්වභාවය කයේ හැපීමෙන් දත හැකි නොවේ. වතුරෙහි උණු සිසිල් ස්වභාවය තේජෝ ධාතුව ය. ජලය තදින් ශරීරයෙහි හැපීමෙන් පඨවි ස්වභාවය දනෙති. එසේ නැතහොත් වායෝ ස්වභාවය දනෙති. වැගිරෙන බන්ද වන පැතිරෙන ස්වභාවය වූ ආපෝ ධාතුව කයට හැපීමෙන් දත නොහැක. එය මනො විඥාන සිත් වලින්ම දත යුතු වේ. මහා භූත රූප වෙන් නොවී එකටම පවත්නා රූප සතරකි. ඉත්ථි භාව, පුරිස භාව රූපයන් —මුළු ශරීරයෙහි ම පැතිර පවත්වන කර්මජ රූප දෙකක් වේ. මේ රූප දෙකම නො ලබන සුගති අහේතුක පටිසන්ධිකයින් ද, දෙකම පවත්වන අය ද, අවස්ථානුරූපව පවත්නා උභතො ඛ්‍යඤ්ජන'' යන පුද්ගලයා ද ධර්මයෙහි සඳහන් වෙයි. සාමාන්‍යයෙන් එක ඉන්ද්‍රිය රූපයක් එක් අයෙකුට ලැබීම සාමාන්‍ය සිද්ධියකි.

දෙපස් විඥාන 10 ත් අරූප විපාක සිත් 4 හැර මනො ධාතු, මනො විඥාන ධාතු යන සිත් 75 උපදනුයේ වස්තු රූපය ඇති භවයන්හි මේ වස්තු රූපය ඇසුරු කොට ය.

හදය වස්තු රූපය :—ශරීරාභ්‍යන්තරයෙහි පිහිටි හදය වස්තු රූපය හදය වස්තු නම් වේ. එයද කර්මජ රූපයකි. මනො ධාතු, මනො විඥාන ධාතු යන සිත් දෙපස් විඥාන 10 ත් ආරූප විපාක සිත් 4 හැර ඉතිරි සිත් 75 උපදිනුයේ වස්තු රූපය ඇති භවයන්හි .මෙ වස්තු රූපය ඇසුරු කොටය. හදය වස්තුව තුලදීම ඇතිව පවත්නා ලේ වල ස්වභාවයන් ඇසුරු කොට සිත් උප දින්නේ යයි පෙන්වා තිබේ.

ජීවිතින්ද්‍රිය රූපය :—කර්මජ රූපයන් කර්මය නිසා හට ගන්නේ ය. එහෙත් ඒ කර්මජ රූප පවත්නෝ නො නැසී පැවැත් මට උපකාර වන්නේ මේ ජීවිතෙන්ද්‍රිය නම් වූ කර්මජ රූපයේ

බලයෙනි. කර්මජ රූපයන් ජීවත් කරවන රූපයයි. ජීවිතෙන්ද්‍රිය රූපය. කර්මජ රූප පවත්නේ සත්වයා ජීවත් වන තාක් කල් පමණකි. ච්‍යුතිය සමගම කර්මජ රූප සියල්ලම නිරුද්ධ වේ.

ආහාරජ රූපය:—මහා භූත රූපයන්ගි පවත්නා ඕජා ගතියයි. එය සියලුම ශුද්ධාෂ්ටක කලාපයකම තිබේ. ආහාර වශයෙන් ගන්නා ද්‍රව්‍යයන්හි ඕජා රූප අඩු වැඩි වශයෙන් නොයෙක් ආකාරයට පවත්නේ ය. ආහාර ගැනිම කාම ලෝකයන්හි පමණක් සිදුවේ. ධ්‍යාන වශයෙන් දියුණු කළ සිත් ඇති ලෝකවල ආහාර ගැනිමක් නොවේ.

ආකාශ ධාතුව :—ආකාශ ධාතුව නම් හිස් බවයි. එක් එක් රූප කලාපයක් අනික් කලාපයෙන් වෙන් කර තබන්නේ ආකාශ ධාතුවෙනි. ඒක ඝනව පිහිටි යේ නම් කිසිම රූප ධර්මයක් ඔවු නොවුන්ගෙන් වෙන් කළ නොහැකි වේ. සෑම රූප කලාපයක් අවටම ආකාශ ධාතුව පවත්නේ ය. ඒක ඝනව ඇති වස්තු වෙන් කළ හැකි වන්නේ මේ රූපය නිසාය. මෙහි පෙන්වන්නේ රූප පරිච්ඡෙදාකාශයයි. රූප කලාප වෙන් කරන ආකාශ ධාතුවයි. ආකාශ ධාතු කීපයක් තිබේ. අජයාකාශය ආදීන් ය.

කාය විඥප්තිය හා වචී විඥප්තිය :—කයින් සහ වචනයෙන් යම් යම් දේ අන්‍යයන්ට ප්‍රකාශ කරන්නේ ද, අත් පා ආදීන්ගෙන් හඟවන්නේ ද යාම් ඊම්, කථා කිරීම් ආදිය කරන්නේ ද මේ විඥප්ති රූප ධර්ම දෙකේ බලයෙනි. මේ රූප ධර්ම දෙක එක එක චිත්තක්ෂණයක ආයු කාලයක් පවත්නා රූප දෙකකි.

ලහුතා, මුදිතා කම්මඤ්ඤතා රූප තුන :—සත්ව ශරීරයන්හි පවත්නා රූප ධර්ම බර නැති බවට සැහැල්ලු බවට පමුණු වන්නා වූ ද, මෘදු මොළොක් බවට පමුණුවන්නා වූ ද, තද බව බර බව ආදිය නැතිකර අඩු කොට පවත්වන්නා වූ ද, දරදඬු බව නැති කරන්නා වූ ද, ඒ ඒ ක්‍රියාවන් සිදු කිරීමට සුදුසු සේ අනික් රූප ධර්මයන් ද කර්මන්‍ය බවට පමුණුවන්නා වූ රූප ධර්ම තුනකි. තමා කැමති පරිදි ශරීරය ක්‍රියා කරවිය හැකි වන්නේ මේ රූප ධර්ම තුන සුදුසු පරිදි පිහිටීමෙනි.

උපචය සන්තති, ජරතා, අනිච්චතා — යන රූප සතර ලක්ෂණ රූප නම් වේ. උපචය සන්තති යන මේ රූප දෙකට ජාති රූප යයි ද ව්‍යවහාර වේ. උපචය නම් රූප ධර්ම පළමු පහළ වන අවස්ථාව ය.

සන්තති නම් එය නැවත නැවත රූප උපදවා පැවතීමයි. පළමු උපන් රූපයට අනුව පරම්පරාව ගෙනයාම යි.

ජරතා රූපය නම් රූපය මෝරා රූප කලාපයේ චුතිය දක්වා භංගාව තෙක් ගෙන යන කාලයයි. මැද චිත්තක්ෂණ 49 ජරතා නම් වේ.

අනිච්චතා රූපය නම් උපන් රූපය ජරාවට පත්ව බිඳී අවසන් වීම ය. භංගය. ය රූපයේ ආයු කාලය තුල චිත්තක්ෂණ 17 ඇතුලත උත්පාද,ඨිති, භංග ඇති වන පිළිවෙල මෙහි දක්වේ.

රූප ධර්මයන්ගේ ස්වභාවයන් මෙසේ පෙන්වන්නේය :

## රූප සමුද්දේසය

මහා භූත රූප 4 ය, මහා භූත රූපයන් නිසා හටගන්නා පවත්නා රූපයෝ ද එකොළොස් ආකාරයකින් සංග්‍රහ වේ. රූප 28 හි එකොළොස් ආකාරයට මෙසේය :

1. පඨවි, ආපො, තේජෝ, වායෝ යන 4 මහා භූත රූප නම් වේ.
2. චක්ෂු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන 5 ප්‍රසාද රූප නම් වේ.
3. රූප, ශබ්ද, ගන්ධ, රස ඵොට්ඨබ්බ 7 ගෝචර රූප නම් වේ.
4. ස්ත්‍රී භාව රූපය, පුරුෂ භාව රූපය යන 2 භාව රූප නම් වේ.
5. හදය වස්තු රූපය 1 හදය රූප නම් වේ.
6. රූප ජීවිතින්ද්‍රිය 1 ජීවිත රූප නම් වේ.
7. කබලීකාර ආහාරය 1 ආහාර රූප නම් වේ.
8. පරිච්ඡේද රූපය (ආකාශ ධාතුව) 1 පරිච්ඡේද රූප නම් වේ
9. කාය විඤ්ඤප්ති වචී විඤ්ඤප්ති රූප 2 විඤ්ඤප්ති රූප නම්
10. ලහුතා, මුදිතා කම්මඤ්ඤතා රූප 3 විකාර රූප නම් වේ.
11. උපචය සන්තති ජරතා, අනිච්චතා රූප 4 ලක්ඛණ රූප නම් වේ.

රූප 28 ට නම් වශයෙන් මෙසේ දක්වේ :

එය නැවත බෙද දක්වීමේ දී එකොළොස් වැදැරුම් වූ රූපය නිෂ්පන්න රූප, අනිෂ්පන්න රූප යයි ද දෙවැදැරුම් වේ. මහා භූත රූප අවසන් කොට ඇති රූප 18 ට නිෂ්පන්න රූප නම් වේ. ඉතිරි රූප 10 ය අනිෂ්පන්න රූප නම් වේ. මේ රූප සමුද්දේශය යි.

## රූප විභාගය

රූප ධර්ම සම්ප්‍රයුක්ත හේතු රහිතය (නැත) කර්මාදි ප්‍රත්‍ය යන් නිසා හටගන්නේ ය. ආශ්‍රවයන්ට අරමුණු වන්නේ ය. හේතු ප්‍රත්‍යයන් ගෙන් සකස් වූයේ ය. රූප සියල්ල ලෞකික ය. කාමාවචරය. රූප ලෝකයෙහි ඇතිවන රූපය ද කාමා වචරමය. රූපාවචර නොවේ. අරමුණු ගැනිමේ ශක්තියක් රූප ධර්මයන්ට නැත්තේ ය. කෙලෙසුන් මෙන් පහකට යුතු ධර්මයක් නොවේ. භාවනාවෙන් පහ කළ නොහැක. අධ්‍යාත්ම රූප බාහිර රූප යන බෙදීම් ද ඇත්තේ ය.

## අධ්‍යාත්මිකාදීන් ගේ වශයෙන් රූපය බෙද දක්වීම

ප්‍රසාද රූප පහ වස්තු රූප නම් වේ. ඉතිරි රූප 23 වස්තු රූප වේ.

ප්‍රසාද රූප සහ හදය රූපය ද වස්තු රූප නම් වේ. ඉතිරි රූප 22 අවස්තු රූප වේ.

ප්‍රසාද විඤ්ඤත්ති යන රූප 7 ද්වාර රූප නම් වේ.
ඉතිරි රූප 21 අද්වාර රූප වේ.

ප්‍රසාද, භාව, ජීවිත යන රූප 8 ඉන්ද්‍රිය රූප නම් වේ.
ඉතිරි රූප 20 අනිද්‍රිය රූප වේ.
ප්‍රසාද, විෂය සංඛ්‍යාත රූප 12 ඖදරික රූප සන්තිකෙ රූප සප්පටිඝ රූප නම් වේ. ඉතිරි රූප 16 සුඛුම රූප, දූරේ රූප, අප්පටිඝ රූප නම් ද වේ.

කර්මජ රූප 18 උපාදින්න රූප නම් වේ. ඉතිරි රූප 10 අනුපාදින්න රූප නම් වේ. රූපායතනය සනිදස්සන රූප නම් වේ. ඉතිරි රූප 27 අනිදස්සන රූප නම් වේ. චක්ඛාදි ද්වය අසම්පත්ත වශයෙන් ලඟට නොපැමිණ අරමුණු ගන්නේ ය. ඝාණාදී තුන සම්පත්ත වශයෙන් ද ලඟට නොපැමිණ අරමුණු ගන්නේ ය. මේ රූප 5 ගෝචර ග්‍රාහික රූප නම් වේ. ඉතිරි රූප 23 අගෝචර ග්‍රාහික නම් වේ. ගොදුරු ගැනීම නො කරන රූප නම් වේ.

වර්ණ, ගන්ධ, රස, ඕජාවද, මහාභූත රූප 4 ද, යන රූප 8 මේ මිටිය. අවිනිබ්භෝග හෙවත් ශුද්ධාෂ්ටකය නම් වේ. ඉතිරි රූප 20 විනිබ්භෝග රූප නම් වේ. (වෙන් කළ හැකි රූප) මේ රූප 28 අධ්‍යාත්මික හා බාහිරා දී වශයෙන් බෙදීම යි.

## රූප සමුට්ඨානය

රූප උපදවන හේතු ධර්ම රූප සමුට්ඨාන නම් වේ. කාමාවචර කර්ම කුසලා කුසලාදි 20 ද, රූපාවචර කර්ම 5 ද යන මේ අතීත කර්ම 25, අධ්‍යාත්ම සන්තානයෙහි ප්‍රතිසන්ධියේ පටන් කර්මජ රූප උපදවත්.

අරූපාවචර විපාක සිත් 4 හා දෙපස් විඤාන දහය ද හැර ඉතිරි සිත් 75 ප්‍රතිසන්ධි සිතට අනතුරුව උපදින භවාංග සිතේ උත්පාදක්ෂණයයෙහි පටන් සෑම සිතකම උත්පාදක්ෂණයෙහි දී චිත්තජ රූප උපදවයි.

අර්පණා ජවන් 26 ඉරියා පථය ද පවත්වයි. වොත්ථපනය, කාම ජවන 29 ද, අභිඥ 2 ද විඥප්තිය ද උපදවත්. සොම්නස් ජවන් 13 සිනාව ද උපදවත්. ඨිතියට පැමිණි තේජෝ ධාතුව අධ්‍යාත්ම බාහිර සන්තානයන්හි ඍතුජ කලාපයක් උපදවත්. දෙම්නස් ජවන් 2 හැඬීම ද සිදු කෙරේ.

ඕජා රූපය ආහාර අනුභව කරන කාලයෙහි ඨිතියට පැමිණියේ ආහාරජ රූප උපදවත්. ආහාර ඕජාව ද, අධ්‍යාත්ම බාහිර වශයෙන් දෙපරිදි වේ. බාහිර ඕජාවට තනියම සත්ව

ශරීරයන්හි රූප ඉපද විය නොහැක. අධ්‍යාත්මික ඕජාව සමග බාහිර ඕජාව මිශ්‍රව රූප උපදවත්. සෑම කුඩාක්ෂණයක දීම රූප උපදවයි.

ඒ රූපයන් අතුරෙන් හදය රූපය සහ ඉන්ද්‍රිය රූප 8 ද කර්මයෙන්ම හටගන්නා රූපයෝ ද ඒකාන්ත කර්මජ රූපයෝය.

විඤ්ඤප්ති රූප දෙක චිත්තයෙන්ම හටගන්නා චිත්තජ රූපයෝ ය. ශබ්දය සිතෙන් සහ ඍතුවෙන් හටගනී. ද්විජ රූපයෝ නම් වේ.

ලක්ෂණ රූප 4 :—ප්‍රත්‍යයන් නිසා හටගත් රූපයන්ගේ ආකාර විකාර ආදී ලක්ෂණයෝ වෙත්. ජාති, ජරා, මරණාදි යයි ද කිය යුතු වේ. අනික් ප්‍රත්‍යයන් ගෙන් හටගත් රූපයන් ගේ පැවැත්ම හා විනාශය ආදිය යයි කිය යුතු වේ.

කර්මජ රූපයෝ නම් :—ඒකාන්ත කර්මජ රූප 9 ද වේ. අනේකාන්ත කර්මජ රූප ද 9 ක් වේ. විඤ්ඤප්ති රූප 2 සිතෙන්ම හටගත් බැවින් ඒකාන්ත චිත්තජ රූපයෝ ය. ශබ්දය, චිත්තය, ඍතුවය යන ප්‍රත්‍ය දෙකින් හටගත් බැවින් ද්විජ රූපයෝ නම් වේ.

ලහුතාදි රූප 3 චිත්ත, ඍතු, ආහාර යන ප්‍රත්‍ය තුනකින් හටගත් බැවින් තිජ රූප නම් වේ.

අවිනිබ්භෝග රූප 8 සහ ආකාශ ධාතුව ද යන රූප 9 ය කර්ම, චිත්ත, ඍතු, ආහාර යන ප්‍රත්‍ය 4 න් හටගත් බැවින් චතුජ රූපයෝ ය.

ලක්ෂණ රූප 4 කිසිත් ප්‍රත්‍යයකින් හට නොගත් බැවින් ද සියලු රූපයන්ගේ ජාති ආදි අවස්ථාවන් බැවින් ද, එකම ප්‍රත්‍යයකට අයත් නොව සියලුම රූපයන්ට සාධාරණ වේ.

සුද්ධාෂ්ටක කලාපය නම් :—පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන මහා භූත රූප 4 හා වර්ණ, ගන්ධ, රස, ඕජා යන උපාද රූප 4 ද සමඟ 8 මිටියයි. රූප කලාප සියල්ල ඇති වන්නේ මෙසේ අටේ මිටිය සමඟ තවත් එක් එක් ප්‍රත්‍යයන්ගෙන් උපදවන රූප එකතු වීමෙන් නවයේ මිටි, දසයේ මිටි ආදිය ඇති වේ.

රූප සියල්ල කර්මාදිප්‍රත්‍ය සතරින් වෙන වෙනම උපදනේය. එසේ වෙන වෙනම කලාප වශයෙන් උපදින්නේ ය.

කර්මජ රූප ඒකාන්ත 9 ක් සහ අනේකාන්ත 9 සියල්ල 18 කි.
චිත්තජ රූප ඒකාන්ත රූප 2 සහ අනේකාන්ත 13 යන 15 යි.
ඍතුජ රූප ඒකාන්ත නැත. අනේකාන්ත රූප 13 යි.
ආහාරජ රූප ඒකාන්ත නැත. අනේකාන්ත රූප 3 චතුජ රූප 9 යි. යන 12 යි.

## රූප කලාප වශයෙන් බෙද දැක්වීම

### කර්මජ රූප කලාප 9.

ඉහත කී සුද්ධාෂ්ටකය ද, ජීවිත රූපය ද යන ජීවිත නවක කලාප 1 කි.

ජීවිත නවක කලාපය චක්ඛු ප්‍රසාද රූප ආදීන් සමඟ දසක කලාපයක් වේ.
සියල්ල කලාප 5

ජීවිත නවක කලාපය හා ඉත්ථිභාව, පුරිස භාව යන රූපය සමග කලාප 2

ජීවිත නවක කලාපය හදය වස්තු රූපය සමග වස්තු දසක කලාප 1

## චිත්තජ රූප කලාප 6

සුද්ධෂ්ටකය කාය විඥප්තිය සමග කාය විඥප්ති නවක කලාප 1

සුද්ධෂ්ටකය ශබ්දයද, වචී විඥප්තියද සමග වචී විඥප්ති දසක කලාප 1

සුද්ධෂ්ටකය ලහුතාදි රූප තුන සමග ලහුතාදි ඒකාදසක කලාප 1

සුද්ධෂ්ටකය ලහුතාදි කාය විඥප්තිය සමග ද්වාදසක කලාප 1

සුද්ධාෂ්ටක ලහුතාදි වචී විඥප්තියත් ශබ්දයතත් තෙරයක සක කලාප 1

සුද්ධෂ්ටක කලාපයම පමණක් කලාප 1

## ඍතුජ රූප කලාප 4

සුද්ධාෂ්ටක කලාපය තනිකර ඍතුජ කලාප 1

සුද්ධාෂ්ටක ශබ්දය සමහ ශබ්ද නවක කලාප 1

සුද්ධාෂ්ටක ලහුතාදි රූප තුන සමහ ඒකා දසක කලාප 1

සුද්ධාෂ්ටක ලහුතාදි ශබ්දයත් සමග ද්වා දසක කලාප 1

## ආහාරජ රූප කාලාප 2

සුද්ධාෂ්ටකය සහ ලහුතාදි රූප තුන සමහ ඒකා දසක කලාප 1

තනිකර සුද්ධාෂ්ටක කලාප 1

රූප කලාප සියල්ල 21 වේ. රූප කලාපයන් අතුරෙන් සුද්ධාෂ්ටක කලාපය හා ශබ්ද නවක කලාපය ද යන ඍතුජ කලාප 2 කි. පෘථිවි, පර්වත, ගස්, වැල් ආදි බාහිර වස්තූන් හිද ලැබෙති. සත්ව සන්තානයන්හී සුදුසු පරිදි රූප කලාප 21.

ආකාශ ධාතුව හා ලක්ෂණ රූප 4 ද, රූප කලාපයන් ගේ අංග වශයෙන් නොගන්නා ලදී. ආකාශ ධාතුව රූප කලාපයන් වෙන් කිරීමට ඉහවල් වේ.

ලක්ෂණ රූප සතර ද හැම කලාපයක ඇති ස්වභාවයක් වේ. ඔවුන් ද රූප කලාපයන්ට අයත් නොවේ. විඤ්ඤත්ති විකාර රූප ආදිය ඇතැම් කලාපයන්හි ඇත්තේය. එබැවින් විඤ්ඤප් තීන් රූප කලාපයන්හී ඇතුලත් වෙති.

### ආහාරජ කලාප 2.

සුද්ධාෂ්ටක කලාප 1 ක් ද සුද්ධාෂ්ටකයන් ලහුතාදි රූප තුන සමග සුද්ධාෂ්ටක ලහුතාදි ඒකාදසක ලාපය ද යන ආහාරජ කලාප 2 යි. මෙසේ රූප කලාප සියල්ල 21 ක් වේ.

මෙ රූප කලාප 21 අතුරින් සුද්ධාෂ්ටක පමණක් පවත්නා කලාප 1 ක් ද සුද්ධාෂ්ටකය සමග ඍතුජ ශබ්දය සමග ශබ්ද නවක කලාප ද යන රූප කලාප 2 ක සත්ව ශරීර නොවන බාහිර ගස්වැල් පෘථිවි ආදියෙහි ද සුදුසු පරිදි පවත්නේ ය. සත්ව ශරිරයන්හි අජ්ඣත්තික වශයෙන් රූප කලාප සියල්ලම ලැබෙති. එසේ ලක්ෂ කෝටි ගණන් රූප කලාප එක්තැන් වීමෙන් ඒ අනුසාරයෙන් දැකිය හැකි, අතගා දැනගත හැකි නොයෙක් සටහන් ඇති රූප කලාපයන් ද්‍රව්‍ය නාමයෙන් ද සත්ව ප්‍රඥප්ති නාමයෙන් ද පවත්නේ ය. ආකාශ ධාතුව රූප කලාප අතුරෙහි එක් එක් කලාපයක් ඔවුනොවුන් ගෙන් වෙන් කළ හැකි පරිදි එකට මිශ්‍ර නොවී පැවැත්මට උපකාර වන්නේ ය. රූප ධර්ම අඩුම ගණනේ අටේ මිටිය වශයෙන් හෝ පවත්නේය. අටට අඩුව එකට පහළවීමක් නොවන්නේ ය. නාම ධර්ම ද අටට අඩුව ඇති නොවේ. දෙපස් විඥනයන්හි ඉතාම අඩු චෛතසික ගණනක් ඇතිවන නමුත් චෛතසික 7 ක් සිත සමග 8 ක් ම ඇති වන්නේ ය.

### රූප පවත්නා ක්‍රමය
### (පවත්තික් ක්‍රමය)

රූප ඇතිවන ක්‍රම සතර ආකාරයකි. සත්ව ශරීර වශයෙන් ආකාර 4 කි. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන සත්ව ජාති 4 ක් වශයෙන් ඇති වේ. කාම ලෝකයෙහි මේ සතර ආකාරයටම සත්ව ජාති පහළ වන්නේ ය.

අණ්ඩජ නම් බිජුවටින් උපදනා සත්ව ජාතීන් ය. ජලාබුජයෝ වනාහි මව්කුසෙහි උපදින මිනිස් තිරිසන් ආදී සත්ව ජාතීන් ය. මේ දෙකොටසටම පටිසන්ධි ගැනීමේ දී කාය දසක, භාවදසක, වත්ථු දසක රූප කලාප 3 හෝ දෙකක් ඇති වන්නේ ය. ඇතැම් සත්වයින්ට භාව දසකය නොලැබෙන්නේ ය. පටිසන්ධි සිතත්, මේ රූප කලාපයනුත් ඉදිරි පසු නොවී එක විටම පහළ වන්නේ ය. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා යන කලාප 4 ම දවස් 77 කට පසු ලැබෙන්නේ ය. පටිසන්ධියෙහිදීම ජීවිත නවක කලාපය ද පහළ වන්නේ ය. ඊට පසු චිත්තජ, ඍතුජ, ආහාර රූප කලාප පහළ වෙති. රූප චක්‍රයෙහි එය පෙන්වා ඇත.

සංසේදජයෝ නම් මල් කැකුළු සමහර ගෙඩි වර්ග ද, අට්ටික්කා වැනි ගෙඩි වර්ග වලද කෝඳුරුවන් වැනි කුඩා ප්‍රාණීන් සිටිති. අපවිත්‍ර ස්ථානයන්හි ද වැසිකිලි ආදියෙහිද මළකුණු වල ද ඇති වේ.

ඕපපාතිකයෝ නම් දෙවි ,බඹ, යක්ෂ ආදීන් ද, ඇතැම් ප්‍රේත කොටස්ද, අසුර ආදීන් ද එක වරටම සියලු අංග ප්‍රත්‍යංග සම්පූර්ණව වැඩුන ශරීර වශයෙන් පහළ වන්නේ යයිද, දෙවි බඹ ආදීන් සම්පූර්ණ ශරිරයකින් යුක්තව සහ ශරීරාලෝකයකින් ද යුක්ත ඉතා අලංකාර ලෙස පහළ වන්නේ යයි ද,

රූප උපදින ක්‍රමය කාල වශයෙන් කර්මජ රූප පටිසන්ධි සිත සමග ඒ ඒ සත්ව ජාතීන්ට සුදුසු පරිදි උපදී. කෙසේ හෝ පසුව උපදින රූප කලාප හෝ 77 දවස වනවිට සම්පූර්ණව ඇතිවී එතැන් පටන් චුති සිතට පළමු සිත් 17 කට ප්‍රථම කර්මජ-රූපයන්ගේ හට ගැනීම නවත්නා අවස්ථාව දක්වා සෑම චිත්තක් ෂණයකම ඇති වන්නේ ය. චුති සිතට පළමු ඇතිවීම්, නැවතීමත් නැතිවීම පළමු පරිදිම සිදුවී චුති සිතේ භංගක්ෂණය වන විට කර්මජ රූපයන් ද අවසන් වේ.

ඍතුජ රූප ඉපදීම පටිසන්ධි සිතේ ඨිතික්ෂණයෙහි සිට උපදී. කර්මය ප්‍රත්‍යය වී උපදිනා රූප හැර බාහිර ඍතුජ රූප මල සිරුරෙහි ද පවතී. ඇට සැකිලි වල පවා ඍතුජ රූපය පවත්නේ ය.

චිත්තජ රූප ඉපදීම පටිසන්ධියෙන් පසු ඊළඟ සිතවන භවාංග සිතේ සිට චිත්තජ රූප උපදී. චුති සිතට පසු සිත් නූපදනා බැවින් චිත්තජ රූප ඉපදීම ද නවතින්නේ ය. චුති සිතින් උපන් චිත්තජ රූප ස්වල්ප වේලාවකින් බිඳී අවසන් වන්නේ ය. සිත් 16 කාලය චුති සිතට පසු චිත්තජ රූප පවත්නේ ය.

ආහාරජ රූප ඉපදීම ගබ්භසෙය්‍යක සත්වයින්ට තමන්ගේ මවා ගන්නා ආහාර ඕජාව ගැබතුළ සිටින සත්වයාගේ ශරීරයෙහි පැතිරෙන අවස්ථාවෙහි සිට ආහාරජ රූප උපදන්නේ ය. මෙසේ කාම ලෝකයෙහි රූප උපදනා අයුරු පෙන්වන්නේ ය. රැයක් කල් පවත්නා පරිදි දල්වා තැබූ පහන් දැල්ල අලුයම් කාලය දක්වා පවතින්නා සේ ශරීරයෙහි ද රූප පරම්පරාවන් චුතිය දක්වා ද, චුතියට අනතුරුව ද පවත්නා අයුරු රූප චක්‍රය බලා පැහැදිලි අවබෝධයක් ලැබිය හැකි වේ. ඕපපාතික සත්වයන්ගේ ශරීර කපුරු දැල්ලසේ ඉතිරි නොවන්නේ ය.

## රූප ලෝකයේ රූප පවත්නා ක්‍රමය

රූප කලාප 21 අතුරෙන් ඝාණ ජිව්හා කාය භාවදසක 2 ක සහ කර්මජ කලාප 5 ද ආහාරජ රූපයන්ද රූප කලාප 7 බඹ ලොව නො ලැබේ. (අසඤ්ඤසත්තය හැර) බඹලොව උත්පාදක්ෂණයෙහිදීම චක්ඛු සෝත හදය ජීවිත නවක සහ රූප කලාප 4 ලැබෙති. පටිසන්ධි සිතේ ඨිතියෙහි පටන් ඍතුජ රූපයන් ද ශබ්දය සමග කලාප 2 ලැබෙති. භවාංග සිතේ පටන් චිත්තජ රූපයන්ද කලාප 4 ද යන රූප කලාප 6 ද ලැබෙති. චුති සිතින් පසු රූප සියල්ල නිරුද්ධ වේ. කපුරු දැල්ල සේ නිවී යන්නේ ය. අසඤ්ඤ සත්තයෙහි ජීවිත නවක කලාපය සහ ඍතුජ සුද්ධාෂ්ඨකය පැවත නිරුද්ධ වී යති.

## නිර්වාණ පරමාර්ථය

චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන මේ පරමාර්ථ 4 අතුරින් චිත්ත චෛතසික රූපාදීන්ට අනතුරුව නිබ්බාන පරමාර්ථය 4 වෙනුව විස්තර වන්නේ ය. නිර්වාණය ගැන

විස්තර කිරීම බුදු, පසේබුදු, උතුමන් විසින් ම කරන ලද්දකි. නිර්වාණය ලෝකෝත්තර ධර්මයකි. ප්‍රඥප්තිය මෙන් අභාව මාත්‍රයක් පැණවීමක් ද නොවේ. ඒකාන්තයෙන්ම විද්‍යමාන වූ සදකාලික වූ බුද්ධාදී උතුමන් විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද මාර්ග ඥනයෙන්ම දැනගත යුතු වූ ආර්යයන් වහන්සේලා විසින්ම මාර්ග ඵල සිත්හි උපදනා ප්‍රඥ චක්ෂු සින් දැකිය යුත්තකි. මසැසින් දැකිය හැකි දහමක් නො වන්නේ ය.

මසැසින් දැකිය හැකි ඉර හඳ තාරකා දිය මෙන් ඇසින් දැකිය හැකි ධර්මයක් නොවේ. ඇසින් දැකිය හැකි ප්‍රකටව පවත්නා ඉර හඳ ආදිය පවා ජාති අන්ධයාට දැකිය නොහේ. නිවන ඇතත් එය ලැබීමට නියම ප්‍රතිපත්ති මාර්ගයක් ඇත. එය සම්පූර්ණ කිරීමෙන් විනා වෙනයම් කිසි ක්‍රමයකින් ලැබිය නොහැක්කේ ය. එය සදකාලිකව පවත්නා ධර්මයක් වුවත් ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේලා විසින් ම පළමුව. අවබෝධ කොට ලෝක සත්වයින්ට මිනිස් දෙව් බඹ ආදීන්ට පහදා දිය යුතුය. එහෙත් තිහේතුක පටිසන්ධිකයකු විසින් ම අවබෝධ කළ යුතු වේ. ''පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි'' යන දහම් පදයට අනුව තම තමන් විසින්ම තම නුවණින් ප්‍රත්‍යක්ෂ යෙන්ම දතයුතු ධර්මයකි.

ශාන්ත ලක්ෂණයෙන් යුක්ත වූ නිර්වාන ධාතුව අනුපාදි සෙස නිබ්බාන ධාතුවයි. දෙ පරිදි වේ. සඋපාදිසේස නිබ්බාන ධාතුව නම් රහතන් වහන්සේ සියලුම කෙලෙස් ගිනි නිවාලත් නිර්වාන ධාතුව ස්කන්ධ පරිනිර්වාණය තෙක් පවත්නා හෙයින් එය පඤ්ච උපාදන ස්කන්ධ සහිතව සිටියදී ලබන ලද නිර්වාණ ධාතුවයි. ස්කන්ධ පරිනිර්වාණයෙන් පසු ලබන නිවීම අනුපාදිසසෙ නිර්වාණ ධාතුවයි. පඤ්චස් කන්ධය නැති අවස්ථාවයි. රාග දෝස මෝහයෙන් මිදුනා වූ සුඤ්ඤත නම් වූද, රාගාදී නිමිති නැති හෙයින් අනිමිත්ත වූ රාගාදියෙන් බලාපොරොත්තු නැති රාගාදි පතිධි නැති ප්‍රාර්ථනා නැති අප්පණිහිත නම් වූද, කර්මාදී ප්‍රත්‍යයන් ගෙන් සකස් නොවූ හෙයින් අසංඛත වූද උත්පාද ඨිති භංග යන ඤාණත්‍රයට නො පැමිණෙන්නාවූ විද්‍යාමානව පවත්නා ධර්මයකි.

මාර්ග ඵල සිත් වලින් කෙලෙස් සහමුලින්ම විනාශ කොට දැමිය හැකි වන්නේ ද නිවණෙහි පවත්නා මහත් ආනුභාවය නිසාමය. පළමුවරට සෝවාන් මාර්ගයෙන් නිවණ දැකීම විදුලි එළියෙන් යමක් දැකීම මෙන් ද සකෘදගාමි, අනාගාමි මාර්ගාදියෙන් දැකීම පහන් ආලෝකයෙන් දැකීම මෙන් ද, අර්හත් මාර්ග ඵලයන්ගෙන් දැකීම සූර්යා ලෝකයෙන්දැකීමක් මෙන් ද පෙන්වා තිබේ. සෝවාන් මාර්ගයෙන් පළමුවරට නිවන දැකීමෙ ආනුභාවයෙන් අනාදිමත් සංසාරයෙහි චිත්ත සන්තානය අනුව පැවත ගෙන එන ලද අකුසල කර්මයන් සියල්ලකගේම අපායට පමුණුවන ශක්තිය විනාශ කිරීමම නිර්වාණයෙහි තිබෙන මහත් ආනුභාවය තේරුම් ගැනීමට ප්‍රමාණවත් වන්නේ යැයි සිතිය හැක. සෝවාන් මගින් නිර්වාණ ප්‍රත්‍යක්ෂයෙන් දැකීමෙන් පසු ඒ සත්වයාට අපායට පටිසන්ධි ලබාදීමේ ශක්තියෙන් යුත් අකුසල් කිරීමටද දරුණු සිත් පහළ නොවීමද ආශ්වර්‍යයකි.

කල්‍යාණ පෘතග්ජනයාට ද මහා කුසල් ඥානසම්ප්‍රයුක්ත සිත් වලින් අනුමාන වශයෙන් සිතිය හැකි වේ. නිවන ලෝභ යට අරමුණු වන ධර්මයක් නොවේ. නිවන ලැබීමේ උත්සාහය ඇති වන්නේ පංචස්කන්ධ දුක තරමකින් හෝ තේරුම් ගත් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබන ලද බුදු දහම පැත්තට බරවී නැමීගිය චිත්ත සන්තානයක් ඇති පාරමී කුසල් තරමක් හෝ සම්පූර්ණ වූ කෙනෙකුටම ය.

නිවන් ලැබීමට සෑම කෙනෙකුටම පාරමීකුසල් තිබිය යුතුමය. වහා අවබෝධය ලබන උතුමන්ගේ පාරමී කුසල් පෙර භවයන්හි සම්පූර්ණව තිබී බුදු කෙනෙක් හමුවූ වහාම දරු චීරිය රහතන් වහන්සේට මෙන් වහා අවබෝධය ලබයි. එසේ උත්සාහ කිරීම පටිපද 4 ක් වශයෙන් පෙන්නුම් කර තිබේ.

සෝවාන් පුද්ගලයා සුගති සංසාරයෙහි සැරිසරතත් බුදු සසුනක් නැති පිටසක්වලක නූපදනේ යයි ද, බාහිර ශාස්තෘන් ගේ පිළිසරණ නොපතන්නේ යයි ද, නැවත පෘතග්ජන භාවයට පත් නොවන්නේ යැයි ද, පළමුවරට නිවන් දක්නා පුද්ගලයා ලබන ලද සැනසීම පෙන්වන්නේය.

ශාසනයෙහි චුල්ලසෝතාපන්නයා යැයි තවත් කෙනෙක් පෙන්නුම් කරයි. ඔහුද නිවන්මගට පිළිපන් කෙනෙකි. එහෙත් ඔහුට සෝවාන් මාර්ගය ලැබීමට තරම් කුසල ශක්තිය මෝරා නැත. විදර්ශනා භාවනාදිය තරමක් දුරට දියුණු කළ කෙනෙකි. විසුද්ධීන්ගේ වශයෙන් ශීල විසුද්ධි, චිත්ත විසුද්ධි දිට්ඨිවිසුද්ධි යටද පැමිණි කෙනෙකි. ඊළඟ ආත්ම භවයේ පමණක් ඔහු අපායගාමී නොවේ. දෙවැනි ආත්ම භාවය සුගතියක උත්පත්ති ගන්නේය. ඊට එහාට ගති නියත පුද්ගලයෙක් නොවේ. ගති නියත වන්නේ සෝවාන් පුද්ගලයාගේ පටන් ඉහළ ආර්යයන්ටය. ස්කන්ධයන්ගේ පැවැත්ම නොපැවැත්ම නිසාම මේ කරුණු දෙක ක්ලේශ ශක්තිය නිසා සිදුවේ. සඋපාදිශෙස නිබ්බානය නමින් පෙන්වන්නේ ය.

සතර වරකින් ද, අනුපාදිශෙස නිබ්බානය එක් වරකින් ද සිදුවේ. මාර්ග සිත් සතරෙහි දී සතර වරකින් ක්ලේශප්‍රහානය කරන ආකාරයයි. අනුපාදිශෙෂ නිර්වාණය රහතන් වහන්සේ ගේ චුතියෙන් පසු නැවත පටිසන්ධි නො ගැනීමෙන් නිවනෙහි මහත් ආනුභාවය නිසාම සියලුම කෙලෙස් පහකළ නිසාම රහතන් වහන්සේට නැවත ඉපදීම ලබාදෙන ධර්ම සන්තානයෙහි නැති නිසාම එසේ ඉපදීම සිදු නොවේ. ගින්නේ තම්බන ලද බීජයන්ගේ නැවත පැලවීමේ ශක්තිය විනාශ කිරීම මෙන්ද වේ.

එසේ ලබන ලද නිර්වාණ ධාතුව ත්‍රිවිධාකාරයකින් අවබෝධ වන්නේය. එය භාවනාවේ ආකාරයට ක්ලේශ ප්‍රහාණය සිදු වන ආකාරයට නම් තුනක් ලබන්නේය. සුඤ්ඤතය, අනිමිත්ත අප්පණිහිතය යන ආකාරයෙනි.

සුඤ්ඤත නම් :—සියලු සංස්කාරයන්ගෙන් තොරවූ සියලු සංස්කාරයන් ශුන්‍ය වූ බවය. නිවනෙහි සංස්කාර කිසිවක් නැත. සංස්කාරයන්හි මෙන් නිවනෙහි පළිබෝධ කිසිවක් නැත. සංස්කාර ඇති තැනම පලිබෝධ ඇත.

අනිමිත්ත නම් :—සංසාර නිමිති කිසිවක් නිවනෙහි නැත. නිමිති ඇති සංස්කාරයන්හි නොයෙක් භය, දුක් පීඩා ඇතිවේ. නිමිත්තක් නැති නිවනෙහි දුක් පීඩා කිසිවක් නැත.

අප්පණිහිත නම් :—සංස්කාරයන්හි පංචකාමය ප්‍රාර්ථනා කරන්නා ඒ ගින්නෙන් දැවේ. භවය ප්‍රාර්ථනා කරන්නා භව තෘෂ්ණා ගින්නෙන් දැවෙයි. නිවනෙහි තෘෂ්ණාවෙන් ප්‍රාර්ථනා කළ යුත්තක් නැති බැවින්ද තෘෂ්ණාවට අරමුණු නොවන බැවින්ද එවැනි ගින්නක් නිවනෙහි නැත.

නිවන අනු ශ්‍රවනයෙන් අසා දැනගෙන මෙනෙහි කිරීමේදී භාවනා කිරීමේදී උපදනා කාමාවචර කුසල් සිතෙහි උපදනා ප්‍රඥ චෛතසිකය අනුබෝධ ඥනයයි. ඒ ලෞකික වේ.

ප්‍රතිවේධ ඥනය ලෝකෝත්තරය, දුක්ඛ සත්‍යය පිරිසිඳ දැනගන්නාවූ ද, සමුදය සත්‍යය ප්‍රහාණය කරන්නාවූ ද නිරෝධ සත්‍යය ක්ෂාත් ක්ෂාත්කරන්නාවූ ද, මාර්ග සත්‍යය වඩන්නාවූ ද, මාර්ග චිත්තයෙහි උපදනා ප්‍රඥව, ප්‍රතිවේධ ඥනයයි. පහන දැල්වීමෙන් අඳුර නැසීමය. තෙල් දැවී යාමය. එලිය පැතිර වීමය. පහන් වැටිය දැවීමය. යන කෘත්‍ය සතර කරන්නාක් මෙන් වේ. මෙසේ සත්‍ය සතර අවබෝධ වීමෙන් ශාස්වත, උච්ඡෙද ආදී මිථ්‍යා දිට්ඨී සියල්ල නැති වන්නේ ය. අපාය පටිසන්ධිය ද නොවන්නේ ය. අනුපාදිශේෂ පරිනිර්වානයෙන් ත්‍රිවිධ භව යෙහි හෝ කොතැනක හෝ උත්පත්තියක් නොගන්නා තත්ත්ව යට පත් වන්නේ ය. සංසාර ගමන අවසන් වන්නේ ය.

### රූපවීථි ගැන විස්තර කිරීමක්

කර්මජ රූපයෙන් දෙළොස් අකුසල සිත්ය. කාමාවචර කුසල් සිත් 8 ය, රූපාවචර කුසල් සිත් 5 යන මේ සිත් 25 සමග උපදනා චේතනාවෝ කර්මජ රූප උපදවත්.

චිත්තජ රූප :—අටුවාවෙහි එන පරිදි දක්වා තිබෙන්නේ මෙසේය : අරූප විපාක සිත් 4 ය, දෙපස් විඤ්ඤාණ 10 ය. සියලු දෙනාගේ පටිසන්ධි සිත්ද, රහතුන්ගේ චුති සිත ද හැර පංචවෝකාර භූමියෙහි හටගන්නා ඉතිරි සිත් 75 ද රූප උපදවන සිත් වන්නේ ය.

සෘතුජ රූප :— සවිඤ්ඤාණක ශරීරයන්හි සහ අවිඤ්ඤාණක වස්තූන්හිද ඉපිද ඨිතියට පැමිණි තේජෝ ධාතුවයි. ඒ තේජෝ ධාතුවෙන් උපදවන රූපයෝ සෘතුජ රූප නම් වේ.

ආහාරජ රූපයෝ :—කබලිකාරාහාරාදී සංඛ්‍යාත ආහාර වශයෙන් ගන්නා ආහාරපානාදිය ද වේ. බාහිර ඕජාව අධ්‍යාත්ම ඕජාව සමග බාහිර ඕජාවෙන් උපකාර ලැබ රූප උපදවත්. අධ්‍යාත්ම ඕජාවට තනිව රූප ඉපදවිය නොහැක.

1. කර්මජ රූපයන්හි ඨිතියට පැමිණි ඕජාව ආහාරජ රූපයක් උපදවයි. එය කම්මපච්චය ආහාර සමුට්ඨාන නම් වේ. මෙසේ නැවත නැවත සතර පස් වරක් රූප උපදවත්.

2. චිත්තජ රූපයන්හි ඨිතියට පැමිණි ඕජාව ද ආහාරජ රූප කලාපයක් උපදවයි. එයද දෙතුන් කලාපයක් උපදවයි. එය චිත්ත පච්චය ආහාර සමුට්ඨාන නම් වේ.

3. කබලීකාරාහාරයෙහි ඨිතියට පැමිණි ඕජාවෙන් කර්මජ රූපයෙන් උපකාර ලැබ රූප කලාපයක් උපදවයි. එය ආහාර සමුට්ඨාන රූප නම් වේ. එහිද ඨිතියට පැමිණි ඕජාවෙන් රූප කලාපයක් උපදවයි. එය ආහාර පච්චය ආහාර සමුට්ඨාන නම් වේ. රූප කලාප දෙකක් තුනක් උපදී.

4. උතු පච්චය ආහාර සමුට්ඨාන :—සෘතුජ රූපයෙහි ඨිතියට පැමිණි ඕජාවෙන් රූපයක් උපදවයි. එය දශ දොලොස් වාරයක් රූප උපදවයි. ආහාරජ රූපය සතර ආකාරයකින් දක්වයි. බාහිර ඕජාවද සත්ව සන්තානයෙහි ඕජා පැතිරෙන කාලයෙහි ආහාරජ රූප උපදවන්නේ යයි උතුජ රූපයෙහි ද සතරාකාරය ද වේ. අර්ථසාලිකියෙහි ස්වල්ප වෙනසක් ඇතැයි කියති.

පරිපූර්ණ ආයතන ඇති ගබ්භසෙය්‍යක සත්වයින්ට පටිසන්ධි සිතේ උත්පාද ක්ෂණයේ පටන්ම සෑම ක්ෂණයකදීම කර්මජ රූප උපදවත්. උත්පාද ඨිති භංග යන ක්ෂණ තුනෙහිදීම කර්මජ රූප කලාප තුන බැගින් කාය, භව, වස්තු යන දයක

කලාප තුන උපදී. සෙසු කලාප සතර, චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා යන කර්මජ කලාප සතර එකොලොස්වන සතියෙහි උපදී යයි සම්මොහ විනොදනි අටුවාවෙහි කීය.

සෘතුර රූප කලාපයෝ :—පටිසන්ධි සිතෙන් පසු පළමුවන භවාංග සිතේ උත්පාර ක්ෂණයෙහි පටන් රූප ජනක චිත්තයන් ගේ උත්පාද ක්ෂණකයක් පාසා හටගනිත්. ඨිති භංග අවස්ථා වන්හි හට නොගනිත්.

ආහාරජ කලාපයෝ :—ගබ්භසෙය්‍යක සත්වයන්ට පටි සන්ධියෙන් පසු මව අනුභව කරන ආහාර ඕජාව පැතිරෙන කාලයේ ආහාරජ රූප හටගනිත් යයි ද එසේ නොව දෙවැනි තුන් වැනි සති තුල නොවන්නේ යයි ද කියති.

කර්මජ සෘතුජ ආහාරජ රූපයෝ :—සතලොස් චිත්තක්ෂණ යකට හෝ කුඩා, ක්ෂණ 51 ට ආයු ඇතිව උත්පාද, ඨිති, භංග යන 3 ක්ෂණත්‍රයෙහිම නිරුද්ධ වෙත්. චිත්තජ රූපයෝ වනාහි සිතෙහි උත්පාද ක්ෂණයෙහිම උපදනා බැවින් සතලොස් වන සිතේ භංග ක්ෂණයෙහිම නිරුද්ධ වෙත්.

එබැවින් ගබ්භසෙය්‍යක සත්වයින්ට පටිසන්ධි සිතේ උත් පාද ක්ෂණයෙහිම කාය, භාව, වස්තු යන ත්‍රිවිධ කර්මජ කලා පයෝ පහළ වෙති. ඨිති භංග ක්ෂණයන්හිද එසේම කලාප 3 බැගින් පහළ වෙති. එසේ හෙයින් පටිසන්ධි සිත් භංග ක්ෂණය අවසන් වන විට කර්මජ කලාප 9 ක් පවත්නේ ය. එසේ සිත් 17 අවසාන භංග ක්ෂණයෙහි කර්මජ රූප කලාප 153 ක් සම්පූර්ණව පවත්නේ ය. 18 වන සිතේ උත්පාද ක්ෂණයෙහිදී පළමුව උපන් කර්මජ කලාප 3 චිත්තක්ෂණ 17 සම්පූර්ණ වීම නිසා රූපයාගේ ආයු කාලය ගෙවී ගිය බැවින් නිරුද්ධ විය යුතු බැවින් ධර්මතාව අනුව ඒ කර්මජ කලාප 3 නිරුද්ධ වේ. නමුත් ඒ අඩුව නො පෙනෙන පරිදි කර්මජ කලාප 3 ක් එකතුවීම නිසා අඩුවීම වීථි චක්‍රයෙහි නොපෙනෙතත් අඩුවන බව තේරුම් ගත යුතු වේ.

සෑම කුඩා ක්ෂණයන්හිදීම 3 බිඳීයාමත්, 3 එකතු වීමත් සිදුවේ. සති 11 පසු චක්ඛු සෝත, ඝාණ .ජිව්හා යන කර්මජ රූප කලාප 4 ක් එකතු වේ. එතැන් සිට කලාප 4 ක් එකතු වීමත් එකතුවීමත් 3 ක් බිඳීයමත් සිත් 17 ක් සම්පූර්ණ වන 3 ක් තුරු සිදුවේ. පසුව ඇතිවූ රූප කලාප 4 ට චිත්තක්ෂණ 17 වන ආයු කාලය සම්පූර්ණ වූ විට කලාප සියල්ල 357 ක් වේ. එතැන් සිට රූප කලාප 7 ම එකවිට බිඳීයාමත්, එකවිට හටගැනීමත් ක්‍රමානුකූලව සිදු වේ.

එසේ චුති සිතින් පූර්ව 17 වන චිත්තයේ ඨිතික්ෂණයේ පටන් කර්මජ රූප නූපදනේය. එතැන් සිට රූප බිඳීයාම සිදුවීගෙන ගොස් චුති සිතේ භංග ක්ෂණයෙහි කර්මජ කලාප සියල්ල බිඳී අවසන් වන්නේ ය. චුතිය සිදු වූවාට පසු මෘත කලේබරයෙහි කර්මජ කලාප ඉතිරිව නැත්තේ ය. චුති සිතේ භංගයෙන් පසු ඒ කර්මජ රූපක්ෂණ සිත ද නිරුද්ධ වේ. කම්ම පච්චය රූපයන්ගේ එක කලාප 7 ක් චුතියෙන් පසු බිඳී යන්නේ ය.

චිත්තජ රූප කලාපයන් දැක්වීම අත්ථසාලිනී සම්මොහ විනොදනී විසුද්ධි මාර්ගාදියෙහි ද, රූප සමුට්ඨාන දැක්වූ ආකාර යෙන්ම පටිසන්ධි සිතට පසුව උපදනා භවාංග සිතේ උත්පාද යෙහි පමණක් උපදී. ඨිතිභංග ක්ෂණයන්හි චිත්තජ රූප නූපදනේ ය. මෙසේ 17 වන චිත්තක්ෂණයාගේ උපදිනු ලබන එක කලාපයක්ද බිඳෙන එක කලාපයක් ද වෙති. මෙසේ රූප උපදනා චිත්තයන්ගේ වශයෙන් චිත්තජ රූප ඉපදීමත් වීථි චක්‍රය බලා දතයුතු වේ. චුති සිතට පසු ස්වල්ප වේලාවක් චිත්තජ රූප පවත්නේ ය.

ඍතුජ රූප කලාපයන් හට ගැනීම ද, කර්මජ රූපයන්ට කී පරිදිම වෙයි. පටිසන්ධි සිතේ උත්පාදයෙහි හටගත් කර්මජ රූප කලාප 3 හි හටගත් ඍතුවෙන් තේජෝ ධාතුවෙන් උපන් රූප කම්ම පච්චය ඍතුජ රූප නම් වේ. (රූප වීථි දැක්වීමෙහි තුන්වෙනි පේළියේ එය පෙන්වා ඇත) කම්ම පච්චය, උතුජ රූපය කර්මජ රූපය මෙන් වැඩීම ද, බිඳීම ද සිදුවී අවසානයට චුති සිතේ භංගයෙහි ද කර්ම පච්චය ඍතුජ රූප කලාප 7 ක් බිඳී ගොස් 7 ඉතිරි වේ. චුති සිතින් පසු ඒ කාලප 7 බිඳී යන්නේ ය.

චිත්ත පච්චය උතුජ රූප කලාපයන් ද පළමු භවාංග සිතේ උත්පාදයෙහි චිත්තජ රූප ඉපදීම පටන් ගත් පසු එම කලාප යෙහි පිහිටි තේජෝ ධාතු සංඛ්‍යාත සෘතුවෙන් චිත්ත පච්චය උතුජ කලාපයක් උපදවත්. එසේ සෑම සිතකම ඨිතියෙහි දී රූප කලාපයක් උපදවා අවසානයට නිරුද්ධ වීම ද සිදු වේ. රූප වීථි බලා දැනගත යුතුවේ.

බාහිර සෘතුවෙන් ඉපදවිය යුතු උතුජ රූපයාගේ ඇතිවීම බිඳීම පටිසන්ධි චිත්තයේ ඨිති ක්ෂණයෙහි පටන් සෑම ක්ෂණය කම එක එක කලාපය බැගින් ඉපද රූප කලාප 51 ක් සම්පූර්ණ වීමෙන් පසු එකක් බිඳීමත් එකක් ඇති වීමත් සිදුවේ. රූප වීථියෙහි එය පෙන්වා ඇත.

ආහාර පච්චය උතුරු රූපයන්ගේද උත්පාදදිය සෘතුජ රූපයට සමාන වේ. උතු පච්චය ආහාර සමුට්ඨාන රූපයන්ගේ වැඩීම හා බිඳීමද මෙසේම වේ. කම්ම පච්චය ආහාරජ රූපය තුන් ක්ෂණයන්ගෙන් එක් ක්ෂණයෙක්හිදී උපදී. එසේ කලාප 357 ක් දක්වා ඉපිද බිඳීමද සිදුවේ. කම්ම පච්චය උතුජ කලාප යට සමාන වේ.

චිත්ත පච්චය ආහාරජ රූපයද රූප උපදවන සිතක ඨිති කාලයේ පටන් ඉපදී, චිත්ත පච්චය උතුජ රූපයට සමානව ඉපදීම බිඳීම සිදු වේ.

1. කර්මජ රූපයන්ගේ ඇතිවීම සහ බිඳීයාම පෙන්නුම් කරයි.
2. චිත්තජ රූපයන්ගේ ඇතිවීම සහ බිඳීයාම පෙන්නුම් කරයි.
3. කර්මය උපකාර කොට කර්ම ප්‍රත්‍ය වී සෘතුව නිසා තේජෝ ධාතුවෙන් උපදවන රූපයෝ,
4. සිත උපකාර කොට සිතේ උපකාරයද ඇතිව සෘතුවෙන් රූප ඉපදවීමයි.

5. බාහිර සෘතුවෙන් ඉපදවිය යුතු සෘතුජ රූපයන්ගේ ඉපදීම හා බිඳීම පෙන්නුම් කරයි.

6. ආහාරයෙහි උපකාරයෙන් සෘතුජ රූප උපදවන ආකාරයයි.

7. කර්මය උපකාර කොට ආහාරයෙන් රූප උපදවන ආකාර යයි.

8. චිත්තයේ උපකාර ඇතිව ආහාරජ රූප උපදවන ආකාරයයි.

9. බාහිර ඕජාවෙහි උපකාරයෙන් ආහාරජ රූප උපදවන ආකාරය යි.

10. සෘතුව හේතුකොට ආහාරජ රූප උපදවන ආකාරය යි.

## 1 වන රූප වීථි සටහන

මෙය කාම භවයෙන් චුතව කාම භවයෙහිම පටිසන්ධි ගන්නා රූප වීථිය. ගබ්භසෙය්‍යක සත්වයන්ගේ චක්ඛුද්වාර මරණාසන්න චිත්ත වීථියෙහි තදරම්මණයෙන් අවසන්වී චුතිය ඇතිවී ඊටපසු පටිසන්ධිය ගෙන රූප උපදනා ආකාරය බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවට අනුව අටුවාචාරීන් වහන්සේලා විස්තර කොට දක්වා වදාළ සේක.

ගබ්භසෙය්‍යක සත්වයින්ට පටිසන්ධියෙහි දී කර්මජ කලාප 3 ක් පටිසන්ධි සිත සමග පහල වීමත් ඊට පසු 77 දවසකට පසු ඉතිරි කර්මජ කලාපයන්ගේ පහළ වීමත් එසේ පරම්පරාව පැවත ආයු කෙළවර චුති සිතට සිත් 17 ට පළමු කර්මජ රූපයන්ගේ හටගැනීම නැවතීමත්, කර්මජ රූප ආදී ඒ ඒ රූප කලාපයන් ද නිරුද්ධ වී යාමත් පෙන්වා තිබේ. රූපයක ආයු කාලය වැඩිම ගණන චිත්තක්ෂණ 17 කි. ඊට අඩු රූපද ඇත. විඤ්ඤත්ති රූප 2 ක ලක්ෂණ රූපවන උපචය, සන්තති, ජරතා, අනිච්චතා යන රූපාදිය ද වේ. මේවා ගැන විස්තර ඉහත පෙන්වා ඇත.

පළමුවන වීථි සටහනින් පෙන්වන්නේ අතීත භවය පිළිබඳ චුති අවස්ථාවට ලංව රූප බිඳීයාම පහද පෙන්වා ඇත. පළමු රූප වීථියේ සිත් 17 ආයුකාලය පෙන්වා රූප ධර්මයන්ගේ බිඳීයාම පෙන්නුම් කරයි. කර්මජ රූපයන්ගේ සහ කර්මය උපකාර ඇතිව (කම්ම පච්චය උතු සමුට්ඨාන) හටගන්නා රූප සියල්ල කර්මජ රූප බිඳීයන ආකාරයට කලාප 7 ම එකවිට බිඳීයාම පෙන්වයි. ඉතිරි අනික් චිත්තජ ඍතුජාදී රූපයන් එක එක කලාපය බිඳී යාමෙන් පෙන්වා ඇත. මෘත කලේබර යෙහි උපදනේද ඍතුජ රූප කලාප පමණකි.

## 2 වන රූප වීථි සටහන

දෙවන රූප වීථි සටහනින් පෙන්වන්නේ චුතියට පසු චුති සිතට අනතුරුව ද උපදනා පටිසන්ධි ගන්නා ඊළඟ භවය ඇතිවන මුල් අවස්ථාව ගැනයි. පළමුව මවුකුස උපදනා සත්වයන්ට කර්මජ කලාප 3 ක් පමණක් පළමු පටිසන්ධි සිත සමග ඇතිවීමත් කර්මජ කලාප එසේ 3 බැගින් සෑම කුඩා ක්ෂණයක් පාසාම චිත්තක්ෂණ 17 අවසන් වන තාක් කල් හටගෙන 18 වන සිත උපදනා විට පළමු ඇතිවූ කලාප 3 චිත්ත ක්ෂණ 17 වන රූපයෙහි ආයු කාලය සම්පූර්ණ වී බිඳීයාමත් සිදු වේ. එසේ දවස් 77 ක් සම්පූර්ණ වීමෙන් පසු ඉතිරි කර්මජ කලාපවන චක්ඛු, සොත, ඝාණ, ජිව්හා යන කර්මජ රූප කලාප 4 ඇතිවීම ආරම්භ කරයි. එතැන් සිට කලාප 3 ක් බිඳීමත් අලුතෙන් ඇතිවූ කලාප 4 සමග රූප කලාප 7 ක් ඇතිවීමත් සිත් 17 ක් සම්පූර්ණ වනතුරු පවත්නේය.

ඊට පසු චිත්තක්ෂණයේ සිට පළමු කලාප 3 ත් අලුත් කලාප 4 යන 7 ම එකවිට බිඳීයාමත් එකවිට හටගැනීමත් සිදුවේ. චුති වීථිය තෙක් අංක 1 පළමු වන රූප වීථියේ පෙන්වා ඇති පරිදි චුති සිතට චිත්තක්ෂණ 17 කට පළමු හටගැනීම නැවතී බිඳීයාම පමණක් සිදුවන්නේය. මෙසේ පෙන්වා තිබෙන්නේ එක සත්වයෙකුගේ උත්පත්තියේ සිට මරණය දක්වා සත්ව ශරීරය ඇතිව නැතිවන ආකාරය යි.

නැවතත් පළමු කී පරිදිම පටිසන්ධි සිතේ සිට එකටම එකවරම ඉදිරි පසු වීමක් නැතිවම කායදසක භාව දසක වස්තු දසක යන රූප කලාප තුන හෝ භාව දසකය නොමැතිව හෝ රූපයාගේ ඇතිවීම වේ. වස්තු දසකය වන්නේ මනොධාතු මනො විඤ්ඤාණ සිත් ඉපදවීමට උපකාර වන වැඩි වශයෙන් සිත් උපදන වස්තු රූපයයි.

## 3 වන රූප සටහන

3 වන වීථි චක්‍රයෙන් පෙන්වා තිබෙන රූප ඇතිවීම 2 වන සටහන ගැන විස්තර කිරීමේදී පැහැදිලි කරන ලදි. එහි පෙන්වා තිබෙන්නේ පසුව ඇතිවූ කර්මජ රූප කලාප 4 වන චක්ඛු සොත ඝාණ ජිව්හා යන රූප කලාපයන්ගේ ඇතිවීමය. එසේ ඇතිව කර්මජ රූප සම්පූර්ණ වීම සමග අනිත් රූප කලාප සියල්ල සම්පූර්ණ වීම පැහැදිලි කර ඇත.

හතර වන රූප වීථි සටහනක් පොත්වල පෙන්වා ඇතත් එයද පළමු වීථිය මෙන් රූප ධර්ම චුති සිතට පළමු බිඳීයාම ආරම්භයේ සිට කිසිදු වෙනසක් නොමැතිව පෙන්වා ඇත. සතරවන වීථි චක්‍රයෙහි පෙන්වන්නේ මනොද්වාරික මරණාසන්න වීථි සටහනකි. එපමණයි වෙනස් වන්නේ. එබැවින් පළමු වීථියෙන් බලාගත හැකි බැවින් එය සටහන් නොකෙළෙමි. චුති අවස්ථාව පළමු වීථි චක්‍රයෙන් බලා දත යුතු වේ.

පටිසන්ධි සිතින් පෙර භවයේ මරණාසන්න චිත්තවීථියේ ජවනයෙන් ගත් කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගතිනිමිත්ත යන තුනෙන් එකක් පටිසන්ධි සිතින් අරමුණු කරයි. භවාංග සිතින්ද එම අරමුණම ගනී. එම අරමුණෙහිම එල්බගෙන භවාංග සන්තතිය පහළවේ. මෙහි පෙන්නුම් කරනුයේ කාම භවයෙන් චුතව කාමභවයෙහි ම පටිසන්ධි ගන්නා ගබ්බසෙය්‍යක යන් ගැනය. රූප වීථියෙන් පෙන්නුම් කරනුයේ පටිසන්ධි නාමස්කන්ධ හා පවත්නා රූපාදීන්ගේ ඇතිවීම හා හානියයි. කර්මජ රූපයන්ගේ හා චිත්තජ ඍතුජ රූපාදීන් ඇතිවීම හා හානියද පෙන්නුම් කරයි. පටිසන්ධි සිත නිරුඬ වූවාට පසු පළමු වන භවාංග සිතේ උත්පාදක්ෂණ යෙහි රූපකලාපයක්, පහළවීමද බාහිර ඍතුව නිසා රූපයන්ගේ ඇතිවීමද, කම්ම පච්චය උතුජ රූපාදීන්ගේ පහළවීමද පෙන්නුම් කරයි. මෙහි පෙන්වන්නේ කර්මජ රූපයන්ගේ පළමු පහළවන ආකාරයයි. පටිසන්ධි සිතේ උත්පාදක්ෂණයෙහිදී කායදසක, භාවදසක, වස්තුදසක, යන කලාප තුන පටිසන්ධි සිත සමග එකවිට පහළවේ. එසේ පහළවන වස්තු රූපය ඇසුරුකොට පටිසන්ධි සිත උපදී. ඊටපසු එම සිත ගත් අරමුණ අනිත වශයෙන් ගෙන භවාංග සිත් 15 ක් හෝ 16 ක් ඇතිවී ඊට පසු එම ශරීරයට ඇලුම් කිරීම් වශයෙන් මනොද්වාරික ජවන් ඇතිවේ. ඒ ජවනයන් ලබාගලද භවයට ඇලුම් කිරීම් වශයෙන් ලෝභමූල සිත් 8 න් 1 ක් උපදී. ඊට එම සිත භවයට ඇලුම් කර උපදින හෙයින් භවනිකන්තික ලෝභ ජවන් යයි කියති. මෙසේ හැම සිතකම උත්පාද, ඨිති, භංග යන අවස්ථා තුනෙහිදීම රූපකලාප 3 ක බැගින් සිත් 17 අවසන් වනතුරු උපදනේය. එසේ සිත් 17 ට පසු රූපකලාපයන්ගෙන් පළමුව ඇතිවූ චිත්තක්ෂණ 17 ක සම්පූර්ණ වූ රූපකලාප 3 න බිඳෙන්නේය. එතැන සිට සැම ක්ෂණයකදීම කලාප තුනක් බිඳීමත්, කලාප තුනක් ඇතිවීමත් සිදුවේ. ඒ ක්‍රමයට දවස් 77 වනතුරුම පැවත 77 දවස සම්පූර්ණ වූවිට චක්ඛු සොත, ඝාණ, ජිව්හා, යන ඉතිරි කර්මජ රූපකලාපයන්ගේ හටගැනීම වේ. එතැන සිට සිත් 17 ක් උපදනා තාක් කල් රූප කලාප 3 ක් බිඳීමත්, 7 ක් ඇතිවීමත් වේ. සිත් 17 සම්පූර්ණ වූවාට පසු කර්මජ රූපකලාප 7 ම සම්පූර්ණ වේ. එතැන් සිට රූපකලාප 7ක් ඇතිවීමත් 7 ක් බිඳීමත් සිදුවේ. අංක 3න දරන සටහනින් එය පහද ගත හැකි වේ. ගබ්බසෙය්‍යක යන්ගේ කර්මජ රූප පහළවීම මෙසේ අවස්ථා දෙකකදී සම්පූර්ණ වේ. එකවර සියල්ල නොලැබේ. එසේ එකවර සියලුම රූපධර්ම ඇතිව උපත ලබන්නෝ ' ඕපපාතික'' නමින් දක්වේ. රූප කලාපයක සම්පූර්ණ ආයු කාලය සිත් 17 ක කාලයයයි වදරා ඇත, ඊට වඩා එක කුඩා ක්ෂණයක් හෝ පවත්නා බවක් ධර්මයෙහි පෙන්වා නැත.

ගබ්බ සෙය්‍යක සත්වයින්ගේ පටිසන්ධියේ සිට නාමරූප හටගැනීම මෙහි පෙන්වන්නේය.

| | කාලය | 1 පටි | 2 භ | 3 භ | 4 භ | 5 භ | 6 භ | 7 භ | 8 භ | 9 භ | 10 භ | 11 භ | 12 භ | 13 භ | 14 භ | 15 භ | 16 භ | 17 භ | ම | 1 ජ | 2 ජ | 3 ජ | 4 ජ | 5 ජ | 6 ජ | 7 ජ | භ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කම්ජ රූපයන්ගේ වෘඩිය හා හානිය | උත්පාද | 3 | 12 | 21 | 30 | 39 | 48 | 57 | 66 | 75 | 84 | 93 | 102 | 111 | 120 | 129 | 138 | 147 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| | ඨිති | 6 | 15 | 24 | 33 | 42 | 51 | 60 | 69 | 78 | 87 | 96 | 105 | 114 | 123 | 132 | 141 | 150 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| | භංග | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 | 90 | 99 | 108 | 117 | 126 | 135 | 144 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| චිත්තජ රූපයන්ගේ වෘඩිය හා හානිය | උ | 0 | 1 | 2 | 2 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | ඨි | 0 | 1 | 2 | 2 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භ | 0 | 1 | 2 | 2 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| කම්ම පච්චය උතුජ රූප වෘඩිය හා හානිය | උ | 0 | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 | 90 | 99 | 108 | 117 | 126 | 135 | 144 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| | ඨි | 3 | 21 | 27 | 30 | 39 | 48 | 57 | 66 | 75 | 84 | 93 | 102 | 111 | 120 | 129 | 138 | 147 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| | භ | 6 | 15 | 24 | 33 | 42 | 51 | 60 | 69 | 78 | 87 | 96 | 105 | 114 | 123 | 132 | 141 | 150 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 | 153 |
| චිත්ත පච්චය උතුජ රූප වෘඩිය හා හානිය | උ | 0 | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | ඨි | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භ | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| බාහිර සෘතුවෙන් උපදනා රූපයන්ගේ වෘඩිය හා හානිය | උ | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| | ඨි | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |
| | භ | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 |

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 ආහාර පච්චය උතුජ රූපයන්ගේ වෘඩිය | උ | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | 51 |
| | ඨී | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 |
| | භ | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |
| 7 කම්ම පච්චය ආහාරජ රූපයන්ගේ වෘඩිය | උ | 0 | 3 | 24 | 45 | 66 | 87 | 108 | 129 | 150 | 171 | 192 | 213 | 234 | 255 | 276 | 297 | 318 | 339 | 357 |
| | ඨී | 0 | 10 | 31 | 52 | 73 | 94 | 115 | 136 | 157 | 178 | 199 | 220 | 241 | 262 | 283 | 304 | 325 | 346 | 357 |
| | භ | 0 | 17 | 38 | 59 | 80 | 101 | 122 | 143 | 164 | 185 | 206 | 227 | 248 | 269 | 290 | 311 | 332 | 353 | 357 |
| 8 චිත්ත පච්චයආහාරජ රූපයන්ගේ වෘඩිය | උ | 0 | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| | ඨී | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 |
| | භ | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 17 |
| 9 ආහාර ඕජාවෙන් ඉපද වියයුතු ආහාරජ රූපයන්ගේ වෘඩිය | උ | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 |
| | ඨී | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |
| | භ | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 | 51 |
| 10 උතු පච්චය ආහාරජ රූපයන්ගේ වෘඩිය | උ | 0 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 |
| | ඨී | 0 | 1 | 4 | 7 | 10 | 13 | 16 | 19 | 22 | 25 | 28 | 31 | 34 | 37 | 40 | 43 | 46 | 49 | 51 |
| | භ | 0 | 2 | 5 | 8 | 11 | 14 | 17 | 20 | 23 | 26 | 29 | 32 | 35 | 38 | 41 | 44 | 47 | 50 | 51 |

කර්මජ රූපකලාප සම්පූර්ණයෙන් හටගැනීම කර්මජ කලාප 157 සම්පූර්ණ වීමේ පටන් ආරම්භ වී චිත්තක්ෂණ 17 සම්පූර්ණ වීමෙන් පසු කර්මජරූප සම්පූර්ණ වේ. එතැන් සිට කලාප 7 ක් බිඳියාමත් කලාප 7 ක් ඇතිවීමත් සිදුවේ. එවිට කර්මජ කලාප සියල්ල 357 මෙසේ මේ කර්මජ කලාප 357 චුති සිතට මුලින් පැවති 17 වන චිත්තක්ෂණය දක්වා ආයු කාලය තුල පවත්නේය. කර්මජ රූපයන් ගේ හානියක් නොවූයේනම් මෙසේ චුති සිතට ප්‍රථම ඇති 17 වන සිත දක්වා පැවත එතැන් පටන් බිඳීම සිදුවේ. මෙහි පෙන්වන්නේ රූපයන්ගේ වැඩීමයි. රූපකලාප 7 සම්පූර්ණ වීමත් අනික් චිත්තජ සෘතුජ රූප ආහාරජ රූප ආදිය හටගැනීමද මෙහි පෙන්වා ඇත.

මෙතැන් සිට 157 සිට චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, යන (දසක) කර්මජ කලාප 4 එකතු වේ.

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භ | භ | භ | භ | භ | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ | භ |
| 1 කර්මජ රූපයන්ගේ වෘඩිය | උත්පාද | 153 | 157 | 169 | 181 | 193 | 205 | 217 | 229 | 241 | 253 | 265 | 277 | 289 | 301 | 313 | 325 | 337 | 349 | 357 |
| | ඨිති | 153 | 161 | 173 | 185 | 197 | 209 | 221 | 233 | 245 | 257 | 269 | 280 | 293 | 305 | 317 | 329 | 341 | 353 | 357 |
| | භංග | 153 | 165 | 177 | 189 | 201 | 213 | 225 | 237 | 249 | 261 | 273 | 285 | 297 | 309 | 321 | 333 | 345 | 357 | 357 |
| 2 චිත්තජ රූපයන්ගේ වෘඩිය | උ | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | ඨි | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භ | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| 3 කම්ම පච්චය උතුජ රූපයන්ගේ වෘඩිය | උ | 153 | 153 | 165 | 177 | 189 | 201 | 213 | 225 | 237 | 249 | 261 | 273 | 285 | 297 | 309 | 321 | 333 | 345 | 357 |
| | ඨි | 153 | 157 | 169 | 181 | 193 | 205 | 217 | 229 | 241 | 253 | 265 | 277 | 289 | 301 | 313 | 325 | 337 | 349 | 357 |
| | භ | 153 | 161 | 173 | 185 | 197 | 209 | 221 | 233 | 245 | 257 | 269 | 281 | 293 | 305 | 317 | 329 | 341 | 353 | 357 |
| 4 චිත්ත පච්චය උතුජ රූපයන් ගේ වෘඩිය | උ | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | ඨි | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| | භ | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 | 17 |
| 5 බාහිර ඍතුජ රූපයන්ගේ වෘඩිය | උ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | භ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | [illegible] | 0 | 0 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 | 39 | 42 | 45 | 48 | 51 |

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පෙන්නුම් කරයි | භ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| 6 ආහාර පච්චය සෘතුජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | භ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| 7 කම්ම පච්චය ආහාරජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 357 | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | 70 | 49 | 28 |
| | ඨි | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 189 | 168 | 147 | 126 | 105 | 84 | 63 | 42 | 21 |
| | භ | 350 | 329 | 308 | 287 | 266 | 245 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | 56 | 35 | 14 |
| 8 චිත්ත පච්චය ආහාරජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | ඨි | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | භ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| 9 බාහිර ඕජාවෙන් උපදනා රූපයන් ගේ හානිය පෙන්නුම් කරයි | උ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | භ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| 10 උතු පච්චය ආහාරජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | භ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |

# මරණාසන්න චිත්ත වීථිය

කර්මජරූපයන්ගේ හානිය (නිරුද්ධවීම) මෙහි පෙන්වන්නේය.
චුතියට පළමු 17 වන සිතේ උත්පාදයේ සිට රූප නිරුද්ධ වීම පෙන්වා තිබේ.

| | කාලය | 17 | 16 | 15 | 14 | 13 | 12 | 11 | 10 | 9 | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | චුති සිත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 කර්මජ රූපයන්ගේ හානිය සිදුවන ආකාරය පෙන්නුම් කරයි | උත්පාද | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 189 | 168 | 147 | 126 | 105 | 84 | 63 | 42 | 21 |
| | ඨිති | 350 | 329 | 308 | 287 | 266 | 245 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | 56 | 35 | 14 |
| | භංග | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | 70 | 49 | 28 | 07 |
| 2 චිත්තජ රූපයන්ගේ හානිය සිදුවන ආකාරය පෙන්නුම් කරයි | උ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | ඨි | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | භ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| 3 කම්ම පච්චය සෘතුජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 357 | 343 | 322 | 301 | 280 | 259 | 238 | 217 | 196 | 175 | 154 | 133 | 112 | 91 | 70 | 49 | 28 |
| | ඨි | 357 | 336 | 315 | 294 | 273 | 252 | 231 | 210 | 189 | 168 | 147 | 126 | 105 | 84 | 63 | 42 | 21 |
| | භ | 350 | 329 | 308 | 287 | 266 | 245 | 224 | 203 | 182 | 161 | 140 | 119 | 98 | 77 | 56 | 35 | 14 |
| 4 චිත්ත පච්චය සෘතුජ රූපයන්ගේ හානිය පෙන්නුම් කරයි | උ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | ඨි | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| | භ | 17 | 17 | 17 | 17 | 17 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 | 16 |
| 5 බාහිර සෘතුජ රූපයන්ගේ හානිය | උ | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |
| | ඨි | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 | 51 |

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# සමුච්චය කාණ්ඩයට අනුව පාලිය

## සත්වන පරිච්ඡේදය

463. ද්වාසත්තතිවිධා වුත්තා වත්ථුධම්මා සලක්ඛණා,
එතෙසං දනි යථායොගං පවක්ඛාමි සමුච්චයං.

464. අකුසල සංගහො මිස්සක සංගහො බොධි පක්ඛිය සංගහො සබ්බ සංගහො චෙති සමුච්චය සංගහො චතුධා වෙදිතබ්බො කථං?

465. අකුසල සංගහෙ තාව චත්තාරො ආසවා කාමාසවො, භවාසවො, දිට්ඨාසවො .අවිජ්ජා සවො.

466. චත්තාරො ඕඝා කාමොඝො, භවොඝො, දිට්ඨොඝො, අවිජ්ජොඝො.

467. චත්තාරො යොගා කාමයොගො, භවයොගො, දිට්ඨී යොගො, අවිජ්ජායොගො,

468. චත්තාරො ගන්ථා අභිජ්ඣා කායගන්ථො, ව්‍යාපාදෙ කායගන්ථො, සීලබ්බතපරාමාෙ සාකායගන්ථො, ඉදං සච්චාභිනිවෙසො කාය ගන්ථො.

469. චත්තාරො උපාදනා කාමුපාදනං, දිට්ඨුපා දනං, සීලබ්බතු පාදනං අත්තවාදුපදනං.

470. ඡනීවරණානි කාමච්ඡන්දනීවරණං, ව්‍යාපාද නීවරණං, ථීනමිද්ධනීවරණං, උද්ධච්චකුක්කුච්ච නිවරණං, විචි කිච්ඡානීවරණං, අවිජ්ජා නීවරණං.

471. සත්තානුසයා කාමරාගානුසයො, භවරාගානුසයො, පටි ඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො. විචිකිච්ඡා නුසයො, අවිජ්ජානුසයො.

472. දසසංයොජනානි, කාමරාගසංයොජනං, රූපරාගසං යො ජනං, අරූපරාගසංයොජනං, අරූපරාගසංයොජනං, පටිඝ සංයෝජනං, මානසංයොජනං, දිට්ඨිසංයොජනං, සීලබ්බත පරාමාසසංයොජනං, විචිකිච්ඡාසංයොජනං, උද්ධච්ච සංයොජනං, අවිජ්ජා සංයොජනං, සුත්තන්තෙ.

473. අපරානි දසසංයොජනානි, කාමරාගසංයොජනං, භවරාග සංයොජනං, පටිඝ සංයොජනං, මාන සංයොජනං, දිට්ඨි සංයොජනං, සීලබ්බතපරාමාස සංයොජනං, විචිකිච්ඡා සංයොජනං, ඉස්සා සංයොජනං, මච්ඡරිය සංයොජනං, අවිජ්ජා සංයොජනං, අභිධම්මෙ.

474. දසකිලෙසා ලොභො, දොසො, මොහො, මානො, දිට්ඨි විචිකිච්ඡා, ථීනං, උද්ධච්චං, අහිරිකං, අනොත්තප්පං.

475. ආසවාදිසු පනෙත්ථ කාමභව නාමෙන තබ්බත්ථුකා තණ්හා අධිප්පෙතා සීලබ්බත පරාමාසො ඉදංසච්චා භිනිවෙසො අත්තවා දෙතිව තථා පවත්තං දිට්ඨිගතමෙව පවුච්චතී ති.

476. ආසවොඝාච යොගා ච තයො ගන්ථා ච වත්ථුතො,
උපාදනා දුවෙ ධම්මා අට්ඨනීවරණාසියුං.

477. ඡළෙවානුසයා හොන්ති නවසංයොජනා මතා,
කිලෙසාදසවුත්තොයං නවධාපාප සංගහො.

478. මිස්සක සංගහෙ ඡහෙතවො ලොභො, දොසො, මොහො, අලොභො, අදොසො, අමොහො.

479. සත්තක්ඛානංගානි විතක්කො, විචාරො, පීති, එකග්ගතා සොමනස්සං, දොමනස්සං, උපෙක්ඛා.

480. ද්වාදසමග්ගංගානි සම්මා දිට්ඨි, සම්මාසංකප්පො, සම්මා වාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මාවායාමො සම්මා සති, සම්මා සමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්පො, මිච්ඡා වායාමො, මිච්ඡාසමාධි.

481. ද්වාවීසතින්ද්‍රියානි චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, මනින්ද්‍රියං, සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොම නස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං, උපෙක්ඛින්ද්‍රියං, සද්ධි න්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රි යං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤ තාවින්ද්‍රියං.

482. නවබලානි සද්ධාබලං, විරියබලං, සති බලං, සමාධිබලං, පඤ්ඤා බලං, හිරිබලං, ඔත්තප්ප බලං, අහිරිකබලං, අනොත්තප්පබලං.

483. චත්තාරො අධිපති ඡන්දධිපති, විරියාධිපති, චිත්තාධිපති, වීමංසාධිපති.

484. චත්තාරො ආහාරාකබලි,කාරො ආහාරො, පස්සො, දුතියො, මනොසඤ්චෙතනා තති යො, විඤ්ඤාණං චතුත්ථං.

485. ඉන්ද්‍රියෙසු පනෙත්ථ සොතාපත්තිමග්ගඤාණං අනඤ්ඤා තඤ්ඤස්සාමීතින්ද්‍රියං, අරහත්ත ඵල ඤාණං අඤ්ඤතා වින්ද්‍රියං මජ්ඣෙ ඡඤාණානි, අඤ්ඤින්ද්‍රියානීති වුච්ච න්ති, ජීවිතින්ද්‍රියං ච රූපාරූපවසෙන දුවිධං හොති ද්වි පඤ්චවිඤ්ඤාණෙසුඣානංගානි අවිරියෙසු බලානි අහෙතු කෙසු ච මග්ගංගානි න ලබ්භන්ති, තථා විචිකිච්ඡා චිත්තෙ එකග්ගතා මග්ගින්ද්‍රිය බල භාවං න ගච්ඡති. ද්විහෙතුක තිහෙතුක ජවනෙස්වෙව යථාසම්භවං අධිපති එකොව ලබ්භතී ති.

486. ඡහෙතු පඤ්චඣානංගා මග්ගංගා නව වත්ථුතො,
සොළසින්ද්‍රිය ධම්මා ඹුව බලධම්මා නවෙරිතා.

487. චත්තාරොධිපති වුත්තා තථාහාරති සත්තධා,
කුසලාධිසමාකිණේණා වුත්තො මිස්සක සඞ්ගහො.

488. බොධිපක්ඛියසංගහෙ චත්තාරො, සතිපට්ඨා නාකායානු පස්සනා සතිපට්ඨානං, වේදනානුපස්සනා සතිපට්ඨානං, චිත්තානුපස්සනා සතිපට්ඨානං.ධම්මානු පස්සනා සති ප්ට්ඨානං.

489. චත්තාරො සම්මප්පධානා උප්පන්නානං පාප කානං පහානාය වායාමො, අනුප්පන්නානං පාපකානං අනුප්පා දය වායාමො, අනුප්පන්නානං කුසලානං, උප්පාදය වායා මො, උප්පන්නානං කුසලානං හීයොභාවාය වායාමො.

490. චත්තාරො ඉද්ධිපාද ඡන්දිද්පාදෙ, චිත්තිද්ධිපාදෙ, විරියි විරියිද්ධිපාදෙ, විමංසිද්ධිපාදෙ.

491. පඤ්චින්ද්‍රියානි, සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං.

492. පඤ්චබලානි සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධි බලං, පඤ්ඤාබලං.

493. සත්තබොජ්ඣංගා සතිසම්බොජ්ඣංගො, ධම්මවිචයස ම්බොජ්ඣංගො, විරියසම්බොඣංගො, පීතිසම්බො ජ්ජංගො, පස්සද්ධිසම්බොජ්ඣංගො, සමාධිසම්බො ජ්ඣංගො, උපෙක්ඛා සම්බොජ්ඣංගො.

494. අට්ඨ මග්ගංගානි, සම්මාදිට්ඨි, සම්මා සඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො. සම්ම සම්මා වායාමො, සම්මා සති, සම්මා සමාධි.

495. එත්ථ පන චත්තාරො සතිපට්ඨානාති සම්මා සති එකාව පවුච්චති තථා චත්තාරො, සම්මප්පධානාතිච සම්මා වායාමො.

496. ඡන්දෙ චිත්ත මුපෙක්ඛා ච සද්ධා පස්සද්ධි පීතියො,
සම්මාදිට්ඨි ච සංකප්පො වායාමො විරතිත්තයං.

497. සම්මාසති සමාධීති චුද්දසෙතෙ සභාවතො,
සත්තතිංස පභෙදෙන සත්තධා තත්ථ සංගහො.

498. සංකප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා
ඡන්දෙ ච චිත්තං විරතිත්තයං ච
නවෙකඨානා විරියං නවට්ඨ.
සති සමාධි චතු පඤ්ච පඤ්ඤා.
සද්ධා දුඨානුත්තමසත්තතිංස
ධම්මාන මෙසො පවරො විභාගො.

499. සබ්බෙ ලොකුත්තරෙ හොන්ති නවා සංකප්පපීතියො,
ලොකියෙපි යථායොගං ඡබ්බිසුද්ධිප්ප වත්තියං.

500. සබ්බසංගහෙ පඤ්චක්ඛන්ධා රූපක්ඛන්ධො රූපක්ඛන්ධෙ වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සංඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො,

501. පඤ්චුපාදනක්ඛන්ධා, රූපූපාදනක්ඛන්ධො, වෙදනූපාදනක්ඛන්ධො, සඤ්ඤූපාදනක්ඛන්ධො, සංඛාරූපාදනක්ඛන්ධො, විඤ්ඤාණූපාදනක්ඛන්ධො.

502. ද්වාදසායතනානි චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, මනායතනං, රූපායතනං, සද්දයතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං, ධම්මායතනං.

503. අට්ඨාරස ධාතුයො චක්ඛුධාතු, සොතධාතු, ඝානධාතු, ජිව්හාධාතු, කායධාතු, රූපධාතු, සද්දධාතු, ගන්ධධාතු, රසධාතු, ඵොට්ඨබ්බ ධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සොත විඤ්ඤාන ධාතු, ඝාන විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණධාතු, මනොධාතු, මනොවිඤ්ඤාණ ධාතු ධම්ම ධාතු.

504. චත්තාරි අරියසච්චානි දුක්ඛංඅරියසච්චං, දුක්ඛසමුදයං, අරියසච්චං, දුක්ඛනිරොධං අරියසච්චං, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං.

505. එත්ථ පන චෙතසිකසුඛුම රූපනිබ්බානවසෙන එකූන සත්තතිධම්මා ධම්මායතනං ධම්මධාතුති ච, සංඛං ගච්ඡන්ති, මනායතන මෙව සත්තවිඤ්ඤාණධාතු වසෙන භිජ්ජති.

506. රූපඤ්ච වෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා,
විඤ්ඤාණමිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා.

507. පඤ්චුපාදනක්ඛන්ධාතිතථාතෙභූමකාමතා,
භෙදභාවෙන නිබ්බානං ඛන්ධසංගහ නිස්සටං.

508. ද්වාරාලම්බන භෙදෙන භවන්තායතනානි ච,
ද්වාරාලම්බන දූප්පන්න පරියායෙන ධාතුයො.

509. දුක්ඛං තෙභූමකං වට්ටං තණ්හා සමුදයො භවෙ,
නිරොධො නාම නිබ්බානං මග්ගො ලොකුත්තරො මතො.

510. මග්ගයුත්තා ඵලා චෙව චතුසච්ච විනිස්සටා,
ඉතිපඤ්චප්පභෙදෙන පවුත්තො සබ්බ සංගහො.

ඉති අභිධම්මත්ථ සංගහෙ සමුච්චය සංගහ විභාගො නාම සත්තමෝ පරිච්ඡෙදෙ

# සමුච්චය කාණ්ඩය අනුව ස්වරූපාර්ත්ථ

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්දස්ස. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි චිත්ත චෛතසිකාදි ධර්මයන් ද රූප ධර්මයන්ද වදරා ඊට අනතුරුව සමුච්චය කාණ්ඩ නමින් පර මාර්ථ ධර්ම දෙසැත්තෑව (72) විස්තර කරනු ලැබේ.

එය කොටස් සතර (4) කින් යුක්ත වේ. අකුසල සංග්‍රහය, මිශ්‍රක සංග්‍රහය, බෝධිපාක්ෂික සංග්‍රහය, සර්ව සංග්‍රහය වශයෙනි. අරමුණු දැනගැනීම් ලක්ෂණයෙන් යුත් සිත් එකක් වශයෙන් ද සිත සමග උපදනා චෛතසික ධර්ම හැපීම්, විඳීම්, හැඳිනීම්, කර්ම රැස්කිරීම් ආදි වශයෙන් චෛතසික ධර්ම ලක්ෂණ වශ යෙන් දෙපනයක් ද, රූප ධර්මයන්ගෙන් ප්‍රධාන වශයෙන් ප්‍රකට ධර්ම වන නිෂ්පන්න රූප අටළොස ද නිර්වාණයද යන පරමාර්ථ ධර්ම රාශියකි.

| | | |
|---|---|---|
| චිත්තපරමාර්ථය | 1 | 72 පරමාර්ථ ධර්ම |
| චෛතසික පරමාර්ථය | 52 | |
| නිෂ්පන්න රූප | 18 | |
| නිර්වාණයයි | 1 | |

මෙහි දැක්වෙන ධර්ම කොටස් සතර (4) අතුරෙන් අකුසල සංග්‍රහය පළමුකොට විස්තර වෙයි. දෙවනුව කුසලා කුසල ධර්ම සියල්ල මිශ්‍රක සංග්‍රහය නමින් ද, තෙවනුව කුසල ධර්ම යන්ගේ උතුම් ධර්ම වන බෝධිපාක්ෂික සංග්‍රහය ද, සිව්වෙනුව සර්ව සංග්‍රහය ,ස්කන්ධ, ආයතන, ධාතු, සත්‍ය ආදීන්ගේ වශයෙන් වදළසේක.

# අකුසල සංග්‍රහය

අකුසල ධර්ම සියල්ල සිත්හි ඇතිවන ආකාර වශයෙන් නව වැදෑරුම් වන්නේය.

| | | | |
|---|---|---|---|
| ආසව ධර්ම | 4 | නිවරණ ධර්ම | 6 |
| ඕඝ ධර්ම | 4 | අනුසය ධර්ම | 7 |
| යෝග ධර්ම | 4 | සූත්‍රාන්තයෙහි සංයෝජන ධර්ම | 10 |
| ග්‍රන්ථ ධර්ම | 4 | අභිධර්මයෙහි සංයෝජන ධර්ම | 10 |
| උපාදාන ධර්ම | 4 | ක්ලේශ ධර්ම | 10 |

චිත්ත සන්තානය අනුව ඉපද සත්වයා දුගතියට පමුණුවන අකුසල ධර්ම යෙදෙන ආකාර වශයෙන් කොටස් 63 ක් වේ. අකුසල සංග්‍රහයෙහි පළමුව වදරන ලද ආසව ධර්මයෝ සතර වැදෑරුම් වේ. කාමාසව, භවාසව, දිට්ඨි ආසවය, අවිජ්ජා ආසවය යන සතරයි. කාමාසව යනු රූප, ශබ්ද, ගන්ධාදී පඤ්ච කාම වස්තු කෙරෙහි උපදනා ලෝභය ක්ලේශ කාමයයි. රූපාදී වස්තු ධර්ම වස්තු කාමයෝ ය. කාම යෝග වශයෙන් ගනු ලබන්නේ ද, රූපාදී පඤ්චකාම වස්තුන්මයි. එය අරමුණු කරන්නේ ක්ලේශකාම නමැති ලෝභයෙනි. භවයන් කෙරෙහි ආසා කරන්නාවූ ලෝභය, භවාසව ,භවඕඝ, භවයෝග නම් ලබන්නා වූ ලෝභයමයි. රූප රාගය නම් වූ රූප භවයන් කෙරෙහි ඇති ආශාවද, අරූපරාගය නමින් අරූපී භවයන් කෙරෙහි පවත්නා බලාපොරොත්තුවෙන් කරන භාවනා ආදිය භවය බලාපොරොත්තුවෙන් කරන ලද බැවින් භවාසවාදිය වන්නේය.

භවය දෙවැදෑරුම් වේ. කම්ම භවය සහ උප්පත්ති භවය යන දෙකයි. රූපාවචර අරූපාවචරාදී කුසල් කම්ම භව නම් වේ. එහි උප්පත්තිය ලැබීම උප්පත්ති භවයයි. එය විපාක නාම ස්කන්ධ භවයයි.

දිට්ඨි ආසව, දිට්ඨිඕඝ, දිට්ඨියෝග, වශයෙන් ගනු ලබන්නේ වරදවා ගනු ලබන මිථ්‍යා දිට්ඨි චෛතසිකයයි.

අවිජ්ජා ආසව, අවිජ්ජාඕඝ, අවිජ්ජා යෝග වශයෙන් ගනු ලබනුයේ සියලු අකුසල ධර්ම සමග ඉපද, අකුසල් සියල්ල සිදු කිරීමට නැතිවම බැරි අකුසල සාධාරණ නමින් පවත්නා මෝහාදී චෛතසිකයයි. මේ මෝහ චෛතසිකය බලවත් ස්වභාවය නිසාම බුද්ධාදී අටතැන උපදනා සැකය මෝහමූල සිතෙහිම උපදනේය.

ආසව යනු පල්වූ දෙයට භාවිතාවන වචනයකි. ප්‍රඥප්තියකි චිත්ත සන්තානය අනුව අනාදිමත් කාලයක් තුල පල්වෙමින් මෙන් නැවත නැවත භවයක් පාසාම ඉපද, සත්වයා අකුසල ධර්මයන් කිරීමට පමුනුවා අපායාදියෙහි උපදවන ධර්මයෝ ය. සදෙරින් ගන්නා ලද රූපාදී අරමුණු කෙරෙහි ආසව, ඕඝ, යෝග, ආදි උපදනා ආකාරයට නම් කීපයක් ලබන ධර්මයන් වන ලෝභ දිට්ඨි මෝහයන්, ආසව ධර්ම වශයෙන් ගනු ලැබේ. භවාංග්‍ර යයි කියන නෙවසඤ්ඤානාසඤ්ඤාභවය දක්වා ද, සිත් වශයෙන් මාර්ග චිත්ත විථියෙහි උපදනා ගොත්‍රභූ සිත දක්වා ද චිත්ත සන්තානය අනුව පවත්නේය.

ඕඝ ධර්ම යනුද සත්වයින්ට සංසාරයෙන් එතෙර වූ නිර්වාණ ධර්මය ලබාගැනීමට අවස්ථාව නොදී සසරටම ගසාගන යන ධර්ම සමූහය නාම ඕඝ, භවඕඝ ආදි නම් වලින් හඳුන්වනු ලැබේ. ලෝභ දිට්ඨි මෝහාදියට හසුවී සිටින සත්වයාට එයින් නිදහසක් ලබාගැනීම ඉතා අසීරු කරුණකි. ගැඹුරු ජලාසයන්හි වතුර යට පවත්නා සැඩදිය සුලි නමින් හඳුන්වනු ලබන දිය වැල් වලට අසුවූ සත්වයාට එයින් බේරීම අමාරු වන්නාක් මෙන් කෙලෙස් දිය සුලිවලට අසුවූ සත්වයා ද සසරටම යොදවන්නේය. සසරටම හෙළා වනසාලන හෙයින් ලෝභාදී ධර්ම තුනටම ඕඝ යයි කියනු ලැබේ.

යෝග ධර්ම නමින් හඳුන්වන්නේ ද මේ අකුසල ධර්ම තුනය. ලෝභ දිට්ඨි මෝහ යන තුනයි. යෝග යනු යොදවා ලන ධර්මයන්ට ව්‍යවහාර වන වචනයකි. රථයෙහි ගොනුන් අශ්වයන් ආදිය යොද නොයෙක් වැඩවලට බර ඇදීම් ආදියෙහි යොදවන්නාක් මෙන් සත්වයින් සංසාරයෙහිම රඳවා යොදවා

තබන සසර දුකින් නිදහස් වීමට ඉඩ නොලබන පරිද්දෙන් සුගති දුගති භවයන්හි යොදවා තබන බැඳතබන ධර්මයෝය. යෝග ධර්ම සතරකි. පරමාර්ථ වශයෙන් ලෝභ දිට්ඨි මෝහ යන අකුසල චෛතසික තුනයි.

## ග්‍රන්ථ ධර්ම 4 කි.

අභිධ්‍යා කායගන්ථය, ව්‍යාපාදකාය ගන්ථය, සීලබ්බත පරාමාසකායගන්ථය, ඉදංසච්චාභිනිවේසකායගන්ථයයි. ගන්ථ ධර්ම 4 කි.

අභිජ්ඣා කායගන්ථය නම් අන්‍යයන් අයත් වස්තුව කෙරෙහි පවත්නා දැඩි ලෝභයයි. කාම රාගාදීන් ද, රූප ශබ්දදීන් කෙරෙහි ද පවත්නා බලවත් ආසාවය. සංසාරයෙන් නිදහස් වීමට නොලැබෙන පරිද්දෙන් සුගති දුගති භවයන්හි ගැට ගසන්නාක් මෙන් ගොතන්නාක් මෙන් කරන ලාටුවක් මෙන් පවත්නා බලවත් තණ්හාවය. කාමරාග, රූපරාග, අරූප රාගාදියයි.

ව්‍යාපාද කායග්‍රන්ථය නම් බලවත් ද්වේශයයි. අන්‍යයන් කෙරෙහි නුරුස්නා ආකාරයෙන් ද ඇති වේ. අනුන් නැසේවා වැනසේවා වශයෙන් ද ඇතිවී, අන්‍ය සත්වයන් විනාශ කරන්නේ ද බලවත් ද්වේශයෙනි. එයට ක්‍රොධයයි කියති. චුති පටි සන්ධි වශයෙන් සතර අපායටම හෙලන ධර්මයෙකි. සතර අපායෙහිම ගැටගසා තබන ධර්මයයි කිය යුතු වේ. යක්ෂ රාක්ෂසාදීන් වශයෙන් උපදින්නේද ව්‍යාපාද යටත ද්වේශය නිසාමය.

සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථය නම් :—වැරදි සිල් වැරදි ව්‍රත ආදීන් ගෙන සත්වයාට සසර දුකින් නිදහස් වීමට නො ලැබෙන පරිදි සසරෙහිම අපාය සංසාරයෙහිම උපදවන ධර්ම යෝය. අජසීල, ගෝසීල, අජව්‍රත ගෝ ව්‍රත ආදිය සංසාර විමුක්තිය සඳහා පිළිපදින බලවත් මිථ්‍යා දිට්ඨියයි.

ඉදං සච්චාභි නිවෙස කායගන්ථය නම්:—තමා යම් වැරදි මතයක් හරිය කියා ගත්තේ නම් එහිම තදින් පිහිටන ස්වභාව යෙන් යුත් මිථ්‍යා දිට්ඨියකි. සත්වයා සහ ලෝකයාත් මවන ලද දෙවියෙක් ඉන්නේ යයිද, ඔහුගේ කැමැත්ත පරිදි සියල්ල සිදුවන්නේ යයි ද, යනාදි වශයෙන් ගත්, තදින් අල්ලාගත් වැරදි දිට්ඨියයි. සතර අපායටම හෙලන සතර අපායෙහිම තදින් බැඳ තබන ධර්මයයි.

ලෝභ ද්වේශ දිට්ඨි යන අකුසල් චෛතසික තුන මෙහි ලැබේ. අභිජ්ඣා යනු බලවත් ලෝභයයි. ව්‍යාපාද යනු ද්වේශයයි. සීලබ්බත පරාමාස හා ඉදං සච්චාභි නිවෙස යන දෙක මිථ්‍යා දිට්ඨියයි.

## උපාදන 4 කි.

කාම උපාදනය, දිට්ඨි උපාදනය, සීලබ්බත උපාදනය, අත්තවාද උපාදනය යන 4 යි.

කාම උපාදනය :—රූප ශබ්ද ආදි කාම වස්තූන් කෙරෙහි තදින් අල්ලා ගෙන උපදනා ක්ලේශකාමය වන දැඩි ලෝභයයි. මෙහි සාමාන්‍ය ලෝභයක් ඇතිවනවාට වඩා බලවත් ලෝභය ඇතිවී අරමුණ ගන්නා අවස්ථාවය. තණ්හා පච්චයා උපාදනං යයි පටිච්ච සමුප්පාදයෙහි පෙන්වා වදලේ ලෝභය තදින්. අත්නොහරින පරිදි අරමුණ තදින් අල්ලා ගන්නා අවස්ථාවයි.

නයෙක්. මැඩියෙක් අල්ලා ගැනිම වැනි අවස්ථාවක් වැන්නේය.

දිට්ඨි උපාදනය :—මිථ්‍යා දිට්ඨි චෛතසිකයම බලවත් සේ ගන්නා අවස්ථාව දිට්ඨි උපාදනය නම් වේ. දෙවියෙක් ලෝකය මවනවාය කියා හෝ, එසේ නැත්නම් කිසිම හේතුවක් ප්‍රත්‍ය යක් නැතුව ඉබේම හටගත්තාය කියා හෝ වරදවා ගත් මිථ්‍යා දිට්ඨියේ බලවත් අවස්ථාවයි. මිථ්‍යාදිට්ඨිය ඇතිවන්නේ ලෝභ යන් සමග බැවින් ලෝභ දිට්ඨි මෝහාදී බලවත් අකුසල ධර්ම යන්ගේ උපකාරය ලැබ බලවත් වන්නේය.

සීලබ්බත උපාදනය :—මෙයද සීලබ්බත පරාමාසය සේ වැරදි සිල් වැරදි ව්‍රත සමාදන් වී ආරක්ෂා කරන්නේ මේ අකුසල ධර්මයන්ගේ බලයෙනි. සත්‍ය අසත්‍යය නොවැටහෙන මුලාව හේතුකොට මේ ධර්මයෝ බලවත් වෙති. පාපමිත්‍ර සේවනාදිය ද මේ වැරදි දිට්ඨි ඇතිවීමට බලවත් උපකාරයකි.

අත්තවාද උපාදනය :—භවයෙන් භවයට මාරුවෙමින් යා හැකි ආත්මයක් සත්වයා තුල පවත්නේ යයි ද, ඒ ආත්මය එක් එක් දෘෂ්ටිගතිකයන් නොයෙක් ආකාරයට පනවා ගන්නේ ය. ඇතැම් අය දෙවියන්ගේ කැමැත්ත පරිදි යන්නේ යයි ද කියා ගනිති. කෙසේ හෝ සත්වයා පිළිබඳ ආත්මයක් ඇත යයි කියා ගත් සක්කාය දිට්ඨිය ආදි වැරදි මතයයි.

මෙහි කාම උපාදනයෙන් ලෝභයද, ඉතිරි උපාදන තුනෙන් දිට්ඨියද, පරමාර්ථ ධර්ම වශයෙන් ගනු ලැබේ.

## නීවරණ 6 කි.

කාමච්ඡන්ද නිවරණය, ව්‍යාපාද නිවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්ච කුක්කුච්ච නිවරණය, විචිකිච්ඡා නිවරණය, අවිජ්ජා නිවරණය යනුයි.

කාමච්ඡන්ද නිවරණය :—නීවරණයෝ නම් සුගති මාර්ගයට පමුණු වන්නා වූ ද, නිවනට පමුණුවන්නා වූ ද, ධර්මයන් ඉපදීමට අවකාශ නොලබන පරිදි සිත ආවරණය කරන වසා තබන්නාක් මෙන් උපදනා අකුසල ධර්මයෝය. පඤ්චකාම වස්තූන් කෙරෙහිම බලවත් සේ ඇතිවන ආසාව කැමැත්ත ආදිය වශයෙන් පවත්නා දැඩි ලෝභයයි. කාම, රාග, කාමච්ඡන්ද ආදි නොයෙක් ආකාරයට උපදනා ලෝභ චෛතසිකයයි.

ව්‍යාපාද නිවරණය :—කුසල් සිතක් ඇතිවීමට ඉඩ නොදෙන ආකාරයෙන් සිත වසාගන්නාක් මෙන් පවත්නා අවස්ථාව නම් වේ. කුසලයට අකමැති ආකාරයෙන් චිත්ත සන්තානය අනුව ඉපද කුසලය එපාකරවන ගතියක් ඇති කරයි. මෙය ද්වේශයේ බලවත් අවස්ථාවකි.

ථීනමිද්ධ නීවරණය :—ථීනමිද්ධ චෛතසික දෙක සුගති මාර්ගය සහ නිවන් මාර්ගය ආවරණය කරන ධර්මයෝ ය. කුසලයට සිත නොපැමිණෙන ස්වභාවයෙන් අලස බවක් මෙන් ඇතිවී සිත් ඉදිරියට නොගොස් පසුබසින ආකාරයෙන් ඇඟ මැලි කඩන ආකාරයෙන් ඇතිවන චිත්ත චෛතසිකයන් අලස බවට පමුණුවන ධර්මයෝ ය.

උද්ධච්ච කුක්කුච්ච නීවරණය :—එකම නිවරණයක් වශයෙන් වදාරන ලද චෛතසික දෙකකි. උද්ධච්චයෙන් නොසන් සුන් බවද, කුක්කුච්චයෙන් කල නොකල කුසල් අකුසල් කෙරෙහි පසුතැවෙන ස්වභාවයෙන් පවත්නා චෛතසික දෙකය. ද්වේශ මූල සිතෙහි ද්වේශයත් සමග උපදින්නේය.

විචිකිච්ඡා නිවරණය :—විචිකිච්ඡා සහගත සිතෙහි උපදනා විචිකිච්ඡා චෛතසිකයයි. බුද්ධාදී අටතැන සැකය ඇතිවීමෙන් කුසල් සිත් උපදවා ගැනීමට නොහැකි වන පරිදි සිත ආවරණය කරන අවස්ථාව නීවරණ අවස්ථාවයි.

අවිජ්ජා නීවරණය :—සෑම අකුසල් සිතකම ඉපද කුසල කිරීමට ඉඩ නොලැබෙන පරිදි උපදනා සිත අඳුරු කරන මෝහ චෛතසිකයම සුගති මාර්ගය වන කුසල් සහ නිර්වාණ මාර්ගයට පමුණුවන කුසල් කරන අවස්ථාව නොලැබෙන පරිදි සිත අඳුරු කරන වසාතබන්නාක් මෙන් උපදනා අවස්ථාව නිවරණ නම් වන්නේය. සෑම නිවරණයක් ඇති වන්නේ මෝහයත් සමග වුවත් මේ අවස්ථාව මෝහයේම එක්තරා බලවත් අවස්ථාවක් වන්නේ ය.

### අනුසය 7 කි.

1. කාමරාගානුසය 2. භවරාගානුසය 3. පටිඝානුසය මානානුසය 5. දිට්ඨානුසය 6. විචිකිච්ඡානුසය 7. අවිජ්ජානුසය යනුයි.

කාමරාගඅනුසය :—අප්‍රහීන වශයෙන් චිත්ත සන්තානය අනුව පවත්නා ක්ලේශ ශක්තිය අනුසය නම් වේ. බීජ ශක්තිය වැනි ස්වභාවයක් ක්ලේශ ධර්මයන් කෙරෙහි පවත්නා බැවින් උපන් ක්ලේශ ධර්ම බිඳී අතුරුදහන් වූ නමුත් එහි නැවත චිත්ත සන්තානය අනුව පවත්නා අනුසය ශක්තිය පවත්නා තාක් කල් නැවතත් රූපාදී ආරම්මන කෙරෙහි ලෝභාදී අකුසල ධර්මයන් උපදනේය. මාර්ග කුසලයෙන් අනුසය ශක්තිය නැති කිරීමෙන් පසු නැවත එම චිත්ත සන්තානය අනුව ලෝභාදී අකුසල ධර්ම නූපදනේය. ගිනි කූරෙහි තිබෙන ගිනි උපදවන ශක්තිය මෙනි. කාමරාගානුසය වශයෙන් උපදනේද ලෝභ චෛතසිකයමැයි. කාම වස්තූන් අරමුණු කොට උපදනා ලෝභ සිත් ඉපදීමට ඉවහල් වූ ලෝභයෙහි පැවති නැවත හටගැනීමට උපකාර වූ ශක්ති විශෙෂයයි.

භවරාගානුසය :—රූපාවචර, අරූපාවචරාදි කුසල් විපාක ආදිය කෙරෙහි පැවති ලෝභයේ අනුශය ශක්තියයි. නැවත නැවතත් මේ සිත් ඉපදවිය හැකිවන්නේ අනුශය ශක්තිය පවත්නා තාක් කල් පමණකි. මාර්ග කුසලයන්ගෙන් අනුශය ශක්තිය නැති කලාට පසු නැවත එම චිත්ත සන්තානය අනුව එම ක්ලේශ නූපදනේය. මහද්ගත කුසලයෙන් ක්ලේශයන් ගේ විෂ්කම්භන ප්‍රහානය ලබාදෙන්නේය. කලකට සමහර කෙලෙස් නූපදනා තත්ත්වයට පමුණුවන්නේ ය.

පටිඝානුසය :—රූපාදි ෂඩාලම්බනයන් කෙරෙහි ද්වේශය හටගන්නේ නැවත නැවත හටගන්නේ පටිඝානුසයයි. කියන ලද ද්වේශ බීජ ශක්තිය ක්ලේශ ශක්තිය පවත්නා තාක් කල් පමණකි. මාර්ග කුසලයෙන් එහි අනුශය ශක්තිය විනාශ කලාට පසු නැවත ද්වේශ සිත් පටිඝානුසය ඇති නොවන්නේ ය.

මානානුසය :—දිට්ඨි විප්පයුත්ත සිත් ඉපදීමේ ශක්තිය ලබාදෙන මාන ක්ලේශ ශක්ති විශෙෂය මානානු සය නම් වන්නේය. අරහත් මාර්ග සිත උපදනා තාක් කල් පවත්නා ඉතා සියුම්වූද, අප්‍රකටව මෙන් පවත්නා මේ ක්ලේශ

ශක්තිය රහත්වන තුරුම චිත්ත සන්තානය අනුව පවත්නේය. මානය නූපදනා එකම උත්තමයාණන් වහන්සේලා බුද්ධ, පසේබුද්ධ රහතන් වහන්සේලාය.

දිට්ඨානුසය :—රූපාදි ෂඩාරම්මණයන් කෙරෙහි වරදවා සිතීම් වශයෙන්ද ශාස්වත උච්ඡේදදී දෙසැටක් මිථ්‍යා අදහස් ඇතිවන්නේද දිට්ඨි අනුසය ක්ලේශ ශක්තිය චිත්ත සන්තානය අනුව අප්‍රකටව පවත්නා බැවිනි. මාර්ග කුසලයෙන් අනුසය ක්ලේශ ශක්තිය නැතිකරන තාක් කල් මිථ්‍යාදිට්ඨි සිත් උපදනේය. සෝවාන් මාර්ගයට පැමිණෙන තුරු පවත්නේය.

විචිකිච්ඡානුසය :— බුද්ධාදි සැකහොකළයුතු වස්තු කෙරෙහි සැක පහළ වන්නේ විචිකිච්ඡා අකුසල බීජ ශක්තිය වැනි ස්වභාවය පවත්නා තාක්කල් විචිකිච්ඡා ආදි අකුසල් උපදනේය. මාර්ග කුසලයෙන් එහි පැවති ක්ලේශ ශක්තිය පහකල කල්හි නැවත එම අකුසල් සිත නූපදනේය. සෝවාන් මාර්ගයෙන් පසු නූපදනේය.

අවිජ්ජා අනුසය :—මෝහ නමැති අකුසලය ඇතිවීමේ උප කාරක ධර්මය අවිජ්ජා අනුසය ශක්තියයි. මාර්ග කුසලයන්නේ සතර වාරයකදී පහකටයුතු ශක්ති විශේෂයකි. අවිජ්ජා අනුසය ධර්මය වන අකුසල ශක්තිය ඉතාම ඝන බහල අකුසල ශක්තිය අවිජ්ජා අනුසය විය යුතුය. සෑම අකුසල ධර්මයකටම බලවත් උපකාරයක් ලබා දෙන නැතිවම බැරි අකුසල ශක්තියයි. මෙහි අකුසල ශක්ති වශයෙන් ලැබෙන්නේ ලෝභ, ද්වේස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා යන අකුසල ශක්ති 6කි.

## සංයෝජන 10

මෙය සූත්‍රාන්ත ක්‍රමයට සංයෝජන ධර්ම 10 යි.

1. කාමරාග සංයෝජනය. 2. රූපරාග සංයෝජනය,
3. අරූපරාග සංයෝජනය, 4. පටිඝ සංයෝජනය,
5. මාන සංයෝජනය, 6. දිට්ඨි සංයෝජනය,
7. සීලබ්බතපරාමාස සංයෝජනය, 8. විචිකිච්ඡා සංයෝජනය,
9. උද්දච්ච සංයෝජනය 10. අවිජ්ජා සංයෝජනය යනුයි.

## අභිධර්ම ක්‍රමයට සංයෝජන 10 යි.

1. කාමරාග සංයෝජනය
2. භවරාග සංයෝජනය
3. පටිඝ සංයෝජනය
4. මාන සංයෝජනය
5. දිට්ඨි සංයෝජනය
6. සීලබ්බත පරාමාස සංයෝජනය
7. විචිකිච්ඡා සංයෝජනය
8. ඉස්සා සංයෝජනය
9. මච්ඡරිය සංයෝජනය
10. අවිජ්ජා සංයෝජනය යනුයි

සූත්‍රාන්ත ක්‍රමයට දස සංයෝජන ධර්මයෝ පරමාර්ථ වශයෙන් චෛතසික ධර්ම 7 ක් වේ. ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි, විචිකිච්ඡා ඉස්සා, මච්ඡරිය යන ධර්ම 7 යි.

අභිධර්ම ක්‍රමයට 8 කි. ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, මෝහ යන චෛතසික 8 කි.

මේ කොටස් දෙක්හිම චෛතසික ධර්ම 9 කි. ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, උද්ධච්ච, මෝහ යන 9 ලැබෙති. මෙහි නොලැබෙන අකුසල චෛතසික 5 කි. ථින, මිද්ධ, අහිරික, අනොත්තප්ප, කුක්කුච්ච යන 5 යි.

කාම රාග සංයෝජනය :—සංයෝජන ධර්මයන් කරන කොට සත්වයන් සංසාරයෙහිම බැඳ තබන්නාක් මෙනි ගවයන් වැනි සත්වයන් බැඳ තැබීමට එහිම රඳවා තැබීමට උපකාර වන යොත් වැනි, දම්වැල් වැනි උපකරණයන්ගෙන් ඇතුන් වැනි සත්වයන් පවා බැඳ තබන්නාක් මෙන් සත්වයන් සංසාරයෙහිම සුගති, දුගති, භවයන්ට බැඳ තබන්නාක් මෙන් එහිම කල්ප සිය දහස් කෝටි ගණන් රඳවා තබන ධර්ම සංග්‍රහය සංයෝජන නම් වේ. කාමරාග සංයෝජනය කාම ලෝක යෙහිම සුගති, දුගති භවයන්ට පමුණුවමින් පවත්නේය.

භව රාග යනු රූප භව, අරූප භව යන දෙකෙහි සත්වයන් බැඳ තබන්නාක් මෙන් මහා කල්ප අසූ හතර දහස දක්වා තබන්නේය. රූප රාග, අරූප රාග යනු ලෝභ මැයි. උඩං

භාගිය සංයෝජන යන් හේතු කොට රූපාරූප භවයන්ට පැමිණේ උද්ධංභාගිය සංයෝජන වශයෙන් රූපරාග, අරූප රාග, මාන උද්ධච්ච, අවිජ්ජා යන සංයෝජන 5 යි. ධර්ම වශයෙන් ලෝභ, මාන, උද්ධච්ච, අවිජ්ජා යන අකුසල චෛතසික ධර්ම 4 යි.

පටිඝ සංයෝජනය :—පටිඝ සංයෝජනයෙන් සත්වයන් පමුණුවන්නේ සතර අපායටයි. වැඩි වශයෙන් නපුරු තිරිසන් ගත සතුන් සහ නිරය, අපාය ට පමුණු වන්නේය.

මාන සංයෝජනය :—මාන සංයෝජන ධර්මයක් වශයෙන් වදරා තිබෙන්නේ උද්ධංභාගිය සංයෝජනයක් වශයෙනි. මාන යෙන් තිරිසන් අපායට අයත් සුනඛ, වානර, ආදි සතුන්ව උපදින බව වදරා තිබේ. තොදෙය්‍ය බ්‍රාහ්මණ වස්සකාර අමාත්‍යයා ආදීන් මානය නිසා තිරිසනුන්ව උපන් බව වදරා තිබේ.

දිට්ඨි සංයෝජනය :—බලවත් මිථ්‍යාදිට්ඨිය, දිට්ඨි සංයෝජනයයි. එය නිරය අපායෙහිම උපදවන බරපතල අකුසලය බව වදරා තිබේ.

සීලබ්බත පරාමාස සංයෝජනය :—විචිකිච්ඡාවය බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය ගැන සැක ඇති තැනැත්තා උපාසක භාවයට වත් නැති මෙලොව පරලොව විශ්වාස නැති සීල, සමාධි ප්‍රඥාවන් ගැන ගරු කිරීමක් විශ්වාසයක් නැති මිථ්‍යාදිට්ඨි ගත් කෙනෙකු වෙයි. එය ඔහුට සතර අපායෙහි ම උත්පත්තියට හේතු වන්නේය.

ඉස්සා මච්ඡරිය සංයෝජනයන්ද, මේ සංයෝජන ධර්ම දෙක සංයෝජන වශයෙන් දෙකක් වුවත් ද්වේශයෙන් පිටස්තර නොවන්නේ ය. ද්වේශය නැතිව තනිව ඉපදීමේ ශක්තියක් නැති බැවින් ද්වේශයට මෙන් විපාක ලැබිය යුතුය.

අවිජ්ජා සංයෝජනය මෝහය අවිජ්ජා නමින් ද දක්වනු ලැබේ. අභිධර්මයෙහි මේ චෛතසික ධර්ම නොයෙක් නම් වලින් වදරා තිබේ. කරන කෘත්‍යයන්ගේ වශයෙන්ද නම්

කීපයකින් පෙන්වන්නේය. අවිජ්ජා සංයෝජනය නොමැති අකුසලයක් නැති බැවින්ද අකුසල මූලයක් බැවින් ද සියලුම අකුසල්වලට සාධාරණව යෙදී තම වැඩ කොටස අකුසලය හරි හැටියට කර්මපථ වීමට සෑම ආකාරයෙන්ම අනුබල දෙන්නේය. සියලුම අකුසල විපාක අවිජ්ජාව නිසා ලැබෙන්නේය.

## ක්ලේශ 10 යි

1. ලෝභය
2. ද්වේශය
3. මෝහය
4. මානය
5. දිට්ඨිය
6. විචිකිච්ඡාව
7. ථීනය
8. උද්ධච්චය
9. අහිරිකය
10. අනෝත්තප්පය යනුයි.

අකුසල චෛතසික සියල්ලම චිත්ත සන්තානය දවන, තවන පෙලන, කිලිටි කරන ධර්ම, වන්නේය. ථිනය ගත් කල්හි ථින මිද්ධ දෙකෙන්ම සිදු කරන මැලිබව චිත්ත සන්තානය අනුව ඇතිවන බැවින් ද ද්වේශ මූල සිතෙහි ද්වේශය ගත් බැවින් ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච තුනද අන්තර්ගත ලදී. ගන්නා වැනිය.

ක්ලේශ, ධර්ම ධර්ම වශයෙන් එක් දහස් පන්සියයක් (1500) ද පෙන්වා වදරන ලද්දේය. සිත ආරම්මණ විජානන ලක්ෂණයෙන් එක් ධර්මයක් වශයෙන් චෛතසික දෙපනස විඳීම් ආදී ලක්ෂණ වශයෙන් වෙන් වෙන් වූ ලක්ෂණයන් ගෙන් යුක්ත බැවින් පනස් දෙකක් වශයෙන් ගෙන නාම ධර්ම සියල්ල තෙ පනසක් ද රූප ධර්මයන් අතුරෙන් නිෂ්පන්න රූප අටලොස හා ලක්ෂණ රූප සතර ද ගෙන මේ සැත්තෑ පහක් වූ ධර්මයන් අධ්‍යාත්ම වශයෙන් හා බාහිර වශයෙන් ද ඇති වන ආකාරයට එකසිය පනසක් වෙති. මේ ධර්ම සමූහය ක්ලේශයන්ගේ වශයෙන් වැඩිවීමෙන් එක් දහස් පන්සියයක් වන්නේය. කෙලෙස් එක් දහස් පන්සියය මෙසේ ද ගණන් ගනු ලැබේ.

අකුසල සංග්‍රහය අවසන්

## මිශ්‍රක සංග්‍රහය

අකුසල සංග්‍රහයට අනතුරුව කුසල් අකුසල් යන කර්ම රැස් වන සිත් කොටස් දෙකටම යෙදෙන ධර්ම මිශ්‍රක සංග්‍රහයෙහි වදළ සේක. එය හේතු ධ්‍යානාංග, මාර්ගාංග, ඉන්ද්‍රිය බල, අධිපති, ආහාර වශයෙන් ධර්ම කොටස් සතක් වේ. පළමුව හේතූන් ගැන දක්වනු ලැබේ.

හේතු ධර්ම හයකි. කුසලා කුසල වශයෙන් සයක් වූ හේතු ධර්ම කුසල් විපාක ක්‍රියා සිත් සමග ද යෙදෙන ආකාරයෙන් හේතු නවයක් වේ. චිත්ත චෛතසික ධර්මයන්ට බලවත් උපකාරක ධර්මය හේතු ධර්මයි. හේතු ස්වභාවය මූල ධර්මයයි හේතූන් වශයෙන් වෙන් කොට පෙන්වන්නේ ද චෛතසික ධර්ම අතුරෙන් ප්‍රධාන ධර්ම සයයයි කිව යුතුය.

ධ්‍යාන ධර්ම නම් ඒකාන්ත වශයෙන් පසක් වන ධ්‍යානාංගයෝ කුසලා කුසල දෙකොටසෙහි යෙදෙන ආකාරයට සතක් වන්නේය. විතක්ක, විචාරය, ප්‍රීතිය, වේදනා, ඒකග්ගතා යන පසයි. වේදනාව යෙදෙන ආකාරය ගෙන තුනක් වශයෙන් ගනු ලැබේ. දොම්නස් වේදනාව අකුසල් සිත්හි පමණක් යෙදේති. අනිත් විතක්කාදි ධ්‍යානාංග යෝ දෙපස් විඥාණ සිත් වල පමණක් නොයෙදෙති. දෙපස් විඥාන සිත් හැර අනික් සිත්වල සුදුසු පරිදි යෙදෙති. ධ්‍යාන සිත්වල ධ්‍යාන කෘත්‍යය විශේෂ වශයෙන් ලැබෙති. එහි ප්‍රධාන වශයෙන් ප්‍රථම ධ්‍යානය ලබා ගැනීම සඳහා විතක්කය යෙදිය යුතුමය. අනික්වා එහි බලයෙන් එහි පුරුදුනාවය නිසා අනික් ධ්‍යාන සිත් උපදවා ගත හැකි වන්නේය.

මාර්ගාංග ධර්ම සාමාන්‍ය වශයෙන් මාර්ගාංග අටක් මාර්ග සිත් වල යෙදෙන්නේය. සියලුම සිත්වල යෙදෙන මාර්ගාංග දොළොසකි. සුගති, දුගති, භවයන්ට සහ නිර්වාණයට ද පමුණු වන්නේය. මාර්ගාංගයන්ගේ බලයෙනි.

මාර්ගාංග දොළස :—සම්මා දිට්ඨිය, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, මිච්ඡා දිට්ඨි, මිච්ඡා සංකප්ප මිච්ඡා වායාම, මිච්ඡා සමාධි, යන දොළසයි. පළමුව දක්වෙන මාර්ගාංගයෝ අට දෙන කුසල අව්‍යාකෘත මාර්ගාංග වෙති. ඉතිරි සතර අකුසල මාර්ගාංග නම් වන්නේය. සම්මා දිට්ඨි ආදී අට හේතු කොට සුගති භවයන්ට උත්පත්ති වශයෙන් පමුණු වන්නේය. එම මාරගාංග අට මාර්ග සත්‍ය වශයෙන් යෙදී නිර්වාන ධාතුව ලබා ගැනීමට මාර්ගකෘත්‍යය සිදු කරන්නේය. මාර්ගාංග දොළස චෛතසික ධර්ම වශයෙන් 9 වෙති. සම්මා දිට්ඨිය, ප්‍රඥාවයි. සම්මා සංකප්ප, මිථ්‍යා සංකප්ප දෙකම විතක්කයයි. සම්මා වායාම මිථ්‍යා වායාම දෙකම විරියයි. සම්මා සමාධි මිථ්‍යා සමාධි දෙකම ඒකග්ගතා චෛතසික යයි.

මාර්ගාංග දොළස පරමාර්ථ ධර්ම වශයෙන් ගත් කල්හි ප්‍රඥා, විතක්ක, විරති චෛතසික තුන සතිය, විරිය, ඒකාග්‍රතාව සහ මිථ්‍යාදෘෂ්ඨිය යන ධර්ම 9 යි. එයින් ඒකාන්ත අකුසල මාර්ගාංගය වන්නේ මිථ්‍යා දිට්ඨියයි. අනික්වා කුසල ධර්ම සහ අඤ්ඤ සමාන චෛතසිකයෝ වෙති.

## ඉන්ද්‍රිය ධර්ම 22

| | |
|---|---|
| 1. චක්ඛුන්ද්‍රිය | 2. සෝතින්ද්‍රිය |
| 3. ඝාණින්ද්‍රිය | 4. ජිව්හින්ද්‍රිය |
| 5. කායින්ද්‍රිය | 6. ඉත්ථින්ද්‍රිය |
| 7. පුරිසින්ද්‍රිය | 8. ජීවිතින්ද්‍රිය |
| 9. මනින්ද්‍රිය | 10. සුඛින්ද්‍රිය |
| 11. දුක්ඛින්ද්‍රිය | 12. සොමනස්සින්ද්‍රිය |
| 13. දොමනස්සින්ද්‍රිය | 14. උපෙක්ඛින්ද්‍රිය |
| 15. සද්ධින්ද්‍රිය | 16. විරියින්ද්‍රිය |
| 17. සතින්ද්‍රිය | 18. සමාධින්ද්‍රිය |
| 19. පඤ්ඤින්ද්‍රිය | 20. අනඤ්ඤාතඤ්ඤස්සාමි තින්ද්‍රිය |
| 21. අඤ්ඤින්ද්‍රිය | 22. අඤ්ඤාතාවින්ද්‍රිය |

ඉන්ද්‍රිය ධර්ම අතුරෙහි චිත්ත චෛතසික රූප ධර්ම සහ ලෝකෝත්තර ධර්ම ද ඇතුලත් වෙති. මනින්ද්‍රිය නම් සිත් කොටසකි. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන තුන මාර්ග සිත් හි යෙදුන ප්‍රඥවයි. අඤ්ඤාතඤ්ඤස්සා මීතින්ද්‍රිය නම් සෝවාන් මාර්ග සිතේ යෙදෙන ප්‍රඥවය. අඤ්ඤින්ද්‍රිය ඊළඟ මාර්ග ඵල සිත් 6 හි යෙදෙන ප්‍රඥවයි. අඤ්ඤාතමින්ද්‍රිය අර්හත් ඵල සිතෙහි යෙදුන ප්‍රඥ චෛතසිකයයි. ප්‍රඥව සතර තැනක යෙදේ. රූප ධර්ම යෝ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන ඉන්ද්‍රිය හෙවත් ප්‍රසාද රූප 5 ද ඉත්ථිභාව රූපය, පුරිසභාව රූපය ද, රූපජීවිතින්ද්‍රි යද යන රූප ධර්ම 8 ය. ජීවිතින්ද්‍රිය යන්නෙහි නාම ජීවිතින්ද්‍රි යද ඇතුලත් වේ. සුඛ, දුක්ඛ, සොමනස්ස, දෙමනස්ස, උපේක්ඛා යන ඉන්ද්‍රිය 5 කි. විරිය ඉන්ද්‍රිය ද විරිය චෛතසිකයයි සද්ධා, සති, ඒකග්ගතා යන චෛතසික තුනද ගනු ලැබේ. මෙසේ ඉන්ද්‍රිය ධර්ම දෙවිස්සෙහි නාම රූප දෙකොටස ම ඇතුලත් වේ.

ඉන්ද්‍රිය ධර්ම වශයෙන් උපදනා ධර්ම තමා හා උපන් අනිත් ධර්ම වන නාම රූප ධර්ම දෙකොටසෙහිම ඉන්ද්‍රිය ධර්මය තමාට අනික් ධර්ම අවනත වන තමා ඊශ්වර භාවයට පත්වන ස්වභාව යක් වන්නේය. ඉන්ද්‍රිය 22 ක පරමාර්ථ ධර්ම 16 කි. එය චක්ඛුප්‍රසාදදිද පසද, භාව රූප 2 ද, ජිවිත රූපයද යන රූප ධර්ම 8 ද නාම ධර්ම වශයෙන් නාම ජීවිතින්ද්‍රියද, චිත්ත, වේදනා, සද්ධා, විරිය, සති, ඒකාග්ගතා, ප්‍රඥ යන 8 ද සමග නාමරූප දෙකොටසම ඉන්ද්‍රිය 22 ක් වේ.

## බලධර්ම 9

1. සද්ධා බලය
2. විරිය බලය
3. සති බලය
4. සමාධි බලය
5. පඤ්ඤා බලය
6. හිරි බලය
7. ඔත්තප්ප බලය
8. අහිරික බලය
9. අනොත්තප්ප බලය

මෙහි කුසල චෛතසික සතක් ද, අකුසල චෛතසික දෙකක් ද ඇතිවේ ය. මේ ධර්ම යෙදෙන සිත් වලින් කරන ක්‍රියා වන්හිදී මේ චෛතසිකයන්ගෙන් ලැබෙන්නේ අනික් චෛතසික යන්ට වඩා උසස් තැනකි. සද්ධා, සති, ආදී ප්‍රඥව හැර ඉතිරි චෛතසික ධර්ම කුසල් සිත්වල සහ කුසල විපාක ක්‍රියා ආදි සිත් වල සැමවිටම යෙදුන නමුත් සැම තැනකම බල වශයෙන් නොයෙදෙයි. උසස් අන්දමින් ගරු කොට කුසල කිරිමෙහි දී ඇතැම් විට මෙයින් එකක් බලධර්ම වශයෙන් යෙදී ඒ ක්‍රියාව උසස් ලෙස කරති.

අකුසල පක්ෂයෙහි ද නිව නින්දිත අකුසල් කලහැකිවන්නේ පවට පිළිකුල් කරන හිරි ඔතප් දෙක නැති අවස්ථාවේදී ඒ වෙනුවට හිරි ඔතප් දෙකට ප්‍රති විරුද්ධ අහිරික අනොත්තප්ප ඇතිවී අකුසලය මිහිරි හොඳ කලයුතු ක්‍රියාවක් සේ සිතා කරන චෛතසික 9 කි. සද්ධා, සති, පඥ, හිරි, ඔතප් යන පහ කුසල, අව්‍යාකෘත වශයෙන් ද, විරිය, ඒකග්ගතා යන චෛතසික දෙකකුසල් අකුසල් අව්‍යාකෘත වශයෙන් ද අහිරික අනොත් තප්ප යන දෙක ඒකාන්ත අකුසලද වන්නෝය.

## අධිපති ධර්ම 4

ඡන්දධිපති, විරියාධිපති, චිත්තාධිපති, විමංසාධිපති යන සතරයි. මෙහි අධිපති භාවයෙන් ලැබෙනුයේ එක් එක් ක්‍රියා වන්හිද තමා හා එකට උපදනා අනිත් ධර්මයන්ට වඩා ඒ අවස්ථා වෙහි ප්‍රධානත්වය උසුලන අනික් ධර්ම තමාගේ යටතෙහි පවත්නා සේ තමා උසස් තැනක් ගෙන ඒ කටයුත්තෙහි යෙදෙති. මෙහි සිත් කොටසක් සහ ඒකාන්ත කුසලාදි සෝභන චෛතසික වශයෙන් ප්‍රඥව ගනු ලැබේ. ප්‍රකීර්නක චෛතසික අතුරෙන් ඡන්ද විරිය දෙක ගනු ලැබේ. එකවිට එක ධර්මයක්ම අධිපති වශයෙන් යෙදෙති. ඉන්ද්‍රිය ධර්මාදියෙහි කීපයක් ධර්ම එකවිට ඉන්ද්‍රිය භාවයෙන් යෙදිය හැකි වන්නේය.

අධිපති භාවයෙන් ද්විහේතුක ත්‍රිහේතුක ජවන් 52 ක සහ ඡන්ද, විරිය, ප්‍රඥ යන චෛතසික තුනද අවස්ථාවට අනුව අධිපති වශයෙන් යෙදෙති.

ඡන්දය :—ඡන්දය යෙදෙන සිත් 69 යෙහි ඒක්‍රියාව කරනු බලවත් කැමැත්ත ඇතිව උපදනේය කුසල ඡන්ද, කාමච්ඡන්ද ආදියයි. අහේතුක 18 ත් මෝහ මූල 2 ත් හැර ඉතිරි සිත් 69 ලැබෙති. බලවත් කැමැත්ත ඡන්දය උපදනා විට එයට කත්තුකම්‍යතා වශයෙන් ඡන්දය බලවත්ව උපදින්නේය.

විරියාධිපති වන්නේ විරිය සම්පයුත්ත සිත් 73 හි අධිපති වද උපදින අවස්ථාවට එසේ උසස් ලෙස ඉපදනේය. සැම විරියක්ම අධිපති නොවේ. බලවත්ව උපදනා අවස්ථාව අධිපති වන්නේය.

ඥාන සම්ප්‍රයුක්ත 47 අතුරෙන් යම්කිසි සිතක් අධිපති බල යෙන් යුක්තව උපදනා කල්හි එහි යෙදෙන ප්‍රඥ චෛතසිකය අධිපති භාවයෙන් අනික් ධර්මයන් තමාගේ වසහයට ගෙන මෙන් උපදී. මෙහි අධිපතිව ලැබෙන පරමාර්ථ ධර්මයෝ නම් ජවන් 52 සහ ඡන්ද, විරිය, ප්‍රඥ යන චෛතසික තුනයි.

## ආහාර 4

කබලිංකාරාහාරය, ඵස්සාහාරය, මනොසංචෙතනාහාරය විඤ්ඤාණාහාරය යන සතරයි. මෙහි කබලිංකාරාහාරය, රූප ආහාරයකි. ඉතිරි ඵස්සාහාරය චෛතසිකයකි. අනික් දෙක සිත් කුසලා කුසල කර්ම චේතනා හා පටිසන්ධි විඥානයෝය.

කබලිංකාරාහාරය නම :—කන බොන ආහාරයනාදීන්ගේ රූප ඉපදවීමට උපකාර වන ඕජාෂ්ටමක රූපයයි. ශරීරයෙහි අනිත් රූප ධර්මයන්ටද උපකාර වෙති. අනික් ආහාර තුනම චිත්ත චෛතසික ධර්මයෝය.

ඵස්සාහාරය නම :—සියලුම සිත් සමග උපදනා ඵස්ස චෛතසිකයයි. ඵස්සාහාරයෙන් සුඛ, දුක්ඛ, උපෙක්ඛා යන ත්‍රිවිධ වේදනාව ලබා දෙන්නේය. අරමුණු රස විඳින වේදනාවට ප්‍රත්‍ය වේ.

මනො සංචේතනාහාරය නම්:—කුසලා කුසල කර්ම චේතනා වෝය. කුසලා කුසල චේතනා වන්ගේ සුගති දුගති භවයන් ලබා දෙන්නේය.

විඤ්ඤාණාහාරය නම් :—ත්‍රිවිධ භවයෙහිම අසඤ්ඤසත්තය හැර කාම, රූප, අරූප භවයන්හි ප්‍රතිසන්ධිය ලබා දෙන ප්‍රතිසන්ධි විඥනයෝය. එය එකට උපදනා ඵස්සාදී නාම ධර්මයන් හා කර්මජ රූපයන්ද පවත්වන්නෝය. මේ ආහාර සතරම පඤ්ච වෝකාර භූමීන්හි ලැබෙන්නේය. චතුවෝකාර නම් වූ නාම ස්කන්ධ සතර පවත්නා අරූප භූමියෙහි නාමාහාර තුන පමණක් ලැබෙන්නේය. ඒක වෝකාර නම් වූ රූපස්කන්ධය පමණක් පවත්නා අසඤ්ඤ තලයෙහි පෙරභවයේ සඤ්ඤා විරාග වශයෙන් වැඩූ පඤ්චමධ්‍යාන කුසල චේතනා බලයෙන් එම භවයේ ලත් රූප ශරීරය පවත්වන්නේය. ඒ භවයේ පවත්නේ රූපය පමණකි.

මෙසේ ආහාර සතර වශයෙන් ලැබෙන ධර්මයෝ නම් ආහාර ඕජාව, සහ ඵස්සය චේතනාව සහ විපාක සිත්ය. මිශ්‍රක සංග්‍රහයෙහි හේතු 6 ක් ද, ධ්‍යානාංග 5 ද මාර්ගාංග අකුසල මාර්ගාංගය වන මිථ්‍යාදිට්ඨිය සමග 9 ක් ද, ඉන්ද්‍රිය 22 ක පර මාර්ථ ධර්ම වශයෙන් 16 ක් ද, බල ධර්ම අකුසල පක්ෂයෙහි බල ධර්ම සමග 9 ක් ද අධිපති 4 ද ආහාර 4 ද යන කොටස් 7 කින් යුක්ත වේ.

මිශ්‍රක සංග්‍රහය අවසන්

## බෝධිපාක්ෂික සංග්‍රහය

බෝධි පාක්ෂික ධර්මයෝ නම් :—යම්කිසි ධර්ම සමූහයක් ධර්ම සාමාග්‍රියක් කරනකොට ගෙන සත්වයෝ නිවනට පැමි ණෙත්ද නිවනට පමුණුවන ඒ ධර්ම සමූහය බෝධි පාක්ෂික නම් වේ.

බෝධි පාක්ෂික ධර්ම 37 කි.

1. සතිපට්ඨාන සතරය
2. සම්මප්පධාන සතරය
3. ඉද්ධිපාද සතරය
4. ඉන්ද්‍රිය ධර්ම පඤ්චය
5. බල ධර්ම පඤ්චය
6. බොජ්ඣංග ධර්ම සතකි
7. මාර්ගාංග ධර්ම අටකි.

මෙසේ බෝධිපාක්ෂික වශයෙන් විදර්ශනා භාවනා උපදනා නිවන කරා ගෙන යන ධර්ම 37 කි. ක්ලේශ නිද්‍රාවෙන් නැගී සිටීමට උපකාර වන ප්‍රබෝධමත් කරවන නොහොත් අරිය සච්ච ධර්මයන් ප්‍රතිවේධ කරවන නිර්වාණ ධර්මය ක්ෂාත් ක්ෂාත් කරවන ධර්ම සාමග්‍රිය. සතිපට්ඨානාදී ධර්ම සමූහය බෝධි පාක්ෂික නම් වන්නෝය.

විදර්ශනා කුසල ජවන් හා සම්ප්‍රයුක්තව උපදනා ලෞකික සතිපට්ඨානා සම්මප්පධානාදී ධර්ම සති විරිය ප්‍රඥා ආදී චෛතසික ධර්ම සතය.

## සති පට්ඨාන සතර

බෝධි නම් ලත් ධර්ම සාමග්‍රිය ගේ වශයෙන් විත්ත සන්තානය අනුව පැවති ධර්ම බෝධි පාක්ෂික ධර්ම නම් වන්නෝය. ක්ලෙස නිද්‍රාවෙන් නැගී සිටිද ප්‍රබෝධ වේද අරිය සත්‍ය ධර්මයන් ප්‍රතිවේධ කෙරේද නිර්වාන ධර්මය ක්ෂාත් ක්ෂාත් කෙරේද ඒ ධර්ම සාමග්‍රිය වූ සතර සතිපට්ඨාන සතර සම්මප්පධානා දී වූද ධ්‍යානාංග මාර්ගාදී 37ක් ධර්ම ස්කන්ධයෝ, බෝධි පාක්ෂික ධර්ම නම් වේ.

අත්තකිලමතානුයෝගාදීන් ද ශාස්වත උච්ඡේදදි දෘෂ්ඨීන් ද පහකොට සති, ධම්ම, විචය, විරිය, පීති, පස්සධි, සමාධි ආදී යම් ධර්ම සමූහයක් කරන කොට ගෙන සත්වයා නිවනට පැමිණේද ඒ ධර්මයෝ බෝධිය ගේ අංග නම් වේ.

පළමුකොට සතිපට්ඨාන ධර්ම විස්තර කරනු ලැබේ. කවර කරුණක් හේතුකොට සතිපට්ඨාන 4 ක් ම වදල සේක. තණ්හා චරිත දිට්ඨි චරිකාදීන්ගේ වශයෙන්ද, සමථ

යානික විපස්සනායානිකාදි වශයෙන් ද වේ. විපල්ලාස ධර්මය යන් ගේ ප්‍රහාණය වශයෙන්ද වේ. සුභ, සුඛ, නිත්‍ය, ආත්ම යන විපල්ලාස වරදවා ගැනීම් වශයෙන් පවත්නා ආකාර 46 දුරුකර ගැනීම පිනිස ද වේ.

වරදවා ගන්නා ආකාර තුනකි. සංඥ, චිත්ත, දිට්ඨි වශ යෙන් ගැනීමෙන් දෙළොස් ආකාරයක් වේ. මාර්ග කුසල යන් ගෙන් විපල්ලාස ධර්ම පහ කරනු ලැබේ.

කායානු පස්සනා වශයෙන් කෙස්, ලොම්, ආදියෙහි පටන් නවසිවථිකය අවසන් කොට පවත්නා තුදුස් ආකාර කායානු පස්සනා සතිපට්ඨානය වැඩීමෙන් රූප කයෙහි පවත්නා අසුභත් වය හා ආයූත්වය ද නුවනින් දැකීමෙන් සුභ සඤ්ඤා විපල්ලාසය දුරුවේ.

වේදනානුපස්සනා වශයෙන් නුවනින් බැලීමෙන් නවාකර වේදනාවන්හි පවත්නා ක්ෂණභංගුරත්වය දැකීමෙන් සුඛ, සඤ්ඤා විපල්ලාසය දුරුවේ.

චිත්තානු පස්සනා වශයෙන් සරාග, සදෙස ආදි වශයෙන් පවත්නා සොළොස් ආකාරය සිත පිළිබඳ විදසුන් නුවනින් දක්නා කල්හි නිත්‍ය වශයෙන් සිත පවත්නේ යයි ගන්නා නිත්‍ය සංඥ විපල්ලාසය දුරු වේ.

ධම්මානු පස්සනා වශයෙන් ස්කන්ධ ආයතනාදි වූ ධර්ම සමූහය අනුව විදසුන් නුවණ මෙහෙයා බැලීමෙන් මේ රූප වේදනා දී ධර්ම සමූහය සත්ව පුද්ගලාදි වශයෙන් නො පවත්නා බවත් එය ධර්ම වෙන්කොට බැලීමේදි කෙසෙල් ක දක් එහි පැවැති පතුරු වෙන්කොට බැලීමෙන් ගතයුතු හරයක්නැතුවාක් මෙන් කිසිම සාරයක් සත්වයෙක්, පුද්ගලයෙක් නැතුවනාම රූප පරම්පරාවම පෙනෙන්නේය. එසේ නුවණින් දක්නා තැනැත් තේ පංචස්කන්ධයත් ආයතන ධර්මයත් වෙන් කොට දක්නා නුවනින් බැලීමෙන් සත්ව සඤ්ඤාව දුරුවන්නේය. ධම්මානු පස්සනාව වැඩි දියුණු වීමෙන් ආත්ම සඤ්ඤා විපල්ලාසය දුරු වේ. මෙසේ සතිපට්ඨාන 4 වැඩීමෙහි ප්‍රධාන වශයෙන් පවත්නේ සම්මා සති මාර්ගාංගය දියුණු වීමයි. සති චෛතසිකයයි.

සියලුම සූපයන්ට ලුණු මෙන් සෑම ධර්මයක් දියුනු කිරීමට සතිය උවමනා වේ. ප්‍රඥාව සමග සහ ප්‍රඥාවෙන් තොර වද සතිය ඇති වේ. ප්‍රඥාව සමග යෙදුන සතිය බෝධි පාක්ෂික ධර්ම දියුණු කරන්නේය.

## සම්මප්පධාන 4

සම්මප්පධාන යනු විදර්ශනා නුවන සමග යෙදුන බලවත් වීර්‍ය්‍යයයි. ඒ විරිය බෝධිපාක්ෂික ධර්ම වශයෙන් ඇතිවීමේදී මේ අවස්ථා සතර වශයෙන් පෙන්වන්නේය. උපන් අකුසල් පහ කිරීම සඳහා නැවත නූපදවා ගැනීම් වශයෙන් පහකිරීම ද මේ භවයේ හෝ තවම චිත්ත සන්තානය අනුව නූපන් අකුසල් නො ඉපදීම පිණිස චිත්තසන්තානය ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා උත්සාහයයි. කුන්වෙනුව තවම චිත්තසන්තානය අනුව නූපන්නාවූ සමථ විදර්ශනා ආදි මාර්ග කුසල් ලබා ගැනීම කරන උත්සාහයයි. සතර වෙනුව උපන් කුසල් කරගෙන යන දාන, සීල, භාවනා ආදි පුරුදු කරගත එන ලද කුසල් අඩුපාඩු වීමට ඉඩ නොලැබෙන පරිදි නැවත නැවත දියුණු කරගන්නා උත්සාහයයි. නුවන සමග ගිය වීර්‍ය්‍යයම බෝධි පාක්ෂික ධර්ම වන්නේය. නිවන් ලැබීමට උපකාර වන්නේය. යම්තාක් කල් මාගේ සිත ක්ලේශයන් ගෙන් ආශ්‍රවාදී ධර්මයන් ගෙන් නොමිදේ ද ඒ තාක් කල් මේ වාඩි වූ පර්‍ය්‍යංකය වෙනස් නොකරන්නෙමි යයි බලවත් සේ තබන ලද කාය ජීවිත අපේක්ෂා නොකොට තබන ලද බලවත් වීර්‍ය්‍යය බෝධිපාක්ෂික ධර්ම වශයෙන් පවත්නා බලවත් වීර්‍ය්‍යයයි. මාර්ග භාවනා වශයෙන් නැති වීර්‍ය්‍යය ලෞකිකයි. මාර්ග අවස්ථා වෙහි උපදනා වීර්‍ය්‍යය ආදිය ලෝකෝත්තර යයි. බලවත් ලෞකික වීර්‍ය්‍යය ලෝකෝත්තර වීර්‍ය්‍යය ලබා ගැනීමට උපකාර වෙති. මෙහි නාමය සතරක් ඇතත් ඒ එකම විරිය චෛතසිකය වන්නේය.

## ඍද්ධි පාද 4

බෝධි පාක්ෂික ධර්ම අතුරෙන් ඍද්ධිපාද ධර්මයන් ගණන් ගනු ලබනුයේ බුද්ධ ශාසනයකදී ලැබිය යුතු ශාසන ඍද්ධියයි.

එය සතර වැදෑරුම් වේ. ඡන්ද විරිය, චිත්ත, විමංසා යන ඍද්ධි පාද සතරකි. එය පරිඥන ඍද්ධිය, ප්‍රහාන ඍද්ධිය ක්ෂාත් ක්ෂාත් ඍද්ධිය, භාවනා ඍද්ධිය යන සතර කාරයයි.

පරිඥ ඍද්ධිය නම් :—දත යුතු ධර්මයන් පිරිසිඳ දැන ගැනීම අවබෝධ කිරීම ආදී වූ දුක්ඛ, සත්‍යය තත්වාකාරයෙන් දැන ගැනීම පරිඥ ඍද්ධියයි. පහාන ඍද්ධි නම් පහ කල යුතු සමුදය සත්‍යය සහිත ක්ලේශ ධර්ම පහ කරන ඍද්ධියයි. ක්ෂාත් ක්ෂාත් ඍද්ධිය නම ප්‍රත්‍යක්ෂයෙන් දත යුතු නිරෝධ සත්‍ය අවබෝධ විමය.

භාවනා ඍද්ධි නම් :—නිරෝධ සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා වැඩිය යුතු මාර්ග සත්‍යය සංඛ්‍යාත විදර්ශනා භාවනාවයි. මෙහි දක්වන ලද්දේ ලෝකෝත්තර ධර්මයන්ට ඇතුලත් ඍධි සතරයි.

ඇතැම් අය මාර්ග ඵල ලාභිවූයේ නම් අහසින් යාමම බලාපොරොත්තු වෙති. අහසින් යාම, පොළොව කිමිදීම, නොයෙක් රූප මවා පෙන්වීම ආදී ආශ්චර්‍ය්‍ය සිද්ධීන් ද මාර්ගඵල ලාභී වීමෙන් බලාපොරොත්තු වේ. මාර්ගඵලාධිගමය අනිකකි. ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය පෑම අනිකකි. මේ කරුණු දෙක එකක් නොවේ. ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය සමථ භාවනා බලයෙන් ලත් අභිඥවේ බලයෙන් කරති. මාර්ගඵල නොලත් අභිඥලාභීන්ද එවැනි ආශ්චර්‍ය්‍ය දේවල් කරති. මෙහි අධිපති භාවයට පත් ඍද්ධිපාද ධර්ම ගණන් ගනු ලැබේ.

## ඉන්ද්‍රිය ධර්ම 5

සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤි න්ද්‍රිය යන පහයි. ඉන්ද්‍රිය ධර්මයෝ නම් එක් ඉන්ද්‍රිය ධර්මයක් උපදනා කල්හි අන්‍ය ධර්මයක ඉන්ද්‍රිය භාවය හෙවත් ඊශ්වරත් වය නො වලක්වා තමාගේ ඊශ්වරත්වයෙහි පිහිටයි. විරුද්ධ ධර්මයන් හෝ නො වළක්වා කම්පා නොවී තමාගේ ඉසුරු බව පවත්වයි.

සද්ධින්ද්‍රියයෙන් සෝතාපත්ති අංග සතර දැඩි සේ විශ්වාස කොට අන්‍ය ධර්මයන් ගෙන් නොවළක්වා තමාගේ ඝාතාංශය සිතට දැඩිසේ ගන්වන ස්වභාවයයි.

විරියින්ද්‍රිය සතර සම්‍යග් ප්‍රධාන වශයෙන් උපදනා විරිය ථිනමිද්ධ ආදීන්ගෙන් දුර්වල කල නොහැකි පරිදි තමාගේ වැඩ කොටස උසස් අන්දමින් සිදුකරන අවස්ථාවයි. සෝවාන් මාර්ග සිතෙහි පැවත වීයඹිය විරියින්ද්‍රිය වශයෙන් මෙහිදී ගණන් ගනු ලැබේ.

සතින්ද්‍රිය සතර සතිපට්ඨානාදී ධර්මයන්හි උසස් අන්දමින් පවත්නා සති චෛතසිකයයි. අන්‍ය ධර්මයන්ගෙන් දුර්වල කල නොහැකි පරිදි තමාගේ වැඩ කොටස ඉතා උතුම් ලෙස ඉටු කරන අවස්ථාව ඉන්ද්‍රිය වශයෙන් පැවති අවස්ථාවයි.

සමාධින්ද්‍රිය සෝතාපත්ති මාර්ගාදීන්හී උපදනා සිතේ බල වත් එකඟ බව ඇති කරන ඒකාග්ගතා චෛතසිකයයි. ඒ අවස්ථාවට ධ්‍යාන වශයෙන් ප්‍රථම ධ්‍යානාදියක් නොලැබුනේ වී නමුත් ප්‍රථම ධ්‍යාන චිත්ත සමාධිය වැනි සමාධි තත්ත්වයක් සිත්ට ලබා දෙන්නේය.

පඤ්ඤින්ද්‍රිය චතුස්සත්‍ය ධර්මයන් අවබෝධ වන පරිදි සිතට නාම රූපාදී ධර්මයන්හි පවත්නා අස්ථිර වූ දුක් වූ අනාත්ම වූ ස්වභාවයන් දැඩිසේ ගන්වන උසස් තත්ත්වයට පැමිණි නුවණ පඤ්ඤින්ද්‍රිය නම් වේ. අවිද්‍යා අන්ධකාරයට ප්‍රතිවිරුද්ධව සිතට යථා තත්ත්වය දන්නා පරිදි උපදනා නුවණයි.

බලධර්ම 5

සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ධර්ම පහ ඉතා බලවත්ව උපදනා අවස්ථාවයි.

සද්ධා බලය, සෝතාපත්ති මාර්ගාවස්ථාවෙහි දී ඉතා උසස් අන්දමින් උපදනා සද්ධාවයි. සෝතාපත්ති අංගයෝ නම් සත් පුරුෂ සේවනය සද්ධර්මශ්‍රවනය, යෝනිසො මනසිකාරය

ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන සතරයි. රත්නත්‍රය කෙරෙහි පවත්නා අන්‍යධර්මයන්ගෙන් කම්පා කල නොහැකි දුර්වල කල නොහැකි නොසෙල්වෙන සද්ධාවය අචලශ්‍රද්ධාවය කියන්නේ එවැනි සද්ධාවටය.

විරිය බලය සතර සම්‍යග්ප්‍රධානයන්හි පැවති බලවත් වියර්‍යයයි. සිත ඔසවා තබන්නාක් මෙන් අනුබල දෙන වීර්‍ය චෛතසිකයයි.

සති බලය සතිපට්ඨාන සතර වශයෙන් ඉපද නාම රූප ධර්මයන්හි පැවති යථා තත්ත්වය සිතට මතුකර දෙන හිත මිත්‍රයෙකු සේ පවත්නා පෙරටුව ගමන් කරන්නාක් මෙන් පැවති ධර්මයයි.

සමාධි බලය ප්‍රථම ධ්‍යාන සමාධිය මෙන් සිත තැන්පත් කරන අරමුනෙහි සිත මනාව පවත්වන එකග්ගතා චෛත සිකයයි.

පඤ්ඤාබලය චතුරාර්‍ය සත්‍ය ධර්ම අවබෝධ කිරීමට සුදුසු ප්‍රඥාවයි. ප්‍රධාන වශයෙන් ගන්නා අවිද්‍යාදී ඝණ අඳුර දුරුකොට සිතට සත්‍යාව බෝධය ලබාදෙන නිර්වාණ ධාතුව අවබෝධ කර ගැනීමට නොහැකිව පැවති ක්ලේශ ධර්ම සියල්ල පහ කොට සිත ආලෝකමත් කරන කෙලෙස් කපා හරින කඩුව කට සමාන කොට වදරන ලද ධර්මයයි. ප්‍රඥාවේ බලයයි. ඉන්ද්‍රිය බල යන දෙතැන්හිම ලැබෙනුයේ, සද්ධා විරිය, සති එකග්ගතා ප්‍රඥ යන චෛතසික පසය.

විරිය සම්බොජ්ඣංගය :—සතර සම්‍යක් ප්‍රධානයන්ගේ වශයෙන් බලවත් උත්සාහය විරිය සම්බොජ්ඣංග යයි. ධම්ම විචය නම් වන ප්‍රඥාවට අනුබල දෙන විරියයි. භාවනා අරමුනෙහි වැඩීමෙන් දියුණුවට පත් වියර්‍යය කුසීත කම්මැලිකම් දුරු කොට සිත ඔසවා තබන උනන්දු කරවන කුසල සිත වැඩි දියුණු කරන ධර්මය විරියයි. වියර්‍ය පක්ෂය දියුණුකොට මාර්ග ඥානයන් ලබා දෙන සම්බෝධිය උපදවන ධර්මයෙහි විරිය සම්බොජ්ඣංගය බොජ්ඣංගාදී ධර්ම ලබා ගැනීමට

බලවත් උපකාරයක් ලැබෙන ධර්මයකි. අපාය භය නුවණින් සලකා බැලීම සියලුම ගුණ ධර්ම දියුණු කර ගැනීමට ද අපාය, භය මෙනෙහි කිරීම බලවත් උපකාරයක් වන්නේ ය.

පිතිසම්බොජ්ඣංගය :—කුසල් අරමුණෙහි සිත පිනාවන සතුටු කරවන ධර්මය ප්‍රීතියයි. එය ඇති කරගැනීමට බුද්ධානුස්සති ආදිය වැඩිය යුතු වේ. කාමාමිස, ලෝකාමිසාදී වෘත්තාමිසයන් ගේ අවිද්‍යා මාන බැවින් ආමිසයන්ගෙන් මිදුනෝ ආමිස රහිත වූයේ කුසල ධර්ම විශේෂයෙන් භාවනා කුසල ධර්ම වැඩීමෙහි ක්ලේශ ධර්මයන් කෙරෙන් විනිර්මුක්ත වූ පිරිසිදු ප්‍රීතිය ප්‍රීති සම්බොජ්ඣංගය නම් වේ. අකුසල ධර්ම ගැන සිතාද ප්‍රීතිය ඇති කරගත හැකිය. එය පාපයකි. අපායගාමී මාර්ග යයි. එය පහකල යුතු වන්නේය.

පස්සද්ධි සම්බොජ්ඣංගය :—චිත්ත චෛතසික ධර්මයන් කෙරෙහි කෙලෙස් දැවිලි සන්සිඳුවන ධර්මයයි. එය කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි වශයෙන් සිතෙහි සහ චෛතසික ධර්ම යන්හි දහය දුරුකොට ශාන්ත සීතල ස්වභාවයට පමුණුවන්නා වූ ධර්ම ස්වභාවයයි. චිත්ත චෛතසික දෙකොටසෙහිම සැනසීම ඇතිකරන සන්සිඳීම් ලක්ෂණයෙන් යුක්ත ධර්ම ස්වභාවය පස්සධිසම්බොජ්ඣංගයයි. මෙය චෛතසික ධර්ම දෙකකි. කාය පස්සද්ධි, චිත්ත පස්සද්ධි යන චෛතසික දෙකයි. විදර්ශනා නුවන සමග යෙදුන නිර්වානාවබෝධය ලබාදෙන පස්සධිය මෙහි ගනු ලැබේ.

සමාධි සම්බොජ්ඣංගය :—විදර්ශනා භාවනා වඩන කුසල් සිතෙහි පවත්නා චිත්ත චෛතසික ධර්මයන්ගේ ඒකභතාව නිසලව අරමුනෙහි තබන ලද බව මනාව අරමුණෙහි පිහිටුවන ස්වභාවය සමාධි සම්බොජ්ඣංග යයි. උද්ධච්චයෙන් සිත නොසන්සුන්වීමට අවකාශ නොලැබෙන පරිදි භාවනා අරමුණෙහිම නැවත, නැවත සිත පිහිටුවන ඒකාග්‍රතා චෛතසික ය. සමාධි සම්බොජ්ඣංග යයි.

උපෙක්ඛා සම්බොජ්ඣංගය :—භාවනා වඩන කුසල් සිතෙහි මනාව පවත්වන ථීන මිද්ධ උද්ධච්ච ආදියට ප්‍රතිවිරුද්ධ මැදහත් භාවයෙන් යුත් ධර්මයයි. තත්‍රමජ්ඣත්තතා චෛතසික යයි. සත්සුත් නාම කාය ඇති බැවින් යුත් පුද්ගලයාගේ නිසලව අරමුණෙහි තබන ලද සිත ඇති බව උපෙක්ඛා නම් වේ. අවිණා වට පැමිණියන්හු සේ අරමුණෙහි මනාව පිහිටුවන සිතයි. මාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධිය ලබා දෙන උපෙක්ඛා සම්බොජ්ඣංග යයි.

## මාර්ගාංග 8.

1. සම්මා දිට්ඨිය
2. සම්මා සංකප්පය
3. සම්මා වාචාය
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීවය
6. සම්මා වායාමය
7. සම්මා සතිය
8. සම්මා සමාධිය

මාර්ගාංග නම් නිවනට පමුණුවන නිවන කරා ගෙන යන ධර්ම අටය. එය සම්මා දිට්ඨි ආදි වශයෙන් කොටස් 8 කින් යුක්ත වේ.

මේ ධර්ම අට දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්‍ය්‍ය සත්‍ය යයි ද වේ. එහි පළමුව සම්මා දිට්ඨි යනුවෙන් දක්වා තිබෙනුයේ ලෝභය ආදි අකුසල් ධර්ම පහ කරන ප්‍රඥාවයි. අනික් ධර්ම සතක් ද උපකාරය ලැබ අනාදිමත් කාලයක් තුල පැවත ගෙන එන ලද සියළුම අකුසල ධර්ම පමණක් නොව කුසලාදිය ද සම්පූර්ණයෙන් නූපදනා තත්ත්වයට චිත්ත සන්තානය පමුණු වන්නේ ප්‍රඥාවේ බලයෙනි.

කාමාවචර කුසල් සිතෙහි ද මේ ධර්ම වෙන වෙනම උපදින නමුත් ඒ අවස්ථාව මාර්ගාංග නොවේ. මාර්ගාංග වනුයේ මේ ධර්ම අටම එකට එකවර ඉපද පළමුව කෙලෙස් ධර්මයන් ගෙන් කොටසක් කපා හරින සෝවාන් මාර්ග සිතෙහි ය. එසේ අවස්ථා සතරක දී කෙලෙස් සියල්ල කපා හරින්නේ ය. නැවත නූපදනා ආකාරයෙන්ම පහ කරනු ලැබේ.

සම්මා දිට්ඨිය නම් :—හරි දැකීමය. තමන් කරන හොඳ නරක ආදී ක්‍රියා රාශිය පින්පව් ආදී වශයෙන් කොටස් දෙකක් වේ. එසේ පින් පව් කියා දෙයක් ගැන විශ්වාසය නැති බව සම්මා දිට්ඨියට ප්‍රතිවිරුද්ධ මිථ්‍යාදිට්ඨියයි. පින් පව් ඇත මෙලොවක් ඇත. පරලොවක් ඇත. ආදී වශයෙන් විශ්වාස කරන දස වස්තුක සම්මා දිට්ඨියක් ද තිබේ. ඊට වඩා උසස් සම්මා දිට්ඨිය වනුයේ චතුරාර්‍ය්‍ය සත්‍ය පිළිබඳ ඇති වන සම්මා දිට්ඨිය යි.

කර්ම, කර්මඵල විශ්වාස කරන අයතුලද දස වස්තුක සම්මා දිට්ඨිය ඇති වේ. දස වස්තුක සම්මා දිට්ඨිය පළමුව ඇති කර නො ගෙන චතුසත්‍ය සම්මා දිට්ඨිය ඇති කර ගත නො හැක. තෙරුවන් සරණ යාමේ සිට දස වස්තුක සම්මා දිට්ඨිය ඇති වේ. එහි පිහිටා දනාදි වූ ද සීල භාවනා ආදී උසස් පින්කම් වල යෙදී මෙන් චතුසත්‍ය සම්මා දිට්ඨියෙහි පිහිට විය යුතු වේ. සතර අපායෙන් මිදී සුගතියක ඉපදීමටද සම්මා දිට්ඨියෙහි පිහිටිය යුතුය. නිර්වාණාවබෝධය ලබනුයේද සම්මා දිට්ඨියේ උපකාර යෙනි.

සම්මා සංකප්පය :—යහපත් පිරිසිදු කල්පනාවය. එය තෙවැදැරුම් වේ. නෙක්ඛම්ම සංකප්ප, අව්‍යාපාද සංකප්ප අවිහිංසා සංකප්ප යන තුනයි. ධර්ම වශයෙන් විතක්ක චෛත සිකයයි. සම්මා දිට්ඨියට අරමුණ ලංකර දෙන ධර්මය සම්මා සංකප්පයයි. ප්‍රඥාවට උපකාරක ධර්මය විතක්ක යයි. විතක්ක යේ බලයෙන් නැවත නැවතත් භාවනා අරමුණ ගෙන දෙන්නේය. මතක්කර දෙන්නේය. එයයි උපකාරය.

විතක්කයේ උපකාරය නොලැබ අරමුණ ගැනීම භාවනා බලය නිසා ඒ උපකාරයෙන් ධ්‍යාන සිත් වලදී සිදු වෙති. චක්ඛු විඤ්ඤාණාදියෙහි දී අරමුණ ගැටීම නිසා ප්‍රසාද ආරම්මන ගැටීම නිසා සිත් ඇතිවීම සිදුවෙති. මාර්ගාංග වශයෙන් යෙදෙන විට එය සම්මා සංකප්ප නමින් ඇතිවේ. අකුසල ධර්ම සමග උපදනා විට මිථ්‍යා සංකප්ප වශයෙන් අපායගාමී මාර්ගයෙදී ඇති වේ. විතක්ක චෛතසිකය වශයෙන් අකුසල් සිතෙහි ද ඇති වේ. මෙහි පෙන්වන්නේ නිවනට පමුණුවන මාර්ගාංග යක් වශයෙනි.

මෛත්‍රී සහගත සිත්හි උපදනා සංකප්පය අව්‍යාපාද සංකප්ප යයි. දුකට පත් සත්වයන්ට පිහිටවීම් ආදි වශයෙන් අවිහිංසා සංකප්පය ඇතිවේ. එකම විතක්ක චෛතසිකය මෙසේ නොයෙක් ආකාරයට කුසලා කුසල සිත්හිද මාර්ග අවස්ථාවෙහි මාර්ගාංගයක්ව ද ඇති වන්නේය.

සම්මා වාචා :—යහපත් නිවැරදි වචන කථා කිරීම, සම්මා 'වාචා නම් වේ. එය සතරාකාර වේ. කේලාම් කීමෙන් වැළකීම පරුෂ වචනයෙන් වැළකීම, හිස් වචන කතා කිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, යන ආකාර සතරක් වේ.

සම්මා වාචා යනු විරති චෛතසිකයයි. එය ඇති වන අවස්ථා වශයෙන් මුසාවාද, පිසුනාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප් පලාපා වශයෙන් වචනයෙන් කෙරෙන අකුසල් සතරෙහි වශයෙන් සතරාකාර වේ. මෙය නොකර හැරීමෙන් වළක්නා ආකාර යෙන් ඇති වේ. සම්‍යග් වචන කථා කිරීම් වශයෙන් බොහෝ පින් සිදු කර ගත හැක. ධර්ම දේශනා ආදියෙන්.

මෙසේ සම්‍යග් වාචා පුරුදු කිරීමෙන් දුසිරිතෙන් වැළකීමෙ පුරුද්ද හේතු කොට එය දියුණු වීමෙන් මාර්ගාවස්ථාවෙහි මාර්ගාංගයක්ව මාර්ග සිතෙහි සම්මා දිට්ඨි ආදිය සමග එකවර ඉපිද නිර්වානාවබෝධය ද ලබන්නේය.

සම්මා කම්මන්තය :—යහපත් පිරිසිදු කර්මාන්තයෝ ය. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, යන කාය කර්ම අකුසල් තුනෙන් වැළකීමය. කාය කර්ම අකුසල් තුනෙන් වැළකීම සම්මා කම්මන්තයයි. චෛතසික වශයෙන් සම්මා කම්මන්ත විරතියයි. ඒ ඒ අකුසලයන් ගෙන් වැළකීම් වශයෙන් පුරුදු කිරීම, ලෞකික කුසලයන්ගේ වශයෙන් දියුණු කිරීමෙන් කාමාවචර කුසල් සිතෙහි මේ අකුසල් තුනෙන් වැළකීම සිදු වේ. ධ්‍යාන සිත්වල මේ විරති චෛතසික නොයෙදෙති. විරතීන් ගේ වශයෙන් අකුසලයෙන් වැළකීමක්, සමථ භාවනා වෙන් සිදු නොවේ. පිරිසිදු සීලයෙහි පිහිටා කරන භාවනාවක් බැවින් සැම භාවනාවක්ම පිරිසිදු සීලයෙහි පිහිටා කළ යුතු වේ. ධ්‍යාන සිත්හි විරති නොයෙදෙති. කාමාවචර කුසල් සිත්හි යෙදී දියුණු කොට මාර්ග අවස්ථාවෙහි මාර්ගාංගයක් වශයෙන් එක වර එකටම යෙදී නිවන අරමුණු කරන්නෝය.

සම්මා ආජීවය :—පිරිසිදු දිවි පැවැත්මයි. ජීවිකාව සඳහා වත් මේ කියන ලද වාග් කර්ම වන අකුසල් සතරෙන් ද කාය කර්ම වන අකුසල් තුනෙන් ද වැළකී පිරිසිදු ලෙස ජීවිකාව ගෙනයාම සම්මා ආජීව විරති යයි. මේ කාය කර්ම අකුසල් තුනෙන් වාග් කර්ම අකුසල් හතරක් සමහර අය විනෝදය පිනිසද කරති. ඇතැමෙක් ක්‍රෝධය නිසාද පළිගැනීම සඳහාද කරනු ලැබේ. කෙසේ කලත් අකුසලය සිදු වේ. ජීවිකාව පිනිස මෙ අකුසල් නො කර හැරීම සම්මා ආජීව විරතියයි. මාර්ග අවස්ථාවෙහි මාර්ග සිතෙහි මේ තුනම මාර්ග සත්‍ය වශයෙන් මාර්ගාංගයක්ව උපදනේය. ලෞකික කාමාවචර කුසල් සිත්වල තුනම එකට නූපදනේය. එකක් හෝ දෙකක් උපදිති. ලෝකෝත්තර සිත්වල මාර්ගාංග යක් වශයෙන් උපදින්නේය.

සම්මා වායාම :—යහපත් පිරිසිදු වීර්‍ය්‍යයයි. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය වශයෙන් සතරාකාර වේ. තමා විසින් එම ජාති යේදී නොකළ අකුසල් ඇතිවීමට ඉඩ නො තබා ආරක්ෂා වීමද, කෙරුනාවූ උපන්නාවූ අකුසල් පහකිරීමට නැවත නූපදවා ගැනීමටද නො උපන්නාවූ කුසල් උපදවා ගැනීමට කරන උත්සාහය ද, උපන් කුසල් කරගනයන කුසල් වැඩිදියුණු කර ගැනීමට කරන උත්සාහය ද විරියද භාවනා ආදි කුසල් වැඩි දියුනු කර ගැනීම් ආදී අවස්ථා සතරක වශයෙන් උපදනා වීර්‍ය්‍ය චෛතසිකයයි. මෙසේ ලෞකික කුසල් වශයෙන් උප දනා වීර්‍ය්‍යය.වැඩි දියුණු කොට මාර්ගාවස්ථාවෙහි මාර්ගාංගයන් වශයෙන් ඉපද කෘත්‍ය සතරම සම්පූර්ණ කොට නිර්වාණාව-බෝධය කරන්නේය.

සම්මා සතිය :—යහපත් පිරිසිදු සිහියයි. එය සතර සති පට්ඨාන ධර්මයන්ගේ වශයෙන් සතර වැදෑරුම් වේ. කායානු පස්සනා, වේදනානු පස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සනා වශයෙන් භාවනා දියුණු කරන ආකාර සතරකි. මෙසේ මෙ භාවනා අරමුණක සිත පිහිටුවා එහිම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් නැවත නැවතත් සිත පිහිටුවන බැඳ තබන ධර්මය සතියයි. සිතට නොයෙක් අරමුණු කරා යන්නට ඉඩ නො ලැබෙන සේ තමා ගත් භාවනා අරමුණෙහිම නැවත නැවත, සිත

එහිම පැවැත්වීමට සිත හීලෑකර ගැනීමට අතිශයින් උපකාර වන ධර්මය සතියයි. භාවනා කිරීමේදී ඉතාම උපකාරක ධර්මය සතියයි. ලෞකික වශයෙන් සමථ විපස්සනා වශයෙන් දියුණු වූ සති චෛතසිකය මාර්ග අවස්ථාවෙහි මාර්ගාංගයක්ව නිවන අරමුණු කර ගන්නේය.

සම්මා සමාධිය :—සිතේ තැන්පත් ස්වභාවය, ඒකග්‍රතා චෛතසිකයයි. සිත නොයෙක් අරමුණු කරා යාම වළක්වා භාවනා වශයෙන් තමා සිත පිහිටුවා ගත් අරමුණෙහිම බොහෝ වේලාවක් පවත්වා ගත හැකි පරිදි හීලෑ කරගත් සිතයි. එය සමථ භාවනා වශයෙන් වැඩීමෙන් ප්‍රථම ධ්‍යානාදී වශයෙන් වැඩි දියුණු කිරීමෙන් අරූප ධ්‍යානයද උපදවා රූපය නැතිව සිත පමණක් පවත්නා තත්ත්වයට ද පමුණුවන්නේය.

රූපය පමණක් පවත්නා භවයෙහි සිත පහකොට සිත නවත්වා මහා කල්ප 500 ක් 84000 සිටිය හැකි තත්ත්වයටද පමුණුවන්නේය. මේ සියල්ල ලෞකික සමාධියේ බලයයි. ලෝකෝත්තර සිත් සමග ඉපද මාර්ගාංගයක්ව නිර්වාණාව-බෝධයටද හේතු වන්නේය.

මෙසේ මාර්ගාංග අට දෙන සීල, සමාධි, ප්‍රඥ වශයෙන් ද, බෙද දෙනු ලැබේ.

සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන සීලස්කන්ධ යයි.

සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, යන තුන සමාධි ස්කන්ධයයි.

සම්මා දිට්ඨි, සම්මා සංකප්ප යන දෙක ප්‍රඥ ස්කන්ධ යයි.

මෙසේ මාර්ගාංග අට සීල, සමාධි, ප්‍රඥ වශයෙන් ත්‍රිවිධ ශික්ෂාවට ඇතුලත් වන්නේය. මාර්ගාංග අට මාර්ග සත්‍යය වන්නේ කෙලෙස් කැපිය හැකි ශක්තියෙන් යුක්තව බලවත්ව උපන් කල්හිය. කෙලෙස් කැපීම මාර්ග සතරකදී සිදුවන්නේය.

බෝධිපාක්ෂික සංග්‍රහය අවසන්

## සර්ව සංග්‍රහය

ස්කන්ධ, උපාදනස්කන්ධ, ආයතන, ධාතු සත්‍යය යි පස් වැදෑරුම් වේ.

| | | | |
|---|---|---|---|
| 1. | රූප ස්කන්ධය | 1. | රූප උපාදනස්කන්ධය |
| 2. | වේදනා ස්කන්ධය | 2. | වේදනා උපාදනස්කන්ධය |
| 3. | සංඥ ස්කන්ධය | 3. | සංඥ උපාදනස්කන්ධය |
| 4. | විඥන ස්කන්ධය | 4. | සංස්කාර උපාදනස්කන්ධය |
| 5. | විඥන ස්කන්ධය | 5. | විඥන උපාදනස්කන්ධය |

සමාන ධර්මයන්ගේ වශයෙන් ස්කන්ධ බෙද දක්වනු ලැබේ. පළමු කොට පඤ්චස්කන්ධ වශයෙන් වදරා නැවත උපාදනස් කන්ධය වශයෙන් දේශනා කළ සේක.

උපාදන ධර්මයන්ට අරමුණු වන්නාවූ ද අරමුණු නො වන්නා වූද ස්කන්ධ වශයෙන් ධර්මයන් ලෞකික ලෝකෝත්තර ධර්මයන් හැර පොදුවේ දක්වීම සඳහා පඤ්චස්කන්ධ යයි දේශනා කළ සේක.

විදර්ශනාවට අරමුණු වන්නා වූ ත්‍රෛභූමක ස්කන්ධ පමණක් වෙන්කොට උපාදන ස්කන්ධ යයි දේශනා කළ සේක. කාම උපාදනාදී වූ උපාදනයන්ට අරමුණු වන්නා වූ ලෞකික ස්කන්ධ පඤ්චකය උපාදන ස්කන්ධ යයි වදළ සේක. ලෝකෝත්තර ධර්ම හැර සියලුම බුදුරජාණන් වහන්සේලාගේ රූප ස්කන්ධය වුවද ලෞකිකය. රූපය ලෞකික ධර්මයකි. ලෝකෝත්තර නොවේ.

විපල්ලාස ධර්මයන්ගේ වශයෙන් ද දේශනා කළ සේක. නිත්‍ය සංඥ විපල්ලාසය දුරුකර ගැනීමට විඥණ ස්කන්ධය ද සුඛ සංඥ විපල්ලාසය දුරුකර ගැනීමට වේදනා ස්කන්ධය ද ආත්ම සංඥ විපල්ලාසය දුරුකර ගැනීමට සංඥ ස්කන්ධය ද, සුභ සංඥ විපල්ලාසය දුරුකර ගැනීමට රූප ස්කන්ධය ද වදළහ.

## ආයතන දෙළොස

| | | | |
|---|---|---|---|
| 1. | චක්ඛායතන | 7. | රූපායතනය |
| 2. | සෝතා යතන | 8. | ශබ්දයතන |
| 3. | ඝාණායතන | 9. | ගන්ධායතන |
| 4. | ජිව්හායතන | 10. | රසායතන |
| 5. | කායායතන | 10. | රසායතනය |
| 5. | කායායතන | 11. | ඓාට්ඨබ්බායතන |
| 6. | මනායතන අජ්ඣත්තා යතන | 12. | ධම්මායතන, බාහිරා යතන |

සසර දුක ඇති කරන දුකට පමුණුවන ධර්ම ආයතන නම් වන්නේය. චක්ෂුස් ප්‍රසාදයම චක්ඛායතන නම් වේ. සෝතායතනාදිය ද එසේය. මනායතනය නම් සිත් 89 යි.

රූපාලම්බනය හෙවත් වර්ණ රූපය රූපායතනයයි. ශබ්ද, ගන්ධ, රස රූපය ද එසේමය. ඓාට්ඨබ්බ රූපය වන්නේ පඨවි, තේජෝ, වායෝ යන භූත රූප තුනයි. ධම්මා ලම්බනය වන්නේ චෛතසික 52 සුඛුම රූප 16 ද, නිර්වාණය ද යන ධර්ම 69 යයි.

සුඛුම රූප 16 නම් අපො ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසන්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, පරිච්ඡෙද රූප, කාය විඤ්ඤ ත්ති, වචී විඤ්ඤත්ති 2 ක, ලහුතා, මුදිතා, කමඤ්ඤතා යන තුන ද උපචය, සන්තති, ජරතා, අනිච්චතා යන රූප 4 ද යන රූප 16 යි.

සසර දුක ආයත නම්. එයට පමුණුවන්නේ ආයතන නම් වේ. ඒ ඒ කෘත්‍යයෙහි ප්‍රයත්න කරනුයේ ආයතන නම් වේ. සතර මාර්ග ඵල සිත් ඇතිවීමට ප්‍රයත්න කරනුයේ සිදුවනුයේ නිර්වාණ ධර්මය නිසා බැවින් නිර්වාණ ධර්මයට ඇතුලත් කරන ලද්දේය.

## ධාතු අටළොස

1. චක්ඛු ධාතු
2. සෝත ධාතු
3. ඝාණ ධාතු
4. ජිව්හා ධාතු
5. කාය ධාතු
6. රූප ධාතු
7. ශබ්ද ධාතු
8. ගන්ධ ධාතු
9. රස ධාතු
10. ඓාට්ඨබ්බ ධාතු
11. චක්ඛු විඤ්ඤාණ ධාතු
12. සෝත විඤ්ඤාණ ධාතු
13. ඝාණ විඤ්ඤාණ ධාතු
14. ජිව්හා විඤ්ඤාණ ධාතු
15. කාය විඤ්ඤාන ධාතු
16. මනො ධාතු
17. මනො විඤ්ඤාණ ධාතු
18. ධම්ම ධාතු

තමාට අයත් ස්වභාව ලක්ෂණය දරණුයේ ධාතු නම් වේ. චක්ඛු ධාතු ආදී වූ ධාතු අටළොස (18) සත්වයෙක් ජිවයක් නොව තමන්ගේ ස්වභාව ධර්මය දරනුයේ ආත්මයක් නො වන්නේ ධාතු නම් වන්නේය. චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු ධාතු නම් වේ. සෝතාදිය ද එසේය. රූප ධාතු ආදිය රූපා යතනාදිය ද මෙනි. චක්ඛු විඤ්ඤාණාදී සිත් ද දැනගැනීම පහසු වේ. මනො ධාතුව නම් සම්පටිච්ඡන සිත් 2 හා පඤ්චද්වාර, වජ්ජන සිතයි. ඉතිරි සිත් මනො විඥාන ධාතු නම්. චෛත සික 52 හා සුහුම රූප 16 ද නිවාණය ධම්ම ධාතු නම්. ද්වාර ආරම්මණ, චිත්තයන්ගේ වශයෙන් අටළොස් වැදැරුම් වේ.

සුහුම රූප 16 නම් ආපො ධාතු, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය හදය රූප, ජීවිත රූප, ආහාර රූප, පරිච්ඡෙද රූප, කාය විඤ්ඤප්ති රූපය, වචී විඤ්ඤප්ති රූපය, ලහුතා, මුදිතා, කම්මඤ්ඤතා රූප, උපචය, සන්තති, ජරතාංතා, අනිච්චතා යන රූප 16 යි.

## සත්‍ය සතර

දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය, යන මේ දුක්ඛාදි කරුණු සතර ඒකාන්ත වශයෙන් සත්‍ය වූ බැවින් ආර්‍ය්‍ය සත්‍ය නම්ද වේ. ලෝකයෙහි සත්වයා උපදින්නේ ද දුකෙනි. උපන් තැන් සිට ඔහුගේ ශරීරය දිරන්නේය. දිරන්නා වූ සත්වයා මොහොතක් පාසා යන්නේ මරණය කරාය. වඩාම බරපතල වූද, නොකැමති වූ ද දෙය මරණයයි. එයද අකමැත්තෙන් වුවද පැමිණෙන්නේය. එය ඉවසිය නොහැකි දුකකි. ස්කන්ධ පසම දුක් ගොඩක්.

පඤ්චස්කන්ධයම දුක් ගොඩක් වුවත් ඔහුට දැනෙන්නේ ප්‍රනීත රසයක් ලෙසටය. විෂ මිශ්‍ර කේක් ගෙඩියක් මෙනි. එය විෂය වැසී පවතී. එමෙන් ස්කන්ධ දුක නො පෙනේ. එය දැකීමට ධර්ම චක්ෂුව ඇති කර ගත යුතුය. ධර්ම චක්ෂුසින් දුටුවහුට ස්කන්ධ පඤ්චයේ ඇති වීමත් ඉබේ සිදු නොවන බවත් ඊට යම් හේතු ධර්ම රාශියක් ඇති බවත් පෙනෙන්නේ ය. ප්‍රධාන හේතුව වන තෘෂ්ණාව ද නුවනැසට හමු වන්නේ ය. එය ඇතිවීම නැතිකර දැමුවහොත් නැවත ස්කන්ධ පඤ්චකයාගේ හට ගැනීම නොවන බව දුටු බුදුරජාණන් වහන්සේ තෘෂ්ණාව නැති කරන්නා වූ ධර්මයක් දේශනා කළාය. එය ඉතා ගැඹුරු කරුණක් වුවත් අවබෝධ කොට සසර දුකින් මිදීමට හැකි වන්නේය. මෙය අවබෝධ කරගැනීමට උත්සාහ කෙරෙත්වා.

සමුච්චය කාණ්ඩය අවසන්

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

# පටිච්ච සමුප්පාද දෙසනා පාලිය

## අටවෙනි පරිච්ඡෙදය

454. යෙසං සංඛත ධම්මානං-යෙ ධම්මා පච්චයා යථා
තං විභාගම්හෙ දනි-පවක්ඛාමි යථාරහං.

455. පටිච්චසමුප්පාදනයො පට්ඨානනයො චෙති පච්චය සංගහො දුවිධො වෙදිතබ්බො, තත්ථ තබ්භාව භාවි භාවාකාර මත්තොප ලක්ඛිතො. පටිච්චසමුප්පාද නයො. පට්ඨානනයො පන ආහච්චපච්චයට්ඨිති මාරබ්භ පවුච්චති, උභයං පන වොමිස්සෙත්වා පපඤ්චෙන්ති ආචරියා.

456. තත්ථ අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූපං පච්චයා සළායතනං, සළායතන පච්චයා පස්සො ඵස්ස පච්චයා වෙදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදනං උපාදන පච්චයා භවො, භවපච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දෙමනස්සු පායාසා සම්භවන්ති. එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක් ඛන්ධස්ස සමුදයො හොතිති අය මෙත්ථ පටිච්ච සමුප්පාද නයො.

457. තත්ථ තයො අද්ධා ද්වාදසංගානි වීසතාකාරා තිසන්ධි චතුසංඛෙපා තීණිවට්ටානි ද්වෙ මූලානි ච වෙදිතබ්බානි.

458. තත්ථ අවිජ්ජා සංඛාරා අතීතො අද්ධා, ජාති ජරා මරණං අනාගතො අද්ධා. මජ්ඣෙ අට්ඨ පච්චුප්පන්නො අද්ධාති තයො අද්ධා.

459. අවිජ්ජා සංඛාරා විඤ්ඤාණං නාමරූපං සළායතනං ඵස්සො. වෙදනා තණ්හා උපාදනං භවො ජාති ජරා මරණන්ති ද්වාදසංගානි සොකාදි වචනං පනෙත්ථ නිස්සන්ද ඵල නිදස්සනං.

460. අවිජ්ජා සංඛාරග්ගහණෙන පනෙත්ථ තණ්හුපාදාන භවාපි ගහිතා භවන්ති, තථා තණ්හුපාදන භවග්ගහණෙන ච අවිජ්ජා සංඛාරා. ජාති ජරා මරණග්ගහණෙන ච විඤ්ඤාණාදි ඵල පඤ්චක මෙව ගහිතන්ති කත්වා.

461. අතීතෙ හෙතවො පඤ්ච – ඉදනි ඵල පඤ්චකං, ඉදනි හෙතවො පඤ්ච ආයතිං ඵල පඤ්චකන්ති,

විසතාකාරා තිසන්ධි චතුසංඛෙපා ච භවන්ති.

462. අවිජ්ජා තණ්හුපාදනා ච කිලෙසවට්ටං, කම්ම භව සංඛාතො භවෙකදෙසො සංඛාරාච කම්ම වට්ටං, උප් පත්ති භව සංඛාතො භවෙකදෙසො අවසෙසා ච විපාක වට්ටන්ති තීණි වට්ටානි ,අවිජ්ජා තණ්හා වසෙන ද්වෙ මූලානි ච වෙදිතබ්බානි.

463. තෙස මෙව ච මූලානං–නිරොධෙන නිරුජ්ඣති,
ජරා මරණ මුච්ඡාය – පිළිතාන මභිණ්හසො.
ආසවානං සමුප්පාද – අවිජ්ජා ච පවත්තති.

464. වට්ටමාබන්ධ මිච්චෙවං – තෙහුමක මනාදිකං,
පටිච්ච සමුප්පාදෙති – පට්ඨපෙසි මහාමුනි.

465. හෙතුපච්චයො ආරම්මණපච්චයො අධිපතිපච්චයො අනන්තර පච්චයො සමනන්තර පච්චයො සහජාත පච්චයො අඤ්ඤමඤ්ඤ පච්චයො නිස්සය පච්චයො

උපනිස්සය පච්චයො පුරෙජාත පච්චයො පච්ඡාජාත පච්චයො ආසෙවනපච්චයො කම්මපච්චයො, විපාක පච්චයො ආහාර පච්චයො ඉන්ද්‍රිය පච්චයො ඣාන පච්චයො මග්ග පච්චයො සම්පයුත්ත පච්චයො විප්පයුත්ත පච්චයො අත්ථි පච්චයො නත්ථි පච්චයො විගත පච්ච යො අවිගත පච්චයොති අය මෙත්ථ පට්ඨානනයො.

466. ඡධා නාමන්තු නාමස්ස – පඤ්චධා නාමරූපිනං,
එකධා පුන රූපස්ස – රූපං නාමස්ස චෙකධා.

467. පඤ්ඤත්ති නාම රූපානි – නාමස්ස දුවිධා ද්වයං,
ද්වයස්ස නවධා චෙති – ඡබ්බිධා පච්චයා කථං.

468. අනන්තර නිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං අනන්තර සමනන්තර නත්ථි විගත වසෙන, පුරිමානි ජවනානි, පච්ඡිමානං ජවනානං ආසෙවන වසෙන, සහජාතා චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සම්පයුත්ත වසෙනෙති ච ඡධා නාමං නාමස්ස පච්චයො හොති.

469. හෙතු ඣාන මග්ගංගානි සහජාතානං නාම රූපානං හෙතාදි වසෙන සහජාතා චෙතනා සහජාතානං නාමරූපානං. නානක්ඛණිකා චෙතනා කම්මානි නිබ්බත්තානං නාමරූපානං කම්ම වසෙන. විපාකක්ඛන්ධා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානංච විපාක වසෙනෙතිච පඤ්චධා නාමරූපානං පච්චයො හොති.

470. පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙනෙති එකධා නාමං රූපස්ස පච්චයො හොති.

471. ඡවත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණධාතූනං පඤ්චාරම්මණානි පඤ්චවිඤ්ඤාණ වීථියා ච පුරෙජාත වසෙනෙති එකධාව රූපං නාමස්ස පච්චයො හොති.

472. ආරම්මණ වසෙන උපනිස්සය වසෙනෙති ද්විධා
පඤ්ඤත්ති නාමරූපානි නාමස්සෙව පච්චයා හොන්ති
තත්ථ රූපාදි වසෙන ඡබ්බිධං හොති ආරම්මණං.

473. උපනිස්සයො පන තිවිධො හොති ආරම්මණූප
නිස්සයො අනන්තරූප නිස්සයො පකතූප නිස්සයොති
ච. තත්ථ ආරම්මණ මෙව ගරුකතං ආරම්මණූප
නිස්සයො. අනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා
අනන්තරූප නිස්සයො, රාගාදයො පන ධම්මා සද්ධාද
යො ච සුඛං දුක්ඛං පුග්ගලො භොජනං උතුසෙනාසනඤ්
ච යථා රහං අජ්ඣත්තා ච බහිද්ධා ච කුසලාදි ධම්මා
නං කම්මං විපාකානන්ති ච බහුධා හොති පකතූප
නිස්සයො.

474. අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සයාහාරින්ද්‍රිය
විප්පයුත්ත අත්ථි අවිගත වසෙනෙති යථාරහං නවධා
නාමරූපානි නාම රූපානං පච්චයා හොන්ති.

475. තත්ථ ගරුකත මාලම්බනං ආරම්මණාධිපති ව සෙන
නාමානං, සහජාතාධිපති චතුබ්බිධොපි සහජාත වසෙන
සහජාතානං නාම රූපානන්ති ච දුවිධො හොති
අධිපති පච්චයො.

476. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපා
නඤ්ච, මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදය රූපානඤ්ච
පටිසන්ධික්ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤන්ති ච
තිවිධො හොති සහජාත පච්චයො.

477. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං මහාභූතා
අඤ්ඤමඤ්ඤං පටිසන්ධික්ඛණෙ වත්ථුවිපාකා අඤ්ඤ
මඤ්ඤන්ති ච තිවිධො හොති අඤ්ඤ මඤ්ඤ පච්චයො.

478. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානඤ්ච මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදය රූපානඤ්ච ඡවත්ථූනි සත්තන්නං විඤ්ඤාණ ධාතූනන්ති ච තිවිධො හොති නිස්සය පච්චයො.

479. කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස, අරූපිනො ආහාරා සහජාතානං නාමරූපානන්ති ච දුවිධො හොති ආහාර පච්චයො.

480. පඤ්චප්පසාද පඤ්චන්නං විඤ්ඤාණානං, රූප ජීවිතින්ද්‍රියං උපාදින්න රූපානං අරූපිනො ඉන්ද්‍රියා සහ ජාතානං නාම රූපානන්ති ච තිවිධො හොති ඉන්ද්‍රිය පච්චයො.

481. ඔක්කන්තික්ඛණෙ වත්ථු විපාකානං චිත්තචෙතසිකා ධම්මා සහජාත රූපානං සහජාත වසෙන, පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙන, ඡවත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණධාතූනං පුරෙජාත වසෙනෙති ච තිවිධො හොති විප්පයුත්ත පච්චයො.

482. සහජාතං පුරෙජාතං පච්ඡාජාතඤ්ච සබ්බථා, කබලිංකාරො ආහාරො රූපජීවිත මිච්චයන්ති පඤ්චවිධො හොති අත්ථිපච්චයො අවිගත පච්චයො ච.

483. ආරම්මණූපනිස්සය කම්මත්ථිපච්චයෙසු ච සබ්බෙපි පච්චයා සමොධානං ගච්ඡන්ති.

484. සහජාත රූපන්ති පනෙත්ථ සබ්බත්ථාපි පවත්තෙ චිත්ත සමුට්ඨානානං පටිසන්ධියං කටත්තා රූපානඤ්ච වසෙන දුවිධං හොතීති වෙදිතබ්බං.

485. ඉති තෙකාලිකා ධම්මා – කාලමුත්තා ච සම්භවා
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච සංඛතා සංඛතා තථා.
පඤ්ඤත්ති නාම රූපානං – වසෙන තිවිධා ඨිතා,
පච්චයා නාම පට්ඨානෙ – චතුවීසති සබ්බථා.

486. තත්ථ රූපධම්මා රූපක්ඛන්ධො ච, චිත්ත චෙතසික සංඛාතා චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බානං චෙති පඤ්චවිධම්පි අරූපන්ති ච නාමන්ති ච පවුච්චති.

487. තතො අවසෙසා පඤ්ඤත්ති පන පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති පඤ්ඤාපනතො පඤ්ඤත්තීති ච දුවිධා හොති.

488. කථං? තං තං භූත විපරිණාමාකාර මුපාදය තථා තථා පඤ්ඤත්තා භූමි පබ්බතාදිකා, සම්භාර සන්ති වෙසාකාර මුපාදය ගෙහරථ සකටාදිකා, ඛන්ධපඤ්චක මුපාදය පුරිසපුග්ගලාදිකා, චන්දා වට්ටනාදිකමුපාදය දිසාකාලාදිකා, අසම්ඵුට්ඨාකාර මූපාදය කූපගුහාදිකා, තං තං භූත නිමිත්තං භාවනා විසෙසංච උපාදය කසිණ නිමිත්තාදිකා චෙති එවමාදිප්පභෙද පන පරමත්ථතො අවිජ්ජමානාපි අත්ථච්ඡායාකාරෙන චිත්තුප්පාදන මාරම්මණභූතා තං තං උපාදය උපනිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පිය මානා සංඛායති සමඤ්ඤායති වොහරියති පඤ්ඤාපියතීති පඤ්ඤත්තීති පවුච්චති අයං පඤ්ඤත්ති පඤ්ඤා පියත්තා පඤ්ඤත්ති නාම.

489. පඤ්ඤාපනතො පඤ්ඤත්ති පන නාම නාම කම්මාදි නාමෙන පරිදීපිතා.

490. සා විජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමාන පඤ්ඤත්ති, විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති, විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති චෙති ඡබ්බිධා හොති.

491. තත්ථ යද පරමත්ථතො විජ්ජමානං රූපවෙදනාදිං එතාය පඤ්ඤාපෙන්ති තදයං විජ්ජමාන පඤ්ඤත්තිති පවුච්චති, යද පන පරමත්ථතො අවිජ්ජමානං භූමිපබ්බතාදිං එතාය පඤ්ඤාපෙන්ති, තද යං අවිජ්ජ

මාන පඤ්ඤත්තීති පවුච්චති. උභින්නං පන වො මිස්සක වසෙන යථාක්කමං ජළභිඤ්ඤො ඉත්ථිසද්දෙ චක්ඛු විඤ්ඤාණං රාජපුත්තොති ච වෙදිතබ්බො.

492. වචිඝොසානුසාරෙන – සොතවිඤ්ඤාණ විථීයා,
පවත්තානන්තරුප්පන්න – මනොද්වාරස්ස ගොචරා
අත්ථායස්සානු සාරෙන – විඤ්ඤායන්ති තතො පරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා – ලොකසංකේත නිම්මිතා.

ඉති අභිධම්මත්ථ සංගහෙ පච්චය සංගහ විභාගො නාම අට්ඨමො පරිච්ඡෙදො.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ප්‍රත්‍ය කාණ්ඩය

අටවෙනි පරිච්ඡෙදය

# පටිච්ච සමුප්පාද

තෙන සමයෙන බුද්ධො භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ බෝධිරුක්ඛ මූලෙ පඨමාභි සම්බුද්ධො අථඛො භගවා බෝධිරුක්ඛමූලෙ සත්තානං එක පල්ලංකෙන නිසීදී විමුක්ති සුඛ පටිසංවේදී

අථඛො භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි.

අවිජ්ජා පච්චයා සංඛාරා; සංඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාම රූපං; නාම රූප පච්චයා සලායතනං සලායතන පච්චයා ඵස්සො; ඵස්ස පච්චයා වෙදනා; වෙදනා පච්චයා තණ්හා; තණ්හා පච්චයා උපාදනං; උපාදන පච්චයා; භවො, භව පච්චයා ජාති; ජාති, පච්චයා ජරා මරණං, සොක පරිදේව දුක්ඛ දෙමනස්සු පායාසා සම්භවන්ති එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති.

අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා, සංඛාර නිරොධො සංඛාර නිරොධා, විඤ්ඤාණ නිරොධො; විඤ්ඤාණ නිරොධා, නාම රූප නිරොධො, නාම රූප නිරොධා, සලායතන නිරොධො; සලායතන නිරොධා, ඵස්ස නිරොධො; ඵස්ස නිරොධා, වේදනා නිරොධො; වේදනා නිරොධා, තණ්හා නිරොධො, තණ්හා නිරොධා, උපාදන නිරොධො උපාදන නිරොධා භව නිරොධො; භව නිරොධා, ජාති නිරොධො ජාති නිරොධා, ජරා මරණං සොක පරිදේව දුක්ඛ දෙමනස්සුපායසා නිරුජ්ඣන්ති. එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති ති.

## උදන ගාථාව

අනේක ජාති සංසාරං සන්ධා විස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො, දුක්ඛා ජාති පුනප්පුනං
ගහ කාරක දිට්ඨෝසි පුන ගෙ හං න කාහසි.
සබ්බාතෙ ඵාසුකා හග්ගා – ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං – තණ්හානං ඛය මජ්ඣගාති.

මෙසේ පටිච්ච සමුප්පාද පාලිය මුළු රෑ තුන්යාමයට ම දේශනා කොට අවසානයට උදන ගාථා තුනක් ද වදළ ආකාරයට තුන්යාමයට දේසනා කළ ස්ථානය ද අවස්ථාව ද දක්වෙන ලෙසට පෙනෙන්නට තිබෙන්නේ විනය පිටකයෙහි මහා වග්ග පාළියෙහි ය. ඉන් පළමු යාමයේ වදළ ආකාරය යි මේ දක් වූයේ. මෙසේ තුන් වාරයක් ද උදන ගාථා තුනක් ද වදල සේක.

අනේක ජාති සංසාරං කියන ගාථා ධර්මය, ධම්ම පද පාලියේ තිබේ. එම ගාථාව බුදුරජාණන් වහන්සේලා භාවිත කල උදනයක් සේ එය ඉතා ප්‍රකට බැවින් ඒ ගාථා ධර්මය මෙහි සඳහන් වේ. පටිච්ච සමුප්පාද ධර්මය විදර්ශනා භාවනා කර බුද්ධත්වය අවබෝධ කල ලවත්, ඒ අවස්ථාවේ ම මෙනෙහි කරන ලද බවත්, දක්වේ.

බුදුරජාණන් වහන්සේ දිනපතාම පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ බවත් මෙය ඉතා ගෞරවයෙන් පාඩම් කර දිනපතා භාවිතා කරන ලෙස මතක් කර සිටිමි.

අවිද්‍යා ප්‍රත්‍යය ඇති නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර ඇති නිසා විඤ්ඤාණය ඇති වේ. මෙසේ සැම ධර්මයක් ම ප්‍රත්‍යය ද වේ. ප්‍රත්‍යයොත්පන්නය ද වේ. අවිද්‍යාව නැති කර ගත හැකි උවහොත් අනික් සියළුම පටිච්ච සමුප්පාද ධර්ම නැති වේ. අනුලොම පටිච්ච සමුප්පාදයෙන් සංසාරයේ ඇතිවීම ද පටිලොම පටිච්ච සමුප්පාදයෙන් සංසාරයාගේ

නිරෝධය ද පෙන්වයි. ක්ෂණික නිරොධය නොව අවිද්‍යාදීන් ගේ අනුත්පාද නිරොධයයි. එයයි ලබාගන්නට උත්සාහ කල යුත්තේ. ඇති වූ ධර්ම නැතිවීම වන ක්ෂණික නිරොධය ඒ ධර්මයන්ගේ ස්වභාව වන්නේ ය.

අනුත්පාද නිරොධය නම් අතීතයෙහි ඉපිද නිරුද්ධ වූ නාම රූප යන්ගේ නිරොධය ද නොව, දැන් පවත්නා නාම රූප යන්ගේ නිරොධය ද නොව, මතු ඇතිවන නාම රූප යන්ගේ නිරොධය බව වදාළ සේක. ආත්මයක් ඇතැයි කියා ගන්නේ නම් මෙය අවුලක් වන්නේ ය. ආත්ම දෘෂ්ඨියෙහි නොපිහිටා නිවන ගැන සෙවිය යුත්තේ ය. එයයි ධර්මයෙහි පෙන්වන්නේ. සුව දුක් විඳින පුද්ගලයෙක් නිවනෙහිත් නැත. නිවනෙන් මෙපිටත් නැත්තේ ය.

සංඛත ධර්මයන්ට උපකාරවන ප්‍රත්‍ය ධර්මයන්ගේත් ප්‍රත්‍ය ධර්මයන්ගෙන් උපකාර ලැබ උපදනා ප්‍රත්‍යයොත්පන්න ධර්ම යන්ගේත් ඉතා සුළු විස්තරයක් මෙහි දක්වනු ලැබේ.

ප්‍රත්‍ය කාණ්ඩයෙහි පටිච්චසමුප්පාදනය හා සූවිසි ප්‍රත්‍යනය මෙහි දේශනා කර තිබේ. පටිච්ච සමුප්පාදනය පළමුව දක්වා තිබේ. එය අවිද්‍යාදී ප්‍රත්‍යයන්ගේ ඇති වීමෙන් සංඛාරාදිය ඇති වේ යයි ද, අවිද්‍යාදීන් ගේ ඉපදීම නැවතීමෙන් කුසලා කුසලාදී සංඛාර ධර්ම යන්ගේ හටගැනීම නොවන්නේ යයි ද, අනුලොම පටිලොම යන දෙයාකාරයකින් පෙන්වන්නේ ය.

අවිද්‍යාවෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් මුවහ කරන්නේය. (මෝහයයි) සංඛාර නම් කුසලා කුසලාදිය යි. කාය සංඛාර, වචී සංඛාර, මනොසංඛාර, කියාද කොටස් තුනක් වේ. අවිජ්ජා පච්චයා සංඛාරා. මෙහි ඵල වශයෙන් සංඛාර ගනු ලැබේ. සංඛාර පච්චාය විඤ්ඤාණං යන මෙහි ප්‍රත්‍ය සංඛාර යයි.

වරෙක ඵල ධර්ම වශයෙන් ද වරෙක ප්‍රත්‍ය ධර්ම වශයෙන්ද ඇතිවීම පටිච්ච සමුප්පාද ක්‍රමය යි.

**අවිජ්ජා පච්චයා සංඛාරා**

අවිජ්ජාව නම් චතුරාර්‍ය සත්‍ය ධර්මයන් නොපෙනෙන සේ සිත සමග උපදනා මෝහන්ධ කාරයයි. සංඛාරයෝ නම් කුසල් අකුසල් ආදියයි. කාමාවචර කුසල් 8 ද රූපාවචර කුසල් 5 ද අරූපාවචර 4 ද යන 17 ය. අකුසල් 12 ද සමග 29 යි. එහි යෙදෙන චෛතසික 52 කි. අරූපාවචර කුසල් සිත් වලට අනෙඤ්ජාභි සංඛාර යයි ද නමකි.

**සංඛාර පච්චයා විඤ්ඤාණං**

මෙහි විඤ්ඤාණ නම පටිසන්ධි ප්‍රවෘත්ති යන දෙයාකාර වේ. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පටිසන්ධි දෙන සිත් 19 යි. ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණ ලෞකික විපාක සිත් 32 යි. අවිජ්ජා පච්චයා සංඛාර යනුවෙන් ලැබෙන්නේ ඵල සංඛාරයයි. ''සංඛාර පච්චයා විඤ්ඤාණ'' යනුවෙන් ලැබෙන්නේ ප්‍රත්‍ය සංඛාරය යි. කුසල අභිඥ චේතනාව හා උද්ධච්ච සිතේ චෙත නාව ඵලසංඛාරය යි. උද්ධච්ච චේතනාව අකුසල විපාකයන් උපදව යි.

**විඤ්ඤාණ පච්චයා නාමරූප**

මෙතැන නාම වශයෙන් ගනු ලබන්නේ චෛතසික ධර්ම යෝ ය. විඤ්ඤාණය ප්‍රත්‍ය වශයෙන් ගත් බැවින් එසේ විය. මෙතැන ගන්නේ පටිසන්ධි නාම රූපයෝ ය. පටිසන්ධි සිතත් ඒ සමගම උපදනා චෛතසික සහ රූපත් මෙහි ගනු ලැබේ. එය තුන් වැදෑරුම් වේ.

විඤ්ඤාණ පච්චයා නාමං කියා අරූප භවයන් ද, විඤ්ඤාණ පච්චයා රූපං කියා අසංඥ තලය ද, විඤ්ඤාණ පච්චයා නාම රූපං කියා පංච වෝකාර භාවයන් ද මෙසේ ත්‍රිවිධාකාරය කට පෙන් වන්නේ ය.

### නාම රූප පච්චයා සළායතනං

සළායතන නම් චක්ඛායතනා දි අධ්‍යාත්මික ආයතන සයයි. එකවෝකාර භවයෙහි පවතින්නේ ධර්මායතනය පමණකි. චතුවෝකාර භවයෙහි ඇතිවන චෛතසික ධර්ම මනා යතන සංඛ්‍යාත සිතට ප්‍රත්‍යය වේ. මනායතන ධම්මායතන දෙක එහි ඇතිවේ. පංචවෝකාර භූමියෙහි සළායතනයම ඇති වේ. සළායතනය–සළායතනයට ම ප්‍රත්‍යවන්නේ ය.

### සළායතන පච්චයා ඵස්සො

මෙතැන චක්ඛු සම්ඵස්සාදි සය ගනු ලැබේ. දෙපස් විඤ්-ඤාණ සිත් 10 සහ ලෞකික විපාක සිත් 22 සමඟ යෙදෙන ඵස්ස චෛතසිකයෝ ගනු ලැබේ. ලෞකික විපාක 32 මනො සම්ඵස්ස යයි, ඵස්ස චෛතසිකය විස්තරයේ දී ඵස්සය ගැන කරුණු පෙන්වා ඇත. චක්ඛායතන ආදී ආයතන සය සමග යෙදී මෙන් බාහිර ආයතන සමග ගැටීම සිදුවන ආකාරය පෙන්වන්නේ ය.

### ඵස්ස පච්චයා වේදනා

වේදනාව ද විපාක විඤ්ඤාණ සිත් සමග යෙදෙන වේද නාව සය වැදෑරුම් වේ. චක්ඛු සම්ඵස්සජා වේදනා ආදි වශයෙන් දෙපස් විඤ්ඤාණය ද ගෙන චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව යි. චක්ඛු ප්‍රසාද රූපාරම්මණ යන් ගේ ගැටීමෙන් ඇතිවන ඵස්ස යයි එයින් වේදනාවක් ඇති වේ. එයයි මෙහි පෙන්වන්නේ. චක්ඛු සම්ඵස්සජා වේදනා ආදි 5 වැදෑරුම් වේදනාව සහ මනො සම්ඵස්සයෙන් හටගත් වේදනාව සමග මෙහි වේදනා 6 ගනු ලැබේ.

### වේදනා පච්චයා තණ්හා

රූපාදී අරමුණු කෙරෙහි හටගන්නා ලෝභයයි. එය රූප තණ්හා, ශබ්ද තණ්හා, ආදි වශයෙන් සය වැදෑරුම් වේ.

ධම්ම තණ්හා යනු ලෞකික සිත් 81 චෛතසික 52 ප්‍රසාද රූප 5 සුඛුම රූප 16 සහ ප්‍රඥප්තිය ද යන මේවා කෙරෙහි ඇතිවන ලෝභයයි.

**තණ්හා පච්චයා උපාදනා**

උපාදනයෝ සතර වැදෑරුම් වේ. කාම උපාදන, දිට්ඨි උපාදන, සීලබ්බත උපාදන, අත්තවාදුපාන යන 4 යි. එය සමුච්චය කාණ්ඩයෙහි පෙන්වා ඇත. භවය නම් උප්පත්ති භව, කර්ම භව වශයෙන් දෙවැදෑරුම් වේ.

උප්පත්ති භවය නම් කර්මයෙන් උපදවන ලෞකික විපාක 32 චෛතසික 35 විරතිහැර කර්මජ රූප 20 යන මේ ධර්මයෝය. උප්පත්ති භවය නම් කාම භව, රූප භව, අරූප භව, සංඥදී භව අසංඥදී භව, නෙවසංඥදී නා සංඥදී භව එක වොකාරභව, චතු වොකාර භව, පඤ්ච වොකාර භව ආදී වශයෙන් භව 9 යි.

**උපාදන පච්චයා භවො**

භවයද කර්ම භවය ද ,උප්පත්ති භවය ද දෙවැදෑරුම් වේ. එහි කර්ම භවය නම් ලෞකික කුසල් අකුසල් චේතනාවෝ ය. උප්පත්ති භවය නම් කර්මයෙන් උපදින ලෞකික විපාක 32 සහ චෛතසික 33 යන මෙ ධර්ම සමූහය යි. භවය නව වැදෑරුම් භවය යි. වෝකාර යනු ස්කන්ධයන්ට තවත් නමකි.

භව පච්චයා ජාති නම් — උප්පත්ති භවය පිළිබඳ ස්කන්ධයන්ගේ පහල වීමය. එය නාමජාති, සහ රූප ජාති වශයෙන් දෙවැදෑරුම් වේ. නාම ජාති සතර නාම ස්කන්ධයන් පහලවීමයි. රූප ජාති නම් නිෂපන්න රූපයන්ගේ පහලවීමය නිෂ්පන්න (රූප 18) ඇතිවීම ය. භව 9 හි පහලවීම පෙන්නුම් කරති.

**ජාති පච්චයා ජරා මරණං**

සොක, පරිදේව, දුක්ඛ, දෙමනස්ස, උපායාස යන මේවාය.

ජාතිය නිසා ඇතිවන අප්‍රධාන ඵලයෝය. එහි ජරාව ද දෙවැදෑරුම් වේ. නාම ජරා සහ රූප ජරාවය, නාම ජරා නාම ධර්මයන් පවත්නා ඨිතික්ෂණය යි. රූප ජරාව නම්, නිෂ්පන්න රූප 18 ඉපිද පවත්නා ක්ෂණය යි. ඨිති ක්ෂණයයි කුඩා ක්ෂණ 49 කාලය යි. රූප කලාප යක් පවත්නා කාලය යි.

මරණයද නාම රූප වශයෙන් කිය යුතුය. නාම ධර්ම යන්ගේ මරණය භංගක්ෂණය යයි සිතක අවසාන ක්ෂණය යි රූප ධර්මයන්ගේ ද මරණය රූප කලාපයක භංග ක්ෂණය යි. සොක නම් විපත්තිය කදී දෙසමූල සිතෙහි ඇතිවන දෙම්නස් වේදනාවෝ ය.

පරිදේව විපතකදී සිත්හි ඇතිවන දුක නිසා හැඬීම් ආදිය යි. දුක්ඛ නම් දුක්ඛ සහගත කාය විඤ්ඤාණ සිත්හි ඇතිවන දුක් වේදනාවෝ ය.

දෙමනස්ස නම් දෙම්නස් සිත්හි ඇතිවන දෙම්නස්වේදනාවය.

උපායාස විපතක දී සිත දවමින් වෙහෙස කරවන ද්වේශ යයි. මෙය පටිච්ච සමුප්පාදයෙහි අංග 12 යෙහි නාම මාත්‍රයක් දක්වීම ය.

**වීසති නය**

ආයුහන සංඛ්‍යාත කර්මය කරන්නහුගේ පූර්ව කර්ම චේතනා ආයුහනා සංඛාර නම් වේ. නිකාන්ති සංඛ්‍යාත ඇලීම තණ්හාව යි. දැඩිව අල්වා ගැනීම උපාදනය යි. එහි ඇති වන චේතනා තොමෝ කර්ම භව නම් වේ. මෙසේ කර්ම භවයෙන් සිද්ධ වූ ධර්ම පස්දෙන වර්තමාන භවයේ පටිසන්ධියට ප්‍රත්‍ය වේ.

මෝහය ඇති නිසා කර්ම භවය ඇතිවිය. සෝක පරිදෙව, දුක්ඛ දෙමනස්ස උපායාසයන් අවිජ්ජා සංඛාරාදිය මෙන් නිතර ඇති නොවන්නේ ය. ප්‍රධාන අංග නොවෙති. ඔවුන් අප්‍රධාන ඵල වශයෙන් ගනු ලැබෙත්. සොක පරිදේව ආදිය අගට දැක්වූයේ සාමාන්‍ය ඵල පරම්පරාව දැක්වීම වසයෙන් ය.

අතීත, වර්තමාන අනාගත යන කාල තුනකි. අංග දෙළස කි. අවිජ්ජා සංඛාර දෙක අතීත භවයෙන් ද ජාති ජරා මරණ යන දෙක අනාගත භවයෙහි දී ද, මැද අංග අට වර්තමාන භවයෙහි ද ඇතුලත් වේ.

**ආකාර විස්ස**

අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදන, භව යනු අතීත හේතු 5 ය. තණ්හා උපාදන, භව, අවිජ්ජා සංඛාර, වර්තමාන හේතු 5 ය. විඤ්ඤාණ, නාම රූප සලායතන, ඵස්ස, වේදනා අනා ගත ඵල 5 ය. (මේ 20) ආකාර 20 ය ය.

**සන්ධි තුන**

හේතු–ඵල, ඵල–හේතු, හේතු–ඵල යන සන්ධි තුන ය. සංඛාර විඤ්ඤාණ අතර එක් හේතු ඵල සන්ධියකි. වේදනා, තණ්හා අතර එක් ඵල හේතු සන්ධියකි. භව ජාති අතර එක් හේතු ඵල සන්ධියකි. කුසල් රාශිය හේතු වශයෙන් ද විපාක සියල්ල ඵල වශයෙන් ද ගනු ලැබේ.

**සංක්ෂේප සතර**

මේ කොටස් විස්ස සතරක් වන සේ සංක්ෂේප කිරීම ය, සන්ධි තුනක් ඇති නිසා සංක්ෂේප සතරක් ඇති වේ. අවිජ්ජා සංඛාර යන අතීත හේතු එක් සංක්ෂේපයකි. විඤ්ඤාණ නාමරූප, සලායතන, ඵස්ස, වේදනා වර්තමාන ඵල 5 එක් සංක්ෂේප යකි. තණ්හා, උපාදන, භව යන හේතු තුන එක් සංක්ෂේපයකි.; ජාති, ජරා, මරණ යන දෙක එක් සංක්ෂේපයකි.

## වට්ට තුන

අංග දෙළස අවිජ්ජා, තණ්හා, උපාදන යනු ක්ලේශ වට්ට යයි. ලෞකික කුසලා කුසල කර්ම සංඛාරයන් කම්ම වට්ට නම්. විපාක විඤ්ඤාණ සමූහය විපාක වට්ට නම් වේ. විපාක වට්ටය ඇති වන්නේ කම්ම වට්ටය නිසාය. මෙසේ අවිද්‍යාදී හේතු ඵල ධර්ම සමූහයා රෝදයක් මෙන් පෙරලෙමින් පවත්නා බැවින් වට්ට නම් වේ.

## මුල් දෙක

සංඛාර වට්ට නැමැති භව චක්‍රය නොසිඳී පැවැත්මට මුල්වන අවිජ්ජා, තණ්හා දෙක මුල් වෙයි. ආකාර විස්සෙක් වේ. පළමු කී හේතු ඵල පංචකයට අවිජ්ජාව මුල් වෙයි. දෙවනු කී පංචකයට තණ්හාව මුල් වෙයි. මේ හේතු ඵල පරම්පරාව එකිනෙකට සම්බන්ධව පවත්නා බැවින් භව චක්‍ර යයි කියනු ලැබේ.

උපමාවකින් මෙසේ පෙන්වා තිබේ. ගසක් ගැන සිතා බැලුවහොත් සියලුම ගස් වැල් ආදියෙහි ඕජාගතියක් තිබේ. එය එම ගස් වැල් වල ගෙඩිය හට ගැනීමට උපකාර වේ. එයින් නැවත එම වර්ගයේ ගස් හටගැනීමට උපකාරවේ. ඒ ගසට බෙහෙතක් විදීමෙන් ගසෙහි ඕජාව වියළී යයි. නැවත ඒ ගස නිසා තවත් ගස් හට නොගන්නේ ය. සත්වයා ගැන උපමාව, දක්වුවහොත් ක්ලේශ වට්ටය ගසේ ඕජාව මෙනි. මේ කෙලෙස් නිසා නැවත සත්ව, සංඛ්‍යාත විපාක වට්ටය ඇති වේ. විදර්ශනා භාවනාව ඕජාව වියලා දමන ඖෂධය මෙනි. විදර්ශනාවෙන් ක්ලේස වට්ටය සංසිඳෙ. ක්ලේස නමැති ඕජාව නැති නිසා විපාක වට්ටය නැති වන්නේය. මෙසේ කිරීමෙන් එක එක සත්වයකුගේ සංසාර වට්ටය අවසන් වන්නේ ය.

## ප්‍රතීත්‍ය සමුත්පාද දෙසනාව

පටිච්ච සමුප්පාද දෙසනාව සංසාරයේ මුල පෙන්වන දෙසනාවක් නොව, සංසාරය හෙවත් සත්වයාගේ පැවැත්ම පෙන්වීමකි. චක්‍රයක් වැනි වූ පටිච්ච සමුප්පාද ක්‍රමයෙන් පෙන්වන්නේ එක භවයක් පසු කල අවස්ථාවන් මෙන් නැවත නැවත ක්ලේශාදීන් පවත්නා නිසා මතු භවයන් ද ඇතිවන හමුවන බවයි. චතුරාර්‍ය සත්‍ය ධර්මය අවබෝධ නොවන තාක් කල් එසේම භව චක්‍රය පවත්නේ ය. චතුරාර්‍ය සත්‍යය අවබෝධයෙන් නිර්වාණ ධාතුව අවබෝධවීම (දක්නා) නුවණ ඇතිවූවාට පසු සංසාරයෙහි ඉපදීම කෙලවර වන්නේ ය.

ආකාශයේ හටගත් තැනක් නැතුවාක් මෙන් සත්වයින්ගේ ද පටන් ගැනීමක් පෙන්විය නොහැකි යයි ද ඉපදීමක් තිබේ. බිඳීමක් තිබේ. ජරාවක් තිබේ. මේවා ප්‍රත්‍යයෙන් හටගන්නා ධර්මයන්ගේ ලකුණු ය.

බුදුරජාණන් වහන්සේ ඉතා දීර්ඝ කාලයක් පාරමී ධර්ම සම්පූර්ණකොට ලබාගත් විශිෂ්ඨ නුවණින් අවබෝධ කොට මහා කරුණා ඥාණයෙන් වදාරණ ලද්දේ ය. මෙය නිතර භාවිතා කල යුතු බව ද වදාරණ ලද්දේ ය.

බුදුරජාණන් වහන්සේ දශබල ඥාණයෙන් යුත් බ්‍රහ්ම චක්‍රය පවත්වන සේක. එය අභිධර්ම පිටකයෙහි විභංග 18 කින් යුත් විභංග ප්‍රකරණයෙහි ඥාණ විභංගයෙන් දේශනා කරන ලදී. විසුද්ධි මාර්ගයෙහි ද විස්තර වෙයි. එහි දශබල ඥාණ චතුවෛශාරද්‍ය ඥාණ ආදිය ද විස්තර වෙයි.

පටිච්ච සමුප්පාද ධර්ම තේරුම් ගැනීම අමාරු බව බුදුරජාණන් වහන්සේම දේශනා කර තිබේ. යම් කම් කෙලෙස් මාත්‍රයක් වටහා ගැනීමට උපකාරයක් වශයෙන් ගාම්භීර භාවය දැක්වෙන කරුණු ස්වල්පයක් සහ නය (ක්‍රම) සතරක් ද ධර්මයෙහි පෙන්වා තිබෙන පරිදි මෙහි දක්වන්නෙමු.

**ගම්භීරතා**

අවිද්‍යාව, ඥාණයට ප්‍රතිවිරුද්ධ බව නොදැනීම චතුරාර්‍ය සත්‍ය ආදී ගැඹුරු ධර්මයන් දක්නට ඉඩනොතබා සිතෙහි ඉපද වසාගෙන මෙන් පවත්නා ඝන අඳුරු අවිද්‍යාව ය. සත්‍යයන් දැනගැනීමට නොහැකි පරිදි සිතෙහි පවත්නා ආකාරය දැන ගැනීම අපහසු බව ගැඹුරු ය.

සංඛාරයන්ගේ නාම රූපයන් ඇති කරන බව ද අකුසල් ආදිය සිදුකිරීමට අනුකූල බව ද යනාදී කරුණු දැනගැනීම ගැඹුරු ය. විඤ්ඤාණයාගේ ද භවගාමී කර්ම රැස් කරන බව ය. යම්කිසි භවයක පටිසන්ධි ආදීන් ගැනීමේ උත්සාහයක් නැති බව ය. ආත්ම ස්වභාවයක් නැති බවය. යනාදී කරුණු තේරුම් ගැනීම අසීරු ය. ගැඹුරු ය.

නාම රූප ධර්ම එකට එකතුව උපදනා බව ය. වෙන් වශයෙන් පවත්නා බවය. යන කරුණු දැනගැනීම ගැඹුරු ය. මෙසේ පටිච්ච සමුප්පාද අංග සියල්ලත් සියළුම පරමාර්ථයනුත් දැනගැනීම ඉතාම අමාරුයි. උත්සාහ කොට තරමක් හෝ තේරුම් ගත යුතුය.

**පටිච්ච සමුප්පාද නය සතර**

ඒකත්ත නය ය, නානත්ත නය ය, අව්‍යාපාර නය එවං ධම්මතා නය ය යනුවෙන් නය සතර පෙන්වා තිබේ. පටිච්ච සමුප්පාදය තේරුම් ගැනීමේ අපහසු කම සලකා මෙසේ ද විස්තර කරති.

**ඒකත්ත නය**

මේ ඒකත්වය ධර්මයන්ගේ නම් පරම්පරා සම්බන්ධය යි. අවිද්‍යාව ප්‍රත්‍ය කොට හටගන්නා, සංස්කාරයෝ අවිද්‍යාවට බොහෝම වෙනස් වූ ධර්ම ස්වභාවයෙක් වේ. සංස්කාරයන් ගෙන් ප්‍රත්‍ය ලැබ උපදනා විඤ්ඤාණයත් දෙකටම වෙනස් ය. ඒකත්ත නය තේරුම් නොගැනීම හේතුකොට ඇතැම්විට උච්ඡේද දිට්ඨිය ආදිය ඇතිවේ.

### නානත්ත නය

සන්තති ප්‍රඥප්තියෙන් වැසී තිබෙන ධර්ම සමූහය හේතු ඵල වශයෙන්ද, ඒ ඒ ධර්මයන්ට අයත් ලක්ෂණ වශයෙන් ද, කාල ආදී වශයෙන් ද, වෙන් වෙන් ව පවත්නා ධර්ම සමූහයක ගේ නානත්වය ධර්මයන්ගේ ස්වභාවය පටිච්ච සමුප්පාදයාගේ නානත්වය යි. පරණ වන සංස්කාර බිඳීයාමෙන් පසුව අළුත් සංස්කාර පහල වන බව දක්නා තැනැත්තා භට භවයෙන් භවයට යමින් සුවදුක් විඳින සත්වයෙක් ඇතැ යි කියා ගන්නා ශාශ්වත දිෂ්ඨිය දුරු කරගත හැකි වේ.

### ආව්‍යාපාර නය

අවිද්‍යාදීන්ගේ ඵල ඇති කිරිමේ උත්සාහයක් නැතිවම ඵල ඇතිවීම අව්‍යාපාර නයයි. එය දක්ක කල්හි කර්ම කරන කෙනෙකු නැති බව හා ජාතියෙන් ජාතියට යන කෙනෙක් ආත්මයක් නැති බව ද වේදනාව හැර සැප දුක් විඳින කෙනෙක් නැති බව ද දැකීමෙන් ආත්ම දෘෂ්ඨිය දුරු වේ.

### එවං ධම්මතා නය

අවිද්‍යාදි ධර්මයන් නියමයක් නැති යම්කිසි ඵලයක් ඇති නොකොට හේතු ධර්මයට අනුකූල වන පරිදි සංස්කාරාදී ඵල ධර්ම උපදවති. අවිද්‍යාදීන් ගේ හේතුවට අනුකූල ඵලයම උපදවන ශක්තිය ඇති බව පටිච්ච සමුප්පාදයේ එවං ධම්මතා නයයි. මේ නය ක්‍රමය හොඳාකාර තේරුම් ගන්තෝ නම් සහලෙන් බත ද, දෙනගෙන් කිරිද, හටගන්නාක් මෙන් ප්‍රත්‍යයට අනුරූප ඵල ලැබෙන බව අවබෝධ වීමෙන් අහේතුක දෘෂ්ඨිය දුරු කර ගත හැකි වන්නේය.

### පටිලෝම පටිච්චසමුප්පාදය

අවිද්‍යායත් වෙව අසේස විරාග නිරොධා සංඛාර නිරෝධෝ'

සංඛාර නිරෝධා, විඤ්ඤාණ නිරොධෝ, විඤ්ඤාණ නිරොධා–නාම රූප නිරෝධෝ, නාම රූප නිරෝධා, සළායතන නිරොධා යනාදී පටිලොම පටිච්ච සමුප්පාදයන් ගෙන්

දැක්වෙන්නේ සංසාර චක්‍රයාගේ නිරොධය වූ නිර්වාණය යි. යම් ශබ්ද ආදියක් ඇති වී නැති වී යාමට ද නිරොධයයි ව්‍යවහාර වේ. සංසාර යෙහි පැවැති නාම රූප ආදිය ද ක්ෂණයෙකින් නැතිවී යයි. ඒ ධර්ම නැතිවීම සමඟම වාගේ ක්ෂණයෙකින් නැවත ධර්ම ඇති වේ. එසේ නැතිවයාම මෙහි දැක්වෙන නිරොධය නොවේ.

ඒ ක්ෂණික නිරොධයයි. මෙහි ඇතිවන නිරොධය එවැනි ක්ෂණික නිරෝධයක් නොවන්නේ ය. තවම ඇතිනොවූ මතුවට, ඇති විය හැකි අවිද්‍යාදීන් මතු කවර කලකවත්, නූපදනා ලෙස නිරෝධය යි. එය නිර්වානාවබෝධයෙන් සිදු වේ.

අරහත් මග අවිද්‍යා නිරොධය සමගම සියළු සංස්කාර ධර්මයන් එකට ම නුවනින් නිරෝධය වන්නේ ය. සංසාර චක්‍රයාගේ නැවැත්ම මේ නිරොධය නිසා වන්නේ ය. මෙයින් ඇති වන්නේ විමුක්ති සුඛය යි. සුවදුක් විඳින පුද්ගලයෙක් නිවනෙහි නැත. සුවදුක් විඳින පුද්ගලයෙක් නිවනෙන් මෙපිටත් ලෝකයෙත් නැත. සත්ව පුද්ගල කථාව සම්මුතියෙන් පනවා ගන්නා ලද්දකි. පරමාර්ථ වශයෙන් සත්වයෙක් පුද්ගලයෙක් ලොකයෙහි නැති බව බුදුරජාණන් වහන්සේ වදරා ඇත්තේ ය. පවත්නේ නාම රූප ධර්ම සමූහයක් පවත්නා බවය.

මේසය ඇත්තේ ය. එය හොඳාකාර විමසා බලන්නෙකුට පෙනෙන්නේ ලි කෑලි පමණක් ය. එම ලී කෑලි ටික පුළුස්සා දැමුවහොත් මේසයක් නැත. මේසය පිළිස්සුනේ ද නැත. ඇසට හෝ අතට හසු නොවන මේසය ගින්නට ද හසු නොවේ. පුළුස්සා දැම්මේ ලි කැබැලි ටිකය. වඩුවා ලී කැබැලි තබන ලද ආකාරයට මේසය ඇති විය.

සියළු කෙලෙස් නැතිකිරීමේ දුක් නැති කිරීමේ බලයක් මෙහි පෙන්නා තිබේ. භාවනා කර නිවන් දැකීමෙන් සියළු දුක් සන්සිඳී යන්නේය. ඒ නිවනෙහි ඇති ආනුභාවය නිසා ය.

විභංග ප්‍රකරණයෙහි නිවන ගැන බොහෝ විස්තර වන්නේ ය. පටිච්චසමුප්පාද විභංග, ඤාණ විභංග, සච්ච විභංග, මග්ග විභංග ආදීන් ගේ වශයෙන් විශාල විස්තරයක් තිබේ. තවත් ගාම්භීරතා සතරක් පෙන්වන්නේය. එය අර්ථගම්භීර, ධර්ම ගම්භීර, දෙසනා ගම්භීර, ප්‍රතිවේද ගම්භීර තා යනු යි.

පටිච්ච සමුප්පාදය නැමති මේ ගම්භීරදේසනාව අවබෝධ කිරීම සඳහා අසා සිටින අයට වැටහෙන පරිදි සමහර සූත්‍රයක අවිද්‍යාවෙන් ආරම්භ කොට ද නවත් සමහර තැනක ඵස්ස යෙන් ආරම්භ කොට ද යනාදී ක්‍රිප ආකාරයකට දෙසනා කරණ ලද්දේ ය. පුද්ගල අධිෂ්ඨාන වශයෙන් ද, ධර්මය වූ පරිද්දෙන් ද දේශනා කරන සේක. ත්‍රිපිටකයෙහි පටිච්ච සමුප්පාද දේශනා රාශියක් දැකිය හැකි වේ. විභංග ප්‍රකරණයේ පටිච්ච සමුප්පාද දේශනා බොහෝ ගණනක් ඇත්තේ ය. නොයෙක් උපමාවන් ගෙන් ද වදරා තිබේ. වැල් ඉදිරීමට ගිය සතර දෙනාගේ උපමාවෙන් වැලේ මුල සිට ද වැලේ අග දක, අග සිටද, මැද සිට අගට හා මුලට ද, වැල ඇද ප්‍රයෝජනයට ගත් ආකාරයෙන් ද ආකාර සතරකින් පෙන්වා දේශනා කල සේක. එසේ කල දේශනාවන් නොයෙක් ආකාරයෙන් විසිතුරු බැවින් ද ගාම්භීර වේ.

අසන්නන්ගේ ඥාණයට වැටහෙන ආකාර බලා දේශනා කරන සේක. උපමාවන්ට අනුව අනුමානයෙන් ද තේරුම් ගන්නේ ය.

පටිච්ච සමුප්පාදයෙහි අංගයන් වන අවිද්‍යාදීන්හි සාමාන්‍ය නුවණට නොවැටහෙන බව ද ගැඹුරුය. පටිච්චසමුප්පාදයෝ හේතුහුද වෙති. ඵලයන් ද වෙති. අවිද්‍යාව සංස්කාර යන්ගේ හේතුව උවත් ඒ කෙසේ හේතු වන්නේ ද, කොයි අවස්ථාවක හේතුවන්නේ දැ යි කිය නොහැකි බැවින් හා, නොපෙනෙන බැවින් ද තේරුම් ගැනීම අසීරු වේ. සංස්කාර ඇතිවීම ද එය දැක ගැනීම ද දැනගැනීම ද ඉතාමත් අමාරු කරුණකි. එසේ අංග දෙලොසම එක හා සමානම අමාරු බවයි බුදුරජාණන් වහන්සේ වදරා තිබෙන්නේ. මෙ ධර්මය දැනගැනීමට ප්‍රකට උපමා පෙන්වා තිබේ.

එනම් අන්ධ මනුෂ්‍යයෙක් පාරේ ගමන් කරන විට පය පැකිලී වැටී ගෙඩියක් සැදීමත් එහි බිබිලි සයක් සැදී එය සුවකර ගැනීමට වෙදෙකුගෙන් බෙත් ගැනීමත් එයින් නවත් අමාරුවට වේදනාවට පත් වූ ආකාරයත් එයින් බිබිලි හිල් වූවාට පසු වන මුබ ඇති වූ ආකාරයත් වදරා, එය සත්ව ශරීරයට උපමාකර දෙශනා කර තිබේ. ඒ කාරණ තේරුම් ගැනීම අවිද්‍යාව අප තුල ඇති නිසාම තේරුම් ගත නො හැකිය. ධර්ම ගාම්භීරත්වය

තේරුම් ගත යුත්තේ, කොපමණ අමාරු වුවත් මේ ධර්ම ඇතුලත් පටිච්ච සමුප්පාදය සත්වයාගේ පැවැත්ම හා නැවැත්ම තේරුම් ගෙන සසර දුකින් නිදහස් විය යුතු යයි ද දේශනාවෙහි දක් වේ.

එයට උපකාර වීම සඳහා භාවනා ක්‍රම දෙකක් පෙන්වා තිබේ. එයයි කල යුතු වැඩය. හිස හෝ හැඳි වත ගිනිගත් උපමාව කින් ද පෙන්නුම් කර තිබේ. මේ ගැඹුරු දහම, ඉගෙන භාවිතා කල යුතු බවයි එයින් පෙන්වන්නේ.

පටිච්චසමුප්පාද කථාවට ඇතුලත් සංස්කාරයෝ නම් විපාක ඇති කරන බවය, මහාභූත රූප, ඵස්ස, වේදනා චිත්ත චේතනාදි ඇති කරන ධර්ම රාශියකි. ඒ සියළු සංස්කාර යන්ට ම පොදු ලක්ෂණ තුනකි. එය අනිත්‍යය, දුකය, අනාත්මය යන ලක්ෂණ තුනයි. සියළුම සංස්කාර ධර්මයෝ මේ ලක්ෂණ තුනෙන් යුක්ත වේ. අනිත්‍ය අනිත්‍ය ලක්ෂණයෙන් යුක්ත වේ. දුක්ඛය දුක්ඛ ලක්ෂණයෙන්ද අනාත්මය අනාත්ම ලක්ෂණයෙන් ද යුක්ත වේ. ධර්මයේ ලක්ෂණය එකක්. ලක්ෂණය ඇති ධර්ම ස්වභාව වෙන එකක්. විදර්ශනා කරන්නේ මේ ලක්ෂණ තුන වටහා ගැනීමට ය. එහි ඇති ස්වභාවය සොයා දැනගැනීම ඉතාමත් අසීරුය. දකින සතරකින් වැසී තිබෙන බැවින් දැනගැනීම අමාරුය. මෙය ඝන සතර නිසා ඒවායින් වැසී යන්නේය.

උපමාව ගිනිපෙනෙල්ලක් වේගයෙන් කැරකැවීමේදී එකම රවුමක් වුවක් සේ ගිනි රෝදයක්සේ පෙනෙන්නේය. පරමාර්ථ ධර්මයන්ගේද ක්‍රියා වේගය නිසා එකක් සේ ගන්නා ද්‍රව්‍යයන්හි එකක් නොව ද්‍රව්‍ය රාශියක් තිබේ. ද්‍රව්‍ය සමූහයක් එකක් සේ ගන්නේ සමූහය නොපෙනෙන බැවිනි. එය සමූහ ඝන සන්තති ඝනයන්ගෙන් වැසී තිබේ. ගස්, වැල්, අත පය ආදීන්ගේ පවත්නා පරමාර්ථ ධාතු පඨවි, ආපො ආදිය ගැන නොදන්නා නොපෙනෙන නිසා එකක් සේ ගනී. මේවා සමූහ ඝනයෙන් වැසී තිබේ.

සන්තති ඝනය නම් කලක් ජීවත් වන සත්වයන් ද නොයෙක් වස්තූන් ද එම නාම රූප ධර්මයන්ගේ උත්පාද, ඨිති, භංග යන අවස්ථාවන් ගැන නො පෙනෙන නොසිතන නිසා එක් දෙයක් සේ ගන්නේය. එය සන්තති ඝනයෙන් වැසී යයි.

කෘත්‍ය ඝනය නම්—යාම්, ඊම් ආදී ක්‍රියාවෝද, නාම රූප රාශියකින් කෙරෙන ක්‍රියාවෝය. ඒ නාම රූප ගැන සැලකීමක් දැනීමක් නැතිව මම යනවා ආදී වචන භාවිත වේ. මම කීවාම එයම නාම රූප රාශියක් බව නොසිතයි. මම යනු එක් දෙයක් නොව රූප රාශියකි. යනවා කීවාම ඒ ක්‍රියාව සිතින් සිතා කය මෙහෙයවා චිත්තකිරිය වායො ධාතුව මෙහෙයවා අනික් ධර්මයන්ගේද උපකාරයෙන් එක පයක් ඔසවා තබයි. තමන් නැවත අනික් පය ඔසවා තබයි. ඒ ආකාරයෙන් මේ ආදී නාම රූප රාශියකගේ ක්‍රියාවක් බව නොපෙනේ. එය කෘත්‍ය ඝනයෙන් වැසී යයි.

ආරම්මණ ඝනය නම් සිත් රාශියකින් සහ රූප රාශියකින් කරන දේ එක ක්‍රියාවක් සේ ගෙන මම දැක්කා යයි ගන්නේය. ඒ දැකීමට දකින සිතක් ද දැකිය යුතු රූප අරමුණක් ද තිබිය යුතුය. චක්ෂුප්‍රසාදය ඇසුරු කොට චක්ඛු විඤ්ඤාණය ඉපදීමට සිත් උපදනා වීථියක් ඇතිවිය යුතුය. ඒ චිත්ත වීථියේ චක්ඛු ද්වාර වීථියේ සිත ඉපිදවිය යුතුය. දැකීමට වර්තමාන රූපාරම්ම ණයක් ද තිබිය යුතුය. ඒ නාම රූප ක්‍රියා සියල්ල ගෙන් කෙරෙන දැකීම් ක්‍රියාව එකක් සේ ගන්නේය. ඒ ආරම්මණ ඝනයයි. භාවනා කරන යෝගාවචරයන් මේවාද සැලකිය යුතුයි. දත යුතුයි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# පට්ඨාන නය

හෙතු පච්චයො, ආරම්මණ පච්චයො, අධිපති පච්චයො, අනන්තර පච්චයො, සමනන්තර පච්චයො, සහජාත පච්චයො අඤ්ඤමඤ්ඤ පච්චයො, නිස්සය පච්චයො, උපනිස්සය පච්චයො පුරෙජාත පච්චයො, පච්ඡාජාත පච්චයො, ආසේවන පච්චයො, කම්ම පච්චයො, විපාක පච්චයො, ආහාර පච්චයො, ඉන්ද්‍රිය පච්චයො, ඣාන පච්චයො, මග්ග පච්චයො, සම්පයුත්ත පච්චයො, විප්පයුත්ත පච්චයො, අත්ථි පච්චයො, නත්ථි පච්චයො, විගත පච්චයො අවිගත පච්චයො.

ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ ඉපදීමට සහ පැවැත්මට උපකාර වන ස්වභාව ධර්මයන්ට ප්‍රත්‍ය යයි කියනු ලැබේ. ප්‍රත්‍යයොත්පන්න නම් ඒ ඒ ප්‍රත්‍ය භාවයෙන් උපකාර ලැබ හටගන්නා වූ ද ඇතිවන්නා වූ ද ධර්ම රාශිය යි.

ප්‍රත්‍යනීක වන්නේ ඒ ප්‍රත්‍යයට හෝ ප්‍රත්‍යයොත්පන්නයන්ට අයත් නොවන ධර්මයි.

1. හේතු ප්‍රත්‍යය — ගසක් ස්ථිරව පැවැත්මට මුල් උපකාර වන්නාක් මෙන් ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් හටගෙන පැවැත්මට උපකාර වන්නා වූ හේතු වශයෙන් හෙවත් මුල් වශයෙන් උපකාර වන ලෝභාදි අකුසල හේතු සහ කුසල අව්‍යාකෘත හේතූන් ද වේ. හේතු ධර්මයන්ගේ උපකාර නොලබනා, අහේතුක සිත් සහ එහි යෙදෙන චෛතසිකද රූපද, ප්‍රත්‍යයද ප්‍රත්‍යයොත්පන්නද නොවෙති.

2. ආරම්මණ ප්‍රත්‍යය — දුර්වල වූවන්ට නැගිසිටීමට උපකාර වන සැරයටි ආදිය මෙන් චිත්ත චෛතසිකයන්ට ඉපදීම් ආදියට උපකාර වන රූප ශබ්ද දී අරමුණු සයයි.

3. අධිපති ප්‍රත්‍යය — සහජාත අධිපති සහ ආරම්මණ අධිපති වශයෙන් දෙපරිදි වේ. පාඨශාලාවක සෙසු ආචාර්ය වරයන්ගේ ආධිපත්‍යය යටපත් කරන ප්‍රධානාචාර්‍ය්‍යවරයා මෙන් ප්‍රකෘතියෙන් උපදනා සෙසු චිත්ත චෛතසිකයන් යටපත් කොට නැගී සිටින ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට උපකාර වන සහජාත වශයෙන් සහ අරමුණු වීම් වශයෙන් උපකාර වන ධර්ම සමූහය යි.

4. අනන්තර ප්‍රත්‍යය — රටක රජතුමාගේ අභාවය හෝ රජය අත්හැරීම ඔවුන්න හිමියන්ට රාජ්‍යය ලබාගැනීමට උපකාර වන්නාක් මෙන් චිත්ත චෛතසික ධර්මයන්ද තමාට අනතුරුව උපදනා චිත්තොත්පාදයන්ට ඉඩ සලසා දී පලමුව උපන් සිත් 89 හා චෛතසික ද නිරුද්ධ වෙති.

5. සමනන්තර ප්‍රත්‍යය — රටක රජතුමාගේ අභාවය ඔවුන්න හිමි අයට එය ලබාගැනීමට උපකාර වන්නාක් මෙන් තමාට අනතුරුව උපදනා චිත්තොත්පාදයන් හටගැනීමට ඉඩ ලබා දී අභාවයට යන නිරුද්ධ වන පළමු උපන් චිත්තොත්පාදයෝය. සිත් හා චෛතසික ධර්ම යි. මේ ප්‍රත්‍ය දෙකෙහි ස්වරූප සමාන වේ. එහෙත් පුද්ගලයන්ගේ අදහස් අනුව හෝ දෙශනා විලාස වශයෙන් හෝ වදරන ලද්දේ ය.

6. සහජාත ප්‍රත්‍යය — අඳුර ඇති තැන පහනක් දැල්වීමෙන් අඳුර නැතිවී ආලෝකය පැතිරීම මෙන් සහජාත නාම ධර්මයන්ට හා රූප ධර්මයන්ට ද උපකාර වන එකට උපදනා නාම රූප ධර්මයෝ ය.

7. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය — එකට හේත්තු කර තිබූ දඬු තුනක් ඔවුනොවුන්ට උපකාර වීම වශයෙන් පැවැත්ම සේ එකට උපදනා චිත්ත චෛතසික ධර්මයන් සහ රූප ධර්මයන්ද ඔවු නොවුන්ට උපකාර වීම් වශයෙන් පවත්නේ ය.

8. නිස්සය ප්‍රත්‍යය — පොළොව ගස්, වැල්, ආදිය සෑදීමට උපකාර වන්නාක් මෙන්, ප්‍රත්‍යයෙන් උපකාර ලැබ හටගන්නා ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට නිශ්‍රය වශයෙන් පිහිටීමට උපකාර වන ඇතැම් නාම රූප ධර්මයන්ය. සහජාත නිස්සය ප්‍රත්‍යය, වත්ථු පුරෙජාත නිස්සය ප්‍රත්‍යය වශයෙන් දෙපරිදි වේ.

9. උපනිස්සය ප්‍රත්‍යය — සහල් නිපදවීමට බිත්තර වී ද, කුඹුර ද, ජලයද, ගොවියාද යන මොවුන් ඉතා බලවත් ලෙය උපකාර වන්නාක් මෙන් ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට උපනිශ්‍රය (ඉතා බලවත්) වශයෙන් උපකාර වන නාමරූපාදී ධර්ම සමූහයකි. උපනිශ්‍රය ප්‍රත්‍යය ද ආරම්මණ උපනිශ්‍රය, අනන්තර උපනිශ්‍රය, පකතූපනිශ්‍රය, වශයෙන් තුන් වැදෑරුම් වේ. ආරම්මණ උප නිශ්‍රය ආරම්මණ ප්‍රත්‍ය මෙනි. පකතූපනිශ්‍රය ප්‍රත්‍යය–අධ්‍යාත්ම බාහිර බලවත් සිත් 89 ය, චෛතසික 52 රූප 28 වේ. ඇතැම් ප්‍රඥප්ති ධර්ම ද වේ.

10. පුරෙජාත ප්‍රත්‍යය — මව් පිය දෙදෙනා පසුව උපදින දරුවන්ට පළමු ඉපද උපකාර වන්නාක් මෙන්, පසුව උපදනා නාම ධර්මයන්ට පුරෙජාත (පළමු ඉපදීම්) වශයෙන් උපකාර වන වස්තු රූප ආදිය යි. එය වස්තු පුරෙජාත, ආරම්මණ පුරෙජාත ආදියයි. එයින් වස්තු පුරෙජාත යද වස්තු පුරෙජාත වත්ථාරම්මණ පුරෙජාත වශයෙන් දෙවැදෑරුම් වේ.

11. පච්ඡාජාත ප්‍රත්‍යය — පසුව වත්කරන ජලය පළමු සිට වන ලද වෘක්ෂලතා වන්ගේ වැඩීමට උපකාර වන්නාක් මෙන් පසුව ඉපද පළමු උපන් රූප ධර්මයන්ට පච්ඡා (පසුව ඉපදීම) ජාත වශයෙන් උපකාර වන චිත්ත චෛතසික ධර්මයෝ ය.

12. ආසෙවන ප්‍රත්‍යය — පලමුව ලැබූ ඉගෙනීම, පසුව ලබන ඉගෙනීමට උපකාර වන්නාක් මෙන්, තමාට අනතුරුව උපදින කුසල්–අකුසල් කිරිය ජවනයන්ට ආසෙවන වශයෙන් හෙවත් තමාගේ සෙවනය ලැබ බලවත් වනසේ උපකාර වන ලෞකික ජවන් 47 ය.

13. කර්ම ප්‍රත්‍යය — වෘක්ෂය හටගැනීමට උපකාර වන බීජය මෙන් සත්වයෙකු හටගැනීමට කර්ම වශයෙන් උපකාර වන චේතනාව ය. එය සහජාත කම්ම, නානාක්ෂණික කම්ම වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සහජාත කම්ම නම්, බීජ හටගන්නාක් මෙන් සිත් 89 හා එකට හටගන්නා වර්තමානව ඇතිවන චේතනා 89 යි. නානාක්ෂණික කම්ම නම්, මතු පැලවීම පිණිස තවන් කල බීජ මෙන් මතු විපාක ඉපදවීමට චිත්ත සන්තානයෙහි නිදහන් කොට මෙන් පවත්නා අතීත වූ කුසල් අකුසල් චේතනා 29 යි.

14. විපාක ප්‍රත්‍යය — වෘක්ෂලතාවන්හි හටගෙන පැසී ඉදී ගිය ගෙඩි ආදිය මෙන් විපාක දීම් වශයෙන් ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට උපකාර වන විපාක සිත් 36 හා චෛතසික 38 ය.

15. ආහාර ප්‍රත්‍යය — දිරාපත් වූ ගෙයකට රුකුල් දෙන බල කරු මෙන් ශරීරයට අනුබල දෙන ආහාරයෝ යි. එය රූප ආහාර–නාම ආහාර වශයෙන් දෙවැදෑරුම් වේ. රූප ආහාර නම් ආහාර වශයෙන් ගනු ලබන බාහිර ඕජාව හා අධ්‍යාත්ම ඕජාවය. නාම ආහාර නම් ඵස්ස චේතනා විඤ්ඤාණ යයි.

16. ඉන්ද්‍රිය ප්‍රත්‍යය — ප්‍රදේශ රජ අන්‍ය ප්‍රදේශ රජ වරුන් ගේ අධිපති භාවය නොවලක්වා තමන් අයත් ප්‍රදේශයෙහිම ඊශ්වර භාවය පවත්වන්නාක් මෙන්, තම තමන්ට අයත් චක්ඛු විඤ්ඤාණාදී ප්‍රත්‍යයොත්පන්නයන් කෙරෙහිම ඊශ්වර භාව යෙන් උපකාරී වන චක්ඛු ඉන්ද්‍රිය ආදියයි. ඒ ඉන්ද්‍රිය ප්‍රත්‍යයද සහජාත ඉන්ද්‍රිය, පුරෙජාත ඉන්ද්‍රිය, රූපජීවිතින්ද්‍රිය, වශයෙන් තුන් වැදෑරුම් වේ. එහි සහජාත ඉන්ද්‍රිය නම් චිත්ත ධර්මය ජීවිතින්ද්‍රිය චෛතසිකය, වෙදනා, විරිය, සද්ධා, සති, ඒකග්ගතා යන මේ නාම ඉන්ද්‍රිය 8 ය, පුරෙජාත ඉන්ද්‍රිය නම් මධ්‍යමායුෂ්ක වූ චක්ඛුරාදී ප්‍රසාද රූප 5 ය. රූප ජීවිතින්ද්‍රිය නම් ජීවිතින්ද්‍රිය රූපය යි.

17. ධ්‍යාන ප්‍රත්‍යය — යම් දෙයක තත්ත්වය දැනගත හැකි පරිදි ළඟට ගොස් බලන්නාසේ ධ්‍යාන වශයෙන් අරමුණ කරා එළඹ බැලීම් වශයෙන් ප්‍රත්‍යයොත්පන්නයන්ට උපකාර වන විතර්කය ආදී ධ්‍යානාංග සතය. දෙපස් විඤ්ඤාණ හැර ඉතිරි සිත් 79 යෙදෙන ධ්‍යානාංගයෝ ය.

18. මාර්ග ප්‍රත්‍යය — එතෙරින් මෙතෙරට පැමිණීමට උප කාර වන නැවක් මෙන් ප්‍රත්‍යයොත්පන්නයන්ට මාර්ග වශයෙන් උපකාර වන මාර්ග අංග 12 ය. එය සහේතුක සිත් 71 යෙදෙන මාර්ගාංග යි.

19. සම්පයුත්ත ප්‍රත්‍යය — එකට මිශ්‍ර වූ කිරි, ගිතෙල්, මී, සකුරු, ආදිය චතුමධුරය මෙන් සම්ප්‍රයුක්ත වශයෙන් එකට යෙදී මිශ්‍රව ඔවුනොවුන්ට උපකාර වන සිත් 89 හා චෛතසික 52 යි.

20. විප්පයුත්ත ප්‍රත්‍යය — නෙළුම් පතෙහි ජලය එකට මිශ්‍ර නොවී පවත්නාක් මෙන් ඔවුනොවුන්ට උපකාර වන නාම රූප ධර්මයි. එය සහජාත විප්පයුත්ත–පුරේජාත විප්පයුත්ත–පච්ඡාජාත විප්පයුත්ත වශයෙන් තුන් වැදෑරුම් වේ.

21. අත්ථි ප්‍රත්‍යය —විනය ශික්ෂාපදයන් ඇතිවීම, හික්මීමට උපකාර වන්නාක් මෙන් විද්‍යාමානව ඇති බැවින් ඔවුනොවුන්ට උපකාර වන නාම රූප ධර්මයෝ ය. එය සය ආකාරයකි.

22. නත්ථි ප්‍රත්‍යය — රාත්‍රිය ගෙවීයාම හිරු උදවීමට උපකාර වන්නාක් මෙන් තමාට අනතුරුව උපදනා නාම ධර්මයන්ට ඉඩ දී නිරුද්ධව අවිද්‍යාමාන භාවයෙන් උපකාර වන සිත් 89 ය හා චෛතසික 52 ය. අනන්තර ප්‍රත්‍යය මෙනි.

23. විගත ප්‍රත්‍යය — සූර්‍ය්‍යාලෝකය පහවීම චන්ද්‍රා ලෝකය ඇති වීමට උපකාර වන්නාක් මෙන් තමන් පහවයාම පසුව උපදනා නාම ධර්ම යන්ට උපකාර වන සිත් 89 චෛතසික 52 ය.

24. අවිගත ප්‍රත්‍යය — පර්‍ය්‍යාප්තිය ඉගනීම ප්‍රතිපත්තියගේ පැවැත්මට උපකාර වීම මෙනි. පහනොවීම වශයෙන් ඔවුනොවුන්ට උපකාර වන නාම රූප ධර්මයි. මෙය සහජාත අවිගත, වත්ථු පුරේජාත අවිගත, ආරම්මණ පුරේජාත අවිගත, පච්ඡාජාත අවිගත, ආහාර අවිගත, රූප ජීවිතින්ද්‍රිය අවිගත වශයෙන් සය වැදෑරුම්.

ප්‍රත්‍යධර්මයන්ගේ නාම මාත්‍රයක් මෙහි දක්වේ.

**ප්‍රත්‍යයන්ගේ ෂඩ් ප්‍රකාරය**

1. නාමය නාමයට සය ආකාරයකින් උපකාර වෙයි.
2. නාමය නාමරූප දෙකට පස් ආකාරයකින් උපකාර වෙයි.
3. නාමය රූපයට එක් ආකාරයකින් උපකාර වෙයි.
4. රූපය නාමයට එක් ආකාරයකින් උපකාර වෙයි.
5. ප්‍රඥප්තියද, නාමයද රූපයද නාමයට දෙආකාරයකින් උපකාර වෙයි.
6. නාම රූප දෙක නාම රූප දෙකට නව ආකාරයකින් උපකාර වෙයි.

## 1. නාමය නාමයට සය ආකාරයකින් උපකාර වීම.

මුලින් ඉපද නිරුද්ධ වූ නාම ධර්ම පිළිවෙලින් චිත්තචෛත සික ධර්මයන්ට අනන්තර, සමනන්තර, නත්ථි, විගත, ප්‍රත්‍යයන් ගෙන් උපකාර වේ. පළමුඋපන් ජවනයෝ පසු පසුව උපදනා ජවනයන්ට අසේවන ප්‍රත්‍යවසයෙන් ප්‍රත්‍ය වේ.

සහජාත නාම ධර්ම ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් උපකාර වේ. අනන්තරාදිය – මුලින් ඉපද නිරුද්ධ වූ නාම ධර්ම (රහත් චුතිය) හැර ඒවුති සිත ප්‍රත්‍යයොත්පන්න වේ. ප්‍රත්‍යයො වේ.

කුසලය අකුසලයට ද, අකුසලය කුසලයටද ප්‍රත්‍ය නොවේ. වේදනාවද එසේය, කුසල වේදනාවෝ අකුසල වේදනාවන්ට ප්‍රත්‍ය නොවේ. ඔවුනොවුන්ට විරුද්ධ ධර්මයන්ට ප්‍රත්‍ය නොවේ.

ආසේවන–චිත්ත විථියක අවසාන ජවනයත් මාර්ග ජවන් සහ ඵල ජවන් හැර ඉතිරි ජවන් 47 ය.

පසු ජවන් නම් — ප්‍රථම ජවනය හා ඵල ජවන් හැර ලෞකික ජවනයෝය. ජාති භෙදය නිසා ආසේවන නොවේ. ගොත්‍රභූ සිතේ හා ධ්‍යාන මාර්ග සිත්හි භූමි භෙදය නැත්තේ ය.

## 2. නාමය නාමරූප දෙකට පස් ආකාරයකින් ප්‍රත්‍ය වේ.

හේතු ධර්ම හා ධ්‍යාන අංග ද, මාර්ගාංගයන් ද සහජාත නාම රූපයන්ට හේතු, ධ්‍යාන, මාර්ගාංග යන්ගෙන් උපකාර වේ.

සහජාත චේතනාව සහජාත නාම රූපයන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යවේ.

නානාක්ෂණික චේතනාව කර්මජ නාම රූපයන්ට නානාක්ෂ ණික කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ.

විපාක නාම ඔවුනොවුන්ටද, සහජාත රූපයට ද විපාක වශයෙන් ප්‍රත්‍ය වේ. මෙසේ නාමරූපයට, හේතු, ධ්‍යාන, මාර්ග, කම්ම විපාක යන ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වේ.

මහාභූත රූප ඔවුනොවුන්ට ද, උපාද රූපයන්ට ද සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.

පටිසන්ධියෙහි දී හදය වස්තුව පඤ්චවෝකාර භවයෙහි පටිසන්ධි නාම ධර්මයන්ට ද සහජාත ප්‍රත්‍යශක්තියෙන් උපකාර වේ. මෙසේ ප්‍රත්‍යශක්තිය ත්‍රිවිධ වේ.

අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය

නාමධර්ම ඔවුනොවුන්ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යශක්තියෙන් ප්‍රත්‍යය වෙයි. මහාභූත රූපද එසේම ඔවුනොවුන්ට ප්‍රත්‍යවේ. පටිසන්ධියෙහි දී හදය වස්තුව හා පඤ්චවෝකාර භවයෙහි පටිසන්ධි නාම ධර්ම ඔවුනොවුන් ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ශක්තියෙන් ත්‍රිවිධාකාරයෙකින් උපකාර වේ.

නිස්සය ප්‍රත්‍යය

නාම ධර්ම ඔවුනොවුන්ට ද, සහජාත වූ චිත්තජ රූපයන්ට හා පටිසන්ධි කර්මජ රූපයන්ටද සහජාත නිස්සය ශක්තියෙන් ප්‍රත්‍යය වේ. මහාභූත රූප ඔවුනොවුන්ට ද උපාද රූපයන්ට ද සහජාත නිස්සය ප්‍රත්‍යය වේ. ෂඩ් වස්තු රූපයන් සප්ත විඥාණ ධාතුන්ට පුරෙජාත නිස්සය ප්‍රත්‍යශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ආහාර ප්‍රත්‍යය

ආහාර ඉන්ද්‍රිය ප්‍රත්‍ය දෙක

කබලීකාර ආහාරය රූපකයට රූප ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අරූපී වූ ඵස්ස චෙතනා, විඤ්ඤාණ සංඛ්‍යාත නාම ධර්ම සහජාත නාම රූපධර්මයන්ට නාම ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ. රූප ආහාර නාම ආහාර වශයෙන් ආහාර ප්‍රත්‍යය දෙවැදෑරුම් වේ.

ඉන්ද්‍රිය ප්‍රත්‍යය

පඤ්ච ප්‍රසාද රූපයන් පඤ්ච විඤ්ඤාණයන්ට පුරෙජාත ඉන්ද්‍රිය ප්‍රත්‍යශක්තියෙන් ද, ප්‍රවෘත්ති පටිසන්ධි වශයෙන්

පවත්නා ජීවිතින්ද්‍රිය රූපය කර්මජ රූපයන්ට ද, රූප ජීවිතින්ද්‍රිය ශක්තියෙන් ද, අරූපි ඉන්ද්‍රියයෝ සහජාත නාම රූපයන්ට සහජාතින්ද්‍රිය වශයෙන් ද ඉන්ද්‍රිය ප්‍රත්‍යය නෙවැදැරුම් වේ.

මෙහි ප්‍රසාද රූප පස නම් අතීත භවාංගය සමග ඉපද මධ්‍යමායුෂ්ක වූ ප්‍රසාද රූප පසය.

විප්පයුත්ත ප්‍රත්‍යය

විප්පයුත්ත, අත්ථි, අවිගත ප්‍රත්‍ය 3.

පටිසන්ධියෙහි දී පංචවෝකාර ප්‍රතිසන්ධි නාම ධර්ම සමග උපදනා හදය වස්තුව එම පටිසන්ධි නාමධර්මයන්ට සහජාත විප්පයුත්ත ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ සහජාත රූපයන්ට සහජාත විප්පයුක්ත ශක්තියෙන් උපකාර වේ.

පසුව උපදින නාම ධර්මයෝ පළමු උපන් රූපකායට පච්ඡා ජාත විප්පයුත්ත ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ෂඩ් වස්තුහු ප්‍රවෘත්තියෙහි දී සප්ත විඥ්ඥාණ ධාතුන්ට වත්ථු පුරේජාත විප්පයුත්ත ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

අත්ථි ප්‍රත්‍යය

සහජාත අත්ථි, පුරේජාත අත්ථි, පච්ඡාජාත අත්ථි, ආහාර අත්ථි, රූපජීවිතින්ද්‍රියඅත්ථි මෙසේ පඤ්ච ප්‍රභෙද වේ.

අවිගත ප්‍රත්‍යය

සහජාත අවිගත, පුරේජාත අවිගත, පච්ඡාජාත අවිගත, ආහාර අවිගත, රූපජීවිතින්ද්‍රි අවිගත යයි අවිගත ප්‍රත්‍යයද පඤ්ච ප්‍රභෙද වේ.

මෙසේ නාම රූපයෝ ඔවුනොවුන්ට 9 ආකාරයකින් උපකාර වේ.

## නාම රූප ප්‍රඥප්තීන් බෙද දක්වීම

අටවිසි රූපය රූපස්කන්ධයයි. නාම ස්කන්ධ 4 සහ නිර් වාණය නාම නම් වේ. ප්‍රඥප්තිය වනාහි අර්ථ ප්‍රඥප්තිය ශබ්ද ප්‍රඥප්තිය යන දෙවැදෑරුම්. ප්‍රඥප්තිය – පඤ්ඤා පියත්තා ප්‍රඥප්ති, ප්‍රකාරයෙන් පනවනු ලබන්නුයි ප්‍රඥප්තියි. ද්‍රව්‍ය වස්තූන් අනුන්ට හැඟෙනසේ-සිතට වැටහෙන සේ කියනු ලබන අර්ථයි. ඒ අර්ථය නන් වැදෑරුම් නාමයන්ගෙන් හැඟ විය යුතු බැවින් මෙහි ප්‍රකාරයෙන් යයි කීහ.

ඒ ප්‍රඥප්තිය "පඤ්ඤාපනතොපඤ්ඤත්ති" ප්‍රකාරයෙන් පනවනු ලබන හෙයින් ප්‍රඥප්ති නම් වේ. ඒ ඒ වස්තු ද්‍රව්‍යයන් හඟවන පාළි සිංහල-දෙමළ ආදී භාෂා ශබ්දයෝ ය.

අත්ථි ප්‍රඥප්තිය

වනාහි සන්තාන ප්‍රඥප්ති ,සමූහ ප්‍රඥප්ති, සත්ත ප්‍රඥප්ති, දිසා කාලාදි ප්‍රඥප්ති, ආකාශ ප්‍රඥප්ති, කසිණ ප්‍රඥප්ති, නිමිත්ත ප්‍රඥප්ති යනාදි ප්‍රභෙදයෝ වෙති.

සන්තාන ප්‍රඥප්ති

මහා භූතයන්ගේ විපරීතාකාරය නිසා පනවන ලද භූමිය පර්වතය, වෘක්ෂය. සමුද්‍රය ආදියයි. මෙයට සමූහ ප්‍රඥප්තිය යිද කිව හැකිය.

සමූහ ප්‍රඥප්ති

දැවදඬු, මැටි ආදි උපකරණයන් එකතු වීමෙන් සෑදුන සටහන් ආකාරයට ව්‍යවහාර වන ගෘහය, රථය, කලය. වස්ත්‍රය යනාදිය යි.

සත්ත ප්‍රඥප්ති

නාම රූපාදීන්ට ව්‍යවහාර කරන සත්වයා පුද්ගලයා, පුරුෂයා, ස්ත්‍රිය ආදිය උපාද ප්‍රඥප්ති නම් වේ.

දිසා කාලාදී ප්‍රඥප්ති

චන්ද්‍ර, සූර්‍ය, තාරකාවන් නැගීම් බැසීම් නිසා ව්‍යවහාර වන, පූර්වදිසා, පශ්චිම දිසා, පෙරවරු, පස්වරු, ඍතු මාස ආදිය යි.

ආකාශ ප්‍රඥප්ති

රූප කලාපයන්ට ස්පර්ශ නොවන සිදුරු ආදීන්ට ව්‍යවහාර වන ලිං, පොකුණු ආදිය යි.

කසිණ ප්‍රඥප්ති

පඨවි ආදිය නිසා සැදුන කසිණ ප්‍රඥප්තිය යි.

නිමිත්ත ප්‍රඥප්ති

භාවනානු යෝගින්ට වැටහෙන පරිකර්ම උපචාර ආදි අරමුණු ය.

තතියා රූප සිතට අරමුණු වන නාස්තිභාව ප්‍රඥප්ති හා ආනාපාන ප්‍රඥප්ති, වර්ණ කසිණ ප්‍රඥප්තිය, උපාදන ප්‍රඥප්ති, උපනිසා ප්‍රඥප්ති, යනු බහු ප්‍රභෙද වේ.

ප්‍රඥප්ති ධර්ම

ශබ්ද ප්‍රඥප්තිය එක් එක් වස්තු ද්‍රව්‍ය හැඳිනීම පිණිස එක් එක් භාෂාවන්ට අනුව පනවාගත් වචන නාම මාත්‍රයයි.

ශබ්ද ප්‍රඥප්තිය

අවිජ්ජ මාන ප්‍රඥප්ති, විජ්ජමාන ප්‍රඥප්ති, විජ්ජ මානෙන අවිජ්ජමාන ප්‍රඥප්ති, අවිජ්ජ මානෙන විජ්ජමාන ප්‍රඥප්ති, විජ්ජමානෙන විජ්ජ මාන ප්‍රඥප්ති අවිජ්ජමානෙන අවිජ්ජමාන ප්‍රඥප්ති සයකි. ප්‍රඥප්තීන් පරමාර්ථ ධර්ම ස්වභාව සලකා ව්‍යවහාර කරනු ලැබේ.

විජ්ජමාන ප්‍රඥප්ති

හඟවනු ලබන අර්ථය පරමාර්ථ වසයෙන් ඇති දෙයක් ගැන උවහොත් එයට ව්‍යවහාර කරන නාමය විද්‍යමාන ප්‍රඥප්තියකි. එය රූප වේදනා ආදිය යි. රූප යනු ශබ්ද ප්‍රඥප්තියයි. එයින් හඟවනු ලබන පඨවි ආදී රූපය අර්ථ ප්‍රඥප්තියකි. පරමාර්ථ ධර්ම සියල්ලම විද්‍යමාන ප්‍රඥප්තියයි.

අවිද්‍යමාන ප්‍රඥප්ති

හඟවනු ලබන අර්ථය පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන නම් එයට ව්‍යවහාර කරන නාමය අවිද්‍යමාන ප්‍රඥප්තියයි. එය භූමි පර්වත. එය ශබ්ද ප්‍රඥප්තියකි. එ භූමි ශබ්දය අවිද්‍යමාන ප්‍රඥප්තියයි.

විජ්ජමානෙන අවිජ්ජමාන ප්‍රඥප්ති

මේ විජ්ජමාන, අවිජ්ජමාන යන වචන දෙක එකට ගලපා ව්‍යවහාර කරන ශබ්දය හෝ නාමයයි. ෂඩ් අභිඥ පුද්ගලයා ආදියයි. ෂඩ් අභිඥ පරමාර්ථ ධර්මයකි. විද්‍යමානයි. අභිඥ-පුද්ගලයා අවිද්‍යමානයි. එසේ දත යුතුය.

අවිජ්ජමානෙන විජ්ජමාන ප්‍රඥප්ති

මේ අවිජ්ජමානෙන විජ්ජමාන වචන දෙක එකට ගලපා ව්‍යවහාර කරන නාමයයි. ළමයා ශබ්ද කරයි, බල්ලා බුරයි. යනාදිය මෙනි. ළමයා, බල්ලා අවිද්‍යමානය ශබ්දය විද්‍යමාන වේ.

විජ්ජමානෙන විජ්ජමාන ප්‍රඥප්ති

විද්‍යමාන ප්‍රඥප්ති දෙකක් එකට ගලපා ව්‍යවහාර කරන ශබ්දයයි. එනම් චක්ඛු විඤ්ඤාණ, චක්ඛුසම්ඵස්ස ආදිය මෙනි. වචන දෙකම පරමාර්ථයෝය.

අවිජ්ජමානෙන අවිජ්ජමාන ප්‍රඥප්ති

අවිජ්ජමාන ප්‍රඥප්ති දෙකක් එකට ගලපා ව්‍යවහාර කරන ශබ්දයයි. බමුනු කුමරා, සිටු දේවිය, යන අවිජ්ජමාන වචන දෙකක් එකට ගලපා ව්‍යවහාර කරයි.

ප්‍රකට කරන ආකාරය මෙසේ දක්වේ.

සද්දං පඨම චිත්තේන — තීතං දුතිය චෙතසා
නාමං තිතිය චිත්තේන — අත්ථං චතුත්ථ චෙතසා
යන්නෙන් ඒ බව ප්‍රකට කෙරෙයි.

පළමු උපදින සොත විඤ්ඤාණ වීථියෙන් වර්තමාන ශබ්දය ද දෙවනුව උපදනා තදනු වර්තක මනොද්වාරික වීථියෙන් අතීත ශබ්ද රම්මණය දැනගනී. තුන් වෙනුව උපදනා මනො ද්වාරික වීථියෙන් ශබ්දය පිළිබඳ නාමය ද, සතර වෙනුව උපදනා සුබ මනොද්වාරික වීථියෙන් එහි අර්ථය ද දැන ගන්නේ ය.

නාම ප්‍රඥප්තිය වනාහි ලොකසත්වයාගේ ව්‍යවහාරය අනුව පහළ වන්නේ ය.

ප්‍රත්‍ය කාණ්ඩය ඉතාමත් සංක්ෂෙපයෙන්
නාම මාත්‍රයක් මෙහි දක්වේ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# කම්මස්ථාන කාණ්ඩය පාලිය

## නම වෙනි පරිච්ඡෙදය

493. සමථ විපස්සනානං භාවනාන මිතොපරං,
කම්මට්ඨානං පවක්ඛාමි දුවිධම්පියථාක්කමං.

494. තත්ථ සමථසංගහෙ තාව දසකසිණානි දස අසුභා දස අනුස්සතියො චතස්සො අප්ප මඤ්ඤායො එකාසඤ්ඤා එකංවවත්ථානං චත්තාරො ආරුප්පා චෙති සත්තවිධෙන සමථ කම්මට්ඨාන සංගහො.

495. රාගචරිතා දොසචරිතා මොහචරිතා සද්ධා චරිතා බුද්ධි චරිතා විතක්ක චරිතා චෙති ඡබ්බි ධෙන චරිත සංගහො.

496. පරිකම්මභාවනා උපචාරභාවනා අප්පනා භාවනා චෙති තිස්සො භාවනා.

497. පරිකම්ම භාවනා උපචාර භාවනා අපපණා භාවනා චෙති තිස්සොභාවනා පරිකම්ම නිමිත්තං උග්ගහනිමිත්තං පටිභාගනිමිත්තං චෙති තීනි නිමිත්තානි ච වෙදිතබ්බානි.

498. කථං? පඨවිකසිණං, ආපොකසිණං, තෙජො කසිණං වායොකසිණං, නීලකසිණං, පීත කසිණං, ලොහිතකසිණං, ඔදත කසිණං, ආකාස කසිණං, ආලොකකසිණං, චෙති ඉමානි දසකසිණානි නාම.

499. උද්ධුමාතකං, විනීලකං, විපුබ්බකං, විච්ඡිද්දකං, වික්ඛායි
තකං, වික්ඛිත්තකං, හතවික්ඛිත්තකං, ලොහිතකං, පුල
වකං, අට්ඨිකං චෙති ඉමෙ දස අසුභා නාම.

500. බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති
චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, මරණා
නුස්සති, කායගතා සති, ආනාපානසති, චෙති ඉමා දස
අනුස්සතියො නාම.

501. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා චෙති ඉමා චතස්සො
අප්පමඤ්ඤා නාම, බ්‍රහ්ම විහාරාති පි වුච්චන්ති.

502. ආහාරෙ පටික්කූලසඤ්ඤා එකාසඤ්ඤා නාම.

503. චතුධාතු වවත්ථානං එකං වවත්ථානං නාම.

504. ආකාසානඤ්චායතනාදයො චත්තාරො ආරුප්පා නාමාති
සබ්බථාපි සමථනිද්දෙසෙ චත්තාලීස කම්මට්ඨානානි
භවන්ති.

505. චරිතාසු පන දසඅසුභා කායගතාසති සංඛාතා කොට්ඨාස
භාවනා ච රාගචරිතස්ස සප්පායා.

506. චතස්සො අප්පමඤ්ඤායො නීලාදීනි ච චත්තාරි
කසිණානි දෙසචරිතස්ස.

507. ආනාපානං මොහචරිතස්ස විතක්ක චරිතස්ස ච.

508. බුද්ධානුස්සති ආදයො ජ සද්ධා චරිතස්ස.

509. මරණොපසමසඤ්ඤා වවත්ථානි බුද්ධිචරිතස්ස.

510. සෙසානි පන සබ්බානිපි කම්මට්ඨානානි සබ්බෙසම්පි
සප්පායානි.

511. තත්ථාපි කසිණෙසු පුථුලං මොහචරිතස්ස ඛුද්දකං විතක්ක
චරිතස්සොති. අය මෙත්ථ සප්පාය භෙදො.

### අයමෙත්ථ සප්පාය භෙදො

512. භාවනාසු පන සබ්බත්ථාපි පරිකම්මභාවනා ලබ්භතෙව. බුද්ධානුස්සති ආදිසු අට්ඨසු සඤ්ඤාවවත්ථා නෙසු චාති දසසු කම්මට්ඨානෙසු උපචාර භාවනා සම්පජ්ජති නත්ථි අප්පනා. සෙසෙසු පන සමතිංස කම්මට්ඨානෙසු අප්පණා භවනාපි සම්පජ්ජති.

513. තත්ථාපි දසකසිණානි ආනාපානඤ්ච පඤ්චකජ්ඣානිකා

514. දසඅසුභා කායගතාසතිච පඨමජ්ඣානිකා.

515. මෙත්තාදයො තයො චතුක්කජ්ඣානිකා.

516. උපෙක්ඛා පඤ්චමජ්ඣානිකා ති ඡබ්බිසති රූපාවචර ජ්ඣානිකානි කම්මට්ඨානානි.

517. චත්තාරො පන ආරුප්පා අරූපජ්ඣානිකානි.

### අයමෙත්ථ භාවනා භෙදො.

518. නිමිත්තෙසු පන පරිකම්ම නිමිත්තං උග්ගහ නිමිත්තංච සබ්බත්ථාපි යථාරහං පරියා යෙන ලබ්භතෙව.

519. පටිභාග නිමිත්තං පන කසිණාසුභකොට්ඨාසානාපානෙ ස්වෙව ලබ්භති.

520. තත්ථහි පටිභාගනිමිත්තමාරබ්භ උපචාර සමාධි අප්පනා සමාධි ච පවත්තන්ති.

521. කථං? ආදිකම්මිකස්සහි පඨවිමණ්ඩලාදිසු නිමිත්තං උග්ගණ්හන්තස්ස තමාරම්මණං පරිකම්මනිමිත්තන්ති පවුච්චති, සාවභාවනා පරිකම්ම භාවනා නාම.

522. යද පන තන්නිමිත්තං චිත්තෙන සමුග්ගහිතං හොති චක්ඛුනා පස්සන්තස්සේව මනොද්වාරස්ස ආපාථමාගතං තද තමේවා ලම්බනං උග්ගහනිමිත්තං නාම. සාච භාවනා සමාධි යති.

523. තථා සමාහිතස්ස පන තස්ස තතොපරං තස්මිං උග්ගහ නිමිත්තෙ පරිකම්මසමාධිනා භාවනා මනුයුඤ්ජන්තස්ස යද තප්පටිභාගං වත්ථු ධම්ම විමුච්චිතං පඤ්ඤත්ති සංඛාතං භාවනාමයමාලම්බනං චිත්තෙන්නිසින්නං සම ප්පිතං හොති, තද පටිභාගනිමිත්තං උප්පන්නන්ති පවුච්චති.

524. තතොපට්ඨාය පරිපන්ථ විප්පහීනා කාමාවචර සමාධි සංඛාතා උපචාර භාවනා නිප්ඵන්නා නාම හොති.

525. තතොපරං තමෙව පටිභාග නිමිත්තං උප චාර සමාධිනා සමාසෙවන්තස්ස රූපාවචර පඨමජ්ඣානමප්පෙති.

526. තතොපරං තමෙව පඨමජ්ඣානං ආවජ්ජනා සමාපජ්ජනා අධිට්ඨානා වුට්ඨානා පච්චවෙක්ඛණා චෙති ඉමාහි පඤ්චහි වසිතාහි වසීභූතං කත්වාවිතක්කාදික මොළාරි කංගප්පහාණාය විචාරාදී සුඛුමංගුප්පත්තියා පද හතො යථාක්කමං දුතියජ්ඣානාදයො යථා රහ මප්පෙන්ති.

527. ඉච්චෙවං පඨවිකසිණාදිසු ද්වංවීසති කම්මට්ඨානෙසු පටිභාගනිමිත්තමුපලබ්භති.

528. අවසෙසෙසුපන අප්පමඤ්ඤා සත්තපඤ්ඤත්තියං පවත්තන්ති.

529. ආකාසවජ්ජිත කසිණෙසු පන යං කිඤ්චි කසිණමුග්ඝා ටෙත්වා ලද්ධමාකාසං අනන්ත වසෙන පරිකම්මං කරොන් තස්ස පඨමාරුප්පමප්පෙති.

530. තමෙව පඨමාරුප්පවිඤ්ඤාණං අනන්ත වසෙන පරිකම්මං කරොන්තස්ස දුතියාරුප්ප මප්පෙති.

531. පඨමාරුප්පවිඤ්ඤාණාභාවං පන නත්ථි කිඤ්චි ති පරිකම්මං කරොන්තස්ස තතියා රුප්පමප්පෙති.

532. තතියාරුප්පං සන්තමෙතං පණීතමෙතන්ති පරිකම්මං කරොන්තස්ස චතුත්ථාරුප්පමප්පෙති.

533. අවසෙසෙසුච දසසු කම්මට්ඨානෙසු බුද්ධ ගුණාදිකමාල-ම්බනමාරබ්භ පරිකම්මං කත්වා තස්මිං නිමිත්තෙ සාධුකමුග්ගහිතෙ තත්ථෙව පරිකම්මංච සමාධියති උප චාරොච උප්පජ්ජති.

534. අභිඤ්ඤාවසෙන පවත්තමානං පන රූපාවචර පඤ්චමජ්ඣානං අභිඤ්ඤාපාදක පඤ්චමජ්ඣානා වුට්ඨහිත්වා අධිට්ඨෙය්‍යාදිකමාවජ්ජෙත්වා පරිකම්මං කරොන්තස්ස රූපාදීසු ආලම්බනෙසු යථාරහමප්පෙති.

535. අභිඤ්ඤාච නාම —

ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්ත විජානනං,
පුබ්බෙ නිවාසානුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා.

අයමෙත්ථ ගොචර භෙදො.

නිට්ඨිතොච සමථකම්මට්ඨාන නයො.

536. විපස්සනා කම්මට්ඨානෙ පන සීලවිසුද්ධි, චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කංඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි, පටිපදඤාණ දස්සනවිසුද්ධි, ඤාණදස්සන විසුද්ධි, චෙති සත්ත විධෙන විසුද්ධි සංගහො.

537. අනිච්ච ලක්ඛණං, දුක්ඛලක්ඛණං, අනත්ත ලක්ඛණං, චෙති., තිණි ලක්ඛණානි.

538. අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, චෙති, තිස්සො අනුපස්සනා.

539. සම්මසනඤාණං, උදයව්‍යයඤාණං, භංගඤාණං, භයඤාණං, ආදීනවඤාණං, නිබ්බිදාඤාණං, මුඤ්චිතුකම්‍යතාඤාණං, පටිසංඛාන ඤාණං, සංඛාරුපෙක්ඛා ඤාණං, අනුලොම ඤාණං චෙති. දසවිපස්සනාඤාණානි.

540. සුඤ්ඤතොවිමොක්ඛො අනිමිත්තොවිමොක්ඛො අප්පණිහිතො විමොක්ඛො චෙති තයො විමොක්ඛා.

541. සුඤ්ඤතානුපස්සනා අනිමිත්තානුපස්සනා අප්පණිහිතානුපස්සනා චෙති තිනිවිමොක්ඛ මුඛානි ච වෙදි තබ්බානි.

542. කථං? පාතිමොක්ඛ සංවරසීලං ඉන්ද්‍රිය සංවරසීලං ආජීව පාරිසුද්ධි සීලං, පච්චයසන්නිස්සිතසීලං චෙති චතුපාරිසුද්ධිසීලං සීලවිසුද්ධිනාම.

543. උපචාර සමාධි අප්පණාසමාධි චෙති දුවිධොපි සමාධි චිත්තවිසුද්ධි නාම.

544. ලක්ඛණරස පච්චුපට්ඨානවසෙන නාම රූප පරිග්ගහො දිට්ඨිවිසුද්ධි නාම.

545. තෙසමෙව ච නාමරූපානං පච්චය පරිග්ගහො කංඛා විතරණ විසුද්ධි නාම.

546. තතො පරං පන තථා පරිග්ගහිතෙසු සප්පච්චයෙසු තෙභූමකසංඛාරෙසු අතීතාදිභෙදභින්නෙ ඛන්ධාදි නයමාරබ්භ කලාපවසෙන සංඛිපිත්වා අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තං අසාරකට්ඨෙනාති අද්ධාන වසෙන සන්තතිවසෙන ඛණවසෙන වා සම්මසනඤාණෙන ලක්ඛණත්තයං සම්ම සන්තස්ස.

තෙස්වෙව පච්චයවසෙන ඛණවසෙන ච උදයව්‍යයඤාණෙන උදයව්‍යය මනුපස්සන්තස්ස ච.

ඔභාසො පීති පස්සද්ධි අධිමොක්ඛො ච පග්ගහො.
සුඛං ඤාණ මුපට්ඨාන මුපෙක්ඛා ච නිකන්ති චෙති.

ඔභාසාදි විපස්සනුපක්කිලෙසෙ පරිපන්ථ පරිග්ගහවසෙන
මග්ගාමග්ග ලක්ඛණ වවත්ථානං මග්ගාමග්ග ඤාණ
දස්සන විසුද්ධි නාම.

547. තථා පරිපන්ථ විමුත්තස්ස පන තස්ස උදයබ්බය ඤාණ
තොපට්ඨාය යාවානුලෝමා තිලක්ඛණං විපස්සනා පරම්
පරාය පටිපජ්ජන්තස්ස නවවිපස්සනා ඤාණානි පටිපද
ඤාණාදස්සන විසුද්ධි නාම.

548. තස්සෙවං පටිපජ්ජන්තස්ස පන විපස්සනා පරිපාක
මාගම්ම ඉදනි අප්පණා උප්පජ්ජතීති භවංගං වොච්ඡින්
දිත්වා උප්පන්න මනොද්වාරාවජ්ජනානන්තරං වෙතීනි
විපස්සනා චිත්තානි යංකිඤ්චි අනිච්චාදි ලක්ඛණමාරබ්භ
පරිකම්මොපචාරානුලෝම නාමෙන පවත්තන්ති, යා
සිඛාප්පත්තා සානුලොමා සංඛාරුපෙක්ඛා වුට්ඨානගාමිනී
විපස්සනාති ච වුච්චති.

549. තතොපරං ගොත්‍රභූචිත්තං නිබ්බානමා ලම්බිත්වා
පුථුජ්ජන ගොත්තමභිභවන්තං අරියගොත්ත මභිසම්
භොන්තඤ්ච පවත්තති.

550. තස්සානන්තර මෙව මග්ගො දුක්ඛසච්චං පරිජානන්තො
සමුදයසච්චං පජහන්තො නිරොධ සච්චං සච්ඡිකරොන්
තො මග්ග සච්චං භාවනාවසෙන අප්පණා වීථිමොතරති.

551. තතොපරං ද්වෙතිනිඵලචිත්තානි පවත්තිත්වා
නිරුජ්ඣනිති.

552. තතොපරං භවංගපාතො හොති.

553. පුනභවංගං වොච්ඡින්දිත්වා පච්ච වෙක්ඛණ ඤාණානි
පවත්තන්ති.

554. මග්ගං ඵලවඤ්ච නිබ්බානං පච්චවෙක්ඛති පණ්ඩිතො,
හිනෙ කිලෙසෙ සෙසෙව පච්චවෙක්ඛති වා න වා

555. ඡබ්බිසුද්ධික්කමෙනෙවං භාවෙතබ්බො චතුබ්බිධො,
ඤාණදස්සන විසුද්ධිනාම මග්ගො පවුච්චති.

අයමෙත්ථ විසුද්ධිභෙදෙ

556. තත්ථ අනත්තානුපස්සනා අත්ථාභිනිවෙසං මුචඤ්චන්ති සුඤ්ඤතානුපස්සනා නාම විමොක්ඛ මුඛං හොති. අනිච්චානු පස්සනා විපල්ලාස නිමිත්තං මුඤ්චන්ති අනිමිත්තානු පස්සනා නාම, දුක්ඛානුපස්සනා තණ්හා පණිධිං මුඤ්චන්ති අප්පණිහිතානුපස්සනා නාම.

557. තස්මා යදි වුට්ඨානගාමිනී විපස්සනා අනත්තතො විපස්සති සුඤ්ඤතො විමොක්ඛො නාම හොති, මග්ගො යදි අනිච්චතො විපස්සති, අනිමිත්තො විමොක්ඛො නාම යදි දුක්ඛතො විපස්සති මග්ගො අප්පණිහිතො විමොක්ඛො නාමාති ච මග්ගො විපස්සනා ගමනවසෙන තිනි නාමානි ලභති.

558. තථා ඵලංච මග්ගාච ගමන භාවනා වසෙන මග්ග වීථියං.

559. ඵල සමාපත්ති වීථියං පන යථාවුත්තනයෙන විපස්ස න්තානං යථා සකං ඵල මුප්පජ්ජමානම්පි විපස්සනාගමන වසෙනෙව සුඤ්ඤතාදි විමොක්ඛොති පවුච්චති.

560. ආලම්බන වසෙන පන සරසවසෙන ච නාමත්තයං සබ්බත්ථ සබ්බෙසම්පි සමමෙව.

අයමෙත්ථ විමොක්ඛභෙදො

561. එත්ථ පන සොතාපත්ති මග්ගං භාවෙත්වා දිට්ඨි විචි කිච්ඡාප්පහාණෙන පහීණාපාය ගමනො සත්තක්ඛත්තු පරමො සොතාපන්නො නාම හොති.

562. සකදගාමි මග්ගං භාවිවෙත්වා රාග දෙස මොහානං තනුත්තා සකදගාමි නාම හොති සකිදෙව ඉමං ලොකං ආගන්තා.

563. අනාගාමි මග්ගං භාවෙත්වා කාමරාග ව්‍යාපාදනං මනවසෙසප්පහාණෙන අනාගාමි නාම හොති අනාගන්තා ඉත්ථත්තං.

564. අරහත්ත මග්ගං භාවෙත්වා අනවසෙස කිලෙසප්පහානෙන අරහා නාම හොති ඛීණාසවො ලොකෙ අග්ගදක්ඛිණෙය්‍යො.

අයමෙත්ථ පුග්ගල භෙදො

565. ඵල සමාපත්ති පනෙත්ථ සබ්බෙසම්පි යථාසක ඵලවසෙන සාධාරණාව.

566. නිරොධ සමාපත්ති සමාපජ්ජනං පන අනාගාමීනඤ්චෙව අරහන්තානංච ලබ්භති.

567. තත්ථ යථාක්කමං පඨමජ්ඣානාදි මහග්ගත සමාපත්තිං සමාපජ්ජිත්වා වුට්ඨාය තත්ථ ගතෙ සංඛාර ධම්මෙ තත්ථ තත්ථෙව විපස්සන්තො යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා තතොපරං අධිට්ඨෙය්‍යාදිකා පුබ්බ කිච්චං කත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමා පජ්ජති.

568. තස්ස ද්වින්නං අප්පණාජවනානං පරතො වොච්ඡිජ්ජති චිත්ත සන්තති.

569. තතො නිරොධ සමාපන්නො නාම හොති.

570. වුට්ඨානකාලෙපන අනාගාමී නො අනාගාමී ඵල චිත්තං අරහතො අරහත්ත ඵල චිත්තං ඒකවාරමෙව පවත්තිත්වා භවංගපාතො හොති.

571. තතොපරං පච්චවෙක්ඛණඤාණානි පවත්තන්ති.

අයමෙත්ථ සමාපත්ති භෙදො

නිට්ඨිතොච විපස්සනා කම්මට්ඨානනයො

572. භාවෙතබ්බං පනිච්චෙවං භාවනාවය මුත්තමං
පටිපත්තිරසස්සාදං පත්ථයන්තෙන සාසනෙ.
ඉති අභිධම්මත්ථ සංගහෙ කම්මට්ඨාන සංගහ විභාගො නාම නවමො පරිච්ඡෙදො.

නව වෙනි පරිච්ඡේදය

# කර්මස්ථාන කාණ්ඩය

කමටහන් අරමුණු මේ කාණ්ඩයට ඇතුළත් වේ :

මෙතැන් පටන් සමථ, විදර්ශනා යන කමටහන් දෙක ගැන කරුණු ස්වල්පයක් දක්වනු ලැබේ.

කර්මස්ථාන භාවනා කර්මය පැවැත්මට ස්ථාන වූ අරමුණු කර්මස්ථානයෝය.

සමථ කර්මස්ථාන

සමථ භාවනාවෙහි අරමුණු 40 ක් වේ.

විදර්ශනා කර්මස්ථාන, විදර්ශනා භාවනාවෙහි අරමුණු ය. ඒ නම් ත්‍රෛභූමික නාම රූප ධර්මයෝ ය.

භාවනා

වරක් ඉපද වූ පසු නැවත නැවත වැඩිය යුතු සමාධිය සහ විදර්ශනා ප්‍රඥාව සහ සතිය යි. විදර්ශනා භාවනාවේ අරමුණ නාම රූප ධර්මයෝය.

සමථ භාවනාව

නීවරණයන් සහ ඖදරික විතක්කාදි ධ්‍යාන අංගයන් සංසිඳවන සමාධිය සමථ භාවනාවයි. එය ලෞකික කුසල් කිරිය සිතේ යෙදෙන ඒකග්ගතාවයි. සමථ භාවනාවෙන් මහග්ගත ධ්‍යාන හා අභිඥ ලබයි. ධ්‍යාන සිත් වලදී එය විස්තර කර ඇත.

## විදර්ශනා භාවනාව

නාම රූප ධර්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් මහා කුසල් සහ කිරිය සිත්වලින් විදර්ශනා කරයි. එයින් සතර මාර්ග සහ සතර ඵලයන්ට පැමිණේ. කිරිය සිත් රහතුන් වහන්සේට පමණක් ලැබෙන්නේ ය.

සමථ භාවනාවෙහි සප්පාය භෙදය, භාවනා භෙදය, ගෝචර භෙදය යයි තුනක් තිබේ. කර්මස්ථාන 40 ද, චරිත 6 ද, භාවනා 3 ද, නිමිති 3 ද වේ.

### කර්මස්ථාන 40

| | | |
|---|---|---|
| කසිණ දසය | 10 | 40 කර්මස්ථාන |
| අසුභ දසය | 10 | |
| අනුස්සති දසය | 10 | |
| අප්පමඤ්ඤා සතර | 4 | |
| ආහාරෙ පටික්කූල සඤ්ඤා | 1 | |
| චතු ධාතු වවත්ථානය | 1 | |
| අරූප ධ්‍යාන සතර | 4 | |

### කසිණ දසය

පඨවි කසිණය, ආපො කසිණය, තෙජෝ කසිණය, වායො කසිණය, නීල කසිණය, පීත කසිණය, ලෝහිත කසිණය, ඕදත කසිණය, ආකාස කසිණය, ආලෝක කසිණය යන කසිණ අරමුණු දහයයි.

පඨවි කසිණය, පඨවි නිමිත්තය, කසිණ මණ්ඩල සාදගෙන භාවනා අරමුණ වශයෙන් යොද ගනිති. ස්වභාවයෙන් පිහිටන ලද්දක් කසිණ මණ්ඩලය වශයෙන් භාවිතා කරන්නේ නම් කමතක් පමණ ස්වභාවයෙන් පිහිටි තැනක් ද කසිණ මණ්ඩලය වශයෙන් භාවිත කරති.

කසිණ මණ්ඩලය සාදගෙන ද පාවිච්චි කරති. පිරිසිදු අරුණුවන් මැටි යොද එක් වියත් සතර අහලක් පමණ ප්‍රමාණ

යට කවාකාරව සාදා ගෙන එදෙස බලා එය සිතින් අරමුණ වශයෙන් ගෙන භාවනා කළ යුතුය. කසිණ මණ්ඩලය කවාකාර විය යුතුය.

ආපොකසිණය — ජලයම කසිණ මණ්ඩලය වශයෙන් ගන්නේය.

තෙජො කසිණය — ගින්දරම කසිණ මණ්ඩලය වශයෙන් ගන්නේ ය.

වායො කසිණය — සුළඟම භාවනා අරමුණ වේ.

නීල කසිණය — නිල් පැහැයෙන් යුත් කසිණ භාවනා නිමිත්ත වේ.

පීත කසිණය — කහ පැහැයෙන් යුත් කසිණ මණ්ඩලයයි.

ලෝහිත කසිණය — රතු පැහැයෙන් යුත් කසිණ මණ්ඩලයයි.

ඕදත කසිණය — සුදු පැහැයෙන් යුත් කසිණ මණ්ඩලයයි.

ආකාශ කසිණය — පිරිසිඳ වෙන්කොට ගත් හිස් සිදුර කසිණ මණ්ඩලයයි.

ආලොක කසිණය — ආලොක වශයෙන් ගනු ලබන්නේ චන්ද්‍රාලෝක ප්‍රදීපාලෝක ආදියෙන් ලැබෙන ආලෝක කසිණ මණ්ඩලයයි.

### දස අසුභය

අසුභය නම් මරණයට පත්වූවන් එක් දවසක් ගිය අසුභය ආදී වශයෙන් ඉදිමීම ආදී අසුභය ප්‍රකටව පවත්නා අවස්ථා වන් ය.

1. උද්ධුමාතක — ඉදිමී ගිය මළ සිරුරය.
2. විනීලක — නිල් වී පිළිකුල් වූ මළ සිරුරය.
3. විපුබ්බක — සැරව වැගිරෙන මළ සිරුරය.
4. විච්ඡද්දක — සිදුරු සහිත පිළිකුල් වූ මළ සිරුරය.
5. වික්ඛායිතක — බලු සිවල් ආදීන් විසින් ගැවසීගත් මළ සිරුරය.
6. වික්ඛිත්තක — බලු සිවල් ආදීන් විසින් කා කඩ කඩ කොට ඒ ඒ තැන කැබලි දැමූ මළ සිරුරය.

7. හත වික්ඛිත්තක — කපා හෝ කඩා ඒ ඒ තැන දමූ මළ සිරුරය.

8. ලෝහිතක — ලේ පිටත වැගිරෙන දමන ලද මළ සිරුරය.

9. පුලවක — ඇද හැලෙන පනු කැදලි ඇති මළ සිරුරය.

10. අට්ඨික — පිළිකුල් ඇටසැකිල්ලය.

## දස අනුස්සති

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතා සති, ආනාපානසති යන අනුස්සති කම්ටහන් දසයයි.

අනුස්සති යනු කමටහන් අරමුණක් ගෙන නැවත නැවත එයම සිහි කරන සතිචෛතසිකයයි.

1. බුද්ධානුස්සති — බුද්ධ රූප සටහන හෝ බුදුගුණ හෝ නැවත නැවත සිහිකරන බවයි.
2. ධම්මානුස්සති — ත්‍රිපිටක ධර්මය සහ මග ඵල, නිවන් යන දහම් ගුණ සිහි කිරීමයි.
3. සංඝානුස්සති — ආර්‍ය්‍ය සංඝරත්නයේ ගුණ නැවත නැවත සිහිකිරීමයි.
4. සීලානුස්සති — කඩ නොවීම් ආදී වශයෙන් තමා විසින් රක්නා සීලය සිහි කිරීමයි.
5. චාගානුස්සති — තමාගේ ත්‍යාග ගුණය සිහි කිරීමයි. පිරිසිදු සිතින් දෙන දානාදිය සිහි කිරීමයි.
6. දෙවතානුස්සති — දෙවියෝ සද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා, හිරි, ඔත්තප්ප ආදී යහපත් ධර්මයන්හි පිහිටා හොඳ කුසල් කළ හෙයින් දේවත්වයට ගියහ. එසේ දෙවියන්ට සමාන ගුණ ධර්ම තමා තුළ ඇතිකර ගැනීමට සිතීම් වශයෙන් භාවනා කිරීමය ය.
7. උපසමානුස්සති — නිර්වාණයේ දුක් සංසිඳවීමේ ගුණය නැවත නැවත සිහි කිරීමය.

8. මරණානුස්සති — ජීවිතයාගේ අවසාන මරණයට පත්වීම ගැන සිහි කිරීමය.

9. කායගතාසති — කෙස් ලොම් ආදි දෙතිස් කුණපයකින් සැදි ශරීරයෙහි පිළිකුල් ස්වභාවය නැවත නැවත සිහි කිරීමය.

10. ආනාපානසති — නාම් ආශ්වාස ප්‍රාශ්වාස යන අරමුණු කෙරෙහි සිත පිහිටුවා නැවත නැවතත් නාසයෙන් ඇතුල්වන පිටවන වාතය කෙරෙහි සිත පිහිටුවා බැලීමය.

**අප්පමඤ්ඤා සතර**

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සත්ව ප්‍රඥප්තිය අරමුණු කොට මෙයින් එකකින් හෝ යහපත් සේ සිත පිහිටුවා විසීම බ්‍රහ්මයා ගේ විසීමට සමාන යයි යන තේරුමෙන් බ්‍රහ්ම විහරණ සතර යයි කියනු ලැබේ.

නවද පුත්‍ර ප්‍රේමය ආදි වශයෙන් දරුවන් ආදීන්ට ඇති ආලය ලෝභයයි. මෙත්තා නොවේ. වංචක ධර්මයකි. මෛත්‍රියට අරමුණු වන්නේ දුකට පත් සත්ව ප්‍රඥප්තියයි. සත්වයින් කෙරෙහි උපදින ඒ දුකින් නිදහස් කොට සැපයට පමුණුවන චේතනාවය. සියළුම සත්ව ප්‍රජාව කෙරෙහි හට ගත් හොඳ යහපත් සිතයි.

කරුණාව — දුක් විඳින සියළු සතුන් කෙරෙහිම සමව පවත්නා හොඳ, යහපත් සිතිවිල්ලයි. දුක් විඳින සත්වයින් කවරෙක් හෝ කෙරෙහි ඇතිවන ස්වභාවයකි. එයට අනුකම්පාව යයි ද කියති.

මුදිතාව — සැපසේ සිටින සත්ව ප්‍රජාව කෙරෙහි ඊර්ෂ්‍යා නොකරන හොඳ ගතිය යි. සැපසේ වසන සත්වයන් ගැන සිතා සතුටු වීමයි.

උපෙක්ඛා — සියළුම සත්වයින් අරමුණු කොට සියල්ලන් කෙරෙහි උපදනා තත්‍රමධ්‍යස්ථතා චෛතසිකයයි. උපෙක්ඛා වේදනාව නොවේ.

සියළුම සත්ව ප්‍රජාව කෙරෙහි සිතේ ඇතිවන හොඳ ගති සතරකි. මෙය භාවනාවක් වශයෙන් වැඩීමෙන් ධ්‍යාන උපදවා බඹලොව ඉපදිය හැකිය.

## ආහාරෙ පටික්කූල සඤ්ඤා

කන බොන ආහාරයෙහි ඇති වන පිළිකුල් ස්වභාවය පිළිකුල් ස්වභාවයට පත්වීම, ආහාර සෙවීම් ආදී දුක සිතා ආහාරයෙහි ගිජු නොවී ආහාර ගැනීමය.

## චතුධාතු ව‍වත්ථානය

සත්ව ශරීර ස්ත්‍රී පුරුෂාදීන් වශයෙන් සිතා ඒවායේ ඇති ස්වභාවයන් පඨවි ආදී ස්වභාව ධර්ම සතරක් ඇති සැටිය නුවණ මෙහෙයා බැලීමෙන් ලෝභාදිය ඇති කර නොගෙන ශරීර කූඩුව සෑදී තිබෙන පඨවි ආදි ධාතු ආකාරය නුවනින් නිතර නිතර බලා භාවනා කර දුක් සහිත සසරින් ගැලවීමට යොදු ගැනීම උගන්වයි. මෙය සමථ භාවනාව වශයෙන් ද දියුණු කොට බඹලොව උත්පත්තිය ද ලබයි. විදර්ශනා වශයෙන් භාවනා කර සංසාර දුකෙන් ද නිදහස් විය හැකි වේ.

## අරූප භාවනා සතර

ආකාසානඤ්චායතන, විඤ්ඤානඤ්චායතන, ආකිඤ්චඤ්ඤා යතන, නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන යන අරූප භවයන්ට පැමිණීමට කරන භාවනා ක්‍රමයයි. කර්මස්ථාන 4 කි.

1. පළමුවන අරූප භවය ලබාගැනීමට කරන භාවනාවෙහි— අරමුණ ආකාශ ප්‍රඥප්තියයි.

2. දෙවන අරූප භවය ලබා ගැනීම සඳහා කරන භාවනාව— පළමු උපදවන ලද අරූපාවචර විඤ්ඤාණයයි. මහග්ගත අරමුණකි.

3. තෙවන අරූප භවය ලබා ගැනීම සඳහා කරන භාවනාව— පළමු අරූපාවචර සිතේ නැති බව නාස්ති භාව ප්‍රඥප්තියයි.

4. සිවුවන අරූප භවය ලබා ගැනීම සඳහා කරන භාවනාවේ — අරමුණ තුන් වන අරූප සිතයි. මහග්ගත අරමුණකි.

පළමු කාණ්ඩයෙහි සිත් ගැන විස්තරයෙහි මෙය විස්තර කොට දක්වා ඇත.

ප්‍රඥප්ති ධර්ම අරමුණු කරන කර්මස්ථාන 28—දස කසින ප්‍රඥප්තියද, දස අසුභ ප්‍රඥප්තිය ද, කායගතා සතියට අරමුණු වන කායාදී කොට්ඨාශ ප්‍රඥප්තිය ද, ආනාපාන සතියට අරමුණු වන ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තියද සතර බ්‍රහ්ම විහාරයන්ට අරමුණු වන සත්ව ප්‍රඥප්ති සතරද අරූප භාවනා දෙකට අරමුණු වන ප්‍රඥප්ති ධර්මයන්ද වේ.

පරමාර්ථ ධර්ම අරමුණු වන කර්මස්ථාන 12 කි. ඒ භාවනාවන් බුද්ධානුස්සති ආදියට අරමුණු වන සීල සමාධි, ප්‍රඥාවන්ද, ආහාර, ඕජා රූප ධර්ම අරමුණු වන පරමාර්ථ ධර්මයකි. මහාභූත ධාතු සතර හා දූතිය, චතුත්ථ අරූපාවචර සිත්වලට අරමුණු වන පඨම තතිය අරූප සිත්ය යන මේ දෙළස පරමාර්ථ කර්මස්ථානයි.

බුද්ධානුස්සති අගදෙක හැර අටය, රූප ආහාරය, සතර මහා භූත රූපය, පඨම තතිය අරූප කමටහන් දෙකය යන මේ දෙළස පරමාර්ථ කර්ම ස්ථානයි.

**භාවනා භෙදය**

පරිකර්ම භාවනා, උපචාර භාවනා, අර්පණා භාවනා යනු වෙන් අවස්ථාවන් දැක්වෙන්නේ ය.

**ලෝකෝත්තර අපර්ණා**

විසුද්ධි මාර්ගයේ එය විසුද්ධි 7 කගේ වශයෙන් පෙන්වා තිබේ. විසුද්ධි සත නම්—සීල විසුද්ධිය, සීලය පිරිසිදුව තබා ගැනීම භාවනාවේ ආරම්භයයි. පැවිදි සීල, ගිහි සීල, වශයෙන් එය දැක්වේ.

දෙවන විශුද්ධිය දිට්ඨි විශුද්ධියයි. පිරිසිදු සම්‍යග්දෘෂ්ටියයි ඒ අවස්ථාව සමථ භාවනාවෙන් සිත තැන්පත් කර ගන්නා අවස්ථාවයි. ධ්‍යාන ලබන යෝගාවචරයෝ ධ්‍යාන උපදවති. භික්ෂූන් වහන්සේලා සතර සංවර සීලයෙහි පිහිටා සමථ භාවනාවෙන් ධ්‍යාන උපදවති.

චරිත සයකි—රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, විතක්ක චරිත, ශ්‍රද්ධා චරිත, බුද්ධි චරිත යන සයයි. මෙය මිශ්‍ර චරිතයන්ගේ වශයෙන් 63 ක් වේ. තමාගේ චරිතයට සුදුසු කමටහනක් ලබාගෙන භාවනා කරන්නේ ය.

## කර්මස්ථාන 40 ප්‍රඥප්ති — පරමාර්ථ වශයෙන් දක්වීම

බුද්ධානුස්සති අට සහ ආහාරයේ පටික්කූල සංඥා, චතුධාතු වවත්ථාන යන දෙක හැර ඉතිරි 30 අර්පණා භාවනා ලබන කර්මස්ථානයන්ය. දස කසිණය සහ ආනාපාන කර්මස්ථානය රූපාවචර ධ්‍යාන පහ ලබයි.

දස අසුභයද කායගතාසති භාවනාවද, ප්‍රථමධ්‍යානය පමණක් උපදවයි. ප්‍රථම ධ්‍යානය උපදවන කර්මස්ථාන සියල්ල දස කසිණය, දස අසුභය, කේසාදී කාය කොට්ඨාස ආනාපාන සතියට අරමුණු වන ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය, බ්‍රහ්මවිහරණ තුන (උපෙක්ඛාව හැර විසිපහයි).

දෙවන, තුන්වන, සතරවන ධ්‍යාන උපදවන භාවනා — දස කසිණය, ආනාපාන සතිය, මෙත්තා, කරුණා, මුදිතා යන 14 වේ.

උපෙක්ඛා බ්‍රහ්ම විහරණය පංචමධ්‍යානය පමණක් ලබයි. අරූප කමටහන් සතර හැර මේ කමටහන් 26 රූපාවචර ධ්‍යාන ලබයි.

අරූප කමටහන් 4 අරූපධ්‍යාන පළමු කී පරිදි ලබයි.

**ගෝචර භේදය**

ගෝචර භෙදය කියාද නිමිත්ත කියාද දක්වන්නේ අරමුණුය.

**භාවනා භේදය**

පරිකර්ම භාවනා, උපචාර භාවනා, අර්පණා භාවනා වශයෙන් භාවනා භෙදය දක්වේ.

පරිකර්ම භාවනා නම් මතු උපචාර, අර්පණා භාවනාවන් සකස් කරන මූලික අවස්ථාවය. මේ පරිකර්ම කිරීම භාවනා සියල්ලටම සාධාරණව ඇති වේ. භාවනා 40 හිම ලැබේ.

උපචාර නම් අර්පණා භාවනාවට සමීපව ඇති වේ. ධ්‍යාන, මාර්ග ඵලයන්ට සමීපව ඇතිවේ.

අපර්ණා — අරමුණෙහි හොඳටම පිහිටා සිටින භාවනාවය. ධ්‍යාන මාර්ග ඵල අවස්ථාවය.

බුද්ධානුස්සති ආදී මූල භාවනා 8 ද ආහාරෙ පරික්කුල සංඥවද අපර්ණා නො ලබයි.

දෙව්ලොව — දස අසුභය, කායගතා සතිය සහ ආහාරෙ පටික්කූල සංඥවද නොලැබේ. එහි ඒ අරමුණු නැති හෙයිනි.

රූපී බඹලොව මේ 12 සහ ආනාපාන සතිය ද නොලැබේ.

**අරූප ලෝකයෙහි අරූප කමටහන් 4 ලැබේ.**

**භාවනාවන්ගේ හා නිමිත්තයන්ගේ සම්බන්ධය**

උපචාර අර්පණා සමාධි දෙකට අරමුණු වන්නේ ප්‍රතිභාග නිමිත්තයි. එය ලැබූ පසු උපචාර සමාධිය ලැබේ. පරිකර්ම සහ උද්ගත නිමිති දෙක පරිකර්ම භාවනාවට අරමුණු වේ. ප්‍රතිභාග නිමිත්ත අරමුණු වන්නේ උපචාර. අපර්ණ භාවනා වන්ට යි.

විසුද්ධි මාර්ගයෙහි භාවනා ක්‍රම සවිස්තරව දක්වා තිබේ. පළමු කොට සීලයෙහි පිහිටා පටන් ගත යුතුය. ඊටපසු ආවාසාදී, කුල මච්ඡරිය ආදීන් අත්හැර කමටහන් ගත යුතු

ආචාර්‍ය්‍යවරයා ළඟට පැමිණ ගෞරවයෙන් කමටහන් ගෙන එය ඉතා ඕනෑකමින් ගෞරවයෙන් ගුරුතුමා කියාදුන් පරිදිම කළ යුතුය.

ඒ අරමුණ හොඳින් සිතට ගත් කල්හි පරිකර්ම නිමිත්ත හා උද්ගත නිමිති ලැබෙන්නේය. උද්ගත නිමිත්ත ලැබූ කල්හි ඇස පියා බැලුවත් ස්ථානය වෙනස් කොට බැලුවත් සිතට පෙනෙන්නේය. එය මුල් අවස්ථාවට වඩා නැවත භාවනා කිරීමෙන් සිත හොඳට තැන්පත් වේ.

උද්ග්‍රහ නිමිත්ත අරමුණු කොට සිත තැන්පත් වූ කල්හි නැවතත් භාවනා කරන කල්හි උද්ග්‍රහ නිමිත්ත හොඳාකාර පහළ වේ. එය ප්‍රතිභාග නිමිත්ත යයි දක්වනු ලැබේ. එය ඉතා පිරිසිදුය. කසිණ ප්‍රඥප්තියෙහි ඇත්තේ පරමාර්ථ වූ ශුද්ධාෂ්ටක රූපයෝය.

පටිභාග නිමිත්ත නම් සිතට වැටහී එන අරමුණය. එය ලැබූ පසු උපචාර භාවනා තත්ත්වය ලබයි. එය කාමාවචර කුසල් සිතය. ඒ සිත නීවරණ ධර්ම යටපත් කරයි. මෙසේ ක්‍රම යෙන් උපචාර සමාධිය ලබන්නේය. මෙය ඉක්මණින් කළ හැකි නොවේ. බොහෝ මහන්සි වී උත්සාහ කළ යුතුය.

නුවණැත්තෝ මේ භාවනාවන්ගෙන් ධ්‍යාන උපදවත්. සසර මේ භාවනා කර පුරුදු ඇති අයට නම් වැඩි උත්සාහයක් නොකළද ධ්‍යාන ලැබිය හැක. කලක් එසේ භාවනා කළ කල්හි රූපාවචර ප්‍රථම ධ්‍යානය ලබන්නේය.

එසේ උත්සාහවන්තයා නොනවත්වා භාවනා කරන්නෝ නම් ධ්‍යාන සියල්ලම ලැබිය හැකි වෙයි. මෙය ඉතා අමාරු කොටසකි. ගිහිගෙය නම් කිසිසේත් සුදුසු නොවේ යයි කියති. විවේක මඳ නිසා ලබන ලද ධ්‍යානය ප්‍රවේසම් කිරීමද ඉතා අපහසුය.

පංචවිධ වසීතාවන්ගෙන් හොඳට හුරු පුරුදු කළ යුතුය. වසීතා පහක් වේ. ආවර්ජන වසීතාවය, සමාපජ්ජන වසීතාවය, අධිෂ්ඨාන වසීතාවය, උට්ඨාන වසීතාවය, පච්චවෙක්ඛණ වසී තාව යයි හැඳින් වේ.

## අරූපාවචර කර්මස්ථාන සතර

රූපාවචර ධ්‍යාන ලබාගත් පසු රූපය නැති භවයක් ලැබීම සඳහා කරන භාවනාව අරූපාවචර භාවනාවයි. අරූපාවචර සිත් විස්තර කරන අවස්ථාවේ එය දක්වා ඇත. මෙසේ අපර්ණා ලැබෙන කර්මස්ථාන 30 කි. අපර්ණා නොලැබෙන කර්ම ස්ථාන 10 කි.

බුද්ධානුස්සති ආදිය වඩන කල්හි යෝගියාට අර්හත් ගුණය කැමති නම් එය අරමුණු වේ නම් ''අරහං'' යි භාවනා වැඩීමෙන් පරිකර්ම නිමිත්ත ලැබේ. අනෙක් බුද්ධ ගුණයෙන්ද එසේ වැඩිය හැකිය. නීවරණ යටපත් වීමෙන් උපචාර අවස්ථාවටද පැමිණිය හැක්කේ ය.

අභිඥ භාවනාවත් පසුගිය පාඩම්වල විස්තර කර ඇත. ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්ත විජාණන, පුබ්බෙ නිවාසානුස්සති, දිබ්බචක්ඛු ආදියයි. මේවා සමථ භාවනාවෙන් ලැබෙන විශේෂ අවස්ථාවන් වේ.

සමථයෙන් කෙලෙස් විස්කම්භන වශයෙන් යටපත් වීම විදර්ශනාවට බොහෝ උපකාර වන්නේ ය.

සමථ කර්මස්ථාන නිමි

## විදර්ශනා භාවනා සහ කර්මස්ථාන

විදර්ශනා යනු යෝගීන් විසින් ක්ෂණික සමාධියත්, සතර කමටහන් යයි කියන බුද්ධානුස්සති, මෛත්‍රී, අසුභ, මරණානුස්සති ආදියෙන් ලබා ඊට පසු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ත්‍රෛභූමික නාම රූප ධර්මයන් ගැන ත්‍රිලක්ෂණය වැටහී සසර දුක නැතිකරන මාර්ගඵල උපදවන භාවනාවයි. ස්ත්‍රී පුරුෂාදීන් වශයෙන් සලකන නාම රූප ධර්මයන් නාම රූප වශයෙන් නුවණින් බැලීමයි.

විදර්ශනා භාවනාව ගැන විසුද්ධි මාර්ගයෙහි පුරාණ සන්න පොතෙහි ඉතා ලක්ෂණ දිග විස්තරයක් තිබේ.

විසුද්ධි සතය, ලක්ෂණ තුනය, අනුපස්සනා තුනය, විදර්ශනා ඥාණ දසය, විමොක්ඛ මුඛ තුනය යන මේ ධර්ම විදර්ශනා භාවනාව කරනු කැමැතියන් විසින් උගත යුතුයි.

කෙලෙස් මල සුද්ධ කරන හෙයින් විසුද්ධි නම් වන්නේ ය.

### මාර්ගාධිගමයට අන්තරායික ධර්ම

කර්මාන්තරාය, ක්ලේශාන්තරාය, විපාකාන්තරාය, උපවාදන්තරාය, ආඥාවීතික්‍රමාන්තරාය යන කරුණු පස සිදුකරන තැනැත්තන්ට මාර්ගාධිගමයට බාධා වේ. පංචානන්තරීය කර්ම හා භික්ෂුණී දූෂණ කර්මය යන මෙයින් එකක් හෝ කර තිබුණි නම් එම භවයේ මගඵල නොලැබෙන්නේය. මිථ්‍යා දෘෂ්ටියද ක්ලේශාන්තරාය ය. අහේතුක, විහේතුකයින් විපාකාන් තරාය ය. මේවාට අයත් නොවන ත්‍රිහේතුකයින්ට උත්සාහ කළහොත් මගඵල නොලැබීමට හේතුවක් නැත්තේය. හරියට කරවන ගුරුවරු සොයා ගැනීම අසීරු කරුණකි. අත්හද බැලීමට සැක ඇතිව භාවනා නොකළ යුතුය.

### සීල විසුද්ධිය

පිරිසිදු සීලයෙහි පිහිටා භාවනා කළ යුතුය. ගිහියෙකු නම් තමාගේ ගිහි සීලය ප්‍රවේසම් කර ගත යුතුය. විසුද්ධි ධර්ම සතෙන් පළමුවැන්න සීල විසුද්ධියයි. ගිහියන්ට සුදුසු ආජීව අෂ්ටමක සීලය නම් එය මනාව පිරිසිදුව තබාගත යුතුය.

චිත්ත විසුද්ධිය සඳහා නීවරණාදියෙන් වළක්වා සිත පිරිසිදු කර ගත යුතුය. සමථ භාවනා මගින් සිතේ සමාධිය ඇතිකර ගැනීම විදර්ශනාවට බොහෝ උපකාරී වේ. එසේ අවස්ථාව නොලද හොත් ඒ ඒ අවස්ථාවේදී රත්නත්‍රයට වැඳ ක්ෂමා කර ගෙන ආචාර්යයන්ට යම් දෝෂාරෝපණයක් කර ඇත්නම් එයද ක්ෂමා කර ගත යුතුයි. අනතුරුව සතර කමටහන් අසා දැන ගෙන ටික වේලාවක් එසේ සමථ භාවනාවකින් ක්ෂණික සමාධියක් ලබා විදර්ශනා භාවනා කරන්නේය. කර්මස්ථාන ආචාර්යවරයාගෙන් හොඳාකාර අසා දැනගෙන භාවනාව ආරම්භ කළ යුත්තේය.

## දිට්ඨි විසුද්ධිය

දිට්ඨි විසුද්ධිය සඳහා නාම රූප ධර්ම සත්ව පුද්ගල වශයෙන් නොව නාම රූපාදී පරමාර්ථ ධර්ම වශයෙන් සිතිය යුතුය. නුවණ පිරිසිදු කිරීම මෙතැනදී ආරම්භ කෙරේ. බුදුගුණ භාවනාව ආදිය හොඳාකාර පුරුදු කොට සිත සමාධියට පුරුදු කොට දිට්ඨි විසුද්ධියට ආරම්භ විය යුතුයි. සතිපට්ඨාන සූත්‍රයෙහි මේ සඳහා ගවයෙක් මරා මස් විකුණන උපමාවක් ආදිය දක්වා තිබේ.

මෙතැනදී සම්මුති කථාව හොඳට මනක තබාගෙන සම්මුතියෙහි පිහිටා කථා කළ යුතුය. විදර්ශනා භාවනාව ඉතා ප්‍රවේසමෙන් කළ යුතුයි. පිටස්තර අන්‍යයන්ට වඩා ප්‍රකට වීමෙන් අපහසුකම් ද ඇතිවිය හැකිය. නාමරූප සංඛ්‍යාත ස්කන්ධ පංචකයට සිත යොදා හොඳාකාර නාමරූපාදිය කෙරෙහි ත්‍රිලක්ෂණයට අනුව නුවණින් සහ සතියෙන් යුතුව භාවනා කළ යුතුය.

විදර්ශනා භාවනා වැඩීමට නාම රූප ධර්ම හොඳාකාර ඉගෙනගන තිබීම ඉතාමත් ප්‍රයෝජනවත්ය. කායානුපස්සනාවේ දක්වෙන දෙතිස් කුණප ආදිය දැන තිබීමද සතිපට්ඨානය ඉගෙන පුරුදු කොට තිබීමද බොහෝ ප්‍රයෝජනවත් වේ. ඒවා නොදන සිටි අයට ඒවා වටහා දීම ගුරුතුමා විසින් කළ යුතුවේ. මෙතැනදී ඉතා ඕනෑකමින් ඉක්මන් නොවී ප්‍රවේසමෙන් දිට්ඨි විසුද්ධිය සම්පාදනය කළ යුතුය. මෙය හොඳාකාර සම්පාදනය කළ යුතුය. මේ තුන්වන විසුද්ධියයි.

## කඞ්ඛා විතරණ විසුද්ධිය

නාමරූප ධර්මයෝ භවයක් පාසා සංසාරයෙහි පැවැතීම පෘථග්ජනයාට තේරුම් ගැනීම ඉතා අසීරු කරුණකි. සැක සහිත දෙයකි. ඇතම් අයභවයක් පාසා යන ආත්මයක් ඇතැයි ගන්නේ මෙය තේරුම් ගැනීමේ අපහසුව නිසාමය. පටිච්ච සමුප්පාදදිය ගැන කිසිම දැනුමක් නැති නම් මෙය තේරුම් ගැනීම ඉතාමත් අසීරුය. භාවනාව හොඳාකාර සිදුවන්නට ධර්ම වැටහිය යුතුයි. කෙසේ නමුත් පොත පතින් හෝ ගුරුවරුන්ගෙන් අසා දැනගන නැති නම් හෝ මේ ධර්ම තේරුම් ගත නොහැක. අමාරුවෙන් හෝ අසා දත යුතුය.

අවිද්‍යා නමැති අන්ධකාරය සහ තණ්හාව ද ඇති අයට මේ ධර්ම තේරුම් ගැනීම කෙසේ කළ හැකිද? බුදු දහම දන සිටීම ප්‍රයෝජනවත් වේ. විසුද්ධි මාර්ගයෙහි කඞ්ඛා විතරණ විසුද්ධියෙහි දී පටිච්ච සමුප්පාදය සම්පූර්ණයෙන් විස්තර වෙයි

සතියෙන් යුක්තව සිටියහොත් නාමරූප ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය තේරුම් ගතහොත් සෑම මොහොතකදීම යම් කිසි ක්‍රියාවක යෙදී සිටින බව වැට හෙන්නේය. මේ ධර්ම ස්වභාව ඝන සතර නිසා වැසී යන්නේය. ඝන සතර නම් සමූහ ඝනය, සන්තති ඝනය, කෘත්‍ය ඝනය, ආරම්මණ ඝනය යනුවෙනි.

## මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිය

මේ පස්වෙනුව පෙන්වා තිබෙන විසුද්ධියයි. විසුද්ධි සතර කදී හොඳාකාර දක්නා ලද, නාමරූප ධර්මයන්ගේ ඇති සැටිය දක්නා ලද යෝගාවචරයා හට පෙර කිසිවිටෙක නුදුටු විරූ ආලෝකාදී ධර්මයන් දක්නට ලැබේ. එසේ දක්නට ලැබෙන අරමුණු කෙරෙහි රැවටීමට ඉඩ සැලසේ. මෙය භාවනාවේ ඵලය ලබන ලදැයි ද දකින්ට ලැබුණ ආලෝකය නිවන යයිද සිතා රැවටීමට පත්වන්නේය. මෙය කරගෙන එන ලද භාවනා මාර්ගය නොමඟට හැරෙන්නට මේතැනදී ඉඩ ඇති අවස්ථාවකි. ප්‍රවේසම් විය යුතු අවස්ථාවකි. කමටහන් දෙන ආචාර්‍යයන් ගෙන් අසා දනගන ඕභාසාදිය නිසා කෙළෙස් ඇතිවී භාවනා පිළිවෙල කිලිටි වූ බැවින් නැවතත් උදයබ්බය, භංග භය ආදී නව ආදි මහා විදර්ශනා ඤාණ යදහා නැවතත් භාවනා කළ යුතුය. මේ ඇතිවූ උපක්ලේශ ධර්ම දසය ගාථාවකින් විසුද්ධි මාර්ගයෙහි මෙසේ පෙන්වා තිබේ.

" ඕභාසො පිති පස්සද්ධි — අධිමොක්ඛොච පග්ගහො
සුඛං ඤාණ මුපට්ඨානං — උපෙක්ඛාච නිකන්තිච "

මේ ඕභාසාදීන් චෛතසික කොටසකි. මින් එකක් දෙකක් හෝ ඇතිවිය හැකිය. ඒ ධර්ම හඳුනාගෙන ඒවා නිවන නොවන බව තේරුම් ගෙන නිකන්ති ආදීන්ගෙන් ආලෝකය

කෙරෙහි ඇතිවූ ලෝභය දුරුකොට නැවත පළමු පරිදි භාවනා කොට විදර්ශනා ඥාණ ලබාගත යුතුය. මෙහි දී කලාප වශයෙන්ද, අද්ධාන වශයෙන්ද, සන්තති වශයෙන්ද, භාවනා කරන්නේය. ඊලඟට තවත් විසුද්ධියක් ලබාගත යුතුය.

**පටිපද ඥාණ දස්සන විසුද්ධිය**

මේ හයවන විසුද්ධියයි. දැන් භාවනාවේ දියුණු තත්වයට පත්ව ඇත. මේ විසුද්ධියෙහි දී නැවතත් විදර්ශනා නුවණ පිරිසිදුව හොඳාකාර සිදු වේ. මූල විසුද්ධීන්හි දී සම්මර්ශන උදයබ්බය ඥාණයාගේ පූර්ව භාගය ලබාගත් පසු මෙතැනදී ඒ ඥාණ සම්පූර්ණව සම්මස්සන, උදයබ්බය, භංග, භය, ආදීනව නිබ්බිද, මුඤ්චිතුකම්‍යතා, පටිසංඛා, සංඛාරුපෙක්ඛා, අනුලෝම ඥාණයද ලබන්නේය. විදර්ශනා ඥාණ සම්පූර්ණ වීමෙන් පසු අවසානයට ලබන ඥාණ දස්සන විසුද්ධිය නිවණ දකිමින් සතර මාර්ග ඵල ධර්මයන් ලබන්නේය. ඔහුට තවත් මේ විසුද්ධීන් සඳහා කළ යුතු දෙයක් නැත්තේය.

## විමොක්ඛ මුඛ තුන

අනිමිත්ත විමොක්ඛයද, අප්පණිහිත විමොක්ඛයද, ශූන්‍යත විමොක්ඛයද යන තුනයි. අනිත්‍යානු දර්ශන නම් වූ අනිමිත්ත විමොක්ඛයද, දුක්ඛානු දර්ශන නම් වූ අප්පණිහිත විමොක්ඛයද, අනත්මානු දර්ශන නම් වූ ශූන්‍යත විමොක්ඛයද වේ.

අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනුයේ ශ්‍රද්ධේන්ද්‍රිය නම් වූ අධිමොක්ඛ බහුල වූයේ අනිමිත්ත විමොක්ඛය ලබයි. දුක් වශයෙන් මෙනෙහි කරනුයේ සංසිඳීම බහුල කොට ඇත්තේ අප්පණිහිත විමොක්ඛය ප්‍රතිලාභය කෙරේ. අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ ආත්ම ශූන්‍යතා නිපුණ ඤාණ විශේෂය බහුල වූයේ ශූන්‍යතා විමොක්ඛය පිළිලමයි.

එකල්හි ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනා තොමෝ අනාත්ම වශයෙන් විදර්ශනා කෙරේද එකල්හි මාර්ගය සුඤ්ඤත විමොක්ඛ ලබයි. අනිත්‍ය වශයෙන් විදර්ශනා කෙරේද මාර්ගය

අනිමිත්ත විමොක්ඛය ලබයි. දුක් වශයෙන් විදර්ශනා කෙරේද මාර්ගය අප්පණිහිත විමොක්ඛය නම් වේ. මෙසේ මාර්ගය හා ඵලය වුට්ඨාන ගාමිණී විදර්ශනා වශයෙන් නම් තුනක් ලබයි. මේ විමොක්ඛ භෙදයයි.

පුද්ගල භෙදය වශයෙන් මාර්ග ඵල ලාභී පුද්ගලයන් අට-දෙනා පෙන්වා තිබේ. නිරෝධ සමාපත්තියට සමවැදීමද ඉහතින් පෙන්වා ඇත.

**නවමහා විදර්ශනා ඥාන :**

උදයව්‍යය ඥානාදීන් මග්ගාමග්ග ඥාන දස්සන විසුධීන්හිදී ඇති විය. එහෙත් එය විදර්ශනා උප ක්ලේශයන්ගෙන් කිලුටු වීමෙන් අනිත්‍යාදීන් හරි හැටි නොවැටහිනි. ශිඛාප්‍රාප්ත විදර්-ශනා ඥානයත් සංස්කාර උපෙක්ෂා ඥානයට උදයව්‍යාදී ඥාන අටදෙනාගේ වශයෙන් සම්පූර්ණ වන්නේය. මෙය පටිපද ඥාන දස්සන විසුද්ධියයි. එහි නාම මාත්‍රයක් මෙහි දැක්වේ. උදයබ්බය ඥානය, භංගානුදස්සන ඥානය, භයතුපට්ඨාන ඥානය, ආදීනවානු දස්සන ඥානය, නිබ්බිදනු දස්සන ඥානය, මුඤ්චිතු-කම්‍යතා ඥානය, ප්‍රතිසංඛානු දස්සන ඥානය, සංඛාරු උපෙක්ඛා ඥානයද නමවෙනි සත්‍යානුලෝමික ඥානයද වේ.

උදයබ්බය ඥානය තිලකුණු මෙනෙහි කිරීම් වශයෙන් ඇති වේ. නාම රූප ධර්මයන්ගේ තදබැව් ආදීන්ගේද, නාම ධර්ම-යන්ගේද, ඵස්ස, වේදනාදීන් ද වෙන් කොට, සමූහ ඝනය, කෘත්‍ය ආරම්ණදී ඝනයන් බිඳ බැලීමෙන් අනාත්ම ලක්ෂණය වැටහේ. නාම රූප ධර්ම ධාතු වශයෙන් බැලීමෙන් සත්ව පුද්ගල ආත්ම නොවන අනාත්ම බව වැටහේ. නාම රූප ධර්ම උපදින මැරෙන විනාශය දැකීමෙන් අනිත්‍යාදිය වැටහෙන්නේය.

**භංගානු පස්සනා ඥානය :**

රූප වේදනාදී අරමුණු ක්ෂය, වය වශයෙන් දක්නා විදර්-ශනා ඥානයයි. රූපාරම්මණය ඉපද බිදේද. ඒ අරමුණ කරන ලද සිතද ඉපද බිදේද, එය අනිත්‍යය අනුව බලයි. නිත්‍ය

අනුව නොබලයි. දුක, අනාත්ම යන් අනුවද බලයි. නිත්‍ය සංඥවද, සුබසංඥවද, ආත්මසංඥවද දුරු කෙරේ. කලකිරුනේ නන්දියද (සතුට) දුරු කෙරේ. නො ඇලීමෙන් රාගය දුරු කෙරේ. වේදනා, සංඥ සංඛාර, විඥ්ඥාණාදියද එසේ දුරු කෙරේ. අරමුණට අනුව යාමෙන් දුටු නුදුටු දෙය අතීත අනාගත සංස්කාරයන් ස්වභාව වශයෙන් මෙනෙහි කෙරේ. රූපාදි අරමුණු දැන ඒ අරමුණෙහි භඞ්ගයද බලයි. ආරම්මණ කරන ලද සිතද ඒ සිතේ භංගයද බලයි. සංස්කාරයන් ශුන්‍ය වශයෙන් වැටහෙයි. ක්ෂය, වය, සුඤ්ඤ යන තුන වශයෙන් බලයි. එය දැකීමෙන් නොයෙක් මිථ්‍යාදෘෂ්ටීන්ගෙන් කම්පිත නොවේ. රූපය අරමුණු කළ සිත ඉපිද බිඳේ. ඒ රූපාරම්මණය ක්ෂය, වය වශයෙන් දක්නා සිත ද ඉපද බිඳී යාම අනික් සිතකින් මෙනෙහි කොට බලයි. යම් සේ මෙය සංස්කාර ධර්ම, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බලයි. තෘෂ්ණා දෘෂ්ටි ආදී වශයෙන් අල්වා නොගනී. නො ඇලේ. මෙසේ නොදක්නා ලද සංස්කාරයන්ද අත්වයේ නුවණින් (අනුමාන නුවණින්) නිරුද්ධ කෙරේ. මෙසේ දැකීමෙන් තදංග වශයෙන් කෙලෙස් දුරු කෙරේ. නිවන පැත්තට නැඹුරු වේ. මේ සංස්කාරයන්ගේ බිඳීම දක්නේ හිරු නැගි කල්හි තණ අග පිණි බිඳු මෙනි. වැසි වසිනා කල්හි මහත් මහත් දිය බුබුලු මතුවීමත් බිඳීමත් දක්නා සේ නාම රූප බිඳීම ප්‍රකට වන්නේය. ඒ යෝගී හට භංගානු දස්සනා ඥනය බලපාන කල්හි භව දෘෂ්ටි සංඛ්‍යාත ශාස්වත දෘෂ්ටියද ප්‍රහාණය වන්නේය.

**භයතු පට්ඨාන ඥනය** :

සියලු ත්‍රෛභූමක සංස්කාරයන් ක්ෂය වය භෙද වශයෙන් ක්ෂණික නිරෝධය දුටු යෝගී හට සියලු භව, යොනි, ගති, සත්වාවාසයන්හි සුවසේ ජීවත් වෙනු කැමති බියගුලු පුරුෂයෙකුට සිංහ - වග - වලස් - දිවි - රාක්ෂ යක්ෂාදීන් ගැවසීගත් තැන් මෙන්ද සොහොන - සොහොන - යුද බිම - ගිනි අඟුරු වල මෙන්ද මහත් භයක් ඇති අතීත සංස්කාරයෝ නිරුඬ වූහ. වර්තමාන සංස්කාරයෝ නිරුඬ වෙත්, අනාගත ඇතිවන සංස්කාරයෝද එසේම නිරුඬ වන්නාහු යයි දක්නා යෝගී හට මෙතනදී භයතු පට්ඨාන ඥනය උපදීහ. ගිණි අඟුරු වලකට වැටුන දිය බිඳු මෙන් වහා නිවීමම දක්නේ මේ භය ඥනය යි.

**ආදීනව ඥානය :**

භය වශයෙන් වැටහුනු නාම රූප ධර්මයන්ගේ දෙස් දක්නා නුවණයි. කාම, රූප, අරූප යන භව තුනෙහිම ගිණි අඟුරු වලක් මෙන්ද, සතර මහා භූත රූපයෝ දරුණු විෂ සහිත සපුන් මෙන්ද. පස් කඳහු කඩු ගත් වධකයන් මෙන්ද, අධ්‍යාත්මිකායතනයන් ශූන්‍ය ග්‍රාමයක් මෙන්ද, බාහිරායතනයන් සොරුන් මෙන්ද, නව සත්වාවාස ආදිය එකොළොස් ගිණි ඇවිල ගත් තැන් මෙන්ද, සංස්කාර ධර්මයන් ගඩු මෙන්ද, රෝග මෙන්ද, ආස්වාද රහිතයෝ යයිද දකී. සංස්කාරයන්ගේ පැවැත්මද, නිමිත්තද, ආයුහනයද, ප්‍රතිසන්ධියද, ප්‍රවෘත්තියද නිරයාදිගතීන්ද, ජාති, ජරා, ව්‍යාධි ආදියද දක්නේය. භයතු පට්ඨාන ඥානය ද ආදීනවයෙහි ඥානයයි.

**නිබ්බිදානු පස්සනා ඥානය :**

සංස්කාරයන්ගේ ආදීනව දැක කලකිරේ, නො ඇලේ. රාජහංස තෙම සැඩොල් ගම ගවරවල නො ඇලේද එමෙනි. අනුපස්සනාවන්හිම ඇලේ. එසේම යොගාවචර නැමැති රාජහංස තෙම ආදීනව දක්නා ලද සංස්කාරයන් කෙරෙහි නො ඇලේ, කලකිරේ. භාවනා රාමරාමයෙහිම ඇලේ. නිබ්බිදානු පස්සනා ඥානය භයතුපට්ඨාන ඥාන ආදීන් සමග අර්ථ වශයෙන් ම එකක් වේ. සංස්කාර භය වශයෙන් දුටුවේ භය ඥානයයි, දුටුයේ ආදීනව ඥානයයි. සංස්කාරයන් කෙරෙහි කලකිරීමෙන් ආදීනව උපන් නුවණ නිබ්බිදානු පස්සනා නම් වේ.

**මුඤ්චිතු කම්‍යතා ඥානය :**

සියලු සංස්කාර ධර්මයන්ගෙන් මිදෙනු කැමැත්ත මුඤ්චිතු කම්‍යතා ඥානයයි. උපමාවක්, දැල තුලට වන් මසුමෙන් ද, සර්ප මුව පත් මැඩි ද, අහිගුණ්ඨිකයකුගේ අතට පත් සපු ද, ගුරුළු මුව පත් නා රජ ද මේ ආදී සත්වයෝ භයානක විපතින් මිදීම කැමති වන්නාක් මෙන්, යෝගීහු සියලු සංස්කාරයන් ගෙන් මිදෙනු කැමැත්ත ඇතිවේ. එසේ සියලු සංස්කාරයන් ගෙන් මිදෙනු කැමැත්ත වූ ඒ ඥානය මුඤ්චිතු කම්‍යතා ඥානයයි.

**පටිසංඛානු පස්සනා ඥනය** :

යෝගාවචර තෙම සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් මිදෙනු කැමැත්තේ, නැවත විදර්ශනා නුවණින් බලයි. සංස්කාර ධර්මයන් අනිත්‍යය අන්ත කොට ඇති හෙයින් ද, තාවකාලික හෙයින් ද, උදය, වය දෙකින් පිරිසිඳින ලද හෙයින් ද, විනාශ වන හෙයින් ද, බිඳෙන හෙයින් ද, අස්ථිර හෙයින් ද, සඬබන හෙයින්ද මරණ ධර්ම හෙයින් ද මේ ආදීන්ගෙන් යුක්ත වූ අනිත්‍යයම දකී. නිතර පෙලන හෙයින් ද, දුකින් ඉවසන හෙයින් ද, දුකට වස්තු හෙයින් ද, වධකයෙකු හෙයින් ද, මාරාමිස වූ ජාති, ජරා, ව්‍යාදි ආදී වූ දුක් උපදනේ යයි දකී. විරූප ද වේ, අතිභයානක වේ. දුක්ඛ ලක්ඛණයට පරිවාර වූ අසුභයම දකී. මොහු මේ සංස්කාරයන් පරිග්‍රහ කෙරේ ද? හවයෙන් මිදීම පිණිසය, මසුන් අල්ලන්නෙක් මසෙකු යයි සිතා සර්පයෙක් බෙල්ලෙන් අල්වා ගොඩට ගෙන සපු බව දැක ඔහුගෙන් මිදීම පිණිය බෙල්ලෙන් අල්වා හිස වට කරකවා වීසිකර නිර්භය ස්ථානයකට දුව ගියේය. යෝගියාගේ විදර්ශනා ඥනයන් සඳහා උපමාවය. අනිත්‍ය විසින් මෙනෙහි කිරීමෙන් නිමිත්ත ඇති සැටියෙන් වැටහේ, දුක වශයෙන් බැලී මෙන් සංඛාර නිමිත්ත ද ප්‍රවෘත්තිය ද වැටහේ, අනාත්ම වශ යෙන් බැලීමෙන් නිමිත්ත ද පවත්තද ඇති ඥනය උපදී, සික නිසාත් ධර්මයත් නිසාත් මහානුවිඥනය උපදී යනාදිය මෙනි.

**සංඛාරුපෙක්ඛා ඥනය** :

වරද සහිත නාමරූප ධර්මයන් කෙරෙහි ආශාව දුරු කොට ඔවුන් කෙරෙහි මැදහත්ව බලන ඥනයයි. උපමාව – වරද සහිත භාර්‍යාව අත් හැරීමෙන් පසු නැවත ඇය ගැන නො සොයා හැරීම මෙනි. මේ සංස්කාර ධර්මයෝ ශූන්‍යය හයි පිළි-ගෙන නැවත ආත්මය හෝ ආත්මය පිළිබඳ ධර්මයක් හෝ නොදකී. මෙසේ දෙකොළවරක් ඇති ශූන්‍යත්වය දකී. මේ යොගාවචර තෙම ආත්මයක් හුගේ නොලැබීම නුවනැසින් ප්‍රත්‍යක්ෂයෙන්ද අනුමානයෙන්ද ආත්මයක් නොම දකී. කිසි තැනෙක්හි ආත්මයක් නොම දකී.

වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, ජරා මරණ අවිපරිනාම ධර්මයන් හෝ නිසරු බව වේද, සංසාරයෙන් පහ වේද, එරඬු ගස, කෙසෙල් කඳ, මායාව, අසාරද වේ, නිස්සාරද වේ. මෙසේ පරිග්‍රහනය කෙරේ.

## අනුලොම ඥනය :

නැවතත් තිලකුණු වඩන්නේ මුලින් පැවති විදර්ශනා ඥන නවයට හා මතු ලොකොත්තර මාර්ගක්ෂණයෙහි අවබෝධ වන බෝධිපාක්ෂික ධර්ම 37 ටද අනුකූලව හටගන්නා ඥනයයි. ඤාණ දස්සන විසුද්ධියයි. විසුද්ධි සය වැඩු කල්හි අවසනට ලැබෙන මාර්ග ඵල ධර්මයන් මෙ ඤාණ දස්සන විසුද්ධියෙහි දි ලැබේ. මාර්ග ඵල සිත් කලින් විස්තරය වී ඇත.

## ඥණ දස්සන විසුද්ධිය

ඥණ දස්සන විසුද්ධියෙහිදී විදර්ශනා භාවනාවන් සම්පූර්ණ වීමෙන් පසු මාර්ගඵල ධර්මයන් අට ගැනම දක්වා තිබෙන්නේය. චතුරාර්‍ය සත්‍යයන් අවබෝධය ලබන අවස්ථාවෙහි මාර්ග වීථියෙහි පිලිවෙලින් ලැබීම පෙන්වයි. කාලයක් මුළුල්ලෙහි සසර සැරිසරමින් චිත්ත සන්තානය අනුව පැවති එක්දහස් පන්සියයක් පමණ (1500) ක්ලේශ ධර්මයන් ගෙන්ද ඉතාම ඝන බහල ක්ලේශධර්ම දෙකක් වන මිථ්‍යා දිට්ඨියත් බුද්ධාදී අටතැන ඇතිවන සැකයත් සම්පූර්ණයෙන් නැවත එම චිත්ත සන්තානය අනුව ඇති නොවන පරිද්දෙන් අනුසය ධර්ම සහිතවම මුලින් උපුටා දමන අචල වූ වෙනස් නොවන ශ්‍රද්ධාවෙන් සහ සමාගද්‍රෂ්ඨියෙන් යුක්ත වූ සෝවාන් මාර්ග ඵල සංඛ්‍යාත වූ නිවණ පළමුවරට ප්‍රත්‍යක්ෂ වශයෙන් තමා අවබෝධ කරන ලෝකෝත්තර කුසලය සහඵල ධර්මය ලබන්නේය. සතර අපායේ උත්පත්තිය දුරුකොට කාම ලෝකයන්හි උත් පත්තියද සත් වාරයකට සීමා කරන සෝවාන් මාර්ග ඵලයන් ලැබීම කොපමණ ආශ්චර්‍යයක් ද? එම ඵලයට පැමිණි පුද්ගලයා

ඒ ආයුෂ්මතුන් වහන්සේ ඵල සමාපත්ති සුවයට පැමිණ නිර්වාණ ධාතුව අරමුණු කරමින් එක මොහොතක් සිටීම කොපමණ උතුම් ද? ඊට පසු නැවත විදර්ශනා භාවනාවෙහි යෙදීමෙන් ඵල සමාපත්තීන් සහ ඉතිරි මාර්ග ඵලයන්ද ඉපදවිය හැකි වන්නේය. එසේ නොවේ නම් විශාඛා උපාසිකාව, අනේපිඬු සිටුතුමා ආදී උතුමන් මෙන් දෙව්ලෝ බඹලෝ ආදියෙහි සැරිසරමින් ගොස් සුද්ධාවාස භූමියෙහි දී රහත් ඵලයෙන් ගමන අවසන් කරන්නේය. අග්ග දක්ඛිණෙය්‍ය වූ සියළු පූජාවන් ලැබීමට සුදුසු වූ රහතන්වහන්සේ අනුපාදිශෙෂ පරිනිර්වාණ ධාතුවට පැමිණෙන්නේ ය.

(සුද්ධාවාසයෙහි උපත ලබන්නට අනාගාමී ඵලයට පැමිණීමත් පඤ්චමධ්‍යාන විපාක සිතත් ලැබිය යුතුය'' යි ධර්මයෙහි පෙන්වා තිබේ.)

**භාවනා**

පඤ්චේන්ද්‍රියයන් අතුරෙන් ශද්ධා, ප්‍රඥා දෙක හා සමාධි, වීර්‍ය්‍ය දෙදෙනාගේ සමව පැවැත්ම මැනවැයි බුද්ධාදී උතුමෝ ප්‍රශංසා කෙරෙත්. බලවත් ශ්‍රද්ධාවන්තයා නුවණ මඳ වී නම් කාරණා නොදන පිළිපදින්නේ වෙයි. බලවත් ප්‍රඥාවන්තයාද සැදැහැ මඳ බැවින් කුසල් සිත් ඇතිවීම් පමණෙකින් සෑහීමට පැමිණෙයි. කෛරාටික පැත්ත භජනය කරයි. ඒ පුද්ගලයන් බෙහෙතින් උපන් රෝගයක් මෙන් පිළියම් කළ නොහැකි තත්වයට පැමිණෙයි. අර්ථ ශූන්‍ය තර්ක හෝ උඩඟු වූ සිත් ඇති වේ. නුවණැතියන් ගේ බස් නොපිළිගැනේ.

ශ්‍රද්ධා, ප්‍රඥා දෙදෙනාගේ සමබව හේතුකොට පැහැදිය යුතු වස්තුවෙහිම පහදින්නේ ය.

බලවත් සමාධි ඇතිව වීර්‍ය්‍ය මඳ වූයේ නම් සමාධිය කුසීත පාක්ෂික බැවින් අර්පණා නොලබන්නේය. බලවත් වීර්‍ය්‍ය වන්ත තෙම මඳ වූ සමාධිය නිසා වීර්‍ය්‍යය උඩඟු බවට පැමිණේ. සමාධිය වීර්‍ය්‍යය හා සම බර වී නම් කුසීත බවෙහි හා උඩඟු

බවෙහි නොවැටී අර්පණ ලබන්නේය. එහෙයින් සතිය සෑම විටම ඇතිවිය යුත්තේ ය. ආහාරයට ලුනු මෙන් වේ. කුසල් සිත සතිය පිහිට කොට ඇත්තේය. නොපැමිණි විශේෂාධිගමයන්ට පැමිණීමට ද උපකාර වේ. සෙසු කුසල ධර්මයන්ද ආරක්ෂා කරන්නේය. බොජඣංග ධර්මයන් ගැන 7 වන පරිච්ඡේදයෙහි පෙන්වා ඇත.

බොජ්ඣංග ධර්ම වැඩිය යුත්තේය. කුසීතව හැකුලුනාවූ සිත මේ බොජඣංග ධර්ම වැඩීමෙන් නඟා සිටුවාලිය හැකි වන්නේ යයි වදාළ සේක.

යම් කලෙක සිත හැකුළුණේ ද එකල ධම්මවිචය, ප්‍රීති, විරිය යන බොජ්ඣංග ධර්ම වඩන්නේ යයි වදාළ සේක.

පඤ්ච ආනන්තරිය කර්මයන්ද, නියත මිථ්‍යාදිට්ඨියද, අහේතුක ද්විහේතුක පටිසන්ධීන්ද, නිර්වාණාධිගමයට බාධාවන්ය ප්‍රතිපත්ති පූරණයෙහි නොකැමති සත්වයින්ටත් එකම භාවනා වකදීවත් ධ්‍යානාදිය නොලැබේ. සූවිසි ප්‍රත්‍යය, පටිච්ච සමුප්පාද දීන්ගෙන් තොරව සත්වයෙකුගේ පැවැත්ම වේ යයි ගන්නා මිථ්‍යාදිට්ඨී ආදියෙන් යුක්ත වූවෝද වෙති.

කර්මාවරණ, විපාකාවරණ, ක්ලේශාවරණ, ආදියෙන් යුක්ත වූවෝද මාර්ගානුලෝමික ප්‍රතිපත්තියෙහි ද, සත්‍යානුලෝමික විදර්ශනාවෙහි ද කත්තුකම්‍යතා කුශලච්ඡන්දයෙහි ද, නිවන් දැකීමේ කැමැත්ත නොවූවෝ ද කුසල ධර්මයෙහි යෙදීමට අශක්‍යයෝය. කර්මාවරණාදිය නැති සත් පුරුෂයින් බණ ඇසීම, සත්පුරුෂ සේවනය, යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව ත්‍රිහේතුක උපත ලැබූවන් කුසල ධර්ම වැඩිදියුණු කොට කර්ම ඵලය ශ්‍රද්ධාව, ප්‍රතිපත්ති පූරණය ආදිය දියුණු කොට නිර්වාණාවබෝධය කරන්නේය.

ලොකෝත්තර කුසලය වන මාර්ග කුසලය තමා අනන්තර ප්‍රත්‍ය භාවයෙන් ඵල සිත්වලට ප්‍රත්‍ය වන්නේ යයි ද වදාරන ලද්දේය.

කර්මස්ථාන කාණ්ඩය අවසන්

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු